විගණකාධිපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව සතුවන රාජ්‍ය මූල්‍ය පාලනය ඵලදායීව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාම සම්බන්ධව ස්වාධීන පරීක්ෂණයන් පැවැත්වීම හා එය පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා වෙත පැවරී ඇති ප්‍රධානතම කාර්යයක් වේ. එම කර්තව්‍යන් ඉටු කිරීම සම්බන්ධව 2015 මුදල් වර්ෂය සඳහා වූ මාගේ වාර්තාව සතුටින් ඉදිරිපත් කරමි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම වාර්ෂික වාර්තාව, හත්වෙනි කාණ්ඩය වශයෙන් ඉදිරිපත් කරනු ලබන අතර අනෙකුත් වාර්තා පහත සඳහන් කාණ්ඩ අට යටතේ වෙන වෙනම සභාගත කිරීමට කටයුතු යොදා ඇත.

පළමුවන කාණ්ඩය	-	අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු
දෙවන කාණ්ඩය	-	රාජ්‍ය සංස්ථා, අධිකාරී හා මණ්ඩල
තුන්වන කාණ්ඩය	-	ව්‍යවස්ථාපිත හා අනෙකුත් අරමුදල්
හතරවන කාණ්ඩය	-	විදේශ ආධාර ව්‍යාපෘති
පස්වන කාණ්ඩය	-	පළාත් සභා
හයවන කාණ්ඩය	-	පළාත් පාලන ආයතන
අටවන කාණ්ඩය	-	කාර්යසාධන විගණනය හා වෙනත් විශේෂිත විමර්ශණයන්

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය හා ව්‍යවස්ථාපිත භූමිකාව පිළිබඳව මහජන කථිකා වේ පුළුල් ලෙස සාකච්ඡාවට භාජනය වීම නිසා විගණකාධිපති දෙපාර්තමේන්තුවට මෙම වර්ෂය කාර්ය බහුල වර්ෂයක් විය. 2014 නොවැම්බර් 01 දින සිට විගණකාධිපති තනතුර පුරප්පාඩු වී තිබුණු අතර 2015 නොවැම්බර් 27 දින ස්ථිර වශයෙන් විගණකාධිපති වශයෙන් මා පත්කරන ලදී. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ක්‍රියාකාරී අංශයෙන් පමණක් නොව පරිපාලනය හා මූල්‍ය සම්බන්ධයෙන්ද විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා වැඩි බලතල විගණකාධිපතිවරයා හා ඔහුගේ කාර්යය මණ්ඩලයට ලබාදිය යුතු බව රජය පිළිගෙන තිබුණි. දිගු කාලයක් අපේක්ෂා කළ විගණන සේවා කොමිෂන් සභාව 2015 දෙසැම්බර් මාසයේදී ස්ථාපිත කරන ලදී. එම කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ පත්කිරීම්, උසස් කිරීම්, මාරුකිරීම්, කාර්ය මණ්ඩලය සේවයෙන් පහකිරීම් හා විනය පාලනය සිදුවිය යුතුව තිබුණි. නමුත් ජාතික විගණන පනත පාර්ලිමේන්තුවේ සම්මත කිරිම සඳහා ඉදිරිපත් නොවීම හේතුවෙන් ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයක් ස්ථාපිත කිරීමට නොහැකි වී ඇත. එබැවින් තවදුරටත් ශ්‍රී ලංකා විගණන සේවයේ හා විගණන පරීක්ෂක සේවයේ කටයුතු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉටු කරනු ලබයි. ශ්‍රී ලංකා විගණන සේවයේ හා විගණන පරීක්ෂක සේවයේ සාමාජිකයන් සිදුකරන ලද, සේවයේ වටිනා දායකත්වය අමාත්‍ය මණ්ඩලය හඳුනාගෙන තිබීම සහ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය නමින් අලුත් සේවයක් පිහිටුවීමට අනුමත කර තිබුණි. ඉහත සේවාවන් දෙකෙහි නිලධාරීන් නව ඒකීය සේවාවට අවශෝෂණය කිරීම විගණන සේවා කොමිෂන් සභාවට පැවැරී ඇත. අනෙක් ප්‍රධානතම වෙනස්කම වූයේ රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් හෝ සියයට

50 ක් හෝ ඊට වඩා වැඩි කොටස් හිමිකමක් ලබා ගෙන ඇති, සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගම්ද, විගණකාධිපතිවරයාගේ විෂයපථයට ඇතුළත් කිරීමය.

නීතිපතිවරයා, නීති කෙටුම්පත් සම්පාදකවරයා හා නොයෙකුත් ක්ෂේත්‍රයන්හි නිරත වෙනත් වෘත්තීයවේදීන් ගණනාවකගෙන් තොරතුරු විමසීමෙන් අනතුරුව දිගු කාලයක් අපේක්ෂා කළ ජාතික විගණන පනත කෙටුම්පත් කර ඇත. විගණකාධිපතිවරයාට වර්තමානයේ පවරා ඇති සීමිත අධිකාර බලය මුළු රාජ්‍ය අංශයම ආවරණය වන පරිදි තවදුරටත් ව්‍යාප්ත කිරීමට ඉන් යෝජනා කරයි. ගිණුම්කරණ හා විගණන වෘත්තියෙහි කොටසක් ලෙස ගොඩනැගෙන පීඩනය ඇතුළත්ව වඩා අභියෝගකාරී සහ නිරන්තරයෙන් වෙනස්වන පරිසරයකදී දෙපාර්තමේන්තුවේ ප්‍රතිසංවිධානය සිදුකිරීම ඉතා වැදගත් වේ. සියුම් අධීක්ෂණය හා විමර්ශනය සිදුකිරීමට හැකිවන පරිදි සහ විගණන විෂයය පථය පුළුල් කිරීමට හැකිවන පරිදි අංශ 59 ක් යටතේ විගණන හා සහායක සේවා සංවිධානය කරමින් ආයතනයේ සංවිධාන ව්‍යුහය පිළියෙල කර ඇත.

පාර්ලිමේන්තුවේ වැදගත් කාර්යභාරය සැළකිල්ලට භාජනය කිරීම් මෙන්ම රාජ්‍ය අංශය මුහුණදෙන ප්‍රධාන ගැටළු දෙපාර්තමේන්තුව හොඳින් අවබෝධකර ගැනීම සහතික කිරීමට විගණකාධිපති දෙපාර්තමේන්තුව මුල් පිරීම් රාශියක් ක්‍රියාවට නංවා ඇත. විගණන වාර්තා කාර්යක්ෂමව හා ඵලදායීව බෙදාහැරීම උදෙසා දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරිත්වය අඛණ්ඩව වර්ධනය කිරීමට හා සමාලෝචනය කිරීමට දෙපාර්තමේන්තුව බැඳී සිටී. අවසානයේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබාදී තිබුණ විගණන ස්වාධීනත්වය දෙපාර්තමේන්තුවේ ඵලදායීතාවයේ ප්‍රධාන සාධකය ලෙස ඉතා පැහැදිලි ලෙස හඳුනා ගෙන ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ රාජකාරියට කැපවූ කාර්යය මණ්ඩලය සමඟ වැඩකිරීමට ලැබීම මා ලැබුවාවූ ගෞරවයක් වන අතර ඔවුන්ගේ රාජකාරි කාර්යක්ෂමව තත්ත්වයෙන් ඉටුකිරීමට ඔවුන්ගේ කැපවීම සම්බන්ධයෙන් මම ඔවුන්ට ස්තුතිවන්ත වෙමි. රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති තුමන්ලා සහ සාමාජිකයන් පොදු වෘත්තීයේ යෙදෙන සහාය විගණනයන් සිදුකළ වරලත් ගණකාධිකාරිවරුන්ගෙන් සමන්විත ආයතන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය, විගණිත ආයතන, දෙපාර්මේන්තුවේ පරිපාලන කටයුතුවලදී සහයෝගය ලබාදුන් ජනාධිපති ලේකම්තුමා හා ඔහුගේ කාර්යය මණ්ඩලය, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා හා කාර්යය මණ්ඩලය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව සහ පරිපාලන කටයුතුවලදී සහාය වූ අනෙකුත් රජයේ ආයතන, දෙපාර්තමේන්තුවේ භෞතික හා මානව සම්පත් සංවර්ධනයට දායක වූ ජාත්‍යන්තර සංවර්ධන සමායතනයේ සහයෝගිතාවයට ස්තුතිවන්ත කිරීමටද මම මෙම අවස්ථාව යොදාගනිමි.

පොදු මහජනතාවගේ හා පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවයන් උදෙසා පවතින විගණනය පිළිබඳව සහතික වීමට මම දැඩිව උනන්දු වෙමි.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

2016 ඔක්තෝබර් 28 දින.

විගණකාධිපතිතුමා ධුරයේ වැඩ බාරගැනීම

2014 නොවැම්බර් 01 දින සිට පුරප්පාඩුව පැවැති විගණකාධිපති ධුරය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය පරිදි අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 40 වන විගණකාධිපතිවරයා වශයෙන් 2015 නොවැම්බර් 27 දින එච්.එම්.ගාමිණී විජේසිංහ වන මා වැඩ භාර ගන්නා ලදී.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී රාජ්‍ය පරිපාලන (විශේෂ) උපාධිධාරියෙකු හා කොරියානු ජනරජයේ කියුන් හී විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිධාරියෙකුද වන වන මා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකයෙකුද වේ.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවෙකුද, නියෝජ්‍ය කොමසාරිස්වරයෙකු, කොමසාරිස්වරයෙකු හා ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරයෙකු වශයෙන් කටයුතු කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රාජ්‍ය පරිපාලන විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වශයෙන් වසර 30 ක කාලයක් සේවය කරන ලදී.

රාජ්‍ය සේවයේ අත්දැකීම් මෙන්ම පෞද්ගලික අංශයේද සේවා අත්දැකීම්ද ලබා ගත් මා වරලත් ගණකාධිකාරී මැතිව් සහ සමාගමේ සේවය කර ඇති අතර විගණකාධිපති වශයෙන් පත්වීමට පෙර ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන්ද කටයුතු කරන ලදී.

පටුන

	පිටුව		පිටුව
අපේ සංවිධානය	**01**	ඉඩම්	121
නීත්‍යානුකූල ඉටු කිරීම	05	සංස්කෘතික හා කලා කටයුතු	125
අපගේ සංවිධාන සටහන	10	අධ්‍යාපනය	126
කාර්ය මණ්ඩල පුහුණුව	14	කම්කරු හා වෘත්තිය සමිති සබඳතා	135
සුදුසුකම්ලත් විගණකවරුන් සේවයේ යොදවා ගැනීම	15	පරිසරය	138
රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවට හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට සහායවීම.	16	විදේශ කටයුතු	140
විගණකාධිපති විසින් පනවන ලද අධිභාර	16	විදේශ සේවා නියුක්ති	142
විගණකාධිපතිවරයා විසින් සිදු කරනු ලබන කාර්යසාධන විගණනය	17	ධීවර හා ජලජ සම්පත් සංවර්ධනය	146
විශේෂ විමර්ශන විගණනය හා මහජන නියෝජන පිළිබඳ විගණන කටයුතු	30	සෞඛ්‍ය හා පෝෂණය	150
2015 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන	**37**	ජනමාධ්‍යය	161
විගණන නිරීක්ෂණවල සාරාංශය (ක්ෂේත්‍ර අනුව)	**51**	නීතිය හා සාමය	164
ඒකාබද්ධ අරමුදල	52	වරාය හා නාවික කටයුතු	166
රාජ්‍ය ආරක්ෂාව	72	මාර්ග ඉදිකිරීම් කටයුතු	171
රාජ්‍ය ව්‍යවසායන්	78	කාර්මික හා වෘත්තිය අධ්‍යාපනය	177
පළාත් පාලනය	89	ආපදා කළමනාකරණය	183
විදේශීය ආධාර ව්‍යාපෘති	92	ක්‍රීඩා කටයුතු	186
රාජ්‍ය බැංකු	97	කාන්තා හා ළමා කටයුතු	189
කෘෂිකර්මය	109	සංචාරක කටයුතු	196
වැවිලි කර්මාන්ත	113	නාගරික සංවර්ධනය	200

කර්මාන්ත හා වාණිජ කටයුතු	204	රජයේ සේවය සඳහා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ	258
නිවාස හා ඉදිකිරීම්	208	**පළාත් සභා විගණන නිරීක්ෂණවල සාරාංශය**	**263**
ප්‍රවාහනය	211	බස්නාහිර පළාත් සභාව	264
තරුණ කටයුතු	218	මධ්‍යම පළාත් සභාව	267
සමාජ සේවා හා සමාජ සවිබල ගැන්වීම	222	උතුරු මැද පළාත් සභාව	270
විද්‍යා, තාක්ෂණය හා පර්යේෂණ කටයුතු	226	දකුණු පළාත් සභාව	273
සන්නිවේදනය	230	නැගෙනහිර පළාත් සභාව	276
උසස් අධ්‍යාපනය	235	උතුරු පළාත් සභාව	279
බලශක්තිය	240	සබරගමුව පළාත් සභාව	281
ග්‍රාමීය ආර්ථික කටයුතු	249	වයඹ පළාත් සභාව	287
ජල සම්පාදන හා ජලාපවහනය	253	ඌව පළාත් සභාව	292
වාරිමාර්ග හා ජල සම්පත්	258		

අපේ සංවිධානය

අපේ දැක්ම

රාජ්‍ය ගණන්දීමේ වගකීම සහ යහපාලනය පෙර දැරි කර ගත් රාජ්‍ය අංශයේ මඟ පෙන්වන්නා වීම.

අපේ මෙහෙවර

තිරසාර සංවර්ධනයක් උදෙසා මනා මුල්‍ය කළමනාකරණ සහ රාජ්‍ය සම්පත් ප්‍රශස්ත ලෙස උපයෝජනය කිරීම තහවුරු කරනු වස්, විගණනය මෙහෙයවීම මගින් යහපාලනය සහ රාජ්‍ය ගණන්දීමේ වගකීම ප්‍රවර්ධනය කිරීම.

අපගේ අරමුණු

1. සම්පත්වල භාරකාරීත්වය පවරනු ලබන ආයතනවල කළමනාකරණයන් හා ඔවුන් හා පවරන ලද ගණන්දීමේ වගකීම ඉටුකර තිබේද යන්න ස්වාධීන පරීක්ෂණයක් සිදුකිරීම සහ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම.

2. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව යන නමින් හඳුන්වන පාර්ලිමේන්තුවේ අධීක්ෂණ කාරක සභා දෙක රාජ්‍ය ආයතනවල සිදුකරන කාර්යසාධනය පරීක්ෂා කිරීමට සහාය වීම.

3. විගණිත ආයතනවලට ඔවුන්ගේ ගිණුම් කටයුතුභාවය වර්ධනය කර ගැනීමට කළමනාකරණ වාර්තා නිකුත් කිරීම මගින් නිර්දේශ සිදුකර සහාය වීම.

අපේ වටිනාකම්

විශිෂ්ඨත්වය

නවෝත්පාදනය

නායකත්වය

අපගේ ඉතිහාසය

එවකට ලංකාව යනුවෙන් හැඳින්වුන ශ්‍රී ලංකාවේ වත්මන් විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ආරම්භය බ්‍රිතාන්‍ය යුගයේ මුල් කාල සීමාව තරම් ඈතට දිවේ. 1776 වර්ෂයේදී බ්‍රිතාන්‍යයන් විසින් දිවයින අත්පත් කර ගැනීමෙන් වසර 3 කට පසුව එනම්, 1779 වර්ෂයේදී සිසිල් ස්මිත් නමින් ගණකාධිකාරිවරයෙකු හා විගණකාධිපතිවරයෙකුව සිටි බව ලියකියවිලි වලින් සනාථ වේ. එතැන් පටන් ශ්‍රී ලංකාවේ උත්තරීතර විගණන ආයතනය වශයෙන් විගණකාධිපතිවරු 40 දෙනෙකු යටතේ ස්වාධීන ආයතනයක් ලෙස විගණකාධිපති දෙපාර්තමේන්තුව අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

විගණන සම්බන්ධව අපේ අධිකාර බලය

රාජ්‍ය අංශයේ ආයතනවල ගිණුම් විගණනය කිරීමට විගණකාධිපතිවරයාට අධිකාර බලය මූලික වශයෙන් ලැබෙනුයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවෙනි.

සමාගමේ කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනක් විසින් දරනු ලබන සමාගම් පනත යටතේ පිහිටුවා ඇති සමාගම්ද, ආවරණය වන පරිදි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ බලය තවදුරටත් පහත පරිදි පුළුල් කර ඇත.

''විගණකාධිපතිවරයා විසින් ආණ්ඩුවේ සියලු දෙපාර්තමේන්තු, ජනාධිපතිවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය, අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ කාර්යාලය, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන්ගේ කාර්යාල, අධිකරණ සේවා කොමිෂන් සභාව , ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව, 41 (ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් කොමිෂන් සභා, පරිපාලනය පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා, පාර්ලිමේන්තු මහ ලේකම්වරයා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළඳ ව්‍යාපාර, වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සමාගමක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම්ද ඒවායේ ගිණුම් ඇතුළුව විගණනය කරනු ලැබිය යුත්තේය.''

පහත අණපනත් මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් විගණකාධිපති වෙත පවරා ඇති බලය විකාශනය කිරීමක් හෝ ප්‍රසාරණය කිරීමක් හෝ කර තිබේ.

- රාජ්‍ය සංස්ථා සඳහා විගණන විධිවිධාන සළසන 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටස
- පළාත් සභා සඳහා විගණන විධිවිධාන සලසන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 වගන්තිය
- මහ නගර සභා සඳහා විගණන විධිවිධාන සලසන මහ නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 219 වගන්තිය
- නගර සභා සඳහා විගණන විධිවිධාන සලසන නගර සභා ආඥාපනතේ (255 අධිකාරය) 181 වගන්තිය
- ප්‍රදේශීය සභා සඳහා විගණන විධිවිධාන සලසන 1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ 172 වගන්තිය
- ගොවිජන සංවර්ධන සභා සඳහා විගණන විධිවිධාන සලසන 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන සභා පනතේ 58 වගන්තිය
- ක්‍රීඩා සංගම් සඳහා විගණන විධිවිධාන සලසන 1993 අංක 47 දරන ක්‍රීඩා සංගම් පනතේ 9 වගන්තිය

පාර්ලිමේන්තුව විසින් අවශ්‍යතාවයක් ලෙස සම්මත කරන ලද මොනයම් හෝ නීතියකින් සඳහන් කරන කවර හෝ වෙනත් රාජකාරි කරගෙන යාමට විගණකාධිපතිවරයා සතු බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ද පවරනු ලැබේ. විගණකාධිපතිවරයාගේ කටයුතු හා රාජකාරි ඉටුකිරීමේදී හා පැවරීමේදී ඔහුගේ රාජකාරියට සහායවීමට සුදුසුකම්ලත් විගණකවරුන්ගේ සේවය ලබාගැනිමට විගණකාධිපතිවරයාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය දී ඇත. තවද විගණනයට

අදාළ වන තාක්ෂණ, වෘත්තීය හා විද්‍යාත්මක ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා විශේෂඥ සහාය ලබාගැනීමට අවශ්‍ය විධිවිධාන සලසා තිබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(5) ව්‍යවස්ථාවෙන් විගණකාධිපතිවරයා ඔහුගේ රාජකාරි කටයුතු සිදුකිරීමේදී හා පැවරීමේදී සියලු පොත්පත් හා වාර්තා ඉහතින් සඳහන් කරන ලද ආයතනවල හෝ රාජ්‍ය ආයතනවල ගබඩා හා වෙනත් දේපලවලට පිවිසීමට විගණනයන් සිදුකිරීම හා අවශ්‍ය විය හැකි තොරතුරු හා කරුණු පැහැදිලි කිරීම් ලබාගැනීමට විධිවිධාන සලසා ඇත.

අපගේ සේවා ග්‍රාහකයෝ

විගණකාධිපතිවරයාගේ විෂය පථය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම නිර්වචනය කරන අතර තවදුරටත් එය දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සමාගම් ද ඇතුළත් කරමින් ව්‍යාප්ත කර තිබේ. වර්තමානයේදී අපගේ සේවාලාභී පදනම පහත සඳහන් පරිදි වේ.

අමාත්‍යාංශ	50
දෙපාර්තමේන්තු	95
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	25
සංස්ථා	163
රාජ්‍ය සමාගම් (දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් විගණකාධිපතිවරයාගේ විෂය පථයට යටත් කර ඇති)	134
විශ්වවිද්‍යාල, පශ්චාත් උපාධි ආයතන, පර්යේෂණ හා අනෙකුත් පුහුණුකිරීම් ආයතන	75
රාජ්‍ය බැංකු	08
ව්‍යවස්ථාපිත හා අනෙකුත් අරමුදල්	77
විදේශ අරමුදල් ව්‍යාපෘති	128
අනෙකුත් ස්වාධීන ආයතන	19
පළාත් සභා	09
පළාත් පාලන ආයතන	335
ගොවිජන සේවා මධ්‍යස්ථාන	559
ක්‍රීඩා සංගම්	46

අපගේ විෂය පථය

විගණකාධිපති විසින් ඔහුගේ අභිමතය පරිදි විගණන විෂය පථය තීරණය කරනු ලබන අතර මේ සම්බන්ධයෙන් 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනතේ විධිවිධාන ප්‍රකාරව හඳුන්වා දී ඇති දැනට භාවිතයේ පවතින විගණන ප්‍රමිති සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ICASL), උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (INTOSAI) හා උත්තරීතර විගණන ආයතන පිළිබඳ ආසියානු සංවිධානය (ASOSAI) විසින් අනුගමනය කරනු ලබන විගණනයට අදාළ සම්මුති සහ ප්‍රශස්ත පරිචයන් මගින් සහ පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (COPA) සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) විසින් විගණකාධිපති වෙත මඟ පෙන්වනු ලබයි.

මෙයට අමතරව රාජ්‍ය සංස්ථා සම්බන්ධයෙන් විගණකාධිපති විසින් සලකා බලා තීරණය කළයුතු විගණන විෂය පථය 1971 අංක 38 දරන මුදල් පනත මඟින් වඩා සවිස්තරාත්මකව දක්වා ඇත. ඒ අනුව විගණකාධිපති විසින් සංස්ථාවේ කළමනාකරණය වෙත විස්තරාත්මක වාර්තාවක් , සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කිරීම සඳහා වන

වාර්තාවක් සහ පාර්ලිමේන්තුවට වෙනම ඉදිරිපත් කරනු ලබන විගණන වාර්තාවක් වශයෙන් වාර්තා 03 ක් නිකුත් කරනු ලබයි. මුදල් පනතේ විස්තර කර දක්වා ඇති පරිදි හැකිතාක් සහ අවශ්‍යවන ප්‍රමාණයකට විගණන විෂය පථයට පහත කරුණු ඇතුළත් විය යුතුය.

- තොරතුරු ඉදිරිපත් කිරීමේ අංශයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි සංවිධාන ක්‍රම, කාර්ය පටිපාටි, පොත්, වාර්තා හා වෙනත් ලියකියවිලි නියමිත අන්දමට හා ප්‍රමාණවත් ලෙස සකස් කර තිබේද යන බව සහ එවැනි ක්‍රම, කාර්ය පටිපාටි, පොත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායීව ක්‍රියාත්මකව පවතීද යන බව;
- රාජ්‍ය සංස්ථාවේ වැඩ කටයුතු එම රාජ්‍ය සංස්ථාවට අදාළ නීති, රීති හා නියෝග අනුව වූයේ ද සංස්ථාවේ පරිපාලනයෙහිලා සාධාරණත්වයක් තිබේද යන බව;
- අරමුදල් වෙන්කිරීමේදී හා එම අරමුදල් උපයෝජනය කිරීමේදී ආර්ථිකභාවයෙන් හා කාර්යක්ෂමතාවයෙන් ඉටු කර තිබේද යන බව;
- මුදල් තබා ගැනීමේ හා දේපල ආරක්ෂා කිරීමේ ක්‍රම සතුටුදායකද යන බව;
- සැලැකිල්ලට භාජනය වූ කාලපරිච්ඡේදයට අදාළව විගණනයට භාජනය කරන ලද ගිණුම් සංස්ථාවේ කටයුතු පිළිබඳව සත්‍ය හා සාධාරණ දර්ශනයක් පිළිබිඹු කෙරෙන පරිදි ගණකාධිකරණය, මූල්‍යනය හා තක්සේරු කිරීම යන මූලධර්මයන්ට නිසි සැලැකිල්ල යොමු කරමින් පිළියෙල කර තිබේද යන බව සහ
- විගණකාධිපති විසින් අවශ්‍යයැයි සලකනු ලැබිය හැකි වෙනයම් කරුණු.

අපගේ ස්වාධීනත්වය

විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම පුළුල් වශයෙන් සහතික කර ඇත. දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් උත්තරීතර විගණන ආයතනයක ස්වාධීනත්වය මත පදනම් වූ උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ මූලික මූලධර්මයන් සමග ගැලපීමට මෙය තවදුරටත් විකාශනය කරනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාව අනුව ,

''විගණකාධිපතිවරයෙක් වන්නේය. ඔහු සුදුසුකම්ලත් විගණකවරයෙකු විය යුතු අතර, ජනාධිපතිවරයා විසින් ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව පත්කරනු ලබන අතර විගණකාධිපතිවරයා යථා පැවැත්මෙන් සිටිනතාක් ස්වකීය ධූරය දරන්නේය.''

අයහපත් සෞඛ්‍ය තත්ත්වය හෝ ආබාධිත තත්ත්වය මත හෝ ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව ඇමතීමත් යන තත්ත්වයන්හීදී පමණක් ජනාධිපතිවරයා විසින් විගණකාධිපතිවරයා ධූරයෙන් ඉවත් කරනු ලබයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාවේ තවදුරටත් දැක්වෙන පරිදි විගණකාධිපතිවරයාගේ වැටුප පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන අතර, එසේ නිශ්චය කරන ලද වැටුප ඒකාබද්ධ අරමුදලට වැය බරක්වනු ලබන අතර ඔහුගේ ධූර කාලය තුළ එය අඩු නොකළ යුතුය.

විගණකාධිපති කිසිදු අමාත්‍යවරයෙකුගේ හෝ රජයේ නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතට නොගැනේ.

නීත්‍යානුකූල ඉටු කිරීම

නීත්‍යානුකූල ඉටුකිරීම් සඳහා අවශ්‍යතාවය

විගණකාධිපතිවරයාගේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ස්වාධීනත්වය මේතාක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් සුරක්ෂිත කර තිබුණද, විගණකාධිපතිවරයාගේ මූල්‍ය හා පරිපාලන ස්වාධීනත්වය පවත්නා ව්‍යවස්ථාව හා නීතිමය විධිවිධාන මත විධායකය විසින් සීමා කිරීම් සිදුකර ඇත. විගණකාධිපතිවරයා කිසිදු පුද්ගලයෙකුගේ හා ආයතනයක සියලු බැඳීම්වලින් නිදහස් විය යුතු අතර අත්තනෝමතික පළිගැනීම්වලින් තොරවිය යුතු නිසා මූල්‍ය හා මිනිස් බලය යන දෙවර්ගයෙන් දැක්වෙන ඔහුගේ සම්පත් සඳහා විගණකාධිපතිවරයා විධායකයේ රඳාපැවැත්ම පාර්ලිමේන්තුව වෙනුවෙන් සිදුකරන ලද විගණනයේ ස්වාධීනත්වය සැබවින්ම හානියට ලක්වන බව පිළිගනී. මූල්‍ය පරිපාලන ස්වාධීනත්වය ඇතුළුව විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා නීතිමය විධිවිධාන මඟින් වැඩි ආරක්ෂාවක් පාර්ලිමේන්තුව විසින් සැලසිය යුතු වේ. වර්තමානයේදී විගණකාධිපතිවරයා ඔහුගේ වියදම් සඳහා මහා භාණ්ඩාගාරයේ සහයෝගය තුළ යැපීම සිදුවන අතර දෙපාර්තමේන්තුවට සම්පත් වෙන්කිරීම දෙපාර්තමේන්තුව මුහුණ දෙන අවදානමට ගැලපෙන පරිදි සිදු නොවේ. අනෙකුත් උසස් පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල්වල පරිදි ශ්‍රී ලංකාවේ විගණකාධිපති සඳහා වූ අයවැය, ව්‍යවස්ථාදායක සම්පාදක කමිටුවක් විසින් සියුම් පරීක්ෂණයකට යටත්ව අනුමත කර හෝ ඔහුගේ අයවැය පිළිබඳ විධායක පාලනයට එරෙහි වූ කිසිදු ආරක්ෂාවක් හෝ සලසා නොමැත.

විගණකාධිපතිවරයාගේ හා ඔහුගේ කාර්ය මණ්ඩලයේ පරිපාලන ස්වාධීනත්වය සුරක්ෂිත කිරීමට අවශ්‍ය වේ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ පත්කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, විනය ක්‍රියාමාර්ග, වැටුප් සහ කාර්ය මණ්ඩලයේ වෙනත් පරිපාලන කටයුතු සම්බන්ධයෙන් වූ පරිපාලනමය කරුණු පිළිබඳ පාලනය ප්‍රථමයෙන් ජනාධිපති ලේකම් වෙත පැවරී තිබුණු අතර, පසුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහහත්වෙනි සංශෝධනයට අනුව එම බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව (PSC) වෙත පැවරී ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විගණකාධිපතිවරයා වෙත සම්පූර්ණ වශයෙන් බලතල පැවරීමක් කර නොමැති හෙයින් ප්‍රවර්තන වැඩ පිළිවෙල යටතේ වුවද, විගණකාධිපතිට තම කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සඳහා පත් කිරීමේදී ගැටලුවලට මුහුණ පෑමට සිදු වී ඇත. විශේෂිත ආයතනයක් වූ අධිකරණ සේවා කොමිෂන් සභාවේ විෂය සීමාව යටතට එන අධිකරණ සේවය පරිදි භුක්ති විඳිය යුතු ස්වාධීනතාවය පිළිබඳ දෘෂ්ටිකෝණයෙන් බලන කළ විගණන සේවය විශේෂ සේවාවක් වේ.

තවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිදි විගණකාධිපති "රාජ්‍ය නිලධාරීන් පිළිබඳ විශේෂිත ලැයිස්තුවට" ඇතුළත් කර නොතිබුණු අතර, ආයතන සංග්‍රහයේ විස්තර කර ඇති පරිදි රජයේ සියලුම පරිපාලන රෙගුලාසි විගණකාධිපතිට හා ඔහුගේ කාර්ය මණ්ඩලයට අදාළවේ. මෙය තවදුරටත් විගණකාධිපතිගේ පරිපාලන ස්වාධීනතාවය සීමා කිරීමක් වේ. ඔහුගේ රාජකාරි පිළිබඳ මෙම පරිපාලනමය පාලන අඩුපාඩුව විගණන කටයුතුවලට සැලකිය යුතු ලෙස අවහිර කිරීම් කළ අවස්ථා බොහෝමයක් විය.

එක්සත් ජාතීන්ගේ උත්තරීතර විගණන ආයතනයන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (INTOSAI) 1977 දි අනුමත කළ "ලීමා ප්‍රකාශනය" මගින් ශිල්ප ක්‍රම හා වෘත්තීමය වශයෙන් රාජ්‍ය විගණනයේ ස්වාධීනත්වය

පිළිබඳව මූලධර්ම කෙරෙහි අවධානය යොමු කර ඇත. වසර 30 කට පසුව උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ XIX සම්මේලනයේදී (2007 මැක්සිකෝව) "මැක්සිකෝ ප්‍රකාශනය" මගින් රාජ්‍ය අංශයේ මනා විගණනයක් සඳහා උත්තරීතර විගණන ආයතනයන්ගේ ස්වාධීනතාවය පිළිබඳව ස්ථිර වශයෙන් වන පහත සඳහන් පරිදි ප්‍රධාන අත්‍යවශ්‍ය අවශ්‍යතා 8 ක් හඳුනාගෙන ඇත.

1. අර්ථාන්විත සහ ඵලදායී ව්‍යවස්ථාපිත නෛතික රාමුවක පැවැත්ම සහතික කිරීම සඳහා හා එහි තත්ත්වාකාර ව්‍යවහාරය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවල හා නීතිවල, උත්තරීතර විගණන ආයතනවල ස්වාධීනතාවය පැහැදිළිවම අර්ථ දැක්වීම.

2. උත්තරීතර විගණන ආයතනයන්ට රජයේ හෝ එහි අධිකාරීන්ගේ බලපෑමෙන් තොරව, අවශ්‍ය සාධාරණ මිනිස් සම්පත්, ද්‍රව්‍ය හා මූල්‍යමය සම්පත් තිබිය යුතු අතර, තමන්ගේ අයවැය ඇස්තමේන්තුව හැසිරවීමට බලය තිබිය යුතුය.

3. උත්තරීතර විගණන ආයතනයේ ප්‍රධානියා හා අනෙකුත් සාමාජිකයින් පත්කිරීම සඳහා කොන්දේසි ව්‍යවස්ථාවේ සඳහන් විය යුතුය. උත්තරීතර ආයතනයන්ගේ ප්‍රධානියා හෝ අනෙකුත් සමාජිකයින්ගේ ස්වාධීනතාවය ඔවුන්ගේ පත්වීම ප්‍රමාණවත් දිගු කාලයකට හෝ ස්ථිර කොන්දේසි මත සිදුකිරීම හා ඉවත්කිරීම විධායකයේ බලපෑමෙන් තොර බවට සහතික විය යුතුය.

4. උත්තරීතර විගණන ආයතනයක් තමාගේ බලවරම ඵලදායීව ඉටු කිරීම සඳහා විගණන විෂය කරුණු තෝරා ගැනීම, ඔවුන්ගේ විගණන කටයුතු සැලැසුම් කිරීම, විගණන ශිල්ප ක්‍රම ක්‍රියාත්මක කිරීම මෙන්ම ඔවුන්ගේ විගණනය ක්‍රියාත්මක කිරීම, කාර්ය මණ්ඩලය සංවිධානය කිරීම හා කළමනාකරණය කිරීම සඳහා ස්වාධීනතාවයක් තිබිය යුතුය. ව්‍යවස්ථාදායකයේ හෝ විධායකයේ හෝ මෙහෙයවීමකින් හෝ බලපෑමකින් තොරව ඔවුන්ගේ බලවරම ක්‍රියාත්මක කිරීමට මේ මගින් ඉඩ සැලසේ.

5. විගණන ආයතනවලට ඔවුන්ගේ වගකීම මනා ලෙස ඉටු කිරීම සඳහා ඔවුනට අවශ්‍ය විය හැකි සියලු ආකාරයේ ලියවිලි සහ තොරතුරුවලට ප්‍රවේශවීමේ නිදහසක්, කාලයක් සහ සීමා කිරීම්වලින් තොර වූ හිමිකමක් තිබිය යුතුය.

6. උත්තරීතර විගණන ආයතන අවම වශයෙන් වර්ෂයකට වරක්වත් ඔවුන්ගේ විගණන වැඩවල ප්‍රතිඵල පිළිබඳව වාර්තා කළ යුතුය. කෙසේ වුවද අවශ්‍යයැයි සළකනු ලබන්නේ නම්, නිරන්තර වාර්තා කිරීමේ නිදහස ඇත.

7. විගණන වාර්තාවල අන්තර්ගතය තීරණය කිරීම සහ විධිමත්ව සහාගත කිරීම සඳහා යෝග්‍ය අධිකාරියකට, එම වාර්තා භාරදුන් පසු එම වාර්තා ප්‍රසිද්ධ කිරීමට සහ බෙදාහැරීමට උත්තරීතර විගණන ආයතනයන්ට නිදහස තිබිය යුතුය.

8. විගණිත ආයතන විගණන නිගමන හා නිර්දේශවලට නිවැරදිව යොමුවී තිබේද හා නිවැරදි පියවර ගනු ලබනවාද යන්න පිළිබඳව පසු විපරම් කිරීමේ ස්වාධීන ක්‍රියාවලියක් උත්තරීතර විගණන ආයතනවලට තිබිය යුතුය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ විගණකාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලය නොව, විගණකාධිපතිවරයා බැවින් වෙනත් රටවල මෙන්ම වෙනමම විගණන පනතක් මගින් විගණකාධිපති දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ කටයුතු සහ අධිකාරය විස්තර කිරීමට අවශ්‍ය වේ.

විගණකාධිපතිවරයාට පරීක්ෂා කළ හැකිවනුයේ රාජ්‍ය ආයතනවල කටයුතු පමණක්ය. කෙසේ වුවද, සම්පූර්ණයෙන් හෝ කොටසක් අයිති, සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද රාජ්‍ය සමාගම් විගණකාධිපතිවරයාගේ විෂය පථයට නොගැනේ. කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 50 ක් හෝ ඊට වඩා වැඩි ප්‍රතිශතයක් මහා භාණ්ඩාගාරයෙන් හෝ රාජ්‍ය ව්‍යාපාර ආයතනයෙන් ප්‍රාග්ධනය ලෙස යොදවන රාජ්‍ය සමාගම් 200 කට වඩා වැඩි ප්‍රමාණයක් පවතියි. රාජ්‍ය ව්‍යාපාර විසින් සැලකිය යුතු සමාගම් සංඛ්‍යාවක් පිහිටුවා ඇත. තවද, රාජ්‍ය ආයතනයකින් අරමුදල් ලැබුණු සංවිධානද ඇතුළුව පෞද්ගලික සංවිධාන විමර්ශනය කිරීමට විගණකාධිපතිවරයාට නොහැකි වී ඇත.

දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ 153 හා 154 ව්‍යවස්ථාවන්ට සිදුකළ සංශෝධන

විගණකාධිපතිවරයා විසින් මුහුණ දුන් පරිපාලන හා මූල්‍ය ස්වාධීනත්වයේ අඩුපාඩු මඟ හැරීම සඳහා පහත සඳහන් සංශෝධනයන් දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදු කර ඇත. රාජ්‍ය විගණනය නවීකරණය කරමින් තවදුරටත් ප්‍රතිසංස්කරණයන් විගණන පනත් කෙටුම්පතෙහි ඇතුළත් කර ඇත.

- විගණකාධිපතිවරයා සුදුසුකම්ලත් විගණකවරයෙකු විය යුතු අතර, ජනාධිපතිවරයා විසින් ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව පත්කරනු ලබන්නේය. විගණකාධිපතිවරයා යථා පැවත්මෙන් සිටිනතාක් ස්වකීය ධූරය දරන්නේය.
- විගණකාධිපතිවරයා සභාපතිත්වය දරන විගණන සේවා කොමිෂන් සභාවක් පිහිවනු ලැබේ. නියෝජ්‍ය විගණකාධිපති හෝ නියෝජ්‍ය විගණකාධිපතිවරයාගේ ශ්‍රේණියට ඉහළින් වූ ධූරයක් උසුලන ලද විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විශ්‍රාමලත් නිලධරයන් දෙදෙනෙකු, ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ හෝ මහාධිකරණයේ විශ්‍රාමලත් විනිශ්චයකාරවරයෙකු සහ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමලත් I වන පන්තියේ නිලධරයෙකු අනෙකුත් සාමාජිකයන් වනු ඇත. ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශයන්ට යටත්ව වර්ෂ 03 ක ස්ථිර කාලපරිච්ඡේදයකට කොමිෂන් සභාවේ සාමාජිකයන් ජනාධිපතිවරයා විසින් පත්කරයි.
- ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සමාජිකයන්ගේ බඳවාගැනීම්, උසස්කිරීම්, මාරුකිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහකිරීමේ බලය කොමිෂන් සභාව වෙත පැවරීමෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුවේ පරිපාලන ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම.
- රජය විසින් රාජ්‍ය සමාගමක් විසින් හෝ පළාත් පාලන ආයතනයක් විසින් සමාගම් පනත යටතේ ලියාපදිංචි සමාගමක කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 50 කට වැඩි හිමිකමක් ඇති රාජ්‍ය සමාගම් සියල්ලේ විගණනය විගණකාධිපතිවරයාගේ විෂයය පථය යටතට ගැනේ.

- විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනිමට ''රාජ්‍ය නිලධාරියා'' යන නිර්වචනයෙන් ඉවත් කරයි.
- විධායකගේ කිසිදු මැදිහත්වීමකින් තොරව විගණකාධිපතිවරයාගේ කටයුතු සිදුකිරීමට ප්‍රමාණවත් අරමුදල් සපයන බවට සහතික කර ගැනීමට විගණන සේවා කොමිෂන් සභාව විසින් පිළියෙළ කරන ජාතික විගණන ආයතනයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තු පාර්ලිමේන්තුව විසින් නිශ්චය කිරීම

යෝජිත ජාතික විගණන පනත් කෙටුම්පත

රාජ්‍ය මූල්‍ය පිළිබඳ පාර්ලිමේන්තු පාලනය ශක්තිමත් කිරීමට, රාජ්‍ය සම්පත් භාවිතා කිරීම පිළිබඳ වාර්තා කිරීමේ ගිණුම් කටයුතුභාවය සහතික කිරීමේ විගණකාධිපතිවරයාගේ කටයුතු, අධිකාර බලය සහ ස්වාධීනත්වය වැඩි කිරීමට, රාජ්‍ය සම්පත් භාවිතා කිරීමේදී පිරිමැසුම්බව, කාර්යක්ෂමතාවය ඵලදායිතාවය ඉහළ නැංවීමට අධිකාර බලය ඔප්නංවමින් විගණන කෙටුම්පත් පනතක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. ජාතික විගණන පනත් කෙටුම්පත නීතිපතිවරයා සහ නීති කෙටුම්පත්වරයාගෙන් උපදෙස් ලබා ගැනීමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර මහජන අදහස් සඳහා ගැසට් පත්‍රයේ පල කරනු ඇත.

ඉහතින් දක්වන ලද ජාතික විගණන පනත් කෙටුම්පතේ සඳහන් ප්‍රධාන ලක්ෂණ පහත පරිදි වේ.

- ගිණුම්, මූල්‍ය, මූල්‍ය තත්ත්වය, රාජ්‍ය අරමුදල්වල මූල්‍ය පාලනය, විගණන ආයතනවල දේපල පරීක්ෂාව සහ කාර්යසාධන විගණනයක් සිදුකිරීමට හැකිවෙන ලෙසට ඔවුන්ගේ ගිණුම්කටයුතුභාවය, තාක්ෂණික විගණනයන් සිදුකිරීමට විගණකාධිපතිවරයාට හැකිවන පරිදි විෂය පථය වැඩිකිරීමට අපේක්ෂා කරයි.
- මහජනයා අතරින් යම්කිසි පුද්ගලයෙකු විසින් විගණිත ආයතනයක් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද යම්කිසි ගැටළුවක් විමර්ශනය කිරීමට සහ ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කිරීම විගණකාධිපතිවරයාගේ අභිමතානුසාරී බලය පරිදි සිදු කිරීම.
- 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත යටතේ පිහිටුවන ලද විගණන ප්‍රමිති කමිටුව විසින් තීරණය කරන ලද ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ජාතික විගණන කාර්යාලය විසින් බාරගනු ලබන අතර එය සියලු විගණනයන්ට අදාළ වේ.
- විගණකාධිපතිවරයාට හෝ අධිකාර බලයලත් නිලධාරියෙකුට සහාය නොදැක්වීම වරදක් වන බවට පනතෙහි විධිවිධාන සළසා තිබේ.
- රහස්‍යභාවය නොසළකා, ලිඛිත හෝ ඉලෙක්ට්‍රොනික වාර්තා, පොත්, ලියවිලි හෝ තොරතුරුවලට පිවිසීමේ ඉඩකඩ සළසාලමින් විගණකාධිපතිවරයාගේ බලතල පුළුල් කර ඇත.
- ඕනෑම පුද්ගලයෙකුගේ හෝ ආයතනයක හෝ ගිණුම් විගණනය කර විගණන පිරිවැය අයකර ගැනීමට විගණන ගාස්තුවක් නියම කිරීමට විගණකාධිපතිවරයාට අධිකාර බලය දෙනු ලැබේ.

- විගණකාධිපතිවරයාගේ මතය පරිදි ගනුදෙනුවක් කවර හෝ නීතියකට, රෙගුලාසියකට හෝ රීතියකට පටහැනිව කර තිබීමෙන් එම ගනුදෙනුවට අදාල වූවන්ගේ වංචාව, නොසැලකිල්ල, දූෂණය හෝ විෂමාචාරය හේතුවෙන් අඩුවක් හෝ පාඩුවක් සිදුවන අවස්ථාවකදී හෝ ඇතුළත් කළ යුතු කවර වූ හෝ ගනුදෙනුවක් ගිණුම්වලින් අත්හැර තිබෙන අවස්ථාවකදී එවැනි සියලු ගනුදෙනුවල මූල්‍ය හෝ වෙනත් වටිනාකම, ප්‍රතික්ෂේප කිරීමට විගණකාධිපතිවරයාට හැකි වන්නේය. එවැනි ගනුදෙනුවට අදාල මුළු වටිනාකම අධිභාර කිරීමේ බලතල විගණකාධිපතිවරයාට ලබාදෙනු ලැබේ. එකී ගනුදෙනුවේ වටිනාකම එයට වගකිවයුතු පුද්ගලයන්ගෙන් වෙන් වෙන්ව හෝ සාමූහික වන පරිදි අධිභාර කිරීමට විගණකාධිපතිවරයාට හැකිය.

- අධිභාරයන් පැනවීම සම්බන්ධයෙන් අතෘප්තියට පත් පුද්ගලයෙකුට, එයට එරෙහිව විගණන සේවා කොමිෂන් සභාවට අභියාචනා කිරීමට අයිතිවාසිකම් තිබේ. කොමිෂන් සභාව අවසාන තීරණය ගනු ලැබේ.

- වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා කාලරාමු නියම කිරීම.

- රටේ උත්තරීතර විගණන ආයතනය ලෙස ජාතික විගණන කාර්යාලයක් පිහිටුවනු ලැබේ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සියලු විගණන කාර්ය මණ්ඩලය ජාතික විගණන කාර්යාලයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

- ජාතික විගණන කාර්යාලය විගණනය කිරීමට සුදුසුකම්ලත් ස්වාධීන විගණකවරයෙකු කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන අතර, එම වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.
- මේ පනත මඟින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම් නියම කරනු ලැබේ.

- අභ්‍යන්තර විගණනයේ පැවැත්ම සහ කර්තව්‍යන් මේ පනත මඟින් නිර්වචනය කරනු ලැබේ.

- ජනරජයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම අවධාරණය කර තිබේ.

- විගණන හා කළමනාකරණ කමිටුවල පැවැත්ම සහ ඒවායේ සඵල ක්‍රියාකාරීත්වය අවධාරණය කර තිබේ.

- විගණකාධිපතිවරයාට තොරතුරු සපයන පුද්ගලයින්ගේ ආරක්ෂාව තහවුරු කර තිබේ.

- විගණකාධිපතිවරයා විසින් හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකු විසින් අවංක විශ්වාසයෙන් හෝ එකී අදහසින් යුක්තව සිදු කරනු ලබන කිසිදු කටයුත්තකින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඉටු කරනු ලබන පූර්ව නීතිමය කටයුත්තකට එරෙහිව පැනනගින නීතිමය පියවරයන්ගෙන් ඔවුන් නිදහස් කරනු ලැබේ.

අපගේ සංවිධාන සටහන

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විගණකාධිපතිවරයා වන අතර දෙපාර්තමේන්තුවේ මූලායමය කටයුතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියෙකු ලෙසද කටයුතු කරනු ලබයි. දෙපාර්තමේන්තුවේ වර්තමාන සංවිධාන ව්‍යුහය මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති කාර්ය මණ්ඩලය හා අනුකූලවන පරිදි එක් එක් මට්ටම්වල රැඳුණු නිශ්චිත නිලධාරීන් සංඛ්‍යාවකින් සැදුම්ලත් ධුරාවලි 4 කින් සමන්විත වේ.

පළමු මට්ටම අතිරේක විගණකාධිපතිවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන් විසින් මධ්‍යම රජයේ හා පළාත් සභාවල විගණන කටයුතු සිදු කරනු ලැබේ.

දෙවැනි මට්ටම අංශ 52 කින් සමන්විත වන අතර නියෝජ්‍ය විගණකාධිපතිවරයා හෝ සහකාර විගණකාධිපතිවරයා එකී අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කරනු ලබයි. මෙම අංශ ප්‍රධානීන් වෙත පැවරෙන විගණන “ශාඛා” වන්හි ප්‍රධානත්වය “ශාඛා ප්‍රධානී” ලෙස විගණන අධිකාරිවරයෙකු හෝ විගණන පරීක්ෂක සේවයේ ජ්‍යෙෂ්ඨ තම නිලධාරියෙකු විසින් ඉටු කරනු ලබන අතර ඔහුට නිශ්චිත විගණන ආයතන සංඛ්‍යාවක් පවරා ඇත. ඔවුන් තුන්වන මට්ටමට අයත් වේ. ඒ අනුව නිශ්චිත ලෙස තම අධීක්ෂණයට ගැනෙන විගණන ශාඛා ක්‍රියාත්මක විය යුතු ආකාරය කළමනාකරණය කිරීම හා අධීක්ෂණය පිළිබඳ සම්පූර්ණ වගකීම අංශ ප්‍රධානීන්ට පැවැරේ. ශාඛා ප්‍රධානීන් වෙත අනුයුක්ත කරනු ලැබ ඇති විගණන පරීක්ෂක සේවයේ නිලධාරීන් කාර්යක්ෂව හා ඵලදායිව සේවයේ යොදවා ඔවුන් වෙත පවරා ඇති රාජ්‍ය ආයතනවල විගණනයන් ක්‍රියාත්මක කරවීම අපේක්ෂා කර ඇත.

ඒ අනුව ශාඛා ප්‍රධානීන්ට සහයවන එම නිලධාරීන් සිව්වන මට්ටමට අයත් වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති, ව්‍යවස්ථාපිත සහ වෙනත් නීතිමය අවශ්‍යතාවන්ට හා පරිචයන්ට අනුකූල වන පරිදි පරීක්ෂණ, නිරීක්ෂණ සහ ක්ෂේත්‍ර රාජකාරී සිය අනුමත වැඩසටහන්වලට අනුකූල වන පරිදි ඉටු කිරීම මගින් ඔවුන් වෙත පවරා ඇති රාජ්‍ය ආයතනවල ගිණුම් විගණනය ක්‍රියාත්මක කරමින් සිය ශාඛා ප්‍රධානීන්ට සහය වේ. ඉහත සඳහන් දෙවන මට්ටමට අයත්වන අංශ 52 ක අංශ ප්‍රධානීන්ගෙන් අංශ නවයක ප්‍රධානීන් 12 දෙනෙකු පළාත් මට්ටමින් ප්‍රාදේශීය කාර්යාල භාරව කටයුතු කරනු ලැබේ.

දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු අධ්‍යක්ෂ (පරිපාලන) යටතේ වන ආයතන ශාඛාවෙන්ද, මූල්‍ය කටයුතු ප්‍රධාන ගණකාධිකාරී යටතේ ගිණුම් අංශයෙන්ද සිදු කරනු ලබයි.

විගණකාධිපති
මධ්‍යම රජය
පළාත් සභා
අතිරේක විගණකාධිපති CGSE
අතිරේක විගණකාධිපති
අතිරේක විගණකාධිපති PZIA
අධ්‍යක්ෂ පාලන
ප්‍රධාන ගණකාධිකාරී
නියෝජ්‍ය විගණකාධිපති EDU
නියෝජ්‍ය විගණකාධිපති HED
නියෝජ්‍ය විගණකාධිපති SUR
නියෝජ්‍ය විගණකාධිපති DEF
නියෝජ්‍ය විගණකාධිපති LOR
සහකාර විගණකාධිපති NNP-1
නියෝජ්‍ය විගණකාධිපති PLA
නියෝජ්‍ය විගණකාධිපති TIP
සහකාර විගණකාධිපති SNP
නියෝජ්‍ය විගණකාධිපති AGL
නියෝජ්‍ය විගණකාධිපති PER
සහකාර විගණකාධිපති WNP-2
නියෝජ්‍ය විගණකාධිපති LEW
නියෝජ්‍ය විගණකාධිපති RCT
සහකාර විගණකාධිපති NWP
නියෝජ්‍ය විගණකාධිපති POS
නියෝජ්‍ය විගණකාධිපති FFP
සහකාර විගණකාධිපති ENP
නියෝජ්‍ය විගණකාධිපති AVA
නියෝජ්‍ය විගණකාධිපති CTP
සහකාර විගණකාධිපති NNP-2
සහකාර විගණකාධිපති HUD
සහකාර විගණකාධිපති FLS
සහකාර විගණකාධිපති WNP-1
සහකාර විගණකාධිපති CMU
සහකාර විගණකාධිපති JPA
සහකාර විගණකාධිපති NCP
සහකාර විගණකාධිපති POE -1
සහකාර විගණකාධිපති ENP
සහකාර විගණකාධිපති CLP-1
සහකාර විගණකාධිපති POE-2
සහකාර විගණකාධිපති SIN
සහකාර විගණකාධිපති CLP-2
සහකාර විගණකාධිපති DMG
සහකාර විගණකාධිපති WSS
සහකාර විගණකාධිපති SGP
සහකාර විගණකාධිපති SNP
සහකාර විගණකාධිපති HSM
සහකාර විගණකාධිපති UVP
සහකාර විගණකාධිපති PUR-1
සහකාර විගණකාධිපති EHA
සහකාර විගණකාධිපති AGS/IMU/TRD/TAX /TEC
සහකාර විගණකාධිපති TEC
සහකාර විගණකාධිපති TCM
සහකාර විගණකාධිපති BAF-1
සහකාර විගණකාධිපති VIT
සහකාර විගණකාධිපති BAF-2
සහකාර විගණකාධිපති RQC
සහකාර විගණකාධිපති CAS
සහකාර විගණකාධිපති TRE
සහකාර විගණකාධිපති MED
සහකාර විගණකාධිපති PUR-2

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ වගකීම හා කාර්යභාරය පිළිබඳ ඇගැයීමකින් පසු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව 2011 නොවැම්බර් 14 දින අනුමත කර තිබූ කාර්ය මණ්ඩලය අනුව ශ්‍රී ලංකා විගණන සේවයේ මුළු නිලධාරීන් ගණන 350 ක්ද, විගණන පරීක්ෂක සේවයේ මුළු නිලධාරීන් ගණන 1200 ක්ද විය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනවවන ව්‍යවස්ථා සංශෝධනය අනුව ස්ථාපිත කළ ශ්‍රී ලංකා විගණන කොමිෂන් සභාව බලාත්මක කිරිම සඳහා ජාතික විගණන පනත පාර්ලිමේන්තුවේ සම්මත නොවිම නිසා එම කොමිෂන් සභාව බලාත්මක වී නොමැත. එනිසා දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් කෙටුම්පත් කර ඇති සේවා ව්‍යවස්ථාව සම්මත කර ගැනීමට නොහැකි වී ඇති අතර, ඇති වන පුරප්පාඩු පිරවීමට පැරණි සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබයි.

එම තත්ත්වය යටතේ 2015 වර්ෂය ආරම්භයේ, 2015 වර්ෂය අවසානයට හා 2016 ජුනි 30 දිනට දෙපාර්තමේන්තුවේ ඒ ඒ තනතුරුවල පැවැති පුරප්පාඩු සංඛ්‍යාව පහත වගුව 01හි දැක්වේ.

තනතුර	2015 ජනවාරි 01 දිනට			2015 දෙසැම්බර් 31 දිනට			2016 ජුනි 30 දිනට		
	අනුමත කාර්ය මණ්ඩලය	සත්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු	අනුමත කාර්ය මණ්ඩලය	සත්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු	අනුමත කාර්ය මණ්ඩලය	සත්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු
විගණන කාර්ය මණ්ඩලය									
අතිරේක විගණකාධිපති	3	3	-	3	2	1	3	2	1
නියෝජ්‍ය විගණකාධිපති	15	9	6	15	9	6	15	9	6
සහකාර විගණකාධිපති	44	21	16	44	32	12	44	31	13
විගණන අධිකාරි	288	116	172	288	160	128	288	219	69
විගණන පරීක්ෂක	1200	791	412	1200	1022	184	1200	941	259
විගණන නොවන කාර්ය මණ්ඩලය									
අධ්‍යක්ෂ - පරිපාලන	1	1	-	1	1	-	1	1	-
ප්‍රධාන ගණකාධිකාරී	1	1	-	1	1	-	1	1	-
අනෙකුත් මාණ්ඩලික නිලධාරීන්	4	2	2	4	2	2	4	2	2
රාජ්‍ය කළමනාකරණ සහයක සේවාව හා සමාන්තර ශ්‍රේණි	184	147	37	183	151	32	183	160	23
කණිෂ්ඨ සේවකයින්	183	139	44	183	143	40	183	157	26
එකතුව	1923	1230	693	1922	1523	399	1922	1523	399

වගුව 01 - කාර්ය මණ්ඩල තත්ත්වය 2015 දෙසැම්බර් 31 දිනට හා 2016 ජුනි 30 දිනට

ඉහත සටහනේ සඳහන් පරිදි අනුමත කාර්ය මණ්ඩලවල එක් එක් සේවාවන්හි විශාල පුරප්පාඩු සංඛ්‍යාවක් පැවතිම හේතුවෙන් දෙපාර්තමේන්තුව වෙත පැවරි ඇති වගකීම් හා කාර්යභාරය ඉටු කිරිම කෙරෙහි විශාල බාධාවක්ව පැවැතුණි. ඒ අනුව පවතින පුරප්පාඩු පියවා ගැනීම සම්බන්ධයෙන් පහත ක්‍රියාමාර්ග ගැනීම දෙපාර්තමේන්තුව මට්ටමින් මේ වන විටත් සිදු කර ඇත.

- අතිරේක විගණකාධිපති තනතුරක පවතින පුරප්පාඩුවක් පිරවීම සඳහා අනුමැතිය ඉල්ලා ඇත.
- ශ්‍රී ලංකා විගණන සේවයේ I පන්තියේ I ශ්‍රේණියේ නියෝජ්‍ය විගණකාධිපති තනතුරු 03 ක පුරප්පාඩු පිරවීම සඳහා අනුමැතිය ඉල්ලා ඇත.
- ශ්‍රී ලංකා විගණන සේවයේ I පන්තියේ I ශ්‍රේණියේ නියෝජ්‍ය විගණකාධිපති තනතුරට සෘජුව බඳවා ගැනීම සඳහා අනුමැතිය ඉල්ලා ඇත.
- ශ්‍රී ලංකා විගණන සේවයේ I පන්තියේ II ශ්‍රේණියේ සහකාර විගණකාධිපති තනතුරු 04 ක පුරප්පාඩු පිරවීම සඳහා අනුමැතිය ඉල්ලා ඇත.
- විගණන පරික්ෂක ශ්‍රේණියට බඳවා ගැනීමට 2016 මැයි 06 දින ගැසට් නිවේදනය නිකුත් කර ඇත.
- සංචාරක බංගලා භාරකරු අනුමත තනතුරු 09 හි පුරප්පාඩු පිරවීමත් සමග පසුව අනුමත කර ඇති බංගලා භාරකරු තනතරුවලත් පුරප්පාඩු එකවර පිරවිමටත් අනුමැතිය ඉල්ලා ඇත.
- ජලනල / විදුලි කාර්මික තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටියක් පිළියෙල කර ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත යවා ඇත.

සේවා ව්‍යවස්ථාව අනුමත කර ගැනීම

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන කාර්ය මණ්ඩලය ශ්‍රී ලංකා විගණන සේවයේ නිලධාරීන්ගෙන් හා විගණන පරීක්ෂකවරුන්ගෙන් සමන්විත වේ. එවකට පැවති තත්ත්වය අනුව, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව මෙම සේවාවන් දෙක සඳහා වෙන වෙනම සේවා ව්‍යවස්ථාවන් පිළියෙල කරනු ලැබුවත් ඒ වෙනුවෙන් කාර්ය මණ්ඩලයෙන් වූ විවිධ යෝජනා හා ඉල්ලීම් පිළිබඳව තවදුරටත් සලකා බැලීම සඳහා ජනාධිපති ලේකම්වරයා විසින් කමිටුවක් පත් කරන ලදි. එම කමිටුව විගණකාධිපතිවරයාගේ සභාපතිත්වයෙන් හා හිටපු විගණකාධිපතිවරුන් දෙදෙනෙකු හා ජනාධිපති අතිරේක ලේකම්වරයෙකුගේ සාමාජිකත්වයෙන් සමන්විත විය. එම කමිටු නිර්දේශ සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා විගණන සේවය හා විගණන පරීක්ෂක සේවය යන සේවාවන් දෙක ඒකාබද්ධ කර "ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය" නමින් නව සේවයක් ඇති කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2014 දෙසැම්බර් 23 දින අනුමැතිය ලබාදී තිබුණි.

එම අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා විගණන සේවය හා විගණන පරීක්ෂක සේවය ඒකාබද්ධ කර, ස්ථාපනය කිරීමට යෝජනා කර තිබූ "ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය" පිහිටුවීම රජය ප්‍රතිපත්තියක් ලෙස පිළිගෙන තිබුණි. ඒ අනුව නව සේවාව සඳහා සේවා ව්‍යවස්ථාවක් පිළියෙල අවසන් කර තිබුණත්, රාජ්‍ය විගණන කොමිෂන් සභාව ස්ථාපිත කර තිබුණත්, එය බලාත්මක විම සඳහා ජාතික විගණන සේවා පනත 2016 සැප්තැම්බර් 20 දින වන විටත් පාර්ලිමේන්තුවේ සම්මත නොවීම හේතුවෙන් කටයුතු අවසන් කර ඇති

සේවා ව්‍යවස්ථාව අනුමත කර ගැනීමට නොහැකි වි ඇත. නව සේවා ව්‍යවස්ථාව සම්මත කිරීම තුළින් විගණකාධිපතිවරයා වෙත පැවරෙන කාර්යයන් හා කර්තව්‍යන් වඩාත් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා වඩාත් පුළුල් වෘත්තීය මට්ටමේ කාර්ය මණ්ඩල පවත්වා ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත. එසේම, නව සේවාවේ පත්වීම් හා විනය බලධාරියා විගණන සේවා කොමිෂන් සභාව බැවින් ප්‍රමාදයකින් තොරව එම කටයුතු ඉටු කිරීමට හැකිවීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ඉහළ නැංවීමට පිටිවහලක් වනු ඇත.

කාර්ය මණ්ඩල පුහුණුව

ශ්‍රී ලාංකීය ජාතිය වෙනුවෙන් ගුණාත්මක හා විශ්වාසනීය සේවාවක් ලබාදීම අරමුණු කර ගෙන පවත්වා ගෙන යනු ලබන රාජ්‍ය ආයතනවල මෙහෙයුම් කාර්යභාරයන් ආර්ථිකවත්, කාර්යක්ෂමවත් හා ඵලදායකවත් ඉටුවන පරිදි සිදු කිරීම පිළිබඳව ගණන්දීමේ වගකීම නිවැරදිව ඉටු කර තිබේද යන්න පරීක්ෂා කර පාර්ලිමේන්තුවට වාර්තා කිරීමේ කාර්යභාරය විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඉටු කිරීම සඳහා විගණන සහ විගණන නොවන නිලධාරින් 1,523 ක් පමණ වූ කාර්ය මණ්ඩලයක් වර්තමානයේදී සේවයේ නියුක්තව ඇත. කෙසේ වෙතත් වර්තමාන තාක්ෂණයෙන් හා දැනුමෙන් පරිපූර්ණවූ ශ්‍රම බලකායක් දෙපාර්තමේන්තුවට අත්‍යාවශ්‍ය වේ. එම අවශ්‍යතාවය පෙරදැරි කරගෙන සෑම නිලධාරියෙකුට වර්ෂයකට අවම වශයෙන් පැය 80 කට නොඅඩු පුහුණුවක් දෙපාර්තමේන්තු පුහුණු අංශය විසින් ලබා දෙනු ලැබේ. නේවාසික හා අනේවාසික වශයෙන් පවත්වනු ලබන අතර ඒ සඳහා වායුසමනය කරන ලද දේශන ශාලා, සාකච්ඡා කාමර, පරිගණක විද්‍යාගාරය සහ පුස්තකාලය ආදී අංගෝපාංගයන්ගෙන් සමන්විත පුහුණු මධ්‍යස්ථානයක් දෙපාර්තමේන්තුව සතුව ඇත. බහුමාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍ර, සාමාන්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍ර, ශබ්දවාහිනි පද්ධතිවලින් සමන්විත දේශන ශාලා තුළ දේශන පැවැත්වෙන අතර, පුහුණුලාභීන් සඳහා උසස් නිමාවෙන් යුත් නිබන්ධන සපයනු ලැබේ. දේශකයින්ගේ සහ පුහුණුලාභීන්ගේ ආහාර අවශ්‍යතාවය නිසි පහසුකම්වලින් සමන්විත භෝජනාගාරයක් පුහුණු මධ්‍යස්ථානය සතුව ඇත.

පහත සඳහන් අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා දේශන, සාකච්ඡා, ක්ෂේත්‍ර චාරිකා, වැඩමුළු මගින් නිලධාරීන් පුහුණු කරනු ලැබේ.

- නිලධාරීන්ගේ දැනුම සහ තාක්ෂණික කුසලතා සංවර්ධනය
- නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය සහ කාර්යසාධනය ඉහළ නැංවීම
- නිලධාරීන්ගේ කළමනාකරණ හැකියාවන් වර්ධනය
- රාජකාරි ඉටුකිරීමෙහිලා අවශ්‍ය වන දැනුම, මෙවලම් සහ ශිල්පීය ඥානය ලබාදීම
- මූල්‍යමය සහ සේවා නීති සම්බන්ධ දැනුම ලබාදීම
- නිලධාරින්ගේ ආකල්පමය වශයෙන් වෙනසක් ඇති කිරිම සඳහා වූ වැඩසටහන් පැවැත්වීම

පුහුණු වැඩසටහන් පැවැත්වීමේදී සම්පත් දායකයන් ලෙස දෙපාර්තමේන්තුවේ, විශ්වවිද්‍යාල සහ අනෙකුත් ආයතනයන්හි ප්‍රවීන දේශකයන් හට අවශ්‍යතාවය මත ආරාධනා කරනු ලබයි.

ඉහත සඳහන් අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා 2015 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ පුහුණු අංශය විසින් විගණන අධිකාරිවරුන් 36 දෙනෙකු සහ විගණන පරීක්ෂකවරුන් 431 දෙනෙකු සඳහා මාතෘකා 06 ක් ආවරණය වන පරිදි වැඩසටහන් 14 ක් පවත්වා ඇත. විස්තර වගුව 02 හි දක්වා ඇත.

	වැඩසටහන් වර්ගය	සහභාගී වූ නිලධාරීන්			දින ගණන
		විගණන අධිකාරී	විගණන පරීක්ෂක	එකතුව	
1.	මූල්‍ය විගණන ක්‍රමවේදය	04	29	33	05
2.	අළුතින් බඳවාගත් විගණන පරීක්ෂකවරුන් සඳහා වන මූලාරම්භක පුහුණු වැඩසටහන	-	246	246	70
3.	ප්‍රසම්පාදන පරිපාටිය සහ සිවිල් ඉදිකිරීම්	14	28	42	08
4.	මූලික පරිගණක පුහුණුව	10	50	60	04
5.	පළාත් සභා සම්බන්ධ පුහුණුව	08	38	46	05
6.	විශේෂ විමර්ශන සම්බන්ධ පුහුණුව	-	40	40	03
	එකතුව	**36**	**431**	**467**	**95**

වගුව 02-. 2015 වර්ෂයේදී විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට පුහුණුවීම් ලබාදීම

සුදුසුකම්ලත් විගණකවරුන් සේවයේ යොදවා ගැනීම

පවතින පුරප්පාඩු හේතුවෙන් වූ සම්පත්වල පරතරය පියවා ගැනීම සඳහා රාජ්‍ය බැංකු විගණනය වැනි විශේෂ අවස්ථාවලදී මෙන්ම අවශ්‍යවන විශේෂිත සේවා සඳහාද සුදුසුකම්ලත් විගණකවරුන් සේවයෙහි යොදවා ගැනීමට අවශ්‍ය විය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(4) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාට සුදුසුකම්ලත් විගණකවරුන්ගේ සේවය ලබා ගැනිමට හැකිය.

විගණිත ආයතනය, අදාළ අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය හා විගණන සමාගමේ නියෝජිතයන්ද ඇතුළත් වන පරිදි දෙපාර්තමේන්තුවේ විගණන ගාස්තු කමිටුවේ අනුමැතිය මත අදාළ විගණිත සමාගම්වල සේවය සඳහා වන විගණන ගාස්තුව තීරණය කරනු ලැබේ. ඒ අනුව සේවය සඳහා යොදා ගෙන තිබුණු විගණන සමාගම් වෙත 2014 හා 2015 වර්ෂවලදී පිළිවෙලින් රු.මිලියන 32.47 ක් හා රු.මිලියන 37.94 ක් ගෙවා තිබුණි. සුදුසුකම්ලත් විගණකවරුන්ගේ සේවය ලබා ගැනීමේදී ඔවුන් විසින් පෙර සපයා තිබුණු සේවාවන්ගේ තත්ත්වය, සමාගමේ සිටින හවුල්කරුවන් සංඛ්‍යාව, ඔවුන් සමඟ සේවයේ යෙදී සිටින විගණන පුහුණුවන්නන් සංඛ්‍යාව, සමාගමේ ප්‍රමිතිය ප්‍රකාශ කෙරෙන ජාත්‍යන්තර සම්බන්ධතාවය හා ඔවුන් සළසන වෘත්තිය සේවාවන්වල තත්ත්වය ආදී කරුණු ඔවුන් තෝරා ගැනීමේ නිර්ණායකයන්ට ඇතුළත් වී තිබුණි.

සාමාන්‍යයෙන් එක් විගණන සමාගමකට උපරිම වර්ෂ 5 ක කාලයක් සඳහා අඛන්ඩව එක් විගණන කාර්යභාරයක් පවරනු ලැබේ.

ප්‍රධාන රාජ්‍ය වාණිජ බැංකු 3 ක් හා එහි තෝරාගත් ශාඛාවන් සහ දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් විගණකාධිපතිගේ විෂය පථයට ඇතුළත් වූ සියයට 50 ක් හෝ ඊට වැඩි රාජ්‍ය අයිතිය ඇති සමාගම් ඇතුළත්ව 2014 හා 2015 වර්ෂවලදී පිළිවෙලින් ආයතන 174 ක් හා 139 ක් විගණනය කිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින විගණන සමාගම් පිළිවෙලින් 135 ක් හා 89 ක් මට සහය විය.

රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවට හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට සහායවීම.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 125 හා 126 යටතේ පිළිවෙලින් රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව (COPA) සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) පිහිටුවා ඇත. රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ මූලික අරමුණ වන්නේ රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා පළාත් පාලන ආයතනවල කාර්යක්ෂමතාවය හා මූල්‍ය විනය සියුම්ව පරීක්ෂා කිරීම වන අතර පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අරමුණ වන්නේ රාජ්‍ය සංස්ථා සහ අනෙකුත් රාජ්‍ය ව්‍යාපාරවල ගිණුම්, අයවැය හා ඇස්තමේන්තු මූල්‍ය පරිපාටීන්, කාර්යසාධනය සහ කළමනාකරණය පිළිබඳ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම වේ.

මෙම කමිටු දෙක මගින් විගණකාධිපති විසින් නිකුත් කරනු ලබන වාර්තා සමාලෝචනයට ලක් කරනු ලැබේ. මෙම ක්‍රියාවලියේදී විගණකාධිපතිවරයා විසින් සාකච්ඡාවලදී පැනනැගුණ කරුණු සම්බන්ධයෙන් යම් මඟ පෙන්වීමක් ලබා දෙනු ලැබේ. කමිටු විසින් රාජ්‍ය ආයතනවල වගකිව යුතු නිලධාරීන් වෙතින් අදාළ සාක්ෂි ලබා ගැනෙන අතර අරමුදල් යෙදවීම සම්බන්ධව කළමනාකරණයට අවශ්‍ය රෙකමදාරු කිරීම් සිදු කෙරේ. මෙම කාරක සභා දෙක මගින් ඔවුන්ගේම වාර්තා දෙකක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබේ. රාජ්‍ය ගිණුම් හා පොදු ව්‍යාපාර කමිටුවලට සහාය දැක්වීමක් වශයෙන් විගණකාධිපතිවරයාගේ වගකීම වන්නේ රාජ්‍ය ආයතන ඉහළ ගුණාත්මක මට්ටමකින් පාලනය කිරීම, තත්ත්වයන් තක්සේරු කිරීම සහ රාජ්‍ය වගවීම තහවුරු කිරීම සම්බන්ධ කරුණු පරීක්ෂා කිරීම වේ.

විගණකාධිපතිවරයා විසින් සභාගත කරනු ලබන වාර්තා අඛණ්ඩව සාකච්ඡාවට ලක් කිරීම කමිටු දෙක විසින් අඛණ්ඩව සිදු කරනු ලබන අතර සම්පත් කළමනාකරණය කිරීම පිළිබඳ අදාළ රාජ්‍ය ආයතනවල නිලධාරීන්ගෙන් ඒ සඳහා අවශ්‍ය සාක්ෂි ලබා ගැනීම සිදු කරනු ලැබේ.

ඉහත පාර්ලිමේන්තු පාලන කමිටු දෙකකට සහභාගීවීම හැරුණු කොට පළාත් සභා 09 ක විගණන කටයුතු කරන සහකාර විගණකාධිපතිවරු පළාත් සභා යටතේ වන ආයතනයන්හි කටයුතු පරීක්ෂා කිරීම සඳහා පළාත් සභා ගිණුම් කාරක සභාවලට සහාය දැක්වූහ.

විගණකාධිපති විසින් පනවන ලද අධිභාර

ශ්‍රී ලංකාවේ පවතින පළාත් පාලන ආයතන සංඛ්‍යාව 335 ක් වූ අතර, මහා නගර සභා 23 ක්, නගර සභා 41 ක් හා ප්‍රාදේශීය සභා 271 ක් ඊට අයත් විය. මෙම පළාත් පාලන ආයතන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා අදාළ ආඥාපනත් සහ පනත්වල විධිවිධාන පරිදි විගණකාධිපති විසින් විගණනය කරනු ලැබේ.

එකී ආඥා පනත් සහ පනත්වලින්, නීතියට පටහැනි ගෙවීම් විෂයයන්, නොසැලකිල්ල හෝ විෂමාචාරය නිසා සිදුවූ පාඩු සහ ගිණුම්වල දැක්විය යුතු නමුත් දක්වා නැති විෂයයන් අධිභාර කිරීම සඳහා විගණකාධිපති වෙත බලය පවරා ඇත. ඉහත දී අධිභාර සැකසීමේ ක්‍රියාවලිය නිසිපරිදි ක්‍රියාත්මක වුවද, අදාළ බලධාරීන් විසින් දැනට, අධිභාර අයකර ගැනීමේ ක්‍රියාවලිය කෙරෙහි නිසි අවධානයක් යොමුකරන බව දක්නට නොමැත.

2015 ජනවාරි 01 දින සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ පළාත් සභා යටතේ ක්‍රියාත්මක වූ පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් පාර්ශවකරුවන් 70 ක් වෙනුවෙන් රු.මිලියන 13.78 ක අධිභාර සහතික 16 න් නිකුත් කර තිබුණි. 2016 මැයි 30 දින වන විට ඉන් රු.157,017 ක් පමණක් අයවී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී නිකුත් කළ අධිභාර සහතිකවලින් රු.මිලියන 13.63 ක් තවදුරටත් අයවිය යුතුව තිබුණි.

විගණකාධිපතිවරයා විසින් සිදු කරනු ලබන කාර්යසාධන විගණනය

මූල්‍ය විගණනයට සමගාමීව තෝරාගත් විශේෂ ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් එක් එක් රාජ්‍ය ආයතනයන්ගේ කටයුතුවල ආර්ථිකබව, කාර්යක්ෂමබව, ඵලදායීබව හා පාරිසරික බලපෑමද ඇගයීමට ලක්කර අදාල විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් නිර්දේශයන් ඇතුළත්ව වාර්තා කිරීම කාර්යසාධන විගණනය මගින් සිදු කරනු ලැබේ.

2011 වර්ෂයේ සිට දෙපාර්තමේන්තුවේ වෙනම ඒකකයක් ලෙස කාර්යසාධන විගණන ඒකකය ක්‍රියාත්මක කරනු ලැබේ. රාජ්‍ය ආයතනවල විවිධ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වෙනත් විගණන ශාඛාවලින් ඉදිරිපත් කරනු ලබන යෝජනා හා මෙම කාර්යසාධන හා පරිසර විගණන ඒකකය මගින් තෝරා ගනු ලබන විශේෂ ක්ෂේත්‍ර ඔස්සේ කාර්යසාධන හා පරිසර විගණනයන් සිදු කරනු ලැබේ. තවද මූල්‍ය විගණන වාර්තාවන්ට අමතරව ඉදිරිපත් කරනු ලබන කාර්යසාධන හා පරිසර විගණන වාර්තාවන්ද පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. මෙම ක්ෂේත්‍රයට අදාල දෙපාර්තමේන්තු නිලධාරීන් පුහුණු කිරීමද සිදු කරනු ලැබේ.

කාර්යසාධන විගණනය ක්‍රියාත්මක කිරීමෙහිලා කාර්යඵල පදනම් කරගත් අයවැය ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම හා එක් එක් ආයතනය සඳහා ප්‍රධාන කාර්යසාධන දර්ශක (Key Performance Indicated) නිශ්චය කිරීම ඉතා වැදගත් වන නමුත් ශ්‍රී ලංකාවේ දැනට කාර්යඵලය පදනම් කරගත් අයවැය ක්‍රමයක් හා කාර්යසාධන දර්ශක නිෂ්චය කර ක්‍රියාත්මක කරනු නොලැබේ. මේ හේතුවෙන් එක් එක් ක්ෂේත්‍රයන්ට අදාලව කාර්යසාධන දරශක අප විසින් නිශ්චය කර කාර්යසාධන විගණනය ක්‍රියාත්මක කරනු ලබයි. මෙම කාලපරිච්ඡේදයට අදාළව සිදුකරන ලද කාර්යසාධන විගණන වාර්තාවල නිරීක්ෂණ සාරාංශ ගතකර පහත දැක්වේ.

නව නිපයුම්කරුවන් දිරි ගැන්වීම

ශ්‍රී ලංකාව සීඝ්‍ර ආර්ථික වර්ධනයක් ළගා කර ගැනිම සඳහා නව නිපැයුම් පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ යුතුව ඇත. ලෝකයේ බොහෝ ඌන සංවර්ධිත රටවල් නව නිපයුම් බිහිකිරිම තුළින් සංවර්ධිත බවට පත් වී ඇත.

මෙම සංවර්ධිත රටවල් විසින් නිෂ්පාදනය කරනු ලබන වෛද්‍ය උපකරණ, කෘෂිකාර්මික හා කාර්මික උපකරණ අප රටද අත්‍යාවශ්‍ය භාණ්ඩ හා උපකරණ වි ඇති අතර මෙම භාණ්ඩ හා උපකරණ ආනයනය කිරීමේදී විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වැය කිරීමට සිදු වි ඇත. එසේ ආනයනය කරනු ලබන භාණ්ඩ හා උපකරණ වැඩි කොටසක් ලාභ පරමාර්ථය මුල් කරගෙන නිෂ්පාදනය කරන අතර එමගින් බොහෝ සෞඛ්‍ය හා පරිසර ගැටළු මතු වි ඇත. එබැවින් සෞඛ්‍යාරක්ෂිත හා පරිසර හිතකාමී භාණ්ඩ අප රට තුළම නිපදවීමට අවශ්‍ය නව නිර්මාණ බිහිවන්නේ නම් එය රටේ ඉදිරිගමනට වැදගත් වන අතර එවැනි නිර්මාණයන් සඳහා දිරි ගැන්විම සිදු කළ යුතුය. ශ්‍රී ලාංකික නව නිපයුම්කරුවන් දිරිගැන්වීමේ අරමුණින් 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපයුම්කරුවන්ගේ කොමිෂමද, නව නිපැයුම් ආරක්ෂා කිරිමට පේටන්ට් බලපත්‍ර ලියාපදිංචි කිරිම හා පරිපාලනය කිරිම සඳහා 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත මඟින් ජාතික බුද්ධිමය කාර්යාලයද පිහිටුවා ඇත. මෙම ආයතනය ඇතුළුව මෙම ක්ෂේත්‍රයේ කටයුතු වෙනුවෙන් වගකිව යුතු රාජ්‍ය ආයතන මගින් ඉටු කරනු ලබන කාර්යයන් සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

සම්පූර්ණ අයවැය ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ ඇති ආයතන 11ක් අතරින් නව නිපයුම්කරුවන්ගේ කොමිෂම එක් ආයතනයක් වේ. පසුගිය 2012, 2013 හා 2014 වර්ෂවල අයවැය ඇස්තමේන්තුවලින් තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ ඇති රාජ්‍ය ආයතන වෙනුවෙන් පිළිවෙලින් සියයට 3 ක්, සියයට 1 ක් හා සියයට 3 ක ප්‍රමාණයක ප්‍රතිපාදන කොමිෂම වෙත ලබා දි තිබුණි. කොමිෂම විසින් එම ප්‍රතිපාදන උපයෝගී කරගෙන නව නිපයුම්කරුවන් දිරිගැන්වීමේ කාර්යයන් සඳහා ඉහත සඳහන් වර්ෂයන් වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 25.96 ක්, රු.මිලියන 13.48 ක් හා රු.මිලියන 27.57 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව නව නිපයුම්කරුවන් දිරිගැන්විම සඳහා ඉහත සඳහන් පරිදි අමාත්‍යාංශය යටතේ ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් පිළිවෙලින් සියයට 29 ක්, සියයට 61 ක් හා සියයට 31 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

නව නිපැයුම්කරුවන්ගේ නිර්මාණ වාණිජකරණය කිරීම

2013 හා 2014 වර්ෂවල නිර්මාණකරුවන් 8 දෙනෙකු වෙනුවෙන් රු.මිලියන 2.94 ක මුලාධාර ගෙවා තිබුණි. එසේ ලබා දි තිබුණු මුලාධාර ප්‍රමාණවත් නොවිම, අදාළ අනුමැතිය නොලැබිම හා තාක්ෂණික සහය නොලැබීම යන ගැටළු නිසා එම නිර්මාණ වාණිජකරණය කිරීමට නොහැකි වි තිබුණි. එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

- කොදු ඇට පෙළ ආශ්‍රිතව හට ගන්නා වේදනාව සමනය කිරීමේ උපකරණයක් නිර්මාණය කළ නිර්මාණකරුවෙකුට රු.මිලියන 1.27 ක මුලාධාර ගෙවා තිබුණි. එසේම එම නිර්මාණය සාර්ථක නිර්මාණයක් ලෙස ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් (ශිල්පීය) විසින් සනාථ කර තිබුණි. නමුත් ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය අවසාන වන විටත් ඒ සඳහා අනුමැතිය ලබා නොදීම නිසා එය වාණිජකරණය කිරීමට නොහැකි වි තිබුණි.

- ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනතට අනුව නව නිපැයුම්කරුවන් සඳහා අවශ්‍ය රසායනාගාර පහසුකම් ඇතුළු වෙනත් තාක්ෂණික පහසුකම් ලබාදීම මූලික කාර්යයක් වී තිබුණි. තාක්ෂණික ආධාර ලබාදීම නව නිර්මාණ බිහිකිරීම හා ඒවා වැඩිදියුණු කිරීමට උපකාරීවන අතර එම නිර්මාණ අයිතිය සම්බන්ධයෙන් පේටන්ට් බලපත්‍ර ලබා ගැනීමට සහය වීම අත්‍යාවශ්‍ය කාර්යයක් වී තිබුණි. ඒ අනුව නිර්මාණකරුවන් 6 දෙනෙකු විසින් තාක්ෂණික සහය ඉල්ලුම්කර තිබුණත්, ඒ සඳහා කොමිෂම විසින් සක්‍රීය දායකත්වයක් ලබා දී නොතිබුණි. නිර්මාණකරුවන් 8 දෙනෙකුගෙන් 7 දෙනෙකු විසින් ඔවුන්ගේ නිර්මාණ වැඩිදියුණු කර ගැනීමට අවශ්‍ය තාක්ෂණික සහය ලබා ගැනීමට ඉල්ලුම් කර තිබුණද, ඒ සඳහා ආයතනයක් ඉදිරිපත් නොවීම නිසා ඔවුන්ගේ නිර්මාණ වාණිජකරණය කිරීමට නොහැකි වී තිබුණි.

නිර්මාණ සඳහා නීති ආධාර ලබා දීම

නව නිපැයුම්කරුවන්ට තම නිර්මාණය ආරක්ෂා කර ගැනීමට නීති අංශයක සහය අවශ්‍ය වි තිබුණි. එවැනි අංශයක් නොතිබීම හෝ කොමිෂමේ මැදිහත්වීමෙන් නීති නිලධාරීන්ගේ සේවය ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් එම නිර්මාණකරුවන්ට ලැබී නොතිබුණි.

පාසල්වල නව නිපැයුම් සමාජ වර්ධනය

නව නිපැයුම් බිහි කිරීම සඳහා මූලික පදනම පාසල තුළින් ඇති කිරීම සඳහා 2006 ජූනි 06 දිනැති අංක 2006/23 දරන අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පාසල්වල නව නිපැයුම් සමාජ ඇති කිරීමට උපදෙස් ලබා දී තිබුණි. නමුත් පාසල්වල එවැනි සමාජ බිහිවීම මන්දගාමී බවක් හා ඒ සඳහා වන පෙළඹවීම අඩු වී තිබුණි.

නව නිපැයුම් තරඟවල විනිශ්චය

නව නිපැයුම් බිහිකිරීමෙන් අනතුරුව එම නව නිර්මාණවල වැදගත්කම හඳුනා ගැනීම මූලික අවශ්‍යතාවයක් වන අතර එය සාධාරණ විනිශ්චයක් මගින් සිදුවීම අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව පාසල් මට්ටමින් පවත්වන තරඟ හා විවිධ ප්‍රදර්ශණවලට ඉදිරිපත් කරන නව නිර්මාණ සාධාරණ පදනමක් යටතේ විනිශ්චය කර ඇගැයීමට ලක් කිරීම තුළින් නව නිර්මාණකරුවන්ගේ විශ්වාසය ගොඩනැගිය හැකිය. එමගින් තවදුරටත් නව නිර්මාණයන් බිහිකිරීමට නිර්මාණකරුවන් පෙළඹවේ. නමුත් එසේ සිදු කරනු ලබන තරඟ විනිශ්චය සාධාරණ නොවූ විට නිර්මාණකරුවන් අධෛර්යමත් වේ. තොරතුරු කැඳවූ නිර්මාණකරුවන්ගෙන් ඇතැම් නිර්මාණකරුවන්ගේ අදහස් අනුව එසේ ලැබෙන විනිශ්චයන් කෙරෙහි ඔවුන්ගේ විශ්වාසය පළුදු වී ඇති බව නිරීක්ෂණය විය.

රාජ්‍ය ආයතනවල මැදිහත්වීම

නව නිපයුම්කරුවන්ගේ නව නිර්මාණ ජාතික ආර්ථිකයට ඵලදායි ලෙස යොදා ගැනීමට ඒ සඳහා කටයුතු කරන රාජ්‍ය ආයතනවල මැදිහත්වීම ප්‍රමාණවත් වි නොතිබුණි. විශේෂයෙන්ම පාසැල් අධ්‍යාපනය තුළින් නව නිපයුම්කරුවන් බිහිකිරීමේ පසුබිමක් පාසල්වල ඇති කළ යුතු වුවත්, එසේ සිදු කිරීම මන්දගාමී වි තිබුණි.

තවද, නව නිපයුම්කරුවන් බිහිකිරිමට අවශ්‍ය මුලික අවශ්‍යතා හඳුනාගැනිම, ඒවා ක්‍රියාත්මක කිරිම, නව නිපයුම්කරුවන් හඳුනාගැනිම, එම නිපැයුම් සඳහා දිරිගැන්විම් සිදු කිරිම හා එම නිර්මාණ වාණිජකරණය කිරිමට අවශ්‍ය පහසුකම් සපයා දිම මගින් මෙම නිර්මාණ ජාතික ආර්ථිකයට ඵලදායි ලෙස යොදා ගැනිමට හැකි වේ.

රජයේ පාසල්වල ගුරුවරුන්ගේ කාර්යසාධනය ඇගැයිම

ආසියාවේ දැනුම් කේන්ද්‍රය ලෙස ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීමේ දැවන්ත කාර්යභාරයට දායකත්වය සැපයීමේ සුවිසල් වගකිම අධ්‍යාපන අමාත්‍යාංශය ප්‍රමුඛව පළාත් මට්ටමෙන් ඉටු කරනු ලැබේ. 2014 වර්ෂය වන විට ජාතික පාසල් 350 ක්ද, පළාත් සභා පාසල් 9,771 ක්ද, වශයෙන් දිවයිනේ සමස්ථ පාසල් 10,121 ක් වේ. දිවයිනෙහි සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාව 4,078,037 ක් හා ගුරුවරුන්ගේ සංඛ්‍යාව 232,993 ක් වූ අතර ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය හා පළාත් සභා මට්ටමෙන් සමස්ථ අධ්‍යාපනය වෙනුවෙන් 2005 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා රු.මිලියන 53,148 ක සිට රු.මිලියන 117,000 ක් දක්වා පරාසයක ප්‍රමාණයන්ගෙන් අධ්‍යාපනය සඳහා වැය කළ සමස්ථ වියදම වර්ධනය වි තිබුණි. ඒ අනුව පසුගිය කාලපරිච්ඡේදවල මුළු පුනරාවර්තන වියදමෙන් ආසන්න වශයෙන් සියයට 50 කට වැඩි ප්‍රමාණයක් ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය වෙනුවෙන් වැය කර තිබුණි. ඉන් ගුරු වැටුප් හා ගුරු සංවර්ධන වැඩසටහන් සඳහා වූ වියදම මුළු පුනරාවර්තන වියදමෙන් වැඩි අගයක් ගෙන තිබුණි.

අධ්‍යාපනය තුළින් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනිම උදෙසා අවශ්‍යවන ප්‍රධානතම මානව සම්පත ගැරුවරුන් වේ. මේ නිසා එම සම්පතේ ගුණාත්මකභාවය, කාර්යක්ෂමතාවය ඉතා වැදගත් වේ. මෙහිදී ගුරුවරුන් බඳවා ගැනිම, අනුයුක්ත කිරිම, පුහුණු කිරිම, ස්ථාන මාරුවිම් ලබාදිම, කාර්යභාරයන් පැවැරිම හා අධික්ෂණය කිරීමේ කාර්යයන් සම්බන්ධයෙන් බස්නාහිර පළාතට අදාළව සිදු කරන ලද කාර්යසාධන විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

ගුරුවරුන් අනුයුක්ත කිරිම

බස්නාහිර පළාතේ පාසල් අතර ගුරුවරුන් අනුයුක්ත කිරීමේදි පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- බස්නාහිර පළාතේ අධ්‍යාපන කළාප 11 හි 2016 මාර්තු 31 දින වන විට අතිරික්ත ගුරුවරුන්ගේ සංඛ්‍යාව 561 ක් වී තිබුණු අතර ගුරු ඌනතා 3,886 ක් පැවැතුණි. සමස්ථ පළාත තුළ ගුරු ඌනතාවයන් හා අතිරික්තයන් තුලනය වන ආකාරයට ගුරුවරුන් අනුයුක්ත කර නොතිබුණි.
- දැනට විද්‍යාපීඨ පුහුණුව මගින් රජයේ ගුරු වෘත්තිකයන් විධිමත්ව පුහුණු කරනු ලබයි. එසේ පුහුණු වු ගුරුවරුන් රටේ සමස්ථ පාසල් පද්ධතියට අනුයුක්ත කිරීමේදි ජාතික පාසල් වෙත වැඩි ප්‍රතිශතයක්ද, පළාත් සභා පාසල් සඳහා අඩු ප්‍රතිශතයක්ද වශයෙන් අනුයුක්ත කර තිබුණි. 2005 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලය තුළ ජාතික පාසල් 350 ක් සඳහා පුහුණුව ලැබු ගුරුවරුන් 8,476 ක් අනුයුක්ක කරන විටදී පළාත් සභා පාසල් 9,771 ක් වෙනුවෙන් විද්‍යා පීඨ පුහුණුව ලැබු ගුරුවරුන් 19,307 ක් අනුයුක්ත කර තිබුණි. ඒ අනුව පුහුණුව ලැබු ගුරුවරුන් ජාතික පාසල් හා පළාත් සභා පාසල් අතර අනුයුක්ත කිරිමේදි සාධාරණ පදනමක් මත සිදු කර නොතිබුණි.

- 2007 දෙසැම්බර් 15 දිනැති අංක 2007/20 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛයෙන් හා 2010 ඔක්තෝබර් 28 දිනැති අමාත්‍ය මණ්ඩලයේ තීරණය අනුව එක් පාසලක වසර 10 කට වැඩි සේවා කාලයක් සහිත ගුරුවරුන් වෙනත් පාසල් වෙත මාරු කිරීම් කළ යුතුව තිබුණි. බස්නාහිර පළාතේ පාසල් 6 ක් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී එක් පාසලක වර්ෂ 20 කට වැඩි කාලයක් මුළුල්ලේ සේවය කළ ගුරුවරුන් 12 ක්ද, වර්ෂ 15 ක සිට වර්ෂ 20 ක් දක්වා කාල පරාසයක සිට සේවය කළ ගුරුවරුන් 14 ක් හා වර්ෂ 10 ක සිට වර්ෂ 15 ක් දක්වා කාල පරාසයක සේවය කළ ගුරුවරුන් 6 ක්ද, ස්ථාන මාරුවීම් නොලබා එකම පාසලේ සේවයේ යෙදී සිටි බව නිරීක්ෂණය විය.
- විෂය අධ්‍යක්ෂ හා ගුරු උපදේශකවරුන්ද, ගුරුවරුන්, හා සමගාමීව විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ඒ අනුව බස්නාහිර පළාතේ විෂය අධ්‍යක්ෂ තනතුරු 68 ක් හා ගුරු උපදේශක තනතුරු 33 ක් 2014 වර්ෂය අවසාන වන විට පුරප්පාඩුව පැවැතුණි. තවද, විදුහල්පති සේවය හා අධ්‍යාපන පරිපාලන සේවයේ තනතුරුවල පුරප්පාඩු පැවැතිම හේතුවෙන් බස්නාහිර පළාතේ විදුහල්පති තනතුරු 586 ක් දීර්ඝ කාලයක සිට පුරප්පාඩුව පැවැතුණි.

කාර්යභාරයන් ඉටුකිරීම

ගුරුවරුන්ගේ කාර්යභාරයන් ඉටු කිරීමේදී මූලික සැලැස්ම වාර්ෂික කාල සටහන වේ. එම කාල සටහන අනුව තම කාර්යභාරයන් ඉටු කර ඇති බව තහවුරු කර ගැනීම සඳහා ගුරුවරුන් විසින් පවත්වා ගෙන යායුතු විෂයමාලා සැලැසුම්කරණය, වාර්තා සටහන්, පංති වාර්තා හා ලකුණු සාරාංශ ඉවහල් වේ. මෙම වාර්තා පදනම් කරගෙන සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- පාසල්වල ඉගැන්වීමේ කටයුතු සංවිධාත්මකව ඉටුකර ගැනිමට ඉවහල්වන සිසු ගුරු ප්‍රගති සටහන් පොත ගුරුවරුන් විසින් අනිවාර්යෙන්ම පවත්වාගත යුතු බව බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නියම කර තිබුණි. එමෙන්ම 2014 වර්ෂයේදී එම පොත් 45,000 ක් මුද්‍රණය කිරීම සඳහා රු.3,440,436 ක් වැය කර තිබුණි. බස්නාහිර පළාතේ පාසල් 6 ක් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදි පාසල් 6 හි ගුරුවරුන්ගෙන් සියයට 19 ක සිට සියයට 84 ක් දක්වා පරාසයක ගුරුවරුන් සංඛ්‍යාවක් විසින් එම වාර්තා පොත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. විගණනයට ඉදිරිපත් වූ සටහන් පොත්වලද, වාර සටහන්, පාසල් පාදක ඇගයීම් ලකුණු, ගුණාත්මක යෙදවුම් භාවිතය පිළිබඳ සටහන් හා විෂය සමගාමී කටයුතු සම්බන්ධ විස්තර විධිමත්ව පවත්වා නොතිබුණි.

- පංති වාර්තා පොත් පවත්වා ගැනිම පිළිබඳව බස්නාහිර පළාතේ පාසල් 10 ක සිදුකළ නියැදි විගණන පරික්ෂාවකදී නියමිත කාලපරිච්ඡේදය තුළ ඉගැන්වීමේ කටයුතුවල යෙදුණු බවට හා අධීක්ෂණය කරන ලද නිලධාරීන් විසින් එම කටයුතු අධීක්ෂණ කළ බවට සටහන් තබා නොතිබුණි.

- නියැදි පරීක්ෂාවට ලක් වූ පාසල්වල සිසුන්ගේ අභ්‍යාස පොත් පරීක්ෂාවේදි සිසුන් විසින් දැක්වූ ප්‍රතිචාර අනුව ගුරුවරුන් විසින් ඒවා පරීක්ෂා කිරීම සතුටුදායක මට්ටමක නොපැවතුණි.

- ගුරුවරුන් නිවාඩු ලබා ගැනීමේදි පූර්ව අනුමැතිය ලබා ගෙන නොතිබීම, එහිදී අදාළ පංතිය සඳහා අවශ්‍ය පැවැරුම් ලබා නොදීම, නිකුත් කර ඇති චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව නිවාඩු ලබා ගැනීම, නිවාඩු හා කෙටි නිවාඩු ලේඛන යාවත්කාලීන කර නොතිබීම වැනි අඩුපාඩු නියැදි විගණන පරීක්ෂාවට ලක් කළ පාසල් 10 ක ගුරුවරුන් තිස් දෙදෙනෙකු සම්බන්ධයෙන් අනාවරණය විය.

- 10 හා 11 ශ්‍රේණිවල පංතිවල ඉගැන්වෙන විෂයයන් සම්බන්ධයෙන් සිසුන් ගෙන් ලබාගත් තොරතුරු අනුව ගුරුවරුන් නියමිත වේලාවට පංතියට පැමිණීම හා පිටවීම, විෂය කරුණු පැහැදිලිව ඉගැන්වීම, අදාළ පාඩම් ඇසුරින් අභ්‍යාස කිරීම, අභ්‍යාස පොත් පරීක්ෂා කිරීම, වාර විභාගයට පෙර විෂය නිර්දේශය ආවරණය කිරීම හා විෂය කරුණු පැහැදිලි කිරීම යන කරුණු සම්බන්ධයෙන් සිසුන් විසින් යහපත් ප්‍රතිචාර ඉදිරිපත් කර නොතිබුණි.

ගුරුවරුන් අධීක්ෂණය

අමාත්‍ය මණ්ඩලයේ තීරණයක් මත 2004 ජනවාරි 15 දින සිට අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ හා ප්‍රමිති ඒකක පිහිටුවා තිබුණි. එම අංශය විසින් 2008 මාර්තු 10 දිනැති අංක ඊඩී/03/44/05/සීඅයිආර්/2008 දරන චක්‍රලේඛය මගින් ගුරු අධීක්ෂණය සම්බන්ධයෙන් සියළු පාර්ශවයන් දැණුවත් කර තිබුණි. බස්නාහිර පළාතේ පාසල්වලින් ලබාගත් දත්තයන් පදනම් කරගෙන ගුරුවරුන් විසින් ඉටුකරනු ලබන කාර්යයන් පිළිබඳ අධීක්ෂණය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- සමස්ථ අධීක්ෂණ ක්‍රියාවලිය තුළ පාසල් මට්ටමේ අධීක්ෂණය ඉතා ඵලදායි වන නමුත් ඒ සඳහා අභ්‍යන්තර ඇගැයීම්කරුවන් පත් කර නොතිබුණු අතර ඇගැයීම් ක්‍රියාවලියේ දුර්වලතා පැවැතුණි.
- කොට්ඨාශ මට්ටමින් සිදු කරනු ලබන අධීක්ෂණය මගින් ගුරුවරුන් වෙත විධිමත් පරිදි මඟ පෙන්වීම් ලබා දීම සිදු කර නොතිබුණි. එසේම ඇතැම් පාසල් අධික්ෂණය නොකිරීම මෙන්ම පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කර ගැනීම සිදුකර ඇති බවට පසුවිපරම් කර නොතිබුණි.
- ගුරු උපදේශකයන් විසින් සිදු කරනු ලබන අධීක්ෂණය හා සහය ඉගැන්වීම් ක්‍රමය විධිමත් පරිදි සිදු කර නොතිබුණි.
- කළාප මට්ටමේ අධීක්ෂණයේදි සියළු පාසල් ආවරණය කර නොතිබුණි. සියළු ගුරුවරුන් අධීක්ෂණය කර නොතිබුණු අතර අධීක්ෂණයට ලක්වූ අය පිළිබඳව පසුවිපරම් කිරීමක් සිදු කර නොතිබුණි.
- අධ්‍යාපන අමාත්‍යාංශ මට්ටමෙන් සිදු කරනු ලබන අධීක්ෂණ ක්‍රියාවලිය තුළ වාර්ෂික ප්‍රගතිය පළාත් මට්ටමෙන් අධීක්ෂණයට ලක් කිරීම, මඟපෙන්වීම හා පසුවිපරම් කිරීම පිළිබඳ අඩුපාඩු හා ඇගැයීම් ක්‍රියාවලිය සඳහා යොදා ගන්නා දර්ශකවල අඩුපාඩුද පැවැතුණි.

විභාග ප්‍රතිඵල ඉලක්කගත තත්ත්වයට ළඟා වීම

සැමට අධ්‍යාපනය හා සහශ්‍ර සංවර්ධනය ඉලක්ක ගත ජාත්‍යන්තර ප්‍රඥප්තිය යටතේ ඉලක්ක 11 ක් අතරින් ඉලක්ක කිහිපයක ප්‍රතිඵල ඉහළ නැංවීම කෙරෙහි අවධානය යොමු වී තිබුණි. ඒ අනුව 2016 වර්ෂය වන විට

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) ප්‍රතිඵලවල අපේක්ෂිත ඉලක්කය සියයට 75 ක මට්ටමකට පත්විය යුතු අතර බස්නාහිර පළාතේ එය 2015 වර්ෂය අවසාන වන විට සියයට 72.67 කට ළඟා වී තිබුණි. ඒ අනුව අනෙකුත් පළාත් කිහිපයක් හා සැසඳීමේදී බස්නාහිර පළාත තුළ එම ඉලක්කයට ළඟා වීම මන්දගාමීව සිදු වෙමින් පැවැති බැවින් ගුරු කාර්යසාධනය ඉහළ නැංවීම මගින් මෙම තත්ත්වය වැඩි දියුණු කර ගත හැකි බව නිරීක්ෂණය විය.

අතුරුගිරිය වානේ කර්මාන්ත ශාලාවෙන් ඇති වන පාරිසරික බලපෑම

අතුරුගිරිය වානේ කර්මාන්ත ශාලාව 1957 අංක 49 දරන රාජ්‍ය කර්මාන්ත සංස්ථා පිහිටුවීමේ පනත යටතේ චීන රජයෙන් ලැබූ පරිත්‍යාගයක් ලෙස ආරම්භ කර තිබුණි. මෙමඟින් දේශීය වශයෙන් අවශ්‍ය වානේ හා යකඩ නිෂ්පාදනය කර තිබූ අතර එය 1996 වර්ෂයේදී පෞද්ගලිකරණයට ලක් වී තිබුණි. ඉන් අනතුරුව අවස්ථා කිහිපයකදීම එහි අයිතිය වෙනස් වී තිබූ අතර වර්තමානයේදී දේශීය ආයෝජකයෙක් විසින් පෞද්ගලික සමාගමක් ලෙස පවත්වාගෙන යනු ලැබේ.

මෙම කර්මාන්ත ශාලාව පරිසර හිතකාමී කර්මාන්ත ශාලාවක් ලෙස ආරම්භ කර තිබූ අතර එහිදි එම කර්මාන්ත ශාලාවේ මායිමේ සිට කිලෝ මීටර් 1 ක පමණ ප්‍රදේශය රක්ෂිතයක් ලෙස වෙන්කර තිබුණි. වර්තමානයේදී සීමාසහිත ලංකා වානේ සංස්ථාව නමින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමත ව්‍යාපෘතියක් ලෙස වානේ කම්බිවලට අමතරව ගැල්වනයිස් බට නිෂ්පාදනයද ආරම්භ කර තිබුණි. කර්මාන්ත ශාලාව තුළ ගැල්වනයිස් බට නිෂ්පාදනය ආරම්භ කිරීමේදි කර්මාන්ත ශාලාව වෙනුවෙන් ලබාගත යුතු පරිසර ආරක්ෂණ බලපත්‍රය මධ්‍යම පරිසර අධිකාරිය මඟින් අවසන් වරට 2013 නොවැම්බර් 20 දින සිට 2014 නොවැම්බර් 19 දින දක්වා කාල සීමාව සඳහා නිකුත් කර තිබුණි. 2015 වර්ෂය වන විට මධ්‍යම පරිසර අධිකාරිය හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය එක්ව පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා දීමට කටයුතු කර තිබුණු අතර කර්මාන්ත ශාලාව තුළ සිදුකළ යුතු ඇතැම් කාර්යයන් නිවැරදි නොකිරීම නිසා එම බලපත්‍රය ලබා දීම දිගින් දිගටම ප්‍රමාද වී පැවතුණි.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමත තවත් ව්‍යාපෘතියක් ලෙස 1999 වර්ෂයේදී මිලේනියම් සිටි නිවාස ව්‍යාපෘතිය ඉහත සඳහන් වානේ කර්මාන්ත ශාලාව අවට තිබූ රක්ෂිත ප්‍රදේශයද ඇතුළත්වූ භූමි ප්‍රදේශයේ ආරම්භ කර තිබූ අතර එය අක්කර 97.3 ක් වූ වපසරියක් තුළ A B C ලෙස වර්ගීකරණය කරන ලද මධ්‍යම පාන්තික නිවාස 1,575 කින් සමන්විත වී තිබුණි.

පසු කාලීනව මෙම කර්මාන්ත ශාලාව මඟින් එල්ල වන පාරිසරික ගැටලු මත එම මිලේනියම් සිටි නිවාස යෝජනා ක්‍රමය තුළ පදිංචිකරුවන් හා කර්මාන්ත ශාලා කළමනාකරණය අතර යම් මතභේද උද්ගත වී තිබුණි. ඒ අනුව කර්මාන්ත ශාලාව තුළින් නිකුත් වන ශබ්දය හා අධික දුම නිසා එල්ලවන තර්ජනය සම්බන්ධයෙන් අදාල ආයතන දැනුවත් කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

කර්මාන්ත ශාලාව වැඩි දියුණු කිරීමේදී නිවාස ව්‍යාපෘතිවලට ගැටළු ඇති වීම

1998 ඔක්තෝබර් 28 දින මෙම නිවාස යෝජනා ක්‍රමයට අදාළව පවත්වන ලද නිවාස හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ වැඩ කමිටු වාර්තාවේ "2" ඡේදය අනුව කර්මාන්ත ශාලාව වැඩි දියුණු කිරීමේදී නිවාස ව්‍යාපෘතියට ගැටළු මතු විය හැකි බව හඳුනාගෙන තිබුණි. එම තත්ත්වය කෙරෙහි අවධානය යොමු නොකර, 1999 වර්ෂයේදී මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය සහිතව නිවාස හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය විසින් මෙම නිවාස ව්‍යාපෘතිය සඳහා පාරිසරික අනුමැතිය ලබා දී තිබුණි. එසේම ගොඩනැගිලි සැලැසුම් සහ වින්‍යාස සැලැසුම් සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය ලබා දී තිබුණි. එවකට කඩුවෙල ප්‍රාදේශීය සභාව විසින් අනුකූලතා සහතිකයද නිකුත් කර තිබුණි.

ශබ්දයේ බලපෑම

කර්මාන්ත ශාලාවේ ක්‍රියාකාරීත්වය හේතුවෙන් ජනනය වන ශබ්දය පිළිබඳ දිවා රාත්‍රී අවස්ථා කිහිපයකදීම මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් සමඟ පරීක්ෂාවට ලක් කළ අතර කර්මාන්ත ශාලාවේ බලපෑම වැඩි වශයෙන් එල්ල වී ඇති ප්‍රදේශයේ සිට අදාළ නිරීක්ෂණයන් සිදු කරන ලදී. එහිදී තහවුරු වූ පරිදි කර්මාන්ත ශාලාවේ ධාරිතාවය උපරිමයෙන් යොදාගත් විට ශබ්දයේ බලපෑම අනුමත පරාසයක් තුළ පැවැතුණි. එහෙත් මහල් 03 කින් යුතු එක් නිවසක් තුළ සිට නිරීක්ෂණය කළ විට එහි බලපෑම ක්‍රමයෙන් වැඩි වන බව නිරීක්ෂණය විය.

පනවා තිබුණු කොන්දේසිවලට පටහැනිව මිලේනියම් සිටි නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

මිලේනියම් සිටි නිවාස ව්‍යාපෘතිය සඳහා කර්මාන්ත ශාලා රක්ෂිතය යොදා ගැනීමේදී ඉදිකිරීම් පිළිබඳ ආයෝජන මණ්ඩලය විසින් කොන්දේසි පනවා තිබුණි. ඒ අනුව කර්මාන්ත ශාලාව ආසන්නයේ ඇති නිවාස තනි තට්ටුවේ නිවාස විය යුතු බව දක්වා තිබුණි. එසේ තිබියදී එම කොන්දේසිය අදාළ වන කළාප අංක 5 හි නියැදි පරීක්ෂණයට ලක් වූ එක් නිවසකට අදාළව එවකට කඩුවෙල ප්‍රාදේශීය සභාව විසින් අදාළ කොන්දේසි උල්ලංඝනය කරමින් තනි තට්ටුවේ නිවාස වෙනුවට තට්ටු 3 ක් වශයෙන් එය වෙනස් කිරීම අනුමත කර තිබුණි.

කර්මාන්ත ශාලාවෙන් පිටවන දුම ජනජීවිතයට අහිතකරවීම

කර්මාන්ත ශාලාවෙන් නිකුත්වන දුම පිළිබඳ නිරීක්ෂණය කළ අතර එහිදි වායු ගෝලයේ පහළ ස්ථරයේ දුම පැතිරියාම නිසා එය ජන ජීවිතයට අහිතකර විය හැකි බව නිරීක්ෂණය විය.

නිවාසලාභීන්ගේ සෞඛ්‍ය ගැටළු

කර්මාන්ත ශාලාව අවට නිවාස ව්‍යාපෘතිය තුළ ජීවත්වන නිවැසියන්ගේ සෞඛ්‍ය ගැටළු පිළිබඳ කඩුවෙල නගර සභාවේ සෞඛ්‍ය වෛද්‍ය ඒකකයේ පැහැදිලි කිරීම අනුව එම ප්‍රදේශයේ විශේෂිත වූ සෞඛ්‍ය ගැටළු කිසිවක් නොමැති බව වාර්තා කර තිබුණි.

පාරිසරික ගැටළු අවම කිරීම සඳහා කර්මාන්ත ශාලාව ගෙන තිබුණු ක්‍රියාමාර්ග

කර්මාන්ත ශාලාවෙන් නිකුත්වන දුම හා ශබ්දය පාලනය කිරීම සඳහා කර්මාන්ත ශාලාවේ කළමනාකරණය විසින් විශේෂ ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන තිබු අතර එම දුම පාලනය සඳහා තව දුරටත් ගතයුතු ක්‍රියාමාර්ග විය.

ඉහත කරුණු සියල්ල සළකා බැලීමේදී අනාවරණය වු පරිදි විවිධ කොන්දේසි මත වුවද, මෙම නිවාස ව්‍යාපෘතිය ආරම්භ කිරීමේදී කර්මාන්ත ශාලා රක්ෂිතය යොදා ගැනීම පාරිසරික ගැටළු ගණනාවක් ඇති කිරීමට හේතු වී තිබුණි. එසේ තිබියදී එවකට කඩුවෙල ප්‍රාදේශීය සභාව විසින් ගොඩනැගිලි සැලැසුම් අනුමත කිරීමේදී අදාළ කොන්දේසි පිළිබඳ නොසළකා හරිමින් කටයුතු කිරීම මෙම ගැටළුව තවදුරටත් වර්ධනය වීමට හේතු වී තිබුණි.

ඔලුවිල් වරාය ඉදිකිරීමේ කාර්යසාධන විගණනය

ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීම නිසා අතීතයේ සිටම නාවික ගමනාගමනය අතින් වැදගත් කේන්ද්‍රස්ථානයක් වී තිබුණි. අර්ධ මහාද්වීපික වරායවල් තුළ පිහිටි ගැඹුරු පතුලත්, බොහෝ පෝෂක නැව් මාර්ග සම්බන්ධවීමේ හැකියාව නිසා වරාය කටයුතුවලින් ආර්ථිකයට දක්වන දායකත්වය වැඩි කළ හැකිය. ඒ අනුව ශ්‍රී ලංකාවේ නැගෙනහිර මුහුදු තීරයේ ඉදිකිරීමට යෙදුනු ඔලුවිල් වරාය ඉදිකිරීම මඟින් අපේක්ෂා කළ අරමුණු අතර පළාතේ සංවර්ධනය, නාවික යාත්‍රාවලට පහසුකම් සැපයීම, ධීවර කර්මාන්තය වැඩි දියුණු කිරීම හා පරිසර හානිය අවම කිරීම යන කරුණු ඇතුළත් විය. මෙම ව්‍යාපෘතිය සඳහා 2008 වර්ෂයේදී ඩෙන්මාර්ක් බැංකුවක් විසින් ශ්‍රී ලංකා රජයට ප්‍රදානයක් ලෙස යුරෝ 86,100 ක් සහ පොලී රහිත ණයක් ලෙස යුරෝ 46,009,269 ක් ලබා දී තිබුණි. 2011 මාර්තු 31 දින සිට ආරම්භ කර වාරික 20 කින් ගෙවා අවසන් කිරීමේ කොන්දේසිය මත මෙම ණය ප්‍රදානය කර තිබුණි. ණය කොන්දේසි අනුව ඩෙන්මාර්ක් රටේ සමාගම්වලින් මිල කැඳවීම් කර අඩුම මිල ඉදිරිපත් කළ සමාගමක් වෙත 2008 ජුනි මාසයේදී මෙහි ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. 2015 සැප්තැම්බර් 30 දින වන විට මෙම ණය මුදලින් යුරෝ 23,004,634 ක් ගෙවීමට ඉතිරි වී තිබුණි. එම ණය මුදලට අමතරව වරාය අධිකාරිය විසින් මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 426.49 ක මුදලක් 2000 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලය තුළ විවිධ පුද්ගලයන්ට හා විවිධ අයතනවලට ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

ශක්‍යතා හා පාරිසරික බලපෑම පිළිබඳ අධ්‍යයන වාර්තාව

මෙම ව්‍යාපෘතිය සම්බන්ධව මූලික අධ්‍යයනයන්ට අදාලව ශක්‍යතා අධ්‍යයනය හා පාරිසරික බලපෑම් ඇගයීමේ අධ්‍යයනය 1995 වර්ෂයේ සිට 2001 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළදී පෞද්ගලික ආයතනයක් හා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් සිදු කර තිබුණි. ඒ සඳහා පිළිවෙලින් රු.මිලියන 24.48 ක් හා රු.මිලියන 1.22 ක් වැය කර තිබුණි. ඊට අමතරව වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා මධ්‍යම පරිසර අධිකාරිය මඟින්ද අවශ්‍ය නිර්දේශ හා අනුමැතිය, කොන්දේසිවලට යටත්ව ලබා දී තිබුණි.

මෙම මූලික අධ්‍යයනය මඟින් වරාය ව්‍යාපෘතියට අදාළව මෙහි ඉදිරි ඡේදවල සඳහන් කර ඇති පරිදි වර්තමානයේ පැන නැගී ඇති මූලික ගැටළු හා පාරිසරික ගැටළු පිළිබඳ වාර්තා කර නොතිබුණි. එබැවින් එම අධ්‍යයනයන් මඟින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් දායකත්වයක් ලැබී නොතිබුණි.

ව්‍යාපෘති කළමනාකරණය සඳහා වන ප්‍රධාන සැලැස්ම

ව්‍යාපෘතිය කළමනාකරණයේදී ඒ සඳහා ප්‍රධාන සැලැස්මක් පිළියෙළ කර අදාල කාර්යයන් ඉටු කරන නිශ්චිත කාලවකවානු තීරණය කර ක්‍රියාත්මක කර නොතිබුණි. ඒ අනුව වරාය සැලැසුම් කර ඉදිකර අවසන් කිරීමට වසර 18 ක පමණ අධික කාලයක් ගත කර තිබුණි.

වරාය තුළට කිසිදු වාණිජ නෞකාවක් නොපැමිණීම.

2013 වර්ෂයේ දී මෙම වරාය ජනතා අයිතියට පත්කර තිබූ අතර 2015 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු වාණිජ නෞකාවක් වරාය වෙත පැමිණ නොතිබුණි. වරාය ප්‍රවේශ මාර්ගය වැලි පිරීමෙන් අවහිර වීමත්, වරාය බේසම තුළට වැලි එකතු වීම නිසා නොගැඹුරු වීමත්, මෙයට හේතු ලෙස නිරීක්ෂණය විය. තවද වරාය ඉදිකිරීමෙන් පසු වරායට උතුරු දෙසින් ගොඩබිම් තීරය දරුණු මුහුදු බාදනයට ලක් වෙමින් පැවතීම නිසා එම ප්‍රදේශයේ ප්‍රධාන වශයෙන් වී ගොවිතැනට හා පොල් වගාව කෙරෙහි එය දරුණු ලෙස බලපා තිබුණි.

වරාය පිවිසුම වැලිවලින් තිබීම

විනාශ වී ඇති වී වගාව

වෙරළ බාදනය හා පොල් වගාව විනාශවීම

පවරාගත් ඉඩම් වෙනුවෙන් වන්දි ගෙවීම

එසේම වරාය ඉදිකිරීම සඳහා පවරාගත් ඉඩම් වෙනුවෙන් වන්දි ගෙවීම හෝ විකල්ප ඉඩම් ලබාදීම ඇතැම් ඉඩම් හිමියන් සම්බන්ධයෙන් තවදුරටත් ප්‍රමාද වී තිබුණි. මේ නිසා වරාය ව්‍යාපෘතියෙන් ප්‍රදේශයේ සංවර්ධනයට දායකවීමක් සිදු වී නොතිබුණි. එමෙන්ම වන්දි ගෙවීම් සම්බන්ධ ගැටළු නිරාකරණය නොකිරීම යන කරුණු නිවාස අපේක්ෂිත ප්‍රාදේශිය සංවර්ධනය ළගාකර ගෙන නොතිබුණි.

ධීවර වරාය කොටස ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවට පැවැරීම

මෙම වරාය ව්‍යාපෘතියේ එක් අංශයක් ධීවර වරායක් ලෙස ඉදිකර තිබූ අතර මුළු ව්‍යාපෘතියෙන් දැනට ක්‍රියාත්මක වන්නේ ධීවර වරාය කොටස පමණක් බව නිරීක්ෂණය විය. ඒ අනුව වර්තමානයේ එහි ධීවර යාත්‍රා 100 ක් හා 200 ක් අතර ප්‍රමාණයකට පමණ මෙහෙයුම් කටයුතු සිදු කළ හැකිය. වරාය අධිකාරිය විසින් එම යාත්‍රාවලට අවශ්‍ය විදුලිය, ජලය හා ඉන්ධන සැපයීමෙන් සුළු ආදායමක් උපයා තිබුණි. වරාය අධිකාරිය සංස්ථාපනය කර ඇති අරමුණු අනුව ධීවර වරායන් ඉදිකිරීම, නඩත්තු හා මෙහෙයුම් කටයුතු සිදු

කිරීම එයට අයත් කාර්යයක් වී නොතිබුණි. එබැවින් ධීවර වරායන් පාලනය හා නඩත්තු කටයුතු සිදු කරනු ලබන ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව වෙත මෙම වරාය කොටස පවරා දීමට 2015 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

ව්‍යාපෘතිය මගින් ඉදිකළ ගොඩනැගිලි

වරාය ව්‍යාපෘතියට අදාළව පරිපාලන ගොඩනැගිල්ල, ඉංජිනේරු කාර්ය මණ්ඩල ගොඩනැගිල්ල, කාර්ය මණ්ඩල නිල නිවාස හා ශිතාගාරය යන ගොඩනැගිලි ප්‍රධාන වේ. මෙම ගොඩනැගිලි ඇතුළු පහසුකම් ඇති කිරීම වෙනුවෙන් යුරෝ මිලියන 4.33 ක් වැය කර තිබුණි. ඒ අනුව දැනට අභාවිතව පවතින ශිතාගාරය සඳහා පමණක් යුරෝ. මිලියන 2.12 ක් වැය කර තිබු අතර එහි වටිනා යන්ත්‍ර සුත්‍ර නිෂ්ක්‍රියව පැවතුණි .කෙසේ වුවද ව්‍යාපෘතියේ ඉදිකිරීම් අවසන්කර මේ වන විට වර්ෂ 02 කට අධික කාලයක් ගත වී තිබුණත්, මෙම ගොඩනැගිලි සියල්ල භාවිතයෙන් තොරව නිෂ්ක්‍රියව පැවතුණි.

වරාය ඵලදායි තත්ත්වයකට පත් කිරිමට කටයුතු කිරිම

මෙම වරාය ඵලදායී තත්ත්වයට පත්කිරීමට ගත හැකි විකල්ප ක්‍රියාමාර්ග කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු වී නොතිබූණි. එය ඵලදායීත්වයට පත්කිරීමට ගත හැකි විකල්ප ක්‍රියාමාර්ග අධ්‍යයනය කිරීම සඳහා අදාල ණය දෙන ආයතනය ගාස්තු අය කිරීමකින් තොරව ඉදිරිපත් වී තිබූණත් 2015 දෙසැම්බර් 31 දින වන විටත් එම කටයුතු ආරම්භ කර නොතිබුණි.

නිෂ්ක්‍රියව පවතින ශීතා ගාරය

විනාශවීමේ අවධානමට ලක්වී ඇති යන්ත්‍ර

ආබාධිත පුද්ගලයන්ගේ සුභසාධනය සම්බන්ධ කාර්යසාධන විගණනය

විෂමතාවයන්ගෙන් යුක්ත වුවත්, ආබාධිත පුද්ගලයන්ද සමාජයේ සෙසු සාමාජිකයන් හා සමානවම සැළකිය යුතු පිරිසක් බැවින් ඔවුන්ගේ අභිවෘද්ධිය උදෙසා අධ්‍යාපන, සෞඛ්‍ය හා අනෙකුත් සුභසාධන අවශ්‍යතා හා ඔවුන්ට ස්වෝත්සහයෙන් නැගීසිටීමට හැකිවන පරිදි සුදුසු වෘත්තීයමය ක්ෂේත්‍රයන් යටතේ අවශ්‍ය පුහුණුවීම් ලබාදෙමින් ඔවුන් සවිබල ගැන්වීම පිණිස සිදුකරනු ලබන එකී වැඩ සටහන්වල කාර්යසාධනය මැනිමේදී ඒ සඳහා මූලික කාර්යභාරයන් ඉටු කරනු ලබන මධ්‍යම රජය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු හා සමාජ සේවා අමාත්‍යාංශය මට්ටමින් සිදුකරන කාර්යභාරය ඇගයීමට ලක්කරන ලදී. මෙහිදී හඳුනාගත් විශේෂ නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

විශේෂ අධ්‍යාපන ඒකක පිහිටුවීම

රජයේ පාසල් අතරින් 2014 වර්ෂයේ ජාතික පාසල් 111 කද, පළාත් සභා පාසල් 603 කද විශේෂ අධ්‍යාපන ඒකක පිහිටුවා තිබුණි. එම ඒකකවල ඉගෙන ගන්නා විවිධ අබාධිත ශිෂ්‍යයන් සංඛ්‍යාව ජාතික හා පළාත් සභා පාසල්වල පිළිවෙලින් 1092 ක් හා 9410 ක් විය. 2012 නොවැම්බර් 23 දිනැති අංක 42/2012 දරන අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පාසල්වල මෙම විශේෂ ඒකකවල සේවයේ නියුක්ත විය යුතු විශේෂ අධ්‍යාපන පුහුණුව ලැබූ ගුරුවරුන් සංඛ්‍යාව ශිෂ්‍යයන් 5 දෙනෙකුට එක් විශේෂ පුහුණුව ලැබූ ගුරුවරයෙකු බැගින් විය යුතු බවට තීරණය කර තිබුණි. ඒ අනුව එම සංඛ්‍යාව පදනම් කරගනිමින් අවශ්‍ය විශේෂ අධ්‍යාපන ගුරු සංඛ්‍යාව 2,112 ක ආසන්න අගයක් විය යුතු අතර අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබාදී තිබුණු තොරතුරු අනුව එය 2014 වර්ෂය සඳහා ගුරුවරුන් 1352 ක් ලෙස හඳුනාගෙන තිබුණි. එසේ වුවද, සත්‍ය වශයෙන්ම මෙම ක්ෂේත්‍රයේ නියැලි සිටි ගුරුවරු සංඛ්‍යාව 941ක් වි තිබුණි. ඒ අනුව මෙම ක්ෂේත්‍රයේ ගුරු පුරප්පාඩු සංඛ්‍යාව 411 ක් ලෙස හඳුනාගත හැකි වූ අතර ක්ෂේත්‍රය තුළ පුහුණුව ලැබූ එහෙත් මෙම විශේෂ අධ්‍යාපන ඒකකවලින් බැහැරව සාමාන්‍ය පන්ති කාමරවල රජකාරී ඉටුකරන ගුරුවරු සංඛ්‍යාව 355 ක් වී තිබුණි.

මෙම සංඛ්‍යාව අදාළ ගුරු පුහුණුව ලබාගත් විශේෂ අධ්‍යාපන ඒකකවලට අනුයුක්ත කිරීමට කටයුතු කලේ නම් අදාළ පුරප්පාඩු සංඛ්‍යාව 56 කින් අඩුකර ගැනීමට හැකියාව තිබුණි. මීට අමතරව විශේෂ පාසල් වශයෙන් පාසල් 25 ක් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර එම පාසල්වල විශේෂ අධ්‍යාපන ගුරු පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වශයෙන් හඳුනාගෙන ඇති බැවින් විශේෂ අධ්‍යාපන පුහුණුව ලැබූ ගුරුවරුන් අවශ්‍ය පරිදි අදාළ ඒකකවලට අනුයුක්ත කර ඉහත කී පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

විශේෂ අධ්‍යාපන ඒකකවලට පහසුකම් සැලැසීම

විශේෂ අධ්‍යාපන ඒකකවලට පහසුකම් සැපයීම සම්බන්ධයෙන් 2008 මැයි 14 දිනැති අංක 2007/07 දරන අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව එය අනිවාර්ය අවශ්‍යතාවයක් ලෙස හඳුනාගෙන තිබුණි. තවද 2006 ඔක්තෝබර් 17 දිනැති අංක 1467/15 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින්ද මෙම අවශ්‍යතතාවය තහවුරු කර තිබුණි. එසේ වුවද පාසල් 13 ක ප්‍රවේශ පහසුකම් සපයා නොතිබුණු බවත්, පාසල් 03 ක ගොඩනැගිලි අවශ්‍යතා හා අධ්‍යාපනික උපකරණ ප්‍රමාණවත් නොවන බවත්, පාසල් 22 ක් සඳහා අධ්‍යාපන හා වෛද්‍ය උපකරණ අඩුපාඩුකම් පවතින බවත් අනාවරණය විය.

සම්මත සංඥා භාෂා ක්‍රමවේදය

රජයේ විශේෂ පාසල්වල සංඥා භාෂාව භාවිතා කරන ළමුන් සඳහා සම්මත සංඥා භාෂා ක්‍රමවේදයක් නොතිබුණි. ඒ අනුව සංඥා පරිදි ලබා නොදීම හා ළමුන්ගේ අධ්‍යාපන කටයුතු කර ගැනීම පිණිස ප්‍රමාණවත් භාවිතය පිළිබඳ සම්මත ක්‍රමවේදයක් නොවීම නිසා ඇති වන දුෂ්කරතාවලට නිතර මුහුණදීමට සිදු වී තිබුණි. තවද පහ ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයන් සඳහා පෙනී සිටින සිසුන්ට ප්‍රශ්න පත්‍ර කියවීම සඳහා සහභාගී වන ගුරුභවතුන් විශේෂ අධ්‍යාපනය හදාරා ඇති ගුරුභවතුන් වුවත් ඔවුන් විභාග පරීක්ෂකයන් ලෙස සහභාගී වන විෂයයන් සම්බන්ධයෙන් අවබෝධයක් නොතිබීමෙන් ගැටළු මතුවී තිබුණි. තවද සංඥා භාෂාව භාවිතා කරන ළමුන්ට සිය විෂය නිර්දේශය අපේක්ෂිත කාල පරිච්ඡේදය තුළ නිම කිරීමට නොහැකිවීම හා විභාග ප්‍රතිඵල ඉතා දුර්වල මට්ටමක පැවතීම යන ගැටළු ඇතිවීමට එය හේතු වී තිබුණි. අන්ධ සිසුන් සම්බන්ධයෙන් බ්‍රේල් මාධ්‍ය පෙළ පොත් ඔවුන් වෙත ලබාදුන්නද, රූප සටහන් බ්‍රේල් මාධ්‍යයෙන් ඉදිරිපත් කළ නොහැකිවීම සහ රූප සටහන් ඇසුරින් ඉදිරිපත් කරන ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමේ අපහසුව මෙන්ම විශේෂ විභාගවලදී ප්‍රශ්න කියවීම සඳහා පැමිණෙන ගුරුභවතුන්ට විෂයය පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයක් නොමැතිවීම හේතුවෙන් එය ආබාධිත දරුවන්ට අවාසි සහගත ලෙස බලපා තිබුණි.

ගුරු උපදේශකයන්ගේ කාර්යභාරය

ගුරු උපදේශකවරුන්ගේ පැමිණීම සතුටුදායක මට්ටමක නොතිබීම හා වරින්වර විෂය නිර්දේශ වෙනස්වීම් සම්බන්ධව පවත්වනු ලබන පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ ආදිය සඳහා විශේෂ අධ්‍යාපන ඒකක සහ විශේෂ පාසල්වල ගුරුවරුන් සම්බන්ධ කර ගැනීම ප්‍රමාණවත් පරිදි ඉටු කර නොතිබීම හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ පිටපත් ප්‍රමාණවත් පරිදි මුද්‍රණය නොකිරීම, ඒවා විධිමත්

උපස්ථායක කාර්ය මණ්ඩලයක් යොදවා නොතිබීම නිසා තොරතුරු ලබාගන්නා ලද

බහුතර පාසල් සංඛ්‍යාවක ආබාධිත ළමුන් සඳහා ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම කෙරෙහි බලපා තිබුණි.

වෘත්තිය පුහුණු පාඨමාලා හැරයාම

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ වෘත්තීය පුහුණු පාසල්වලට බඳවා ගන්නා ලද සිසුන්ගෙන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් පාඨමාලා අතමඟදී හැර දමා තිබුණි. උදාහරණයක් ලෙස 2014 වර්ෂයේ වෘත්තිය පුහුණු පාසල්වලට සිසුන් 429 දෙනෙකු බඳවා ගෙන තිබුණද, සිසුන් 227 දෙනෙකු පමණක් අවසන් කර තිබුණි. ඇතැම් ආකර්ශණීය විෂයන් සඳහා වෘත්තිය පුහුණු උපදේශකවරුන්ගේ අඩුපාඩු පැවැතුණි. පාඨමාලාව සම්පූර්ණ කරන සිසුන් රැකියාගතවීම් පිළිබද නිශ්චිත තොරතුරු සමාජ සේවා දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි. පාඨමාලා සම්පූර්ණ කළ පසු සිසුන්ට උපකරණ කට්ටලය වෘත්තීය පුහුණු පාසල මගින් ලබා නොදී එය ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ලබා දිම නිසා පුහුණුලාභියාට වඩාත් සුදුසු උපකරණ ලබාගැනීමේ අවස්ථා ද මඟහැරී තිබුණි. කැටවල ආබාධිත වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ දිගු කාලයක සිට අළුත්වැඩියා කටයුතු සඳහා ඉවත් කර ඇති වෘත්තීය පුහුණු උපකරණ ගණනාවක් පැවතුණි. මෙම උපකරණ අළුත් වැඩියාකර භාවිතයට ගත හැකිව තිබුණි.

විමර්ශන විගණනය හා මහජන නියෝජන පිළිබඳ විගණන කටයුතු

පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් විසින් අසාධාරණව හෝ නිතියට පටහැනි ආකාරයට වාසියක් හෝ ප්‍රතිලාභයක් ලබා ගැනීමට ඇති අවදානම පිළිබඳව එහි මූලයන් පරීක්ෂා කිරිම විමර්ශනය විගණනයකින් අපේක්ෂා කරයි. මෙවැනි අවස්ථාවකදී වංචාවන් සොයා ගැනිම හා ඒවා වැලැක්විමට පාලන පද්ධතිය ශක්තිමත් කිරිම කෙරෙහි විමර්ශන විගණනයේ සැලැකිල්ල යොමු වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනවවන ව්‍යවස්ථා සංශෝධනය මගින් රාජ්‍ය මූල්‍යාණය නිසි පරිදි කළමනාකරණය කිරිම සඳහා රාජ්‍ය විගණනය ශක්තිමත් කර ඇත. විගණිත ආයතනවල රාජකාරී ලිපිලේඛන පරීක්ෂා කිරිමට අමතරව, විමර්ශනය පුළුල් කිරිම පිණිස මහජන නියෝජනද ලබා ගනිමින් රාජ්‍ය මූල්‍යාණය කළමනාකරණය කාර්යක්ෂම කිරිම කෙරෙහි විමර්ශන විගණනයෙන් කටයුතු කිරිමට අපේක්ෂා කරනු ලැබේ. මෙයට සමගාමීව දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන්ගේ දැණුම හා කුසලතාව වර්ධනය කිරිම සඳහා ක්‍රමවේදයන් වැඩිදියුණු කිරිමත්, අවශ්‍ය පුහුණුවීම් ලබාදිමත්, භෞතික සම්පත්, ක්ෂණික ඇමැතුම් අංකයන්, විද්‍යුත් තැපැල යනාදිය වැඩිදියුණු කිරිමට කටයුතු කරමින් පවතී.

මහජන නියෝජනයන් දෛනිකව දෙපාර්තමේන්තුව ගලා එන නමුත් ඒවායින් වැදගත් හා ක්ෂණික අවධානය යොමුවිය යුතු (මහජන නියෝජන) කෙරෙහි අවධානය යොමු කිරීමේදී නියෝජන 37 කට අදාළව රු.බිලියන 59.50 ක වියදම් පරීක්ෂා කිරීමේදී රජයට සිදු වූ ඇස්තමේන්තුගත අලාභය රු.බිලියන 10.56 ක් වී තිබුණි. 2015 වර්ෂයේදී සිදුකළ විමර්ශනයන්ට අදාළ වැදගත් නිරීක්ෂණ සාරාංශ කර පහත දක්වා ඇත.

නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය

ව්‍යාපෘතිය විසින් රු.මිලියන 16.9 ක වැය කර කොළඹ නගරයේ වතු ආශ්‍රිත නිවාස පිළිබඳව සමීක්ෂණයක් කර තිබුණි. එම සමීක්ෂණය අනුව කොළඹ නගරයේ අක්කර 900 ක පමණ වපසරියක වතු 1,500 ක් පවතින බවත්, ඒ ආශ්‍රිතව පවුල් 68,812 ක් වාසය කරන බවත්, ආර්ථික වශයෙන් ඉහළ වටිනාකමක් ඇති එම භූමියෙන් සියයට 84 ක් රජය සතු ඉඩම් බවත්, හඳුනා ගෙන තිබුණි.

නාගරික පුනර්ජීවන අරමුදල පිළිබඳව වාර්තා වී ඇති වැදගත් නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

- නිදහස් කර ගනු ලබන ඉහත ඉඩම් ද ඇතුළත්ව ඉඩම් අක්කර 950 ක් නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා යොදා ගැනීමට සැලසුම් කර තිබුණි.
- නිවාස ඉදිකිරීම් වැඩසටහනෙහි පළමු අදියර යටතේ වර්ග අඩි 400 කින් යුත් නිවාස ඒකක 10,475 ක් හා දෙවන අදියර යටතේ වර්ග අඩි 500 කින් යුත් නිවාස ඒකක 8,960 ක් ඉදිකිරීමට යෝජිතව තිබුණි.
- මෙහි මූලික ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා 2010 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ණයකර නිකුත් කිරීම මගින් රු. බිලියන 50.0 ක් ලබා ගැනීමටත්, නිදහස් කර ගන්නා ඉඩම් දීර්ඝ කාලීන කල්බදු ක්‍රමය යටතේ බදු දීමෙන් රු. බිලියන 68.9 ක ආදායමක් ලබා ගැනීමටත්, අපේක්ෂා කර තිබුණු අතර ඊට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියද ලබා ගෙන තිබුණි.

ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සිදු කළ විගණනයේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම, ප්‍රසම්පාදන කාල රාමු හා නිදහස් කර ගන්නා ඉඩම් ආයෝජන කටයුතු සඳහා යොදවා අරමුදල් උපයාගෙන යෝජනාව ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් වූ උපාය මාර්ගික සැලැස්ම පිළියෙල කර නොතිබුණි.
- නිදහස් කර ගන්නා ලද වතු 12 කට අදාල හෙක්ටයාර 11.23 ක ඉඩම්වල අයිතිය විධිමත්ව පවරා ගෙන නොතිබුණි.
- කොන්ත්‍රාත් ප්‍රදානය තරගකාරීව කළ යුතු බව අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබියදීත්, කැදවා නොතිබුණු යෝජනා (Unsolicited Proposal) මත වටිනාකම රු. බිලියන 57.4 ක් වූ කොන්ත්‍රාත්තු 26 ක් ප්‍රදානය කර තිබුණි.
- කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් පසු මාස 9 ක සිට මාස 33 ක් දක්වා පරාසයක කාල පමාවකින් පසුව එකතුව රු. බිලියන 32.5 ක් වූ නිවාස සංකීර්ණ 14 ක ඉදිකිරීම සඳහා වූ ගිවිසුම්වලට එළඹ තිබුණි.
- ජ්‍යේෂ්ඨ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් රු.මිලියන 500 කට වැඩි කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹීම කළ යුතු වුවද, අධිකාරියේ සභාපතිවරයා හා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම සීමාව ඉක්මවූ ගිවිසුම්වලට එළඹී තිබුණි.
- සම්පූර්ණ කොන්ත්‍රාත් කාලය ආවරණය වන පරිදි කාර්යසාධන ඇපකර ලබා ගෙන නොතිබුණි.

- මූලික වැඩ නිම කිරීමෙන් අනතුරුව ඉදිකිරීම් අත්හිටුවා තිබුණද, රු. මිලියන 315.3 ක් වූ ගෙවා තිබුණු අත්තිකාරම් අය කර ගෙන නොතිබුණි.

- ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි.

- අරමුදල් සම්පාදන කර ගැනීම දුෂ්කර වීම හේතුවෙන් වර්ෂ 4 කට වැඩි කාලයක් ඉදිකිරීම් නවතා තිබුණි.

- එම කාලය තුළ ව්‍යාපෘතිවලට අදාල ඇපකර වෙනුවෙන් රු. මිලියන 183.3 ක් වූ අමතර කොමිස් මුදලක් ගෙවීමට සිදු වී තිබුණි.

- ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවල ගිවිසුම් කොන්දේසි කඩ කිරීමට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා අධිකාරියේ නීති අංශය වෙත යොමු නොකර, බාහිර නීති උපදේශකවරයෙකුගේ සේවය ලබා ගෙන, ඒ සඳහා නීති ගාස්තු ලෙස රු. මිලියන 3.1 ක් ගෙවා තිබුණි.

- නිවාස සංකීර්ණ 10 ක නිවාසලාභීන් 4,676 ක් පදිංචි කර තිබුණද, ඊට අදාල ගිවිසුම්වලට එළඹීමට හා නිවාසලාභීන්ගෙන් අයවිය යුතු රු. මිලියන 333.2 ක් වූ මාසික කුලී වාරික අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

- 2003 අංක 39 දරන (සංශෝධිත) පොදු පහසුකම් පනත අනුව ප්‍රතිලාභී නිවසියන් 4,486 කට බෙදා දී තිබුණු නිවාස 4,685 ක් සහිත නිවාස සංකීර්ණ 10 ක් වෙනුවෙන් සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ මූලික නිරාකරණ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

- ව්‍යාපෘති නිර්නායකයන්ට පටහැනිව තම නිවසට අමතරව අතිරේක නිවසක් බැගින් නිවාස 177 ක් ද, අතිරේක නිවාස 2 බැගින් අවස්ථා 12 කදී නිවාස 24 ක් ද වශයෙන් වටිනාකම රු.මිලියන 1,342.68 ක් වූ අතිරේක නිවාස 201 ක් ලබා දී තිබුණි.

- රජය සතු ඉඩම්වල අනවසර ව්‍යාපාරික ස්ථාන වෙනුවෙන් නිවාස 6 ක් හා අනුමත පරිපාටියට පටහැනිව නිවාස 39 ක් අවිධිමත් ලෙස ලබා දී තිබුණි.

- හෙක්ටයාර් 0.1012 ක් වූ නිදහස් කර ගත් ඉඩම් 6 ක ආරක්ෂාව සඳහා ආරක්ෂිත වැටවල් ඉදි කර නොතිබුණි. නිදහස් කර ගත් ඉඩම්වල නිවාසලාභීන් 131 දෙනෙකුගේ පැරණි නිවාස කඩා නොදැමීම හේතුවෙන් එම නිවාසවලම නැවතත් අනවසරයෙන් පදිංචි වී තිබුණි.

නැගෙනහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය - මාර්ග සංවර්ධන ව්‍යාපෘති

ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (JICA) මගින් මූල්‍යනය සපයන ලද වැඩසටහන් 2 ක් යටතේ මඩකලපු දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කළ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 59 (Package) අතුරින් ව්‍යාපෘති 13 ක ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ලංසුකරුවන් ඉදිරිපත් කර තිබුණු රේට් මිල ගණන් වැඩි කිරීම මගින් රු.මිලියන 174 ක මූල්‍ය අක්‍රමිකතා සිදු කර තිබුණි.

- කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගතවූ ප්‍රමාණ පත්‍රවල (BOQ) සඳහන් රේටයන් හා ප්‍රමාණයන්, සංශෝධිත ප්‍රමාණපත්‍ර රේටයන් හා ප්‍රමාණයන් (Revised Rate Qty's) සමග සැසඳීමේදී BOQ අයිතමයන්හි ප්‍රමාණ හා රේටයන්වල විශාල ලෙස වෙනස්කම් පැවතුණි. මේ හේතුවෙන් කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගත වු ප්‍රමාණ පත්‍ර ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් විධිමත් ලෙස පිළියෙල නොකිරීමෙන් කොන්ත්‍රාත්කරුට රු.827,994 ක් වැඩිපුර ගෙවා තිබුණි.

- අමරාවතියල් තෙන්නවරාමඩි මාර්ගය ඉදිකිරීමේ කොන්ත්‍රාත් ගිවිසුමේ ප්‍රමාණ පත්‍ර අනුව සමස්ථ ප්‍රමාණය ඉක්මවා වැඩබිමට සපයන ලද ඉදිකිරීම් ද්‍රව්‍ය වර්ග 4 ක් සඳහා රු. මිලියන 51.8 ක් වැඩිපුර ගෙවා තිබුණි.

රජයේ ඉඩම් සඳහා දීමනා පත්‍ර ලබාදීම

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ රජයේ ඉඩම් භුක්ති විඳින ගොවීන් වෙත භාරදීම සඳහා ජනාධිපතිවරයා විසින් 1997 වර්ෂයේ සිට 2001 වර්ෂය දක්වා කාලය තුළ අත්සන් කර ප්‍රාදේශීය ලේකම් වෙත එවා තිබුණු දීමනා පත්‍ර 910 ක් ගොවීන් වෙත භාරදී නොතිබුණි. මේ හේතුවෙන් ගොවීන්ට තමා භුක්ති විඳින ඉඩමේ නිරවුල් අයිතිය තහවුරුකර ගැනීමට නොහැකි වීම සහ ගොවීන් අතර විවිධාකාර වු ඉඩම් ආරවුල් පැන නැගී තිබුණි.

දුටුවැව ජනපදයේ රජයේ ඉඩම් භුක්ති විඳින ගොවීන්ගෙන් තෝරාගත් නියැදියකට අනුව කළ විගණන පරීක්ෂණයේදී දීමනා පත්‍ර වසර ගණනාවක් තිස්සේ ගොවීන්ට භාරනොදී රඳවා තබා ගෙන, ගොවීන්ගේ භුක්තිය තහවුරු කරන ලිපිලේඛන අස්ථානගත කර, අයථා ප්‍රතිලාභ ලබාගෙන, ඒ සඳහා ව්‍යාජ ලිපි ලේඛන පදනම් කර ගනිමින් සහ පනතේ විවිධිවිධාන වැරදි ලෙස අර්ථ දක්වමින් දින දෙකක් වැනි කෙටි කාලයක් තුළ ගොවීන්ගේ මුල් උරුමය ලියාපදිංචි කිරීමට හා පසු උරුම සංශෝධනය කිරීමට කටයුතු කර තිබිණි.

සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ පොහොර තොග ඌනතා

නෑගම ප්‍රාදේශීය පොහොර ගබඩාවේ 2014 පෙබරවාරි 25 දින තොග සත්‍යාපනයට අනුව තොග ඌනතාවය රු.86,412 ක් ද , 2014 දෙසැම්බර් 31 දින තොග සත්‍යාපනයට අනුව තොග ඌනතාවය රු.3,352,358 ක් ද, ව්‍යාජ තොග නිකුත් කිරීම තොග පොතට ඇතුළත් කිරීමෙන් රු.303,146 ක් ද වශයෙන් එකතුව රු.3,741,916 ක් වු ඌනතා වටිනාකම සහ ඊට අදාල සියයට 25 ක් වූ රජයේ ගාස්තු රු.935,479 ක් අයකරගෙන නොතිබුණි.

මිල්කෝ සමාගමේ සිදු වී තිබුණු දූෂණ හා අක්‍රමිකතාවන්

- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධානවලට පටහැනිව අවම ලංසුව ඉදිරිපත් කළ සැපයුම්කරුගෙන් ඇසුරුම් ද්‍රව්‍ය මිලදී නොගෙන වැඩි මිල ගණන් යටතේ කිරිපිටි ඇසුරුම් කි.ග්‍රෑම් 160,690 ක් මිලදී ගැනීම නිසා එකතුව රු. මිලියන 19.88 ක මූල්‍ය අලාභයක් සිදු වී තිබුණි.

- ප්‍රසම්පාදන කමිටුව අනුමැතිය ලබාදී නොතිබුණු සැපයුම්කරුවෙකුගෙන් වැඩි මිල ගණන් යටතේ යෝගට් කප් මිලදී ගැනීම හේතුවෙන් රු.472,606 ක මූල්‍ය අලාභයක් සමාගමට සිදුවී තිබුණි.
- මිල්කෝ කිරිගොවි සමාජ ආරක්ෂණ අරමුදලේ සාමාජිකයන්ට මූල්‍ය හා ද්‍රව්‍යමය ප්‍රතිලාභ ලබාදීමේ ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් සමාගමේ ප්‍රාදේශීය කාර්යාල හරහා ව්‍යාපෘති නිලධාරීන් මගින් සිදුකිරීමේ නිශ්චිත ක්‍රමවේදයක් තිබුණි. නමුත් එම ක්‍රමවේදය අනුගමනය නොකර ප්‍රතිලාභ වශයෙන් රු.මිලියන 1.06 ක් වූ පාසල් උපකරණ දරුවන්ට ලබා දීම හා ඒ වෙනුවෙන් උත්සව පැවැත්වීමට රු.728,703 ක් වූ අධික වියදමක් කර තිබුණි.
- කිරිගොවි හමුවක් පවත්වන බව ප්‍රකාශ කර ගොවීන් 4,200 ක් පමණ සහභාගි කර ගනිමින් පැය දෙකක් වැනි සුළු කාලයක් තුළදී දේශපාලන හමුවක් කොළඹදී පවත්වා සමාගමේ රු. මිලියන 6.20 ක මුදලක් අවභාවිත කර තිබුණි.
- නව නිෂ්පාදනයක් පාසල් සිසුන් අතරේ ප්‍රචලිත කිරීමේ අරමුණ හුවා දක්වමින් මෝටර් රථ ධාවන ශූරයෙකු සන්නාම තානාපති ලෙස නම් කර අනුග්‍රාහකත්වය සඳහා රු.මිලියන 3.38 ක ගෙවීම කර රජයේ මුදල් අවභාවිතා කර තිබුණි.

පොල්ගහවෙල ගව ආහාර කර්මාන්ත ශාලාව ප්‍රතිව්‍යුහගත කිරීම

- පොල්ගහවෙල ගව ආහාර කර්මාන්තශාලාව ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ කමිටුව විසින් නිර්දේශ කර තිබුණු විකල්ප යෝජනා අතුරින් 3 වන විකල්ප යෝජනාව වෙනුවට 2 වන විකල්ප යෝජනාව වූ කම්හල බදු දීමෙන් රු.100,000 ක මාසික බදු කුලියක් අය කිරීම ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් රු.මිලියන 1.61 ක අලාභයක් සිදු වී තිබුණි.
- කම්හලේ මාසික නිෂ්පාදන ධාරිතාවය කි.ග්‍රෑම් 25,000 ක් වුවත්, ප්‍රමාණවත් නිෂ්පාදනයක් පවත්වා නොතිබීමෙන් අඩු නිෂ්පාදනය පදනම්ව ආදායම අයකර ගැනීම හේතුවෙන් රු.මිලියන 2.26 ක අලාභයක් ද සිදුවී තිබුණි.

මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ වාහන මිලදී ගැනීම

2010 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන අයවැය චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ආයතනවල අවුරුදු 10 කට වඩා පැරණි සහ ආර්ථික වශයෙන් ඵලදායී නොවන වාහන අපහරණය කිරීමට සහ කුලී වාහන ලබා ගෙන ඇති විට ඒවා ඉවත් කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබාදෙමින් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ වාහන මිලදී ගැනීම සඳහා උපදෙස් ලබා දී තිබුණි. ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව, මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ආරම්භයේ සිට 2016 අප්‍රේල් 30 දින දක්වා වාහන 3,958 ක් ලබාගෙන තිබුණි. 2010 දෙසැම්බර් 14 දින භාණ්ඩාගාර ලේකම්, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා ලංකා බැංකුවේ නියෝජිතයන් සමඟ සාකච්ඡා කර සියයට 12 ක වාර්ෂික පොලී අනුපාතයක් යටතේ මූල්‍ය කල් බදු යටතේ වාහන ලබාගැනීමට එකඟ වී තිබුණි. නමුත් ලංකා බැංකුවෙන් ලබා ගත් තොරතුරු අනුව, එහි පොලී අනුපාතිකය සියයට 10.5 ක සිට සියයට 14.5 ක් දක්වා පරාසයක අනුපාතයන් ගෙන තිබුණි. ඊට අදාල තොරතුරු පහත වගුව 03 හි දැක්වේ.

විස්තර	ප්‍රාග්ධනය රු.මිලියන	පොලිය රු.මිලියන	එකතුව රු.මිලියන
මිලදී ගත් වාහන වල පිරිවැය	12,745.51	4,074.86	16,820.37
ගෙවන ලද වටිනාකම	7,230.82	3,044.86	10,275.68
ගෙවීමට ඇති වටිනාකම	5,468.67	1,021.42	4,490.09

වගුව 03. - මුල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබා ගත් වාහනවල වටිනාකම හා ගෙවිය යුතු වටිනාකම

චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු නොකිරීම

2010 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2 ඡේදය ප්‍රකාරව ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් මහජන බැංකුවට හා ලංකා බැංකුවට අනුබද්ධිත සමාගම් සමඟ සාකච්ඡා කර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 3.3 මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කර රජයට වඩාත් වාසිදායක මිල ගණන් හා කොන්දේසි ඉදිරිපත් කරන කල්බදු සමාගම තෝරා ගත යුතු බව සඳහන් කර තිබුණද, එම මිලදී ගැනීම ඉතා හදිසි හා ඉක්මනින් කළ යුතු බව ලිපිගොනුවේ සටහන්වල සඳහන් කර තිබුණු අතර අදාල තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ හෝ එම විධිවිධානවලින් බැහැරවීම සඳහා විධිමත් අනුමැතියක් හෝ ලබා නොගෙන මිලදී ගැනීම සිදු කර තිබුණි.

ඉහත සඳහන් චක්‍රලේඛයේ 3 හා 4 ඡේද අනුව, රාජ්‍ය ආයතනවල ආයතන ප්‍රධානීන් තම රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය සහිතව ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉල්ලුම්පත් එවූ පසු එම ඉල්ලුම් පත්‍ර අධ්‍යයනය කර ප්‍රමුඛතා ගත කර තෝරා ගත් කල්බදු සමාගම වෙතින් වාහන මිලදී ගැනීමට අනුමැතිය ලබා දිය යුතුව තිබුණි. එසේ අනුමැතිය ලබා ගත් රාජ්‍ය ආයතනය විසින් අදාළ කල්බදු සමාගම වෙතින් වාහනය ලබා ගත යුතුව තිබුණි. නමුත් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් අයදුම්පත්‍ර අනුව අදාළ සමාගම සමඟ වරින්වර ගිවිසුම්වලට එළඹ වාහන මිලදී ගැනිමට කටයුතු කර තිබුණි. චක්‍රලේඛයේ 6 ඡේදය අනුව අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු සඳහා මේ යටතේ ලබා ගත හැකි නිෂ්පාදන හා රේගු බදු රහිත වාහනයක උපරිම වෙළඳපොල මිල රු.මිලියන 4 ක් පමණක් වුවද, ඊට වඩා වැඩි මිලකට වාහන ලබා ගත් අවස්ථා තිබුණි.

වට්ටම් වාසිය ලබා ගැනීමට කටයුතු නොකිරීම

2016 මාර්තු 09 දින හා 2016 මැයි 26 දිනැති අංක BD/1/1/II/1/ උප I / 2016 දරන ලිපි මගින් රාජ්‍ය ආයතන සියල්ල සඳහා එකවර වාහන 50 කට වඩා වැඩි ප්‍රමාණයක් මිලදී ගැනීම තුළින් වට්ටම් ලබා දෙන බව විගණනයේදී නිරීක්ෂණය විය. කෙසේ වුවද, මුල්‍ය කල්බදු ගිවිසුම් පරීක්ෂා කිරීමේදි වාහන 1, 3 හා 4 ක් වශයෙන් ගිවිසුම්වලට එළඹ තිබුණි. ඒ නිසා රජයට ඉහත සඳහන් පරිදි වට්ටම් වාසිය ලබා ගැනීමට කටයුතු කර තිබුණු බවට සාක්ෂි ඉදිරිපත් වී නොතිබුණි.

විගණනයට තොරතුරු ලබා නොදීම

තෝරාගත් සමාගම්වලින් වාහන 50 කට වඩා ලබාගැනීමේදී වට්ටම් ලබාදීමට එකඟ වී ඇති බව දැන්වූ නිසා ඒ අනුව ලද වට්ටම් වාසිය පිළිබඳ තොරතුරු විමසූ අතර ඊට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවද, බැංකුව පාර්ශවයෙන් ලබාගත් තොරතුරු අනුව, වාහන ගෙන්වීමේදි මුදල් අයකිරීමකින් තොරව වාහන (Free unit) ලැබී තිබුණු බව නිරීක්ෂණය විය. මේ පිළිබඳව 2016 ජුලි 04 දිනැති තොරතුරු කැඳවීමේ ලිපියෙන් ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් විමසීමෙන් පසුව මුදල් අය කිරීමකින් තොරව ලද Toyota Hiace වෑන් 17 කට අදාල ලිපිගොනුවක් පමණක් විගණනයට ඉදිරිපත් කර තිබුණි. ඉතිරි වාහනවලට අදාළ තොරතුරු 2016 ජුනි 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

මිලදී ගෙන තිබුණු වාහන රාජ්‍ය ආයතනවලට ලබා නොදීම

මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ආයතන සඳහා මිලදී ගෙන තිබුණු වාහන 83 ක් 2016 ජුනි 16 දින වන විටත් එම ආයතනවලට ලබා නොදී මෝටර් රථ අංගනවල පැවැතුණි.

මෙහෙයුම් කල් බදු ක්‍රමය යටතේ වාහන ලබා ගැනීම

මෙහෙයුම් කල් බදු ක්‍රමය යටතේ වාහනේ අයිතිය කිසිම විටෙක කල්බදු ගෙවන ආයතනයට නොපැවරෙන අතර මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ, වර්ෂ 5 ක කාලයක් තුළ කල්බදු වාරික ගෙවීමෙන් පසු වාහනයේ අයිතිය සම්පූර්ණයෙන්ම කල් බදු ගෙවූ ආයතනයට පැවරෙන බවත් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ මිලදී ගන්නා ලද වාහනවල වටිනාකම ගෙවීම කාලයක් පුරා සිදුවන බැවින් එහි මූල්‍යමය බලපෑම එම කාලය පුරා විසිරී පවතින බවත් ඒ යටතේ වාහනවල නඩත්තු වියදම කල්බදු ගෙවන්නාට පැවරෙන නමුත් නව වාහන නඩත්තු වියදම් මුල් වර්ෂ 5 තුළදී අවම මට්ටමක පවතින බවත් සඳහන් කර 2010 දෙසැම්බර් මාසයේදී මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ වාහන මිලදී ගැනීම නිර්දේශ කර තිබුණි. එම ක්‍රමයේ පවතින දුර්වලතා මගහැරීමටත් රාජ්‍ය ආයතන වැය කරන විශාල නඩත්තු වියදම අඩුකිරීමටත් කල්බදු කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමටත් යන අපේක්ෂා ඇතිව 2016 මාර්තු මාසයේදි මෙහෙයුම් කල්බදු ක්‍රමය නිර්දේශ කර තිබුණි. කෙසේ වුවද, මෙහෙයුම් කල්බදු ක්‍රමයේදි වාහනයක් සඳහා මාස 60 ක ස්ථාවර කුලී පදනම යටතේ " භාවිතා කර වාහනය ආපසු භාර දීමේ" විකල්පය මත වාහන ලබාගෙන ඇති බැවින් වාහනවල අයිතිය කිසි විටෙකත් රජය සතු නොවන බව නිරීක්ෂණය විය.

විදේශ ශිෂ්‍යත්ව

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට අයත් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය තුළදී විදේශ රටවල් හා ආයතන 15 කින් දිගුකාලීන පුහුණු අවස්ථා 69 ක් සඳහාද, කෙටිකාලීන පුහුණු අවස්ථා 1,173 ක් සඳහාද එකතුව පුහුණු අවස්ථා 1,242 සඳහා විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල සේවයේ නියුක්ත රජයේ නිලධාරීන් තෝරා පත්කර තිබූ අතර චීන රජය විසින් 2015 වර්ෂය තුළදී පුහුණු වැඩසටහන් 324 ක් සඳහා අවස්ථාවන් සළසා දී තිබුණි. 2015 වර්ෂයේදී පුහුණු වැඩසටහන් 90 ක් සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත් සියල්ලම ප්‍රතික්ෂේප කර තිබූ අතර අයදුම්පත් නොලැබීම මත පුහුණු අවස්ථා 85 ක් අහිමිවී තිබූ බව විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු විශ්ලේෂණයේදී නිරීක්ෂණය විය.

2015 වර්ෂය සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හඳුන්වාදීම තුළින් වාර්ෂික අයවැය ඇස්තමේන්තුවලින් සළසා දෙන ලද ප්‍රතිපාදනවලින් ජනිතවන වත්කම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමෙන් ඒවායේ පාලනය මෙන්ම රටක් වශයෙන් රජය සතු වත්කම්වල වටිනාකම ගණනය කිරීමෙන්, ඒවායේ ආරක්ෂාව තහවුරුවන පරිදි වගකීම පැවරීමටත් හැකි තත්ත්වයක් නිර්මාණය වන බව සඳහන් කළ යුතුය. මෙම මූල්‍ය ප්‍රකාශනවල සඳහන් උපචිත පදනම මත ගණනය කළ ආදායම හා වියදම සමඟ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල සඳහන් ආදායම් හා වියදම් සැසඳිය හැකිවීම තුළින් ආදායම් රැස්කිරීමට හා වියදම් පාලනයක් ඇති කර ගත හැකිය.

වාර්ෂික විසර්ජනයන්

2015 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදනය කරන ලද මුළු අරමුදල් ප්‍රමාණය රු.මිලියන 1,186 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ප්‍රතිපාදනය රු.මිලියන 1,042 ක් විය.

2015 වර්ෂය තුළදී රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, පළාත් පාලන බලමණ්ඩල, විශ්වවිද්‍යාල හා ව්‍යවස්ථාපිත අරමුදල්වලින් විගණන ගාස්තු වශයෙන් රු.මිලියන 109 ක් ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදී. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රැස්කිරීමට අපේක්ෂා කළ විගණන ගාස්තුව රු.මිලියන 110 ක් වුවත්, එම ඇස්තමේන්තුව රු.මිලියන 1 ක් අඩුවෙන් සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු රැස්කිරීමට හැකි වී තිබුණි.

දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

වත්කම් පාලනය හා මෙහෙයුම් කාර්යක්ෂමතාවය මැන බැලීම සඳහා මෙවලමක් වශයෙන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ මූලික වැඩ කටයුතු 2010 වර්ෂයේදී ආරම්භ කෙරුණි. යටත් විජිත සමයේ සිට විසර්ජන ගිණුම් පමණක් ඉදිරිපත් කරමින් පවතින ආයතන කාණ්ඩය යටතේ පවතින දෙපාර්තමේන්තුවලට ප්‍රථම වතාවට මෙම ගිණුම්කරණය හඳුන්වා දී ඇත. තවදුරටත් 2013 වර්ෂයේ සිට සෑම අමාත්‍යාංශයකම හා දෙපාර්තමේන්තුවකටම මෙම ගිණුම් ක්‍රමය 2013 ජනවාරි 24 දිනැති අංක SA/AS/AA/Circular දරන රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියෙන් හඳුන්වා දී ඇත. මේ මගින් ආරම්භක පියවරක් වශයෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම මුළු රාජ්‍ය ක්ෂේත්‍රයටම ආදර්ශයක් වී ඇත.

ගිණුම් ප්‍රතිපත්ති

1 වාර්තා කිරීමේ අස්ථිත්වය

විගණකාධිපති දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් කිසියම් විශේෂ නීතියක් නොමැත. කෙසේ වුවද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාවෙහි විගණකාධිපතිවරයෙක් විය යුතු බව දක්වා ඇත. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) හා (3) ව්‍යවස්ථාවල

සඳහන් ආයතනවලට විගණන සේවා සැපයීම වේ. මෙම මූල්‍ය ප්‍රකාශන 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වේ.

2 වාර්තා කිරීමේ කාලපරිච්ඡේදය

වාර්තා කිරීමේ කාලපරිච්ඡේදය ජනවාරි 01 දිනෙන් ආරම්භ වී දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන ලිත් වර්ෂය වේ.

3 සකස් කිරීමේ පදනම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදී. ඓතිහාසික පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලද අතර සියලුම වටිනාකම් ආසන්නම රුපියල් දහසේ වටිනාකමට වටයා ඇත.

4 ආදායම්

භාණ්ඩාගාරයෙන් ලද පුනරාවර්තන වියදම් සඳහා ප්‍රදාන, විගණන ගාස්තු, ණය සඳහා පොළී, ගොඩනැගිලි කුළී, සංචාරක බංගලා ගාස්තු, වත්කම් අපහරණයෙන් ලාභ, දඩ හා ගාස්තු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආදායම් ප්‍රභවයන් වන අතර ඒවා උපචිත පදනම මත ගිණුම්ගත කර ඇත. ආදායම ඒවාට ලැබුණු ප්‍රතිෂ්ඨාව අනුව සාධාරණ පදනම මත ගණනය කර ඇත.

රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, පළාත් පාලන ආයතන, විශ්වවිද්‍යාල හා ව්‍යවස්ථාපිත අරමුදල්වලින් විගණන ගාස්තු අයකරනු ලබයි. කාලපරිච්ඡේදයට අදාළ ආදායමක් ලෙස ගාස්තු හඳුනාගනී. විගණන ගාස්තුවල වටිනාකම, විගණනය සඳහා ගත කරනු ලබන කාලය හා එම විගණනය සඳහා වැය කරන සෘජු පිරිවැය පදනම් කරගෙන තීරණය කරනු ලැබේ.

ණය සඳහා පොලී, ගොඩනැගිලි කුලී, සංචාරක බංගලා ගාස්තු, දඩ හා ගාස්තු, වත්කම් අපහරණයෙන් ලද ආදායම් පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වෙනත් දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු වුවත්, දෙපාර්තමේන්තුවට අදාල එම ආදායම් එකතු කරන නිලධාරියා විගණකාධිපති වන හෙයින් හා එකතු කරන ලද ආදායම සමස්ථ ආදායමෙන් සුළු ප්‍රතිශතයක් වන හෙයින්, එම ආදායම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත. මුදල් පදනම මත භාණ්ඩාගාර පුනරාවර්තන වියදම් සඳහා වන ප්‍රදානයන් ගිණුම්ගත කර ඇතත්, ස්ථාවර වත්කම් ක්ෂයවීම් පුනරාවර්තන වියදම් සඳහා ලැබිය යුතු ප්‍රදාන යටතේ ගිණුම්ගත කර ඇත.

5 වියදම්

උපචිත පදනම යටතේ සියළු පුනරාවර්තන වියදම් ගිණුම්ගත කරනු ලැබේ.

6 විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු

විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු එම ගනුදෙනුව සිදුවන දිනට පවතින විනිමය අනුපාත යොදා ගනිමින් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ. එම ගනුදෙනු පියවීමේදී සිදුවන විදේශ විනිමය ලාභ හා පාඩු මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේදී හඳුනාගනු ලැබේ.

7 මුදල් හා මුදල්වලට සමාන දෑ

අතැති මුදල් හා බැංකුවල ඇති වැඩි ද්‍රවශීලතාවයෙන් යුක්ත කෙටිකාලීන තැන්පතු, මුදල් හා මුදල්වලට සමාන දෑ ඇතුළත් වේ.

8 ණයගැතියන් හා අනෙකුත් ලැබිය යුතු මුදල්

ණයගැතියෝ හා ලැබිය යුතු දෑ මූලිකව සාධාරණ අගයට ගණනය කරනු ලැබේ. ලැබිය යුතු ශේෂ පිළිබඳ මූලික කොන්දේසිවලට අනුව දෙපාර්තමේන්තුවට මුදල් අයකර ගැනීමට නොහැකි බවට සාක්ෂි තිබෙන විට ලැබිය යුතු මුදලක් හානිකරණය වූ ලෙස සලකනු ලැබේ.

9 දේපල, පිරියත හා උපකරණ

ඉඩම්, ගොඩනැගිලි, ලීබඩු හා සවිකිරීම්, කාර්යාල උපකරණ, පරිගණක දෘඩාංග හා මෝටර් රථ යනාදියෙන් දේපල, පිරියත හා උපකරණ සමන්විත වේ. දේපල පිරියත හා උපකරණ පිරිවැයට සමුච්චිත ක්ෂය හා අපහරණයෙන් වූ පාඩු අඩුකර දක්වනු ලැබේ. 2009 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන ශේෂ පදනම් කරගෙන පළමුවරට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති අතර 2010 ජනවාරි 01 දිනට පැවති සියළුම ඉඩම් හා ගොඩනැගිලි මැණුම් දෙපාර්තමේන්තුවේ සැලැසුම්වලට අනුව තක්සේරු දෙපාර්තමේන්තුව මගින් කරන ලද තක්සේරුවට අනුව ගිණුම් ගත කරන ලදී. සියළුම මෝටර් රථ වාහන රජයේ තක්සේරුකරු විසින් කරන ලද ප්‍රත්‍යාගණනය පදනම් කරගෙන ගිණුම්ගත කර ඇති අතර, ලීබඩු, පරිගණක හා වෙනත් විෂයයන් ස්වාධීන තක්සේරු කණ්ඩායමක් විසින් සිදුකරණ ලද තක්සේරුව මත පදනම් කරගෙන ගිණුම්වලට ගන්නා ලදී.

දේපල පිරියත හා උපකරණ විෂයයක පිරිවැය වත්කමක් ලෙස හඳුණාගනු ලබන්නේ විෂයය සමඟ සම්බන්ධිත අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ විය හැකි සේවා දෙපාර්තමේන්තුවට ගලා එන්නේ නම් හා එම විෂයෙහි පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි අවස්ථාවන්හිදීය. බොහෝ අවස්ථාවලදී දේපල පිරියත හා උපකරණ විෂයයන් එහි පිරිවැයට හඳුණාගනු ලැබේ. පිරිවැය රහිතව අත්කර ගත් හෝ නාමික පිරිවැයට අත්කර ගත් වත්කමක පිරිවැය, එම වත්කම අත්කර ගත් දිනයේදී සාධාරණ අගයට හඳුණාගනු ලැබේ.

9.1 අපහරණයන්

අපහරණයේදී ලැබෙන මුදල වත්කමෙහි ධාරණ වටිනාකම සමඟ සසඳා අපහරණයෙන් උද්ගතවන ලාභය හා පාඩුව තීරණය කරනු ලැබේ. අපහරණය මත ලාභ හා පාඩු මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් කරනු ලැබේ.

9.2 පසුව සිදුවන පිරිවැය

මුල් අත්පත් කර ගැනීමෙන් අනතුරුව දරනු ලබන පිරිවැය ප්‍රාග්ධනිත කරනු ලබන්නේ එමගින් ලැබිය හැකි ආර්ථික ප්‍රතිලාභ හෝ ලැබිය හැකි සේවා දෙපාර්තමේන්තුවට ගලා එන්නේනම් සහ එම විෂයන්හි පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි අවස්ථාවන්හිදීය.

9.3 ක්ෂය කිරිම

සියළුම දේපල, පිරිවිත හා උපකරණවල පිරිවැය අඩුකළ ඇස්තමේන්තුගත අවශේෂ වටිනාකම් සහ ඒවායේ ප්‍රයෝජනවත් ආයුකාලය අනුපාතයට අනුව සියළුම දේපල, පිරියත හා උපකරණ සඳහා ක්ෂය සරල මාර්ග පදනම මත ප්‍රතිපාදනය කරනු ලබයි. ප්‍රධාන වත්කම්වලට ප්‍රයෝජනවත් ආයු කාලය හා සම්බන්ධිත ක්ෂය අනුපාත පහත දැක්වෙන පරිදි ඇස්තමේන්තු කර ඇත.

වත්කම	ආයු කාලය	ක්ෂය අනුපාතය
	වර්ෂ	ප්‍රතිශතය
ගොඩනැගිලි	50	2.0
කුඩා පරිමාණ මුද්‍රණාලය	20	5.0
විදුලි සෝපානය	20	5.0
මෝටර් වාහන	8	12.5
ලීබඩු හා උපකරණ	5	20.0
පරිගණක හා දෘඩාංග	4	25.0

10. ගෙවිය යුතු මුදල්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනට පවතින වටිනාකමට ගෙවිය යුතු මුදල් ගිණුම්වලට ගනු ලැබේ. මූලිකව සාධාරණ අගයට ගෙවිය යුතු මුදල් ගණනය කරනු ලැබේ.

11. වාර්ෂික ඇස්තමේන්තු

පාර්ලිමේන්තුව විසින් වාර්ෂික විසර්ජන පනත මගින් වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල දැක්වෙන සංඛ්‍යා ප්‍රධාන ඇස්තමේන්තුවේ සංඛ්‍යා වේ. මුදල් රෙගුලාසි 66 හා 69 යටතේ වීරමොං පරිපාටියෙන්ද, පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් හා පරිපූරක ඇස්තමේන්තු මගින් ගැලපීම් කිරීමෙන් පසුව මෙම සංඛ්‍යා අවසාන සංඛ්‍යා ලෙස දක්වනු ලැබේ.

12. විනිශ්චයන් සහ ඇස්තමේන්තු කිරීම්

ප්‍රතිපත්ති යොදා ගැනිම සහ වාර්තා කරන ලද වත්කම් හා බැරකම්, ආදායම් හා වියදම් සඳහා බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු කිරිම්, උපකල්පනයන් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම සඳහා අවශ්‍ය වේ. අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගැලපෙන පරිදි ඇස්තමේන්තු හා ආශ්‍රිත උපකල්පනයන් ඓතිහාසික අත්දැකීම් හා වෙනත් විවිධ කරුණු මත පදනම් වේ.

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

ඇස්තමේන්තුව 2015		සටහන	2015	2014
රු.000			රු.000	රු.000
	ආදායම			
110,000	විගණන ගාස්තු	1	104,025	117,238
150	කුලී		280	232
9,000	පොළී		9,384	10,110
-	දඩ මුදල් හා රාජසන්තක කිරීම්		15	69
2,000	අනෙකුත්		3,053	2,714
-	වත්කම් අපහරණයෙන් ලාභ	2	3,255	3,372
121,150	**මුළු මෙහෙයුම් ආදායම**		**120,012**	**133,735**
711,183	පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාර දායකත්වය	3	1,134,428	784,682
812,383	**මුළු ආදායම**		**1,254,440**	**914,973**
	වියදම			
1,022,850	පුද්ගල පඩිනඩි	4	1,015,033	670,988
15,000	ගමන් වියදම්	5	14,663	13,611
21,000	සැපයීම්	6	18,133	21,033
20,700	නඩත්තු වියදම්	7	16,510	14,954
72,500	සේවා	8	68,283	52,693
13,100	මාරු කිරීම්	9	10,379	10,326
1,900	පුහුණු කිරීම් හා හැකියා වර්ධනය		1,889	251
-	ක්ෂයවීම්	10	85,715	82,974
-	පුනරාවර්තන වියදම් - රාජ්‍ය අංශයේ ධාරිතා වර්ධන ව්‍යාපෘතිය		-	1,788
-	විගණන ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ පිරිවැය ක්‍රමක්ෂය	11	24,904	24,904
812,383	**මුළු වියදම**		1,255,509	**893,522**
0	**වියදම ඉක්මවූ ආදායමේ අතිරික්තය/(ඌනතාවය)**		(1,069)	24,895

2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2015 දෙසැම්බර් 31		2014 දෙසැම්බර් 31	
		රු.000	*රු.000*	*රු.000*	*රු.000*
ජංගම වත්කම්					
මුදල් ශේෂය		-		-	
තොගය	12	5,225		6,577	
රජයේ නිලධාරීන්ට අත්තිකාරම්	13	218,238		231,840	
ලැබිය යුතු විගණන ගාස්තු	14	214,429		214,810	
මුළු ජංගම වත්කම්			**437,892**		**453,227**
විගණන ක්‍රමවේදය සංවර්ධනය කිරීම	11		151,380		176,284
ජංගම නොවන වත්කම්					
දේපල,පිරියත හා උපකරණ	10		1,116,592		1,175,360
මුළු වත්කම්			**1,705,864**		**1,804,871**
ජංගම වගකීම්					
ගෙවිය යුතු වියදම්	15	2,232		2,897	
ගෙවිය යුතු තැන්පත්		24,990		18,221	
මුළු ජංගම වගකීම්			**27,222**		**21,118**
සමුච්චිත අරමුදල					
ජනවාරි 01 දිනට ශේෂය		218,490		193,595	
වර්ෂයේ අතිරික්තය/(ඌනතාවය)		**(1,069)**		24,895	
දෙසැම්බර් 31 දිනට ශේෂය			**217,421**		**218,490**
දායකය					
භාණ්ඩාගාර	16	625,135		644,906	
රාජ්‍ය අංශයේ ධාරිතාවය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	17	836,086	1,461,221	920,357	1,565,263
මුළු බදු ගෙවන්නන්ගේ ස්කන්ධය			1,705,864		1,804,871

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

එස්.ජී.සේනාරත්න
ප්‍රධාන ගණකාධිකාරී

2016 ඔක්තෝබර් 28 දින

මූල්‍ය ප්‍රකාශනවල සටහන්

සටහන් 01	විගණන ගාස්තු		
ඇස්තමේන්තුව 2015	විස්තරය	2015	2014
රු.දහස්		රු.දහස්	රු.දහස්
110,000	**ලැබීම්**		
	රාජ්‍ය සංස්ථා, මණ්ඩල හා රජයට අයත් අනෙකුත් ආයතන	32,787	38,809
	පළාත් පාලන ආයතන	26,307	15,025
	ගොවිජන සේවා මධ්‍යස්ථාන	1,225	725
110,000	**එකතුව**	**60,319**	**54,559**
	ලැබිය යුතු		
	රාජ්‍ය සංස්ථා, මණ්ඩල හා රජයට අයත් අනෙකුත් ආයතන	20,850	32,852
	පළාත් පාලන ආයතන	19,986	28,171
	ගොවිජන සේවා මධ්‍යස්ථාන	2,870	1,656
-	**එකතුව**	**43,706**	**62,679**
110,000	**මුළු එකතුව**	**104,025**	**117,238**

සටහන 02	වත්කම් අපහරණය		
ඇස්තමේන්තුව 2015	විස්තරය	2015	2014
රු.දහස්		රු.දහස්	රු.දහස්
	වාහන අපහරණය		
-	වාහනවල විකුණුම් වටිනාකම	6,349	7,241
-	ධාරණ අගය	(3,212)	(3,875)
-	වාහන අපහරණයෙන් ලාභ/(අලාභ)	3,137	3,366
-	**ලීබඩු හා උපකරණ අපහරණය**		
-	ලීබඩු හා කාර්යාල උපකරණ විකුණුම් වටිනාකම	133	8
-	ධාරණ අගය	(46)	(2)
-	ලීබඩු හා උපකරණ අපහරණයෙන් ලාභය	87	6
	පරිගණක හා දෘඩාංග අපහරණයෙන්		
-	පරිගණක හා දෘඩාංග විකුණුම වටිනාකම	31	-
	ධාරණ අගය	-	-
-	පරිගණක හා දෘඩාංග අපහරණයෙන් ලාභය	31	-
-	වත්කම් අපහරණයෙන් ලාභය	**3,255**	**3,372**

සටහන 03	පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාර දායකත්වය		
ඇස්තමේන්තුව 2015	විස්තරය	2015	2014
රු.දහස්		රු.දහස්	රු.දහස්
711,183	පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම	1,023,809	676,804
-	ක්ෂයවීම් සඳහා ලැබිය යුතු අග්‍රිම	85,715	82,974
-	විගණන ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ පිරිවැය	24,904	24,904
711,183	**පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාර දායකය**	**1,134,428**	**784,682**

සටහන 04 **පුද්ගල පඩිනඩි**

ඇස්තමේන්තුව 2015	විස්තරය	2015	2014
රු.දහස්		රු.දහස්	රු.දහස්
388,650	වැටුප් හා වේතන	384,461	341,291
3,200	අතිකාල හා නිවාඩු දින දීමනා	3,196	2,999
631,000	අනෙකුත් දීමනා	627,376	326,698
1,022,850	**එකතුව**	**1,015,033**	**670,988**

සටහන 05 **ගමන් වියදම්**

ඇස්තමේන්තුව 2015	විස්තරය	2015	2014
රු.දහස්		රු.දහස්	රු.දහස්
11,000	දේශීය	10,945	11,226
4,000	විදේශීය	3,718	2,385
15,000	**එකතුව**	**14,663**	**13,611**

සටහන 06 **සැපයීම්**

ඇස්තමේන්තුව 2015	විස්තරය	2015	2014
රු.දහස්		රු.දහස්	රු.දහස්
9,500	ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා	9,080	9,131
11,000	ඉන්ධන	8,599	11,454
500	ආහාර පාන හා නිල ඇඳුම්	454	448
21,000	**එකතුව**	**18,133**	**21,033**

සටහන 07	නඩත්තු වියදම්		
ඇස්තමේන්තුව 2015	විස්තරය	2015	2014
රු.දහස්		රු.දහස්	රු.දහස්
9,000	මෝටර් වාහන	7,727	6,238
5,500	පිරියත, යන්ත්‍ර හා උපකරණ	4,714	4,662
6,200	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	4,069	4,054
20,700	එකතුව	**16,510**	**14,954**

සටහන 08	සේවා		
ඇස්තමේන්තුව 2015	විස්තරය	2015	2014
රු.දහස්		රු.දහස්	රු.දහස්
11,500	ප්‍රවාහන	9,491	10,920
16,500	තැපැල් හා සංනිවේදනය	16,144	10,118
13,300	විදුලිය හා ජලය	12,201	11,518
1,200	බදු කුලී හා පළාත් පාලන ආයතන බදු	339	548
30,000	අනෙකුත්	30,108	19,589
72,500	එකතුව	68,283	**52,693**

සටහන 09	මාරු කිරීම්		
ඇස්තමේන්තුව 2015 රු.දහස්	විස්තරය	2015 රු.දහස්	2014 රු.දහස්
600	දායක මුදල් හා සම්මාදම්	270	468
12,500	රජයේ නිලධාරීන්ගේ දේපල ණය මත පොළී	10,109	9,858
13,100	එකතුව	**10,379**	**10,326**

සටහන 10 දේපල, පිරියත හා උපකරණ

	ඉඩම්	ගොඩනැගිලි	මෝටර් වාහන	පරිගණක හා දෘඩාංග	ගෘහ භාණ්ඩ හා උපකරණ	මුද්‍රණ යන්ත්‍රය	විදුලි සෝපානය හා විදුලි ජනක යන්ත්‍ර	එකතුව
	රු.දහස්	රු.දහස්	රු.දහස්	රු.දහස්	රු.දහස්	රු.දහස්	රු.දහස්	රු.දහස්
පිරිවැය								
2015 ජනවාරි 01 දිනට ශේෂය	**256,147**	775,028	109,988	**132**,394	94,421	**26,023**	**8,828**	**1**,402,829
එකතු කිරීම්	-	657	15,950	**1**,944	4,653	-	7,002	30,206
අපහරණය කිරීම්	-	-	(6,425)	(741)	(229)	-	-	(7,395)
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය	**256,147**	**775**,685	119,513	**133**,597	98,845	**26,023**	15,830	**1**,425,640
ක්ෂය කිරීම්								
2015 ජනවාරි 01 දිනට ශේෂය	-	39,862	41,804	92,860	47,460	3,903	**1**,580	227,469
අපහරණය කළ වත්කම් වෙනුවෙන් ක්ෂය	-	-	(3,212)	(741)	(183)	-	-	(4,136)
එකතු කිරීම්	-	**15,5**14	14,939	**33**,400	19,769	**1,301**	792	85,715
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය	-	55,376	53,531	125,519	67,046	5,204	2,372	309,048
2015 දෙසැම්බර් 31 දිනට ශුද්ධ අගය	**256,147**	**720,309**	**65,982**	**8,078**	**31,799**	**20,819**	**13,458**	**1,116,592**

සටහන 11 විගණන ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ වියදම්

විස්තරය	2015	2014
	රු.දහස්	රු.දහස්
2015 ජනවාරි 01 දිනට ශේෂය	176,284	201,108
2015 වර්ෂයට අදාල පිරිවැය ක්‍රමක්ෂය (පිරිවැයෙන් 10%)	(24,904)	(24,904)
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය	**151,380**	**176,284**

සටහන 12 තොගය

විස්තරය	2015	2014
	රු.දහස්	රු.දහස්
ගොඩනැගිල්ල නඩත්තු කිරීමේ ද්‍රව්‍ය	273	367
ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා	4,396	4,973
ටයර් හා ටියුබ්	556	1,237
එකතුව	**5,225**	**6,577**

සටහන 13 රජයේ නිලධාරීන්ට අත්තිකාරම්

විස්තරය	2015	2014
	රු.දහස්	රු.දහස්
දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරින්ගෙන් අය විය යුතු ශේෂ එකතුව	210,890	228,663
වෙනත් දෙපාර්තමේන්තුවලට ස්ථාන මරුවීම් ලබා ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ශේෂ එකතුව	3,284	187
විශ්‍රාම ගිය හා මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ශේෂ එකතුව	3,069	1,917
තනතුර අතහැර ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ශේෂ එකතුව	456	475
සේවය අවසන් කළ නිලධාරින්ගෙන් අයවිය යුතු ශේෂ එකතුව	539	598
එකතුව	**218,238**	**231,840**

සටහන 14 ලැබිය යුතු විගණන ගාස්තු

විස්තරය	2015	2014
	රු.දහස්	රු.දහස්
සංවර්ධන සභා	30	30
මහා නගර සභා	25,044	24,493
නගර සභා	46,054	50,187
ප්‍රාදේශීය සභා	23,105	24,601
රාජ්‍ය සංස්ථා, මණ්ඩල හා අනෙකුත් රාජ්‍ය ආයතන	108,056	105,207
ගොවිජන සේවා මධ්‍යස්ථාන	12,140	10,254
ආර්ථික මධ්‍යස්ථාන		38
එකතුව	**214,429**	**214,810**

සටහන 15 උපචිත වියදම්

විස්තරය	2015	2014
	රු. දහස්	රු. දහස්
දුම්රිය බලපත්‍ර - නිවාඩු	351	416
දුම්රිය බලපත්‍ර - රාජකාරී ගමන්	3	44
අනෙකුත් වියදම්	138	-
තැපැල් ගාස්තු	15	21
දුරකථන බිල්පත්	500	**844**
විදුලි බිල්පත්	1,026	808
ජල බිල්පත්	76	60
වාහන අළුත්වැඩියා	46	296
ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා	3	355
දේපල හා පිරියත නඩත්තු කිරීම	74	53
එකතුව	**2,232**	**2,897**

සටහන 16 මූලධන වියදම් හා පොදු තැන්පත් ගිණුම සඳහා භාණ්ඩාගාර දායකය

විස්තරය	2015	2014
	රු.දහස්	රු.දහස්
රජයේ නිලධාරින්ට අත්තිකාරම් සඳහා	218,238	231,840
තැන්පත් ගිණුම සඳහා	(24,990)	(18,221)
ස්ථාවර වත්කම් සඳහා	431,887	431,287
එකතුව	**625,135**	**644,906**

සටහන 17 රාජ්‍ය අංශ ධාරිතාවය වර්ධනය ව්‍යාපෘතියේ දායකය

විස්තරය	2015	2014
	රු.දහස්	රු.දහස්
ස්ථාවර වත්කම් සඳහා	684,706	744,073
විගණන ක්‍රමවේදය සඳහා	151,380	176,284
එකතුව	**836,086**	**920,357**

විගණන නිරීක්ෂණවල සාරාංශය
(ක්ෂේත්‍ර අනුව)

ඒකාබද්ධ අරමුදල

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙ 148 ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය මුල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතුවේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාව ප්‍රකාරව රජය විසින් එකතු කරනු ලබන ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කිරිමත්, ඒකාබද්ධ අරමුදලින් ගෙවීම් කළ යුතු ආකාරය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 හා 152 ව්‍යවස්ථාවල දක්වා ඇත.

මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය ආදායම් ඉපයිම සහ රජයට ලැබිය යුතු වෙනත් මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළු මුදල් කටයුතු අධීක්ෂණය මුදල් අමාත්‍යවරයා වෙත පැවරී තිබේ. සියළුම ආකාරයේ දෙපාර්තමේන්තුමය මුදල් ගනුදෙනු ඉටු කළ යුත්තේ සාමාන්‍යයෙන් කවර සීමාවක් ඇතුළතද යන වග අමාත්‍යවරයා හෝ ඔහු වෙනුවෙන් භාණ්ඩාගාරය විසින් නියම කරනු ලබයි. සියළුම ලැබීම් හා ගෙවීම් පිළිබඳව පාර්ලිමේන්තුවට උත්තරදීම මුදල් අමාත්‍යවරයාගේ යුතුකම වන අතර ඒ වෙනුවෙන් මහජන අරමුදල් එකතු කිරීම හා වැය කිරීම සඳහා අමාත්‍යවරයා විසින් එක් එක් අමාත්‍යාංශයේ ලේකම්වරයා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් වශයෙන් පත්කර භාණ්ඩාගාරයේ විධිවිධානයන්ට යටත්ව දෙපාර්තමේන්තුවල මුදල් කටයුතු අධික්ෂණය කිරීමේ වගකීම එම නිලධාරීන්ට පවරනු ලබයි. අමාත්‍යාංශ ලේකම්වරුන්ට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52(4) ව්‍යවස්ථාවෙහි නිශ්චිතවම සඳහන් කර ඇති දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්ද සහ අමාත්‍යාංශයක් යටතට නොවැටෙන දෙපාර්තමේන්තු ප්‍රධානීන් මුදල් අමාත්‍යවරයා විසින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් වශයෙන් පත් කර තිබුණි.

2015 වර්ෂය සඳහා ප්‍රතිපාදන සැලැසීම

2015 අංක 15 දරන විසර්ජන (සංශෝධන) පනත හා 2015 අංක 1 දරන විසර්ජන (සංශෝධන) පනත යන පනත්වලින් සංශෝධිත 2014 අංක 41 දරන විසර්ජන පනතින් 2015 වර්ෂයට පුනරාවර්තන වියදම් සඳහා රු.බිලියන 869 ක් හා මුලධන වියදම් සඳහා රු.බිලියන 1,232 ක් වශයෙන් එකතුව රු.බිලියන 2,101 ක ප්‍රතිපාදන සලසා තිබුණි. පවත්නා නීති මඟින් අනුමැතිය ලැබී ඇති ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු විශේෂ නිති සේවා වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රු.බිලියන 434 ක් හා මුලධන වියදම් සඳහා රු.බිලියන 803 ක් වශයෙන් එකතුව රු.බිලියන 1,237 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඒ අනුව රු.බිලියන 3,338 ක ප්‍රතිපාදන 2015 වර්ෂයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ දක්වා තිබුණි. මීට අමතරව විශේෂ නීති සේවා සඳහා අතිරේකව ලබාදුන් රු.බිලියන 137 ක ප්‍රතිපාදනය සමඟ 2015 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රතිපාදනය රු.බිලියන 3,475 ක් වී තිබුණි.

2014 අංක 41 දරන විසර්ජන පනතේ 6 වගන්තිය ප්‍රකාරව අයවැය සහන සේවා හා හදිසි අවස්ථා වගකීම් ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂය සඳහා රු. බිලියන 63 ක් පුනරාවර්තන වියදම් සඳහාද, රු. බිලියන 138 ක් මූලධන වියදම් සඳහාද, වශයෙන් එකතුව රු.බිලියන 201 ක ප්‍රතිපාදන සලසා තිබුණි.

ප්‍රතිපාදන උපයෝජනය

2015 වර්ෂය වෙනුවෙන් සලසා තිබුණු රු.බිලියන 3,475 ක ප්‍රතිපාදනවලින් රු.බිලියන 3,204 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.බිලියන 271 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. ඉකුත් වර්ෂයේ ඉතිරිය වූ රු.බිලියන 126 සමඟ සැසැඳීමේදී රු.බිලියන 145 කින් ඉතිරිවීම්වල වැඩි වීමක් නිරීක්ෂණය විය. 2015 වර්ෂයට අදාලව ණය ගෙවීම් හැර ඇස්තමේන්තුගත මූලධන වියදම රු.බිලියන 835 ක් වූ අතර උපයෝජනය ඉන් සියයට 81.9 ක් හෙවත් රු.බිලියන 684 ක් වී තිබුණි. එය පසුගිය වර්ෂයේ උපයෝජනය කළ මූලධන ප්‍රතිපාදන වූ රු.බිලියන 596 ක් සමඟ සැසඳීමේදී රු.බිලියන 88 කින් වැඩි වි තිබුණි. පසුගිය වර්ෂ 5 තුළ පුනරාවර්තන වියදම, මූලධන වියදම හා මුළු වියදම පහත සඳහන් රූපසටහන 01 හි දැක්වේ.



රූපසටහන 01 2015 වර්ෂයේ වියදම
මූලාශ්‍රය - ජනරජයේ මූල්‍ය ප්‍රකාශන හා මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව

2011 වර්ෂයේදී පුනරාවර්තන වියදම රු.බිලියන 1,020 ක් වී තිබුණත්, එය 2015 වර්ෂය වන විට රු.බිලියන 1,673 දක්වා වැඩි වී තිබුණි. එය සෑම වර්ෂයකදීම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 7.26 ක සිට සියයට 22.12 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් වැඩි වී තිබුණි. 2013 වර්ෂයේදී සියයට 12.16 කින් වැඩි වී තිබුණත්, 2015 වර්ෂයේදී එහි වැඩිවීම සියයට 22.12 ක් වැනි ඉහළ ප්‍රමාණයක් වී තිබුණි. විස්තර රූප සටහන 02 හි දැක්වේ. එමෙන්ම මූලධන වියදම 2011 වර්ෂයේදී රු.බිලියන 399 ක් වී තිබුණත්, 2015 වර්ෂයේදී එය රු.බිලියන 684 ක් දක්වා වැඩි වී තිබුණි. 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ (2013 වර්ෂයේදී හැර) ඉකුත් වර්ෂයට වඩා සියයට 14.77 ක සිට 218.72 ක පරාසයක ප්‍රමාණයකින් වැඩි වී තිබුණි. 2013 වර්ෂයේදී 2012 වර්ෂයට සාපේක්ෂව සියයට 60.30 ක ප්‍රමාණයකින් අඩු වී තිබුණි. නමුත් 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේදී මූලධන වියදමේ වැඩිවීම සියයට 218.72 කින් වැඩි වී තිබුණි. විස්තර රූපසටහන 02 හි දැක්වේ.



රූප සටහන 02- ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූලධන, පුනරාවර්තන හා මුළු වියදමේ වැඩිවීමේ/(අඩුවීමේ) ප්‍රතිශතය
මූලාශ්‍රය - ජනරජයේ මූල්‍ය ප්‍රකාශන

2015 වර්ෂයේ පුනරාවර්තන, මුලධන හා ණය ආපසු ගෙවීම්වල එකතුව රු.බිලියන 3,203 ක් වී තිබුණි. හඳුනාගත් අංශ 16 ක් අතර එම වියදම සිදු කළ ආකාරය රූප සටහන 03 හි දැක්වේ. සමස්ථ වියදමෙන් සියයට 26 ක් ණය ගෙවීම සඳහාද, සියයට 16 ක් පොලී ගෙවීම සඳහාද වැය කර තිබුණි.

මධ්‍යම රජයේ ප්‍රතිපාදනවලින් ආරක්ෂාවට මුළු වියදමෙන් සියයට 9.27ක්ද, පළාත් සභා හා පළාත් පාලනයට සියයට 7.09 ක්ද, රාජ්‍ය පරිපාලනය හා විශ්‍රාම වැටුප් සඳහා සියයට 5.19 ක්ද සෞඛ්‍ය හා පෝෂණය සඳහා සියයට 4.09 ක්ද සහ අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය සඳහා සියයට 3.19 ක්ද වැය කර තිබුණි.



රූපසටහන 03 - සමස්ථ වියදම හඳුනාගත් ක්ෂේත්‍ර 16 ක දායකය
මූලාශ්‍රය - ජනරජයේ මුල්‍ය ප්‍රකාශන 2015

ආදායම

ශ්‍රී ලංකා ජනරජයේ පාර්ලිමේන්තුව මගින් 2015 වර්ෂය සඳහා අනුමත වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව 2015 වර්ෂයේ දේශිය හා විදේශිය ණය ගැනීම් හැර ඇස්තමේන්තු කළ රාජ්‍ය ආදායම රු.බිලියන 1,440.6 ක් වී තිබුණි. එය ඉකුත් වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම වූ රු.බිලියන 1,331.4 සමඟ සැසඳීමේදී රු. බිලියන 109.2 ක් හෙවත් සියයට 8.20 ක වැඩිවීමක් විය. 2015 වර්ෂයේදී ඇස්තමේන්තු කළ ආදායමින් රු.බිලියන 1,394.2 ක් හෙවත් සියයට 96.78 ක් රැස්කර ගැනීමට හැකි වී තිබුණි. එය ඉකුත් වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායමට එරෙහිව

2015 වර්ෂයේදී රැස්කළ රු.බිලියන 1,127.6 ක් හෙවත් සියයට 84.96 ක ප්‍රමාණය හා සැසදීමේදී 2015 වර්ෂයේදී කැපී පෙනෙන ආදායමක් රැස්කළ බව පෙන්නුම් කරයි. 2015 වර්ෂයේදි රැස්කළ ආදායම ඉකුත් වර්ෂය සමඟ සැසදීමේදී රු.බිලියන 266.6 ක් හෙවත් සියයට 23.64 ක වර්ධනයක් ලබාගෙන තිබුණි. රජයේ ආදායම දළ දේශිය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස සලකා බැලීමේදී ඉකුත් වර්ෂයේ සියයට 11.52 ක් වි තිබුණත්, 2015 වර්ෂයේදි එය සියයට 12.47 ක් දක්වා වර්ධනය වී තිබුණි. විස්තර රූප සටහන 04 හි දැක්වේ.



රූප සටහන 04. මුළු රාජ්‍ය ආදායම ද.දේ.නි.ප්‍රතිශතයක් ලෙස

මූලාශ්‍රය - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය ප්‍රකාශන

අයවැය හිඟය

ජනරජයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2015 වර්ෂයේ ඇස්තමේන්තුගත අයවැය හිඟය රු.බිලියන 1,170.9 ක්ව පැවැති අතර ඉකුත් වර්ෂයේදී එය රු.බිලියන 776.9 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයේ පැවැති ඇස්තමේන්තුගත අයවැය හිඟය 2015 වර්ෂයේදී රු.බිලියන 394 කින් හෙවත් සියයට 50.7 කින් වැඩි වී තිබුණි. 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 3(අ) වගන්තිය ප්‍රකාරව ඇස්තමේන්තුගත අයවැය හිඟය ඇස්තමේන්තුගත දළ දේශිය නිෂ්පාදිතයෙන් සියයට 5 ක ප්‍රතිශතය නොඉක්ම විය යුතුව තිබුණද, එය 2015 වර්ෂයේදී සියයට 10.4 ක් වි තිබුණු අතර එය ඉකුත් වර්ෂයේ සියයට 7.4 සමඟ සැසදීමේදී සියයට 3 කින් වැඩි වී තිබුණි. පසුගිය වර්ෂ 5 ක කාල පරිච්ඡේදය තුළ ඇස්තමේන්තුගත අයවැය හිඟය ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස රූප සටහන 05 හි දැක්වේ. 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකිම්) පනත ප්‍රකාරව පවත්වා ගත යුතු උපරිම අයවැය හිඟය, ඉක්මවා සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර තිබුණි.



රූප සටහන 05 - ඇස්තමේන්තුගත අයවැය හිඟය ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස

මූලාශ්‍ර - ජනරජයේ මූල්‍ය ප්‍රකාශන හා මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව

ජනරජයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2015 වර්ෂය සඳහා රජයේ පුනරාවර්තන වියදම රු.බිලියන 1,673 ක් හා රජයේ මූලධන වියදම රු.බිලියන 684 ක් වී තිබුණි. එහෙත් රජය විසින් උපයා තිබූ සමස්ථ ආදායම රු.බිලියන 1,394.2 ක් වීම හේතුවෙන් එම ආදායම 2015 වර්ෂයේ පුනරාවර්තන වියදම පියවා ගැනීමටවත් ප්‍රමාණවත් වී නොතිබුණි. ඒ අනුව සමස්ථ රාජ්‍ය ආදායම ඉක්මවා රු.බිලියන 278.8 ක පුනරාවර්තන වියදම් කර තිබුණි.

වියදම මුල්‍යකරණය කිරීම

දේශීය අරමුදල්වලින් රු.බිලියන 3,156 ක් හා විදේශ අරමුදල්වලින් රු. බිලියන 340 ක් ද වශයෙන් 2015 වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ රු.බිලියන 3,475 ක වියදම මූල්‍යනය කිරීමට අපේක්ෂා කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී විදේශ ණය හා ආධාරවලින් රු.බිලියන 562 ක් ලැබී තිබුණි. ඉන් රු.බිලියන 258 ක් හෙවත් සියයට 45.9 ක් උපයෝජනය කර තිබුණි.

2015 වර්ෂය සඳහා විදේශ ණය වශයෙන් රු.බිලියන 321.6 ක් රැස් කර ගැනීමට අපේක්ෂා කර තිබුණු අතර එම මූල්‍යනය ප්‍රභවයෙන් අපේක්ෂිත මුදල ඉක්මවා රු.බිලියන 234 ක් රැස්කර ගෙන තිබුණි. විදේශ ප්‍රදානවලින් අපේක්ෂිත ඉලක්කය වූ රු.බිලියන 18 කින් රු.බිලියන 6 ක් ලැබී තිබුණි. ඒ අනුව විදේශ ප්‍රදානවලින් රු.බිලියන 12 ක් අඩුවෙන් ලැබී තිබුණි. දේශීය අරමුදල් මගින් රු. බිලියන 3,156 ක් රැස්කර ගැනීමට අපේක්ෂා කර තිබුණත් රු.බිලියන 2,594 ක් හෙවත් සියයට 82.2 ක ප්‍රමාණයක් රැස්කර ගෙන තිබුණි. සමස්තයක් වශයෙන් ගත් කළ 2015 වර්ෂයේ අයවැයෙන් අපේක්ෂිත ඉලක්ක ඉටු කිරීමට අවශ්‍ය මූල්‍යනයන් අපේක්ෂා කළ ප්‍රමාණයෙන්ම ලබා ගැනීමට භාණ්ඩාගාරය අපොහොසත් වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය වියදම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 28.64 ක් වී තිබුණු අතර එය ඉකුත් වර්ෂයේ සියයට 24.89 සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී සියයට 3.75 කින් වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම රු.බිලියන 1,672.9 ක් වි තිබුණු අතර, එය මුළු රාජ්‍ය වියදමෙන් සියයට 52.22 ක ප්‍රමාණයක් ගෙන තිබුණු අතර එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 14.95 ක ප්‍රමාණයක් ගෙන තිබුණි. ඉකුත් වර්ෂයේ සියයට 14.00 ක් වූ එම ප්‍රතිශතය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ වැඩි වීමක් නිරීක්ෂණය විය. රාජ්‍ය ආයෝජන රු.බිලියන 683.9 ක් හෙවත් මුළු වියදමෙන් සියයට 21.35 ක් වි තිබුණි. සමාලෝචිත වර්ෂයේදී පොලී ගෙවීම් සඳහා රු.බිලියන 527.2 ක් හෙවත් මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 31.51 ක ප්‍රමාණයක් වැය කර තිබූ අතර එය ඉකුත් වර්ෂයේ වියදම වූ රු.බිලියන 446.4 හා සැසඳීමේදි රු.බිලියන 80.8 කින් වැඩි වී තිබුණි. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී පුනරාවර්තන වියදම තුළ සහනාධාර, ප්‍රදාන හා මාරු කිරීම් වෙනුවෙන් රු.බිලියන 140.2 කින් වියදම වැඩි කර සමාලෝචිත වර්ෂයේදී රු.බිලියන 552.8 ක් වැය කර තිබුණි. එමෙන්ම ඉකුත් වර්ෂවලදී මෙන් සමාලෝචිත වර්ෂයේදීද පෞද්ගලික පඩිනඩි වෙනුවෙන් මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 25.68 ක ප්‍රතිශතයක් හෙවත් රු.බිලියන 429.7 ක් වැය කර තිබුණි. එය ඉකුත් වර්ෂයේ වියදමට වඩා රු.බිලියන 95.9 කින් වැඩි වී තිබුණි. මුළු පුනරාවර්තන වියදමෙන් පොලී, සහනාධාර, ප්‍රදානයන්, මාරු කිරීම් හා පෞද්ගලික පඩිනඩි වෙනුවෙන් වූ මුළු වියදම රු.බිලියන 1,509.7 ක් වැය කිරීමට සිදුවී තිබුණි. මුළු පුනරාවර්තන වියදම කෙරෙහි ඉහත සඳහන් වියදම් ඉහළ ප්‍රතිශතයක් ගෙන තිබුණු අතර සමස්ථ පුනරාවර්තන වියදම පියවා ගැනීමට රැස්කළ ආදායම සමත් වී නොතිබුණි.

පුනරාවර්තන වියදම් සඳහා රැස් කළ ආදායම ප්‍රමාණවත් නොවී තිබියදීත්, රාජ්‍ය ආයෝජනය සඳහා සමාලෝචිත වර්ෂය සඳහා රු.බිලියන 683.9 ක් වැය කර තිබුණු අතර එය ඉකුත් වර්ෂයේ වියදම වූ රු.බිලියන 595.7 සමඟ සැසඳීමේදී රු.බිලියන 88.2 කින් වැඩි වි තිබුණි. රාජ්‍ය ආයෝජන දළ දේශීය

නිෂ්පාදිතය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී සියයට 6.1 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

පුනරාවර්තන වියදමේ කොටසක් හා රාජ්‍ය ආයෝජන හා ණය වාරික ගෙවීමට දේශීය ණය, විදේශ ණය හා ආධාර ලබා ගැනීමට සිදු වී තිබුණි. ඒ වෙනුවෙන් වාර්ෂිකව පොලී හා ණය වාරික ගෙවීමට විශාල මුදලක් වැය කිරීමට සිදුවී තිබුණු අතර, එය වාර්ෂිකව වර්ධනය වන පිරිවැයක් ලෙස නිරීක්ෂණය විය.

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ ශීර්ෂ 198 වැඩ සටහන් 2 හි වැය විෂය 2502 (ගිං නිල්වලා ගඟ හැරවීමේ ව්‍යාපෘතිය) යටතේ රු.මිලියන 40 ක ප්‍රතිපාදනය රු.මිලියන 2,972.4 කින් ඉක්මවා 2015 වර්ෂයේදී රු.මිලියන 3,012.4 ක් වැය කර තිබුණි.

ආයෝජන

2015 ජනවාරි 01 දින වන විට වාණිජ රාජ්‍ය සංස්ථා, රජයට අයත් සමාගම්, වැවිලි සමාගම් හා සංවර්ධන බැංකුවල කොටස් හිමිකම් හා ප්‍රාග්ධන දායකත්වය වෙනුවෙන් ආයතන 121 ක රු.බිලියන 397.8 ක් ආයෝජනය කර තිබුණි. 2015 වර්ෂයේදී ආයතන 07 ක රු.බිලියන 94.2 ක් ආයෝජනය කර තිබුණු අතර ඇමරිකානු හා සිංගප්පූරු ඩොලර්වලින් ප්‍රකාශිත කොටස් හිමිකම් ඇති සමාගම්වල විදේශ විනිමය විචලනය වාසිදායක වීම නිසා එහි රුපියල් වටිනාකම රු.මිලියන 23 කින් වැඩිවී තිබුණි. මීට අමතරව සමාලෝචිත වර්ෂයේදී ආයතනයක කොටස් ප්‍රාග්ධනය අඩුවීම නිසා මුළු ආයෝජන වටිනාකම රු.මිලියන 41 කින් අඩුවී තිබුණි. ඒ අනුව 2015 දෙසැම්බර් 31 දිනට ආයතන 121 ක මුළු ආයෝජන වටිනාකම රු.බිලියන 492.1 ක් වී තිබුණි.

රාජ්‍ය සංස්ථා 35 ක, රජයට අයත් ආයතන 57 ක, වැවිලි සමාගම් 24 ක, සංවර්ධන බැංකු 02 ක හා ඇමරිකානු ඩොලර්වලින් ප්‍රකාශිත සංස්ථා 03 ක් ඇතුළු ආයතන 121 ක රු.බිලියන 492.1 ක් ප්‍රාග්ධනයෙහි ආයෝජනය කර තිබුණද, ඉන් රාජ්‍ය සංස්ථා 09 ක්, රජයට අයත් ආයතන 35 ක්, වැවිලි සමාගම් 12 ක් හා සංවර්ධන බැංකු 01 කින් සමාලෝචිත වර්ෂයේදී ලාභ හා ලාභාංශ වශයෙන් රු.බිලියන 32.1 ක් ලැබී තිබුණි. එම ආදායම මුළු ආයෝජන වටිනාකමින් සියයට 6.5 ක් වී තිබුණි.

රාජ්‍ය ආදායම් කළමනාකරණය

දේශීය ආදායම්, ශ්‍රී ලංකා රේගුව, සුරාබදු හා මෝටර් රථ ප්‍රවාහන යන දෙපාර්තමේන්තු 4 විසින් සමස්ත රාජ්‍ය ආදායමෙන් සියයට 89 ක ආදායම් ප්‍රමාණයක් රැස්කරනු ලබයි. 2015 වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුව විසින් රු.බිලියන 612 ක් රැස්කිරීමට සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව අනුව සැලැසුම් කර තිබුණු අතර, එම සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම රු.බිලියන 4 කින් ඉක්මවා රු.බිලියන 616 ක ආදායම් රැස්කර තිබුණි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව 2015 වර්ෂයේදී රු.බිලියන 537 ක ආදායම් රැස්කිරීමට සංශෝධිත ඇස්තමේන්තුව අනුව සැලැසුම් කර තිබුණත්, රු.බිලියන 12 ක් අඩුවෙන් රු.බිලියන 525 ක ආදායම් රැස්කර තිබුණි. 2015 වර්ෂයේදී ඉහත සඳහන් දෙපාර්තමේන්තු 4 හි සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම පිළිබඳ විස්තර පහත සඳහන් රූප සටහන 06 හි දැක්වේ.



රූප සටහන 06 දෙපාර්තමේන්තු අනුව සංශෝධිත ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

මූලාශ්‍රය - ජනරජයේ මූල්‍ය ප්‍රකාශන

රාජ්‍ය ණය කළමනාකරණය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව ප්‍රකාරව ණය ඇතුළුව සම්පූර්ණ මූල්‍ය පාලනය පාර්ලිමේන්තුව සතුවන අතර ජනරජයේ සියලු ණය සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබාගත යුතුවේ. ඒ අනුව 2015 අංක 01 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2014 අංක 41 දරන විසර්ජන පනතේ 2.1 (ආ) වගන්තිය ප්‍රකාරව ආණ්ඩුව සඳහා සහ ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැරව රු.බිලියන 1,780 ක සීමාවකට යටත්ව සමස්ථ ණය ලබාගැනීම සඳහා පාර්ලිමේන්තුව අනුමැතිය ලබාදී තිබුණි.

ජනරජයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී විදේශිය ණය රු.බිලියන 556 ක් ද, දේශිය බැංකු නොවන ණය රු.බිලියන 2,793 ක්ද වශයෙන් එකතුව රු.බිලියන 3,349 ක ණය ලබාගෙන තිබුණි. එය අනුමත ණය සීමාව වූ රු. බිලියන 1,780 , රු. බිලියන 1,569 කින් ඉක්මවා තිබුණි. මේ සඳහා පාර්ලිමේන්තු අනුමැතියද ලබාගෙන නොතිබුණි. එය ඉකුත් වර්ෂයේ ණය සීමාව ඉක්මවීම වූ රු. බිලියන 1,164 සමග සැසඳීමේදී රු. බිලියන 405 ක වැඩිවීමකි. 2006 වර්ෂයේ සිට පාර්ලිමේන්තුව අනුමත කළ ණය සීමාව ඉක්මවා රජය විසින් ණය ලබා ගෙන තිබුණි. 2006 වර්ෂයේ එසේ ඉක්මවීම රු.බිලියන 64 ක් වී තිබුණු අතර එය 2015 වර්ෂය වන විට රු.බිලියන 1,569 ක් වී තිබුණි. පසුගිය වර්ෂ 11 ක කාලයට අදාළ ඉක්මවීම පහත සඳහන් රූප සටහන 07 හි දැක්වේ.



රූප සටහන 07 පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු ණය ලබා ගැනීමේ සීමාව ඉක්මවා රජය ණය ලබා ගැනීම
මූලාශ්‍රය - වාර්ෂික විසර්ජන පනත් හා ජනරජයේ මූල්‍ය ප්‍රකාශන

මෙවරත් දේශීය ණය කෙරෙහි රජය වැඩි සැලකිල්ලක් දක්වා ඇති අතර සමාලෝචිත වර්ෂයේදී ලබාගෙන තිබුණු දේශීය ණය මුදල රු.බිලියන 2,793 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ ලබාගත් රු.බිලියන 2,020 ක් වූ දේශීය ණය මුදල හා සැසඳිමේදී රු.බිලියන 773 ක් හෙවත් සියයට 38.3 කින් වැඩිවී තිබුණි.

2015 වර්ෂයේදී දේශීය ණය හා පොලී ගෙවීම (ණය සේවාකරණය) සඳහා පිළිවෙලින් රු. බිලියන 2,265 ක් සහ රු.බිලියන 450 ක් වශයෙන් එකතුව රු. බිලියන 2,715 ක් වැය කර තිබුණි. එම වියදම සමාලෝචිත වර්ෂයේ ලබාගත් මුළු දේශීය ණය මුදලෙන් සියයට 97.2 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. ඒ අනුව දේශීය ණයවලින් ජනරජයේ සංවර්ධන කටයුතු සඳහා යොදාගෙන තිබුණේ සියයට 2.8 ක් වූ ඉතා අඩු ප්‍රතිශතයකි. පසුගිය වර්ෂ 05 තුළ දේශීය ණය ගැනීම් හා ණය වාරික සහ පොලී ගෙවීම් පහත අංක 04 වගුවේ දැක්වේ.

වර්ෂය	2015	2014	2013	2012	2011
	රු.බිලියන	රු.බිලියන	රු.බිලියන	රු.බිලියන	රු.බිලියන
ලබාගත් දේශීය ණය	2,793	2,020	2,178	2,256	1,719
ණය වාරික ගෙවීම්	2,265	1,583	1,696	1,980	1,493
ණය සඳහා පොලී ගෙවීම්	450	376	401	351	312
සංවර්ධන කටයුතුවලට උපයෝජනය කරගත් ණය මුදල	78	61	81	-	-
උපයෝජනය කළ මුදල ප්‍රතිශතයක් ලෙස	2.8	3.0	3.7	-	-

වගුව 04. – දේශීය ණය ගැනීම්, ණය වාරික හා පොලී ගෙවීම හා ණය උපයෝජනය

මූලාශ්‍රය – ජනරජයේ මූල්‍ය ප්‍රකාශන

2015 වර්ෂය තුළ විදේශීය ණය හා පොලී ගෙවීම සඳහා පිළිවෙලින් රු. බිලියන 187 ක් හා රු. බිලියන 77 ක් වශයෙන් එකතුව රු. බිලියන 264 ක් වැයකර තිබුණි.

පසුගිය වසර 05 තුළ ලබාගත් විදේශ ණයවලින් ආපසු ගෙවූ විදේශ ණය වාරික හා පොලිය ගැලපූ පසු ජනරජයේ සංවර්ධන කටයුතු සඳහා උපයෝජනය කරගෙන තිබුණු ප්‍රමාණයන් පහත අංක 05 වගුවෙන් දැක්වේ.

වර්ෂය	2015	2014	2013	2012	2011	එකතුව
	රු.බිලියන	රු.බිලියන	රු.බිලියන	රු.බිලියන	රු.බිලියන	රු.බිලියන
ලබාගත් විදේශ ණය	556	423	183	365	287	1,814
ණය වාරික ආපසු ගෙවීම්	187	107	95	153	72	614
පොලී ගෙවීම්	77	70	63	58	40	308
සංවර්ධන කටයුතුවලට උපයෝජනය කරගත් මුදල	292	246	25	154	175	892
උපයෝජනය කළ මුදල ප්‍රතිශතයක් ලෙස	52.5	58.1	13.7	42.2	60.4	49.2

වගුව 05. - විදේශීය ණය ගැනීම්, ණය වාරික හා පොලී ගෙවීම හා ණය උපයෝජනය

මූලාශ්‍රය - ජනරජයේ මූල්‍ය ප්‍රකාශන

2015 වර්ෂයේ ජනරජයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනට රජය විසින් ගෙවිය යුතු ණය ශේෂය රු. බිලියන 7,685 ක් වී තිබුණු අතර, එය ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.බිලියන 6,577 ක ණය ශේෂය සමඟ සැසඳීමේදී රු. බිලියන 1,108 කින් හෙවත් සියයට 16.8 ක වැඩිවීමකි. නමුත්, මුදල් අමාත්‍යාංශයේ ආර්ථික වර්ගීකරණයට අනුව 2015 දෙසැම්බර් 31 දිනට ණය ශේෂය රු. බිලියන 8,503.2 ක් වී තිබුණි. එය ඉකුත් වර්ෂයේ ආර්ථික වර්ගීකරණයට අනුව ණය ශේෂය වූ රු. බිලියන 7,390.9 ට වඩා රු. බිලියන 1,112.3 ක වැඩිවීමකි. ඉකුත් වසර 4 හි හා සමාලෝචිත වර්ෂයේ ආර්ථික වර්ගීකරණයට අනුව ණය සම්බන්ධ විස්තර පහත 06 වගුවෙහි දැක්වේ.

විෂයය	දෙසැම්බර් 31 දිනට				
	2015	2014	2013	2012	2011
	රු.බිලියන	රු.බිලියන	රු.බිලියන	රු.බිලියන	රු.බිලියන
මුළු දේශීය ණය	4,959	4,278	3,833	3,233	2,804
රුපියල් ණය	24	56	56	59	62
භාණ්ඩාගාර බිල්පත්	658	695	700	629	591
භාණ්ඩාගාර බැඳුම්කර	3,305	2,844	2,452	2,095	1,819
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර	669	391	369	223	184
මහ බැංකු අත්තිකාරම්	151	144	109	111	95
අනෙකුත්	152	148	147	116	53
මුළු විදේශීය ණය	3,544	3,113	2,960	2,767	2,329
මුළු නොපිය වූ රාජ්‍ය ණය	8,503	7,391	6,793	6,000	5,133
ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතය	11,183.2	9,785	8,674	7,582	6,543
නොපියවූ රාජ්‍ය ණය ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් ප්‍රතිශතයක් ලෙස	76.03	75.53	78.31	79.13	78.45

වගුව 06 - ආර්ථික වර්ගීකරණය අනුව ණය පිළිබඳ තොරතුරු

*මූලාශ්‍රය - මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව **2015***

2015 වර්ෂයේ සමස්ථ නොපියවූ ණය ශේෂය, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 76.03 ක ප්‍රමාණයක් ගෙන තිබුණු අතර, එය ඉකුත් වර්ෂයට වඩා සියයට 0.5 කින් වැඩි වී තිබුණි.

රජයේ මුළු ණයද ඇතුළත්ව සමාලෝචිත වර්ෂයේ මුළු බැරකම් වටිනාකම රු. බිලියන 8,125 ක් වේ. ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස රජයේ මුළු බැරකම් ප්‍රමාණය ගත්විට සියයට 72.65 ක් වී තිබුණු අතර එය ඉකුත් වර්ෂයේ සියයට 71.25 ට වඩා සියයට 1.40 ක වැඩිවීමකි. එහෙත් 2013 අංක 15 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනතින් සංශෝධිත 2003 අංක 3 දරන මූල්‍ය (වගකීම්) පනතේ 2 (ආ) වගන්තිය අනුව 2013 ජනවාරි 01 දිනයෙන් ආරම්භ වන මුදල් වර්ෂයේ සිට මුළු බැරකම් වටිනාකම ඒ ඒ මුදල් වර්ෂයේ ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 80 ක් නොඉක්ම විය යුතු බවට දක්වා තිබුණ ද, මහා භාණ්ඩාගාරයේ ඇපකර මත රාජ්‍ය ව්‍යාපාර විසින් ලබාගෙන ඇති ණය හා රජය විසින් රාජ්‍ය ව්‍යවසායන්ට පවරා දෙන ලද ණය මෙයට ඇතුළත් නොවන බැවින් මෙම බැරකම් සීමාව ඉක්මවීමක් සිදුවේද යන්න පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන වලින් පිළිබිඹු නොවන බව නිරීක්ෂණය විය

2015 දෙසැම්බර් 31 දින වන විට ජනරජයේ මූල්‍ය ප්‍රකාශන අනුව පැවති මුළු ණය වර්ෂයේ ජනගහනය සමඟ සැසඳීමේදී ඒක පුද්ගල ණය ප්‍රමාණය රු.331,655 ක් වී තිබුණි. එය ඉකුත් වර්ෂයේ ඒක පුද්ගල ණය ප්‍රමාණය වූ රු.296,106 ට වඩා රු.35,549 ක වැඩි වීමකි.

ජනරජයේ මූල්‍ය ප්‍රකාශන

2015 වර්ෂයේ ජනරජයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණයන් සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

- මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනට රජය විසින් ගෙවිය යුතුව තිබුණු ණය ශේෂය රු.මිලියන 7,684,954 ක් වී තිබුණද, නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ පහත සඳහන් නිරීක්ෂණවල බලපෑම හේතුවෙන් එම ණය ශේෂය රු.මිලියන 1,025,180 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.
  - 2015 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර බැඳුම්කරවල මුහුණත අගය (Face Value) රු.මිලියන 3,695,541 ක් ලෙස භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් විගණනයට සනාථ කර තිබුණද, මූල්‍ය ප්‍රකාශනවල එම ශේෂය රු.මිලියන 508,763 ක් අඩුවෙන් දක්වා තිබුණි.
  - 2015 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර බිල්පත්වල මුහුණත අගය (Face Value) රු.මිලියන 663,285 ක් ලෙස භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් විගණනයට සනාථ කර තිබුණද, එම ශේෂය රු.මිලියන 30,000 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.
  - විදේශීය ණය දෙන ආයතන සමඟ ජනරජය එළඹි ණය ගිවිසුම් 07 කට අදාළව 2015 දෙසැම්බර් 31 දින වන විට ජනරජය විසින් ගෙවිය යුතුව තිබුණු රු.මිලියන 338,141 ක ණය ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

- ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් තොරතුරු අනුව 2015 දෙසැම්බර් 31 දිනට මුලා කල්බදු බැරකම රු.මිලියන 19,376 ක් ලෙස සනාථ කර තිබුණද, මුලා ප්‍රකාශනවල 2014 වර්ෂයේ සිට මුලා කල්බදු ක්‍රමය යටතේ ලබා ගෙන තිබුණු යතුරු පැදි වෙනුවෙන් වූ බැරකම රු.මිලියන 13,807 ක් අඩුවෙන් දක්වා තිබුණි.

- රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය විසින් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේ සිට දේශීය බැංකු 4 ක් මඟින් ලබා ගෙන තිබුණු රු.මිලියන 7,550 ක ණය ශේෂය මුලා ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

- අමාත්‍යාංශයක් විසින් රජයේ ඇපකර සහිතව දේශීය බැංකුවලින් 2014 වර්ෂයේදී ලබාගත් ණය වෙනුවෙන් වාරික හා පොලී වශයෙන් සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු.මිලියන 2,469 ක් හා රු.මිලියන 9,562 ක් වශයෙන් එකතුව රු.මිලියන 12,031 ක් ගෙවා තිබුණි. එම ණය හා පොලී ගෙවීම රජය විසින් සිදු කර තිබුණද, රු.මිලියන 126,919 ක් වූ ණය ශේෂය මුලා ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

- මුලා ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ පොලී වශයෙන් රු.මිලියන 527,227 ක් ගෙවා තිබුණද, ඒ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදි අනාවරණය වූ පහත සඳහන් විගණන නිරීක්ෂණවල ශුද්ධ ප්‍රතිඵලය හේතුවෙන් රු.මිලියන 16,818 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

  - භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමෙන් ඉපයූ රු.මිලියන 13,998 ක පොලී ආදායම, පොලී ගෙවීම් ගිණුමට අධිභාර කිරීම හේතුවෙන් 2015 වර්ෂයේ ලද පොලී ආදායම් හා පොලී ගෙවීම් එම ප්‍රමාණයෙන් මුලා ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.

  - මුහුණත වටිනාකමට වඩා අඩු මිලට භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේදී බැඳුම්කරවල මුහුණත වටිනාකම බැඳුම්කර ගිණුමට බැර නොකර, බැඳුම්කර විකිණීමේ වටිනාකම පමණක් බැඳුම්කර ගිණුමට බැර කර තිබුණු අතර මේ හේතුවෙන් එම බැඳුම්කරවල මුහුණත වටිනාකම සමාලෝචිත වර්ෂයේදී මුදල් ගෙවා නිදහස් කිරීමේදී රු.මිලියන 40,378 ක බැඳුම්කර වට්ටම, පොලී ගිණුමට හර කිරීම හේතුවෙන් මුලා ප්‍රකාශනවල සඳහන් පොලිය රු.මිලියන 40,378 කින් වැඩියෙන් දක්වා තිබුණි.

  - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරනු ලබන 854-1 වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂයේ විදේශ ණය සඳහා පොලිය රු.මිලියන 83,063 ක් වී තිබුණු අතර මූලා ප්‍රකාශනවල සඳහන් සටහන් අංක 08 අනුව පොලී ගෙවීම රු. මිලියන 77,174 ක් වී තිබීම හේතුවෙන් රු.මිලියන 5,889 ක වෙනසක් නිරීක්ෂණය විය.

- අමාත්‍යාංශයක් විසින් රජයේ ඇපකර සහිත බැංකු මඟින් ලබාගත් ණය සඳහා රු.මිලියන 9,562 ක පොලී ගෙවා තිබුණද, එය පොලී ගෙවීම් ලෙස ගිණුම්ගත නොකර රාජ්‍ය ආයෝජන යටතේ ගිණුම්ගත කිරීම හේතුවෙන් පොලී ගෙවීම රු.මිලියන 9,562 කින් අඩුවෙන් දක්වා තිබුණි.

- මූල්‍ය ප්‍රකාශන අනුව රජය විසින් විවිධ රාජ්‍ය ආයතන වෙත එකතුව රු.මිලියන 174,196 ක උප ණය ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ පහත සඳහන් නිරීක්ෂණවල ශුද්ධ බලපෑම හේතුවෙන් එහි වටිනාකම රු.මිලියන 2,682 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

  - 2015 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ආයතන 14 කින් ලැබිය යුතු උප ණය ශේෂය රු.මිලියන 8,390 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, අදාළ ආයතන විසින් එම ණය ශේෂ රු.මිලියන 7,215 ක් ලෙස සනාථ කර තිබීම හේතුවෙන් එම ආයතන 14 හි උපණය ශේෂය රු. මිලියන 1,175 කින් වැඩියෙන් දක්වා තිබුණි.

  - මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනට ආයතන 07 කට අදාළ උප ණය වටිනාකම රු.මිලියන 5,726.0 ක් ලෙස දක්වා තිබුණද, එම ආයතන විසින් එවා තිබුණු ශේෂ සනාථ කිරීම් අනුව ණය ශේෂය රු. මිලියන 9,332.6 ක් විය. ඒ අනුව එම ආයතන 07 ට අදාල ණය ශේෂය රු. මිලියන 3,606.6 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

  - 2001 වර්ෂයේ සියයට 9 ක පොලී අනුපාතයක් මත රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව වෙත ලබාදී තිබුණු රු.මිලියන 250 ක උපණය හා ඒ මත 2001 වර්ෂයේ සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා ලැබිය යුතු පොලී මුදල වන රු.මිලියන 337 ක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

- 2015 වර්ෂයේ බැඳුම්කර නිකුත් කිරීම මගින් ඉපැයූ අධිමිල (Premium) මූල්‍ය ප්‍රකාශනවල වෙනම සටහන් කිරීම වෙනුවට භාණ්ඩාගාර බැඳුම්කර ගිණුමට බැර කිරීම හේතුවෙන් භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම රු.මිලියන 18,846 ක් වැඩියෙන් දක්වා තිබුණි.

- මූල්‍ය ප්‍රකාශනවල විදේශ ණය ලැබීම් හා ගෙවීම් වශයෙන් පිළිවෙලින් රු.මිලියන 556,370 ක් හා රු.මිලියන 187,113 ක් දක්වා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ පහත සඳහන් විගණන නිරීක්ෂණවල බලපෑම හේතුවෙන් විදේශ ණය ලැබීම් රු.මිලියන 34,003 ක් අඩුවෙන්ද, විදේශ ණය ගෙවීම් රු.මිලියන 4,605 ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

  - විදේශීය ණය ගිවිසුම් 7 කට අදාලව 2015 වර්ෂයේදී ලැබී තිබුණු රු.මිලියන 10,696.7 ක විදේශ ණය ප්‍රමාණය හා 2015 වර්ෂයේදී ගෙවා තිබුණු රු.මිලියන 4,604.7 ක විදේශ ණය ප්‍රමාණය ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

- ණය ගිවිසුම් 41 කට අදාළව සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු විදේශ ණය ලැබීම්වලින් රු. මිලියන 23,306.5 ක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

- මූල්‍ය ප්‍රකාශනවල විදේශ ණය ආපසු ගෙවීම් ලෙස රු.මිලියන 187,113 ක් දක්වා තිබුණු අතර එහි සටහන් අංක 30(i) (විදේශ ණය ශේෂ ප්‍රකාශනය) අනුව විදේශ ණය ආපසු ගෙවීම් රු.මිලියන 174,800 ක් වීම හේතුවෙන් රු.මිලියන 12,313 ක වෙනසක් විය.

- මූල්‍ය ප්‍රකාශනවල සඳහන් රජය විසින් විවිධ රාජ්‍ය ව්‍යවසායන්වල කර ඇති ආයෝජනවල වටිනාකම රු.මිලියන 492,192 ක් වී තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ පහත සඳහන් නිරීක්ෂණවල ශුද්ධ බලපෑම හේතුවෙන් එම වටිනාකම රු.මිලියන 105,068 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

  - සීමාසහිත හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) සමාගම වෙත පවරා දී තිබුණු රජය සතු ඉඩමේ ප්‍රාග්ධනිත වටිනාකම රු.මිලියන 7,000 ක් වි තිබුණද, එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

  - මහා භාණ්ඩාගාරය විසින් පෞද්ගලික සමාගමක 2011 වර්ෂයේ සිදුකර තිබුණු රු.මිලියන 100 ක ප්‍රාග්ධන දායකත්වය මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

  - මූල්‍ය ප්‍රකාශනය අනුව රජය සතු ව්‍යාපාර 121 කින් ව්‍යාපාර 6 කට අදාළව එකතුව රු.මිලියන 305,152 ක් මහා භාණ්ඩාගාරයේ ප්‍රාග්ධන දායකත්වය වශයෙන් දක්වා තිබුණද, අදාළ ආයතන විසින් ප්‍රාග්ධන දායකත්වය ලෙස එකතුව රු.මිලියන 339,069 ක් එම ආයතනවල මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් එම ව්‍යාපාර 06 ට අදාලව එකතුව රු.මිලියන 33,917 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

  - මූල්‍ය ප්‍රකාශන අනුව රජය සතු ව්‍යාපාර 121 කින් ආයතන 02 කට අදාළව එකතුව රු.මිලියන 349 ක් මහා භාණ්ඩාගාරයේ ප්‍රාග්ධන දායකත්වය ලෙස දක්වා තිබුණද, මහා භාණ්ඩාගාරය විසින් අදාළ ආයතනයන්හි ප්‍රාග්ධනය සඳහා ආයෝජනය කර නොමැති බවට ශේෂ සනාථ මඟින් තහවුරු කර තිබුණි. ඒ අනුව රු. මිලියන 349 ක වටිනාකමක් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි.

  - 2015 වර්ෂයේ මහා භාණ්ඩාගාරය විසින් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම මඟින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ රු. මිලියන 50,500 ක් හා ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ රු. මිලියන 13,900 ක් ප්‍රාග්ධනයට දායක වී තිබුණද, එම වටිනාකම 2015 වර්ෂයේ ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

- ප්‍රධාන ආදායම් උපයන රාජ්‍ය ආයතන තුනකට අදාළව සමාලෝචිත වර්ෂයේ හිඟ ආදායම්වල එකතුව රු.මිලියන 55,408 ක් වී තිබුණත්, ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කිරීමක් කර නොතිබුණි.

- විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් මුදල් අමාත්‍යාංශයේ ඇපවීම මත නෙළුම් කුළුණ බහු සම්ප්‍රේක්ෂණ හා විදුලි සංදේශ කුළුණ ඉදි කිරීම සඳහා 2012 වර්ෂයේදී ඇමරිකානු ඩොලර් මිලියන 104.3 ක් හෙවත් රු.මිලියන 15,238 ක වාණිජ ණයක් විදේශීය ණය දෙන ආයතනයකින් ලබාගෙන තිබුණද, එම අසම්භාව්‍ය බැරකම ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

- සමාලෝචිත වර්ෂය අවසානයට ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල අංක 8533 දරන අවිනිශ්චිත ගිණුමේ රු.මිලියන 400 ක ශේෂයක් පැවැති අතර, එම ශේෂයෙහි පොදු රාජ්‍ය මණ්ඩලීය සමුළුවට වාහන ලබා ගැනීම වෙනුවෙන් වැය කළ මුදලද ඇතුළත් වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම වියදම සඳහා ප්‍රතිපාදන ලබා ගෙන ගිණුම්ගත කර ශේෂය නිරවුල් කර නොතිබුණි. ඊට අමතරව 8233 දරන අවිනිශ්චිත ගිණුමේ රු.මිලියන 1,269 ක බැර ශේෂයක් පැවැති අතර, එම ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

- ජනරජයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම මුදල් පදනම මත සිදු කර තිබුණි. මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත පිළියෙල කිරීමට වර්ෂ ගණනාවක් මුළුල්ලේ කටයුතු කරමින් පැවැතියද 2015 වර්ෂය වන විටත් එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. මූල්‍ය ප්‍රකාශනවල පළාත් සභාවල කාර්යසාධනය හා මූල්‍ය තත්ත්වයද ඇතුළත් කළ යුතු වුවත්, එම කාර්යයද ඉටු කිරීමට අසමත් වී තිබුණි.

රාජ්‍ය ආදායම් කළමනාකරණය සම්බන්ධයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද විශේෂ විමර්ශණ හා එමගින් රාජ්‍ය ආදායමට වූ බලපෑම්.

විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් වරින්වර රාජ්‍ය ආදායම් කළමනාකරණය සම්බන්ධයෙන් සිදු කරන ලද විශේෂ විමර්ෂණවලදී රාජ්‍ය ආදායම් කළමනාකරණයේ පවතින වැරදි, දුර්වලතා, අකාර්යක්ෂමතා හා අනාර්ථිකභාවයන් පෙන්වා දෙන ලදී. මේ පිළිබඳව විගණන විමසුම් හා වාර්තාවලින් දිගින් දිගටම නිරීක්ෂණ ඉදිරිපත්කර තිබුණද, එම අඩුපාඩු අවම කර ගැනීම සඳහා කටයුතු කිරීමේ මන්දගාමී බව රාජ්‍ය ආදායම් කළමනාකරණයට අහිතකර ලෙස බලපා ඇති බව පෙන්වා දීමට සිදුවී තිබේ. විශේෂයෙන් 2015 වර්ෂයේ මුළු රාජ්‍ය ආදායමෙන් ආදායම් එකතු කිරීමේ ප්‍රධාන ආයතන 04 වන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, සුරාබදු දෙපාර්තමේන්තුව හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සියයට 89 ක දායකත්වයක් ලබාදෙන අතර එම ආයතනවල කටයුතු පිළිබඳව සිදුකරනු ලැබූ විගණනයේදී අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණවල සම්පිණ්ඩනයක් පහත දැක්වේ.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

- 2015 වර්ෂයේ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා 2015 අංක 10 දරන මුදල් පනත මඟින් නව බදු ආදායම් 04 ක් රැස්කිරීම සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට බලය ලබාදී තිබුණි. ඒ අතරින් සුපිරි වාසි බද්ද පමණක් එකතු කිරිමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි.

ඒ අනුව පහත බදු අයකිරීමට සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

- 2015 ජනවාරි 29 දින සිට බලපැවැත්වෙන 2015 නොවැම්බර් 15 දින හෝ ඊට පෙර ගෙවිය යුතු කැසිනෝ ව්‍යාපාරයේ නියැලී සිටින සෑම තැනැත්තෙකුගෙන්ම කැසිනෝ කර්මාන්ත අය බද්ද ලෙස රුපියල් මිලියන එක් දහසක් අය කිරීම.

- 2015 අප්‍රේල් 01 දින හෝ එදිනෙන් පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහාම 2000 අප්‍රේල් 01 දින හෝ ඉන් පසුව ඉදිකරන ලද මන්දිරයක සෑම අයිතිකරුවකුගෙන්ම රුපියල් මිලියන එකක මන්දිර බද්දක් අයකිරීම.

- 2015 නොවැම්බර් 01 දින සිට බල පැවැත්වෙන පරිදි ස්ථිරව ශ්‍රී ලංකාව හැරයන සෑම ශ්‍රී ලාංකික පුරවැසියෙකුගෙන්ම එම පුරවැසියාට රටින් පිටතට ගෙනයාම සඳහා නිදහස් කරන ලද විදේශ විනිමය මත සියයට විස්සක අනුප්‍රමාණයකට විගමන බද්දක් අය කිරීම.

• ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ආදායම රු. බිලියන 39.45 කින් එනම් සියයට 8.1 කින් වැඩිවී තිබුණ ද, එම වැඩිවීම සඳහා සමාලෝචිත වර්ෂයේදී අලුතින් හඳුන්වාදී තිබුණු සුපිරි වාසි බද්දෙන් එකතුවී තිබුණු රු. බිලියන 47.36 ක් බලපා තිබුණ බව විගණනයට අනාවරණය විය. ඒ අනුව සුපිරි වාසි බද්දෙන් මුළු ආදායමට එකතු වූ මුදල ඉවත්කළ විට දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලබන අනෙකුත් සියලුම බදු වර්ගයන්ගෙන් ආදායමට කර ඇති දායකත්වය රු. බිලියන 477.47 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. බිලියන 7.91 ක් හෙවත් සියයට 1.6 ක පිරිහීමක් බව නිරීක්ෂණය විය.

• 2012 වර්ෂයේදී එකතු කළ අගය මත බද්දට යටත්වන ආදායම් සීමාව ඉහළ දැමීමත් සමඟම දෙපාර්තමේන්තුව විසින් බදුකරුවන් 17,000 ගේ පමණ එකතු කළ අගය මත බදු ලිපි ගොනු තාවකාලිකව අක්‍රීය කර තිබුණද, ඇතැම් අක්‍රීය බදුකරුවන් එකතුකළ අගය මත බදු ඉන්වොයිස්පත් නිකුත් කරමින් බදු එකතු කර තිබුණි. එම පුද්ගලයන් හා ආයතන විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත බදු වාර්තා ඉදිරිපත් කිරීම හෝ එකතු කළ අගය මත බදු ගෙවීම හෝ සිදුකර නොතිබුණ අවස්ථා විය. නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි බදුකරුවන් 54 දෙනෙකු රාජ්‍ය ආයතන වෙතින් රු. මිලියන 175.09 ක පමණ එකතු කළ අගය මත බදු රැස්කර ගෙන තිබුණ ද, බදු වාර්තා ඉදිරිපත් කිරීම හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත බදු ගෙවීම හෝ සිදුකර නොතිබුණි. මෙම තත්ත්වය පරිපාලනය කර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් දෙපාර්තමේන්තව විසින් හඳුන්වා දී නොතිබුණ අතර බදු ආදායම් අඩුවීමටත් මිල මට්ටමේ ඉහළයාමටත් මෙම තත්ත්වය ඉවහල් වන බව විගණනයේදී නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා රේගුව

2015 වර්ෂයේ තථ්‍ය ආදායම හා ඉකුත් වර්ෂයේ තථ්‍ය ආදායම අතර විචලතාවයන්ට පහත සඳහන් කරුණු බලපා තිබුණි.

බදු අනුපාතයන් වෙනස් කිරීම

- **මෝටර් රථ නිෂ්පාදන බද්ද**

  - සමස්ථ රේගු ආදායම තුළ සියයට 36.28 ක දායකත්වයක් ලබාදෙන මෝටර් වාහන නිෂ්පාදන බදු ආදායම පසුගිය වර්ෂය හා සැසඳීමේදී සියයට 192 කින් වර්ධනය වීම.
  - 2015 වර්ෂයේ සිට ආනයනිත මෝටර් වාහන මත බදු අය කිරීමේදි අනෙකුත් සියලු බදු වෙනුවට නිෂ්පාදන බදු පමණක් අයකිරීම.
  - සමහර මෝටර් වාහන කාණ්ඩයන් සඳහා රේගු මිල කමිටුව විසින් කලින් ලබා දී තිබූ තක්සේරු වටිනාකම් අඩුකිරීම හේතුවෙන් ආනයනිත මෝටර් රථ ප්‍රමාණය ඉහළ යාම.
  - ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව අනෙකුත් විදේශ විනිමයන්ගේ වටිනාකම ඉහළ යාම හේතුවෙන් ආනයනිත පිරිවැය ඉහළ යාම හා ඒ මත ගණනය කරනු ලබන බදු ආදායම ඉහළ යාම.

- **ආනයනිත භාණ්ඩ ඒකක ප්‍රමාණය වැඩිවීම**

  සමස්ථ බදු ආදායම තුළ වැඩි දායකත්වයක් සපයන භාණ්ඩ වර්ග කිහිපයක පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ආනයන ඒකක ප්‍රමාණය ඉහළ යාමද රේගු බදු ආදායම වර්ධනය වීමට හේතුවී තිබුණි.

- **බදු අත්හැරීම**

  ආනයනික තිරිඟු ඇට මත එතෙක් අයකළ රේගු බද්ද 2015 ජනවාරි 30 දින සිට සම්පූර්ණයෙන්ම ඉවත් කිරීමට මුදල් අමාත්‍යාංශය විසින් තීරණය කර තිබූ අතර එම තීරණය හේතුවෙන් පසුගිය වර්ෂයට සාපේක්ෂව තිරිඟු ආනයනය සියයට 11.1 කින් වැඩි වී තිබියදීත්, රැස්කර ගෙන තිබූ බදු ආදායම සියයට 65.7 කින් එනම් රු.මිලියන 7,101 කින් පමණ අඩු වී තිබුණි.

- **බදු සහන ලබාදීම**

  - දේශීය වාහන නිෂ්පාදන කර්මාන්තය නගා සිටුවීමේ අරමුණින් සියයට 30 කට නොඅඩු දේශීය අගය එකතු කිරීමක් සහිතව නිෂ්පාදනය කරන වාහන සඳහා සහන නිෂ්පාදන බද්දක් අය කිරීමේ ක්‍රමවේදයක් රජය විසින් හඳුන්වාදී තිබුණි. ඒ අනුව ආනයනයේදී සියයට 150 ක සිට සියයට 240 කට ආසන්න නිෂ්පාදන බද්දක් ගෙවිය යුතු වාහන, දේශීය අගය එකතු කිරීමක් සහිතව නිෂ්පාදනය කිරීමේදී සියයට 15 ක සහන නිෂ්පාදන බද්දක් පමණක් අයකර ගෙන තිබුණි. මෙම ක්‍රමවේදය යටතේ 2015 වර්ෂයේදී දේශීයව නිෂ්පාදනය කරන ලද වාහන 5873 ක් සඳහා රජය ලබාදී තිබුණු බදු සහනය රු.මිලියන 13,800 කට ආසන්න විය.

- 2010 දෙසැම්බර් 10 දිනැති අංක 1/2010 දරන වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛය හා එහි සංශෝධන මගින් රාජ්‍ය සේවයෙහි නිරත නිලධාරීන් සඳහා සහනදායී කොන්දේසි යටතේ මෝටර් රථ වාහන ආනයනය කිරීමට/ නව කොටස් හා උපාංග යොදා දේශීය නිෂ්පාදනය කරන ලද මෝටර් රථ මිලදී ගැනීමට බලපත්‍ර ලබාදී තිබුණි. එම බලපත්‍ර මගින් 2015 වර්ෂයේදී ආනයනය කර තිබූ වාහන 4558 ක් සඳහා ලබාදී තිබූ බදු සහනය රු.මිලියන 20,938 වී තිබුණු අතර එමගින් රජය උපයාගෙන තිබූ බදු ආදායම රු.මිලියන 16,649 ක් වී තිබුණි.

- රාජ්‍ය සේවයේ නිරත නිලධාරීන්ට ලබාදී තිබුණු බදු සහන වාහන බලපත්‍රවලට අමතරව වෙනත් පාර්ශවයන්ට එනම් විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන්ට, බදු ගෙවන්නන්ට, රාජ්‍ය ආයතනවලට සහ පළාත් සභා මන්ත්‍රීවරුන්ට/ රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන්ට ලබා දී තිබුණු සහන වාහන බලපත්‍ර 893 ක් සඳහා රු.මිලියන 7,011 ක බදු සහනයක් ලබා දී තිබුණි.

- රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන, විදේශීය තානාපති හා මහ කොමසාරිස් කාර්යාල සහ ජපානය, චීනය යන රටවල් විසින් මෙරට ක්‍රියාත්මක කරනු ලබන විවිධ ව්‍යාපෘති සඳහා 2015 වර්ෂයේදී සිදු කර තිබුණු ආනයනයන් මත පිළිවෙලින් රු.මිලියන 19,047 ක්, රු.මිලියන 17,858 ක්, රු.මිලියන 1,715 ක් හා රු.මිලියන 1,544 ක් වශයෙන් එකතුව රු.මිලියන 40,164 ක බදු සහනයක් ලබාදී තිබුණි.

- **බදු නිදහස් වෙළඳ ගිවිසුම් සඳහා ලබා දී ඇති සහනයන්**

  ශ්‍රී ලංකාව විසින් විදේශීය රටවල් සමග ඇති කර ගෙන තිබුණු විවිධ බදු නිදහස් වෙළඳ ගිවිසුම් 05 කට අදාළව සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකාවට ආනයනය කර තිබූ භාණ්ඩවල වටිනාකම රු.මිලියන 40,021 කට ආසන්න වූ අතර එම ආනයනයන් සඳහා ලබා දී තිබූ බදු සහනය රු.මිලියන 7,123 ක් පමණ වී තිබුණි.

- **තීරු බදු ආදායම්**

  ශ්‍රී ලංකා රේගුව 2015 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද තීරු ආදායම් බදු වාර්තා අනුව අයවිය යුතු මුළු තීරු බදු ආදායම රු.මිලියන 19,493.54 ක් වූ අතර එයින් සියයට 59 ක පමණ ප්‍රමාණයක තීරු බදු ආදායම ඉකුත් වර්ෂවල සිට පැවැත එමින් තිබුණි.

- ශ්‍රී ලංකා රේගුව විසින් රේගු බදු කටයුතු සඳහා වටිනාකම් තක්සේරු කිරීම් නිරන්තරව වෙනස් කිරීම හේතුවෙන් විශාල වශයෙන් බදු අලාභ සිදුවන බව නිරීක්ෂණය විය. උදාහරණ ලෙස 2014 අගෝස්තු 15 දින ඇ.එ.ඩො. 36,800 ලෙස තක්සේරු කර තිබූ TRJ 150 W මාදිලියේ මෝටර් රථවලට වටිනාකම 2015 මාර්තු 23 දින වන විට ඇ.එ.ඩො. 27,944 (ජපන් යෙන් 3,375,000) දක්වා ඇ.එ.ඩො. 8,856 කින් අඩු කිරීම හේතුවෙන් තීරු බදු සහන බලපත්‍ර යටතේ මෙම වාහන ආනයනය කිරීමට අවස්ථාව සැලසී තිබුණි.

මෙසේ ආනයනය කළ වාහන 407 ක් සඳහා ජපාන වාහන වෙන්දේසියේදී විකුණුම් මිල බදු ගණනයේදී සැලකිල්ලට ගත්තේ නම් රජයට ලැබිය යුතුව තිබූ බදු ආදායම දළ වශයෙන් රු.මිලියන 3,000 ක් පමණ වී තිබුණි.

- ආනයනය කළ අවස්ථාවේ සම්මත වටිනාකම ලෙස ඇ.එ.ඩො. 30,300 ක් වශයෙන් මිල නියම කර තිබූ BMW 520d SE වාහන 07 ක් සඳහා අදාළ තොරතුරු රේගු පරිගණක පද්ධතියට ඇතුළත් කර තිබුණද, දින 23 ක කාලයක් බදු මුදල් ගෙවීමට කටයුතු කර නොතිබුණි. පසුව මෙම මාදිලියේ වාහනයක සම්මත මිල අවස්ථා 02 කදී යුරෝ 22,600 (ඇ.එ.ඩො. 26,675) ක් දක්වා අඩු කර තිබුණු අතර මෙම වාහන 07 සඳහා එම අඩු කරන ලද සම්මත මිල මත බදු ගෙවීම සඳහා රේගුව විශේෂ අවස්ථාවක් මෙම ආනයනකරුවන්ට ලබාදීම හේතුවෙන් රු.මිලියන 9.05 ක බදු ආදායම් අලාභයක් සිදු වී තිබුණි.

- කටුනායක බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන්තොටුපලේ පිටවීමේ පර්යන්තය හරහා රු. මිලියන 18.83 ක් වටිනා විදේශ ව්‍යවහාර මුදල් තොගයක් නීති විරෝධීව මැලේසියාවට රැගෙන යාමට උත්සාහ කළ ගුවන් මගියෙකු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුවේ මධ්‍යම විමර්ශන අංශය විසින් රේගු විමර්ශනයක් සිදු කර තිබුණි. එම රේගු විමර්ශනයෙන් අනතුරුව විමර්ශන නිලධාරියා විසින් උක්ත ගුවන් මගියාට රේගු ආඥා පනතේ 130 වගන්තිය ප්‍රකාරව රු. මිලියන 50.50 ක දණ්ඩනයක් නියම කර පසුව එම දණ්ඩන මුදල, ආඥා පනතේ 163 වගන්තිය ප්‍රකාරව රු.මිලියන 3 ක් දක්වා අඩු කිරීමට කටයුතු කර තිබුණි. මූලික විමර්ශන නිලධාරියා විසින් රු.මිලියන 3 ක දණ්ඩන මුදලක් පැනවූවද අදාළ වරදකරු විසින් ඉදිරිපත් කර තිබූ අභියාචනාවක් පදනම් කරගෙන එම දණ්ඩන මුදල නැවත රු.මිලියන 1.5 ක් දක්වා අඩු කිරීමට රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා නියෝග කර තිබීම රේගු ආඥා පනතේ විධිවිධානවලට පටහැනිව කටයුතු කිරීමක් වී තිබුණි.

- 1996 - 2002 දක්වා කාලපරිච්ඡේදය තුළ ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් නෞකාවලට සැපයීම සඳහා ශ්‍රී ලංකා රේගුව සපයනු ලබන බැඳුම්කර පහසුකම් යටතේ තීරු බදු ගෙවීමකින් තොරව ආනයනය කර ගබඩා කර තිබූ නැව් තෙල් හා ලිහිසි තෙල් තොග එම ගබඩාවලින් අපහරණය කර තිබුණද, ඒ සම්බන්ධ තොරතුරු ශ්‍රී ලංකා රේගුව වෙත වාර්තා කිරීමට කටයුතු කර නොතිබුණි. අපහරණය කර තිබූ තෙල් තොග වෙනුවෙන් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් නිරවුල් කළ යුතුව පැවති රු. මිලියන 57.74 ක බැඳුම්කර වගකීම අයකර ගැනීම සඳහා කටයුතු කිරීම වෙනුවට ශ්‍රී ලංකා රේගුවේ බැඳුම්කර අංශය විසින් 2015 වර්ෂයේදී රේගු විමර්ශනයන් ආරම්භ කිරීමට කටයුතු කර තිබුණි. රේගු විමර්ශනයෙන් අනතුරුව අදාල බදු මුදල දණ්ඩනයක් ලෙස අයකරගෙන තිබුණු අතර එම දණ්ඩන මුදලින් සියයට 30 ක් හෙවත් රු. මිලියන 17.32 ක් පමණක් රාජ්‍ය අදායමට බැර කර තිබූ අතර ඉතිරි සියයට 70 ක මුදල හෙවත් රු. මිලියන 40.42 ක් රේගු නිලධාරීන්ගේ ත්‍යාග හා රේගු නිලධාරීන්ගේ කළමනාකරණ සහ වන්දි අරමුදල වෙත වෙන් කර තිබුණි.

- ආනයනික බහාළුම් භෞතික පරීක්ෂාව සඳහා ස්ථාපනය කර ඇති අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්ගේ පවත්නා දුර්වලතා හේතුවෙන් රේගු බදු හා ගාස්තු වශයෙන් රු.මිලියන 17 කට අධික මුදලක් ගෙවිය යුතු භාණ්ඩ ඇතුළත් බහාළුමක් සඳහා රු.549,622 ක් පමණක් ගෙවා නිදහස් කර ගැනීමට ආනයනකරුවකු විසින් කටයුතු කර තිබුණි.

සුරාබදු දෙපාර්තමේන්තුව

- සුරාබදු දෙපාර්තමේන්තුව 2015 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද හිඟ ආදායම් වාර්තා අනුව අයවිය යුතු ප්‍රමාද ගාස්තු සහිත මුළු හිඟ බදු ආදායම රු.මිලියන 2,191.18 ක් වූ අතර, එම සමස්ථ හිඟ බදු ආදායමින් සියයට 66 ක් වර්ෂ 5ට වැඩි කාලයක සිට පැවත එන හිඟ බදු ආදායම් වී තිබුණි.

- ස්ප්‍රීතු දේශීයව මිලදී ගැනීමේදී හා ආනයනයේදී අයකරනු ලබන රඳවා ගැනීමේ බදු මුදල් එම ස්ප්‍රීතු යොදා ගනිමින් නිෂ්පාදනය කරනු ලබන මත්පැන් සඳහා අදාළ සුරාබදු ගෙවීමේදී හිලව් කිරීමට ඉඩදෙනු ලැබුවද රු.මිලියන 821 ක් වූ රඳවා ගැනීමේ බදු මුදල් සුරාබදු ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

- 2014 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 1,534.98 ක් වූ හිඟ ආදායම 2015 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 2,191.18 ක් දක්වා රු. මිලියන 656.20 කින් හෙවත් සියයට 43 කින් වැඩි වී තිබුණි.

- පහසුවෙන් හා නිවැරදි සුරාබදු ආදායම එකතු කිරීම හා ගිණුම්ගත කිරීමට සුදුසු පරිගණක ජාල පද්ධතියක් ක්‍රියාත්මක කර නොතිබුණි.

- දුම්කොළ බදු පනතට අනුව සෑම සිගරට්ටුවක්ම, සුරුට්ටුවක්ම, බීඩියක්ම සඳහා සහ පයිප්ප දුම්කොළ කිලෝ ග්‍රෑමයක් සඳහා බදු අය කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව සිගරට් සඳහා පමණක් බදු අයකර තිබුණි.

- දෙපාර්තමේන්තුව සිගරට් සඳහා දුම්කොළ බද්ද අයකරනු ලැබුවද පනතට පටහැනිව ඒකකයක් සඳහා නොව සිගරට් නිෂ්පාදනය සඳහා පාවිච්චි කරනු ලබන දුම්කොල කිලෝ ග්‍රෑමයකට අදාල බදු මුදලක් අයකරනු ලබයි.

- බීඩි නිෂ්පාදනය සඳහා ආනයනය කරනු ලබන දුම්කොල වර්ගයේ නිවැරදිතාවය තහවුරු කර ගැනීමට ආදාල ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව විසින් සකස් කර නොතිබුණි.

- දෙපාර්තමේන්තුව විසින් සිගරට් අපනයනය සම්බන්ධයෙන් බලපත්‍ර නිකුත් කරනු ලැබුවද අපනයනය කරනු ලබන සිගරට් ප්‍රමාණය සත්‍ය වශයෙන්ම අපනයනය කර තිබේද යන වග තහවුරු කර ගැනිමට ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි.

- මත්පැන් නිෂ්පාදන සමාගම්වලට අනුයුක්ත කර ඇති නිලධාරීන් මඟින් සිදු කරනු ලබන ආදායම් රැස් කිරීමේ කාර්යය දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් අඛණ්ඩ සෝදිසි පරික්ෂාවකට ලක් කර නොතිබුණි.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ එක් අරමුණක් වනුයේ මෝටර් රථ වාහන පනතට අදාල කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීමයි. මේ සඳහා පවත්නා පරිගණක පද්ධතියේ දුර්වලතා මග හරවා ගනිමින් විශාල වශයෙන් සිදු වන වැරදි වංචා අක්‍රමිකතා වැළැක්වීමට / අනාවරණය කර ගැනිමට හැකි වන පරිදී තාක්ෂණය යොදා ගැනීම සඳහා ඊ-මෝටරින් ව්‍යාපෘතිය වෙනුවෙන් 2015 වර්ෂයේ ප්‍රතිපාදන රු.මිලියන 250 ඇතුළුව 2009 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රු.මිලියන 740 ක ප්‍රතිපාදන සලසා තිබුණි. අදාල ප්‍රතිපාදන උපයෝගී කරගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එසේම සලසා තිබුණු ප්‍රතිපාදන නිරන්තරයෙන්ම වෙනත් වැය විෂයන් සඳහා මාරු කර වෙනත් අවශ්‍යතා සඳහා වියදම් කර තිබුණි.

රාජ්‍ය ආරක්ෂාව

ශ්‍රී ලංකාවේ භෞමික අඛන්ඩතාවය සහතික කිරීම සහ ගුවන්, මුහුදු සහ ගොඩබිම ආරක්ෂාව පවත්වා ගෙන යාම යන ප්‍රතිඵලය ළගා කර ගැනීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු පහක් හා ව්‍යවස්ථාපිත ආයතන අටකින් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබුණි.

ජාතික ආරක්ෂාව

- ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවය හා ජාතික ආරක්ෂාව සහතික කිරීම.
- ගුවන්, මුහුදු සහ ගොඩබිම් කළාපයන්හි ආරක්ෂාව පවත්වා ගෙන යාම
- ජාතික ආරක්ෂාව හා සම්බන්ධ පර්යේෂණ හා සංවර්ධන කටයුතු මෙහෙයවීම
- ශ්‍රී ලංකාවේ අභිමානය හා ප්‍රෞඩත්වය පවත්වා ගෙන යාම සඳහා සහයවීම.
- ආරක්ෂක කටයුතු සම්බන්ධ වැඩසටහන් හා ව්‍යාපෘතින් පිළිබඳ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

සිවිල් ආරක්ෂාව

- නීතිය හා සාමය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී පොලීසිය වෙත සහයවීම
- ජීවිත හා දේපළවල ආරක්ෂාව සහතික කිරීම
- කුඩා ප්‍රමාණයේ ගිනි අවි නියාමනය කිරීම.

ඉහත සඳහන් කාර්යභාරයන් අදාළ ආයතන විසින් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ආරක්ෂක අමාත්‍යාංශය

පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර ගාස්තු අයකර ගැනීමේ කටයුතු දුර්වල තත්ත්වයක පැවැතීම

පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර ගාස්තුවල 2000 වර්ෂයෙන් පසුව කිසිදු සංශෝධනයක් සිදුකර නොතිබුණි. බලපත්‍ර ගාස්තු ආදායම් ගිණුම අනුව 2015 වර්ෂයට අදාල හිඟ ආදායම රු.මිලියන 0.85 ක්ද, ඇතුළුව මුළු හිඟ ආදායම රු. මිලියන 1.42 ක් වූ අතර ඒවා අයකර ගැනීම සම්බන්ධ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

රජයේ නිලධාරින්ට ලබා දුන් අත්තිකාරම් ණය අයකර ගැනීම දුර්වලවීම

රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දින වන විට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. මිලියන 9.89 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 30 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණි. එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය විසින් අධිකාරී බලයකින් තොරව ණය ලබා ගැනීම

මහල් 20 කින් යුත් පුද්ගල අනන්‍යතා ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2012 ජුලි මාසයේ සිට වර්ෂ 3 කින් නිම කිරීමේ පදනම මත ජාත්‍යන්තර සමාගමකට අනුබද්ධ දේශීය කොන්ත්‍රාත් සමාගමකට පවරා තිබුණි. මේ සඳහා පෞද්ගලික බැංකු 02 ක් හා රාජ්‍ය

බැංකු 02 ක් මඟින් 2015 අගෝස්තු මාසයේ සිට වර්ෂ 15 කින් ආපසු ගෙවීමේ පදනම මත විධිමත් අධිකාර බලයකින් තොරව රු. මිලියන 7,550 ක ණය ලබා ගැනීමට 2012 වර්ෂයේදී ගිවිසගෙන තිබුණි. ඒ අනුව රු. මිලියන 8,295 ක ණය ලබාගෙන තිබුණි. ඒ සඳහා 2015 වර්ෂය අවසානය වන විට ගිවිසුම් ප්‍රකාරව රු.මිලියන 7,004 ක පොලියක් ද ගෙවිය යුතුව තිබුණි. 2015 වර්ෂය අවසාන වන විට මුළු ණය වටිනාකම හා පොලිය රු.මිලියන 14,752.75 ක් වි තිබුණි. නමුත් එම බැරකම 2015 වර්ෂයේදී අමාත්‍යාංශයේ විසර්ජන ගිණුමේ බැරකම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි. ණය ලබාගැනීම සහ ගිවිසුම්වලට එළඹීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයා වෙත අධිකාරී බලය පැවරුනු ආකාරය සහ ණය ලබා ගැනීම සඳහා භාණ්ඩාගාරයෙන් ලබා ගත් අනුමැතිය හා එකඟතාව සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. නමුත් වාර්ෂික විසර්ජන පනතේ අමාත්‍යාංශය යටතේ රාජ්‍ය ආයෝජන වැය විෂයයන් යටතේ පුනරාවර්තන හා මූලධන වියදම් යටතේ සළසා තිබුණු ප්‍රතිපාදනවලින් 2015 වර්ෂය වෙනුවෙන් වූ ණය වාරික හා පොලී ගෙවා තිබුණි.

උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාලය පිහිටුවීම

ත්‍රිවිධ හමුදා අතර පවතින නවීන සන්නිවේදන පද්ධතියට සමාන අයුරින් අඛන්ඩව ආරක්ෂාකාරී හා විකල්ප සංනිවේදන ජාලයක් සැපයීම අරමුණු කරගෙන උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාලය පිහිටුවීමට සැලැසුම් කර තිබුණි. එය 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජනා වි තිබුණු අතර ඒ සඳහා වියදම රු. මිලියන 1,192.25 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. නමුත් එම මුල් ඇස්තමේන්තුව රු.මිලියන 661.75 කින් ඉක්මවා රු.මිලියන 1,297.25 දක්වා නැවත අසාමාන්‍ය ලෙස රු.මිලියන 1,854 දක්වා සංශෝධනය කර තිබුණි. මේ හේතුවෙන් අමාත්‍යාංශය යටතේ වූ සමාගමකට ගෙවිය යුතු උපදේශන සේවා ගාස්තු ප්‍රමාණයද ඉහළ යාමේ ප්‍රවනතාවයක්ද පැවතුණි. 2015 වර්ෂය අවසානයට ව්‍යාපෘති කාලය වර්ෂ එකකුත් මාස හයකින් ඉක්මවා තිබුණි. නමුත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 22.03 ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර එහි භෞතික ප්‍රගතිය සියයට 2 ක මට්ටමක පැවතුණි. මූලික කාර්යය වූ සන්නිවේදන කුළුණු 22 ක ඉදිකිරීම් ආරම්භ කර නොතිබීම, ව්‍යාපෘති කාර්යසාධනය ප්‍රාථමික අදියරයක පැවතීම, අදාළ ව්‍යාපෘතිය සැලැසුම් කළ කාලය හා පිරිවැය තුළ නිම කිරීමට නොහැකි වීමත් නිසා ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රථිඵල ලබාගැනීම අවිනිශ්චිත මට්ටමක පැවතුණි.

අකුරේගොඩ ආරක්ෂක සේවා මූලස්ථානය ඉදිකිරීම්

ශ්‍රවනාගාරයක්, සන්නිවේදන ගොඩනැගිල්ල, ආරක්ෂක ගොඩනැගිල්ල හා ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ගේ නේවාසික ගොඩනැගිලි ආදියෙන් සමන්විතව වර්ග අඩි මිලියන 4.7 ක්වූ මහල් 10 කින් යුතු ගොඩනැගිලි 08 කින් සමන්විතව ආරක්ෂක සේවා මූලස්ථානය ඉදිකිරීමේ කටයුතු 2012 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. මෙම ගොඩනැගිල්ලේ සන්නද්ධ සේවා නිලධාරින් 10,250 කට කාර්යාල ඉඩ පහසුකම් හා 6,850 කට නේවාසික පහසුකම් සැපයීමට අරමුණු කරගෙන සැලැසුම් කර තිබුණු අතර ත්‍රිවිධ හමුදාවේ ශ්‍රම දායකත්වය මත ඉදිකිරීම් කරමින් පැවතුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- ආර්ථික, මූල්‍ය, පාරිසරික හා සමාජ අවශ්‍යතා සාධකයන් ඇතුළත්වූ ශක්‍යතා අධ්‍යයනයක් පාරිසරික ගැටළු අවම කිරීමේ සැලැස්මක් හා පාරිසරික බලපෑම පිළිබඳ තක්සේරුවක් සිදුකිරීමකින් තොරව මෙම ඉදිකිරීම ආරම්භ කර තිබුණි. 2011 වර්ෂයේදී පිළියෙල කර තිබුණු ඇස්තමේන්තුව අනුව එහි වියදම රු.මිලියන 25,401 ක් වී තිබුණි. එම ඇස්තමේන්තුව සියයට 95 කින් සංශෝධනය කළ පසු එහි වියදම රු.මිලියන 55,601 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. මෙම ඉදිකිරීම සඳහා ප්‍රමාණ බිල්පත් පිළියෙල කර නොතිබුණු අතර, 2016 මැයි 30 දින වන විටත් සංශෝධිත ඇස්තමේන්තුව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

- ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය පිහිටුවා තිබුණු ඉඩම විදේශීය සමාගම් දෙකකට විකුණා 2010 සහ 2011 වර්ෂවලදී ලබා ගෙන තිබුණු රු.මිලියන 19,817.30 ක ආදායම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාව ප්‍රකාරව ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව භාණ්ඩාගාරය විසින් අවස්ථා 3 කදී අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණු එම ආදායම ආයෝජනය කර රු. මිලියන 5,506.77 ක පොලී ආදායමක් උපයාගෙන තිබුණි. එම පොලී මුදල සමඟ එකතු වූ මුළු මුදලින් රජයේ මුදල් රෙගුලාසිවලට පටහැනිව රු.මිලියන 12,265.98 ක් වැය කර තිබුණු අතර 2014 දෙසැම්බර් 31 දින වන විට තවදුරටත් අමාත්‍යාංශයේ ශේෂව පැවැති රු.මිලියන 13,058.09 ක් 2015 ජනවාරි 19 දින භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා ඉකුත් වර්ෂවල අමාත්‍යාංශයෙන් විසින් පොදු තැන්පත් ගිණුමෙන් වැය කළ රු.මිලියන 3,383.17 ක්, 2015 මාර්තු මාසයේදී ගිණුම්ගත කර තිබුණි.

- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව රු.මිලියන 22,377.68 ක ප්‍රතිපාදන අවශ්‍යතාවය සඳහා 2015 වර්ෂයේදී රු.මිලියන 7,980.90 ප්‍රතිපාදන සළසා තිබුණද, ඉන් රු.මිලියන 1,761.29 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

- ගිනි ආරක්ෂක වැඩපිළිවෙලක් ස්ථාපිත කර නොතිබුණු අතර 2014 වර්ෂයේදී ඇති වී තිබුණු ගිනි උවදුරෙන් ඉදිකිරීම් ව්‍යුහයන්ට රු. මිලියන 6.53 ද ඇතුළුව රු. මිලියන 12.31 ක හානියක් සිදු වී තිබුණි.

- උපදේශක සමාගම් තෝරා ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහය ප්‍රකාරව තරඟකාරී ලංසු කැඳවීම්වලින් බැහැරව අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2011 වර්ෂයේ සිට වාස්තු විද්‍යාත්මක සහ ඉංජිනේරු සේවාව සඳහා රු.මිලියන 606.3 කට පෞද්ගලික වාස්තු විද්‍යාත්මක උපදේශක සමාගමක සේවය ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව ලබාගෙන තිබුණි. ඒ සඳහා රු.මිලියන 490.5 ක් ගෙවා තිබුණි. උපදේශක සමාගමේ වෘත්තීය නිපුණතාවය හා ධාරිතාවය ව්‍යාපෘතියේ උපදේශක සේවා කටයුතු සඳහා ප්‍රමාණවත් නොවන බව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය හා ඉදිකිරීම් කළමනාකරණ ඒකකය විසින් හඳුනාගෙන තිබුණි. තවද ඉංජිනේරු උපදේශක සේවාව සඳහා රු.මිලියන 1,556.9 කට මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාලයට පවරා තිබුණු අතර ඒ වෙනුවෙන් ගිවිසගත් ගාස්තු ප්‍රමාණයෙන්

සියයට 77 ක් වූ රු.මිලියන 1,199 ක් ගෙවා තිබුණි.

- 2012 අප්‍රේල් මාසයේ ආරම්භ කර තිබුණු ඉහත ව්‍යාපෘතිය සමස්ථ ව්‍යාපෘති වැඩ සැලැසුමක් සකස් කර වැඩ මෙහෙයවීමක් සිදු කර නොතිබීම, වැඩ ඉලක්ක හඳුන්වා දී ඒ අනුව අපේක්ෂිත කාල රාමුවක් තුළ ඉදිකිරීම් සිදු කර නොතිබීම, මාස 18 ක් පමණ කාලයක් ඉදිකිරීම් කටයුතු නවතා තිබීම, සහ උපදේශක සේවා සැපයීමේ හා ප්‍රසම්පාදන කටයුතුවල ප්‍රමාදයන් හේතුවෙන් ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වී තිබුණු අතර සමස්ථ ව්‍යාපෘති ඉදිකිරීම් ප්‍රගතිය සියයට 35 ක ප්‍රමාණයක පැවතුණි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව යටතේ පවත්වා ගෙන යනු ලබන ලාභ උපයන ව්‍යාපෘතිවලින් උපයන ලාභ ඒකාබද්ධ ආදායමට බැර නොකිරීම

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් පවත්වා ගෙන යනු ලබන ලාභ උපයන ආයතන අතුරින් ලයා බීච් වාද්දූව හෝටලය හැර අනෙකුත් ආයතන සියල්ල රජයට අයත් ඉඩම් හා ගොඩනැගිලි තුළ ස්ථාපනය කර තිබුණි. රජය සතු වාහන 7 ක්, රු. මිලියන 14.90 ක් වැය කර වාර්ෂික කුලියට පවරා ගත් වාහන 17 ක් සහ වෙනත් රජය සතු යන්ත්‍රෝපකරණ 5 ක් ඉහත ව්‍යාපෘති කටයුතු පවත්වාගෙන යාම සඳහා යොදවා තිබුණි. තවද ඉන්ධන සඳහා වර්ෂයකට රු.මිලියන 5.44 ක් රජයේ ප්‍රතිපාදනවලින් උපයෝජනය කර තිබුණු අතර රජයේ සේවකයින් 2,063 ක් සේවයේ යොදවා තිබුණි. එහෙත් එම ව්‍යාපෘතිවලින් උපයන ලාභ රජයේ ආදායමට බැර කර නොතිබුණි.

බදු වංචාකළ සැපයුම්කරුවෙකුට නැවත කොන්ත්‍රාත්තුවක් ලබාදීම

2011 වර්ෂයේදී විගණකාධිපති විසින් හෙළිදරව් කරන ලද ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට භාණ්ඩ සැපයුම්කරුවෙකු විසින් සිදුකර තිබුණු රු.මිලියන 1.09 ක බදු වංචා කිරීම නොසලකා 2014 වර්ෂයේදී එම සැපයුම්කරුගෙන්ම නැවත භාණ්ඩ මිලදී ගැනීම සඳහා කොන්ත්‍රාත්තුව ලබාදී තිබුණි. ඒ අනුව ඔහු වෙත එකතු කළ අගය මත බදු වශයෙන් රු.මිලියන 5.36 ක් ගෙවා තිබුණු අතර එම බදු මුදල්ද වංචා සහගත ලෙස රඳවා ගෙන තිබුණි.

වෙනත් අරමුදල්වලින් මිලදී ගෙන තිබුණු භාණ්ඩ සඳහා රජයේ ප්‍රතිපාදනවලින් ප්‍රතිපූර්ණය කිරීම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයට පටහැනිව විවෘත ලංසු කැඳවීමේ පටිපාටියෙන් බැහැරව, රෙජිමේන්තු ආයතන සභාපති අරමුදල්වලින් මිලදී ගෙන තිබුණු රු.මිලියන 36.67 ක් වූ භාණ්ඩවල වටිනාකම රජයේ ප්‍රතිපාදනවලින් උපයෝගී කර ගෙන ප්‍රතිපූර්ණය කර තිබුණි.

ශ්‍රී ලංකා නාවික හමුදාව

ශ්‍රී ලංකා නාවික හමුදාව 2015 වර්ෂයේදී නීති විරෝධි සංක්‍රමණිකයන් 20 ක්, විගමනකයින් 120 ක් සහ මත්ද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් 638 ක් අත්අඩංගුවට ගෙන තිබුණි. රජයේ විවිධ ආයතනවල ඉදිකිරීම් සහ අලුත්වැඩියාවන් සඳහා රු.මිලියන 306 ක ශ්‍රමදායකත්වයක් ලබාදී තිබුණු අතර නාවික සෙබලුන් හයිටි රාජ්‍යයේ සාමසාධක රාජකාරී සඳහා යෙදවීම මඟින් ඇ.ඩො.280,993 ක විදේශ විනිමයක් 2015 වර්ෂයේදී උපයාගෙන තිබුණි. තවද, 2015 වර්ෂයේදී ගංවතුර ආපදා තත්ත්වයන්ට

ගොදුරු වූ පුද්ගලයින් 3,372 ක් බේරාගැනීමට කටයුතු කර තිබුණි.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශයන්ට අනුකූල නොවීම

2011 ජූනි 11 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේ නිර්දේශය පරිදි මිලදී ගැනීමට අපේක්ෂිත භාණ්ඩ ශ්‍රී ලංකා නාවික හමුදාවට ලැබීමට පෙර චෙක්පත් ලිවීම සහ සැපයුම්කරුවන්ට චෙක්පත් ලබාදීමේ පූර්ව ගෙවීම් ප්‍රේෂණපත් ක්‍රමය සම්පූර්ණයෙන් වැරදි ගනුදෙනුවක් බැවින් එය වහාම නිවැරදි කරන ලෙස උපදෙස් ලබාදී තිබුණ ද, ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් 2011 ජූලි මාසයේ සිට 2015 අප්‍රේල් මාසය දක්වා කාලය තුළ එම ක්‍රමය උපයෝගි කරගනිමින් අවස්ථා 8,653 කදී රු.මිලියන 2,730 ක් වැය කර භාණ්ඩ මිලදීගෙන තිබුණි.

නාවික යාත්‍රා මිලදී ගැනීම හා අළුත්වැඩියා කිරීම

නාවික මුර යාත්‍රා දෙකක් ඇ.ඩො. මිලියන 133.10 කට මිලදී ගැනීම සඳහා 2013 මැයි 13 දින ඉන්දියානු සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. 2016 ජූනි මාසය වන විට රු.මිලියන 8,800 ක් (ඇ.ඩො.මිලියන 66.55 ක්) සමාගමක් වෙත ගෙවා තිබුණු නමුත් නාවික යාත්‍රා දෙක 2016 වර්ෂය වන විටත් ශ්‍රී ලංකා නාවික හමුදාවට ලැබී නොතිබුණි.

2015 දෙසැම්බර් 31 දින වන විට ශ්‍රී ලංකා නාවික හමුදාව සතු මුළු යාත්‍රා සහ නෞකා ගණන 636 ක් වූ අතර ඉන් 143 ක් අක්‍රියව පැවතුණි. එම යාත්‍රා සහ නෞකාවලින් ඇ.ඩො.මිලියන 86 ක් ගෙවා මිලදීගත් නෞකා සහ යාත්‍රා 39 ක් ද, රු.මිලියන 558 ක් ගෙවා මිලදීගත් නෞකා සහ යාත්‍රා 104 ක් ද පැවැතුණි. මෙම යාත්‍රා අප්‍රමාදව අළුත්වැඩියා කිරීමට නාවික හමුදාව අපොහොසත් වී තිබුණි.

විදුලි බිල්පත් නිරවුල් කිරිම

විදුලි බිල්පත්වලට නියමිත දිනයේදී මුදල් ගෙවීමට අපොහොසත් වීම නිසා ඒ වෙනුවෙන් පොලී වශයෙන් වර්ෂ 4 ක් තුළ රු. මිලියන 29 ක් ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවා තිබුණි.

ශ්‍රී ලංකා ගුවන් හමුදාව සූර්යබල වීජී පහන් මිලදී ගැනීම

සූර්යබල වීජී පහන් මිලදී ගැනිම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් පෞද්ගලික සමාගම් දෙකකින් රු.මිලියන 19.96 ක් වටිනා සූර්යබල වීජී පහන් 187 ක් වසර 15ක වගකීම් කාලයකට යටත්ව සහ බැටරි 37ක් වසර 3ක වගකීම් කාලයකට යටත්ව මිලදී ගැනීම සඳහා 2009 මැයි මාසයේදී ගිවිසුම්වලට එළඹ තිබුණි. කෙසේ වෙතත් 2009 වර්ෂයේදී සවිකර තිබුණු වීජී පහන් සහ බැටරි අතරින් රු. මිලියන 16.02 ක් වටිනා වීජී පහන් 148 ක් සහ බැටරි 33 ක් 2015 අප්‍රේල් 20 දින වන විට ක්‍රියා විරහිත වී තිබුණි. මෙසේ විදුලි වියදම අවම කර ගැනීමේ අපේක්ෂාවෙන් මෙම මිලදි ගැනිම් සිදු කර තිබුණද, මෙමගින් 2015 අප්‍රේල් 20 දින වන විට ගුවන් හමුදාවට රු.මිලියන 19.96 ක අලාභයක් සිදුව තිබුණි.

ගුවන් යානා කුලී රාජ්‍ය ආදායමට බැර නොකිරීම

සමාලෝචිත වර්ෂය තුළ රැස්කළ ගුවන් යානා කුලී ආදායමෙන් රු. මිලියන 5.51 ක් අදාළ ආදායම් සංකේතයට බැර නොකර රජයේ

ගිණුමක් නොවන විධායක සුභසාධන අරමුදල නම් වූ ගුවන් හමුදාවේ අභ්‍යන්තර අරමුදලකට බැර කර තිබුණි.

එමෙන්ම 2002 ජුලි 17 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛය ප්‍රකාරව ගුවන් හමුදාවේ ගුවන්යානා කුලී ආදායම් රැස්කිරීම සම්බන්ධයෙන් ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් ගුවන් හමුදාපතිවරයා කටයුතු කළ යුතුව තිබුණි. නමුත් ගුවන් හමුදා නිලධාරීන් කිහිප දෙනෙකුගේ නමින් පිහිටුවා ගත් පෞද්ගලික සමාගමක් මගින් මෙහෙයුම් කටයුතු සිදුකර තිබුණි. වාර්තා පිළියෙල කිරීම් හා ආදායම එකතු කිරීම සම්බන්ධයෙන් රජයේ චක්‍රලේඛ විධිවිධානවලට අනුව කටයුතු නොකිරීම හා සමාගමේ බැංකු ගිණුම්, මූලික ලියවිලි, ලිපිලේඛන විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන කෘෂිකාර්මික, පශු පාලන හා වෙනත් ව්‍යාපෘතිවලින් රු.මිලියන 497.70 ක ආදායමක් උපයාගෙන තිබුණි. ඊට අමතරව රු.මිලියන 19.15 ක් වැය කර විදුලි වැට කිලෝ මීටර් 401 ක් ඉදිකර තිබුණි.

වැඩිපුර ගෙවීම්

2015 වර්ෂයට අවශ්‍ය සපත්තු පොලිස් ටින් 80,000 ක් මිලදී ගැනීමේදී එකක් රු.98.80 බැගින් මිලදී ගැනීම නිසා රු.මිලියන 3.01 ක මුදලක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය

වෛරහැර විශ්ව විද්‍යාලීය රෝහල ඉදිකිරීම සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් රු.බිලියන 26 ක ණයක් ලබාගෙන තිබුණ ද 2016 නොවැම්බර් මාසය අගභාගය වන විටත් වැඩ නිම කර නොතිබුණි. උපායශීලී සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස සලකා ඉහත ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන තිබුණ ද ඉහත ගණයට නොවැටෙන මෙම ව්‍යාපෘතියේ කටයුතු සඳහා විදේශ ණය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. එහෙත් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ලංසු කැඳවීමකින් තොරව චීන ඉදිකිරීම් සමාගමක් වෙත පවරා තිබුණි. දේශීය බැංකුවකින් ලබාගත් ණයවලින් විදේශීය සමාගමකට ගෙවීම් කිරීමේ හේතුවෙන් 2015 වර්ෂයේදී විශ්වවිද්‍යාලයට සිදුවූ විනිමය අලාභය රුපියල් මිලියන 1,030.53 ක් වී තිබුණි. ඉහත ණය මුදල සඳහා මහා භාණ්ඩාගාරය විසින් පොලී ගෙවනු ලබන අතර 2015 වර්ෂයේ දී ඒ සඳහා රුපියල් මිලියන 1,540.9 ක් ප්‍රතිපාදන සලසා තිබුණි.

ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව අත්තිකාරම් ගෙවීම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව 2011 වර්ෂයේ සිට භාණ්ඩ මිලදී ගැනීමේදී සැපයුම්කරුවන් වෙත අත්තිකාරම් ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී අත්තිකාරම් ලෙස රු.මිලියන 274.56 ක් ලබාදී තිබුණු අතර ඉන් රු.මිලියන 57.39 ක අත්තිකාරම් 2015 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි.

රාජ්‍ය ව්‍යවසායන්

රාජ්‍ය ව්‍යවසායක් යනු සම්පූර්ණයෙන් රජය සතු වෙනම නීතිමය ස්වභාවයක් සහිත සහ එහි භාණ්ඩ හා සේවා විකිණීමෙන් ආදායම උපයනු ලබන ආයතනයකි. ඒ අනුව එහි වත්කම් මත ප්‍රතිලාභයක් ඉපැයීම අනාගත සංවර්ධනය සඳහා අවශ්‍ය වේ. නියාමන, ප්‍රවර්ධනාත්මක හා අධ්‍යාපනික රාජ්‍ය ව්‍යවසායන් සම්ප්‍රදායානුකූලව වාණිජ අංශයන්ට අයත් නොවන අතර එම ව්‍යවසායන් ලාභ නොලබන සංවිධාන ලෙස සැලකෙන අතර, ලාභදායීත්වය හැර වෙනත් නිර්ණායකයන් භාවිතා කරමින් ඒවායේ කාර්යසාධනය පරික්ෂා කළ යුතු වේ. පහත සඳහන් ශීර්ෂයන් යටතේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවසායන් පුළුල් ලෙස වර්ගීකරණය කළ හැක.

- විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන්
- ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල්
- රජය සතු සීමිත වගකීම් සමාගම්
- නියාමන හා අධීක්ෂණ ආයතන
- විශ්වවිද්‍යාල, පර්යේෂණ සහ වෙනත් පුහුණු ආයතන
- වෙනත් සංවර්ධන හා ලාභ නොලබන ආයතන

විදුලි බලය, ජලය, ඛනිජ තෙල් නිෂ්පාදිත, විදුලි සංදේශ හා ගුවන් ප්‍රවාහන ආදී ආර්ථිකයේ උපාය මාර්ගිකව ඉතා වැදගත් ක්ෂේත්‍ර රාජ්‍ය ව්‍යවසායන් මඟින් මෙහෙයවනු ලැබේ. ආර්ථිකයේ සමස්ත හිමිකම් සහ තරඟකාරිත්වය කෙරෙහි සියළු රාජ්‍ය ව්‍යවසායන්හි ආයතනික පාලනය ඉතා වැදගත් වේ. 2015 දෙසැම්බර් 31 දිනට එක් එක් වර්ගයන්හි රජය සතු සීමිත වගකීම් සහිත සමාගම් හැර රාජ්‍ය ව්‍යවසායන් 243 ක මුළු වත්කම්වල සංයුතිය ඉකුත් වර්ෂය අවසානය සමඟ සසඳා පහත රූපසටහන 08 හි දැක්වේ.



රූපසටහන 08 – 2014 වර්ෂය සමඟ සසඳා 2015 වර්ෂයේ රාජ්‍ය ව්‍යවසායන්හි මුළු වත්කම්

2015 වර්ෂයේදී රාජ්‍ය ව්‍යවසායන්ට දළ වශයෙන් රු.බිලියන 50.8 ක රජයේ පුනරාවර්තන ප්‍රදාන ලබාදී තිබුණද, එය රජයේ මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 3.03 ක් වූ අතර එයට අනුරූපී ඉකුත් වර්ෂයේ සංඛ්‍යාව පිළිවෙලින් රු.බිලියන 44.7 ක් සහ සියයට 3.26 ක් විය. මෙයට අතිරේකව ප්‍රාග්ධන වියදම් සඳහා සමාලෝචිත වර්ෂයේදී දළ වශයෙන් රු.බිලියන 284.36 ප්‍රාග්ධන ප්‍රදාන ලබාදී තිබූ අතර එය රජයේ මුළු ප්‍රාග්ධන වියදමෙන් සියයට 41.57 ක් විය. ඉකුත් වර්ෂයට අනුරූපීව එම සංඛ්‍යා පිළිවෙලින් රු.බිලියන 264.11 ක් සහ සියයට 44.33 ක් විය.

කාර්යසාධනය ඇගයීම

රාජ්‍ය ව්‍යවසායන් විගණනය මූල්‍ය හා අනුකූලතා විගණනයට පමණක් සීමා නොවන අතර අරමුණු හා ඉලක්ක ඉටුකර ගැනීම සඳහා කාර්යක්ෂමතාවය, ආර්ථික බව හා ඵලදායීතාවය කෙරෙහිද අවධානය කරනු ලැබේ.

රාජ්‍ය ව්‍යවසායන්හි කාර්යක්ෂමතාවය හා ඵලාදායීතාවය පිළිබඳ විගණනය සමහර ප්‍රමිතින් හා නිර්නායකයන් මත පදනම්ව සිදු කරනු ලැබේ. ලාභය කාර්යසාධනයේ ප්‍රධාන නිර්නායකය නොවන අතරම රාජ්‍ය අරමුදල් ආර්ථිකභාවයෙන් හා කාර්යක්ෂමව යොදා ගැනීමේ කළමනාකරණයේ කාර්යසාධනය සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම වඩාත් ඵලදායී වේ. අරමුණු ව්‍යවසායෙන් ව්‍යවසායාට වෙනස් වේ. ව්‍යවසායක කාර්යසාධනය විශ්ලේෂණය ඇගයීම ව්‍යවසාය පිහිටුවීමේ අරමුණ යම් දුරකට අගය කරනු ලැබේ. විගණනයේ එක් ප්‍රමුඛ කාර්යයක් වනුයේ ව්‍යාව්‍යසායක කාර්යසාධනය ඇගයීම සඳහා නිර්නායකය හඳුනා ගැනීමයි. නිෂ්පාදන ව්‍යවසායක, උදාහරණයක් වශයෙන්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ගත් විට, අරමුණු සහ ආයෝජනයේ පදනම, ධාරිතාවය, පිරිවැය හා කාල සැලැසුම්, පරිභෝජන නියමයන්, ඉපැයීම්, ඵලදායීතාවය, පිරිවැය, ප්‍රතිලාභ අනුපාතය ආදිය කාර්යසාධනය මැනීමේ මිනුම් දඬු වේ. ව්‍යවසායක් වෙත ඇති දිගු හා කෙටි කාලීන ප්‍රාග්ධනය හා මෙහෙයුම් සැලැසුම් කාර්යසාධනය තක්සේරු කිරීමේ වෙනත් සමුද්දේශ ලක්ෂණයන් වේ.

භෞතික කාර්යසාධනය ඇගයීම අදාළ වන අවස්ථාවක ඒකකයක තක්සේරු කළ ධාරිතාවය පිළිගත හැකි මිණුම් ලකුණක් වේ. අනුපාතික ධාරිතාවය උපයෝජනය යනු අමු ද්‍රව්‍ය සහ උපයෝගීතා පරිභෝජනය සඳහා සම්මතයන් ඉපැයීම් හා ප්‍රතික්ෂේපිතයන් මෙන්ම විධිමත් නඩත්තුව හා උපකරණ සේවා කිරීම සඳහා අවශ්‍යතාවයන් සමඟ තක්සේරු කිරීමයි. කාර්යසාධනය ඇගයීම සඳහා අනෙක් වැදගත් පදනම වන්නේ පිරිවැය කාර්යක්ෂමතාවයයි. ධාරිතා උපයෝජනය, පරිභෝජනයන්, ඵලදායීතාවය, ඉපයීම් ආදිය පිළිබඳ සම්මතයන් මත පදනම්ව ප්‍රමිති හා පිරිවැය ඉලක්කයන් තීරණය කරනු ලැබේ. ආයතනික පාලනය, සාමාන්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, ප්‍රසම්පාදන කළමනාකරණය, ඉදිකිරීම් කළමනාකරණය සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යවසායායක් අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති අතර මෙම මාර්ගෝපදේශ ව්‍යවසායයක කාර්යසාධනය හා පද්ධති ඇගයීම් කිරීම සඳහා වෙනත් පදනමක් වේ. අභ්‍යන්තර හා බාහිර විශේෂඥයින් විසින් සිදුකරන වෙනත් තාක්ෂණික අධ්‍යයනයන් හා ප්‍රමිතීන් මෙම මාර්ගෝපදේශයට පදනම් වන වෙනත් නිර්නායකයන් වේ.

විගණකාධිපතිවරයා විසින් පවත්වනු ලබන බාහිර විගණනය ගණන්දීමේ වගකීම් පිළිබඳ උපකරණයක් වේ. රජයට සහායක් සේම ව්‍යවසාය කළමනාකාරිත්වය ඔවුන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලාදායිතාවය වැඩිදියුණු කර ගැනීම සඳහා රාජ්‍ය ව්‍යාපාර විගණනය සමානවම වැදගත් වන කාරණයක් වේ. මූල්‍ය හා මෙහෙයුම් අඩුපාඩු, පද්ධති ප්‍රමාණාත්මක නොවීම හෝ අකාර්යක්ෂමතාවය, කාර්යසාධනයේ ඌනතාවයන්, නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම් ආදිය සහ කාර්යසාධනය පිළිබඳ පිළිගත හැකි ප්‍රමිතින් පිළිබඳ ඉලක්කයන් සපුරා නොගැනීම සම්බන්ධයෙන් හේතු විග්‍රහ කිරීම මඟින් මෙය සපුරා ගැනේ. මූල්‍ය කාර්යසාධනය භෞතික කාර්යසාධනය සමඟ සම්බන්ධවන අතර කාර්යක්ෂම හා ආර්ථික මෙහෙයුම් සහ සම්පත් කළමනාකරණය පිළිබඳ ගැටළු විගණන වාර්තාවෙන් අවධාරණය කරනු ලැබේ. ආයතනවල කළමනාකරිත්වය සමඟ මාගේ නිලධාරින් විසින් පවත්වන විධිමත් රැස්වීම්වලදී අවශ්‍ය පද්ධති හා මෙහෙයුම් වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ සාකච්ඡා කරනු ලැබේ. විගණකාධිපතිවරයා විසින් නිරීක්ෂණය කෙරෙන අහිතකර සොයා ගැනීම් සඳහා රාජ්‍ය ව්‍යවසායන්හි අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකාරිත්වය පසු විපරම් කටයුතු සිදුකිරීමද වැදගත් වේ. එකම කරුණ සඳහා වර්ෂයක් පාසාම කෙරෙන අහිතකර සොයා ගැනීම් නැවත නැවත සිදුවීමෙන් තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා වැඩි ප්‍රවනතාවය පෙන්නුම් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය

රාජ්‍ය ව්‍යවසායන් විසින් වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබේ. ආයතනවල ක්‍රියාකාරිත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් මූල්‍ය ප්‍රකාශනවලින් පිළිබිඹු කරන්නේද යන බවට ස්වාධීන සහතිකයක් විගණකාධිපති විසින් ලබාදෙනු ලැබේ. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම ආකාරයෙන් මෙම සහතිකය ලබාදෙනු ලැබේ. රාජ්‍ය ව්‍යවසාය මූල්‍ය තත්ත්වය හා මූල්‍ය කාර්යසාධනය මූල්‍ය ප්‍රකාශනවලින් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන්නේද හෝ නොවන්නේද යන්න සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට හෝ දැනට ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූල වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට යන මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතින්ට එම මූල්‍ය ප්‍රකාශන අනුකූල වන්නේද හෝ නොවන්නේද යන්න පිළිබඳ විගණකාධිපතිවරයාගේ නිගමනය විගණන මතයෙන් දැක්වේ.

සිව් ආකාරයේ විගණන මතයන් ප්‍රකාශ කරනු ලැබේ. ඒවා නම් තත්ත්වාගණනය නොකළ, තත්ත්වාගණනය කළ, අහිතකර සහ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවය කළමනාකරණ එකඟ නොවීම හෝ කටයුතු සීමාවීම පිළිබඳ අවස්ථාවලදී මතය ව්‍යාචනය කිරීම නම් වේ. විෂය පථය සීමාවීම මතය ව්‍යාචනය කිරීමට හේතුවන අතර නොඑකඟතාවය ඇතිවීම අහිතකර විගණන මතයක් ප්‍රකාශ කිරීමට හේතුවේ.

2015 වර්ෂය සඳහා රාජ්‍ය ව්‍යවසායන් 243 ක් විසින් ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් නිකුත් කළ විගණන වාර්තාවල ඇතුළත් විගණන මතය ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත 07 වගුවෙහි දැක්වේ.

විගණන මතයේ ආකාරය	2015	2014
තත්ත්වාගණනය නොකළ	29	30
තත්ත්වාගණනය කළ	136	162
ව්‍යාවනය කළ	12	20
අහිතකර	12	11
මෙතෙක් තීරණය නොකළ	38	16
මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ	16	4

වගුව 07 - රාජ්‍ය ව්‍යවසායන් විසින් ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපතිවරයා විසින් නිකුත් කළ විගණන මතයන්

අහිතකර මතයක් ප්‍රකාශ කිරීම සඳහා සලස්වන බරපතල සාවද්‍ය ප්‍රකාශයන් හේතුවෙන් විගණකාධිපතිවරයාගේ උපදෙස් පරිදි රාජ්‍ය ව්‍යවසායන් කිහිපයක් අදාළ පාලක මණ්ඩල විසින් තම මූල්‍ය ප්‍රකාශන ඉවත් කර ගන්නා ලදි. නව මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් පිළියෙල කර විගණකාධිපතිවරයාගේ පරීක්ෂාවට ඉදිරිපත් කිරීම සඳහා එම ආයතනවලට උපදෙස් ලබාදෙන ලදි. එසේ සිදුකර සැලකිය යුතු ප්‍රමාදයකින් පසුවත් සමහර ආයතන තම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. එම හේතුන් නිසා මෙතෙක් විගණන මතය නිශ්චය කර නොමැත.

ඉහත දත්ත විශ්ලේෂණය කිරීමෙන්, 2015 වර්ෂයේදී තත්ත්වාගණනය කළ හා විගණන මතය ව්‍යාවනය කිරීම අඩු කිරීම මඟින් වාර්තාකරණ ප්‍රමිතින්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ ප්‍රගතියක් ඇති බව පැහැදිළි වේ.

ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තා පවත්වා ගැනීම

සාමාන්‍යයෙන් විධිමත් වාර්තා එනම් ස්ථාවර වත්කම් ලේඛන (RFA), උපලේඛන හා ජංගම නොවන වත්කම් පිළිබඳ වාර්තා පවත්වා ගැනීම දුර්වලවන අතර සමහර අවස්ථාවලදී ඉතාම දුර්වල වේ. දේපල, පිරියත හා උපකරණ (PPE) වශයෙන් ගිණුම්කරණයේදී හැඳින්වෙන පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළ නොහැකි වත්කම් හා දේපල ජංගම නොවන වත්කම් වේ. ඉඩම් හා ගොඩනැඟිලි, මෝටර් වාහන, ලී බඩු, කාර්යාල උපකරණ, පරිගණක, සවිකිරීම් සහ පිරියත හා යන්ත්‍රෝපකරණ වැනි විෂයයන් සාමාන්‍යයෙන් ස්ථාවර වත්කම්වලට ඇතුළත් වේ. විශාල සංස්ථාවක විද්‍යානුකූලව, ක්‍රමවත්ව හා යාවත්කාලීනව අංකනය නොකරන්නේනම් නිශ්චිත ස්ථාවර වත්කම් හඳුනා ගැනීම හා ස්ථානගත කිරීම ගැටළු සහගත විය හැක. බොහෝ ව්‍යාපාරවල පොදු ගැටළුව වී ඇත්තේ ස්ථාවර වත්කම් ලේඛනය ක්‍රමවත්ව පවත්වා නොගැනීමය. එහි ප්‍රතිඵලයක් ලෙස ස්ථාවර වත්කම් පිළිබඳ

භෞතික සත්‍යාපනය අසාර්ථක කාර්යයක් බවට පත්වන බව නිරීක්ෂණය විය. විධිමත් වාර්තා පවත්වා ගැනීම සහ ස්වකීය වත්කම් ආරක්ෂා කර ගැනීම පිළිබඳ වගකීමක් ව්‍යවසායන්හි කළමනාකාරිත්වයන් සතු වේ. බොහෝ අවස්ථාවන්හිදී වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස වත්කම් පිළිබඳ පැවැත්ම හා තත්ත්වය තහවුරු කර ගත නොහැකි විය.

වගකිව යුතු නිලධාරීන් විසින් වැඩ නිම කිරීම් සහතික නිකුත් කිරීම ප්‍රමාදවීම හේතුවෙන් කෙරීගෙන යන වැඩ ස්ථාවර වත්කම් ලෙස ප්‍රාග්ධනීත කිරීමේදී සැලකිය යුතු ප්‍රමාදයන් සිදුවන බව නිරීක්ෂණය විය. මෙම තත්ත්වය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජල ව්‍යාපෘති සම්බන්ධයෙන් හා ලංකා විදුලි බල මණ්ඩලය විසින් නිම කරන ලද විදුලි බල ව්‍යාපෘතිවලදී ප්‍රධාන වශයෙන් නිරීක්ෂණය විය. ජාතික අධිවේගී මාර්ග හා මාර්ග සංවර්ධන අධිකාරිය (RDA) විසින් නිම කරන ලද වෙනත් ප්‍රධාන මාර්ග ව්‍යාපෘති සම්බන්ධයෙන් ද මෙම තත්ත්වය නිරීක්ෂණය විය. ප්‍රාග්ධනීත කිරීමේ වැදගත්කම විගණනය විසින් පෙන්වාදීමෙන් පසුව මෙම තත්ත්වය පසුව නිවැරදි කර, මෙම මාර්ගවල පිරිවැය ප්‍රාග්ධනීත කර තිබූ අතර එය මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය කර තිබුණි.

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයට අනුකූලවීම සඳහා සියළු රාජ්‍ය ව්‍යවසායන් විසින් ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කර තබාගත යුතු බව අවධාරණය කර ඇත. එක් එක් ස්ථාවර වත්කම් පිළිබඳ විස්තර තබා ගැනීමේ ක්‍රියාමාර්ගය වත්කම් පාලනය තහවුරු වීම හා වත්කම් සාවද්‍ය පරිහරණයෙන් වලක්වා ගැනීම තහවුරු කර ගැනීමට ආයතනයකට පහසුකම් සලසයි. ක්ෂය ගණනය කිරීම, බදු සඳහා සහ රක්ෂණ කාර්යයන් සඳහා ඉඩ සැලසෙන වත්කම්වල නිවැරදි වටිනාකම තබා ගැනීමේ ක්‍රියාමාර්ගයක්ද වේ. ස්ථාවර වත්කම් ලේඛනය කළමනාකරණ අවශ්‍යතාවලට ගැලපෙන සම්පූර්ණ සහ නිවැරදි වාර්තා ජනනය කරයි.

රාජ්‍ය වැවිලි සංස්ථාව, ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් පිළිබඳ වාර්තාද අසම්පූර්ණ බව නිරීක්ෂණය වූ අතර පැවැත්ම හා අයිතිය තහවුරු කර ගැනීම සඳහා පිහිටි ස්ථානය හා ප්‍රමාණය සහිතව විස්තරාත්මක උපලේඛනයක් සැපයීමටද හැකි තත්ත්වයක නොතිබුණි.

කෙසේ වුවද ආයතන සැලකිය යුතු සංඛ්‍යාවක් ඔවුන්ගේ වත්කම් අනිවාර්ය සාධාරණ අගය පදනමට ගෙන ඒම සඳහා නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති යොදා ගැනීමට දැනට ඔවුන්ගේ වත්කම් හඳුනා ගැනීම හා රජයේ ප්‍රධාන තක්සේරුකරු මඟින් තක්සේරු කර ගැනීම සිදුකරමින් තිබෙන බවද නිරීක්ෂණය විය.

වෘත්තීය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට හා රඳවා ගැනීම සඳහා ස්වාධීනත්වය නොමැතිවීම

වාණිජමය තීරණ ගැනීමේදී හා පුහුණු කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ රඳවා තබා ගැනීමේ දී බලපාන විවිධ අනුමත කිරීමේ අවශ්‍යතාවයන් අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියාකාරීත්වයන්ටද අහිතකර ලෙස බලපානු ලබයි. මෙම සීමා කිරීම හේතුවෙන් බොහෝ ව්‍යවසායන් ඉහළ වැටුප් මත කොන්ත්‍රාත් පදනමින් වෘත්තිකයන් බඳවා ගැනීම සිදුකරන

බව නිරීක්ෂණ විය. පුද්ගලික අංශය සමඟ සැසඳීමේදී ඉතා අඩු වැටුප් ව්‍යුහයක් හේතුවෙන් විශේෂයෙන් ගණකාධිකාරිවරුන්, ඉංජිනේරුවරුන් හා තක්සේරුකරුවන් ආදී තනතුරු සඳහා බඳවා ගැනීමට හා වෘත්තීමය සුදුසුකම්ලාභීන් රඳවා ගැනීමට රාජ්‍ය ව්‍යවසායන්ට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදුවිය.

අනුප්‍රාප්තික සැලැස්මක් නොමැතිවීම

ලංකා විදුලි බල මණ්ඩලය හා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වැනි සමහර ප්‍රධාන ආයතනවල ප්‍රධාන කළමනාකාරිත්ව තනතුරු පුරප්පාඩු සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් පිරවීමට කටයුතු කිරීමෙන් තොරව දීර්ඝ කාලයක් පැවති බව නිරීක්ෂණය විය. මෙම තත්ත්වයට ප්‍රධාන හේතුව ආයතනවල ප්‍රධාන තනතුරු ආවරණය කිරීම සඳහා කිසිදු අනුප්‍රාප්තික සැලැස්මක් පිළියෙල කර නොතිබීමයි. මෙම තත්ත්වය, වැඩ බැලීම් ක්‍රියාවලියක් මඟින් කටයුතු කිරීමට එම ව්‍යවසායන්ට ඉඩදී තිබූ අතර අවසානයේදී වැඩ ප්‍රමාදවීම් සිදුවී තිබුණි.

ආයතන විසින් ගෙවන ලද උපයන විට ගෙවීම් බදු

රාජ්‍ය ව්‍යවසායන් 29 ක් විසින් ආදායම් බදු නීතිය මත ඇති මූලික තාර්කිකයට එරෙහිව තම අරමුදල්වලින් ස්වකීය නිලධාරීන් සඳහා උපයන විට ගෙවීම් (PAYE) බදු ගෙවා තිබුණි. එබැවින් ආයතනයෙන් ආයතනයට වෙනස් නොවන පරිදි උපයන විට ගෙවීම් බදු පියවීම සම්බන්ධයෙන් ස්ථිර තීරණයක් මහා භාණ්ඩාගාරය විසින් ගත යුතු බව අවධාරණය කරනු ලැබේ. එසේ ගෙවන ලද මුළු මුදල 2015 වර්ෂය සඳහා රු.මිලියන 3,921 ක් වූ අතර 2014 වර්ෂය සඳහා රු.මිලියන 4,178 ක් විය. ඒ අනුව උපයන විට බදු ගෙවීමේ අරමුණු සාක්ෂාත් නොවන අතර අනිත් අතට සියළු රාජ්‍ය නිලධාරීන්ට කරන සාධාරණ සැලකීම උල්ලංඝණය කිරීමක්ද වේ.

වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම

2015 වර්ෂය සඳහා රාජ්‍ය ව්‍යවසායන් 227 ක මූල්‍ය ප්‍රකාශන 2016 සැප්තැම්බර් 30 දින වන විට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවද 2015 දෙසැම්බර් 31 දිනට මුදල් වර්ෂය අවසානවී මාස 9 ක් ඉකුත්වීමෙන් පසුවත් ආයතන 16 ක් විසින් තම මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එම ආයතන පහත 08 වගුවෙහි ලැයිස්තුගත කර ඇත. 2016 සැප්තැම්බර් 30 දින වන විට මාස 21 ක් ප්‍රමාද වී තිබුණද. ආයතන 04 ක් විසින් 2014 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි. ආයතන 59 ක මූල්‍ය ප්‍රකාශනවල තිබූ බරපතල සාවද්‍ය ප්‍රකාශයන් මා විසින් පෙන්වා දීමෙන් පසුව අහිතකර විගණන මතයක් ප්‍රකාශ කිරීම වැලැක්වීම සඳහා ඔවුන්ගේ එම මූල්‍ය ප්‍රකාශන ඉවත් කර ගෙන තිබුණි.

ආයතනයේ නම	ආයතනයේ නම
ජාතික පුස්තකාල හා ප්‍රලේඛණ මණ්ඩලය	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
අම්බුළුවාව ජෛව විවිධත්ව සංකීර්ණයේ අරමුදල	ශ්‍රී ලංකා ආයුර්වේද සංස්ථාව
ආර්ථික මධ්‍යස්ථානය - කුරුදුවත්ත	ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
ජාතික ව්‍යාපාර සංවර්ධන අධිකාරිය	ශ්‍රී ලංකා පිඟන් සංස්ථාව
තේ ශක්ති අරමුදල	වී අලෙවි මණ්ඩලය
මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදල	ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය
ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව	ශ්‍රී ලංකා තක්සේරු ආයතනය
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය	රාජ්‍ය ආයතනවල අතිරික්ත භාර අරමුදල

වගුව 08 - 2015 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් නොකළ රාජ්‍ය ව්‍යවසායන්

2002 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයට අනුකූලව මූල්‍ය ප්‍රකාශන විගණනයට ලැබුණු දින සිට දින 30 ක කාලයක් ඇතුළත අදාළ රාජ්‍ය ව්‍යවසායට විගණන වාර්තාව නිකුත් කිරීමට හැකි වන පරිදි රාජ්‍ය ව්‍යවසායන් විසින් ඔවුන්ගේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තා අදාළ මුදල් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු අතර අදාල මුදල් වර්ෂය අවසානවී දින 150 ක් ඇතුළත රාජ්‍ය ව්‍යවසායන් විසින් වාර්ෂික වාර්තා හා විගණිත මූල්‍ය ප්‍රකාශන පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. භාණ්ඩාගාර ලේකම් විසින් 2002 මැයි 24 දිනැති අංක පීඑෆ් /පීඊ/21 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් නියෝග නිකුත් කර තිබුණි.

අත්තිකාරම් නිරවුල් කිරීම

භාණ්ඩ දැනටමත් මිලදී ගෙන හා සේවා දැනටමත් ලබාගෙන තිබුණද, එම වියදම් ලෙස ගිණුම්ගත කිරීමෙන් තොරව දීර්ඝ කාලයක් අත්තිකාරම් ලෙස විශාල මුදල් ප්‍රමාණයක් ගිණුම්වල පවතින බව නිරීක්ෂණය විය. සමහර අවස්ථාවලදී පෙර ලබාදී තිබූ අත්තිකාරම් නිරවුල් කිරීමෙන් තොරව එම නිලධාරියාට නැවත අත්තිකාරම් කිහිපයක් ලබාදී තිබුණි.

පරිපාලිත සමාගම් සංස්ථාපනය කිරීම

සමහර අවස්ථාවලදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය නොමැතිව ඇතැම් ආයතන සමාගම් පනත යටතේ සීමිත වගකීම් සමාගම් සංස්ථාපනය කර තිබීම නිරීක්ෂණය විය. මෙසේ කටයුතු කිරීම ප්‍රධාන ආයතනයේ කාර්යයන් දියාරු කිරීමක් මෙන්ම ඒවායේ මෙහෙයුම් විගණකාධිපතිවරයාගේ පරීක්ෂාවට භාජනය කිරීමක්ද සිදු නොවේ. ලංකා විදුලි බල මණ්ඩලය හා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වැනි සමහර උපාය මාර්ගික ආයතන විශාල ප්‍රමාණයක පරිපාලිතයන් හා ආශ්‍රිත සමාගම් පිහිටුවා ඇත. අදාළ ආයතනයේ ප්‍රධාන කොටස් අයිතිකරු වශයෙන් පාලක මණ්ඩලයද නියෝජනය කරයි.

එහෙත් අදාළ ආයතනයන්හි පාලන බලතල ක්‍රියාත්මක කිරීම ඉතා දුර්වල තත්ත්වයක පවතින බවද තවදුරටත් නිරීක්ෂණය විය.

විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන් (SBES)

මෙම ව්‍යවසායන් වූ කලි වෙනත් පුද්ගලික සමාගම් මෙන් භාණ්ඩ හා සේවා සැපයීමේ යෙදී සිටින ව්‍යාපාරයන් හෝ සමහර අවස්ථාවලදී පුද්ගලික අංශය සමඟ සක්‍රීය තරඟකාරිත්වයක් ඇති ව්‍යාපාරයන් වේ. ආර්ථිකයේ සාමාන්‍යයෙන් ඒකාධිකාරී ලෙස සැලකෙන ක්ෂේත්‍රවල මෙම විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන් පොදුවේ දක්නට ලැබේ. අදාළ විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන් මගින් පමණක් කටයුතු සිදුකරනු ලබන අතර තරඟකාරිත්වයට හා පුද්ගලික අංශයේ සහභාගීත්වයට පහසුවෙන් විවෘත නොවේ. සම්පත් හා උපයෝගිතා පදනම් ව්‍යාපාරයන්හි (උදා:- විදුලි බලය, ජලය, ඛනිජ තෙල් නිෂ්පාදන ආදිය) පුළුල්ව පැතුරුණු සහභාගීත්වයක් ඇත.

කෙසේ වුවද ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය, රාජ්‍ය බැංකු වැනි පුද්ගලික අංශයේ තරඟකාරිත්වයට විවෘත ඇතැම් විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන්ද පවතී. ඒ අනුව ක්‍රියාත්මකව පවතින ව්‍යවසායන් 52 ක් (සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද හා විගණකාධිපතිවරයාගේ විෂය පථයට නොවැටෙන ආයතන හැර) විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන් යටතේ වර්ගීකරණය කළ හැකි අතර එයින් ව්‍යවසායන් 45 ක් පමණක් 2015 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2016 සැප්තැම්බර් 30 වන විට විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2012 වර්ෂයේදී ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS) පදනම්ව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) අනුගමනය කිරීමත් සමඟ විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන්ටද ඒවා යොදා ගැනීමට යොමු කරවන ලදි. කෙසේ වුවද සාධාරණ අගය පදනම් කර ගෙන යම්තාක් දුරකට මෙම නව ප්‍රමිතීන්වලට අනුකූලවන පරිදි තම වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට මෙම ව්‍යවසායන් බොහොමයකට හැකි වූ බව නිරීක්ෂණය විය. කෙසේ වුවද නිපුණතාවය හා තාක්ෂණික සහාය නොමැතිවීම හේතුවෙන් තම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ඇතැම් ව්‍යවසායන් මහත් පරිශ්‍රමයක් දරා තිබුණි. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් පෙන්වාදීම මගින් ඔවුන්ගේ මූල්‍ය ප්‍රකාශන නිවැරදි කර ගැනීමට එම ආයතනයන්ට සාධාරණ අවස්ථාවන් ලබාදුන් බව මම මෙහිදී සඳහන් කළ යුතුය. මෙම බොහෝ ආයතන ධනාත්මක පියවරක් ලෙස මෙය භාරගනු ලැබූ අතර, අහිතකර විගණන මතයක් ප්‍රකාශ කිරීම වැළැක්වීම සඳහා හේතු සහගතව සාධාරණව තම මූල්‍ය ප්‍රකාශන නැවත ඉදිරිපත් කිරීමට පියවර ගනු ලැබීය. මෙම නව වැඩ පිළිවෙල යටතේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමේදී සැලකිය යුතු ප්‍රමාදයන් විය. ප්‍රමාදවීම් සිදුවී තිබුණද හේතු සහගතව සාධාරණව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමෙන් අවසානයේදී ගණන්දීමේ වගකීම බොහෝදුරකට ඉහළ නැංවී තිබුණි.

මෙම විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන්වල විශාල ආයෝජනයන් පිළිබඳව සැලකීමේදී, ස්වකීය ආදේශ කිරීම්, ව්‍යාප්ත කිරීම් හා වර්ධනයන් සඳහා ප්‍රමාණවත් අතිරික්තයක් ඔවුන් විසින් උත්පාදනය කර ගැනීම අපේක්ෂා කරනු ලැබේ. ව්‍යාපාර හා වානිජමය ක්ෂේත්‍රයන්හි මෙහෙයුම් සිදුකරන රාජ්‍ය ව්‍යවසායන් පුළුල් කිරීම සඳහා ස්වයං මූල්‍යයනය විශේෂිත වගකීමක් ලෙස සිදුකර ගත යුතුය. ඔවුන්ගේ

පිරිවැය ආවරණය කර ගැනීම සඳහා පමණක් නොව ආයතනයේ මූල්‍ය සංවර්ධන සැලැසුම් සඳහා අතිරික්තයක්ද උත්පාදනය කර ගත යුතුය.

විගණනයට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද එම ව්‍යවසායන් 45 ක ඉකුත් වර්ෂය අවසානයට ශුද්ධ වත්කම් රු.මිලියන 898,188 ට සාපේක්ෂව 2015 වර්ෂය අවසානයට ශුද්ධ වත්කම් එකතුව රු.මිලියන 1,039,446 ක් විය.

අහිතකර ශුද්ධ වත්කම් තත්ත්වය

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ආරම්භයේදී ලාභ පෙන්වා තිබුණද, මෑත කාලයේදී දිගින් දිගටම මෙම ව්‍යවසාය පාඩු පෙන්වා තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට සමුච්චිත පාඩු එකතුව සීඝ්‍රයෙන් වැඩිවී තිබුණු අතර මෙම තත්ත්වය මෙම ව්‍යාපාරයෙහි ශුද්ධ වත්කම් තත්ත්වයට අහිතකරව බලපා තිබුණි. ඉකුත් වර්ෂයේ රු.මිලියන 232,256 ක් වූ සෘණාත්මක ශුද්ධ වත්කම් අගය එකතුව සමඟ සැසඳීමේදී 2015 වර්ෂය අවසානයට එය රු.මිලියන 229,152 ක් විය. මෙම ව්‍යාපාරයෙහි ජංගම වගකීම් එහි ජංගම වත්කම් රු.මිලියන 295,113 කින් ඉක්මවා තිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය. ජංගම වත්කම් හා ජංගම වගකීම් අතර වූ අහිතකර වෙනස දීර්ඝ කාලයක සිට පැවත එමින් තිබුණි. ජංගම වත්කම් මගින් ජංගම වගකීම් පියවීමේ නොහැකියාව අවිනිශ්චිත තත්ත්වයක් පෙන්නුම් කරන අතර මෙම ව්‍යාපාරය විශාල මූල්‍ය අර්බුදයකට මුහුණ දෙන අතරම මහා භාණ්ඩාගාරයේ සහාය නොමැතිව අඛණ්ඩ පැවැත්ම පිළිබඳව සැකයක්ද පවතී.

මූල්‍ය කාර්යසාධනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙම ආයතන 45 හි වැඩ කටයුතුවලින් වූ ප්‍රතිඵලය එකතුව රු.මිලියන 71,221 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභයේ එකතුව රු.මිලියන 70,744 ක් වුයෙන් රු.මිලියන 477 කින් ලාභයේ වැඩිවීමක් දැක්වුණි. 2015 වර්ෂයේදී මෙම ආයතනවල මූල්‍ය කාර්යසාධනයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණේ ලංකා විදුලි බල මණ්ඩලය විසින් රු.මිලියන 19,876 ක් වූ ලාභයක් ඉපැයීමයි. 2015 වර්ෂයේදී එම ආයතන 45 අතරින් ආයතන 14 ක් රු.මිලියන 39,834 ක පාඩු ලබා තිබුණු අතර ආයතන 31 ක් රු.මිලියන 111,105 ක ලාභ උපයා තිබුණි. ලංකා විදුලි බල මණ්ඩලය හා ජනතා වතු සංවර්ධන මණ්ඩලය යන ආයතන 2 විසින් පසුගිය වර්ෂ 4 ක කාලයක් සඳහා අඛණ්ඩව පාඩු ලබා තිබුණි. මේ අතර ලංකා විදුලි බල මණ්ඩලය ඉකුත් වර්ෂයේ ලබා තිබුණු රු.මිලියන 15,003 ක පාඩුව සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 19,876 ක ලාභයක් ඉපැයීම් මගින් 2015 වර්ෂය සඳහා එහි මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයක් දැක්වීමට හැකිවී තිබුණි. ලංකා ඛණිජ තෙල් සංස්ථාවේ ඉකුත් වර්ෂයේ රු.මිලියන 1,129 ක්වූ ලාභය සමාලෝචිත වර්ෂය වන විට රු.මිලියන 20,176 ක අලාභයක් බවට පත්වී තිබුණි. ආයතන 18 ක් පමණක් තම ලාභය වර්ධනය කර ගැනීමට හෝ පසුගිය වර්ෂයේ පාඩුවට එරෙහිව ලාභ උපයා ගැනීමට සමත්වී තිබුණි. ආයතන 22 ක ලාභ ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී රු.මිලියන 47,501 කින් පිරිහී තිබුණි.

ප්‍රතිලාභ අනුපාතිකය මගින් පෙන්වා ඇති පරිදි විශේෂිත ව්‍යාපාර රාජ්‍ය ව්‍යවසායන් අතර කාර්යසාධනයේ විශාල විචලනයක් දැකිය හැක.

රාජ්‍ය ව්‍යවසායන්හි මුළු වත්කම් මත ප්‍රාග්ධන යෙදවුම් ප්‍රතිලාභය (Roce) 2014 වර්ෂයේ සියයට - 33 ක සිට සියයට 125 ක් දක්වා වූ පරාසය සමඟ සැසඳීමේදී 2015 වර්ෂයේ සියයට 78 ක සිට සියයට 136 ක් දක්වා වූ පරාසයකට විචලනය වී තිබුණි. 2015 වර්ෂය සඳහා සාමාන්‍ය වාර්ෂික ප්‍රාග්ධන යෙදවුම් මත ප්‍රතිලාභය සියයට 1.46 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ සියයට 1.38 සමඟ සැසඳීමේදී 2015 වර්ෂයේ වර්ධනයක් පෙන්නුම් කර තිබුණි.

මෙම රාජ්‍ය ව්‍යවසායන්හි අති විශාල ආයෝජනයන් සැලකීමේදී ස්වකීය ආදේශ කිරීම්, ව්‍යාප්ත කිරීම් හා වර්ධනයන් සඳහා මෙන්ම ඉදිරි සංවර්ධනයන් සඳහා ඔවුන් විසින් ප්‍රමාණවත් අතිරික්තයක් උත්පාදනය කිරීම අත්‍යවශ්‍ය වේ. පුළුල් කිරීම් සඳහා ස්වයං මූල්‍යායනය, ව්‍යාපාර හා වාණිජ ක්ෂේත්‍රයන්හි මෙහෙයුම් කෙරෙන රාජ්‍ය ව්‍යවසායන් පිළිබඳ විශේෂිත වගකීමක් සිදු කළ යුතුය. එවැනි ව්‍යවසායන් ඔවුන්ගේ පිරිවැය ආවරණය කිරීම පමණක් නොව රටේ මූල්‍ය සංවර්ධන සැලැසුම් සඳහා අතිරික්තයක්ද උත්පාදනය කළ යුතුය.

විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන්හි පාඩු හා දුර්වල කාර්යසාධනයට පහත කරුණුද ඇතුළත්ව විවිධ හේතූන් බලපා තිබුණි.

- භාණ්ඩාගාරයේ අධීක්ෂණය ප්‍රමාණවත් නොවීම.
- සේවක අතිරික්තය, ඉහළ පොදු කාර්ය වියදම් හා අඩු ඵලදායීතාවය.
- පැහැදිලි ගණන්දීමේ වගකීම හා කාර්යසාධන ඇගයීම් නොමැති විම.
- අයහපත් වාණිජ පරිචයන්.
- මිල පිළිබඳ රජයේ පාලනයන්.
- රජයේ ඉල්ලීම මත වාණිජමය නොවන කටයුතු ක්‍රියාවේ යෙදවිම.
- අදාළ නොවන පහසුකම්, පිරියත හා උපකරණවල දුර්වල තත්ත්වය.
- පුහුණු කාර්ය මණ්ඩලය නොමැතිවිම හා ඉහළ සේවක පිරිවැටුම
- සාර්ථක හා අසමත්වීමේ පුද්ගල ප්‍රතිඵල නොමැතිවීම (සේවක පෙළඹවීම)

රජය සතු සීමිත වගකීම් සමාගම්

රාජ්‍ය ව්‍යවසායන් ලෙස රජය සතු සීමිත වගකීම් සමාගම් කිහිපයක් රටේ පවතී. එම සමාගම්වල කොටස්වලින් වැඩි ප්‍රමාණයක් රජය (මහා භාණ්ඩාගාරය) සතු වේ. මෙම සමාගම්, සමාගම් පනත යටතේ ස්ථාපිත කර තිබූ අතර සමහර විට මෙම සමාගම් සම්පූර්ණයෙන් රජය සතුවන හෝ රාජ්‍ය පුද්ගලික බද්ධ ව්‍යාපාර ලෙස ක්‍රියාත්මක වන කොටස් ප්‍රාග්ධනයෙන් යම් ප්‍රතිශතයක් රජය සතුවන සමාගම් වේ. සම්පූර්ණයෙන්ම රජය සතු ව්‍යවසායන් කෙරෙහි වන බොහෝ ගැටළු වළක්වා ගැනීමට පුද්ගලික අංශයේ මැදිහත්වීම පාලන යාන්ත්‍රණයක් ලෙස ක්‍රියා කරයි. මහා භාණ්ඩාගාරයේ මැදිහත් වීමක් නොමැතිව අදාළ පුද්ගලික ව්‍යවසායන් මගින් ප්‍රාග්ධනය යොදවන පරිපාලිත හෝ ආශ්‍රිත සමාගම් ලෙස රාජ්‍ය ව්‍යවසායන් මගින් ඇති කරන ලද හා සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද රජය සතු සමාගම්ද පවතී.

රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ පරීක්ෂාව සඳහා සමහර සමාගම් කැඳවූ අවස්ථාවලදී එම සමාගම් විසින් පෙනී සිටීම ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවන්ද විය. රජය මගින් සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් හෝ එසේ නොමැති නම් ඍජුව හෝ වක්‍රව රාජ්‍ය සම්පත් සපයමින් ඕනෑම ලිඛිත නීතියක් යටතේ ඕනෑම කෙනෙකුට හෝ ස්ථාපනය කරන ලද අධිකාරියක් ආවරණය කිරීම සඳහා කෙටුම්පත් විගණන පනතට දැනටමත්

සංශෝධන යෝජනා කර තිබූ බව නිරීක්ෂණය විය. මෑත කාලයේදී සමහර රාජ්‍ය ව්‍යවසායන් හා විශ්වවිද්‍යාල විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමෙන් තොරව පවා සමාගම් පනත යටතේ සීමිත වගකීම් සමාගම් විශාල ප්‍රමාණයක් සංස්ථාපනය කර තිබූ බව නිරීක්ෂණය විය.

කොටස්වලින් සියයට 100 ක්ම රජය හෝ රාජ්‍ය ව්‍යවසායක් සතුවන සීමිත වගකීම් සමාගම්වල අධ්‍යක්ෂවරු පත්කිරීමේ බලය රජය සතුවන අතර කිසිදු පුද්ගලික තැනැත්තෙකුට ලාභයෙන් කොටසක් ලැබිය නොහැකිය. එය සැබැවින්ම රාජ්‍ය සංස්ථාවක් වශයෙන් රජය විසින් සරල කොටස් විකිණීමක් මගින් සාමාන්‍ය "පුද්ගලික අංශයේ" සමාගමකට පරිවර්තනය කිරීම ප්‍රමාණවත්වීම හා සමාන වේ. කොටස්වලින් සියයට 50කට අඩු ප්‍රමාණයක් විකිණීමේදී ද සමාගම් අධ්‍යක්ෂවරු පත් කිරීමේ බලය රජය සතුවේ. කොටස්වලින් සියයට 50 කට වැඩි ප්‍රමාණයක් විකිණීමේදීද රජය ආයතනික ප්‍රතිපත්තියට බලපෑම් කිරීමට හැකි වන ප්‍රමාණවත් බලවත් තත්ත්වයක ඇත. කෙසේ වුවද බොහෝ රාජ්‍ය සංස්ථා විසින් පරිපාලනයන්හි අධ්‍යක්ෂ මණ්ඩලයේ බහුතරය ඔවුන්ගේ සාමාජිකයන්ගෙන් සමන්විත වුවද ඔවුන්ගේ පාලන බලතල පරිපාලනයන් සඳහා පවත්වාගෙන නොයන බව නිරීක්ෂණය විය.

ලාභ මූලික නොවන අනෙකුත් රාජ්‍ය ව්‍යවසායන්

මෙම ව්‍යවසායන් නියාමන හා අධීක්ෂණ ආයතන, විශ්වවිද්‍යාල, පර්යේෂණ හා අනෙකුත් පුහුණු ආයතන හා වෙනත් සංවර්ධන හා ලාභ මූලික නොවන ආයතනයන්ගෙන් සමන්විත වන අතර ආයතනවල ප්‍රධාන ලක්ෂණය නම් වාර්ෂික රජයේ ප්‍රදාන හෝ සමහර භාණ්ඩ හා සේවා මත රජය පනවන ලද බදු එම ආයතනවල ප්‍රධාන ආදායම් ප්‍රභවය වීමයි.මෙම ආයතන 138 ක මූල්‍ය ප්‍රකාශන අනුව, මහා භාණ්ඩාගාරය විසින් 2015 වර්ෂයේදී ලබා දෙන ලද රු.මිලියන 44,052 ක පුනරාවර්තන ප්‍රදාන සැලකිල්ලට ගැනීමෙන් පසු එකතුව රු.මිලියන 5,998 ක්වූ වියදමට වැඩි අතිරික්ත උපයා තිබුණි. කෙසේ වුවද මහා භාණ්ඩාගාරයෙන් සපයන ලද පුනරාවර්තන ප්‍රදාන සැලකිල්ලට ගැනීමෙන් පසුවත් ආයතන 46 ක් එකතුව රු.මිලියන 2,566 ක ශුද්ධ ඌනතාවයන් දරා තිබුණි. එය ඉකුත් වර්ෂයේ ආයතන 52 ක එකතුව රු.මිලියන 6,873 ක ශුද්ධ ඌනතාවය සමග සැසඳීමේදී ශුද්ධ ඌනතාවයන්හි රු.මිලියන 4,307 ක සැලකිය යුතු අඩුවීමක් දැක්වුණි.

පළාත් පාලනය

ශ්‍රී ලංකාවේ ස්ථාපනය කර ඇති පළාත් පාලන ආයතන 335 න් මහා නගර සභා 23 ක් මහා නගර සභා ආඥා පනතේ (පරි.252) විධිවිධාන මගින්ද, නගර සභා 41 ක් නගර සභා ආඥා පනතේ (පරි.255) විධිවිධාන මගින්ද, ප්‍රාදේශීය සභා 271 ක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන මගින්ද පිහිටුවා ක්‍රියාත්මක වෙමින් පවතින අතර, මෙම පළාත් පාලන ආයතනයන්ගේ 2015 වර්ෂයේ ගිණුම් විගණනයට ඉදිරිපත් කිරීම හා එම ගිණුම් පිළිබඳ විගණන මතයන් පිළිබඳ සාරාංශයක් පහත වගුව 09 හි දැක්වේ.

පළාත් පාලන ආයතන වර්ගය	ගිණුම් ඉදිරිපත් කළයුතු සභා ගණන	2016 සැප්. 30 දිනට ගිණුම් ඉදිරිපත් කළ සභා ගණන	විගණන වාර්තා නිකුත් කළ සභා ගණන	2016 සැප්තැම්බර් 30 දිනට නිකුත් කර ඇති වාර්තා අනුව විගණන මතය			
				තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ	මතය ව්‍යාවනය	අහිතකර මතය
මහා නගර සභා	23	21	18	17	-	-	01
නගර සභා	41	39	36	34	-	01	01
ප්‍රාදේශීය සභා	271	258	238	230	01	01	06
එකතුව	335	318	292	281	01	02	08

වගුව 09 - පළාත් පාලන ආයතනවල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම හා විගණන මතයන්

සෑම වර්ෂයකදීම විගණනයේදී අනාවරණය වූ අඩුපාඩු අදාල බලධාරීන්ගේ අවධානයට යොමු කරන ලද නමුත් එම අඩුපාඩු නිවැරදි කර ගැනීමට පියවර නොගැනීම නිසා ඒවා දිගින් දිගටම වාර්තා කිරීමට සිදුවී තිබුණි. පළාත් පාලන ආයතනවලට ආධාර සපයන සංවිධාන විසින් ආධාර සැපයීමේදී විගණන වාර්තාවලින් පෙන්වාදෙන අඩුපාඩු නිවැරදි කිරීමෙන් පසුව ආධාර ලබාදෙන බවට කර ඇති දැනුම්දීම නිසා එම ආධාර ලබාගැනීම සඳහා විගණන වාර්තාවලින් පෙන්වාදී ඇති අඩුපාඩු නිවැරදි කර ඇති බවට නිරවුල් කිරීමේ සහතිකයක් පළාත් පාලන බලධාරීන් විසින් ඉල්ලුම් කර තිබූ අවස්ථාවන් විය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වන සංශෝධනයේ නව වන උපලේඛනයේ 4.2 වගන්තියේ විධිවිධාන අනුව පළාත් පාලන ආයතනයන්ගේ අධීක්ෂණය පළාත් සභාව වෙත පැවරී තිබුණද, පළාත් පාලන බලමණ්ඩල අධීක්ෂණය සඳහා විධිමත් වැඩපිළිවෙලක් පළාත් සභා ක්‍රියාත්මක කර නොතිබුණි.

පළාත් පාලන බලමණ්ඩල මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන වාර්තාවලින් අනාවරණය කර ඇති වැදගත් නිරීක්ෂණ කීපයක් සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

- කොළඹ මහා නගර සභාවේ ආදායම් එකතු කිරීම වෙනුවෙන් කාර්යක්ෂම වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නොකිරීම සහ වියදම් කළමනාකරණය නිසි පරිදි සිදු නොකිරීමෙන් සභාවේ බැංකු ගිණුමක 2011 දෙසැම්බර් 31 දිනට පැවති රු.මිලියන 742.9 ක් වූ අයිරා ශේෂය අඛණ්ඩව වර්ධනය වෙමින් තිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට එය රු.මිලියන 1,231.05 ක් වූ අතර ඒ සඳහා 2015 වර්ෂය තුළදී ගෙවා තිබූ අයිරා පොළිය රු.මිලියන 70.5 ක් විය.

- කොළඹ මහා නගර සභාව විසින් දේශීය ආදායම් බදු පනත යටතේ එකතු කරන ලද රු.මිලියන 25.9 ක බදු මුදල් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය නොකර වර්ෂ 5 කට වැඩි කාලයක සිට තැන්පතු ගිණුමක රඳවා ගෙන තිබුණි.

- 1988 සැප්තැම්බර් 20 දිනැති අංක 08 දරන නාගරික සංවර්ධන අධිකාරියේ චක්‍රලේඛය ප්‍රකාරව නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් බැංකු ගිණුමක් පවත්වාගෙන යායුතු අතර ගිණුමේ ප්‍රමාණවත් මුදලක් එකතු වූ විට පළාත් පාලන ආයතනය විසින් හඳුනාගත් ව්‍යාපෘතියක් සඳහා ශක්‍යතා වාර්තාවක් සමඟ මුදල් ආපසු ලබාගැනීම සඳහා අනුමැතිය ලබාගෙන සභාවට අවශ්‍ය ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළහැකි බව දක්වා තිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට කොළඹ මහා නගර සභාව නමින් පවත්නා රාජ්‍ය නියෝජ්‍ය ව්‍යාපෘති ගිණුමේ රු. මිලියන 650.42 ක් වූ ශේෂයක් ද කොට්ටාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව නමින් පවත්නා ජංගම ගිණුමක රු. මිලියන 1.95 ක් වූ ශේෂයක්ද තිබූ නමුත් ඒවා ඵලදායී ව්‍යාපෘතියකට යොදවාගෙන නොතිබුණි.

- කොළඹ මහා නගර සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ වරිපනම් බදු ශේෂය රු.මිලියන 2,596.9 ක් වූ අතර, එම ශේෂය තුළ රු. ලක්ෂ 5 ඉක්මවූ දේපළ 647 ක හිඟ ශේෂය රු. මිලියන 1,302.2 ක් විය.

- කොළඹ මහා නගර සභාව සතු ලැන්ඩ් ලෝවර් ජීප් රථයක් රු. මිලියන 2.17 ක මුදලක් වැය කර 2012 වර්ෂයේදී අලුත්වැඩියා කර තිබූ නමුත් එම වාහනය 2015 දෙසැම්බර් මාසය දක්වාම කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ගාල් කර ඇති බව නිරීක්ෂණය විය.

- කඩුවෙල මහා නගර සභාවට අයත් අතුරුගිරිය මෙගාසිටි සාප්පු සංකීර්ණයේ කඩ කාමර 54 ක් සඳහා 2013 වර්ෂයේදී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සිදුකළ තක්සේරුව නොසළකා, 2015 ජූලි 23 දිනැති මහා සභා තීරණ අනුව අඩු වටිනාකම් සහිත මාසික කුලියක් අයකිරීම නිසා 2015 වර්ෂය තුළ සභාවට අහිමි වූ ආදායම දළ වශයෙන් රු.මිලියන 1.4 ක් වී තිබුණි.

- නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිර්මාණය කරන ලද 2013 වර්ෂයේදී සභාව වෙත භාරදීමට නියමිත වූ පිරිවැය රු. මිලියන 3.44 ක් වූ භූගෝලීය තොරතුරු පද්ධතිය 2015 වර්ෂයේදී කඩුවෙල මහා නගර සභාව වෙත බාරදී තිබූ නමුත් එහි ඇතුළත් තොරතුරු යාවත්කාලීන කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

- ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව විසින් කම්පැක්ටර් වාහන විකිණීම් සිදු නොකරන අතරමැදි ආයතනයකින් එකක් රු. මිලියන 10.50 ක් බැගින් කම්පැක්ටර් 06 ක් මිලට ගැනීම සඳහා රු.මිලියන 63.00 ක් ගෙවා තිබුණි. ලංකා අශෝක් ලේලන්ඩ් ආයතනයෙන් මෙකී කම්පැක්ටරයක් රු. මිලියන 6.70 කට මිලදීගත හැකිව තිබූ බවත් ඒ අනුව කම්පැක්ටර් 06 ක් සඳහා රු.මිලියන 23.25 ක් වැඩියෙන් ගෙවා තිබූ බවත් විගණනයේදී අනාවරණය විය.

- හොරණ ප්‍රාදේශීය සභාව 2002 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලසීමාව තුළ එකතු කළ අගය මත බදු මුදල් නොගෙවීම නිසා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත 2015 ජනවාරි මාසයේදී රු. මිලියන 1.07 ක දඩ මුදලක් ගෙවා තිබුණි.

- නාඋල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ දෛනිකව එකතු කරන ටොන් 02 ක පමණ කසල ඉඩමකට ගෙන ගොස් වල දැමීමේ ක්‍රමයක් අනුගමනය කර ඇති අතර, 2006 වසරේදී එම ඉඩමෙහි කසල කළමනාකරණය සඳහා ඉදිකර තිබූ ගොඩනැගිල්ල හා සමාලෝචිත වර්ෂයේ රු.750,000 ක් වැය කර ඉදිකළ කොම්පෝස්ට් අංගනය ඒ සඳහා භාවිතා කර නොතිබුණි.

- තිරප්පනේ ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂයේදී මධ්‍යම පරිසර අධිකාරියේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ රු. මිලියන 5.57 ක් වැයකර සභා බලප්‍රදේශයේ ඉදිකර තිබුණු ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය නිසිලෙස ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් පරිසරයට හානිකර තත්ත්වයක් හා ගම්වැසියන්ගේ දෛනික ජීවන කටයුතු සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් උද්ගතවී ඇති බවට මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් විසින් 2016 අප්‍රේල් 27 දින සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය කර තිබුණි.

- තලවාකැලේ - ලිඳුල නගර සභාව ඉහළ කොත්මලේ ජලාශය තුළ විනෝදාත්මක බෝට්ටු සේවාවක් පවත්වාගෙන යාම වෙනුවෙන් බෝට්ටු මිලදීගැනීම සහ ජැටිය ඉදිකිරීම සඳහා 2013 වර්ෂයේ රු.926,900 ක වියදමක් දරා තිබූ අතර, ජලාශය භාවිත කිරීම සඳහා වාර්ෂිකව ලංකා විදුලිබල මණ්ඩලයට රු.120,000 ක මුදලක් ගෙවා තිබුණි. එහෙත් අදාළ ව්‍යාපෘති 2016 මාර්තු 15 දින වනවිටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

- 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධානවලට සහ ජනාධිපති ලේකම්ගේ 2010 පෙබරවාරි 03 දිනැති චක්‍රලේඛයේ උපදෙස්වලට පටහැනි ලෙස නුවරඑළිය ප්‍රාදේශීය සභාව අක්කර 01 රූඩ් 02 යි පර්චස් 38.6 ක් වූ ක්‍රිස්ලස් ෆාම් නම් ඉඩම මාසික කුලී පදනම මත කොටස් 37 කට අනුබෙදුම් කර බෙදාදී තිබූ අතර, සභාවේ මන්ත්‍රීවරුන් 08 දෙනෙකුට සහ නිලධාරීන් 21 දෙනෙකුටද ඉඩම් කොටස් ලබාදී තිබුණි.

- මහනුවර දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකයෙන් ලබාදුන් ප්‍රතිපාදන හා මහනුවර මහා නගර සභාවේ අරමුදල් භාවිතා කර, මහා නගර සභාව විසින් පෞද්ගලික නිවසක ආරක්ෂාව සඳහා රු.මිලියන 1.62 ක් වැයකර ආරක්ෂිත බැම්මක් ඉදිකර තිබුණි.

- තංගල්ල ප්‍රාදේශීය සභාව විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධානවලට පටහැනිව අමාත්‍යවරයාගේ ලිඛිත පූර්ව අනුමැතියකින් තොරව සභා අරමුදලින් රු.මිලියන 3.35 ක් වැයකර භාණ්ඩ මිලදී ගෙන ස්වේච්ඡා සංවිධාන 13 ක් වෙත ලබාදී තිබුණි.

විදේශීය ආධාර ව්‍යාපෘති

මුදල් අමාත්‍යාංශයේ 2015 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව අනුව, රාජ්‍ය ණය ගැනීමේ වැඩ සටහන යටතේ සමාලෝචිත වර්ෂයේදී දේශීය මූලාශ්‍රවලින් රු.බිලියන 1,188 ක ණය ප්‍රමාණයක් ලබාගෙන තිබුණු අතර රු.බිලියන 556 ක් විදේශීය මූලාශ්‍ර වලින් ලබාගෙන තිබුණි. විදේශීය මූලාශ්‍රවලින් ලබාගත් ණය අතුරින් රු.බිලියන 298 ක් ස්වෛරීයත්ව බැඳුම්කර නිකුත් කිරීම මඟින් ලබාගෙන තිබුණු අතර විදේශ ආධාර ව්‍යාපෘති හා වැඩ සටහන් ණය වශයෙන් රු.බිලියන 258 ක් ලබාගෙන තිබුණි.

2015 වර්ෂයේදී විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන් සහ ණය දෙන නියෝජිත ආයතන සමඟ නව ණය ගිවිසුම් 23 කට එළඹ තිබුණු අතර එමඟින් ඉදිරි වර්ෂවලදී එ.ජ ඩොලර් මිලියන 1,268 ක් ලබාගැනීමට නියමිතව තිබුණි. ඊට අමතරව, ප්‍රදාන ආධාර ගිවිසුම් 10 ක් මගින් එ.ජ ඩොලර් මිලියන 65 ක් ඉදිරි වර්ෂවලදී ලබා ගැනීමට නියමිතව තිබුණි. මෙම ණය හා ආධාර අතුරින් සියයට 36 ක් මහා මාර්ග හා පාලම් සංවර්ධනය වෙනුවෙන්ද, සියයට 19 ක් විදුලිය හා බල ශක්ති ක්ෂේත්‍රයේ සංවර්ධනය වෙනුවෙන් සහ සියයට 12 ක් ජල සම්පාදනය හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ආයෝජනය කිරීමට නියමිතව තිබුණි.

විදේශ ණය සහ ප්‍රදාන උපයෝජනය

2015 වර්ෂයේදී විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන්ගෙන් හා ණය දෙන නියෝජිත ආයතන මඟින් සංවර්ධන ව්‍යාපෘති හා වැඩ සටහන් හරහා ලැබී තිබුණු එ.ජ. ඩොලර් මිලියන 1,441 ක ණය සහ එ.ජ. ඩොලර් මිලියන 74 ක ප්‍රදාන ආධාර උපයෝජනය කර තිබුණි. කෙසේ වෙතත්, 2014 වර්ෂයේදී උපයෝජනය කර තිබුණු එ.ජ ඩොලර් මිලියන 1,694 ක් වූ ණය මුදල් සහ එ.ජ ඩොලර් මිලියන 155 ක ප්‍රදාන ආධාර සමඟ සසඳා බැලීමේදී සමාලෝචිත වර්ෂයේදී ණය උපයෝජනය පහත වැටී තිබුණු බව නිරීක්ෂණය විය.

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ විගණන නිරීක්ෂණ

ලැබී තිබුණු තොරතුරු අනුව 2015 වර්ෂයේදී ණය සහ ප්‍රදාන ආධාර ව්‍යාපෘති 172 ක් සඳහා එ.ජ. ඩොලර් මිලියන 1,515.2 ක් ලැබී තිබුණු අතර ඒ අතරින් 2016 ජූනි 30 දින වන විට එ.ජ. ඩොලර් මිලියන 1,043.3 ක් සඳහා වූ ණය හා ප්‍රදාන ආධාර ව්‍යාපෘති 104 ක මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් විස්තර පහත 10 වගුවෙහි හා රූප සටහන 09 හි දැක්වේ.

විදේශ සංවර්ධන පාර්ශ්වකරු/ ණය දෙන නියෝජිත ආයතනය	ණය හා ප්‍රදාන ආධාර ලබාදුන් ව්‍යාපෘති ගණන	මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති ගණන
ආසියානු සංවර්ධන බැංකුව	35	26
ලෝක බැංකුව	26	25
ජපානය	21	13
කොරියාව	14	03
චීනය	15	09
එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන	08	06
කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ අන්තර් ජාතික අරමුදල	05	04
කුවෙට්	04	03
ප්‍රංශය	03	01
වෙනත්	41	14
එකතුව	**172**	**104**

වගුව 10. - ණය හා ප්‍රදාන ලබාගත් ව්‍යාපෘති ගණන හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

මූලාශ්‍රය - ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රකාශන හා මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව 2015



රූප සටහන 09. විදේශ ව්‍යාපාති විගණනය
මූලාශ්‍රය : ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රකාශන හා මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව 2015

2016 ජූනි 30 දින වන විට විගණන වාර්තා නිකුත් කර තිබුණු ණය හා ආධාර ප්‍රදාන ව්‍යාපෘති සම්බන්ධයෙන් වූ ප්‍රධාන නිරීක්ෂණ කිහිපයක් සාරාංශ ගත කර පහත දැක්වේ.

- චීන ආනයන හා අපනයන බැංකුව මඟින් සපයන ලද එ.ජ.ඩොලර් මිලියන 86.11 සමාන වූ රු.මිලියන 9,887 ක ණය ආධාර මත ක්‍රියාත්මක වූ පුත්තලම - මරිච්චිකට්ටි - මන්නාරම මාර්ගයේ කිලෝ මීටර් 115 ක දුරක් සංවර්ධනය කිරීම සඳහා වූ ව්‍යාපෘතිය යටතේ වූ එලුවන්කුලම - මරිච්චිකට්ටි දක්වා වූ කිලෝ මීටර් 36 ක කොටස සංවර්ධනය කිරීම, බාහිර පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරන ලද මූලික අයිතිවාසිකම් නඩුවක තීරණය මත පසුව අත හැර තිබුණි. නිසි පරිසර අධ්‍යයනයක් සිදු නොකර ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කිරීම හේතුවෙන් විල්පත්තු අභය භූමියට සිදුවන පාරසරික බලපෑම පදනම් කර ගෙන මූලික අයිතිවාසිකම් නඩුව පවරා තිබුණි.

- ආසියානු සංවර්ධන බැංකුවේ සහ ප්‍රංශ රජයේ ණය ආධාර මත ක්‍රියාත්මක වූ යාපනය - කිලිනොච්චි ජල සම්පාදන සහ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ඉරනමඩු ජලාශය ජල මූලාශ්‍රයක් ලෙස භාවිතා කිරීමට එරෙහිව එම ප්‍රදේශයේ ජනතාව විසින් දක්වන ලද විරෝධය හේතුවෙන් ව්‍යාපෘතිය යෝජිත පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ජනතාව දැනුවත් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය සඳහා සලසා තිබුණු එ.ජ.ඩොලර් මිලියන 142.32 කට සමාන රු.මිලියන 16,460 අරමුදලින් 2015 දෙසැම්බර් 31 දින වන විට එ.ජ.ඩොලර් මිලියන 12.59 කට සමාන රු.මිලියන 1,596 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

- ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ සහ මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු සංවර්ධනය හා වැඩිදියුණු කිරීමේ අරමුණින් ඒකාබද්ධ ජාතික සංවර්ධන තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන යටතේ ලැබී තිබුණු එ.ජ.ඩො. මිලියන 2.16 කට සමාන රු.මිලියන 20.97 කින් 2015 වර්ෂය අවසානය වන විට එ.ජ.ඩොලර් 72,422 කට සමාන රු.මිලියන 9.64 ක් පමණක් උපයෝජනය කර තිබුණි. අදාළ තොරතුරු පද්ධතිය පිළිබඳ ගැඹුරු අධ්‍යයනයන් සිදුකිරීම දුෂ්කරවීම හේතුවෙන් මෙම කාර්යය ප්‍රමාද වූ බව ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා දන්වා තිබුණි.

- ආසියානු සංවර්ධන බැංකුව විසින් ප්‍රතිපාදනය කරන ලද එ.ජ.ඩොලර් මිලියන 40.8 සමාන රු.මිලියන 5,344 ක ණය ආධාර මත ක්‍රියාත්මක වූ මූල්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වූ ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතියක් පිහිටුවීමේ වැඩ කටයුතු ඒ පිළිබඳව නිසි අධ්‍යයනයන් සිදුනොකිරීම හේතුවෙන් ප්‍රමාද වී තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී වර්ෂ පහකට පසුව 2015 දෙසැම්බර් 31 දින වන විට එ.ජ.ඩොලර් මිලියන 8.8 කට සමාන රු.මිලියන 1,140 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

- ආසියානු සංවර්ධන බැංකුවේ ණය ආධාර මත, මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් ක්රියාත්මක කර තිබුණු ජාතික මාර්ග අංශ ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 5,360 ක පිරිවැයකින් මහනුවර - මහියංගනය - පදියතලාව මාර්ගයේ කිලෝ මීටර් 46 ක දුරක්වූ උඩතැන්න මහියංගනය කොටස 2013 වර්ෂය අවසාන වන විට සම්පූර්ණ කර තිබුණු නමුත් ප්‍රමාණවත් පරිදි පරිසර ආරක්ෂණ විධික්‍රම අනුව මාර්ගය සැලැසුම් නොකිරීම හේතුවෙන් පසු කාලීන කඳු කඩා වැටීම් වැනි ව්‍යසනයන් ඇතිවී තිබුණි. මෙම බලපෑම් ආවරණය කිරීම සඳහා ලෝක බැංකුවේ ණය ආධාර මත 2014 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලද දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය මඟින් නැවත රු.මිලියන 648 ක ප්‍රතිපාදන සලසා තිබුණි. මේ අනුව අදාල විදේශ ආධාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතනය මඟින් තිරසාර සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කර නොතිබුණු බව පැහැදිළි විය.

ඉහත සඳහන් නිරීක්ෂණවලට අමතර විදේශ ව්‍යාපෘති විගණනයේදී අනාවරණය වූ පොදු

අඩුපාඩු කිහිපයක් සාරාංශ ගත කර පහත දැක්වේ.

- 2015 වර්ෂයේදී ව්‍යාපෘති කාලය අවසාන වූ ව්‍යාපෘති විශාල සංඛ්‍යාවක් පැවති අතර ඒවා සම්බන්ධයෙන් අඛණ්ඩ පැවැත්ම සංකල්පය පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර තිබුණි. මුදල් අමාත්‍යාංශය විසින් කාලය අවසාන වූ ව්‍යාපෘතින් සම්බන්ධයෙන් ව්‍යාපෘතියේ අවසාන මූල්‍ය වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු ආකාරය සම්බන්ධයෙන් විධිමත් උපදෙස් සපයා නොතිබීම හේතුවෙන් ව්‍යාපෘති වසා දැමීමේ පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

- ජාතික ආර්ථිකයේ වර්ධනය කෙරෙහි ප්‍රමාණවත් දායකත්වයක් සැපයෙන පරිදි සැලැසුම් කරන ලද විශාල පරිමාණයේ ව්‍යාපෘති රාශියක භෞතික හා අරමුදල් උපයෝජනය සතුටුදායක නොවූ බව විගණනයේදී නිරීක්ෂණය විය. මේ හේතුවෙන් එම ව්‍යාපෘතිවල කටයුතු ප්‍රතිව්‍යුහගත කිරීමට, අවලංගු කිරීමට හෝ ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කිරීමට ඉඩකඩ පවතින බවද නිරීක්ෂණය විය. ව්‍යාපෘති කාලය අනවශ්‍ය ලෙස දීර්ඝ කිරීම හේතුවෙන් එම ව්‍යාපෘතිවල මූල්‍ය සැලැසුම් අසාර්ථක වන අතර ණය උපයෝජනය දුර්වලවීමෙන් ණය සපයනු ලබන නියෝජිත ආයතන වෙත අමතර පොලී මුදල් ගෙවීමට සිදුවීම හේතුවෙන් ණය කළමනාකරණය පිරිවැය ඉහළ යන බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. භෞතික ප්‍රගතිය සහ ණය උපයෝජනය පිළිබඳ ප්‍රගතිය දුර්වලවූ ව්‍යාපෘති කිහිපයක් සම්බන්ධ තොරතුරු වගුව 11 හි දැක්වේ.

ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘතිය යටතේ වෙන්කළ මුදල රු.බිලියන	2015 දෙසැම්බර් 31 දිනට ණය උපයෝජන ප්‍රගතිය (සියයට)	ව්‍යාපෘතියේ කටයුතු අවසාන වීමට ඉතිරිව තිබෙන කාලය- මාස
අධ්‍යාපන අංශ සංවර්ධන ව්‍යාපෘතිය	200	27.0	32
දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය 3027 (එස්.ආර්.පී.)	1,002	6.7	03
දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය 3028 (එස්.ආර්.පී.)	6.8	24.0	06
මහ කොළඹ අප ජල කළමනාකරණ ව්‍යාපෘතිය	109.12	39.0	30
වියලි කලාපීය නාගරික ජල සහ සනීපාරක්ෂක පහසුකම් ව්‍යාපෘතිය	103.33	51.3	06
මහ කොළඹ ජල සහ අප ජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	112.00	22.2	12
වේලි ආරක්ෂණ සහ ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතිය	82.50	17.8	30

වගුව 11. - ව්‍යාපෘති කිහිපයක භෞතික ප්‍රගතිය හා ණය උපයෝජනය

- 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ විධිවිධාන පරිදි ව්‍යාපෘති කාර්ය මණ්ඩලය විධිමත් පරිදි අයදුම්පත් කැඳවා වර්ෂ තුනක කොන්ත්‍රාත් කාලයක් සඳහා පත් කළ යුතු වුවත්, ඊට පටහැනිව මාර්ග සංවර්ධන අධිකාරියේ සහ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ නිලධාරීන් ව්‍යාපෘති සඳහා බඳවා ගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

රාජ්‍ය බැංකු

ශ්‍රී ලංකාවේ රාජ්‍ය බැංකු අංශය ලංකා බැංකුව හා මහජන බැංකුව යන ප්‍රධාන බලපත්‍රලාභී වාණිජ බැංකු දෙක ඇතුළත්ව බැංකු 8 කින් සමන්විත වේ. ජාතික ඉතිරිකිරීමේ බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව, ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව හා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව යන බැංකු 6 අනෙකුත් විශේෂිත රාජ්‍ය බැංකු වේ.

රාජ්‍ය බැංකු පිළිබඳ කාර්යසාධනය

ලංකා බැංකුව

2014 වර්ෂයේ රු.මිලියන 38,450ක සිට 2015 වර්ෂයේදී රු.මිලියන 47,739ක් දක්වා ශුද්ධ පොලී ආදායම වර්ධනය වීමත් සමඟ බැංකුවේ ශුද්ධ පොලී ආදායම සියයට 24.16 කින් ඉහළ ගිය අතර 2014 වර්ෂයේ වූ රු.මිලියන 20,291කට සාපේක්ෂව 2015 වර්ෂයේදී රු.මිලියන 25,279 ක බදු පෙර ශුද්ධ ලාභයක් වාර්තා කර තිබුණි. ලාභදායීත්වය ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස බැංකුවේ සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය හා සාමාන්‍ය ස්කන්ධය මත ප්‍රතිලාභ අනුපාතයද 2015 වර්ෂයේදී ඉහළ අගයක් ගෙන තිබුණි.

ඉකුත් වර්ෂයට සාපේක්ෂව බැංකුවේ ණය හා අත්තිකාරම් 2015 වර්ෂය අවසාන වන විට සියයට 11.5 ක වර්ධනයක් වාර්තා කර තිබුණි.

2014 වර්ෂයේදී සියයට 13.6 ක් වූ බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතය (පෙළ II) 2015 වර්ෂයේදී සියයට 13.1 ක් දක්වා අඩු වී තිබුණද, එය සියයට 10 ක් වන අවම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයට වඩා ඉහළ අගයක් ගෙන තිබුණි.

බැංකුවේ අක්‍රීය ණය අනුපාතය 2014 වර්ෂයේ පැවති සියයට 3.8 ට සාපේක්ෂව 2015 වර්ෂයේදී සියයට 4.3 ක් දක්වා වැඩි වී තිබුණි. 2015 වර්ෂයේදී ලංකා බැංකුව ස්වකීය ශාඛා ජාලයට නව ශාඛා 05 ක් එක් කර තිබුණි.

මහජන බැංකුව

ශ්‍රී ලංකාවේ රජය සතු බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ලෙස රු.බිලියන 1,177 ක වත්කම් පදනම් කර ගෙන මහජන බැංකුව 2015 වර්ෂයේදී රු.බිලියන 19.5 ක බදු පෙර ලාභයක් වාර්තා කර තිබුණි. බැංකුව එහි ශාඛා ජාලය බැංකු ශාඛා 346 ක්, සේවා මධ්‍යස්ථාන 392 ක් හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව මධ්‍යස්ථාන (SME) 23 ක් සහිතව ක්‍රියාත්මකව පැවැතුණි.

බැංකුව 2015 වර්ෂයේදී රු.බිලියන 92.4 ක පොලී ආදායමක් වාර්තා කර තිබූ අතර එය ඉකුත් වර්ෂයට වඩා සියයට 9.37 ක වැඩිවීමක් විය. මහජන බැංකුවේ ශුද්ධ පොලී ආදායම 2014 වර්ෂයේ රු.බිලියන 30.12 සිට 2015 වර්ෂය සඳහා රු.බිලියන 43.67 දක්වා වර්ධනය වී ඇත.

බැංකුවේ ණය කළඹ 2015 වර්ෂයේදී සියයට 16.71 ක වර්ධනයක් වාර්තා කර තිබුණි. 2014 වර්ෂයේදී සියයට 3.2 ක් වූ බැංකුවේ අක්‍රීය ණය අනුපාතය 2015 වර්ෂය අවසානයට සියයට 2.4 දක්වා අඩු වී තිබුණි.

බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතය (පෙළ II) 2014 වර්ෂයේ සියයට 14.3ක සිට 2015 වර්ෂයේදී සියයට 12.5 ක් දක්වා පහත වැටී තිබුණද, එය අවම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය වන සියයට 10 ට වඩා ඉහළ අගයක් ගෙන තිබුණි.

ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී බැංකුවේ තැන්පතු පදනම සියයට 13.35 ක වර්ධනයක් වාර්තා කර තිබුණි.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව

ජාතික ඉතිරිකිරීමේ බැංකුව ශ්‍රී ලංකා රජය සතු ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම බලපත්‍රලාභී විශේෂිත බැංකුව වේ. තැපැල් බැංකු ඒකක 12 ක් හා ණය මධ්‍යස්ථාන 06 ක් ඇතුළත්ව ශාඛා 245 ක් සහිතව බැංකුව ක්‍රියාත්මක වේ. කුඩා ශාඛාවන් ලෙස කටයුතු කරන තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාල 4,063 ක් මඟින් තවදුරටත් බැංකු ජාලය ශක්තිමත් කර තිබුණි. බැංකුවේ වත්කම් පදනම 2015 වර්ෂය අවසානයට රු.බිලියන 848 දක්වා සියයට 9 කින් වර්ධනය වී තිබුණි. 2015 වර්ෂය අවසානයට බැංකුවේ ණය කළඹ රු.බිලියන 271.7 ක් දක්වා සියයට 22 ක වර්ධනයක් වාර්තා කර තිබුණි.

2015 වර්ෂයේදී බැංකුව රු.බිලියන 13 ක බදු පෙර ලාභයක් අත්කර ගෙන තිබූ අතර එය ඉකුත් වර්ෂයට වඩා සියයට 24.46 ක වර්ධනයක් විය. 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී බැංකුවේ ශුද්ධ පොලී ආදායම සියයට 26.2 කින් වැඩිවී තිබුණි.

2015 වර්ෂය අවසානයට බැංකුවේ තැන්පතු පදනම රු.බිලියන 595.8 ක් දක්වා සියයට 7.5 කින් වර්ධනය වී තිබුණි. බැංකුවේ අක්‍රීය ණය අනුපාතය 2014 වර්ෂයේ සියයට 7.6 ට සාපේක්ෂව 2015 වර්ෂයේදී සියයට 3.5 දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය වී තිබුණි.

බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (පෙළ II) 2014 වර්ෂයේදී සියයට 18.98 ක සිට 2015 වර්ෂයේදී සියයට 16.4 ක් දක්වා අඩු වී තිබුණද එය අවම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය වන සියයට 10 ට වඩා වැඩි වී තිබුණි.

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

නිවාස ණය පහසුකම් සැපයීමේ මූලික අරමුණ කරගෙන රජය විසින් සංස්ථාපනය කරන ලද මෙම බැංකුව කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත එකම රාජ්‍ය බැංකුව වේ. 2015 වර්ෂයේදී බැංකුවේ ණය කළඹ සියයට 14 කින් වර්ධනය වී 2015 වර්ෂය අවසාන වන විට එය රු.බිලියන 27 ක් දක්වා ළඟා වී තිබුණි. බැංකුවේ තැන්පතු පදනම 2015 වර්ෂය අවසාන වන විට රු.බිලියන 29 ක් දක්වා සියයට 16.8 කින් වැඩි වී තිබුණි. 2014 වර්ෂයේදී සියයට 22.6 ක් වූ බැංකුවේ අක්‍රීය ණය අනුපාතය 2015 වර්ෂයේ සියයට 20.8 දක්වා අඩු වි තිබුණි. බැංකුවේ ශුද්ධ පොලී ආදායම 2014 වර්ෂයේ රු.මිලියන 1,843 ට සාපේක්ෂව 2015 වර්ෂයේදී රු.මිලියන 2,121 දක්වා වර්ධනය විය. 2015 වර්ෂය සඳහා බැංකුවේ බදු පෙර ලාභය සියයට 24 ක වර්ධනයක් වාර්තා කරමින් රු.මිලියන 787 ක් වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2014 වර්ෂයේදී සියයට 13.72 ක්වූ ස්කන්ධය මත ප්‍රතිලාභ අනුපාතය 2015 වර්ෂයේදී සියයට 15.78 දක්වා වර්ධනය විය. 2015 වර්ෂයේදී නව ශාඛා 2 ක් විවෘත කිරීමත් සමඟ බැංකුවේ ශාඛා ජාලය ශාඛා 38 ක් දක්වා ව්‍යාප්ත කරන ලදී.

2014 වර්ෂයේදී සියයට 12.92 සිට බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (පෙළ II) 2015 වර්ෂයේදී සියයට 12.18 දක්වා අඩු වී තිබුණද, එය සියයට 10 ක් වන අවම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයට වඩා ඉහළ මට්ටමක පැවැතුණි.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව නිවාස හා නිවාස සම්බන්ධිත කාර්යයන් සඳහා 1931 වර්ෂයේ සිට උකස් ණය ලබාදීමේ ව්‍යාපාරයක නිරත බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි.

බැංකුවේ ශුද්ධ පොලී ආදායම 2014 වර්ෂයේ රු.මිලියන 1,419 ක සිට 2015 වර්ෂයේදී රු.මිලියන 1,822 ක් දක්වා වැඩි වී තිබුණි. ඒ අනුව බදු පූර්ව ශුද්ධ ලාභය සියයට 65 කින් වැඩි වී තිබූ අතර ණය සහ අත්තිකාරම් සියයට 10 කින් වැඩි වී තිබුණි. අක්‍රීය ණය අනුපාතය 2014 වර්ෂයේදී සියයට 33.95 ක සිට 2015 වර්ෂයේදී සියයට 29.78 ක් දක්වා වර්ධනය වී ඇති අතර එය තුළ කෙටි කාලයකින් ශ්‍රී ලංකා මහ බැංකුවෙන් අයකර ගත හැකි සේවක අර්ථ සාධක අරමුදල් ණයද ඇතුළත් වේ.

බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (පෙළ ii) 2014 වර්ෂයේ සියයට 25.32 ක සිට 2015 වර්ෂයේදී සියයට 22.65 ක් දක්වා පහළ වැටී තිබුණද, එය අවම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය වූ සියයට 10 ක මට්ටමට වඩා වැඩි විය.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා ඔවුන්ට ප්‍රවේශ විය හැකි හා දැරිය හැකි ණය පහසුකම් ලබාදීම හා එමගින් ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීමට දායකවීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකු 6 ක් ඒකාබද්ධ කරමින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ස්ථාපනය කරන ලදී. ව්‍යාපාර කටයුතු ව්‍යාප්ත කිරීම හේතුවෙන් 2015 වර්ෂයේදී බැංකුවේ බදු පූර්ව ලාභය සියයට 57 කින් වැඩි වී තිබුණි. ශුද්ධ පොලී ආදායම 2014 වර්ෂයේදී රු.මිලියන 5,282 ක සිට 2015 වර්ෂයේ රු.බිලියන 6,590 ක් දක්වා වැඩි වී තිබුණි. 2014 වර්ෂයේදී සියයට 7.6 ක් වූ අක්‍රීය ණය අනුපාතය 2015 වර්ෂයේදී සියයට 4.0 ක් දක්වා වර්ධනය විය. බැංකුවේ තැන්පතු පදනම සියයට 19 කින් වැඩි වී තිබූ අතර ණය හා අත්තිකාරම් සියයට 43 කින් වැඩි වී තිබුණි.

බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (පෙළ II) 2014 වර්ෂයේ සියයට 9.3 ක පැවැති අතර එය 2015 වර්ෂය අවසාන වන විට සියයට 10.5 ක් දක්වා වැඩි වී තිබුණි. එය අවම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය වන සියයට 10 ක ප්‍රමාණය ඉක්මවා තිබුණි.

ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව

2014 වර්ෂයේදී බැංකුවේ ශුද්ධ පොලී ආදායම රු. මිලියන 543 ක පැවැති අතර එය 2015 වර්ෂය අවසාන වන විට රු.මිලියන 562 දක්වා සියයට 3.6 කින් වැඩි වී තිබුණි. ඒ අනුව බදු පෙර ලාභය සියයට 3.87 කින් වැඩි වී තිබුණි. බැංකුවේ තැන්පතු පදනම සියයට 37 කින් ද ණය හා අත්තිකාරම් සියයට 26.5 කින් ද වැඩි වී තිබුණි. අක්‍රීය ණය අනුපාතය 2014 වර්ෂයේ සියයට 44.6 ක සිට 2015 වර්ෂයේ සියයට 35.2 ක් දක්වා අඩු වී තිබුණි.

ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව

මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණන නිරීක්ෂණ නිකුත් කිරීමෙන් පසුව, 2015 වර්ෂය සඳහා සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2016 සැප්තැම්බර් මාසයේදී ඉදිරිපත් කර තිබූ අතර ඒ පිළිබඳ විගණනය සිදු කරමින් පැවැතුණි.

ප්‍රධාන විගණන නිරීක්ෂණ

ලංකා බැංකුව

- **බේරා නොගත් රන් භාණ්ඩ උණු කිරීම**

  මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

  - 2014 ජූනි 18 දිනැති අංක 21 දරන කාර්යාල චක්‍රලේඛයෙන් සංශෝධිත

2010 ජනවාරි 15 දිනැති අංක 46/2010 දරන උකස් අත්තිකාරම් මත සේවා පිළිබඳ කාර්යාලීය චක්‍රලේඛය ප්‍රකාරව වෙන්දේසිය සඳහා ඉදිරිපත් කිරීමෙන් අනතුරුව නොවිකිණී ඉතිරිවන බේරා නොගත් රන් භාණ්ඩ, අතැති රන් භාණ්ඩ (Gold in Hand) ගිණුමකට මාරු කළ යුතු බවට ශාඛාවන්ට උපදෙස් දී තිබුණි. ඒ අනුව, 2014 නොවැම්බර් 30 දින වන විට රු.මිලියන 19,965.84 ක රන් භාණ්ඩවල උකස් වටිනාකම අතැති රන් භාණ්ඩ ගිණුමට මාරු කර තිබුණි.

- එසේ අතැති රන් භාණ්ඩ ගිණුමට මාරු කළ රන් භාණ්ඩවලින් රු.මිලියන 570.38 ක් වටිනා රන් කිලෝග්‍රෑම් 112.62 ක් උණුකර තිබූ අතර උණු කළ පසු රන්වල බර ප්‍රමාණය සහ වටිනාකම පිළිවෙලින් කිලෝග්‍රෑම් 111.68 ක් හා රු.මිලියන 451.98 ක් විය. ඒ අනුව උණු කිරීමෙන් අනතුරුව රන්වල බර ග්‍රෑම් 940 කින් හා වටිනාකම රු.මිලියන 118.40 ක ප්‍රමාණයකින් අඩු වී තිබුණි.
- 2015 දෙසැම්බර් 30 දින ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන සුරක්ෂිතාගාරයේ සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී උණු කළ රන් ග්‍රෑම් 37.19 ක ඌනතාවයක් නිරීක්ෂණය විය. සභාපතිවරයාගේ පිළිතුරට අනුව, "උණු කරන ලද රත්රන් බාර් වල රන් බර තොග පොත් වල වාර්තා කර ඇත්තේ සේවා සපයන්නා විසින් භාවිතා කරන ලද බර කිරන යන්ත්‍ර වල පෙන්නුම් කර ඇති සංඛ්‍යා අනුවය. භෞතික පරීක්ෂාව සිදු කර ඇත්තේ ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ මිණුම් ඒකක විසින් ක්‍රමාංකනය කිරීමෙන් අනතුරුව පාරිභෝගික කළමණාකරන දෙපාර්තමේන්තුවේ රන් සුරකුම් ණය සේවා ඒකකයෙහි අළුතින් මිලදී ගන්නා ලද බර කිරීමේ යන්ත්‍රය උපයෝගී කර ගනිමිනි. භෞතික පරීක්ෂාවේදී ලැබුණු ප්‍රතිඵලය සේවා සපයන්නාගේ බර කිරීමේ යන්ත්‍රය උපයෝගි කර ගැනීමේදි ලැබුණු බරට වඩා ග්‍රෑම් 37.19 ක් අඩු විය."

- **ශ්‍රී ලංකා රජයේ පිටහිටි ආනයන බිල්පත් පියවීම**

ඇමරිකානු ඩොලර් 5,000 ක් හෝ ඊට වැඩියෙන් මිලදී ගැනීමට අයදුම් කරන සිය ගනුදෙනුකරුවන්ට ලංකා බැංකුව විසින් විශේෂ අනුපාතිකයන් ලබා දෙයි. ගනුදෙනුකරු ඉල්ලුම් කරන අවස්ථාවේදී වෙළඳපොලේ පවතින ඇමරිකානු ඩොලරය හා රුපියල් විනිමය අනුපාතිකයට අනුව බැංකුව විශේෂ රේටයන් තීරණය කරනු ලැබේ. අනුපාතිකය තීරණය කරනු ලබන්නේ වෙළඳපොළ විකුණුම් අනුපාතිකයට ශත කිහිපයක් (උදා : ශත 10 සිට 25 දක්වා) එකතුකිරීමෙනි. කෙසේ වුවද විශේෂ අනුපාතිකයන් ඉල්ලා සිටින ලද හොඳම ගනුදෙනුකරුවන්ගෙන් උපයාගත හැකිව තිබූ ලාභය ඉක්මවා ගිය සාධාරණය කළ නොහැකි වූ රු.මිලියන 268.12 ක ලාභයක් බැංකුව උපයා තිබුණි. ඉහත කරුණු සලකා බලන විට, බැංකුවේ ව්‍යාපාර කටයුතු වලට සියයට 40 කට වැඩි ප්‍රමාණයකින් දායක වන ගනුදෙනුකරුවකු වශයෙන් හා බැංකුවේ අයිතිකරු වශයෙන් ශ්‍රී ලංකා රජයට ඩොලර් මිලියන ගණනක් වන සිය ගනුදෙනු සඳහා හොඳම අනුපාතිකයක් ලැබිය යුතුය. කෙසේ වුවද,

ඉහත ගනුදෙනුව තුළින් බැංකුවේ ලාභය ලෙස මහජන මුදල් අදාළ නොවන පරිදි ලබා ගැනීම පිළිබඳව දැඩි සැලකිල්ල යොමු කළ යුතු කරුණක් වනු ඇත.

- **2007 සැප්තැම්බර් 28 දිනැති අංක එස්එස්එස්එස්/04/2007 දරන රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව චක්‍රලේඛයෙහි 2.2.2 ඡේදයෙහි ප්‍රතිපාදන සමග අනුකූලතාවයෙන් තොර වීම.**

ලංකා බැංකුව සෘජුව සහභාගීවන අලෙවිකරුවකු වශයෙන්, රු.මිලියන 58,686.09 ක් වටිනා ගනුදෙනු 111 කට අදාළ ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනුවල (REPO) නීත්‍යානුකූල හිමිකම "ලංකා සිකියුර් ඕනර්ෂිප්" (Lanka Secure Ownership) හරහා පැවරීම, කඩිනමින් හා නිවැරදිව වාර්තා කිරීමට අපොහොසත් වී තිබුණි. ප්‍රති මිලදී ගැනුම් (REPO) ගනුදෙනු ප්‍රායෝගිකව පසු ඇගයීමකට ලක් කළ නොහැකි වුවද "සෘජු සහභාගීවන අලෙවිකරු මෙම වාර්තා නොකරන ලද ගනුදෙනුව වාර්තා නොකරන ලද ගනුදෙනුවලට අදාළ චෝදනාවට බැංකුව නිරාවරණය කරමින් භාණ්ඩාගාර අංශය විසින් මෙම පහසුකම සිය ගනුදෙනුකරුවන්ට ලබාදී තිබුණි. එයින් සිදු විය හැකි අධිභාරය රු.මිලියන 586.86 ක් (වාර්තා නොකරන ලද ගනුදෙනු වටිනාකමින් සියයට 1 ක්) විය හැකිව තිබුණි. එවැනි ගනුදෙනු ලංකා සෙකියුර් හි වාර්තා නොවන බැවින් වාර්තා නොකරන ලද කාලපරිච්ඡේදයට අදාළ එවැනි ගනුදෙනු සුරැකුම් නොකරන ලද මූල්‍ය වෙළඳපොළ ගනුදෙනු ලෙස සැලකිය හැකිය.

මහජන බැංකුව

- විශ්‍රාම භාර අරමුදල සඳහා නිකුත් කරන ලද ණයකර සඳහා ගෙවන ලද පොලී මත 2009 සිට 2014 වර්ෂ සඳහා රු.මිලියන 686.25 ක් වූ දිගුකාලීන හිඟ රඳවාගැනීමේ බදු, බැංකුව විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි. 2015 වර්ෂයේදී ද බැංකුව විසින් ඉහත ණයකර මත පොලී ගෙවීමේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.මිලියන 198.75 ක් වූ රඳවා ගැනීම් බදු සියයට 10 ක් අඩු කිරීමෙන් තොරව ගෙවීම් කිරීමෙන් දේශීය ආදායම් පනතේ විධිවිධාන උල්ලංඝනය කර තිබුණි.

- සම්පූර්ණ කරන ලද ශාඛා ඉදිකිරීම් ව්‍යාපෘති 13 කින් මුළු පිරිවැය රු.මිලියන 1,650.18 ක් සහිත ශාඛා 10 ක් හා ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 314.63 ක් සහිත ව්‍යාපෘති 3 ක් ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව හා කොන්ත්‍රාත්කරුගේ වෘත්තීය දක්ෂතාවය හා පූර්ව කාර්යසාධනය ඇගයීමෙන් තොරව බැංකුව විසින් උප පරිපාලිතයකට ප්‍රදානය කර තිබුණි.

- ශ්‍රී ලං ගි ප්‍ර 23 - ණයගැනීම් පිරිවැය ප්‍රමිතිය උල්ලංඝනය කරමින් වර්ෂය තුළ බැංකුවේ වත්කම් කොටසක් ලෙස කොන්ත්‍රාත්කරුගේ රු.මිලියන 136.44 (බදු සහිතව) ක් වූ ණය ගැනීම් පිරිවැය බැංකුව විසින් ප්‍රාග්ධනිත කර තිබුණි. එම සාවද්‍ය ගිණුම්කරණය හේතුවෙන් බැංකුවේ වත්කම් හා ලාභය වැඩියෙන් දක්වා තිබුණි.

- බැංකුව විසින් තංගල්ල ශාඛා කාර්යාල පරිශ්‍රය 2012 ඔක්තෝබර් මාසයේදී බැංකුවේ උප පරිපාලිතයකින් ඉඩම් හා ගොඩනැගිලි මිලදී ගෙන රු.මිලියන 180.44 කට ප්‍රාග්ධනිත කර තිබුණි. එහෙත් මිලදී ගැනීමෙන් මාස 06 කට පසුව 2013 ජුනි 30 දින රජයේ තක්සේරුකරු විසින් කරන ලද තක්සේරුවේදී එම දේපල වටිනාකම රු.මිලියන 110.44 කින් සීඝ්‍රයෙන් පහළ වැටී තිබුණි.

- මහජන බැංකුව සෘජුව සහභාගීවන අලෙවිකරුවකු වශයෙන්, 2007 සැප්තැම්බර් 28 දිනැති අංක එස්එස්එස්එස්/04/2007 දරන රාජ්‍ය ණය දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ විධිවිධාන උල්ලංඝනය කරමින් රු.මිලියන 23,829.94 ක් වටිනා ගනුදෙනු 53 කට අදාළ ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනු (REPO) වල නිත්‍යානුකූල හිමිකම "ලංකා සිකියුර් ඕනර්ෂිප්" (Lanka Secure Ownership) හරහා පැවරීම, කඩිනමින් හා නිවැරදිව වාර්තා කිරීමට අපොහොසත් වී තිබුණි. ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු ප්‍රායෝගිකව, පසු ඇගයීමකට ලක් කළ නොහැකි වුවද "සෘජු සහභාගීවන අලෙවිකරු ලෙස වාර්තා නොකරන ලද ගනුදෙනුවලට අදාළ චෝදනාවට බැංකුව නිරාවරණය කරමින් භාණ්ඩාගාර අංශය එම පහසුකම සිය ගනුදෙනුකරුවන්ට ලබා දී තිබුණි. මෙයින් සිදුවිය හැකි අධිභාරය රු.මිලියන 238.30 විය හැකිව තිබුණි. (වාර්තා නොකරන ලද ගනුදෙනු වටිනාකම මත සියයට 1 ක්) එවැනි ගනුදෙනු ලංකා සෙකියුර් හි වාර්තා නොවන බැවින්, වාර්තා නොකරන ලද කාලපරිච්ඡේදයට අදාළ එවැනි ගනුදෙනු සුරැකුම් නොකරන ලද මූල්‍ය වෙළඳපොළ ගනුදෙනු ලෙස සැලකිය හැකිය.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව

- ප්‍රධාන කාර්යාලයේ අන්තර් ශාඛා බැංකු ගිණුම් හා ශාඛාවල ශේෂයන් අතර රු.මිලියන 2,542.14 ක නොසැසඳුණු ශේෂයක් පැවැතුණි.
- අක්‍රීය ගිණුම් මත, මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු රු.මිලියන 715.991 කින් රු.මිලියන 442.264 ක් නිරවුල් කිරීමෙන් තොරව වර්ෂ 05 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.
- 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාජ ආපසු ගැනීම් රු.මිලියන 94.35 ක් වූ අතර එය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී රු.මිලියන 67.82 ක හෙවත් සියයට 256 ක වැඩිවීමක් එහි දැක්වුණි. ඉන් රු.මිලියන 42.985 ක් හෙවත් සියයට 63 ක් ATM යන්ත්‍රය මගින් ව්‍යාජ ලෙස මුදල් ආපසු ගැනීම්වලට අදාළ විය.
- 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීම් බැංකු පනතේ 47 වගන්තියට අනුව, වර්ෂ 10 කට වැඩි කාලයක් අක්‍රීයව පවත්නා තැන්පතු අක්‍රීය තැන්පතු ලෙස සැලකිය යුතු අතර ඒවා හිමිකම් නොපෑ තැන්පතු සංචිත ගිණුමට මාරු කළ යුතුය. එහෙත් එකී සංචිත ගිණුමට මාරු කිරීමෙන් තොරව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල අක්‍රීය තැන්පතු ලෙස රු.මිලියන 1,435.72 ක් දක්වා තිබුණි.
- බැංකුව විසින් 2013 ජුනි 26 දින රු.මිලියන 14,227 ක ණය පහසුකමක් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත අනුමත කර තිබූ අතර, 2014 හා 2015 වර්ෂ සඳහා ලැබිය යුතු පොලී ගෙවීම ප්‍රමාද කිරීමට හා අර්ධ වාර්ෂික පදනම මත ප්‍රාග්ධනිත කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. ඒ අනුව, 2015 දෙසැම්බර් 31

දිනට මුළු හිඟ මුදල රු. මිලියන 2,799 ක් වූ අතර එය මුළු ණය මුදා හැරීමේ වටිනාකම වූ රු.මිලියන 2,550 කින් හා ප්‍රාග්ධනිත පොලිය රු.මිලියන 249 කින් සමන්විත විය. මෙම ව්‍යාපෘති ණය වර්ෂ 5 ක් තුළ කල් පිරෙන ජාත්‍යන්තර බැඳුම්කර ණය යටතේ යෝජනාවක් ලෙස හඳුනා ගෙන තිබූ බවත් වර්ෂ 2 ½ ක අනුග්‍රාහක කාල සීමාවක් ඇතුළත්ව වර්ෂ 14 ක ආපසු ගෙවීම් කාලයක් සහිතව මෙම ණය මුදල බැංකුව ලබා දී තිබූ බවත් නිරීක්ෂණය විය.

- බැංකුව විසින් 2015 දෙසැම්බර් 31 දිනට ලබා දී තිබුණු මුළු උකස් ණය අත්තිකාරම් රු.මිලියන 26,489.25 ක් වූ අතර එහි වෙළඳපොළ අගය රු.මිලියන 37,838.44 ක් විය. ඉන් රු.මිලියන 5,484.75 ක් 2015 දෙසැම්බර් 31 දිනට අක්‍රීය උකස් ණය අත්තිකාරම් වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 20 කින් හා සියයට 18 කින් පිළිවෙලින් උකස් ණය අත්තිකාරම් වටිනාකම හා වෙළඳපොළ වටිනාකම පහළ වැටී තිබූ අතර, ඒ සඳහා රන් වෙළඳපොළ වටිනාකම විශාල වශයෙන් පහළ යාම හා රු.මිලියන 380.71 ක් වූ අක්‍රීය උකස් ණය අත්තිකාරම් ප්‍රාග්ධන මුදල කපා හැරීම හේතු වී තිබුණි. තවද මුළු උකස් ණය අත්තිකාරම් වලින් සියයට 21 ක් අක්‍රීය මට්ටමේ පැවතුණි.

- ඉඩම්වල නීත්‍යානුකූල හිමිකම බැංකුව වෙත ලබා නොගෙන අනුරාධපුරය, ඇල්පිටිය, ගල්නෑව, කතරගම, කැකිරාව, කිරිදිවැල, මොණරාගල හා රත්නපුර ප්‍රදේශවල ඉඩම් 8 ක ගොඩනැගිලි ඉදිකිරීම සඳහා බැංකුව විසින් රු.මිලියන 83.56 ක් වැය කර තිබුණි.

- බැංකුවේ තථ්‍ය සේවක සංඛ්‍යාවෙන් 2009 ක් හෙවත් සියයට 55 ක් බැංකු සහකරුවන් වන අතර, එම තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටිය ලෙස 2005 වර්ෂයට පෙර අනුගමනය කර තිබූ තරඟකාරී විභාග පැවැත්වීම වෙනුවට 2005 වර්ෂයෙන් පසුව සම්මුඛ පරීක්ෂණයක් පමණක් පැවැත්වීම බැංකුව විසින් අනුගමනය කර තිබුණි. 2005 වර්ෂයට පෙර පැවති බඳවා ගැනීමේ පටිපාටියට අනුව සුදුසු අයදුම්කරුවන් වයස අවුරුදු 28 ට අඩු විය යුතු අතර සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීම සඳහා තරඟකාරී විභාගය සමත් විය යුතුය. එහෙත් 2005 වර්ෂයට පසු බඳවා ගැනීමේ පටිපාටියට අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා කළමනාකරණය විසින් ඉදිරිපත් කරන ලද නාමලේඛන යොදා ගෙන තිබුණු අතර වයස් සීමාව අවුරුදු 25 දක්වා අඩු කර තිබූ අතර විවෘත දැන්වීම් ක්‍රමය හා තරඟකාරී විභාග ක්‍රමය අහෝසි කර තිබුණි.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

- බැංකුවේ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්, ඔවුන්ගේ සමීප පවුල් සාමාජිකයන් හා අස්තිත්වයන් මැදිහත් වූ එකතුව රු.මිලියන 52.66 ක් වූ ගනුදෙනු තිබුණද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 24 හි අවශ්‍ය පරිදි සම්බන්ධිත පාර්ශව ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

- 2001 වර්ෂයේදී සියයට 9 ක පොලී අනුපාතයකට ලබාගන්නා ලද රු.මිලියන 250 ක ණය මුදලක් සඳහා ප්‍රාග්ධන කොටස හා පොලී මුදල මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවීම 2015 දෙසැම්බර් 31 දක්වා සිදුකර නොතිබුණි.

කෙසේ වුවද 2006 වර්ෂය අවසානය වන විටත් එකතුව රු.මිලියන 134.32 ක් වූ පොලිය සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා තිබූ අතර 2007 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ එකතුව රු.මිලියන 202.50 ක පොලිය සඳහා ප්‍රතිපාදන සිදු කර නොතිබුණි.

- 2013 ජූලි 01 දින සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ එක් බැංකු ශාඛාවක ගනුදෙනුකරුවන් විසින් කරන ලද එකතුව රු.මිලියන 2.03 ක් වූ තැන්පතු ගනුදෙනුකරුවන්ගේ ගිණුම්වලින් අත්හැරී තිබුණු අතර මෙම මුදල හඳුනා නොගත් මුදලක් ලෙස ප්‍රධාන කාර්යාලයේ නොසැසඳූ පාලන ගිණුමට මාරු කර තිබුණි.

- එකතුව රු.මිලියන 4.15 ක් වූ බැංකු ගිණුම්වලට අදාළ ගනුදෙනු, ගිණුම්වල ගැලපීම් කිරීමෙන් තොරව නොසැසඳූ පාලන ගිණුමට මාරු කර තිබුණි.

- සටහන් කිරීමේ දෝෂ හේතුකොටගෙන රු.මිලියන 17.72 ක අසාමාන්‍ය හර ශේෂයක් 2015 දෙසැම්බර් 31 දිනට චෙක්පත් උපලබ්ධි ගිණුමේ පැවතුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වෙනත් ණයගැතියන් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

- ඉදිරිපත් නොකළ චෙක්පත් ගිණුමේ රු.මිලියන 3.06 ක් වූ දිගුකාලීන ශේෂයන් නිරවුල් කිරීමෙන් තොරව ඉදිරියට ගෙන එමින් පැවතුණි.

- බැංකුව විසින් 2015 දෙසැම්බර් 31 දිනට ශාඛාවල ජංගම ගිණුම් අතර ශේෂයන් සහ ශාඛාවල ප්‍රධාන කාර්යාලයීය ජංගම ගිණුම් අතර ශේෂයන් සසඳා තිබූ නමුත් ගිණුම්වල එකතුව රු.මිලියන 24.65 ක් සඳහා අදාළ සටහන් යොදා නොතිබුණි.

- ස්ථාවර තැන්පතු, ඉතිරිකිරීමේ ගිණුම්, ස්ථාවර තැන්පතුවලට එරෙහිව ණය සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මුදල හා පරිගණක පද්ධතියෙන් ලබාගත් ශේෂයන් අතර පැවතුණු රු.මිලියන 50.40 ක වෙනස 2015 වර්ෂයේදී නොසැසඳූ පාලන ගිණුමට මාරු කර තිබුණි.

- 2015 දෙසැම්බර් 31 දිනට ප්‍රතිමූල්‍ය ණය, උකස් ණය, පුද්ගලික ණය, වතු අංශයේ අර්ථසාධක අරමුදල් ණය, අර්ථසාධක අරමුදල් ණය හා විභජනය නොකළ ගිණුම්වල ශේෂයන්ට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් සහ පරිගණක පද්ධතියෙන් ලබාගත් ශේෂයන් අතර රු.මිලියන 13.32 ක වෙනසක් පැවතුණි.

- අත්තිකාරම් ගිණුම්වල රු.මිලියන 7.55 ක හර ශේෂයක් හා රු.මිලියන 2.12 ක බැර ශේෂයක් හඳුනාගැනීමෙන් හා ගිණුම්වල ගැලපීම් කිරීමෙන් තොරව දීර්ඝ කාලයක් මුළුල්ලේ පවත්වා ගෙන තිබුණි.

- 2015 දෙසැම්බර් 31 දිනට කුලී අත්තිකාරම් ගිණුමේ ශේෂය අදාළ බැංකුව විසින් රු.මිලියන 2.90ක් ලෙස සනාථ කර තිබුණද එම ගිණුමේ බැර ශේෂයක් ලෙස රු.මිලියන 5.59 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

- ප්‍රධාන කාර්යාලයේ චෙක්පත් මුදල් කිරීමේ ගිණුමට අදාලව වෙනත් වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන

රු.මිලියන 2.39 ක හඳුනා නොගත් මුදල වර්ෂයකට වැඩි කාලයක් හඳුනාගැනීමෙන් හා සැසඳීමෙන් තොරව ගිණුම්වල පැවතුණි.

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

- බැංකුව විසින් ණය වාරික අයකර ගැනීම සඳහා ගනුදෙනුකරුවන්ගෙන් චෙක්පත් ලබාගෙන තිබූ අතර එදිනට එම චෙක්පත් ගනුදෙනුකරු ණය ගිණුම්වලට බැර කර තිබුණි. ඒ අනුව එම චෙක්පත් උපලබ්ධිවීමට ප්‍රථම බැංකුව විසින් එම චෙක්පත් උපලබ්ධි වූ චෙක්පත් ලෙස හඳුනාගෙන තිබුණි. තවද, රු.මිලියන 1.40 ක් වූ චෙක්පත් දිගුකාලයක් ගැලපීම් කර නොතිබූ අතර තැන්පත් කරන ලද නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් ලෙස දක්වා තිබුණි.

- සේවක අර්ථසාධක අරමුදල් රු.මිලියන 10.77 ක් මාස 18 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි. එම ණය ශ්‍රී ලංකා මහ බැංකුවෙන් අයකර ගැනීමට හැකියාව තිබුණද, එම ණය අයකර ගැනීම සඳහා බැංකුව විසින් 2015 දෙසැම්බර් මාසය අවසාන වන විටත් කිසිදු සතුටුදායක ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

- බැංකුව විසින් පුද්ගලික සමාගමක සියයට 11 ක වාර්ෂික පොලී අනුපාතයක් යටතේ රු.මිලියන 100.00 ක් වූ ත්‍රෛමාසික වාණිජ පත්‍ර මිලදී ගෙන තිබුණු අතර ආයෝජිත සමාගම ශ්‍රේණිගත නොවූ සමාගමකි. එම සමාගමෙහි එක් අධ්‍යක්ෂවරයකු බැංකුවේ ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයකු ද වන බව නිරීක්ෂණය විය.

- 2015 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු ගනුදෙනුකරු ස්ථාවර තැන්පතුවලින්, සියයට 41 කට වැඩි ප්‍රමාණයක් තැන්පතුකරුවන් 11 දෙනෙකුට අයත් වී තිබුණි. ඒ අනුව ඉතා සීමිත තැන්පතුකරුවන් ප්‍රමාණයක් මත බැංකුව වැඩියෙන් යැපෙන බවත් එය ඉතා ඉහළ ද්‍රවශීලතා අවදානමකට හේතු වී තිබුණි.

- බැංකුවේ පවත්නා සේවක සංඛ්‍යා තත්ත්වයන්ට අවධානය යොමු කිරීමෙන් තොරව 2015 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි නිලධාරීන් 20 දෙනෙකු ජ්‍යෙෂ්ඨ කළමනාකරු හා ඊට ඉහළ තනතුරු සඳහා උසස් කර තිබුණි.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

- ණය පාඩු ප්‍රතිපාදනය ගණනය කිරීම සඳහා බැංකුව විසින් යොදාගත් මතභේදයට තුඩුදෙන ණය පැහැර හැරීමේ අලාභ අනුපාතය (Loss Given Default Ratio) හේතුවෙන් 2014 හා 2015 වර්ෂවලදී කරන ලද හානිකරණ ප්‍රතිපාදන පිළිවෙලින් රු.බිලියන 1.2 කින් හා රු.බිලියන 611 කින් ප්‍රතිවර්තනය වී තිබුණි. මෙම ප්‍රතිවර්තනය හේතුවෙන් අදාළ වර්ෂයන් සඳහා ලාභය එම මුදලින් වැඩි වී තිබුණි.

- රු.මිලියන 1.60 ක් වටිනා බහා තබන සේප්පු 56 ක් මිලදී ගැනීම සඳහා බැංකුව විසින් සැපයුම්කරුවෙකු වෙත ඇණවුමක් කර තිබුණි. 2016 මැයි 12 දින වන විටත් එම ඇණවුම සම්පූර්ණ කර නොතිබුණද ලංසු බැඳුම්කරයේ හා කාර්යසාධන බැඳුම්කරයේ වලංගු කාලය ඉකුත් වී තිබුණි.

ඉහත සඳහන් වලංගු කාලය දීර්ඝ කර ගැනීම සඳහා බැංකුව විසින් කටයුතු කර නොතිබුණි.

- මිහින්තලය බැංකු ශාඛාව නවීකරණය කිරීමට අදාළව සිදු කරන ලද විමර්ශන වාර්තාවට අනුව, ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටුවට සාමාජිකයන් පත්කිරීම, දැන්වීම් පළකිරීම, ලංසු ඇගයීම, ලංසු විවෘත කිරීම, රැස්වීම් පැවැත්වීම හා අදාළ ලියකියවිලි පිළියෙල කිරීම යනාදී එක් එක් අදියරයන් යටතේ ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැර වීම සිදු වී තිබූ බව පෙන්වා දී තිබුණි. කොන්ත්‍රාත්කරුගෙන් විධිමත් ඉන්වොයිසියක් ලබා ගැනීමෙන් තොරව හා ව්‍යාපෘති ඉංජිනේරු විසින් නිකුත් කරන ලද වැඩ නිම කිරීම් සහතිකයක් ලබා ගැනීමෙන් තොරව කොන්ත්‍රාත්කරුට රු.මිලියන 4.45 ක මුළු මුදලම ගෙවා තිබුණි. ගෙවීම් නිම කිරීමට පෙර ගිවිසුමට හා අවශ්‍ය ප්‍රමිතීන්ට අනුව වැඩය නිමකළ බවට තහවුරු කරගැනීමට බැංකුවේ කිසිදු නිලධාරියකු පියවර ගෙන නොතිබුණි. ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයට පත් වී ඇති අතර මෙම කොන්ත්‍රාත්තුව හේතුවෙන් බැංකුවට දැරීමට සිදු වන අලාභය මෙතෙක් ඇස්තමේන්තු කර නොතිබුණි.

- බැංකුවේ අංක 2010/10 දරන (සංවර්ධන ණය) කාර්යාල චක්‍රලේඛය අනුව උකසට තබන ලද සෑම රන් භාණ්ඩයක්ම උකසට තබන ලද දිනයේ සිට මාස 12 ක කාලපරිච්ඡේදයක් ඇතුළත බේරා ගත යුතුය. එම කාලපරිච්ඡේදය තුළ භාණ්ඩය බේරා නොගතහොත් උකස් ගන්නා (Pawnee) විසින් එම භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියක් මඟින් අලෙවි කළ යුතුය. ඉහත උපදෙස් සේවකයන්ගේ රන් භාණ්ඩ උකස් අත්තිකාරම් සඳහාද පොදුය. කෙසේ වුවද 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ බණ්ඩාරවෙල ශාඛාවේ කාර්ය මණ්ඩල සාමාජිකයන් 04 දෙනෙකුට නිකුත් කරන ලද රු.2,529,750 ක උකස් අත්තිකාරම් නිරවුල් කිරීමෙන් තොරව එසේම පැවැතුණි.

ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව

- ප්‍රධාන කාර්යාලයේ පාරිභෝගික ද්‍රව්‍ය, ලිපිද්‍රව්‍ය සහ ප්‍රවර්ධන විෂයයන්ට අදාළව 2015 දෙසැම්බර් 31 දිනට පොදු ලෙජරය අනුව ශේෂය සහ භෞතික තොග සමීක්ෂණ වාර්තා අනුව ශේෂය අතර රු.මිලියන 6.83 ක වෙනසක් නිරීක්ෂණය විය.

- 2015 දෙසැම්බර් 31 දිනට බැංකුවේ අක්‍රීය ණය අනුපාතය සියයට 35.2 ක් වූ අතර එය බලපත්‍රලාභී විශේෂිත බැංකු සාමාන්‍ය අනුපාතය වන සියයට 6.4 ට වඩා ඉතා ඉහළ අගයක් ගන්නා බව නිරීක්ෂණය විය. එමෙන්ම 2015 දෙසැම්බර් 31 දින වන විට ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතය සියයට 888.2 ක් වූ අතර එය අවම අවශ්‍යතාවය වන සියයට 20 සමඟ සසඳා බැලීමේදී ඉතා ඉහළ අගයක් ගන්නා බව නිරීක්ෂණය විය. මෙය ඉහළ ප්‍රතිලාභයක් ලබාදෙන වත්කම්වල ආයෝජනය කිරීමෙන් තොරව ඉතා ඉහළ ද්‍රවශීලතා වත්කම්වල ආයෝජනය කිරීම හේතුවෙන් ඇති වී තිබුණි.

- 2015 වර්ෂය අවසාන දින 03 තුළ (දෙසැම්බර් 29, 30 හා 31) වෙන්නප්පුව ශාඛාව විසින් ගනුදෙනුකරුවන් 11 දෙනෙකුගේ නමින් රු.මිලියන 50.6 ක ස්ථාවර තැන්පතු අරඹා අදාළ

දිනයන්හිදීම තැන්පතුවලින් සියයට 90 ක් වූ රු.මිලියන 45.54 ක ස්ථාවර තැන්පත් මුදලට එරෙහිව ණය මුදල් ලෙස ලබා දී තිබුණි. කෙසේ වුවද මෙම සියලු ස්ථාවර තැන්පතු අරඹා දින කිහිපයකට පසු (2016 ජනවාරි 07 සහ ජනවාරි 11) මෙම තැන්පතු ආපසු ලබා ගෙන අදාළ ණය මුදල් පියවා තිබුණි.

- 2015 වර්ෂය තුළ ශාඛාව විසින් රස්කරන ලද මුළු තැන්පතු සහ මුදා හරින ලද මුළු ණය සලකා බැලීමේදී මුළු තැන්පතුවලින් සියයට 83 ක් හා මුළු ණය මුදල්වලින් සියයට 23 ක් දෙසැම්බර් මාසය තුළ සිදුකර තිබූ බවත්, එය අසාමාන්‍ය තත්ත්වයක් බවත් අනාවරණය විය. මෙහිදී ඉහත සඳහන් ගනුදෙනු සඳහා සත්‍ය වශයෙන් භෞතික මුදල් චලනයක් සිදු වී නොතිබුණු අතර ශාඛාවේ කාර්යසාධනය වැඩිකර පෙන්වීම සඳහා නව තැන්පතු හා අත්තිකාරම් මැවීමක් පමණක් සිදුකර තිබුණි.

- වෙන්නප්පුව ශාඛාව සම්බන්ධයෙන් සිදු කරන ලද ශාඛා පරීක්ෂණයේදී, තැන්පතු පත්‍රිකාවල ගනුදෙනුකරුවන්ගේ ව්‍යාජ අත්සන් යොදා ගනුදෙනුකරුවන්ගේ ඉතිරිකිරීම් තැන්පතුවලින් මුදල් ලබාගෙන තිබූ බව නිරීක්ෂණය විය. තෝරාගත් සාම්පලයට අනුව එසේ වංචනික ලෙස ගිණුම්වලින් ලබාගන්නා ලද මුළු මුදල රු.738,138 ක් විය.

- බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා යහපාලනයට අදාළ 2007 අංක 12 දරන බැංකු පනතේ නියෝගයට අනුව සභාපතිවරයා විසින් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සෘජු අධීක්ෂණය හෝ කිසිදු ආකාරයක විධායක මට්ටමේ කාර්යයක නිරත නොවිය යුතුය. එහෙත් සභාපතිවරයා විසින් කළමනාකරණ කමිටු කිහිපයකම සාමාජිකයකු වශයෙන් කටයුතු කිරීම මඟින් විධායක කාර්යයන්හි සභාපතිවරයාගේ මැදිහත් වීම නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා මහ බැංකුව

උපදේශක සභාව සඳහා උපදේශක සේවා පිරිවැය

උතුරු හා නැගෙනහිර පළාත්වල පදිංචිව සිට අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධයෙන් නිවැසියන්ගේ පැමිණිලි විමර්ශනය කිරීම සඳහා ජනාධිපති කොමිසමට උපදෙස් ලබාදීම සඳහා වන උපදේශක සභාවේ සේවය කිරීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හිටපු ජනාධිපතිවරයා විසින් 2014 ජුනි 28 දින ජාත්‍යන්තර විශේෂඥයන් තිදෙනෙකු පත්කර තිබුණු අතර එය 2014 ජූලි 15 දිනැති අංක 1871 / 18 දරන අති විශේෂ ගැසට්පත්‍රය මඟින් නිවේදනය කර තිබුණි. කිසිදු ප්‍රතිපූරණය කර ගැනීමේ පදනමකින් තොරව ඉහත උපදේශක සභාවේ හා එහි කාර්ය මණ්ඩලයේ වියදම් වන උපදේශක ගාස්තු, නවාතැන් හා වෙනත් ගාස්තු වශයෙන් රු.මිලියන 145 ක් හා රු.මිලියන 111.5 ක මුදලක් පිළිවෙලින් සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වැය කර තිබුණද ශ්‍රී ලංකා මහ බැංකුව හා ඉහත සඳහන් උපදේශකවරුන් අතර එළඹි කිසිදු ගිවිසුමක්ද නොතිබුණි. ඉහත සඳහන් උපදේශකවරුන්ගේ සේවය ලබා ගැනීම ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු සමඟ සෘජු සම්බන්ධයක් නොවූ බව නිරීක්ෂණය විය.

විදේශීය නීතිඥයින් සහ ආයෝජන ආරවුල් පියවීම සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානය සඳහා ගෙවීම් කිරීම

හෙජින් ගනුදෙනුවේ සැලකිය යුතු දෝෂයන් පැවතීම හා වැදගත් වෙනස්වීම් ඇති බව සොයා ගැනීම හේතුවෙන් 2008 දෙසැම්බර් 16 දින මුදල් මණ්ඩලය නිකුත් කළ උපදෙස් යටතේ ඩොයිෂ් බැංකුව සමඟ එළඹි හෙජින් ගිවිසුම මත ගෙවීම් කිරීමෙන් ලංකා ඛනිජතෙල් නීතගත සංස්ථාව වැළකී තිබුණි. ඒ අනුව රජයට එරෙහිව ආයෝජන ආරවුල් පියවීම සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ බේරුම් කිරීමේ කටයුතු ඩොයිෂ් බැංකුව විසින් ආරම්භ කර තිබුණි. බේරුම් කිරීමේ තීන්දුව ලෙස ඩොයිෂ් බැංකුව වෙත එජඩො 78,469,623 ක මුදලක් පිරිනමා බේරුම් කිරීමේ කටයුතු සිදු කිරීමට 2012 නොවැම්බර් 02 දින භාර දී තිබුණි.

එම තීරණයට එරෙහිව නීතිපතිවරයාගේ හා නීති කණ්ඩායමේ උපදෙස් මත ආයෝජන ආරවුල් පියවීම සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ අවලංගු කිරීමේ කටයුතු ආරම්භ කර තිබුණි.

2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ බේරුම් කිරීමේ ක්‍රියාවලිය සඳහා පෙනීසිටි විදේශීය නීතිඥයන්ට රු.මිලියන 378.68 ක ගෙවීම් කර තිබුණු අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවලංගු කිරීමේ කටයුතු සඳහා වන පරිපාලන පිරිවැය ලෙස ආයෝජන ආරවුල් නිරවුල් කිරීම සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානයට සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 25.62 ක ගෙවීම් සිදුකර තිබුණි. ඊට අමතරව 2015 වර්ෂය සඳහා නීතිඥ ගාස්තුවලට අදාළව ගිණුම්වල රු.මිලියන 13.08 ක ප්‍රතිපාදනයක් කිරීමටද සිදු වී තිබුණි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිපූරණය කර ගැනීමේ පදනමකින් තොරව එකතුව රු.මිලියන 417.37 ක් වූ ඉහත ගෙවීම් සිදු කර තිබූ අතර මෙම ගෙවීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් සඳහා ඍජු සම්බන්ධතාවයක් නොමැති බව නිරීක්ෂණය විය.

කෘෂිකර්මය

ස්වභාවික සම්පත් තිරසාර කළමණාකරණය මගින් සමාජීය වශයෙන් පිළිගත් නව්‍ය හා වාණිජමය නැඹුරුවකින් යුතුව, ගෝලීය තරඟකාරී නිෂ්පාදනයන් බිහිකරන ව්‍යවසායකත්ව කෘෂිකර්මාන්තයක් සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් කෘෂිකාර්මික ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාත්මක කිරීම, කෘෂිකාර්මික විවිධාංගිකරණය සහ නිෂ්පාදනය වැඩිදියුණු කිරීම, කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීම,පාංශු සංරක්ෂණ පනත, ගස් කැපීම පාලනය කිරීමේ පනත, බීජ පනත, පැලෑටි ආරක්ෂණ පනත, පොහොර පනතේ විධිවිධාන සහ පලිබෝධනාශක පනත පරිපාලනය, කෘෂිකාර්මික අධ්‍යාපනය, පර්යේෂණ හා ව්‍යාප්ති සේවා, පුරන් කුඹුරු සංවර්ධනය, කෘෂි ව්‍යවසාය, පශු අස්වනු තාක්ෂණය හා අධිතාක්ෂණික කටයුතු සංවර්ධනය කෘෂිකර්ම අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවල සහ ආයතනන වල කාර්ය භාරය වේ.

මෙම කාර්යභාරය කෘෂිකර්ම අමාත්‍යාංශයට අනුබද්ධිත කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව , ශ්‍රී ලංකා කෘෂිකර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව, සීමාසහිත ලංකා පොහොර සමාගම, සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම, සීමාසහිත ලංකා පොස්පේට් සමාගම, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය, ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය *විසින් ඉටු කළ යුතුව තිබුණි.*

දිවයිනේ මුළු ඉඩම් ප්‍රමාණයෙන් *සියයට* 65 ක් පමණ කෘෂිකර්මාන්තය සඳහා යොදාගෙන ඇති අතර මුළු ජනගහනයෙන් *සියයට* 70 කට වඩා වැඩි පිරිසකගේ ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තය වී තිබුණි. කෘෂිකර්ම අමාත්‍යාංශය *විසින්* 2015 වර්ෂයේදී ප්‍රධාන සංවර්ධන වැඩසටහන් 7 ක් ක්‍රියාත්මක කර තිබු අතර ඒ සඳහා *රු.මිලියන 50,170 ක වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට* පොහොර සහනාධාර වැඩසටහන සඳහා පමණක් රු.මිලියන 49,571 ක් වැයකර තිබුණි. අමාත්‍යාංශය හා ඒ යටතේ වන ආයතනයන් විසින් ඉටු කරන ලද කාර්යභාරයන් සම්බන්ධයෙන් වන විගණන නිරීක්ෂණයන් සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීමේ වැඩසටහන

දේශිය වශයෙන් නිපදවිය හැකි ආහාර ද්‍රව්‍ය වැඩි වශයෙන් නිපදවමින් ආනයනය සීමාකර විදේශ විනිමය ඉතිරි කිරීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි. මේ යටතේ අතිරේක ආහාර බෝග නිෂ්පාදනය, තරුණ කෘෂි ව්‍යවසායකත්ව මෙහෙයුම, වානිජ ගොවිපල, අවාරය අහවරයි හා පාංශු සංරක්ෂණ ආදර්ශ ගම්මාන ස්ථාපනය ආදී වැඩසටහන් ක්‍රියාත්මක කර තිබු අතර ඒ සඳහා රු.මිලියන 305 ක් වැය කර තිබුණි.

ආහාර සුරක්ෂිතතාව වැඩසටහන අපේක්ෂිත පරිදි ඉටු නොකිරිම

ආහාර සුරක්ෂිතතාව වැඩසටහන යටතේ ක්‍රියාත්මක වු වාණිජ ගොවිපල සඳහා *සළසා තිබුණු* ප්‍රතිපාදනයෙන් සියයට 59.4 ක් හා

තරුණ කෘෂි ව්‍යවසායකත්ව වැඩසටහන සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 65 ක් උපයෝජනය කර නොතිබුණු අතර වාණිජ ගොවිපල වැඩසටහන දිස්ත්‍රික්ක 11 ක ක්‍රියාත්මක කර නොතිබුණි.

මිලදී ගෙන තිබුණු බීජ වප්කරවල අඩුපාඩු පැවැතීම

අතිරේක ආහාර බෝග නිෂ්පාදන වැඩසටහන යටතේ මිලදී *ගෙන තිබුණු* බීජ වප්කර 44 ක් සඳහා රු. මිලියන 2.56 ක් වැය කර තිබුණි. එම වප්කරවල බීජ වැටීම ඒකාකාරි නොවීම, බීජ පළුදු වීම හා බහුලව ගොවීන් භාවිතාකරන ට්‍රැක්ටර්වලට වප්කරයේ ඇණ තව් නොගැලපීම ආදි ගැටළු *පැවැතුණි.*

සැලැසුම් කළ පරිදි පැල කට්ටල බෙදා හැර නොතිබීම

අවාරය යැයි සැලකෙන මැයි, ජූනි, ජූලි මාසවලදී අස්වනු ලැබීමේ අපේක්ෂාවෙන් එළවළු වගා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. දිවයිනේ දිස්ත්‍රික්ක 25 ක කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර කළාප 11,333 කට පැල කට්ටල 566,650 ක් බෙදා දීමට සැලැසුම්කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට පැල කට්ටල 360,014 ක් පමණක් බෙදාහැර තිබුණි.

අදාළ නිර්නායකවලින් බැහැරව ප්‍රතිලාභීන් තෝරා ගැනීම

වාණිජ ගොවිපල සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ අදාල නිර්නායකයන්ගෙන් බැහැරව ප්‍රතිලාභීන් තෝරාගෙන තිබුණි. නියැදි පරීක්ෂාවේදි අනාවරණය වු පරිදි කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභින් 3 දෙනෙකුට ලබාදීමට නියමිතව තිබූ රු.1,105,000 ක ප්‍රතිලාභ 2015 වර්ෂය අවසාන වන විටත් ලබාදී නොතිබුණි.

අරමුණුවලට පටහැනි ක්‍රියාකාරකම් කිරීම

ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීමේ විශේෂ කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන් ආරම්භ කර තිබූ අතර එම ප්‍රතිපාදනවලින් අරමුණට පටහැනි ක්‍රියාකාරකම් 19 ක් සඳහා රු. *මිලියන* 14.88 ක් වැය කර තිබුණි.

කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය.

කාබනික පොහොර මඟින් රසායනික පොහොර භාවිතය අවම කිරීම, පැළෑටි පසට සවිකිරීමේ සවිමත් උපස්ථරයක් ලබාදීම, පසේ ජීවත්වන ක්ෂුද්‍ර ජීවීන්ගේ ඝණත්වය වැඩිකර පසේ ලිහිල්භාවය වැඩි කිරීම මගින් ශාඛා මූලවලට අවශ්‍ය කරන වාතය පහසුවෙන් පස තුළට ගමන් කිරීම සිදුවේ. එබැවින් පස සාරවත් කිරීම සඳහා කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රචලිත කිරීමට 2008 *වර්ෂයේ* සිට 2015 *වර්ෂය* දක්වා රු.මිලියන 1,877 ක ප්‍රතිපාදන සළසා *තිබුණු* අතර අමාත්‍යාංශයේ විවිධ වැඩසටහන් මඟින් රු.මිලියන 1,230 ක් වැය කර තිබුණි. *මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.*

මිලදී ගත් උපකරණ හා යෙදවුම් වලින් කොටසක් ගොවීන් අතර බෙදා නොදීම

කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතියක් 2012 වර්ෂයේදී ආරම්භ කර රු. *මිලියන* 100.05 ක් වටිනා උපකරණ හා යෙදවුම් ගොවීන් *අතර බෙදාදීම සඳහා මිලදීගෙන තිබුණි. 2015* දෙසැම්බර් 31 දින වන විට අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන 24 ක රු. *මිලියන* 2.65 ක උපකරණ හා යෙදවුම් ගොවීන් අතර බෙදානොදී ගබඩාවල රදවා තිබුණි.

මේ අතර උපකරණ කට්ටල 204 ක්, තහඩුමඩු 20 ක්, තණකොළ කපන මැෂින් 19 ක්, පොලිතීන් කි.ග්‍රෑම් 2427.5 ක් හා පොස්පේට් කි.ග්‍රෑම් 50 ක මිටි 1,670 ක් විය.

අපේක්ෂිත පරිදි ගොවීන් පුහුණු කිරිමට නොහැකිවීම

තෝරාගත් ගොවීන් හා නිලධාරින් 10,000 ක් මාකඳුර ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ පුහුණු කිරීම හා පුහුණුව ලැබුවන් මගින් ක්ෂේත්‍රයේ ගොවීන් 90,000 ක් පුහුණු කිරීමට රු.මිලියන 10 ක් ප්‍රතිපාදන *සළසා තිබුණි.* 2015 දෙසැම්බර් 31 *දින* වන විට ගොවීන් 4,593 ක් සහ නිලධාරීන් 2,219 ක් පමණක් පුහුණු කර තිබු අතර ක්ෂේත්‍රයේ ගොවීන් 24,860 දෙනෙකු පමණක් පුහුණු කර තිබුණි. මේ අනුව අපේක්ෂිත කාර්යසාධනය කරා *ළඟා* වී නොතිබුණි.

කුඩා කෘෂි උද්‍යාන සකස් කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රගතිය අවමවීම

ගොවිජන සේවා මධ්‍යස්ථාන 558 ක කුඩා කෘෂි උද්‍යාන ලෙස සකස් කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රගතිය සියයට 50 ක අවම මට්ටමක පැවතුණි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.

ජාතික සෞභාගය උදෙසා කෘෂිකාර්මික විශිෂ්ඨත්වය සාක්ෂාත් කර ගැනීමේ දැක්ම පෙර දැරිව ස්ථාපිත කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ප්‍රධාන අංශ 15 කින් සමන්විත *විය.* මිට සිය වසරකට පෙර ස්ථාපිත ශ්‍රී ලංකාවේ විශාලතම රජයේ දෙපාර්තමේන්තු අතරින් එකක් වු කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පර්යේෂණ හා සංවර්ධනය වෙනත් ක්ෂේත්‍ර බෝග උද්‍යාන බෝග වගාව, ව්‍යාපෘති, පුහුණු සහ සන්නිවේදන වැඩසටහන බීජ සහතික කිරිම හා පැළෑටි රෝපණය නිෂ්පාදනය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කළ යුතුව තිබුණි.

කෘෂිකර්මාන්තය පිළිබඳ පර්යේෂණ කිරිම අවම මට්ටමක පැවැතීම

2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා පර්යේෂණ අංශ වෙනුවෙන් රු.මිලියන 1,379 ක් වැය කර තිබුණු අතර 2015 වර්ෂයේ මුළු ප්‍රාග්ධන වියදමෙන් සියයට 2 ක් පර්යේෂණ වියදම් සඳහා *වැය කර* තිබුණි. එළවළු සම්බන්ධයෙන් ගන්නොරුව උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය මගින් තක්කාලි, මැකරල්, බටු, වැටකොලු හා බෝංචි යන බෝග සම්බන්ධයෙන් පමණක් පර්යේෂණ සිදුකර තිබුණ ද එය අවම මට්ටමක පැවතුණි.

බහුලව භාවිතා කරන එළවළු වර්ග කිහිපයක බීජ අවශ්‍යතාවය ආනයන මත පැවැතීම

ශ්‍රී ලංකාවේ බහුලව භාවිතා කරන බීට්රූට්, ගෝවා, කැරට්, නෝකෝල්, ලීක්ස් යන එළවළු වර්ග 5 ක බීජ අවශ්‍යතාවයෙන් වැඩි ප්‍රමාණයක් ආනයන මත *රදා පැවැතුණි.*

නිලධාරින් හට විදේශ පුහුණුව ලබාදිම

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යටතේ විවිධ විදේශ පාඨමාලා වෙනුවෙන් 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා නිලධාරීන් 1,201 ක් සහභාගි කර තිබු*ණි.* 2015 වර්ෂයේදී පමණක් නිලධාරීන් 408 දෙනෙකු වෙනුවෙන් රු. *මිලියන* 11.5*9 ක් වැය කර තිබුණි.* නමුත් පාඨමාලාව අවසන් කිරීමෙන් පසු ඇතැම් නිලධාරින් පුහුණු පාඨමාලාවට අදාල නොවන ක්ෂේත්‍රයන්හි අනුයුක්ත කර තිබුණි. එබැවින් ඔවුන් පුහුණුවෙන් ලබාගත් දැනුම දැනට අනුයුක්තවී සිටින අංශයන් යටතේ ඵලදායීව උපයෝජනය *වී නොතිබුණි.*

වී ප්‍රභේද පිළිබඳව ගොවීන් දැණුවත් කිරිම

ඒ ඒ කළාපවල දේශගුණික තත්ත්වයන්ට සුදුසු වන ආකාරයේ වී ප්‍රභේද පර්යේෂණ තුළින් හඳුන්වා දී තිබුණු නමුත් ඒවා ඒ ඒ ප්‍රදේශයන්හි භාවිතා නොකරන බව විගණනයට අනාවරණය *විය. එම වී ප්‍රභේද* ගොවීන් අතර ප්‍රචලිත කිරීම වෙනුවෙන් ඵලදායි ක්‍රියාමාර්ග *දෙපාර්තමේන්තුව විසින්* ගෙන නොතිබුණි. වර්තමානය වන විටත් ගොවීන් අතර වඩාත් ප්‍රචලිතව ඇති වී ප්‍රභේදයන් වනුයේ 1987 වර්ෂයේදී හඳුන්වා දුන් BG 300 හා 1992 වර්ෂයේදී හඳුන්වා දුන් BG 352 වී ප්‍රභේද දෙකක් පමණි.

පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන

2015 වර්ෂය සඳහා පුරන් කුඹුරු අස්වැද්දීම වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 12 ක් *සඳහා* රු.මිලියන 159.73 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 146.2 ක් *උපයෝජනය* කර තිබුණි. 2015 දෙසැම්බර් 31 *දින වන විට* ප්‍රගතිය පරීක්ෂාවේදී පුරන් වී ඇති බවට හඳුනාගෙන *තිබුණු* වගාවට යෝග්‍ය කුඹුරු අක්කර ප්‍රමාණයෙන් *සියයට 9.2* ක ප් ප්‍රමාණයක් පමණක් සංවර්ධනය කර තිබුණි.

වැවිලි කර්මාන්ත

රටෙහි සීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් වෙනුවෙන් අපනයන වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් ප්‍රධාන වැවිලි බෝගයන්ගේ ඵලදායිතාවය, ලාභදායකත්වය හා තිරසාරභාවය වර්ධනය කිරිම වැවිලි කර්මාන්ත අංශයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි.

ඉහත සඳහන් අපේක්ෂිත ප්‍රතිඵලය අත්කර ගැනීම සඳහා අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුව හා ව්‍යවස්ථාපිත ආයතන 14 ක් විසින් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- වැවිලි කර්මාන්ත විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරිම, පසුවිපරම් කිරිම හා ඇගැයීම
- වැවිලි බෝගවල ඵලදාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සානුබල සහ අනෙකුත් පහසුකම් සැලැසීම
- වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ ඵලදායිතාවය සඳහා අන්තර් ජාතික තරඟකාරීත්වය ඉහළ නැංවීම
- වැවිලි බෝග මත පදනම් වූ එකතු කළ වටිනාකම වැඩි කිරීම සම්බන්ධයෙන් කර්මාන්ත නඟා සිටුවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- තේ හා රබර් සම්බන්ධ බලපත්‍ර නිකුත් කිරිම
- තේ, රබර් හා පොල් වතු කැබැලි කිරීම සම්බන්ධව බලපත්‍ර නිකුත් කිරීම හා පාලනය කිරිම
- බහුබෝග වගාවන් සහ සංගත ගොවිපල ක්‍රම මගින් වැවිලි ඉඩම් ප්‍රශස්ථ මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම සහ එමගින් නිෂ්පාදනය සහ සේවා නියුක්තිය වැඩි කිරීම

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ විගණන නිරීක්ෂණයන් සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

ආදායම් රැස් කිරීම

වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ආදායම් සංකේතයට අදාළව රු.මිලියන 1,000 ක ආදායමක් රැස්කිරිමට ඇස්තමේන්තු කර තිබුණත්, 2015 වර්ෂය අවසානය වන විට රු.මිලියන 645 ක් හෙවත් ඇස්තමේන්තු කළ ආදායමෙන් සියයට 65 ක ප්‍රමාණයක් පමණක් රැස්කර තිබුණි. ඉකුත් වර්ෂයේ තථ්‍ය ආදායම වඩා 2015 වර්ෂයේ තථ්‍ය ආදායම රු.මිලියන 88 කින් අඩුවී තිබුණි.

හිඟහිටි ආදායම් අයකර ගැනීම

විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු. මිලියන 439.76 ක ආදායම් හිඟහිට තිබුණු අතර, එම හිඟ හිටි ආදායම වර්ෂ 01 ක සිට වර්ෂ 06 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එන නමුත් හිඟහිටි ආදායම අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දී එයින් රු. මිලියන 148.97 ක් එනම් හිඟහිටි වටිනාකමෙන් සියයට 33.8 ක් අයකර ගැනීමට ඇස්තමේන්තුකර තිබුණත් ඉන් රු.මිලියන 126.11 ක් පමණක් එකතු කර තිබුණි.

වතු සමාගම්වලින් කල් බදු කුලී අයකර ගැනීම

1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හා රජයට අයත් ව්‍යාපාර ඒකක රාජ්‍ය සමාගම් බවට පත්කිරීමේ පනත යටතේ ප්‍රාදේශීය වැවිලි සමාගම් 23 ක් පිහිටුවා ජනතා වතු සංවර්ධන මණ්ඩලයට හා ශ්‍රී ලංකා වැවිලි සංස්ථාවට අයත් වතු 571 ක් අවුරුදු 53 ක කාලයක් සඳහා ප්‍රාදේශීය වැවිලි සමාගම්වලට කල්බදු පදනම බදු දී තිබුණි. එම සමාගම්වලින් අගරපතාන, උඩුපුස්සැල්ලාව සහ ඇල්කඩුව යන සමාගම් 3 ට අයත් වතු 45 ක් සඳහා 1992 වර්ෂයේ සිට බදු කුලී අයකරගෙන නොතිබුණි. බදු කුලිය ගණනය කිරීම සඳහා භාවිත කරන ලද සූත්‍රය අනුව එම සමාගම්වල ශුද්ධ වත්කම් ප්‍රමාණය රු.මිලියන 200 කට වඩා අඩුවීම නිසා එසේ බදු කුලී අය කර නොගත් බව අමාත්‍යාංශය විසින් දන්වා තිබුණි. බදු කුලී පිළිබඳව සංශෝධනයක් කළ හැකි වන්නේ බදු ගිවිසුමේ සඳහන් කොන්දේසි සංශෝධනය කිරීමකින් පසුව වන අතර බදු ගිවිසුම්වල එවැනි සංශෝධනයක් කළ හැකි වන්නේ අදාල සමාගමේද එකඟතාවය ඇතිවය. “සමස්ථ වශයෙන් සියළුම වැවිලි සමාගම් සමඟ අත්සන් කර තිබුණු බදු ගිවිසුම්වල සඳහන් කොන්දේසිවල සිදුවිය යුතු සංශෝධනයන් පිළිබඳව අමාත්‍යාංශය විසින් මහා භාණ්ඩාගාරය දැනුවත් කර ඇති බවද”. අමාත්‍යාංශයේ ලේකම් විසින් දන්වා තිබුණි. එම සමාගම්වලින් බදුකුලී අයකර ගැනීමේ හැකියාව පිළිබඳ නැවත සලකා බැලීමක් සිදුකර නොතිබීම නිසා රජයට අයකර ගත හැකිව තිබුණු බදුකුලී ආදායම් අහිමිවී තිබුණි.

වතු සමාගම් වෙත පවරා තිබුණු වතුවල ඉඩම් හඳුනා ගැනීම

අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, වැවිලි සමාගම්වලට අයත් වතු 535 කට අයත් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 249,892 ක් වී තිබුණි. පවරන ලද ඉඩම්වල නිවැරදි භූමි ප්‍රමාණයන් හඳුනා ගැනීමට සීමා මායිම් නිර්ණයට අදාල සාක්ෂි කිසිවක් අමාත්‍යාංශය, ජනතා වතු සංවර්ධන මණ්ඩලය හෝ රාජ්‍ය වැවිලි සංස්ථාව සතුව නොතිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට කාර්මික ජනපද, ජල පහසුකම් සැපයීම් හා අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය වැනි පොදු කටයුතු සඳහා නිවාස ව්‍යාපෘති 22 ක්, පාසල් 10 ක්, වතු රෝහල් 7 ක්, ආගමික ස්ථාන 45 ක්, සුසාන භූමි 25 ක්, ක්‍රීඩා පිටි හා අනෙකුත් සුභසාධක කටයුතු වෙනුවෙන් ඉඩම් ලබාදී තිබුණි. ඒ සඳහා ලබාදී තිබූ හෙක්ටයාර් ප්‍රමාණය පිළිබඳ නිශ්චිත තොරතුරු වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශය සතුව ක්‍රමවත්ව පවත්වා නොතිබුණි. මේ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කර රජයේ ඉඩම්වල නිවැරදි අයිතිය තහවුරු කර ගැනීමට ක්‍රියාකර නොතිබුණි. 2006 ඔක්තෝබර් 13 දිනැති රජයේ ඉඩම් බදුදීම නමින් වූ අමාත්‍ය මණ්ඩල වැඩසටහන අනුව 2006 වර්ෂයේ සිට වර්ෂ 03 ක් ඇතුළත සියළු ඉඩම් මැනීමට කටයුතු කළ යුතු යැයි නිර්දේශ කර, වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සලසා ගෙන තිබුණද, ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හිඟය හා මැනුම් සඳහා ගෙවීම්වලට අදාළව පැවති ගැටළු හේතුවෙන් එම කටයුතු අවසන් කිරීමට නොහැකි වූ බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දන්වා තිබුණි.

වතුවල අනවසර හා බලහත්කාරයෙන් පදිංචි වී සිටින අය ඉවත් කිරීම

2015 වර්ෂය අවසන් වන විට වතු සමාගම් 23 ක් මඟින් පාලනය වන වතුවල අනවසර පදිංචි හා බලහත්කාර පදිංචි පුද්ගලයින් 565 කට අදාළ අනවසර ඉඩම් පරිහරණය කිරීමේ

චෝදනාව මත අධිකරණයේ නඩු 117 ක් විභාග වෙමින් පැවැතුණි. වැවිලි සමාගම් වෙත අදාළ වතු බදුදීමේදී ඒ සමගම ඇටෝර්නි බලපත්‍රයක් මගින් බදු කරු (ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව /ජනතා වතු සංවර්ධන මණ්ඩලය) විසින් බදු ගැනුම්කාර වතු සමාගම් වෙත පැමිණිලි පාර්ශවය වශයෙන් කටයුතු කිරීමට බලයක් ලබාදී තිබුණි. එම ඇටෝර්නි බලපත්‍රයේ විධිවිධාන අනුව බදු දීමනාකාර පාර්ශවයේ අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීම සඳහා ඒ ඒ අධිකරණයන්හි පෙනී සිටීමේ බලය ද බදු ගැනුම්කාර පාර්ශවය වෙත ලබාදී තිබුණි. ඒ අනුව පවරා දී තිබෙන ඉඩම් සම්බන්ධයෙන් නෛතික කටයුතු කිරීමේදී රජයේ මැදිහත් භාවය ඉවත් කරගෙන තිබුණි.

අන්තර්ජාල මෙහෙයුම් පද්ධතිය අක්‍රීය වීම

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පැවති පොල් සංවර්ධන ඒකකය හා ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් පොල් වතු කළමනාකරණය සඳහා අන්තර්ජාල මෙහෙයුම් පද්ධතියක් 2012 වර්ෂයේ සිට ක්‍රියාත්මක කළ අතර ඒ සඳහා රු. මිලියන 1.12 ක් වැය කර තිබුණි. 2015 වර්ෂයේදී අමාත්‍යාංශය යටතේ තිබුණු ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙනත් අමාත්‍යාංශයක් යටතට පත්වීම නිසා ඒ යටතේ පැවැති වතු සමාගම් 2 ක ඉවත්වීම නිසා එම මෙහෙයුම් පද්ධතිය අක්‍රීය වී තිබුණි.

වාහනයට සිදු වූ අලාභහානිය

2014 සැප්තැම්බර් 28 දින රාත්‍රියේ අධිවේගී මාර්ගයේ දී සිදු වී තිබුණු අනතුරකින් වාහනයකට රු.මිලියන 3.81 ක අලාභ හානියක් ඇස්තමේන්තු කර තිබුණි. මෙම වාහනය අළුත්වැඩියා කිරීම සඳහා 2015 අගෝස්තු 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. තවද මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර අවසන් පරීක්ෂණ වාර්තාව සති 03 ක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස 2014 ඔක්තෝබර් 15 දින අමාත්‍යාංශ ලේකම්වරයා අභ්‍යන්තර විගණනයට දන්වා තිබුණද, එම වාර්තා ඔහු විසින් 2015 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

රබර් මිලදී ගැනීමේදී කර තිබුණු සාවද්‍ය ගෙවීම

රබර් මිලදී ගැනීම වෙනුවෙන් පුද්ගලික ආයතනයකට රු. මිලියන 329 ක් සහතික මිල හා පවතින වෙළදපළ මිල අතර වෙනස ගෙවා තිබූ අතර එයින් රු. මිලියන 11.5 ක මුදලක් සාවද්‍ය ගෙවීමක් බැවින් එය අයකර ගත යුතු බවට කමිටුවක් විසින් නිර්දේශ කර තිබුණද, එකී මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

රබර් සහතික මිල යටතේ රබර් මිලදී ගැනීම

පහත සඳහන් පරිදි රබර් සඳහා සහතික මිලක් වැඩියෙන් ගෙවා තිබුණි.

- සහතික මිල ගෙවීමේ ක්‍රමවේදය යටතේ 2015 මාර්තු 12 දිනැති අංක 2015/01 දරන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව රබර් අක්කර 50 ට අඩු වගාකරුවන් පමණක් ඒ සඳහා හිමිකම් තිබුණත්, අවස්ථා 06 කදී අක්කර 50 ට වැඩි ඉඩම් හිමියන් සඳහා එකතුව රු. මිලියන 2.03 ක සහතික මිල ගෙවා තිබුණි.

- 2014 දෙසැම්බර් මාසය හා 2015 ජනවාරි මාසය අතර කාලපරිච්ඡේදය තුළ නියෝජිත ආයතන දෙකක් විසින් තමන්

මිලදීගත් රබර් ප්‍රමාණයට වඩා වැඩියෙන් රබර් මිලදී ගන්නා ආයතනයට රබර් සැපයූ බව ප්‍රකාශ කර රු.මිලියන 3.25 ක රබර් සඳහා සහතික මිල වැඩිපුර ලබාගෙන තිබුණි.

- රබර් වගාකරුවන් 17 ක් විසින් සපයන ලද රබර් කිලෝ 79,529 කට අදාල RC 14 වාර්තා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ කෑගල්ල ප්‍රාදේශීයට එවා නොතිබූ අතර එම රබර් ප්‍රමාණය කුමන වගාකරුවන්ගෙන් මිලට ගත් රබර් ප්‍රමාණයන්ද යන්න තහවුරු කර ගැනීමකින් තොරව රු. මිලියන 7.56 ක සහතික මිලක් ගෙවා තිබුණි.
- 2015 වර්ෂයට අදාලව සහතික මිල ගෙවීමේදී RC 14 වාර්තා මඟින් අදාළ තොරතුරු සහතික කර ගැනීමකින් තොරව ආයතන 03 කට රු. මිලියන 7.44 ක් වැඩිපුර ගෙවා තිබුණි.

මීටර් අක්‍රීය ලොරි රථවලට ගෙවීම් කිරීම

පැල ප්‍රවාහනය සඳහා යොදාගන්නා ලොරි රථවල මීටරය නිසි පරිදි ක්‍රියාත්මක විය යුතු බව උපදෙස් පත්‍රිකාවල සඳහන් කර තිබුණද, එසේ මීටරය ක්‍රියාත්මක නොවූ ලොරි රථ 03 කට එකතුව රු. මිලියන 1.05 ක් ගෙවා තිබුණි.

ප්‍රසම්පාදන තීරණයක් නිසා පැල ප්‍රවාහන කිරිමට වැඩිපුර ගෙවීම් කිරීම

රබර් පැල ප්‍රවාහනය කිරිම සඳහා අවම ලංසුකරු තෝරා නොගැනීම නිසා රබර් පැල 190,598 ක් ප්‍රවාහනය කිරීම වෙනුවෙන් රු.2,051,745 ක් වැඩිපුර වැය කර තිබුණි.

රබර් පර්යේෂණ ආයතනය

ණයගැති හා අයවිය යුතු මුදල් අයකර ගැනිමට අපොහොසත්විම

පහත සඳහන් කල් ඉකුත් වූ ණයගැති ශේෂයයන් හා අය කර ගත යුතු මුදල් 2015 වර්ෂය අවසාන වන විටත් අයකර ගැනිමට ආයතනය අපොහොසත් වි තිබුණි.

- 2015 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.මිලියන 13.72 ක ආයතනයට අයවිය යුතුව තිබුණි. එම ශේෂයෙන් රු.මිලියන 6.25 ක හිඟහිටි ශේෂය වර්ෂ 7 කට වැඩි කාලයක සිට පැවැත එමින් තිබුණි.
- 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල පැවති රු.මිලියන 22.55 ක් වූ වෙළඳ ණයගැති ශේෂවලින් සියයට 64 කට වැඩි ප්‍රමාණයක් වර්ෂ 10 කට වැඩි කාලයක සිටද, සියයට 27 ක් ණයගැති ශේෂ වර්ෂ 5 ක සිට වර්ෂ 10 ක් දක්වා කාලයක සිට පැවැත එමින් තිබුණත්, එම ණයගැති ශේෂ 2015 වර්ෂය අවසන් වන විටත් අයකර ගැනිමට ආයතනය අපොහොසත් වී තිබුණි.

සුදුසුකම් නොළත් නිලධාරියෙකුට තීරුබදු සහනදායි වාහන බලපත්‍රයක් නිකුත් කිරිම

2010 දෙසැම්බර් 10 දිනැති අංක 1/ 2010 දරන වෙළඳ, තීරු බදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයේ සඳහන් විධිවිධානවලට පටහැනිව කොන්ත්‍රාත් පදනම මත චතු අධිකාරීවරයකු ලෙස සේවයට බඳවා ගෙන තිබූ නිලධාරියෙකුට තීරුබදු සහනදායී

මෝටර් රථයක් ආනයනය කිරීමේ බලපත්‍රයක් ලබා දී තිබුණි. එම බලපත්‍රය යටතේ මෝටර් රථයක් ආනයනය කිරීම වෙනුවෙන් රේගු බදු සහ අනෙකුත් බදු වශයෙන් රු.මිලියන 8.09 ක් රජයට අලාභයක් සිදු වී තිබුණත්, එම අලාභය වගකිව යුතු අයගෙන් අයකර ගැනීමට 2015 දෙසැම්බර් 31 දින වන විටත් ආයතනය කටයුතු කර නොතිබුණි.

පොල් වගාකිරීමේ මණ්ඩලය

දිරි දීමනා ගෙවීම

පොල් වගා කිරීමේ මණ්ඩලයේ වතු පාලන සේවාවේ සේවකයින් හා කාර්ය මණ්ඩලය සඳහා 2013 වර්ෂය වෙනුවෙන් රු. මිලියන 3.96 ක දිරි දීමනා ගෙවා තිබුණි. ඒ සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

අවම පොල් ඵලදාව ලබා ගෙන නොතිබීම

මණ්ඩලය සතු ආදර්ශ පොල් උයන්වල කරන ලද පාංශු විශ්ලේෂණය අනුව අක්කරයකින් අවම වශයෙන් පොල් ගෙඩි 4000 කට වැඩි ප්‍රමාණයක් ලබා ගත යුතු වුවද, මණ්ඩලය සතු පොල් උයන් 12 න් 9 කට පොල් අස්වැන්න අක්කරයකට ගෙඩි 1119 ක සිට 3788 ක් දක්වා පරාසයක පැවතුණි.

පොල් සංවර්ධන අධිකාරිය

මිලදී ගෙන තිබුණු උපකරණ නිෂ්පාදනයන් සඳහා යොදා නොගැනීම

අධිකාරියේ මහනුවර ප්‍රාදේශිය කාර්යාලය විසින් සැලැසුම් කරන ලද තවාෂි බුරුසු නිෂ්පාදනය සඳහා රු.මිලියන 1.32 ක් වැය කර ප්‍රාග්ධන උපකරණ ලබා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම උපකරණ නිෂ්පාදනය සඳහා භාවිතා කර නොතිබුණි.

වත්කම් නිෂ්කාර්යව පැවැතිම

පොල් සංවර්ධන අධිකාරිය සතු පහත සඳහන් වත්කම් නිෂ්ක්‍රියව පැවැතුණි.

- අධිකාරියේ රසායානාගාරයේ සවිකර තිබූ රු.මිලියන 13.89 ක් වටිනා යන්ත්‍ර 10 ක් වසරක කාලයක සිට නිෂ්ක්‍රියව පැවැතුණි.

- 2015 අගෝස්තු 11 දින සිට 2015 ඔක්තෝබර් 28 දින දක්වා වරින් වර ගබඩාවට ලැබී තිබුණු එකතුව රු.මිලියන 3.00 ක් වූ තවාෂි බුරුසු නිෂ්පාදන උපකරණ 625 කින් 2016 අප්‍රේල් 06 දිනය වන විට එකතුව රු.මිලියන 1.73 ක් වටිනා නිෂ්පාදන උපකරණ 360 ක් පමණක් නිකුත් කර තිබුණි. ඒ අනුව ඉතිරි උපකරණ 265 ක් ගබඩාවේ නිෂ්ක්‍රියව පැවැතුණි.

- අධිකාරිය විසින් කොහු කර්මාන්ත ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් කර්මාන්තකරුවන් අතර බෙදාදීමට කොහු සැකසීම සඳහා භාවිත කරන පෙට්ටි කුට්ටම් උපකරණ 05 ක් එකක් රු.614,400 ක් බැගින් එකතුව රු.මිලියන 3.07 කට 2013 වර්ෂයේදී මිලදී ගෙන තිබුණි. එම යන්ත්‍ර ස්ථාපනය කිරීමේදී ගබඩා හා විදුලි පහසුකම් සහ ජලය රඳවා ගත හැකි භූමියක් වැනි යටිතල පහසුකම් අවශ්‍ය වුවද, වියලි කාලගුණික ප්‍රදේශයක් වන මොණරාගල දිස්ත්‍රික්කයේ ව්‍යවසායකයින් 4 දෙනෙකු වෙත යන්ත්‍ර 4 ක් බෙදාහැර තිබුණි. නමුත් එම යන්ත්‍ර

ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණු බැවින් ඉතිරි යන්ත්‍රය මේ දක්වාම කාර්මික තාක්ෂණ ආයතනයේ රඳවා තිබුණි.

පොල් පර්යේෂණ මණ්ඩලය

පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය පරීක්ෂා කිරිම

- මණ්ඩලය විසින් 2015 වර්ෂය අවසාන වන විට නිම කළ යුතුව තිබුණු ව්‍යාපෘති 16 ක් වර්ෂය අවසාන වන විටත් නිම කර නොතිබුණි. එම ව්‍යාපෘතිවලින් ව්‍යාපෘති 08 ක කාර්යසාධනය සියයට 10 ක සිට සියයට 50 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

- 2013 වර්ෂයේ ආරම්භ කර 2015 වර්ෂයේ අවසාන කිරිමට නියමිතව තිබුණු පාම් ඔයිල් වගාව පිළිබඳ සමාජ ආර්ථික සමීක්ෂණය (Socio-Economic impact Assessment of the Oil Plam Cultivation) 2015 වර්ෂය අවසාන තෙක්ම ආරම්භ කර නොතිබුණි.

- මණ්ඩලය විසින් 2015 වර්ෂයේ ආරම්භ කිරීමට සැලැසුම් කර තිබුණු පර්යේෂණ ව්‍යාපෘති 03 ක කටයුතු 2015 වර්ෂයේදී ආරම්භ කර නොතිබුණි.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ දියුණුවට අනුබලදීමේ පරමාර්ථයෙන් ස්ථාපිත ශ්‍රී ලංකා තේ මණ්ඩලය, තේ කර්මාන්තයේ තිරසාර සංවර්ධනය තුළින් රටට ලැබෙන විදේශ විනිමය ඉපැයීම් ඉහළ නංවා ගැනීම හා එමඟින් වැවිලි කර්මාන්තයේ නියැලි ප්‍රජාවගේ ආර්ථික සංවර්ධනය සහතික වීම මෙහෙවර කරගනිමින් කටයුතු කරනු ලබයි. ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය ගෝලීය තේ කර්මාන්තයෙහි අනර්ඝ තේ නිපැයුම්කරු ලෙස ප්‍රමුඛස්ථානය ලබා ගෙන තිබුණි. එසේ වුවද ශ්‍රී ලංකාවේ වත්මන් තේ කර්මාන්තය තුළ පවතින අධික නිෂ්පාදන පිරිවැය, වාර්ෂිකව අඩුවෙමින් පවතින නිෂ්පාදනය හා ගෝලීය පාරිභෝගිකයන් තම රුචිඅරුචිකම් වෙනස් කරන්නාවු කාලවකවානුවක සාම්ප්‍රදායික තේ නිෂ්පාදනය මත අඛණ්ඩව රැඳීසිටීම ලෝක වෙළඳපොල තුළ ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ ස්ථාවරත්වයට ප්‍රබල අභියෝගයක් වී ඇත.

තේ නිෂ්පාදනය හා අපනයන ප්‍රමාණයේ අඩුවිම

තේ නිෂ්පාදනය පසුගිය වර්ෂ 3 ක කාල පරිච්ඡේදය තුළ ක්‍රමාණුකූලව අඩු වෙමින් පැවැතුණි. 2013 වර්ෂයේදි තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 340 ක් වි තිබුණත්, එය 2015 වර්ෂය වන විට තේ කිලෝ ග්‍රෑම් මිලියන 329 දක්වා කිලෝ ග්‍රෑම් මිලියන 11 කින් අඩු වි තිබුණි. එමෙන්ම 2011 වර්ෂයේ තේ අපනයනය කිලෝ මිලියන 303 ක් වී එය 2014 වර්ෂය වන විට කිලෝ ග්‍රෑම් මිලියන 318 ක් දක්වා වැඩි වී තිබුණි. නමුත් 2015 වර්ෂයේදී තේ අපනයනය කිලෝ ග්‍රෑම් මිලියන 299 දක්වා අඩු වී තිබුණි. විස්තර රූපසටහන 10 හි දැක්වේ.



රූපසටහන 10 -. තේ නිෂ්පාදනය හා අපනයනය

තේවල නිෂ්පාදන පිරිවැය අඩුකිරීම හා තේ නිෂ්පාදනය වැඩි කිරිම

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ප්‍රවර්ධන කටයුතු සඳහා තේ අපනයන කරුවන්ගෙන් අය කරනු ලබන බදුවලින් ආරම්භ කරන ප්‍රවර්ධන අරමුදලින් 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 8 ක් යොදවමින් තේ ප්‍රවර්ධනය සඳහා වැඩසටහනක් නිර්මාණය කරමින් පැවතුණි. වර්තමානයේ කොළඹ තේ වෙන්දේසියේ තේ කිලෝ ග්‍රෑමයක් අලෙවි වන මිලට වඩා වැඩි පිරිවැයක් තේ කිලෝග්‍රෑමයක් නිෂ්පාදනය කිරීමට වැයවන බැවින් ප්‍රචාරණය තුළින් අධි ඉල්ලුමක් නිර්මාණය කර තේ කිලෝවක අලෙවි මිල වර්ධනය කරගැනීමට කටයුතු කර තිබුණි. නමුත් තේවල නිෂ්පාදන පිරිවැය අවම කිරීමට, පහල යන තේ නිෂ්පාදනයේ වර්ධනයට ප්‍රමාණවත් පියවර ගැනීම හා තේ වල ගුණත්වය වර්ධනයට මෙම අරමුදල් යෙදවීම ආර්ථික බවින් වැඩි බැවින් වර්තමානයේ තේ කර්මාන්තයේ පවතින ගැටළු හඳුනාගෙන ඒවාට විසඳුම් ලබාගැනීමේ වැඩ පිළිවෙලකට යොමු වී නොතිබුණි.

තේ අලෙවි මණ්ඩලයේ අලාභය අවම කර ගැනිම

ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන් අතර තේ ප්‍රචලිත කිරීමේ පරමාර්ථයෙන් 2013 වර්ෂයේදී රු.මිලියන 58.37 ක් වැයකර කොළඹ තුරඟ තරඟ පිටිය ගොඩනැගිල්ලේ ස්ථාපනය කළ තේ අලෙවි මධ්‍යස්ථානය, ආරම්භක වර්ෂයේ සිටම අලාභ ලබා තිබුණි. 2015 වර්ෂයේදී වූ අලාභය රු.මිලියන 19.69 ක් විය. තේ ප්‍රවර්ධන කටයුත්තක් ලෙස ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබුණි. මෙලෙස විශාල අලාභයක් ලබමින් පවත්වාගෙන යනු ලබන මෙම මධ්‍යස්ථානයෙහි අලාභය අවම කර ගැනීම සඳහා මණ්ඩලය විසින් විධිමත් ක්‍රියාමාර්ගයන් ද ගෙන නොතිබුණි.

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

කුඩා තේ ඉඩම් සංවර්ධනය කිරීම, නිෂ්පාදනය වැඩි කිරීම, ඵලදායීතාවය වර්ධනය කිරීම සහ කුඩා තේ ඉඩම් හිමියන්ගේ සුභ සිද්ධිය පිණිස කටයුතු කිරීම ආයතනයේ පරමාර්ථ විය. ආයතනය සම්බන්ධයෙන් සිදු කළ විගණනයේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- 2015 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ මුළු තේ නිෂ්පාදනයට කුඩා තේ වතු හිමියන්ගේ දායකත්වය කිලෝග්‍රෑම් මිලියන 239.86 ක් හෙවත් සියයට 72.91 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී කුඩා තේ වතු

හිමියන්ගේ දායකත්වය කිලෝග්‍රෑම් මිලියන 7.5ක අඩුවීමක් සිදු වී තිබුණි.

- ජාතික ප්‍රතිපත්තියට අනුව, කුඩා තේ ඉඩම්වල තේ නිෂ්පාදනය හා ඵලදායිතාවය වැඩි කරමින්, තේ භූමි ප්‍රමාණය ස්ථායීව පවත්වා ගනු පිණිස අඩු අස්වනු සහිත පැරණි බීජ තේ ඉඩම් හි අනුමත රිකිලි තේ නැවත වගාකිරීම සඳහා වන වගා සංවර්ධන ආධාර ක්‍රමය යටතේ පවත්නා භූමි ප්‍රමාණයෙන් සියයට 2 ක් තේ නැවත වගාව සඳහා ඉලක්ක සකසා තිබුණද ආයතනයේ ප්‍රගති සමාලෝචන වාර්තා අනුව සපුරා තිබූ ප්‍රගතිය සියයට 0.67 ක් පමණක් වී තිබුණි.

- තේ අළුතින් වගා කිරීමේ දිරි දීමනා ක්‍රමය සම්බන්ධයෙන් වූ කාර්යසාධන වාර්තාව අනුව 2015 වර්ෂයේ අළුතින් වගාව නිම කළ බිම් ප්‍රමාණය හෙක්ටර්යාර් 479 ක් වූ අතර ක්‍රියාකාරී සැලැස්ම අනුව අපේක්ෂිත ඉලක්කය කරා ළඟා කර ගෙන තිබුණි. එසේ වුවද, තේ අළුත් වගාව සඳහා ගෙවන සහනාධාර මුදල 2015 වර්ෂයේදී හෙක්ටයාරයකට රු.250,000 ක සිට රු.400,000 ක් දක්වා වැඩි කර තිබූ අතර ගෙවන ලද මුළු සහනාධාර ප්‍රමාණය රු.මිලියන 128.12 ක් වී තිබුණි. ගෙවන ලද සහනාධාර ප්‍රමාණය ඉකුත් වර්ෂය හා සැසඳීමේ සියයට 91 කින් වැඩි වී තිබුණද, ඉකුත් වර්ෂයට සාපේක්ෂව තේ අළුතින් වගා කළ බිම් ප්‍රමාණයේ වැඩිවීම සියයට 19 ක් වී තිබුණි.

තේ ශක්ති අරමුදල

තේ කර්මාන්ත ශාලා අත්කර ගැනීම හා සංවර්ධනය කිරීම, තේ කර්මාන්ත ශාලාවල නිෂ්පාදනය අලෙවි කිරීම හා ප්‍රවර්ධනය කිරීම, ඉතිරි කිරීමේ පුරුදු ඇති කිරීම හා ප්‍රවර්ධනය කිරීම මගින් තේ කර්මාන්තයේ නියැලී සිටින කුඩා තේ වතු හිමියන් නඟා සිටුවීමේ අරමුණු පෙරදැරිව තේ ශක්ති අරමුදල පිහිටවනු ලැබීය. මේ සම්බන්ධයෙන් සිදුකළ විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- අරමුදලට අයත් කම්හල් 14 ක් අතරින් කම්හල් 10 ක් පමණක් 2014 වර්ෂයේදී ක්‍රියාකාරීව පැවති අතර එම සියළුම කම්හල්වලින් එකතුව රු. මිලියන 115.48 ක් වූ අලාභ ලබා තිබුණි.
- කම්හල් අලාභය අවම කිරීම සඳහා වැඩි දළු ප්‍රමාණයක් මිලදී ගැනීමේ අරමුණින් තේ දළු සඳහා වැඩි මිලක් ගෙවා තේ දළු මිලදී ගෙන තිබුණද, එම අරමුණ ඉටු වී නොතිබුණි. කෙසේවුවද, අමතර පිරිවැය දැරීමෙන් පිරිවැය ඉහළ යාමක් පමණක් සිදු වී තිබුණි.

තේ පර්යේෂණ මණ්ඩලය

තේ වගා කිරීම සහ නිෂ්පාදනය කිරීම පිළිබඳව පර්යේෂණ කිරීමෙහිලා නියුක්ත වීම සහ ඒ සඳහා අනුබල දීම , පෝෂණය කිරීම හා පහසුකම් සැලසීම මණ්ඩලයේ කර්තව්‍ය වේ. එම අරමුණු ඉටුකරගැනීම සඳහා මණ්ඩලය විසින් අරමුදල් වැයකර අරඹන ලද ඇතැම් පර්යේෂණ කාර්යයන් පර්යේෂණ නිලධාරින්ගේ ඉවත්ව යාම, විශ්‍රාම ගැනීම හා විදෙස් ගත වීම හේතුවෙන් අතර මඟ නවතා දැමීමට සිදුවී තිබුණි. එමනිසා තේ නිෂ්පාදනයේ ඵලදායිතාව සහ ගුණත්වය වඩාත් ලාභදායි ලෙස ඉහළ නැංවීම සඳහා යෝග්‍ය විද්‍යාත්මක දැනුම හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ ආයතනික මෙහෙවර ඉලක්ක ගත කාලය තුළ ඉටුකර ගැනීම මන්දගාමීවී තිබුණි.

ඉඩම්

තිරසාර සංවර්ධනය උදෙසා ඉඩම් සම්පත ප්‍රශස්ත ලෙස භාවිතා කිරිම මෙම අංශයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී ඇත. අමාත්‍යාංශය හා ඒ යටතේ දෙපාර්තමේන්තු 4 ක් හා එක් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් මගින් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කිරීමෙන් එම ප්‍රතිඵලය ළඟා කර ගැනිමට අපේක්ෂා කර තිබුණි.

- ඉඩම් විෂයයට අදාළ ප්‍රතිපත්ති වැඩසටහන් සහ ව්‍යාපෘති සකස් කිරිම සහ ක්‍රියාත්මක කිරිම
- තිරසාර සංවර්ධනය උදෙසා ඉඩම් පරිහරණය ප්‍රතිපත්තිවලට අනුකූලව සිදු කරනු ලබන අධ්‍යයනයන් මත අදාළ අංශ සඳහා උපදෙස් ලබාදිම
- රජයේ ඉඩම් පරිපාලනය සහ කළමනාකරණය
- නිතියෙන් නිශ්චය කොට දක්වා ඇති පරිදි ඉඩම් අන්සතු කිරිම
- ජාතික අවශ්‍යතාවන් සඳහා ඉඩම් අත්පත් කර ගැනිම
- රජයේ ඉඩම්වල අයිතිය තහවුරු කිරිම සඳහා දිමනා පත්‍ර ලබා දිම
- සංවර්ධන සහ නේවාසික අවශ්‍යතා සඳහා රජයේ ඉඩම් දීර්ඝකාලිනව හා කෙටිකාලීනව බදුදිම
- ඉඩම් අයිතිය තහවුරු කිරිම සඳහා හිමිකම් සහතික ලියාපදිංචි කිරිම
- ජාතික සැලැසුම්කරණය ඉලක්ක කරගෙන ඉඩම් මැනිම, සිතියම් සකස් කිරිම හා අනුරේඛන සම්පාදනය කිරිම
- රටේ සියළුම ඉඩම් පිළිබඳව තොරතුරු පද්ධතියක් සකස් කිරිම

ඉහත සඳහන් අමාත්‍යාංශය හා ඒ යටතේ වන ආයතන විසින් තම කාර්යභාරයන් ඉටු කිරිම සම්බන්ධයෙන් සිදු කළ විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

ඉඩම් අමාත්‍යාංශය

රටේ සියළුම ඉඩම් පිළිබඳ තොරතුරු පද්ධතියක් සකස් කර නොතිබීම

රටේ සියළුම ඉඩම් පිළිබඳ තොරතුරු පද්ධතියක් සකස් කිරිම ප්‍රධාන කාර්යභාරයක් වි තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම කාර්යභාරය ඉටු කර නොතිබුණි. මේ නිසා රජය සතු මුළු ඉඩම් ප්‍රමාණය පිළිබඳ සත්‍ය තත්ත්වය හෙළිදරව් කර ගැනීමට නොහැකි වී තිබුණි.

ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉඩම් කැබැලි පරිගණක ගත කිරිම

රජයේ ඉඩම් කළමනාකරණ කටයුතු පහසු හා කාර්යක්ෂමව කරලීම සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය නිර්මාණය කිරීමට කටයුතු කර තිබුණි. මේ යටතේ e - slims නමින් පරිගණකගත තොරතුරු පද්ධතියක් සකස් කර තිබුණු අතර, එම තොරතුරු පද්ධතියට දත්ත රැස් කර ඇතුළත් කිරිම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සිදු කරමින් පැවැතුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 127 ක e-slims ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණු අතර පරිගණක පද්ධතියට ඉඩම් කැබලි 144,725 ක දත්ත ඇතුළත් කර තිබුණි.

2016 මැයි 31 දින වන විට ඉඩම් කැබලි 275,360 ක තොරතුරු පරිගණක පද්ධතියට ඇතුළත් කර තිබුණි. 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉඩම් කැබලි 200,000 ක තොරතුරු ඇතුළත් කිරීමට ඉලක්කගත කර තිබුණද, කැබලි 144,725 ක් හෙවත් ඇතුළත් කළ යුතුව තිබුණු කැබලි සංඛ්‍යාවෙන් සියයට 72 ක පමණ ප්‍රගතියක් අත්කර ගෙන තිබුණි.

රජයේ ඉඩම් බදු දීම පිළිබඳ විස්තර ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබීම

සංවර්ධන හා නේවාසික අවශ්‍යතා සඳහා රජයේ ඉඩම් දීර්ඝ කාලීනව හා කෙටිකාලීනව බදු දීමද ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්යභාරයක් වුවද, 2015 දෙසැම්බර් 31 දින වන විටත් ඉඩම් ප්‍රමාණය පිළිබඳ තොරතුරු ලේඛනගත කිරීමක් සිදු කර නොතිබුණි.

ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් විශාල පිරිවැයක් දැරීමට සිදු වී තිබීම

විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා කඩිනමින් පෞද්ගලික ඉඩම් රජයට අත්කරදීම සඳහා අවශ්‍ය නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයන් අනුගමනය කිරීමද, රජයේ අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුවලට අත්කර ගනු ලබන ඉඩම් සඳහා වන්දි ගෙවීම හා අත්කර ගැනීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමේදී අත්කර ගැනීමේ නිලධාරින් නියාමනය කිරීමද අමාත්‍යාංශයේ ඉඩම් අත්පත් අංශය මගින් සිදු කර තිබුණි. 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(අ) වගන්තිය ප්‍රකාරව ඉඩමක සන්තකය භාර ගැනීම සඳහා 2015 වර්ෂයේදී අත්කර ගෙන තිබුණු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 1357.88 ක් වි තිබුණි. ඉඩම් අත්පත් කරගැනීමේ ප්‍රගතිය පිළිබඳව සලකා බැලීමේදී 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළ දැනට ක්‍රියාත්මක ඉඩම් අත්පත් ලිපිගොනු ගණන 11,428 ක් වූ අතර වන්දි ගෙවා වැඩ අවසන් කර තිබුණු ගොනු ගණන 102 ක් ද, අතහැර දැමූ අක්‍රිය ලිපිගොනු ගණන 305 ක් වි තිබුණි. 2015 වර්ෂයේදී ඉඩම් අත්පත් කරගැනීම සඳහා වන්දි ලෙස රු.මිලියන 1,191.45 ක් ද ලිපිගොනු 99 ක් සඳහා පොලිය රු. මිලියන 545.57 ක් ද ගෙවා තිබුණි. ඉන් 2005 වර්ෂයේදී අත්පත් කරගෙන තිබුණු ඉඩම් වෙනුවෙන් පමණක් රු.මිලියන 92.99 ක් ද, 2005 වර්ෂයට පෙර වර්ෂවල අත්පත් කරගෙන තිබුණු ඉඩම් වෙනුවෙන් රු. මිලියන 225.49 ක් ද පොලී වශයෙන් ගෙවා තිබුණි. මේ අනුව 1950 අංක 9 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38(අ) අතුරු විධාන ආඥාව යටතේ ඉඩම් අත්පත් කරගැනීමකදී ඇති වන ප්‍රමාදවීමක් හේතුවෙන් වන්දි ගෙවීම අවසන් වන දිනය දක්වාම පොලී ගෙවීමට සිදු වීමෙන් රජයට විශාල පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි. එසේම 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙන් අපේක්ෂා කර තිබුණු අමාත්‍යාංශ හා රජයේ දෙපාර්තමේන්තු සඳහා ඉඩම් නිදහස් කිරීමද, කර්මාන්ත සංවර්ධනය සඳහා ඉඩම් වෙන් කිරීමද යන කාර්යයන් සිදු කර නොතිබුණි.

බිම්සවිය වැඩසටහන

ශ්‍රී ලංකාවේ ඉඩම් සම්පතෙහි හිමිකම නිරවුල් කර අනාගත පරපුර සුරක්ෂිත කිරීමේ අරමුණ ඇතිව බිම්සවිය වැඩසටහන ක්‍රියාත්මක වේ. මේ සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සහ අදාල දෙපාර්තමේන්තු සහ ආයතන සම්බන්ධීකරණ කටයුතු මෙන්ම ප්‍රගති සමාලෝචනය අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබයි. මෙයට දායකත්වය සපයන ආයතන ලෙස මායිම් කඩඉම් සිතියම් සකස් කිරීම මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින්ද, ඉඩම් හිමිකම් විමර්ශනය කොට එය තහවුරු කර ගැනීමේ කටයුතු ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව මගින්ද සිදු කරනු ලබන

අතර ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මගින් රජයේ ඉඩම්වලට අදාල සියලු කාර්යයන් ඉටු කරමින් දායකත්වය සපයනු ලබයි.

බිම් සවිය වැඩසටහන සඳහා 2015 වර්ෂයට අදාල ප්‍රතිපාදනවලින් අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු රු.මිලියන 141.00 කින් රු.මිලියන 35.20 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 105.80 ක් හෙවත් සියයට 75 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

හිමිකම් පත් නිකුත් කිරීමේ ප්‍රමාදය

2015 වර්ෂයේදී හිමිකම් සහතික පත් 206,580 ක් නිකුත් කිරීමට අපේක්ෂා කර තිබුණත්, වර්ෂය තුළ ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ ලියාපදිංචි කළ කැබැලි සංඛ්‍යාව 43,132 ක් වී තිබුණි. එසේ ලියාපදිංචි කළ ප්‍රමාණයෙන් කැබැලි 29,043 කට අදාළ හිමිකම් සහතික පත්‍ර පුද්ගලයන් වෙත නිකුත් කර තිබුණි.

සැලැසුම් සහගතව මිනුම් නොකිරීම

සියලු ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් සඳහා මැනුම් සේවා සැපයීම මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාර්යක් වන අතර වාර්ෂිකව ලැබෙන මැනුම් නියෝග අනුව මැනුම් කටයුතු සිදු කරනු ලබයි. මෙසේ ලැබුණු මැනුම් නියෝගයන්ගෙන් 2009 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ඉතිරිව පැවති හිග මැනුම් නියෝග සංඛ්‍යාව 22,941 විය. මෙසේ ඉතිරිව පැවති මැනුම් නියෝග සම්පූර්ණ කිරීමට විශේෂ සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යවස්ථාපිත මණ්ඩලය වූයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවයි. අක්කර 50 කට වැඩි කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණයක් කිසිම තැනැත්තෙකු විසින් අයිතිව තබා නොගැනීම සුරක්ෂිත කිරීම සහ යම් තැනැත්තෙකුට අයිති උපරිමයට වැඩි කෘෂි කාර්මික ඉඩම් පවරා ගැනීම හා ඒ ඉඩම්වල නිෂ්පාදනය සහ ඒ ඉඩම්වලින් ඇති වන රැකිරක්ෂා ප්‍රමාණය වැඩිවීමේ ප්‍රතිඵලය ගෙන දෙන ක්‍රමයකට ඒවා ප්‍රයෝජනට ගැනීම යන අරමුණු පෙරදැරි කරගෙන 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටුවා තිබුණි. ඉඩම් හිමියන්ගේ නීතිමය බැදීම් ලබා දීම මෙන්ම ඔවුනට වන්දි මුදල් ගෙවීම, පවරා ගත් ඉඩම් ඵලදායි ආයෝජනවලට යෙදවීම කොමිෂන් සභාවට ලැබිය යුතු ආදායම රැස් කිරීම හා ඉඩම් ආරක්ෂා කිරීම ප්‍රධාන ප්‍රමුඛතාවයන් වේ. කොමිෂන් සභාව සතු ඉඩම් පනතේ 22(1) වගන්තිය යටතේ බදු දීමෙන් පවරා දීම, විකිණීමෙන් පවරා දීම, වාසය පිණිස නිවාස ඉදිකිරීම සඳහා පවරා දීම, ගොවිපලක් හෝ වැවිල්ලක් සඳහා සහ පොදු කටයුත්තක් සඳහා ප්‍රයෝජනයට ගැනීම, රාජ්‍ය වැවිලි සංස්ථාවට පවරා දීම යනාදී විවිධ ක්‍රම යටතේ උපයෝජනය කිරීමට ඉඩ සළසා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- කොමිෂන් සභාව සතුව පවතින ඉඩම් ප්‍රමාණය දැක්වෙන ලේඛන ගත සාක්ෂි 2015 දෙසැම්බර් 31 දින වන විටත් යාවත්කාලීන කර නොතිබුණි.

- හිඟ ආදායම් රැස්කර ගැනීමට අදාළව වාර්තා තබා ගැනීමක් සිදු කර නොතිබුණි.

- රාජ්‍ය ආයතනවලට පවරන ලද ඉඩම් වෙනුවෙන් ආදායම් ලබා ගැනීම දුර්වල මට්ටමක පැවැතුණි.

- සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුද්ගලයන් වෙත පවරන ලද ඉඩම් සඳහා හිඟහිටි බදු මුදල් අයකර ගැනීමේ ක්‍රමවේදයක් පිළියෙල කර නොතිබුණි.

- ඛණිජ සම්පත් ආදායම් අයකර ගැනීම සම්බන්ධයෙන් බදු ගිවිසුම්වලට එළඹීමක් 2016 මැයි 30 දින වන විටත් සිදු කර නොතිබුණු බැවින් අය නොවී පවතින ආදායම් රැස්කර ගැනීමට නෛතික ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබුණි.

සංස්කෘතික සහ කලා කටයුතු

සමාජයේ සංස්කෘතික අගයන් වැඩි දියුණු කිරීමේ අපේක්ෂිත ප්‍රතිඵලය ළඟා කර ගැනීම සඳහා අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු හතරක් මඟින් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- ශ්‍රී ලංකාවේ ජාතික සංස්කෘතියේ සියළුම අංගයන් අභිවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- විදේශ රටවල් සමඟ සංස්කෘතික සබඳතා පවත්වා ගෙන යාම
- සංස්කෘතික හා පුරාවිද්‍යාත්මක උරුමයන්ට හානි නොවන පරිදි සංස්කෘතිය පදනම් වූ සංචාරක වැඩසටහන් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම
- සිංහල විශ්ව කෝෂය, සිංහල ශබ්ද කෝෂය හා මහාවංශය සම්පාදනය සඳහා අඛන්ඩව අවශ්‍ය පියවර ගැනීම
- ජාතීන් අතර සහයෝගය ඇති කිරීමෙහිලා සංස්කෘතිකමය දායකත්වය යොදා ගැනීමේ ප්‍රවණතාවයන් හඳුනාගැනීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම

ඉහත සඳහන් කාර්යභාරයන් ඉටු කිරීම සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු පිළිබඳව සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

අනුරාධපුරය ප්‍රාසාංගික කලා රඟහල ඉදිකිරීම

2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ අනුරාධපුරය ප්‍රාසාංගික කලා රඟහලක් ඉදිරීම වෙනුවෙන් රු. මිලියන 0.32 ක් ගෙවා තිබුණු අතර තවත් රු.මිලියන 23.84 ක බැදීම්වලට එළඹ තිබුණි. නමුත් එම ඉදිරීකිරීම සිදු කර තිබුණු ඉඩමේ අයිතිය නිරවුල් කර ගෙන නොතිබුණි. ඉදිකිරීම සඳහාශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබුණු අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියද ලබා ගෙන නොතිබුණි.

ආදිවාසි ජන සංස්කෘතිය සංරක්ෂණය කිරීමේ වැඩසටහන

ආදිවාසි ජන සංස්කෘතිය සංරක්ෂණය කිරීමේ වැඩසටහනට අදාළව ශ්‍රී ලංකාවේ ආදිවාසීන්ගේ පාරම්පරික වෙදකම හා වෙනත් සාම්ප්‍රදායික පුරුදු පිළිබඳ දැනුම අධ්‍යයනය හා ප්‍රවර්ධනය කිරීම සඳහා බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණ ආයතනය සමඟ අමාත්‍යාංශය 2009 දෙසැම්බර් 16 දින සිට 2010 අගෝස්තු 31 දින දක්වා කාලය සඳහා අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. ඒ සඳහා 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා රු.මිලියන 3.25 ක් වැය කර තිබුණි. 2012 නොවැම්බර් 06 දින පර්යේෂණ ග්‍රන්ථයේ අත්පිටපත අමාත්‍යාංශය වෙත ලබාදී තිබුණද, 2016 ජුනි 30 දින වන විටත් එම ග්‍රන්ථය මුද්‍රණය කර ප්‍රකාශයට පත්කර නොතිබුණි.

අධ්‍යාපනය

ගුණාත්මක අධ්‍යාපනයක් උදෙසා විෂයය නිර්දේශය තුළින් බුද්ධි, ගුණගරුකභාවය, පෞරුෂත්වය හා යහපැවැත්ම යනාදියෙන් පරිපූර්ණ මානව සම්පතක් බිහිකිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒ යටතේ දෙපාර්තමේන්තු හතරක් ව්‍යවස්ථාපිත ආයතන නවයක් මගින් පහත සඳහන් ප්‍රධාන කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- ලෝක තරඟකාරීත්වයට ආත්ම විශ්වාසයකින් සහ සාර්ථකත්වය පිළිබඳ විශ්වාසයකින් යුතුව ප්‍රවේශවීමට ශ්‍රී ලාංකික ළමා සහ යෞවන පරපුරට හැකියාව ඇති කරවන අන්දමේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරිම

- ජාතික අරමුණු ළඟාකර ගත හැකි පරිදි ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම

- ජාතික පාසල් සඳහා භෞතික හා මානව සම්පත් සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- නොමිලේ පෙළ පොත්, නිල ඇඳුම්, පාහවන් හා දිවා ආහාර ලබාදීම

- සමස්ථ අධ්‍යාපන පද්ධතිය තුළ හා සිසුන් අතර අධ්‍යාපනයෙහි ගුණාත්මක බව සහ විනය සහතික කර ගැනීම

- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ පරිපාලනය හා පිරිස් කළමනාකරණ කටයුතු, බෞද්ධ හා පාලි අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ පිරිවෙන් අධ්‍යාපනය නඟා සිටුවීම

- ඓතිහාසික, පුරාවිද්‍යාත්මක සංස්කෘතික උරුමයන් සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම

- රාජ්‍ය ලේඛන විධිමත් කළමනාකරණය හා සංරක්ෂණය කිරිම

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන විසින් එම කාර්ය භාරයන් ඉටු කිරිම සම්බන්ධයෙන් විගණනයේදී අනාවරණය වූ වැදගත් හා ප්‍රමාණාත්මක විගණන නිරීක්ෂණ පහත දක්වා ඇත.

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල

පසුගිය වර්ෂ කිහිපය තුළ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සමත් වී උසස් පෙළ සඳහා සුදුසුකම් ලබන ශිෂ්‍ය ප්‍රමාණය ක්‍රමයෙන් වැඩිවෙමින් පැවැතුණි. එම විභාගයේ සියළු විෂයයන් අසමත් සිසුන් ප්‍රමාණය සීඝ්‍රයෙන් අඩුවෙමින් පැවතුනු නමුත්, 2014 වර්ෂයට සාපේක්‍ෂව 2015 වර්ෂයේදී සියළු විෂයයන් අසමත් වූ සිසුන් ප්‍රමාණය නැවතත් 551 දෙනෙකුගෙන් වැඩි වී තිබුණි. ප්‍රධාන හර විෂයයන් වූ සිංහල හා ගණිතය විෂයයන්ගෙන් අසමත් මුළු සිසුන් සංඛ්‍යාව 2013 වර්ෂයේ 142,357 ක්, 2014 වර්ෂයේ 136,070 ක් හා 2015 වර්ෂයේදී 144,879 ක් වී තිබුණි. ඒ අනුව 2013 ට සාපේක්‍ෂව 2015 වර්ෂයේදී ශිෂ්‍යයින් 2,522 කින් වැඩි වී තිබුණි.

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ වෙනුවෙන් සිසුන් ඇතුළත් කර ගැනීම

2014 වර්ෂයේදී මහරගම හැර අනෙකුත් විද්‍යාපීඨ 18 ට ඇතුළත් කරගෙන තිබුණු ශිෂ්‍ය ගුරු සංඛ්‍යාව 3,407 ක් වී තිබුණි. 2015 වර්ෂය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ වර්ෂය ලෙස නම්කර තිබුණි. 2018 වර්ෂයේදී උද්ගත වන පුරප්පාඩු සංඛ්‍යාව ප්‍රාදේශිය ලේකම් කාර්යාල හරහා කැඳවමින් 2015 වර්ෂයේ ඇතුළත් කරගැනීමට අපේක්ෂිත ගුරු ශිෂ්‍ය සංඛ්‍යාව 3,720 ක් වී තිබුණි. නමුත් 2015 වර්ෂය සඳහා ගුරු ශිෂ්‍යයන් ඇතුළත් කරගැනීමේ කටයුතු 2016 ජුනි 30 දින වන විටත් අවසන් කර නොතිබුණි.

පත්වීම් ලද විෂයයට පරිබාහිරව විෂයයන් සඳහා ගුරුවරු අනුයුක්ත කිරිම

ජාතික පාසල් 83 ක ගුරුභවතුන් 495 දෙනෙකු ඔවුන් පත්වීම් ලද විෂයයට පරිබාහිර විෂයයන් ඉගැන්වීම සඳහා අනුයුක්ත කර තිබුණි. විශේෂයෙන් ජාතික පාසල් 32 ක ප්‍රාථමික ගුරු පුහුණුව නොළද ගුරුභවතුන් 132 දෙනෙකු ප්‍රාථමික ශ්‍රේණිවලට අනුයුක්ත කර තිබුණි.

නියෝජ්‍ය විදුහල්පතිවරුන් හා සහකාර විදුහල්පතිවරුන් අනුමත සීමාව ඉක්මවා අනුයුක්ත කිරීම

ජාතික පාසලක් සඳහා නියමිත නියෝජ්‍ය විදුහල්පතිවරුන් සංඛ්‍යාව ඉක්මවා ජාතික පාසල් 55ක නියෝජ්‍ය විදුහල්පතිවරුන් 99 දෙනෙකු පත්කර තිබුණු අතර ජාතික පාසලක් සඳහා නියමිත සහකාර විදුහල්පතිවරුන් සංඛ්‍යාව ඉක්මවා ජාතික පාසල් 28ක සහකාර විදුහල්පතිවරුන් 61 දෙනෙකු පත්කර තිබුණි.

අධීක්ෂණ ගුරුභවතින් වෙත ඉගැන්වීමේ කාල පරිච්ඡේද ලබාදීම

ජාතික පාසලක අධීක්ෂණ කාර්යයේ නියුතු ගුරුභවතුන් වෙත සතියකට අවම වශයෙන් විනාඩි 40 ක ඉගැන්වීමේ කාල පරිච්ඡේද 16 ක් පැවරිය යුතු වුවත්, ජාතික පාසල් 14 ක ගුරුභවතුන් 59 දෙනෙකු වෙත එකදු කාල පරිච්ඡේදයක් හෝ ලබාදී නොතිබුණු අතර, ජාතික පාසල් 12 ක ගුරු භවතුන් 66 දෙනෙකු වෙත ඉගැන්වීම් කාල පරිච්ඡේද 16 කට වඩා අඩු සංඛ්‍යාවක් ලබාදී තිබුණි.

පානිය ජලය හා සනිපාරක්ෂක පහසුකම් ලබාදීම

පසුගිය වසර වන විට පානීය ජල පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව සියයට 43.7 ක් වී තිබුණු අතර, සනීපාරක්‍ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව සියයට 24.8 ක් විය. සෞඛ්‍යමත් පාසල් ප්‍රජාවක් උදෙසා සනීපාරක්‍ෂක පහසුකම් සැපයීම වෙනුවෙන් පාසල් 1066 ක් වෙත රුපියල් මිලියන 2,051 ක් 2015 වර්ෂයේදී ගෙවා තිබුණි. එම මුදලින් වැයකර සිදුකර ඇති කාර්යයන් අධ්‍යයනය සඳහා ප්‍රගති වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

කාර්ය මණ්ඩල ඌනතා හා අතිරික්තතාවයන් පැවතීම

- නාත්තන්ඩිය ජාතික පාසලක වූ ගුරු ඌනතාවය 16 ක් හා අතිරික්තතාවය 22 ක් පැවැතීම අවම කිරීමට කටයුතු කර නොතිබුණු අතර, මුළු ගුරුභවතුන් 162 න් 52 ක්ම නියමිත කාල පරිච්ඡේද ප්‍රමාණයන් ආවරණය කර නොතිබුණි.

මීට අමතරව 2016 උසස් පෙළ විෂයයන් සඳහා සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යය ගුරුවරු 15 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි.

- කොළඹ 07 බාලිකා විද්‍යාලයක ගුරුභවතුන් 04 ක ඌනතාවයන් හා 24 ක අතිරික්තතාවයන් අවම කිරීමට කටයුතු කර නොතිබුණි.

- 2015 දෙසැම්බර් 31 දිනට ජාතික පාසැල් 110 ක පවතින ගුරු ඌනතා 1,524 ක් හා අතිරික්තතා 770 ක් අවම කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

- 2015 වර්ෂය අවසාන වන විට අධ්‍යාපන අමාත්‍යාංශයේ පුරප්පාඩු 6,858 ක් පිරවීමටද, 4,507 ක අතිරික්තයක් අවම කිරීමටද අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

- ජාතික පාසල් 37 ක් වෙත දෙවන භාෂාවක් ලෙස දෙමළ හෝ සිංහල ඉගැන්වීම සඳහා ප්‍රමාණවත් ගුරුභවතුන් සංඛ්‍යාවක් අනුයුක්ත කර නොතිබුණු අතර, ඒ සඳහා බඳවා ගෙන තිබුණ බාහිර ගුරුභවතුන් 41 දෙනෙකු වෙනුවෙන් වැටුප් ලෙස රු.මිලියන 3.78 ක් 2015 වර්ෂයේදී පාසල් සංවර්ධන සමිතිවලින් ගෙවා තිබුණි.

- 2015 දෙසැම්බර් 31 දින වන විට ජාතික පාසල් 39 ක පාසල් සංවර්ධන සමිතිවලින් හෝ වෙනත් අරමුදල්වලින් වැටුප් ගෙවමින් බඳවා ගෙන තිබුණු අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව 196 ක් වූ අතර, 2015 වර්ෂයේදී පමණක් මුළු වැටුප් හා දීමනා වශයෙන් රු. මිලියන 26.38 ක් ගෙවා තිබුණි.

- 2015 දෙසැම්බර් 31 දින වන විට ජාතික පාසල් 29 ක අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 143 දෙනෙකුගේ අතිරික්තයක් සහ ජාතික පාසල් 73 ක අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 778 දෙනෙකුගේ ඌනතාවයක් ද විය.

ගුරුභවතුන් පත්කර තිබීම හා කාලසටහන් ලබා දීම

- ජාතික පාසලක නියෝජ්‍ය විදුහල්පතිවරුන් වෙත සතියකට කාල පරිච්ඡේද 10 ක් අවම වශයෙන් ඉගැන්වීම් කටයුතු පැවරිය යුතු නමුත්, ජාතික පාසල් 35 ක නියෝජ්‍ය විදුහල්පතිවරුන් 73 දෙනෙකු වෙත එකම කාල පරිච්ඡේදයක් හෝ ඉගැන්වීම් කටයුතු පවරා නොතිබුණි. ජාතික පාසල් 9 ක නියෝජ්‍ය විදුහල්පතිවරුන් 10 දෙනෙකු වෙත ලබාදී තිබුණු කාලපරිච්ඡේද සංඛ්‍යාව 02 ක සිට 06 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

- සහකාර විදුහල්පතිවරුන් වෙත සතියකට විනාඩි 40 ක කාල පරිච්ඡේද 12 ක් අවම වශයෙන් ඉගැන්වීම් කටයුතු පැවරිය යුතු නමුත්, ජාතික පාසල් 12 ක සහකාර විදුහල්පතිවරුන් 19 දෙනෙකු වෙත එකම කාල පරිච්ඡේදයක් හෝ ඉගැන්වීම් කටයුතු පවරා නොතිබුණි. ජාතික පාසල් 12 ක සහකාර විදුහල්පතිවරුන් 18 දෙනෙකු වෙත ලබාදී තිබුණු කාලපරිච්ඡේද සංඛ්‍යාව 02 ක සිට 06 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

- විෂයය ඉගැන්වීමේ නියුතු ගුරුභවතුන් පිළිවෙලින් සතියකට අවම වශයෙන් විනාඩි 40 කාලපරිච්ඡේද 35 ක් ඉගැන්වීමේ කාර්යයෙහි නියුක්ත කර විය යුතු වුවද, ජාතික පාසල් 77 ක ගුරුභවතුන් 442 දෙනෙකු වෙත එකම ඉගැන්වීම් කාලපරිච්ඡේදයක් හෝ ලබාදී නොතිබුණි. ජාතික පාසල් 79 ක ගුරුභවතුන් 906 දෙනෙකු වෙත ඉගැන්වීම් කාලපරිච්ඡේද 16 කට වඩා අඩු සංඛ්‍යාවක් ලබාදී තිබුණි. මීට අමතරව හොරණ විද්‍යාලයක ගුරුභවතුන් 171 දෙනෙකුගෙන් 16 දෙනෙකු වෙත පමණක් කාලපරිච්ඡේද පවරා තිබුණි.

- දිවයිනේ පළාත් 9 හි විශේෂ අධ්‍යයන ගුරු පුරප්පාඩු සංඛ්‍යාව 411 ක් වූ අතර, විශේෂ අධ්‍යයන ගුරු පුහුණුව ලැබූ ගුරුවරුන් 355 ක් වෙනත් පාසල් හෝ පන්ති කාමරවල සේවයේ යොදවා තිබුණි.

කිසිදු අධ්‍යාපන රාජකාරියක් ඉටු නොකර වැටුප් ලබාගැනීම

නුගේගොඩ බාලිකා විද්‍යාලයක විදුහල්පතිනිය සම්බන්ධයෙන් කරන ලද මූලික විමර්ශන අනුව අභ්‍යන්තර විගණකගේ 2011 ජනවාරි 07 දිනැති අංක ED/S/84/6/2/1 දරන වාර්තාවෙන් චෝදනා පත්‍රයක් නිකුත් කිරීමටත්, වැඩ තහනම් කිරීමටත් නිර්දේශ කර තිබුණද, එම නිර්දේශ පිළිබඳ නොසලකා වහාම ක්‍රියාත්මක වන පරිදි 2011 පෙබරවාරි 07 දින සිට අනිවාර්ය නිවාඩු යැවීමට කටයුතු කර තිබුණි. එදින සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා කිසිදු සක්‍රීය සේවයකින් තොරව ඇය වෙත රු.මිලියන 3.74 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

විධිමත්භාවයකින් තොරව ගුරු භවතුන් නිවාඩු ලබාගැනීම

- ආයතන සංග්‍රහය ප්‍රකාරව නිවාඩු සඳහා විධිමත් අනුමැතියක් ලබා ගත යුතු නමුත්, 2015 වර්ෂයේදී ජාතික පාසල් 27 ක අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 128 දෙනෙකු විසින් අනුමැතියකින් තොරව ලබා ගෙන තිබුණු මුළු නිවාඩු දින ගණන 3,396 ක් වී තිබුණි.

- .2015 වර්ෂයේදී ජාතික පාසල් 86 ක අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 448 දෙනෙකු දින 8,030 ක් වැටුප් රහිත නිවාඩු ලබා ගෙන තිබුණු නමුත්, එම නිවාඩු වෙනුවෙන් අයකළ යුතුව තිබුණු මුදල් අදාළ වැටුපෙන් අවකරණය කර නොතිබුණි.

- කොළඹ 07 බාලිකා විද්‍යාලයක 2013, 2014 හා 2015 වර්ෂවල වැටුප් රහිත නිවාඩු ලබාගෙන තිබුණු අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 19 දෙනෙකුගේ හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 07 දෙනෙකුගෙන් එම නිවාඩු වෙනුවෙන් අයකළ යුතුව තිබුණු මුදල්, අදාළ වැටුපෙන් අවකරණය කිරීම 2016 පෙබරවාරි මාසය අවසානය දක්වා සිදුකර නොතිබුණි.

ගුරු හා අනෙකුත් ස්ථාන මාරු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

- යම් පාසලක අඛණ්ඩව වසර 06 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබුණු සියළුම විදුහල්පතිවරුන් ස්ථාන මාරුවීම්වලට යටත් විය යුතු නමුත්, 2015 මාර්තු මාසයේදී ස්ථාන මාරු කරන ලද ශ්‍රී ලංකා

- විදුහල්පති සේවයේ නිලධාරීන් 48 දෙනෙකු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාළ ස්ථාන මාරුවීම් අනුව කටයුතු කර නොතිබුණි. නියමිත පරිදි නව සේවා ස්ථානය වෙත රාජකාරී සඳහා වාර්තා නොකර සිටින නිලධාරියෙකු සිය කැමැත්තෙන් තනතුර අතහැර ගියා සේ සළකා කටයුතු කළ යුතු බව 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් කර තිබුණු නමුත් ඒ අනුවද කටයුතු කර නොතිබුණි.

- අදාල චක්‍රලේඛ විධිවිධාන හා 2010 ඔක්තෝබර් 28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කවර හෝ රජයේ පාසලක වසර 08 කට වඩා වැඩි සේවා කාලයක් සේවය කර ඇති ගුරුවරුන් ස්ථාන මාරු කළ යුතු වුවත්, නියැදි පරීක්ෂණවලදී ඊට අනුකූලව ස්ථානමාරු නොකළ පහත සඳහන් අවස්ථා නිරීක්ෂණය විය.

  - කොළඹ 07 බාලිකා විද්‍යාලයක ගුරුවරු සංඛ්‍යාව 76 ක් වූ අතර, එය මුළු ගුරු මණ්ඩලයෙන් සියයට 42 ක් වී තිබුණි.

  - දෙහිවල බාලිකා විද්‍යාලයක වර්ෂ 8 ක සිට වර්ෂ 20 ක් දක්වා කාලයක් ස්ථාන මාරු නොලැබූ ගුරුවරු සංඛ්‍යාව 35 ක් වී තිබුණි.

  - නාත්තන්ඩිය විද්‍යාලයක වර්ෂ 8 ක සිට වර්ෂ 25 ක් දක්වා සේවා කාලය ඉක්මවූ ගුරුභවතුන් සංඛ්‍යාව 45 ක් වී තිබුණි.

  - හොරණ ජාතික පාසලක වසර 08 කට වැඩි සේවා කාලයක් ගත කළ ගුරුවරු 94 දෙනෙකු වූ අතර, එය මුළු ගුරු මණ්ඩලයෙන් සියයට 56 ක් වී තිබුණි.

  - අධ්‍යාපන ක්‍රියාවලිය වඩා ඵලදායී අන්දමින් හා ශිෂ්‍යයින්ගේ සුභසාධනය උපරිම වන පරිදි පාසල්වල ගුරුමාරු ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම චක්‍රලේඛයෙන් අපේක්ෂා කර තිබුණද, එහි විධිවිධාන නිසි ලෙස ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් ජාතික පාසල් 109 ක ගුරුභවතුන් 4,089 දෙනෙකු වර්ෂ 8 ක සිට වර්ෂ 27 ක් දක්වා කාලයක් ස්ථාන මාරුවීම් නොලබා එකම පාසලක සේවයේ යෙදී තිබුණි.

  - ආයතන සංග්‍රහයට අනුකූලව සියළුම නිලධාරීන් ස්ථාන මාරු කළ යුතු වුවත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් 46 දෙනෙකු වර්ෂ 5 ක සිට වර්ෂ 22 ක් දක්වා කාල පරාසයක්ද, සංවර්ධන සහකාර තනතුරු 84 කින් 76 දෙනෙකු වර්ෂ 10 කට වැඩි කාලයක් ද, 8 දෙනෙකු වර්ෂ 6 ක සිට වර්ෂ 9 ක් දක්වා කාල පරාසයක්ද, අනෙකුත් අනධ්‍යයන කාර්ය මණ්ඩල සේවාවලට අයත් නිලධාරින් 42 දෙනෙකු වර්ෂ 7 ක සිට වර්ෂ 25 ක් දක්වා කාල පරාසයක්ද ස්ථාන මාරු නොලබා සිටි අතර, ඇතැම් නිලධාරීන් දැනට අනුයුක්ත ශාඛාවලද, ඇතැම් නිලධාරීන් අධ්‍යාපන අමාත්‍යාංශයට පැමිණි දින සිටම එකම ශාඛාවකද සේවයේ යොදවා තිබුණි.

පාසල් අධීක්ෂණය

රජයේ අනුමත පෞද්ගලික පාසල් 78 ක සිසුන් 114,070 දෙනෙකු අධ්‍යාපනය ලබන අතර, එම පාසල්වල ගුරුවරු 4,713 ක් සේවයේ යොදවා තිබුණි. අනුමත නොවූ පෞද්ගලික පාසල් 214 ක් පැවති අතර, එම පෞද්ගලික පාසල් නියාමනය හා අධීක්ෂණය කිරීමේ විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

විනය පරීක්ෂණවල ප්‍රමාදය

විෂමාචාර ක්‍රියාවන් හා ප්‍රමාද දෝෂයන් සම්බන්ධයෙන් ඉක්මනින් කටයුතු කිරීමට හා නියමිත කාලයක් තුළදී විනය ක්‍රියාමාර්ග නොපමාව නිම කිරීමට කටයුතු කළ යුතු වුවත්, වර්ෂ 03 ක සිට වර්ෂ 10 ක් දක්වා කාල පරාසයක් ගතවී තිබුණ නිලධාරීන් 21 දෙනෙකුට අදාළ විනය ක්‍රියාමාර්ග අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි.

ගුරු භවතුන්ගේ උසස්වීම්

ආයතන සංග්‍රහය අනුව නිත්‍ය පත්වීමක් කරන තෙක් තවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වැඩ බැලීමේ නිලධාරියකු පත් කළ හැකි නමුත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට දිවයින පුරා පිහිටි ජාතික පාසල් 350 කින් පාසල් 49 ක 2009 වර්ෂයේ සිටද, පාසල් 106 ක 2016 ජුනි මාසය දක්වාද විදුහල්පති පුරප්පාඩු සඳහා වැඩ බැලීමේ නිලධාරීන් යොදවා තිබුණි.

සිසුන් අපචාර ක්‍රියාවන්ට පොළඹවා ගැනීම

ළමා අපචාර සිද්ධීන්වලට ඉතා කඩිනම්ව විනය පරීක්ෂණ පවත්වා දඬුවම් ලබාදිය යුතු වුවත්, එසේ අප්‍රමාදව කටයුතු නොකිරීමෙන්ද, ඔවුන් වෙනත් පාසල් වෙත මුදා හැරීමෙන් හෝ එම පාසල් තුළම රඳවා තබා ගැනීමෙන්ද අදාළ පාසල් සිසු දරු දැරියන්ගේ අධ්‍යාපන කටයුතුවලට මෙන්ම පාසලේ විනය පවත්වාගෙන යාමටද අහිතකර ලෙස බලපා තිබුණි.

සිසුන් බඳවාගැනීමේදී සිදු වූ අක්‍රමිකතා

- 2011 ජුලි 18 දිනැති SCFR අංක 232/2011 දරන නඩු තීන්දුවෙන් 2016 වර්ෂයේ සිට බල පැවැත්වෙන පරිදි පන්තියක සිටිය යුතු උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 35 ක් විය යුතු බව දන්වා තිබුණි. වසරකදී එක සිසුවකු බැගින් වසර 05 කදී එම ප්‍රමාණයට පැමිණීම සඳහා 2016 වසර සඳහා සිසුන් සංඛ්‍යාව 39 ක් ලෙස සලකා කටයුතු කර තිබුණි.

- කොළඹ මරදානේ පිරිමි ජාතික විද්‍යාලයක 2016 වර්ෂය සඳහා පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේදී මෙම චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවන අයුරින් ඡන්ද හිමිකම නොතිබූ වර්ෂවලට අවස්ථා 29 කදීද, ආසන්නතාවය මත අවස්ථා 3 කදීද, සහෝදර පදනම මත අවස්ථා 10 කදීද හා අධ්‍යාපනයට සෘජුවම බලපාන ආයතනවල කාර්ය මණ්ඩල පදනම මත අවස්ථා 9 කදීද වශයෙන් දරුවන් 51 දෙනෙකු වෙත වැඩිපුර ලකුණු ලබා දී තිබුණි.

- සහෝදර පදනම මත සහෝදරයා ඉගෙනුම ලැබූ කාලය වෙනුවෙන් ලකුණු 6 ක්ද, මව හෝ පියා පාසලට දක්වන සහයෝගය වෙනුවෙන් සනාථ කිරීම සඳහා ලියවිලි කිසිවක් නොමැතිව ලකුණු 4 ක්ද,

දෙමාපියන්ගේ ඡන්ද හිමි නාම ලේඛන වෙනුවෙන් ලකුණු 12 ක්ද වශයෙන් එක් දරුවකු වෙත වැඩිපුර ලකුණු ලබාදී තිබුණි.

- අදාළ රාජකාරිය අවසන් වූ වහාම එම රාජකාරිය සිදුකළ බව තහවුරු කිරීම පිණිස තම අත්සන තැබිය යුතු වුවත්, සිසුන් සඳහා වූ සම්මුඛ පරීක්ෂණවලදී ලකුණු පත්‍රිකාවල සම්මුඛ පරීක්ෂණවලට සහභාගී වූ නිලධාරීන් අත්සන් යොදා එම ලකුණු සහතික කර නොතිබුණි.

- සියළුම රජයේ හා පෞද්ගලික පාසල්වලට ළමුන් ඇතුළත් කිරීමේදී පහසුකම් හා සේවා ගාස්තු සහ පාසල් සංවර්ධන සමිති සාමාජික මුදල් හැර ගාස්තු හා ආධාර වශයෙන් වෙනත් කිසිදු දෙයක් ලබා නොගත යුතු වුවත්, ඊට අනුකූල නොවන පරිදි එක් දරුවකුගෙන් රු.මිලියනයක මුදලක් රැගෙන ඉන් මිලියන 0.6 ක් සඳහා පාසල් සංවර්ධන සමිති ලදුපතක් නිකුත් කර තිබුණි. මීට අමතරව මුදල් ලබාගත් තවත් අවස්ථා නොතිබුණි යැයි සලකා බැහැර කළ නොහැකි විය.

- එකම දරුවාගේ නම පාසල් කිහිපයක තිබීම වැලැක්වීම සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් තබා ඉහළ ප්‍රමුඛතා ලබා ඇති පාසල් ලේඛනයෙන් හැර අනෙක් ලේඛනවලින් එම දරුවන්ගේ නම් ඉවත් කර, පොරොත්තු ලේඛනයේ දරුවන්ට එම අවස්ථාවන් ලබාදිය යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

- ජාතික පාසලක ප්‍රාථමික ශ්‍රේණිවල සමාන්තර පන්තියක සිටිය යුතු උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 40 ක් හා ද්විතියික ශ්‍රේණිවල සමාන්තර පන්තියක සිටිය යුතු උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 45 ක්ද, පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේදී පන්තියක් සඳහා තෝරාගත යුතු මුළු ළමුන් සංඛ්‍යාව 35 ක්ද, වශයෙන් දක්වා තිබුණු නමුත්, එම සීමාවන් ඉක්මවා ජාතික පාසල් 66 ක් විසින් ඇතුළත් කරගෙන තිබුණු මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 6,105 ක් විය. ඒ අතර, ජනප්‍රිය පාසල් ලෙස සැලකෙන ජාතික පාසල් 32 ක් විසින් අදාළ සීමාව ඉක්මවා ඇතුළත් කර තිබුණු මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 5,373 ක් වී තිබුණි.

- 2015 වර්ෂයේදී ජාතික පාසල් 58 ක විවිධ ක්‍රීඩා වර්ග 646 ක් සඳහා සහභාගීවී තිබුණු සිසු දරුවන් සංඛ්‍යාව 33,988 ක් විය. බාහිර ක්‍රීඩා පුහුණුකරුවන් වෙත රු.මිලියන 59.94 ක් ගෙවා තිබුණු අතර සිසු දරුවන්ගෙන් රු. මිලියන 7.40 ක් අයකර තිබුණි.

අධ්‍යාපන අමාත්‍යාංශය සතු ඉඩම්වලින් අනවසර පදිංචිකරුවන් ඉවත්කිරීම

අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල්, ගුරු විද්‍යාල හා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සතුව පවතින පර්චස් 4 ක සිට පර්චස් 224 ක් දක්වා පරාසයක භූමි ප්‍රමාණයන් සහිත වූ නාගරිකව පිහිටා ඇති ඉඩම් 80 ක් අනුමැතියකින් හා අවසරයකින් තොරව බාහිර පාර්ශවයන් විසින් භුක්ති විඳිමින් පැවතුණි. ඉහල තක්සේරු වටිනාකම්වලින් යුක්ත වන මෙම ඇතැම් ඉඩම්වල විශාලත්වය හා වර්තමාන වටිනාකම්වල තොරතුරු අමාත්‍යාංශයේ නොතිබුණි.

විධිමත් අනුමැතියකින් තොරව සිදු කළ ගනුදෙනු

- ආරක්ෂක සේවා විද්‍යාලයට අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා 2008 වර්ෂයේ සිට අධ්‍යාපන අමාත්‍යාංශය වෙත සලසා තිබුණු රු.මිලියන 1,191.97 ක ප්‍රතිපාදන උපයෝගීකර ගනිමින් රු.මිලියන 1,098.24 ක් වැය කරමින් නාගරික සංවර්ධන අධිකාරිය සතු හෙක්ටයාර් 1.9329 ක් වූ භූමියෙහි ගොඩනැගිලි ඉදිකර තිබුණි. නමුත් විද්‍යාලයීය භූමියේ නෛතික අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

- දෙහිවල බාලිකා විද්‍යාලයක් විසින් අනුමැතියකින් තොරව, ගෙවීම් සනාථ කිරීම සඳහා ලිඛිත සාක්ෂි නොමැතිව හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැරව මුල්‍ය ගනුදෙනු සිදු කර තිබුණි.

- හොරණ ජාතික පාසලක 2014 වර්ෂයේ ගිණුම් හා ප්‍රගති සමාලෝචන වාර්තා 2015 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

- පාසල් සංවර්ධන සමිති ගිණුම්වලට අදාළ සියළු වැඩ කටයුතු වැඩ බෙදීමකින් තොරව එක් සංවර්ධන සහකාර නිලධාරිණියකු වෙත පවරා තිබුණි.

- හොරණ ජාතික පාසලක 2014 වර්ෂයේ පාසල් සංවර්ධන සැලැස්මේ ප්‍රගතිය හා ඊට අදාල විගණිත ගිණුම් වාර්තා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කර නොතිබුණි.

- හොරණ ජාතික පාසලක 2014 වර්ෂයේ පාසලේ කාර්යසාධන වාර්තාවක් චක්‍රලේඛයේ දක්වා ඇති ආකෘතිය ප්‍රකාරව 2015 මාර්තු 31 දිනට පෙර පිළියෙල කර, ජාතික පාසල් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කර නොතිබුණි.

- හොරණ ජාතික පාසලක් විසින් රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව කටයුතු කර මිලදී ගැනීම් සිදු කළ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

  - පාසල්වල රු.500,000 කට වැඩි වටිනාකමැති ප්‍රසම්පාදනයන් සඳහා අමාත්‍යාංශ මට්ටමින් ක්‍රියා කළ යුතු වුවත්, ඊට අනුකූල නොවන අයුරින් පාසල් මට්ටමින් මිල කැඳවීම් සිදුකර තෝරාගත් සැපයුම්කරුගෙන් රු.208,815 ක්ද, වෙනත් සැපයුම්කරුවකුගෙන් රු.336,250 ක්ද වශයෙන් රු.545,065 ක ප්‍රසම්පාදනයන් පාසල විසින් සිදු කර තිබුණි.

  - චක්‍රලේඛ හා මාර්ගෝපදේශ විධිවිධාන අනුව පාසල් සංවර්ධන සමිතිය විසින් පවරාගන්නා ලද ඉදිකිරීම් කාර්යයන් උප කොන්ත්‍රාත් ලබාදිය නොහැකි වුවත්, ඒ සඳහා අනුමැතියකින් තොරව විදුහල්පති විසින් සමස්ථ ඉදිකිරීම් කටයුතු රු.428,650 ක ඇස්තමේන්තුගත පිරිවැයකට පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු වෙත පවරා තිබුණි. ඒ සඳහා ගෙවීම් කිරීමේදී විදුහල්පතිවරයා විසින් සකස් කරන ලද හිස් ඉන්වොයිස්පතක් මත රු.265,150 ක් ගෙවා තිබුණි.

ඉදිකිරීම් සම්බන්ධයෙන් පවතින දුර්වල ප්‍රමිති හා කාල ප්‍රමාදයන්

- පිහිනුම් තටාකයක් ඉදිකිරීමේ අරමුදලක් සඳහා කොළඹ ජාතික පිරිමි පාසලක් විසින් එකතු කරන ලද රු. මිලියන 6.00 ක් 2007 දෙසැම්බර් 19 දින ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට එම ආයෝජනයේ වටිනාකම රු. මිලියන 20.20 ක් වී තිබුණි. කෙසේ වෙතත්, 2016 ජුලි 25 දින වන විටත් පිහිණුම් තටාකය ඉදිකිරීමට අදාළ කටයුතු ආරම්භ කර නොතිබුණි.

- 2015 වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලද රු.මිලියන 5.00 ක ප්‍රතිපාදන යටතේ විශේෂ අධ්‍යාපන සම්පත් තොරතුරු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා මුල්ගල තැබීමට රු. 243,000 ක් 2015 ජුලි 14 දින ගෙවා තිබුණි. ලැබී තිබුණු ප්‍රතිපාදනවලින් රු. මිලියන 1.38 ක් ගේට්ටුව සහ ආරක්‍ෂක වැට ඉදිකිරීම සඳහා වැය කර රු. මිලියන 3.15 ක බැරකම්වලට එළඹ තිබුණි. අදාළ මධ්‍යස්ථානය ඉදිකිරීම ආරම්භ කිරීමට හා ඉඩමේ පූර්ණ අයිතිය අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට 2016 ජුලි 25 දින වන විටත් අපොහොසත් වී තිබුණි.

අනාර්ථික ගනුදෙනු

- පාසල් අවශ්‍යතාවයන් හඳුනා නොගෙන හා පාසල්වල පවතින ඇඳන්වල දිග පළල නොවිමසා ක්‍රීඩා පාසල් සඳහා රු.3,543,750 කට 72”×42”×4” ප්‍රමාණයේ නිදන මෙට්ට 500 ක් හා 72”×30”×4” ප්‍රමාණයේ නිදන මෙට්ට 625 ක් මිලදී ගෙන තිබුණි. එම මෙට්ට නිසි ප්‍රමිතියට නොතිබුණු බැවින් ප්‍රයෝජනයට ගත නොහැකි වී තිබුණි.

- අමාත්‍යාංශය විසින් රු. මිලියන 5.36 කට ක්‍රීඩා පාසල් සඳහා ද්විත්ව යකඩ ඇඳන් 250 ක් මිලදීගෙන තිබුණු අතර, ඒවා ගුණාත්මක බවට හා පිරිවිතරයන් සපුරා තිබුණු බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

- පැකට් එකකට රු.8 ක් බැගින් ගබඩාවේ පැවති නිල ඇඳුම් පැකට් 1,179,350 ක පණිවිඩය වෙනස් කර පැකට් කිරීම සඳහා පෞද්ගලික ආයතන 4 කට රු. මිලියන 9.43 ක් ගෙවීමට එකඟ වී තිබුණි.

- කොළඹ අධ්‍යාපන කොට්ඨාශයේ පිහිටි ජාතික පාසලක් සඳහා විදුලි ජනන යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා රු.මිලියන 5 ක් 2016 ජනවාරි මාසයේ අමාත්‍යාංශයේ තැන්පත් කර තිබුණි. 2016 ජුනි මාසය දක්වා එම ප්‍රසම්පාදනයට අවශ්‍ය කටයුතු සිදුකිරීමේ ප්‍රමාදය හේතුවෙන් 2014 වර්ෂයේ සිට 2016 පෙබරවාරි මාසය දක්වා විදුලි ජනක යන්ත්‍ර කුලී පදනම මත ගැනීම සඳහා රු. මිලියන 1.71 ක් වරින්වර පාසල් සංවර්ධන සමිතියෙන් ගෙවා තිබුණි.

- හොරණ ජාතික පාසලක රුපියල් මිලියන 1.00 ක සිට රු.මිලියන 5.00 ක් දක්වාද, දෙහිවල බාලිකා විද්‍යාලයක රුපියල් මිලියන 1.1 ක සිට රු.මිලියන 2.5 දක්වාද, කොළඹ 7 බාලිකා විද්‍යාලයක රුපියල් මිලියන 0.3 ක සිට රු.මිලියන 9.5 ක් දක්වාද පරාසයක මුදල් 2015 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කෙටිකාලීන අයෝජනවල තැන්පත් කර ප්‍රතිලාභ ලබාගැනීමට කටයුතු නොකර පාසල් සංවර්ධන සමිතියේ ජංගම ගිණුමේ රඳවා තිබුණි.

කම්කරු හා වෘත්තිය සමිති සබඳතා

කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අංශය විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- කම්කරු හා වෘත්තිය සමිති සබඳතා විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරිම,
- සේවක අර්ථසාධක අරමුදල, පෞද්ගලික අර්ථසාධක අරමුදල සහ පෞද්ගලික විශ්‍රාම ගැන්වීමේ ක්‍රම පරිපාලනය කිරිම,
- ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන්, සේවක පරිපාලනය සහ සුභසාධනය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරිම සහ ක්‍රියාත්මක කිරිම,
- ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ ජාත්‍යන්තර සමාජ ආරක්ෂණ සංවිධාන සමඟ අන්තර් සහයෝගීතාව පවත්වා ගැනීම,
- වෘත්තිය සමිති ලියාපදිංචි කිරීම සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශවල සියළුම වෘත්තිය සමිතිවල කටයුතු රටේ සංවර්ධනයට යොදා ගැනීම සඳහා අවශ්‍ය සාධනීය පියවරයන් හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම,
- ජාතික මිනිස්බල හා රැකී රක්ෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරිම,
- වෘත්තීය සහ රැකියා මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,
- කාර්මික සබඳතා සහ කාර්මික ආරවුල් නිරාකරණය කිරීම,
- කම්කරු සබඳතාවලට අදාළ නීති රීති සම්පාදනය සහ නියාමනයට අදාළ කටයුතු කිරීම,
- වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම

ශ්‍රී ලංකාවට අදාළව ශ්‍රම බලකායේ ප්‍රධාන ලක්ෂණ කිහිපයක් පහත 12 වගුවෙහි දැක්වේ.

විස්තරය	පිරිමි	ගැහැණු	එකතුව
ජනගහනය (වයස අවුරුදු 15 සහ ඉන් ඉහළ)	7,773,350	8,968,959	16,742,309
එම වයස් කාණ්ඩයේ ශ්‍රම බලය	5,810,483	3,197,652	9,008,135
ශ්‍රම බල සහයෝගිතා අනුපාතය	74.7	35.7	53.8
සේවා නියුක්ති ජගගහනය	5,605,800	2,948,378	8,554,179
සේවා නියුක්ති අනුපාතය	96.5	92.2	95.0
සේවා වියුක්ති ජනගහනය	204,682	249,274	453,956
සේවා වියුක්ති අනුපාතය	3.5	7.8	5.0
ශ්‍රමබලයට අයත් නොවන	1,962,868	5,771,307	7,734,175

වගුව 12 - ශ්‍රම බලකායේ ප්‍රධාන ලක්ෂණ
මූලාශ්‍රය : ශ්‍රී ලංකා ශ්‍රම බල සමීක්ෂණය - 2015 තෙවන කාර්තුව - ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

කම්කරු පරීක්ෂණ පැමිණිලි හා නඩු පරිගණක ගතකිරීම

කම්කරු නිලධාරීන්ගේ රාජකාරිවල ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය වැඩිකර සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් සහ සේවායෝජක ආයතනවලට කාර්යක්ෂම සේවාවක් ලබාදීම සඳහා 2010 වර්ෂයේ සිට ආරම්භ කළ කම්කරු පරීක්ෂණ පැමිණිලි හා නඩු පරිගණකගත කිරීමේ (LISA) ව්‍යාපෘතියට 2015 වර්ෂය අවසාන වන විට රු. මිලියන 56.64 ක් වැයකර තිබුණි. ඒ සඳහා කම්කරු නිලධාරීන්ගේ දායකත්වයක් නොලැබීම නිසා 2016 ජුනි 30 දින වන විටත් ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට කළමනාකරණයට නොහැකි වී තිබුණි.

ශ්‍රී ලංකාව ළමා ශ්‍රමයෙන් තොර කළාපයක් කිරීම

ශ්‍රී ලංකාව ළමා ශ්‍රමයෙන් තොර කළාපයක් බවට පත් කිරීමේ ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා 2015 අප්‍රේල් 04 දින රු.80,562 ක් වැය කර කළාප භාර නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන්, දිස්ත්‍රික් කාර්ය භාර කම්කරු කොමසාරිස්වරුන් හා ජ්‍යෙෂ්ඨ කම්කරු නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් පවත්වා තිබුණි. ග්‍රාම නිලධාරීන්, ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් හා පරිවාස නිලධාරීන්, නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන් මගින් දැණුවත් කිරීමේ වැඩමුළු 9 ක් රු.96,000 ක් වැය කර පැවැත්වීමට සැලැසුම් කර තිබුණත්, එම වැඩමුළු පවත්වා නොතිබුණි. කෙසේ වෙතත්, 2015 අප්‍රේල් 02 දිනැති අංක 3/2015 දරන කාර්යාල චක්‍රලේඛය මගින් ශ්‍රී ලංකාව ළමා ශ්‍රමයෙන් තොර කළාපයක් බවට පත් කිරීමේ උපදෙස් ලබා දී තිබුණි. 2015 ජුලි 31 දින වන විට එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ප්‍රගතිය වාර්තා කරන ලෙස දන්වා තිබුණත්, ඒ සඳහා වූ ප්‍රගතිය එක් නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරයෙකු පමණක් වාර්තා කර තිබුණි.

2015 වර්ෂයේ පැවැති වැඩවර්ජන

2015 දෙසැම්බර් 31 දින වන විට කම්කරු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබුණු වෘත්තීය සමිති සම්මේලන 1,907 ක් වූ අතර, 2015 වර්ෂයේදී වැඩ වර්ජන 51 ක් සඳහා සේවකයින් 14,915 ක් සහභාගීවීම නිසා රටට මිනිස් දින 82,294 ක් අහිමි වී තිබුණි. විස්තර ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත 13 වගුවෙහි දැක්වේ.

විස්තරය	2015	2014
වැඩවර්ජන ගණන	51	38
සහභාගී වූ සේවක සංඛ්‍යාව	14,915	6,451
අහිමි වූ මිනිස් දින ගණන	82,294	37,323

වගුව -13. 2015 වර්ෂයේ පැවැති වැඩ වර්ජන

මූලාශ්‍රය: කම්කරු අංශය - කම්කරු දෙපාර්තමේන්තුව

කම්කරු වන්දි ගෙවීම

සේවායෝජකයින්ගෙන් අයකර ගත් වන්දි ගෙවීමේ ප්‍රමාදය

ආපදාවකට හෝ මරණයකට පත් වන සේවකයන් වෙනුවෙන් සේවා යෝජකයින්ගෙන් අප්‍රමාදව වන්දි මුදල් අයකර දීම මඟින් සේවක තෘප්තිය ඇතිකිරීමේ දැක්ම සහිතව කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය ස්ථාපිත කර තිබුණි. කාර්යාලය විසින් අයකර ගෙන තිබුණු රු. මිලියන 55.89 ක වන්දි සේවකයින්ට හෝ ඔවුන්ගේ හිමිකරුවන් වෙත ලබා දීමට දින 14 ක සිට දින 1634 ක කාල ප්‍රමාදයන් කර තිබුණි.

සේවා යෝජකයින් විසින් තැන්පත් කළ වන්දි නොගෙවීම

සේවා දායකයන් විසින් ආපදාවලට ලක්වූවන් වෙත ගෙවීම සඳහා වන්දි කොමසාරිස් කාර්යාලය වෙත ලබා දුන් රු. මිලියන 19 ක් අදාළ පාර්ශවයන් වෙත ලබා නොදී වර්ෂ 5 ක පමණ කාලයක සිට පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

ඉතිරි කිරීමේ ගිණුම්වල පැවැති වන්දි මුදල් ගෙවීම

2015 වර්ෂය අවසාන වන විට වයස සම්පූර්ණත්වයට පත්ව සිටි ප්‍රතිලාභීන් 531 කගේ බාල වයස්කාර ඉතිරි කිරීම් පාස් පොත්වල එකතුව රු.මිලියන 24.07 ක ශේෂයයක් පැවැතුණි. එම මුදල් ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 20 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, අදාළ ප්‍රතිලාභීන් වෙත ගෙවා නොතිබුණි.

සේවකයන්ගේ ව්‍යවස්ථාපිත දීමනා ගෙවීම

සේවා යෝජකයින් විසින් තම සේවකයින්ට ලබා දිය යුතු ව්‍යවස්ථාපිත වැටුප්, සේවක අර්ථසාධක අරමුදල් දායකයන් හා අයවැය දීමනාවන් සමහර සේවා යෝජකයින් විසින් ගෙවා නොතිබුණි. එවැනි සේවායෝජකයින්ගෙන් අදාළ සේවකයන්ට එකතුව රු.මිලියන 29,157 ක ව්‍යවස්ථාපිත දීමනා ගෙවන ලෙස ඉල්ලා දිවයිනේ අධිකරණවල නඩු 15,304 ක් පවරා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම නඩු විසඳී නොතිබුණි.

සේවක අර්ථසාධක අරමුදලේ සාමාජික ප්‍රතිලාභ අඩුවීම

සේවක අර්ථසාධක අරමුදලේ මුදල් ආයෝජනය කිරීමෙන් උපයා ගත් ආදායමෙන් අරමුදලේ සාමාජිකයින්ගේ ගිණුම් ශේෂය සඳහා ලබා දෙන ප්‍රතිලාභය ඉකුත් වර්ෂවලට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අඩු වී තිබුණි. 2009 වර්ෂයේ ප්‍රතිලාභ ප්‍රතිශතය සියයට 13.75 ක සිට 2015 වර්ෂය අවසාන වන විට සියයට 10.5 ක් දක්වා අඩු වී තිබුණි.

පරිසරය

තිරසාර පරිසරයක් උදෙසා ක්‍රියාත්මක වීම සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තු දෙකකින් හා ව්‍යවස්ථාපිත ආයතන 08 ක් ස්ථාපිත කර තිබුණි. එම ආයතනවලින් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- පරිසරය ක්ෂේත්‍ර සඳහා ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කිරීම
- වර්තමාන හා අනාගත පරපුර උදෙසා පරිසරය සුරැකීම
- පරිසර දූෂණය මැඩලීම පිණිස වැඩසටහන් සම්පාදනය කිරීම හා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම
- සමුද්‍ර දූෂණ නිවාරණ කටයුතු සහ නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
- වනාන්තර, වනසතුන් හා තුරුලතා ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය
- රටේ දැව සපුරාලීම සඳහා වාණිජ වනවගා ප්‍රවර්ධනය
- මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සහ වෙළෙඳාම ප්‍රවර්ධනය හා නියාමනය
- වෙරළ සංරක්ෂණය හා ආරක්ෂණය

මධ්‍යම පරිසර අධිකාරිය

1988 අංක 56 දරන ජාතික පාරිසරික (සංශෝධන) පනතින් හා 2000 අංක 53 දරන ජාතික පාරිසරික (සංශෝධන) පනත් මගින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ සඳහන් අරමුණු හා ප්‍රධාන කාර්යයන් අතර පරිසරයේ තත්ත්වය ආරක්ෂා කිරීමට මෙන්ම වැඩි දියුණු කිරීමට අදාළ විධිමත් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීමේ වගකීම මධ්‍යම අධිකාරිය සතුවේ.

ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිවලින් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීම

වර්තමානයේ ශ්‍රී ලංකාවේ නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල උද්ගතව ඇති කසල කළමනාකරණය පිළිබඳ ගැටළුවට විසඳුම් සෙවීම සඳහා මෙම අධිකාරිය විසින් විදේශ ණය හා ප්‍රදාන ඇතිව පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණත්, ඉන් අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගැනීමට අපොහොසත් වී තිබුණි. විස්තර 14 වගුවෙහි දැක්වේ.

	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘති කාලය	ආයෝජිත මුදල	ප්‍රගතිය
1.	පිළිසරු ව්‍යාපෘතිය	2008-2010	රු.බිලියන 5.63	තවමත් ව්‍යාපෘතිය කෙරෙමින් පවතී.
2.	ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය	2013-2017	ඇ.ඩොලර් මිලියන 41.89	ව්‍යාපෘතිය තවමත් සැලැසුම් අදියරේ පවතී.
3.	දොම්පෙ සනීපාරක්ෂක කසල රඳවන බිම් පිරවුම් ව්‍යාපෘතිය	2008-2013	ඇ.ඩො. මිලියන 6	ඉදිකර අවසන් වුවත්, ප්‍රමාණවත් තරම් කසල නොමැතිකම නිසා ව්‍යාපෘති සියයට 100 කින් ක්‍රියාත්මක ක්රියාත්මක නොවේ.

වගුව 14 - අපේක්ෂිත අරමුණු ඉටු කිරීමට නොහැකි වී තිබුණු විදේශ ව්‍යාපෘති

කසල කළමනාකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු නොකිරීම

ජාතික ගැටළුවක්ව පවතින නගරාසන්න ප්‍රදේශවල එකතු වන කසල සම්බන්ධයෙන් රට තුළ සුළු හෝ මධ්‍ය පරිමාණයෙන් යුතුව කසල කළමනාකරණය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. අපද්‍රව්‍ය කළමනාකරණය තුළින් ඇතිවන අතුරු ඵලයක් වන කොම්පෝස්ට් පොහොර ලබා ගැනීම, කොම්පෝස්ට් පොහොර රසායනික පොහොර භාවිතයට විකල්ප විසඳුමක් වීම, පරිසර හානිය අවම කිරීමට මෙන්ම අධිකාරියට ආදායම් ලබා ගැනීමේ මාර්ගයක් ද වීම යන කරුණු හේතුවෙන් කසල කළමනාකරණ ව්‍යාපෘති රට තුළ ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක කිරීමට ඉහළ ප්‍රමුඛතාවයක් දැක්වීම අධිකාරිය සතු වගකීමක් වුවද ඒ පිළිබඳ වැඩි අවධානයක් හා ප්‍රමුඛතාවයක් ලබා දීමට අපොහොසත් වී ඇත.

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත මගින් මෙම අධිකාරිය ස්ථාපිත කර තිබුණි. අධිකාරියේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ජල තීරයේ හෝ වෙනත් යම් සමුද්‍ර කලාපවල හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ හා වෙරළ කළාපය තුළ නැව් ආශ්‍රිත කාර්යයන්ගෙන් සහ වෙරළ ආශ්‍රිත සමුද්‍රය සම්බන්ධ යම් කටයුත්තකින් ඇති වන දූෂණය වැළැක්වීම, අවම කිරීම, පාලනය කිරීම හා කළමනාකරණය කිරීමට අදාළව අවශ්‍ය පියවර ගැනීමයි.

දිනෙන් දින සමුද්‍ර දූෂණය වැඩිවීම

සංචාරක කර්මාන්තය දියුණු වීමත් සමඟම සීඝ්‍රයෙන් වෙරළාසන්න ප්‍රදේශවල ආපනශාලා, හෝටල් හා නවාතැන් ඉදිකර තිබුණි. එම ආයතන විසින් මුහුදු සීමාවේ සිට මීටර් 300 ක් ගොඩබිම දක්වා වූ ප්‍රදේශයේ මුහුදට අපද්‍රව්‍ය හා වැසිකිළි අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය නොකර බැහැර කරන අතර මේ පිළිබඳව අදාළ ආයතන සමඟ සාකච්ඡා කර විධිමත් පියවර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. මේ නිසා දිනෙන් දින සමුද්‍ර දූෂණය වැඩිවෙමින් පැවැතුණි.

වරායන්වල අපද්‍රව්‍ය කළමනාකරණය කෙරෙහි අවධානය යොමු නොකිරීම

2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ විධිවිධාන යටතේ වූ නියෝගයට අනුව තෙල් උතුරා යාම පිළිබඳ හදිසි සැලැස්ම අධිකාරිය මගින් අනුමත කරවා ගත යුතු වුවද, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් එම සැලැස්ම ඉදිරිපත් නොකිරීම පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි. එබැවින් හදිසි තෙල් විසිරුමක් සම්බන්ධයෙන් වන වගකීම අධිකාරියෙන් බැහැරව පැවැතුණි. තවද, ප්‍රධාන වරායන්වලට අමතරව සුළු හා මධ්‍ය පරිමාණ ධීවර වරායන්වල අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අධිකාරියේ අවධානය යොමු කර නොතිබූ අතර ඒ සඳහා විධිමත් ක්‍රමවේදයක් ද නොතිබුණි.

විදේශ කටයුතු

ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය විධිමත් පරිදි සකස් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ අභිමතාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය කටයුතු කරනු ලබයි. එහිදී රාජ්‍ය තාන්ත්‍රික කටයුතු ශක්තිමත් කිරීමේ අරමුණින් 2015 වර්ෂය අවසානය වන විට තානාපති කාර්යාල 38 ක්, මහ කොමසාරිස් කාර්යාල 15 ක්, කොන්සියුලර් ජනරාල් කාර්යාල 14 ක් වශයෙන් ස්ථාපිත කර ඇති ආයතන මඟින් ශ්‍රී ලංකාව හා ජාත්‍යන්තරය සමඟ සම්බන්ධතා පවත්වාගෙන යනු ලබයි.

2015 වර්ෂය වෙනුවෙන් රු.මිලියන 10,106.08 ක් ප්‍රතිපාදනය කර තිබූ අතර ඉන් රු. මිලියන 8,543.94 ක් වියදම් කර තිබුණි. මෙයින් දූත මණ්ඩල විසින් රු.මිලියන 6,967.21 ක් වැය කර තිබුණු අතර එය මුළු වියදමින් සියයට 81 ක් පමණ විය.

විදේශ කටයුතු අමාත්‍යාංශය සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

මූල්‍ය කල් බදු ක්‍රමය යටතේ මිලදී ගත් අධි සුඛෝපභෝගී බස් රථ නිෂ්ක්‍රියව පැවැතීම

පොදු රාජ්‍ය මණ්ඩලීය නායක සමුළුව වෙනුවෙන් විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් කල්බදු වටිනාකම රු.මිලියන 55 ක් වූ අධි සුඛෝපභෝගී බස්රථ දෙකක් 2013 නොවැම්බර් 01 දින මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබා ගෙන තිබුණි. ඒ සඳහා මාසිකව වාරික හා පොලී වශයෙන් රු. 916,752 ක් බැගින් වාරික 60 කින් ගෙවීමේ එකඟතාවය මත ලබාගෙන තිබුණි. 2015 වර්ෂයේදී මෙම බස්රථ දෙක වෙනුවෙන් වාරික හා පොලිය පිළිවෙලින් රු. මිලියන 6.47 ක් හා රු.මිලියන 5.45 ක් වශයෙන් රු. මිලියන 11.92 ක් ගෙවා තිබුණි. 2014 වර්ෂයේ සිට මෙම බස්රථ දෙක කිසිදු ප්‍රයෝජනයකින් තොරව අමාත්‍යාංශයේ රථගාලේ නිෂ්ක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය.

විදේශ දූත මණ්ඩලවල පවතින කළමනාකරණ සහකාර සේවයේ පුරප්පාඩු පිරවීම

විදේශ දූත මණ්ඩලවල පවතින කළමනාකරණ සහකාර සේවයේ පුරප්පාඩු පිරවීම සඳහා විභාග කොමසාරිස්වරයා විසින් පවත්වන විභාගයක ප්‍රතිඵල මත සිදුකිරීම සාමාන්‍ය ක්‍රමවේදය වී තිබුණි. අමාත්‍යාංශය විසින් 2014/2015 වර්ෂයේ විභාග ප්‍රතිඵල වලින් පරිබාහිරව විදේශ දූත මණ්ඩල සේවය සඳහා නිලධාරීන් 14 දෙනෙකු පත්කර යවා තිබුණි. උක්ත නිලධාරීන් 14 දෙනා අතුරින් නිලධාරීන් 05 දෙනෙකු රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අයත් නොවන නිලධාරීන් බව විගණනයේදී නිරීක්ෂණය විය.

වඩා තරඟකාරී හා රජයට වාසිදායක නොවන පරිදි කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම

වතිකානු ධජ (3x6) 5,975 ක් මිලදී ගැනීම සඳහා අමාත්‍යාංශය ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවා තිබුණු අතර, අමාත්‍යාංශය විසින් ලංසු කැඳවීමේදී අවශ්‍ය ප්‍රමිතීන්, නිමවුම්වල ගුණාත්මක තත්ත්වය හා අමුද්‍රව්‍ය වර්ගය කුමක්ද යන්න ආදී පිරිවිතරයන් ඉදිරිපත් කර නොතිබුණි.

අවම ලංසු ඉදිරිපත් කර තිබූ ආයතන විසින් ඉහත අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු නොකිරීම නිසා එම ලංසු ප්‍රතික්ෂේප කර තිබුණි. ඉහළ මිල ගණන් ඉදිරිපත් කර තිබූ ලංසුකරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර "ධජ" 5975 ක් රු. මිලියන 8.96 කට මිලදී ගෙන තිබුණි. මෙම ගනුදෙනුව වඩා තරගකාරීත්වයකින් යුතුව රජයට වාසිදායක වන පරිදි ඉටු කිරීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

පවතින චක්‍රලේඛ යාවත්කාලීන නොකිරීම

විදේශ දූත මණ්ඩලවල සේවය සඳහා වාර්තා කරනු ලබන හා සේවය නිමවී නැවත පැමිණෙන නිලධාරීන්ගේ ගමන් මළු වරායෙන් නිදහස් කර ගැනීමේදී අනුගමනය කළ යුතු වන ක්‍රියාපරිපාටිය සම්බන්ධයෙන් පවතින චක්‍රලේඛය යාවත්කාලීන විය යුතු අතර, 2015 වර්ෂයේ මුල් මාස 06 තුළ ගමන් මළු නිදහස් කරගැනීමේදි ප්‍රමාද ගාස්තු ලෙස රු.578,335 ක් ගෙවා තිබුණි.

කල් ඉකුත් වූ තැන්පතු රාජ්‍ය ආදායමට නොගැනීම

අමාත්‍යාංශයේ පොදු තැන්පතු ගිණුමේ වර්ෂ දෙක ඉක්වූ රු. මිලියන 55.73 ක ශේෂයක් හා දූත මණ්ඩල කාර්යාලවල 67 ක වර්ෂ 02 ඉක්මවූ රු. මිලියන 86.11 ක ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර රාජ්‍ය ආදායමට ගෙන නොතිබුණි.

අග්‍රිම ගිණුමේ ශේෂය නිරවුල් නොකිරීම

2015 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව අග්‍රිම ගිණුමේ ශේෂය රු. මිලියන 737.22 ක් වී තිබුණි. එදිනට අමාත්‍යාංශයේ හා විදේශ දූත මණ්ඩල කාර්යාලවල නිරවුල් නොවූ අත්තිකාරම් ශේෂයන්, විදේශ දූත මණ්ඩලවල මුදල් ශේෂයන්, මාර්ගස්ථ මුදල් ශේෂයන් හා වෙනත් ගැලපීම්වල එකතුව රු. මිලියන 687.99 ක් වී තිබිම නිසා අග්‍රිම ගිණුමේ නොසැසඳුනු ශේෂය රු. මිලියන 49.23 ක් වී තිබුණි.

විදේශ සේවා නියුක්තිය

1994 අංක 4 හා 2009 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත යටතේ විදේශ සේවා නියුක්ති කාර්යාංශය ස්ථාපනය කර තිබුණි. එය විදේශ රැකියා කර්මාන්තය සඳහා වන නියාමන ආයතනය වන අතර ශ්‍රී ලංකාවෙන් පිටත රැකියාවන් සොයා ගැනීම සඳහා ශ්‍රී ලාංකිකයන්ට පහසුකම් සැපයීම, බලපත්‍රලාභී නියෝජිත ආයතනවල කටයුතු නියාමනය හා විගමණික ශ්‍රමිකයන්ගේ හා පවුල්වල සුභසාධන කටයුතු ඉටු කිරීම මූලික අරමුණ වේ.

විගමණික සුභ සාධනය

ශ්‍රී ලංකාවෙන් පිටත සේවයේ නියුක්ත ශ්‍රී ලාංකිකයන්ගේ සුභසාධනය හා ආරක්ෂාව ඇති කිරීම සඳහා කාර්යාංශයේ ප්‍රධාන අරමුණ පෙරදැරි කරගෙන ඔවුන් වෙනුවෙන් සහන රක්ෂණ අරමුදල් යෝජනා ක්‍රමයක් කාර්යාංශය ක්‍රියාත්මක කර තිබුණි. මෙම ප්‍රධාන අරමුණ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කර ගැනීමට අවධානය යොමු නොවීම හේතුවෙන් පහත තත්ත්වයන් උද්ගත වී තිබුණි.

මියගිය විගමණිකයින් සඳහා වන්දි ගෙවීම

කාර්යාංශයේ ලියාපදිංචිය ලබා විදේශගතව සිටියදී මරණයට පත්වන ශ්‍රමිකයින් වෙනුවෙන් ඔවුන්ගේ මරණය වාර්තා වූ විගස ලිපියක් මගින් රක්ෂණ වන්දි පිළිබඳව යැපෙන්නන් දැනුවත් කිරීමට කටයුතු යොදා නොතිබුණි. මේ හේතුවෙන් 2014 වර්ෂයේ මියගිය විගමණිකයින් 315 දෙනෙකුගෙන් 129 දෙනෙකු වෙනුවෙන්ද, 2015 වර්ෂයේ මියගිය විගමණිකයන් 312 දෙනෙකුගෙන් 152 දෙනෙකු වෙනුවෙන්ද, රක්ෂණ වන්දි පිළිවෙලින් රු.මිලියන 51.60 ක් හා රු.මිලියන 60.80 ක් වශයෙන් එකතුව රු.මිලියන 112.40 ක් යැපෙන්නන් වෙත ලබා දීමට කාර්යාංශය අපොහොසත් වී තිබුණි. එසේම 2014 හා 2015 වර්ෂවල මියගිය විගමණිකයින් පිළිවෙලින් 15 දෙනෙකු හා 29 දෙනෙකුගේ උරුමකරුවන් තහවුරු කර තිබුණද, ඔවුන්ගේ යැපෙන්නන් වෙත හිමි විය යුතු පිළිවෙලින් ආසන්න වශයෙන් රු.මිලියන 6.00 ක් හා රු.මිලියන 11.60 ක වන්දි මුදල් 2016 ජනවාරි 19 දින වන විට ගෙවීමට කටයුතු කර නොතිබුණි.

මියගිය විගමණිකයන්ගෙ ලිපිගොනු යාවත්කාලීන කිරීම

2014 හා 2015 වර්ෂවල මියගිය විගමණිකයින් 42 දෙනෙකුගේ ලිපි ගොනුවල පවතින අඩුපාඩු හේතුවෙන් අදාළ වන්දි මුදල ලබා දීම 2016 ජනවාරි 19 දින වන විටත් කාර්යාංශය කටයුතු කර නොතිබුණි.

කාර්යාංශයේ අංශ අතර සම්බන්ධීකරණයක් නොවීම

හිංසනයට පත් වූ විගමණිකයන් 53 දෙනෙකු ලංකාවට ගෙන්වා ගැනීම සඳහා කාර්යාංශයේ විදේශ සබඳතා අංශය විසින් රු.1,071,639 ක් වැය කර තිබුණි. විගමණිකයා කාර්යාංශයේ සුභසාධන අංශය වෙත පැමිණ තමා විසින් ගුවන් ටිකට් පතට මුදල් ගෙවූ බව ප්‍රකාශකර රක්ෂණ හිමිකම සඳහා අයදුම්කර මුදල් ලබා ගෙන තිබුණි. කාර්යාංශයේ අංශ අතර මනා සම්බන්ධතාවයක් නොතිබීම හේතුවෙන් කාර්යාංශය වැය කළ ගුවන් ටිකට්පත් වියදම රක්ෂණ වන්දිවලින් ආවරණය කර ගත නොහැකි වීම නිසා රු.මිලියන 1.07 ක පාඩුවක් සිදු වී තිබුණි.

එසේම රක්ෂණ ගිවිසුම ප්‍රකාරව විදේශගත වන විගමණිකයකු හට හිරිහැරයක් වී නැවත ලංකාවට ගෙන්වා ගැනීමේ දී කාර්යාංශය වැය කළ එකතු කළ අගය මත බදු මුදල සමඟ ගුවන් ටිකට්පත් ගාස්තුව ප්‍රතිපූර්ණය කරවා ගැනිමට කටයුතු කළ යුතු වුවත්, ඒජන්සිය විසින් බදු රහිත ගුවන් ටිකට්පත් ගාස්තුව පමණක් කාර්යාංශයට ලබා දීම හේතුවෙන් කාර්යාංශයට රු.මිලියන 0.92 ක පාඩුවක් සිදු වී තිබුණි.

කාර්යාංශය වැය කළ ගුවන් ගමන් ටිකට්පත් ගාස්තු ප්‍රතිපූර්ණය කර නොතිබිම

රක්ෂණ යෝජනා ක්‍රමයේ ගිවිසුම් කාලය 2015 මාර්තු 28 දිනෙන් අවසන් වු අතර 2014 වර්ෂයේ සිට 2015 මාර්තු 28 දින වන විටත් විවිධ හිරිහැර මත ලංකාවට ගෙන්වා ගනු ලැබූ විගමණිකයන් 316 දෙනෙකු වෙනුවෙන් කාර්යාංශය රු. මිලියන 8.25 වැය කර ලබා දුන් ගුවන් ටිකට්පත් වියදම ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම විසින් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

අතිරේක කොමිස් මුදල් සහිත වාරික ගෙවීම

විදේශ ගතවන විගමණිකයන් යම් යම් හිරිහැර මත පූර්ණ අකර්මන්‍යතාවයක්, අර්ධ අකර්මන්‍යතාවයක් හෝ මියයාමෙන් ඔවුන් වෙනුවෙන් වන්දි මුදල් ලබාදීමේ අරමුණින් 2012 වර්ෂයේ සිට සහන රක්ෂණ අරමුදල නමින් රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබුණි. ඒජන්සිය විසින් 2012 අගෝස්තු 01 දින සිට 2013 ජුලි මාසය දක්වා කාලය සඳහා MBSL රක්ෂණ සමාගම සමඟත්, 2013 දෙසැම්බර් මාසයේ සිට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමඟත් ගිවිසුම්වලට එළඹ තිබුණි. ඒ අනුව විගමණිකයෙකු රක්ෂණය කිරීම සඳහා පිළිවෙලින් රු.287.07 ක වාරිකයක් හා රු.550 ක වාරිකයක්ද අයකර තිබුණි. විදේශ රැකියා ඒජන්සියක් විසින් එක් විගමණිකයෙක් වෙනුවෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් රු.900 ක වාරිකයක් ලබාගෙන, රක්ෂණ නියෝජිතයකුට හිමි රක්ෂණ කොමිස් ආදායමට අමතරව රු.මිලියන 40.90 ක අතිරේක ලාභයක් උපයා ගෙන තිබුණි. එසේම රක්ෂණ නියෝජිතයෙකු වශයෙන් එම පුද්ගලික සමාගම අතරමැදියෙකු ලෙස සම්බන්ධ වීම නිසා රක්ෂණ ප්‍රතිලාභ ලැබිය යුත්තන්ට වන්දි ලබා දීම සඳහා දිගු ක්‍රියාපටිපාටියක් අනුගමනය කිරීමට සිදුවී තිබුණු අතර වන්දි මුදල් ලබාදීමද ප්‍රමාද වී තිබුණි. තවද ඒජන්සිය සම්බන්ධ කර ගැනීමකින් තොරව කාර්යාංශය සහ රක්ෂණ සමාගම අතර ඍජු සම්බන්ධතාවයක් පවත්වා තිබුණේනම් එම පුද්ගලික සමාගමට ගෙවීමට සිදු වු රු.මිලියන 51.89 ක් වු කොමිස් මුදල සහ රු.900 ක වාරිකය මත හිමිවීමට තිබු අතිරේක ලාභයද කාර්යාංශයට හෝ විගමණිකයාට හිමිවීමට ඉඩකඩ තිබුණි.

විගමනිකයන් වෙනුවෙන් ලබා දුන් නිවාස ණය අයකර ගැනීමේ අකාර්යක්ෂමතාව

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහයෝගිතාවයෙන් සංක්‍රමණික සේවකයන් සඳහා 2013 මාර්තු 08 දින නිවාස ආධාර වැඩසටහනක් සැලැසුම් කර තිබුණි. ඒ අනුව කාර්යාංශය විසින් රු.මිලියන 100 ක් ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතුවක ඇප ලෙස සමෘද්ධි අධිකාරිය නමින් තැන්පත් කර තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට පුද්ගලයින් 9103 කට රු.මිලියන 2,648.11 ක ණය ප්‍රමාණයක් නිදහස් කර තිබුණි. එම ණය ලබා දුන් පුද්ගලයින් 2500 ක ගෙන් එනම් රු.මිලියන 587.1 ක ණය ප්‍රමාණයක් ගෙවීම පැහැර හැර තිබුණි.

එය ලබාදුන් මුළු ණය ප්‍රමාණයෙන් සියයට 22 ක් විය. එසේම 2015 ජූනි 30 දින වන විට නිකුත් කළ ණය මුදලෙන් සියයට 10 ක ප්‍රමාණයක් බොල් ණය බවට පත් වී තිබුණු අතර දෙපාර්ශවය අතර වූ ගිවිසුමට අනුව ණය අයකර ගැනීම සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු නොකිරීම හේතුවෙන් මෙම පාඩුව දෙපාර්ශවය විසින් දරා ගැනීමට සිදුවී තිබුණි.

නිසි අධිකාර බලයක් නොලත් ගනුදෙනු

2003 ජූනි 02 දිනැති අංක පිඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.7 ඡේදය හා 1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ප්‍රකාරව භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබා නොගෙන කාර්යාංශයේ රු.මිලියන 3,001.82 ක් වූ ආදායමින් 2015 වර්ෂයේ දී රු.මිලියන 84.37 ක් විවිධ දීමනා ලෙස කාර්යාංශයේ නිලධාරින්ට ගෙවා තිබුණි.

ප්‍රසම්පාදන කාර්ය පටිපාටියෙන් බැහැරව සාරි මිලදී ගැනිම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශයට පටහැනිව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අධිකාර සීමාව වූ රු.මිලියන 5 ක් ඉක්මවා 2015 වර්ෂයේ නිල ඇඳුම් සාරි මිලදී ගෙන තිබුණි. බදුල්ල දිස්ත්‍රික් රටවිරු ව්‍යවසායකත්ව සහ සංවර්ධන සමුපකාර සමිතියෙන් පමණක් ඒ සඳහා ලංසු කැඳවා තිබුණි. ඒ අනුව එම සමිතියෙන් රු.මිලියන 13.28 ක් වැය කර සාරි 3,144 ක් ලබා ගෙන තිබුණි. ඌව පළාත් සභාවේ කර්මාන්ත අමාත්‍යාංශයෙන් එම සාරි මිලදී ගැනීම කාර්යාංශය දැනුවත්ව තිබියදී, බදුල්ල දිස්ත්‍රික් රටවිරු ව්‍යවසායකත්ව සහ සංවර්ධන සමුපකාර සමිතිය හරහා මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. ඒ හේතුවෙන් එක් සාරියක් සඳහා රු.200 ක අමතර පිරිවැයක් දැරීමට කාර්යාංශයට සිදු වී තිබුණි. 2014 වර්ෂයේ සාරි 750 කින් රු.150,000 ක් ද, 2015 වර්ෂයේ සාරි 3144 කින් රු.628,800 ක අමතර ලාභයක් යථෝක්ත සමිතිය ලබාගෙන තිබීම හේතුවෙන් කාර්යාංශයට 2014 හා 2015 වර්ෂයේ සාරි මිලදී ගැනීමෙන් රු.778,800 ක පාඩුවක් සිදු වී තිබුණි.

සේවක අර්ථසාධක අරමුදලේ දායකය ගණනය කිරීම

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 47 වන වගන්තිය ප්‍රකාරව කාර්යාංශයේ සේවක අර්ථසාධක අරමුදල් දායකය ගණනයේ දී ජීවන වියදම් දීමනාව අදාළ කර නොගැනීම හේතුවෙන් 2015 නොවැම්බර් 08 දින වන විට රු.මිලියන 21.61 ක් අඩුවෙන් දායක මුදල් ගණනය කර තිබුණි.

ව්‍යාපෘතියකට උපදේශක ගාස්තු ගෙවීම

දඹුල්ල විගමණික සම්පත් මධ්‍යස්ථානය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව අමාත්‍ය මණ්ඩලය විසින් අවලංගු කර තිබුණි. නමුත් කාර්යාංශය විසින් රු.මිලියන 9.88 ක් එසේ අවලංගු කරන ලද කොන්ත්‍රාත්තුව වෙනුවෙන් උපදේශන ගාස්තු ලෙසට ගෙවා තිබුණි.

කාර්යාංශයට අදාළ ලාභාංශ භාර නොගෙන ඒජන්සියේ සංවර්ධනයට යෙදවීම

2015 මාර්තු 17 දින අමාත්‍යාංශ ලේකම්, කාර්යාංශයේ සභාපති හා නියෝජිත ආයතනයේ සභාපති සමඟ වූ සාකච්ඡාවේදී ගත් තීරණයන් ප්‍රකාරව 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට කාර්යාංශයට ලැබිය යුතු රු.මිලියන 3.51 ක ලාභාංශය කාර්යාංශය විසින් භාර නොගෙන එම මුදල ඒජන්සියේ සංවර්ධනය සඳහා වෙන්කර දී තිබුණි.

පුහුණු වැඩසටහන් පැවැත්වීම

ඊශ්‍රායෙල් රාජ්‍යයේ රැකියා සඳහා යාමට නියමිත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් වෙනුවෙන් 2013 වර්ෂයේදී මාදුරු ඔය හා මින්නේරිය යුධ හමුදා පාසල් මඟින් පැවැත්වූ පුහුණු වැඩසටහන් වෙනුවෙන් ශ්‍රී ලංකා යුධ හමුදා මූලස්ථානයට ගෙවිය යුතු රු.මිලියන 3.11 ක් 2015 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද මෙම වැඩසටහනට පුහුණුලාභීන් 522 ක් සහභාගී වී තිබූ අතර 2015 දෙසැම්බර් 31 දිනට පුහුණුලාභීන්ගෙන් 120 ක් පමණක් විදේශගත වී තිබුණි. ඒ අනුව පුහුණුලාභීන් 402 ක් සඳහා වැය කළ රු. මිලියන 2.4 ක් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධනය.

ශ්‍රී ලංකාවේ ධීවර හා ජලජ සම්පත් භාවිතය වත්මන් හා අනාගත පරපුරේ ප්‍රතිලාභ පිණිස කළමනාකරණය කිරීමේ මෙහෙවර ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වෙත පැවරි ඇති අතර ඒ සඳහා වූ අමාත්‍යාංශයේ ආයතනික ව්‍යුහයට ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය, ලංකා ධීවර සංස්ථාව සහ සී/ස සීනෝර් පදනම යන ආයතනද ඇතුළත් වේ.

මිලියන 2.6 කට වැඩි ධීවර ප්‍රජාව සඳහා ජීවෝනෝපාය සැලසීම මෙන්ම රටේ ජනතාවගේ ප්‍රෝටීන අවශ්‍යතාවයෙන් සියයට 53 කට වැඩි ප්‍රමාණයක් ලබාදීම මගින් ධීවර කර්මාන්තය ශ්‍රී ලංකා ආර්ථිකයේ වැදගත් කර්යභාරයක් ඉටු කරයි.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය හා ධිවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව ද ඇතුළත්ව අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සඳහා 2015 වර්ෂයේදී වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් රු.මිලියන 6,203.3 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර, ඉන් රු.මිලියන 5,034.3 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 19 ක් හෙවත් රු.මිලියන 1,169 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන විගණනයේ දී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන ආනයනය හා අපනයනය

දිවයින වටා කි.මී. 1585 ක වෙරළ තීරයක් සතුවුවද දකුණු ආසියානු කළාපයේ මුළු මත්ස්‍ය ආනයනයෙන් සියයට 75 කට වැඩි දායකත්වයක් දරන ශ්‍රී ලංකාව දකුණු ආසියානු කලාපයේ ප්‍රධානතම මත්ස්‍ය ආනයන කරු බවට පත්ව තිබුණි. මේ අතර සමාලෝචිත වර්ෂයේ ශ්‍රී ලංකාවේ මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන අපනයන ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 10,082 කින් හෙවත් සියයට 29 කින් පහත වැටී තිබු අතර, ආනයන වියදම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 11,869 කින් හෙවත් සියයට 63 කින් ඉහළ ගොස් තිබීම නිසා ශුද්ධ විදේශ විනිමය ඉපයීම රු. මිලියන 6,013 ක සෘණ අගයක් බවට පත්ව තිබුණි. තවද අපනයන ඉපයුම් සඳහා ධීවර අංශයේ දායකත්වය ඉකුත් වර්ෂයේ සියයට 2.4 ක් ව පැවති අතර, සමාලෝචිත වර්ෂයේ එය සියයට 1.8 ක් දක්වා පහත වැටී තිබුණි. මෙම තත්වය යටතේ සමාලෝචිත වර්ෂයේ මත්ස්‍ය අපනයනය තුළින් විදේශ විනිමය ඉපයීම නම් වූ අමාත්‍යාංශ අරමුණට ළඟාවීමෙහිලා ප්‍රගතින් පෙන්නුම් කර නොතිබුණි.

මත්ස්‍ය නිෂ්පාදනය හා පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම

ජාතික මත්ස්‍ය නිෂ්පාදනය වැඩිකිරීම තුළින් ජනතාවගේ පෝෂණ තත්ත්වය හා ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීම අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණක් ලෙස හඳුනාගෙන තිබුණද,

ඊට අදාලව අනාවරණය වූ පහත දැක්වෙන කරුණු හේතුවෙන් එම අරමුණ ඉටුකර ගැනීමෙහිලා ප්‍රගතින් පෙන්නුම් කර නොතිබුණි.

- ස්ථාවර මිල මත දළ දේශිය නිෂ්පාදනය සඳහා ධීවර අංශයේ දායකත්වය ඉකුත් වර්ෂයේ රු. මිලියන 120,657 ක් එනම් සියයට 1.5 ක් වූ (පදනම් වර්ෂය 2010) අතර සමාලෝචිත වර්ෂයේ එය රු.මිලියන 117,453ක් එනම් සියයට 1.3 ක් දක්වා රු.මිලියන 3,204 කින් හෙවත් සියයට 2.7 කින් පහත වැටී තිබුණි.
- මෙට්‍රික් ටොන් 535,050 ක් වූ ඉකුත් වර්ෂයේ මත්ස්‍ය නිෂ්පාදනය සමාලෝචිත වර්ෂයේ මෙට්‍රික් ටොන් 520,190 ක් දක්වා මෙට්‍රික් ටොන් 14,860 කින් එනම් සියයට 3 කින් පහත වැටී තිබු අතර වර්ෂයකට කිලෝ ග්‍රෑම් 25.76 ක් වූ ඉකුත් වර්ෂයේ එක් පුද්ගලයෙකු සඳහා වූ දේශිය මත්ස්‍ය නිෂ්පාදනය සමාලෝචිත වර්ෂයේ වර්ෂයකට කිලෝග්‍රෑම් 24.81 ක් දක්වා අඩු වී තිබුණි.
- ශ්‍රී ලංකා වෛද්‍ය පර්යේෂණ ආයතනයේ නිර්නායකයන්ට අනුව අනාගත පරපුරේ ශාරීරික හා මානසික සෞඛ්‍ය වැඩි දියුණු කිරීම සඳහා වාර්ෂිකව ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය කීලෝ ග්‍රෑම් 22 ක් හා දෛනිකව ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය ග්‍රෑම් 60 ක් දක්වා වැඩිකර ගැනීමට අමාත්‍යාංශය සැලැසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා කාලය තුළ ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය දිනකට ග්‍රෑම් 44.6 ක් වි තිබුණි.
- රටෙහි අනෙකුත් දිස්ත්‍රික්ක හා සැසඳීමේදී කෑගල්ල, මහනුවර, මාතලේ, වවුනියාව, නුවරඑළිය හා බදුල්ල යන දිස්ත්‍රික්ක 6 හි වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය දිගින් දිගටම ඉතා අඩු ප්‍රමාණයක් වාර්තා කර තිබුණි. 2015 වර්ෂයේදී එම නිෂ්පාදනය රටේ මුළු මත්ස්‍ය නිෂ්පාදනයෙන් සියයට 0.0031 ක සිට සියයට 0.2882 ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයක් වි තිබුණි. රටේ ජනතාවගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවිමේ අරමුණ ඉටුකර ගැනීමේ දී මෙම තත්ත්වය බාධාවක් වුවද, මිරිදිය ධීවර නිෂ්පාදනය ඉහළ නංවා ගැනීම සඳහා ජලජීවි වගා සංවර්ධන අධිකාරිය විධිමත් සැලැස්මක් මත ක්‍රියාත්මක වී නොතිබුණු බව 2015 වර්ෂයේ ධීවර යාත්‍රා හා දැල් ආම්පන්න බෙදාහැරීම සැලැසුම් කිරීමේ දී මෙම දිස්ත්‍රික්ක සඳහා ප්‍රමුඛතාවය ලබා නොදීම තුළින් නිරීක්ෂණය විය.

මච් යාත්‍රා දෙක මිලදී නොගැනීම

මච් යාත්‍රා 02 ක් මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 40 ක ප්‍රතිපාදන සළසා තිබුණ ද අදාළ යාත්‍රා මිලදී නොගැනීම නිසා සළසා තිබුණු මුළු ප්‍රතිපාදනයම ඉතිරි වි තිබුණි. එම මිලදී ගැනීම සඳහා 2006 වර්ෂයේ සිට අඛණ්ඩව ප්‍රතිපාදන සළසා තිබුණ ද මිලදී ගැනීම සඳහා කිසිදු පියවරක් නොගැනීම හේතුවෙන් 2006 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා මේ වෙනුවෙන් වැය කළ එකතුව රු. මිලියන 113.56 ක් නිෂ්ඵල වි තිබුණි.

ධීවර යාත්‍රා සඳහා සුපරීක්ෂණ පද්ධති ස්ථාපිත කිරීම.

ඉන්දියානු සාගර ටූනා කොමිසමේ සාමාජිකයෙකු වශයෙන්ද, ගිවිසුම්කාර පාර්ශවකරුවෙකු වශයෙන් ද හා යුරෝපා සංගමයට මසුන් අපනයනය කරන රටක් වශයෙන් ද, ජාත්‍යන්තර මුහුදේ ක්‍රියාත්මක

වන ධීවර යාත්‍රා සඳහා සුපරික්ෂණ පද්ධතියක් ස්ථාපිත කළ යුතුව තිබුණි. ඒ අනුව ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාශය 2010 වර්ෂයේ ආරම්භ කළ එම කාර්යය 2015 වර්ෂය අවසාන වන විටත් නිම කර නොතිබුණි. එම කාර්ය සඳහා 2015 වර්ෂයේදී ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය රු. මිලියන 85.16 ක්ද, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව රු.මිලියන 553.9 ක්ද, වැය කර තිබූ අතර,ඒ සඳහා සැපයුම්කරු තෝරා ගැනීම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල නොවන පරිදි ස්වේච්ඡා යෝජනා (Unsolicited Proposal) ක්‍රමයට සිදුකර තිබුණි. මේ නිසා අදාළ කොන්ත්‍රාත්තුවේ විනිවිදභාවය විගණනයේදි තහවුරු වී නොතිබුණි.

ඉන්ධන සහනාධාර සඳහා විකල්ප යෝජනා ක්‍රමය

ධීවරයන් සඳහා ලබාදුන් ඉන්ධන සහනාධාරයට විකල්පයක් ලෙස 2014 වර්ෂයේදී ලබාදිය යුතු වු ධීවර දැල්, ජීවිතාරක්ෂක කබා හා බෝට්ටු එංජින් ලබා දීම සමාලෝචිත වර්ෂය තුළ දී නිම කිරීමට අසමත්ව තිබුණි.

ලංකා ධීවර සංස්ථාව

සංස්ථාව පිහිටුවීමේ අරමුණ කරා ළගා නොවිම.

2013 වර්ෂයේ මෙට්‍රික් ටොන් 3,979 ක් වු ලංකා ධීවර සංස්ථාවේ මත්ස්‍ය අලවිය සමාලෝචිත වර්ෂයේ දී මෙට්‍රික් ටොන් 3,661 ක් දක්වා ද, 2013 වර්ෂයේ ක්‍රියාත්මක පැවැති සංස්ථාව සතු විකුණුම් මධ්‍යස්ථාන 132 ක ප්‍රමාණය 2015 වර්ෂයේදි 98 ක් දක්වා ද අඩු වී තිබුණි. 2015 වර්ෂයේදි නව මත්ස්‍ය වෙළඳ සැල් 30 ක් සංස්ථාවේ වෙළඳ සැල් ජාලයට එක් කර ගැනිමට සැලැසුම් කර තිබූ අතර එම කටයුතු වෙනුවෙන් වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් රු.මිලියන 6.9 ක ප්‍රතිපාදන සළසා තිබුණත්, වර්ෂය අවසාන වන විට සම්පුර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. තවද ශ්‍රී ලංකාවේ මත්ස්‍ය වෙළඳපොළ ප්‍රධාන වශයෙන් සියයට 99 ක් පෞද්ගලික අංශය මගින් පාලනය වන අතර සියයට 1 ක ප්‍රමාණයක් පමණක් ලංකා ධිවර සංස්ථාව මගින් පාලනය වේ. ඒ අනුව මත්ස්‍ය පරිභෝගිකයන් සඳහා සාධාරණ මිලක් සහතික කරනුවස් තරඟකාරීත්වයක් ඇති කිරිම සඳහා පිහිටුවන ලද ලංකා ධිවර සංස්ථාව එම අරමුණ ලඟා කර ගැනීමෙහිලා ප්‍රගතියක් පෙන්නුම් කර නොතිබුණි.

සංස්ථාව සතු අයිස් යන්ත්‍රාගාරවල නිෂ්පාදනය අඩුවිම

2012 වර්ෂයේ ලංකා ධිවර සංස්ථාව සතුව පැවැති අයිස් යන්ත්‍රාගාර ගණන 12 ක් ව පැවැතුණි. එය 2013 වර්ෂයේදී 6 ක් දක්වා ද, 2014 වර්ෂයේ 4 ක් දක්වා ද හා 2015 වර්ෂයේ 3 ක් දක්වා ද වශයෙන් අඩුවී තිබුණි. එමෙන්ම 2013 වර්ෂයේදී සංස්ථාව විසින් අයිස් මෙට්‍රික් 16,082 ක් නිෂ්පාදනය කර තිබුණි. එය 2014 වර්ෂයේදී අයිස් මෙට්‍රික් ටොන් 7,525 ක්ද, 2015 වර්ෂයේදි මෙට්‍රික් ටොන් 6,785 ක් දක්වා ක්‍රමයෙන් අඩු වි තිබුණි.

සංස්ථාවේ ශුද්ධ වත්කම් ඛාදනය වීම

සංස්ථාව දිගින් දිගටම අලාභ ලැබීම මත ශුද්ධ වත්කම්වලට අහිතකර ලෙස බලපෑම නිසා හිමිකාරිත්වය හීන වී යාම හේතුවෙන් භාණ්ඩාගාරයේ හෝ රජයේ වෙනත් මූල්‍ය සහායක් නොමැතිව පවත්වාගෙන යාමේ අවිනිශ්චිත භාවයක් පැවැතුණි. සංස්ථාවේ පවතින දැඩි මූල්‍ය දුෂ්කරතාවය සඳහා සහන

ලබාගැනීම වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව සංස්ථාවේ අතිරික්ත කාර්ය මණ්ඩලයට මාස හයක කාලයක් රජයෙන් වැටුප් ගෙවීමට තීරණය කර තිබුණි. තවද සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරය විමසා, ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමයක් සකස් කර විෂය භාර අමාත්‍යවරයා මගින් අමාත්‍ය මණ්ඩලය වෙත සළකා බැලීම සඳහා ඉදිරිපත් කළ යුතු බවටද අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි.

සීමාසහිත සීනෝර් පදනම

අමාත්‍ය මණ්ඩලයේ තීරණයක් අනුව සීමාසහිත සීනෝර් පදනම සතුව තිබූ වීරවිල හා ලුණුවිල දැල් කම්හල් 2 ක් රාජ්‍ය සමාගමක් වෙත පැවරීමටත් ඒ වෙනුවට එම සමාගමට ලබාදී තිබූ කරෙයිනගර් බෝට්ටු නිෂ්පාදන කම්හල නැවත සීනෝර් පදනමට ලබා දීමට එකඟව වී සමාගම් 2 ක අතර අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව, ක්‍රියාකාරිව පැවති දැල් කම්හල් 2011 නොවැම්බර් 01 දින එම රාජ්‍ය සමාගම වෙත පවරා දී තිබුණ ද, යුද්ධයෙන් විනාශ වී ගිය බෝට්ටු නිෂ්පාදන කම්හලෙහි නිෂ්පාදන කටයුතු ඇරඹීමට සුදුසු නවිකරණ සැලැස්මක් 2015 වර්ෂය වන විටත් සකස් කර නොතිබුණි.

ධීවර වරාය හා නැංගුරම් තොටුපල ඉදිකිරීමේ හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය.

- 2013 -2015 කාල පරිච්ඡේදය තුළ ධීවර වරාය හා නැංගුරම් තොටුපොළවල් ඉදිකිරීමේ හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ නිමකළ යුතු වූ ගාල්ල ධීවර වරායේ නව ජැටිය ඉදිකිරීම 2015 වර්ෂයේ අවසාන වන විටත් ආරම්භ කර නොතිබුණි.
- කළමැටිය ධීවර වරාය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2015 දෙසැම්බර් 31 දින වන විට අවසන් කළ යුතු වුවත්, එදින වන විට එහි භෞතික කාර්යසාධනය සියයට 36 ක් පමණ වී තිබුණි.
- හම්බන්තොට ධීවර වරායේ දියකඩනය දීර්ඝ කිරීම, පලඟතුරෙයි පෝරුතොට ගොඩබිම් මධ්‍යස්ථානවල දියකඩන දීර්ඝ කිරීම යන කාර්යන්ගේ එදිනට භෞතික කාර්යසාධනය සියයට 50 ක් පමණක්ද වී තිබුණි.
- අදාළ කාලය තුළ නිම කළ යුතු වූ කයිකාවල නැංගුරම්පල ඉදිකිරීම ආරම්භ කර සියයට 2 ක භෞතික ප්‍රගතියක් හා රු.මිලියන 83.96 ක මූල්‍ය ප්‍රගතියක් සඳහන් තිබුණද, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තු අනුමැතිය ඒ සඳහා නොලැබීම නිසා ව්‍යාපෘතිය නවතා තිබුණි.
- මරදාන නැංගුරම්පල ඉදිකිරීමේ කටයුතු නිමකර තිබුණද, එම කාර්යය සඳහා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා දී නොතිබිම හේතුවෙන් ඉන් සිදුවන පාරිසරික බලපෑම නිගමනය කළ නොහැකිව තිබුණි.
- 2016 වර්ෂයේ දී නිමකළ යුතු කරෙයිනගර් බෝට්ටු අංගනය, වෙන්නප්පුව, දොඩන්දූව ධීවර වරායන් හා පැරලිය නැංගුරම්පල යන ඉදිකිරීම් සහ මීගමු කළපු සංවර්ධනය යන කාර්යන්හි 2015 දෙසැම්බර් 31 දින වන විට මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 22.63 ක් වූ නමුත් භෞතික කාර්යසාධනයක් සිදු කර නොතිබුණි.

සෞඛ්‍ය හා පෝෂණය

දේශයේ ආර්ථික, සමාජීය, මානසික හා අධ්‍යාත්මික සංවර්ධනය සඳහා දායකවන සෞඛ්‍ය සම්පන්න ජාතියක් බිහිකිරීමේ දැක්මකින් යුතුව, ජනතා අවශ්‍යතාවයට ප්‍රතිචාර දක්වමින් සාමූහිකව ක්‍රියාකරමින්, පරිපූර්ණ ඉහළම මට්ටමේ ගුණාත්මක සමාන ඵලදායි සහ තිරසාර සෞඛ්‍ය සේවාවක් ශ්‍රී ලංකා වාසී ජනතාවට ලබාදීම මගින්, අත්කරගත හැකි ඉහළම සෞඛ්‍ය මට්ටමට ළඟාවීම සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ මෙහෙවර වේ. ඒ අනුව ප්‍රධාන කාර්යයන් වන්නේ, සෞඛ්‍ය අංශය සඳහා ප්‍රතිපත්ති සම්පාදනය, වැඩසටහන් සහ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම, සෞඛ්‍ය සේවා ලබාදීම සඳහා ප්‍රමිතීන් හා නීතිරීති සම්පාදනය කිරීම, මානව සම්පත් සංවර්ධනය, කළමනාකරණය, සැලැසුම්කරණය සහ පද්ධති සංවර්ධනය, සම්පත් බෙදාහැරීම, වැඩසටහන් හා ව්‍යාපෘතීන් මෙහෙයවීම, අධීක්ෂණය හා ඇගයීම වේ. මෙම කාර්යභාරය අමාත්‍යාංශය හා ඒ යටතේ වන ව්‍යවස්ථාපිත ආයතන මගින් ඉටුකිරීමේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

සංවිධාන ව්‍යුහය හා වැඩ බෙදීම විධිමත් පරිදි සිදුකර නොතිබීම

පිළියෙල කර තිබුණු සංවිධාන සටහනේ තනතුරු ධුරාවලිය නිසි පරිදි ඇතුළත් කර නොතිබුණි. අමාත්‍යාංශ පරිශ්‍රය තුළ විවිධ අංශ 90 ක් පමණ පිහිටුවා තිබුණු නමුත් එම අංශ අතර නිලධාරීන් අනුයුක්ත කිරීම හා නිලධාරීන් අතර වැඩ බෙදීම අවිධිමත්ව සිදු කර තිබුණු අතර අංශ අතර අන්තර් සම්බන්ධතාවය ඉතා දුර්වල තත්ත්වයක පැවතුණි. ප්‍රසම්පාදන කටයුතු දීර්ඝ ලෙස ප්‍රමාදවීම, ඒ ඒ අංශවල තිබිය යුතු දත්ත පවත්වා නොතිබීම, සෞඛ්‍ය කාර්ය මණ්ඩලවල පත්කිරීම්, අනුයුක්ත කිරීම්, මාරුකිරීම් අවිධිමත්වීම ආදිය කෙරෙහි මේ තත්ත්වය බොහෝ සෙයින් බලපා තිබුණි.

කාර්ය මණ්ඩල පරිපාලනය දුර්වල තත්ත්වයක පැවතීම

අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයින් 7,014 ක් බඳවා ගෙන වැටුප් ගෙවා තිබුණි. එම අතිරික්තය තුළ විශේෂඥ වෛද්‍යවරු 86 ක්ද, සෞඛ්‍ය කාර්ය සහායකයින් 5,567 ක්ද විය. අනුමත කාර්ය මණ්ඩලය තුළ නොවූ තනතුරු සඳහා ස්ථිර පදනමින් සේවකයින් 56 දෙනෙකු හා තාවකාලික හා කොන්ත්‍රාත් පදනමින් සේවකයින් 1,296 දෙනෙකු බඳවා ගෙන තිබුණි. තවද නගර ආශ්‍රිත රෝහල් 24 ක හා ආයතන 02 ක විශේෂඥ වෛද්‍යවරුන්ගේ අතිරික්තය 172 ක්වූ අතර එම අතිරික්තය 01 සිට 25 දක්වා පරාසයක පැවතුණි. වෙනත් රෝහල් 09 ක හා ආයතන 09 ක පැවති විශේෂඥ වෛද්‍යවරුන්ගේ ඌනතාවය 86 ක් විය. එසේම රෝහල් හා ආයතන 75 ක වෛද්‍ය නිලධාරී පුරප්පාඩු සංඛ්‍යාව 1,772 ක් හා රෝහල් හා ආයතන 16 ක අතිරික්ත සංඛ්‍යාව 178 ක් විය. අමාත්‍යාංශයේ විවිධ

පරිපාලන කටයුතු සඳහා අනුමත වෛද්‍ය නිලධාරී සංඛ්‍යාව 30 ක් වූ නමුත්, අතිරික්ත වෛද්‍යවරු 57 දෙනෙකු ප්‍රමාණවත් කාර්ය පැවරුමක් නොමැතිව විවිධ අංශවලට

ඖෂධ,ශල්‍ය උපකරණ හා රසායනාගාර ද්‍රව්‍ය වැනි වෛද්‍ය සැපයීම්

ඖෂධ වට්ටෝරු සමාලෝචන කමිටුවේ නිර්දේශය ලැබී නොතිබුණු වෛද්‍ය සැපයීම් මිලදී ගැනිම

ඖෂධ වට්ටෝරු සමාලෝචන කමිටුව නිර්දේශ නොකරන ලද වෛද්‍ය සැපයීම් මිලදී නොගත යුතු බව අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි. නමුත් එම කමිටුවේ නිර්දේශය ලැබී නොතිබුණු වෛද්‍ය සැපයීම් අයිතම 4,555 ක් මිලදී ගෙන තිබුණි.

මිල අධික අයිතම තරඟකාරීත්වයෙන් තොරව මිලදී ගැනීම

ඇස්තමේන්තුගත නොකළ අයිතම තුළ ඇස්තමේන්තුගත කළ හැකි මිල අධික අයිතම පැවති අතර, එම අයිතම ඇස්තමේන්තුගත නොකිරීම හේතුවෙන් ඒවා තරඟකාරීත්වයෙන් බැහැරව අධික මිලකට දේශීය වශයෙන් මිලදී ගෙන තිබුණි. එවැනි ඇස්තමේන්තුගත නොකළ අයිතම 10 ක නියැදියකින් අයිතම 7ක් 2014 වර්ෂයේ සිට 2016 ජුනි මාසය දක්වා අවස්ථා 243 කදී රු.මිලියන 168 කට මිලදී ගෙන තිබුණි.

ඖෂධ ඇණවුම් කිරීමේදී විධිමත් කාලසටහනක් අනුගමනය නොකිරීම.

ඇස්තමේන්තුගත අයිතම මිලදී ගැනීම සඳහා මාස 11 ක සැපයුම් කාලයක් සහිතව ඇණවුම් නිකුත් කිරීම ප්‍රතිපත්තිය විය. නමුත් 2015 අනුයුක්ත කර තිබුණි. වෛද්‍ය නිලධාරී පුරප්පාඩු හේතුවෙන්, දිස්ත්‍රික්ක 15 කට අයත් ප්‍රාදේශීය රෝහල් 11 ක් හා ප්‍රාථමික සත්කාරක ඒකක 30 ක් වසා දමා තිබුණි.

වර්ෂයට අදාළව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ඉදිරිපත් කර තිබුණු ඇණවුම් සංඛ්‍යාවෙන් සියයට 45 කට අදාළ වෛද්‍ය සැපයීම් පමණක් නියමිත කාලය තුළදී ලැබී තිබුණි. නිසි කාල සටහනකට අනුව කටයුතු කර නොතිබුණු බැවින් ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාදවීම ඊට බොහෝ සෙයින් හේතුවී තිබුණි. මෙම ප්‍රමාදය හේතුවෙන් සෑම වර්ෂයකදීම ඉතා විශාල පිරිවැයක් සහිත වෛද්‍ය සැපයීම් දේශීය වෙළඳපලින් මිලදී ගැනීමට සිදුව තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී පමණක් දේශීය වෙළඳපලින් මිලදීගෙන තිබූ වෛද්‍ය සැපයීම්වල මුළු පිරිවැය රු.මිලියන 4,310 ක් විය. වෛද්‍ය සැපයීම් දේශීය වෙළඳපලින් මිලදී ගැනීමට සිදුවීම නිසා 2007 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළදී වැයකිරීමට සිදුවී තිබුණු අතිරේක පිරිවැය රු.මිලියන 4,876 ක් විය. ඇතැම් ඖෂධ වර්ගවල දේශීය වෙළඳපල මිල රාජ්‍ය ඖෂධ සංස්ථාවේ මිලට වඩා අසාමාන්‍ය ගුණයකින් වැඩිවී තිබුණි.

වෛද්‍ය සැපයීම් මිලදී ගැනීමත් සමඟම තත්ත්ව පරීක්ෂණයකට යොමු නොකිරිම

වෛද්‍ය සැපයීම් මිලදී ගත් වහාම තත්ත්ව පරීක්ෂණයට යොමු කර නොතිබුණු අතර, එම සැපයීම් පිළිබඳ අවිනිශ්චිතතාවයක් ඇතිවීමෙන් පසු පමණක් තත්ත්ව පරීක්ෂණයට යොමුකර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී පමණක් රු.මිලියන 233.9 ක් වටිනා ඖෂධ තත්ත්වයෙන් අසමත්වී තිබුණි. 2015 වර්ෂයේදී තත්ත්වයෙන් අසමත් වූ ඖෂධ භාවිතයෙන් ඉවත් කරන ලෙස නියෝග ලැබෙන අවස්ථාව වන විටත්

රු.මිලියන 163.9 ක් පිරිවැය වූ ඖෂධ රෝගීන් වෙත නිකුත් කර තිබූ අතර එයින් රෝගීන්ට සිදුව ඇති හානිය පිළිබඳව සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. තත්ත්ව පරීක්ෂණ සඳහා දිගුකාලයක් ගත කර තිබීම හේතුවෙන් ඇතැම් ඖෂධ කල් ඉකුත්වී තිබුණි.

තත්ත්වයෙන් අසමත් ඖෂධවල පිරිවැය සැපයුම්කරුවන්ගෙන් අයකර නොගැනීම.

තත්ත්වයෙන් අසමත් ඖෂධවල පිරිවැය හා ඖෂධ පිරිවැයෙන් සියයට 25 ක පරිපාලන වියදම් සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි. නමුත් 2015 දෙසැම්බර් 31 දින වන විට තත්ත්වයෙන් අසමත් ඖෂධවල මුළු පිරිවැය වූ රු.මිලියන 2,772.4 කින් රු.මිලියන 301.4 ක් පමණක වෛද්‍ය සැපයීම් අංශය රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙන් අයකර තිබුණු නමුත් ඖෂධ සංස්ථාව අදාළ සැපයුම්කරුවන්ගෙන් රු.මිලියන 188.4 ක් පමණක් අයකර ගෙන තිබුණි. ඖෂධ ගබඩා හා ප්‍රවාහනය කිරීමට යොදා ගන්නා වාහන නියමිත ප්‍රමිති තත්ත්වයෙන් නොතිබෙන බවත් ඒ හේතුවෙන් ඖෂධ දිවයින තුළට පැමිණි පසු තත්ත්වයෙන් අසමත් වන බවත් සැපයුම්කරුවන් විසින් චෝදනා කර තිබුණු බැවින් ඉතිරි වටිනාකම් ඔවුන්ගෙන් අයකර ගැනීමට නොහැකිවී තිබුණි.

පස් අවුරුදු සැලැස්ම ක්‍රියාත්මක කිරීම

ජාතික ඖෂධ තත්ත්ව පාලන රසායනාගාරයේ යටිතල පහසුකම් හා මානව සම්පත් සංවර්ධනය කිරීම සඳහා පිළියෙල කර තිබුණු මුළු ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 410.5 ක් සහිත පස් අවුරුදු සංවර්ධන සැලැස්ම අමාත්‍ය මණ්ඩලය විසින් 2009 ඔක්තෝබර් 15 දින අනුමත කර තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට එහි මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 132.8 ක් පමණක් විය. පසුගිය වර්ෂ හතර තුළදී සිදුකර තිබුණු රසායනාගාර පරීක්ෂණ ප්‍රමාණය අනුව පස් අවුරුදු සැලැස්මෙන් රසායනාගාර පහසුකම් වැඩි දියුණු වීමක් සිදුවී නොතිබුණු බව තහවුරු විය.

වෛද්‍ය සැපයුම් බහාලුම්වල රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කිරීම

ඖෂධ සංස්ථාව මගින් සපයනු ලබන වෛද්‍ය සැපයීම් බහාලුම්වල රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කර තිබිය යුතුවීම ඇණවුම් කොන්දේසියක් මෙන්ම හඳුන්වාදී තිබුණු අභ්‍යන්තර පාලන උපක්‍රමයක්ද විය. නමුත් රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කර නොතිබුණු රු.මිලියන 60.7 ක පිරිවැයක් සහිත වෛද්‍ය සැපයීම් අයිතම 06 ක් ගබඩාවල තිබුණු බව නියැදි පරීක්ෂාවකදී තහවුරු විය.

අපහරණය කර තිබුණු වෛද්‍ය සැපයීම් පොත්වලින් කපාහැරීම

1990 වර්ෂයේ සිට 2010 වර්ෂය අතර කාල පරිච්ඡේදයට අදාළ රු.මිලියන 170.7 ක් වටිනා කල් ඉකුත්වූ වෛද්‍ය සැපයීම් වර්ග 387 ක් 2012 වර්ෂයේදී අපහරණය කර තිබුණු නමුත් එම වෛද්‍ය සැපයීම් පොතෙන් කපා හැරීමට අදාළ අධිකාර බලය ලැබී නොතිබුණි. 2011 වර්ෂයෙන් පසු කල් ඉකුත්වූ ඖෂධ පිළිබඳ තොරතුරු හා දත්ත විගණනය සඳහා ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශය අපොහොසත් විය.

වෛද්‍ය සැපයීම් තොග ඌනතා සම්බන්ධයෙන් කටයුතු නොකිරීම

වෛද්‍ය සැපයීම් අංශයේ ගබඩාවල පැවති රු.මිලියන 42.7 ක තොග ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව විධිමත් පරීක්ෂණ සිදු කර නොතිබුණි.

වෛද්‍ය උපකරණ සැපයීම

වෛද්‍ය උපකරණ සැපයීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ අඩුපාඩු පහත පරිදි විය.

ප්‍රසම්පාදන ක්‍රියාවලියේ වාසි අත්කර නොගැනීම

සියළුම රජයේ රෝහල් හා ආයතන සඳහා වෛද්‍ය උපකරණ සමස්ථ අවශ්‍යතාවය ඇස්තමේන්තු කර එකවර ප්‍රසම්පාදනය කිරීම මගින් ආර්ථික වාසි ලබා ගත හැකිවුවද, ඒ වෙනුවට ඒ ඒ රෝහල් වෙත ප්‍රතිපාදන වෙන්කිරීම මගින් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු මගින් වෛද්‍ය උපකරණ මිලදී ගැනීමට ඉඩකඩ සලසා තිබුණි. 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වාවූ වර්ෂ 05 ක් තුළදී ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය වෙත සලසා තිබුණු සමස්ථ ප්‍රතිපාදනය වූ රු.මිලියන 11,440 කින් රු.මිලියන 5,224 ක ප්‍රතිපාදන රෝහල් වෙත බෙදාදී තිබුණි.

පිරිවිතරවල නිවැරදිභාවය තහවුරු කර නොගෙන පළමු අවම මිල ප්‍රතික්ෂේප කිරීම

දැඩි සත්කාර ඒකක සඳහා ICU ventilators (Adult & Pediatric) 64 ක් සපයා සවිකර නඩත්තු කිරීම සඳහා සැපයුම්කරුවෙකු තෝරා ගැනීමේදී, පළමු අවම මිල ඉදිරිපත්කර තිබුණු ලංසුකරු විසින් Technical Specification හි ‘’C’’ (Critical Requirements) ලෙස සඳහන් කර ඇති කරුණු එකක් හෝ කිහිපයක් සපුරා නොතිබුණු බව හෝ Tender Document හි සඳහන් Instructions to Bidders (ITB Clauses) උල්ලංඝනය කිරීමක් කර තිබුණු බව හෝ තහවුරු කර ගැනීමකින් තොරව, පළමු අවම ලංසුව ප්‍රතික්ෂේප කර තිබුණි. නීත්‍යානුකූල නොවූ හා පදනමක් ලෙස ගත නොහැකි වාර්තාවක් පදනම් කර ගෙන තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය ලබාදී තිබුණි. එසේම තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයින් 7 දෙනාගෙන් 3 දෙනෙකු එම නිර්දේශයට එකඟවී නොතිබුණි. පළමු අවම මිලට වඩා රු.මිලියන 23.4 කින් වැඩියෙන් ලංසුව ඉදිරිපත් කර තිබුණු දෙවන අවම මිල සහිත ලංසුකරු වෙත ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීමට කටයුතු කරමින් පැවැතුණි.

ගොඩනැගිලි ඉදිකිරීම

අමාත්‍යාංශයේ ප්‍රතිපාදනවලින් වැය කර ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු අනාවරණය විය.

ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු නොකිරීම

ක්‍රියාකාරී සැලැසුම්වලට අනුව කටයුතු නොකිරීමේ හේතුවෙන් 2015 වර්ෂය දක්වා වර්ෂ 5 ක් තුළදී ගොඩනැගිලි හා ඉදිකිරීම් 39 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 19,544.5ක් සම්පූර්ණයෙන්ම උපයෝජනය කර නොතිබුණි.

කොන්ත්‍රාත්තු පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

සමාලෝචිත වර්ෂය ඇතුළු ඉකුත් වර්ෂ 4 කදී ඉදිකිරීම් 68 ක් සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණු නමුත් ඉන් මුළු ප්‍රතිපාදනය රු.මිලියන 36,704.04 ක් වූ ඉදිකිරීම් 40 කට අදාළ කොන්ත්‍රාත් පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශය අපොහොසත් විය.

දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ වාට්ටු සංකීර්ණය ඉදිකිරීමේ අඩුපාඩු

දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ මහල් 07 කින් සමන්විත වාට්ටු සංකීර්ණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 398 ක් වී තිබුණි. අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව වෙනුවට අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් කොන්ත්‍රාත්කරු තෝරාගෙන තිබුණි. අනුමත මුළු පිරිවැය ඇස්තමේන්තුව විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. 2006 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වර්ෂ 10 ක කාලය තුළ දේශීය අරමුදලින් සලසා තිබුණු මුළු ප්‍රතිපාදනය රු.මිලියන 815 ක් විය. නමුත් 2015 දෙසැම්බර් 31 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණු අතර ප්‍රමාද කාලය වර්ෂ 08 ක් විය. වාර්තා කර තිබුණු පරිදි එදින වන විට මූල්‍ය හා භෞතික කාර්යසාධනය පිළිවෙලින් රු.මිලියන 479.7 ක් හා සියයට 65 ක් පමණක් විය. මහල් 07 කින් යුත් ගොඩනැගිල්ල මහල් 08 ක් දක්වා වැඩි කිරීමට තීරණය කර තිබුණද, සංශෝධිත ඉංජිනේරු ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමට හෝ අදාළ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගැනීමට හෝ කොන්ත්‍රාත්කරු සමඟ සංශෝධිත ගිවිසුමකට එළඹීමට හෝ කටයුතු කර නොතිබුණි. කොන්ත්‍රාත්කරු වැඩ නතර කර තිබුණු නමුත් කොන්ත්‍රාත්කරුට ලබා දී තිබුණු රු.මිලියන 51 ක වැඩ අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. 2016 අගෝස්තු මාසය වන විට රු.මිලියන 43ක් වටිනා උපකරණ වර්ෂ 02 ක කාලයක සිට නිෂ්ක්‍රීයව වැඩ බිමෙහි තබා තිබුණි.

ගාල්ල මහමෝදර මාතෘ රෝහල ඉදිකිරීමේ අඩුපාඩු

ගාල්ල මහමෝදර මාතෘ රෝහල ඉදිකිරීම් ව්‍යාපෘතිය 2005 වර්ෂයේදි ආරම්භ කර අත්තිවාරම පමණක් ඉදිකොට කොන්ත්‍රාත්කරු වෙත යුරෝ මිලියන 5.9 ක් ගෙවීමෙන් පසු වැඩ අතරමග නවතා තිබුණි. වැඩ නැවතී වර්ෂ 06 කට පසු 2011 වර්ෂයේදී ගෙන තිබුණු අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, ජර්මනියේ පුනර් නිර්මාණ බැංකුවෙන් යුරෝ මිලියන 28 ක් හෙවත් රු.මිලියන 4,300 ක ණය මුදලක් ලබාගෙන පැරණි අත්තිවාරම මත ඉදිකිරීම් ආරම්භ කිරීම සඳහා 2012 අගෝස්තු මාසයේදී ණය ගිවිසුම අත්සන් කර තිබුණි. ඉන් වර්ෂ 3 කට ආසන්න කාලයකින් පසුව එනම් 2015 ජූලි 30 දින ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සඳහා ගිවිසුම් අත්සන් කර තිබුණි.

කොළඹ දන්තායතනය ගොඩනැගිල්ල ඉදිකිරීමේ ප්‍රමාදය

2010 වර්ෂයේදී ආරම්භකර තිබුණු කොළඹ දන්තායතනය ගොඩනැගිල්ල ඉදිකිරීම් ව්‍යාපෘතියේ මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 734 ක් විය. ගිවිසුමට අනුව 2014 මාර්තු 31 දින වන විට වැඩ අවසන් විය යුතු නමුත් 2016 ජූලි 15 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණි. ප්‍රමාද කාලය වර්ෂ 02 මාස 04 ක් වී තිබුණි. මෙම ප්‍රමාදය හේතුවෙන් ආධාර වශයෙන් ලද හා මිලදීගත් මුළු වටිනාකම රු.මිලියන 108 ක් වූ වෛද්‍ය උපකරණ නිෂ්කාර්යව පවතින අතර ඒවායේ වගකීම් කාලය ඉකුත් වෙමින් පැවතුණි.

ශ්‍රී ලංකා ජාතික රෝහලේ මහල් 08 කින් සමන්විත අපස්මාර ඒකකය ඉදිකිරීම

සෞදි රියාල් මිලියන 281.25 ක ණය මුදලකින් ශ්‍රී ලංකා ජාතික රෝහලේ මහල් 08 කින් සමන්විත අපස්මාර ඒකකය ස්ථාපිත කිරීම හා දිවයින පුරා අපස්මාර කළමණාකරන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වූ ව්‍යාපෘතිය 2008 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමේ කාලය අවස්ථා 3 කදී දීර්ඝ කර තිබුණත් 2016 වර්ෂය වන විට ප්‍රමාද කාලය වර්ෂ 06 කට වඩා වැඩි වී තිබුණි. ඉදිකිරීම් කටයුතු වල භෞතික ප්‍රගතිය සියයට 91 ක් පමණක් බව වාර්තාවූ අතර අපස්මාර කළමණාකරන වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි. උපකරණ මිලදී ගැනීම සඳහාවූ සෞදි රියාල් මිලියන 35.5 ක ප්‍රතිපාදන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වැයකර තිබුණු බැවින් උපකරණ මිලදී ගැනීමට නොහැකිවී තිබුණි. ව්‍යාපෘති ප්‍රමාදය නිසා ගොඩනැගිලි ඉදිකිරීම හා උපදේශන සේවා සඳහා ඇස්තමේන්තුගත පිරිවැයට වඩා තථ්‍ය කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 977.39 කින් වැඩිවී තිබුණි.

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ නිෂ්පාදන ධාරිතාවය පුළුල් කිරීමේ ප්‍රමාදය

ගොඩනැගිලි ඉදිකිරීම හා යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම සඳහා සංරචක 02 ක් යටතේ ජයිකා ණය ආධාර ලබා ගනිමින් රු.මිලියන 1,777.13 ක් පිරිවැය වූ ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ නිෂ්පාදන ධාරිතාවය පුළුල් කිරීමේ ව්‍යාපෘතියක් 2012 වර්ෂයේදි ආරම්භ කර 2017 වර්ෂයේදි නිම කිරීමට සැලැසුම් කර තිබුණි. 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළදී රු.මිලියන 1,993.1 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු නමුත් 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 160.7 ක් පමණක් විය. 2015 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව මිලදී ගැනීම් හා ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර ණයවර ලිපි විවෘත කිරීමට අපේක්ෂා කළද, 2016 ජුනි 30 දින වන විටත් උපකරණ සඳහා ලංසු ඇගයීම සිදුවෙමින් පැවති අතර ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

රජය සතු වාහන සම්බන්ධයෙන් දුර්වල පාලනය

නීත්‍යානුකූල හිමිකාරීත්වය අමාත්‍යාංශය සතු වාහන 752 ක් හා යතුරු පැදි 3,134 ක්, වාහන ඇණිය තුළ භෞතිකව නොපවතින බව අනාවරණය විය. ගිලන් රථ 13 ක් ඇතුළුව වාහන 17 ක පරිහරණ අයිතිය බාහිර ආයතන 12ක් වෙත අවිධිමත් ලෙස ලබාදී තිබුණි. විධිමත් පරිදි අපහරණය කර නොතිබුණු වාහන 11 ක් වෘත්තීය පුහුණු ආයතන වෙත අබලි වාහන ලෙස මුදාහල බවට ලේඛන ගත කර තිබුණි. තවද උතුරු නැගෙනහිර යුධ සමයේදී අතුරුදහන්වූ බවට පොලිසියට පැමිණිලි කර තිබුණු නීත්‍යානුකූල හිමිකාරීත්වය අමාත්‍යාංශය සතු වාහන 11 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. කිසියම් අක්‍රමිකතාවයකට හෝ අකටයුත්තකට යොදාගත නොහැකි වන අයුරින් ඒවායේ ලියාපදිංචිය අහෝසි කිරීමට කටයුතු කර නොතිබුණි. ඊට අමතරව සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් ඩබල් කැබ් රථයක් හා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් භාවිතයට ගන්නා ලද මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මිට්සුබිෂි පැජරෝ රථයක් විධිමත් පරිපාටිවලින් හා අනුමැතීන්ගෙන් බැහැරව පිළිවලින් රු.290,000 කට හා රු.395,000 කට ඉහළ නිලධාරීන් දෙදෙනෙකුට විකුණා තිබුණි.

පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව

පෞද්ගලික සෞඛ්‍ය සේවා අංශ මගින් ඉටුකරන සේවාවන් වැඩිදියුණු කිරීම සහ නියාමනය කිරීම අරමුණු කරගෙන 2007 වර්ෂයේදී පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව පිහිටුවා තිබුණි. 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව,

- ලියාපදිංචි පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් පවත්වා ගෙන යායුතු ප්‍රමිති සංවර්ධනය කිරීම හා අධීක්ෂණය කිරීම.
- පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රමිති ඇගයීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
- සියළු පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් සේවක පිරිස් බඳවා ගැනීම්වලදී අවම සුදුසුකම් අනුගමනය කරන බවට සහතිකවීම හා සේවක පිරිස් පුහුණු කිරීමේදී අවම ප්‍රමිතීන් අනුගමනය කරන බවට වගබලා ගැනීම.
- පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් පිරිනමනු ලබන හෝ සපයනු ලබන රෝගීන් රැකබලා ගැනීමේ සේවාවල ගුණාත්මකභාවය තහවුරු කිරීම.

යන අරමුණු ඉටු කිරීම මෙම ආයතනයෙන් අපේක්ෂා කර තිබුණි.

පනතේ 19 (1) හා 19 (2) උපවගන්ති ප්‍රකාරව, පෞද්ගලික වෛද්‍ය ආයතන සම්බන්ධයෙන් රීති පිළියෙල කර බලාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. තවද පනතේ 2(1) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, 2007 වර්ෂයේදී ලියාපදිංචි කර තිබුණු පෞද්ගලික වෛද්‍ය ආයතන සංඛ්‍යාව 1,747 ක් වූ අතර 2015 වර්ෂය වන විට එම සංඛ්‍යාව 787 ක් දක්වා ක්‍රමයෙන් අඩුවී තිබුණි. නමුත් ලියාපදිංචි විය යුතු පෞද්ගලික වෛද්‍ය ආයතන සංඛ්‍යාව හඳුනාගැනීමට, ලියාපදිංචි කරවීමට හා ලියාපදිංචි නොවන ආයතන සම්බන්ධයෙන් පනතේ 4 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට විධිමත් ක්‍රමවේදයක් පිළියෙල කර නොතිබුණි. තවද 2011 වර්ෂයේ සිට මෙම සභාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

දේශීය හා විදේශ සමාගම් සමඟ හවුල් සහයෝගීතාවලට එළඹීම

අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව, 2015 වර්ෂය තුළ අවස්ථා 5 කදී දේශීය හා විදේශ සමාගම් සමඟ හවුල් සහයෝගීතාවලට එළඹීමේ මූලික කටයුතු ආරම්භ කර තිබුණි.

ඖෂධ ඉල්ලුමට සරිලන නිෂ්පාදනයක් නොකිරීම

ප්‍රමාණවත් යන්ත්‍ර ධාරිතාවයක් නොතිබීම, නිෂ්පාදන ක්‍රියාවලිය තුළ තාක්ෂණික දෝෂ පැවතීම හා පෙති ආවරණ පහසුකම් ප්‍රමාණවත් නොවීම ආදී වූ විවිධ හේතූන් මත වෛද්‍ය සැපයුම් අංශය විසින් 2015 වර්ෂය සඳහා ඇණවුම් කර තිබුණු සමස්ථ ඖෂධ ඉල්ලුමෙන් සියයට 61.8 කට සමාන රු.මිලියන 447 ක්වූ ඖෂධ සමාලෝචිත වර්ෂය තුළදී සැපයීමට අපොහොසත්වී තිබුණි.

සමහර ඖෂධ නිෂ්පාදනය අතහැර දැමීම නිසා සිදු වූ අලාභ

සමහර ඖෂධ නිෂ්පාදනය අතහැර දැමීම නිසා ඒ සඳහා මිලදී ගත් අමුද්‍රව්‍ය භාවිතයෙන් ඉවත්වීම, කල් ඉකුත්වීමට ආසන්නව පැවති අමුද්‍රව්‍ය තත්ත්වයෙන් අසමත්වීම වැනි හේතු මත පාවිච්චියට නුසුදුසු යැයි හඳුනාගෙන තිබුණු අමුද්‍රව්‍යයවල මුළු පිරිවැය රු.මිලියන 2 ක් හා ඇසුරුම් ද්‍රව්‍යවල මුළු පිරිවැය රු.මිලියන 1 ක් 2015 වර්ෂයේ ලාභයට එරෙහිව කපා හැර තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට මුළු පිරිවැය රු.මිලියන 15 ක්වූ එවැනි අමුද්‍රව්‍ය තොග හා මුළු පිරිවැය රු.මිලියන 2 ක් වූ ඇසුරුම් ද්‍රව්‍ය තොග ගබඩාවල තබා තිබුණු නමුත් ඒවා විධිමත් ලෙස අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

අනුමත සීමාව ඉක්මවා නිෂ්පාදන දිරි දීමනා ගෙවීම

කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත රු.4,000 ක මාසික නිෂ්පාදන දිරි දීමනාවක් ගෙවිය හැකි නමුත් ඊට පටහැනිව 2011 ජූලි 01 දින සිට මාසික උපරිමය රු.12,000 කට යටත්ව සමස්ථ කාර්ය මණ්ඩලය වෙත නිෂ්පාදන දිරි දීමනා ගෙවා තිබුණි. 2015 වර්ෂය තුළදී පමණක් වැඩියෙන් ගෙවා තිබුණු නිෂ්පාදන දිරි දීමනා වටිනාකම රු.මිලියන 12 ක් විය.

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

අලෙවි කළ නොහැකි ඖෂධ

සංස්ථාවේ අලෙවිය සඳහා මිලදී ගෙන තිබුණු ඖෂධවලින් 2015 දෙසැම්බර් 31 දින වන විට පිරිවැය රු.මිලියන 141 ක් වූ ඖෂධ විකිණිය නොහැකි තත්ත්වයට පත්වී තිබුණි. නමුත් භෞතික තොග සමීක්ෂණ වාර්තා අනුව එම තොගයේ පිරිවැය රු.මිලියන 99 ක් පමණක් වූයෙන් රු.මිලියන 42 ක වෙනසක් පැවතුණි. මෙම වෙනසින් රු.මිලියන 36 ක වෙනසට හේතු ඉදිරිපත් කර නොතිබුණු බැවින් හා හානි වූ තොග භෞතිකව නොපැවතීම තුළ විකිණීමට නුසුදුසු තොග නැවත වෙළඳපලට නිකුත්වීමේ හැකියාවක් පවතින්නේද යන්න විගණනයේදී බැහැර කළ නොහැකි විය.

ඔසුසැල් 17 කින් අලාභ ලැබීම

2015 වර්ෂය තුළ පැවති ක්‍රියාකාරි ඔසුසල් 32 ක් අතරින් ඔසුසල් 15 ක් පමණක් රු.මිලියන 143 ලාභ ලබා තිබුණු අතර ඉතිරි ඔසුසල් 17 කින් රු.මිලියන 27 ක අලාභ ලබා තිබුණි. ඔසුසල් සමස්ථයෙහි මුළු ශුද්ධ ලාභය රු.මිලියන 116 ක් වූ අතර එය පසුගිය වර්ෂයේ ලැබූ මුළු ශුද්ධ ලාභය රු.මිලියන 72 ක් සමඟ සැසඳීමේදී රු.මිලියන 44 ක් හෙවත් සියයට 61 ක වැඩිවීමක් විය. නමුත් අවිස්සාවේල්ල, අම්පාර, හම්බන්තොට, යාපනය හා පිළියන්දල යන නගරවල පිහිටි ඔසුසල් 5 ක් 2012 වර්ෂයේදී රු.මිලියන 5 ක්ද 2013 වර්ෂයේදී රු.මිලියන11 ක්ද 2014 වර්ෂයේදී රු.මිලියන12 ක්ද හා 2015 වර්ෂයේදී රු.මිලියන12 ක්ද වශයෙන් අඛණ්ඩව අලාභ ලබා තිබුණි. එසේම 2015 වර්ෂයේදී ඔසුසැල් 17 න්ම ලැබී තිබුණු මුළු අලාභයෙන් සියයට 47 ක්ම එම ඔසුසැල් 5 න් ලැබී තිබුණු අලාභයන්ගෙන් සමන්විත විය.

රක්ෂණ ආවරණයක් රහිතව ඖෂධ ප්‍රවාහනය කිරීම

රක්ෂණ ආවරණයක් සහිතව ඖෂධ ප්‍රවාහනය කිරීම සංස්ථාවේ වගකීම වුවද, 2013 හා 2014 වර්ෂවලදී රක්ෂණ ආවරණයක් ලබා නොගෙන ප්‍රවාහනය කරමින් තිබුණු පිළිවෙලින් රු.මිලියන12 ක් හා රු.මිලියන 9 ක් පිරිවැය වූ ආනයනිත ඖෂධ තොග දෙකක් නෞකාව තුළ හටගෙන තිබුණු ගින්නකින් විනාශ වී තිබුණි. අලාභය තක්සේරු කිරීම සඳහා වැයකර තිබුණු රු.මිලියන 6 ක් ඇතුළු මුළු අලාභය රු.මිලියන 27 ක් වී තිබුණි.

ආයුර්වේද ඖෂධ සංස්ථාව

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා භාණ්ඩාගාර නියෝජිතයා සහභාගි නොවීම

2015 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර 06 ක් පවත්වා තිබුණි. 2016 මාර්තු 09 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට සහභාගීවී තිබුණු භාණ්ඩාගාර නියෝජිතවරයාට සංස්ථා සේවකයින් විසින් හිරි හැර කර තිබීම හේතුවෙන් ඉදිරි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගීවීමට ආරක්ෂාව ඉල්ලා තිබුණද ඒ පිළිබඳව විධිමත් පරිදි කටයුතු කර නොතිබුණි. ඒ අනුව 2016 අප්‍රේල් 22, මැයි 26 හා ජුනි 03 දිනවල පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා භාණ්ඩාගාර නියෝජිතවරයා සහභාගිවී නොතිබුණි. නමුත් භාණ්ඩාගාර නියෝජිතවරයා සහභාගීවී නොතිබුණු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී අවිධිමත් තීරණ ගෙන තිබුණි. සංස්ථාවේ සභාපතිවරයා 2016 ජුනි 29 දින සිට සේවයට වාර්තාකර නොතිබුණු බැවින් එදිනෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වා නොතිබුණි.

අවිධිමත් ලෙස නිලධාරීන් පත්කිරීම

2015 වර්ෂය තුළදී අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ තනතුරු 57 කට අවිධිමත් ලෙස නිලධාරීන් පත්කර වැටුප් ගෙවා තිබුණි.

නව නිෂ්පාදන වෙළෙඳපොලට හඳුන්වාදීම

නව නිෂ්පාදන 10 ක් විවෘත වෙළෙඳපොලට හඳුන්වාදී ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතියේ පළමු පියවර ලෙස ඉසිවර ඔසු දොරට වැඩීම නමින්වූ උළෙලක් 2015 වර්ෂයේදී පවත්වා තිබුණි. ඒ සඳහා රු.මිලියන7 ක් වැය කර තිබුණු අතර ඉන් සියයට 71 ක් ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් වැයකර තිබුණි. කෙසේ වෙතත් පැරණි නිෂ්පාදන 9 ක් හා නව නිෂ්පාදනයක් පමණක් හඳුන්වාදී තිබුණි.

ශ්‍රී ජයවර්ධනපුර රෝහල

ප්‍රධාන තනතුරු පුරප්පාඩුව පැවැතීම

ආයතනයේ ප්‍රධාන තනතුරු වන අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ, ගණකාධිකාරී යන තනතුරු සඳහා පැවති පුරප්පාඩු ස්ථිර වශයෙන් පිරවීමට සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සෘජුව මැදිහත්වී කටයුතු කළ යුතු බව 2016 පෙබරවාරි 10 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී නියෝග කර තිබුණද, 2016 අගෝස්තු 22 දින වන විටත් එම තනතුරු සඳහා ස්ථිර නිලධාරීන් පත්කර නොතිබුණි.

අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා නිලධාරීන් බඳවා ගැනීම

2015 අගෝස්තු 10 දින වන විට වාට්ටු ලිපිකරු තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව 9 ක් වුවද, ස්ථිර පදනම මත 9 දෙනෙකු හා කොන්ත්‍රාත් පදනම මත 8 දෙනෙකු වශයෙන් නිලධාරීන් 17 දෙනෙකු බඳවාගෙන තිබුණි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් තොරව හා අනුමත බඳවා ගැනීමේ පරිපාටියකින් තොරව අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණු නිලධාරීන් 8 දෙනා වෙත 2015 සැප්තැම්බර් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාලය තුළ එකතුව රු.මිලියන 1.7 ක වැටුප් හා අතිකාල දීමනා ගෙවා තිබුණි.

ගබඩාවල කල් ඉකුත් වූ හා චලනය නොවන වෛද්‍ය උපකරණ පැවැතීම

2015 දෙසැම්බර් 31 දින වන විට පිරිවැය රු.546,490 ක් වූ ඖෂධ වර්ග 11 ක ඒකක 12,322 ක් හා පිරිවැය රු.මිලියන 5.6 ක් වූ ශල්‍ය ද්‍රව්‍ය හා විකිරණශීලී ද්‍රව්‍ය අයිතම 12 ක ඒකක 4,778 ක් කෙටි කාලයකදී කල් ඉකුත් වන හා චලනය නොවන අයිතම ලෙස ගබඩාවල පැවතුනි. ඊට අමතරව 2015 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු පිරිවැය රු.මිලියන 4.4 ක් වූ ශල්‍ය ද්‍රව්‍ය හා ඖෂධ අයිතම 12 ක ඒකක 4,118 කින් එකම අයිතමයක් හෝ වර්ෂය තුළදී භාවිතා කර නොතිබුණි. මෙම ඖෂධ භාවිතයට ගැනීම කෙරෙහි නිසි අවධානය යොමු කර නොතිබුණු අතර අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා ගැනීමකින් තොරව මිලදී ගැනීම, ඖෂධ භාවිතා කළ ශල්‍ය වෛද්‍යවරයා විශ්‍රාමයාම හා නව ශල්‍ය වෛද්‍යවරයා ඒවා භාවිතයට නොගැනීම වැනි කරුණු මෙවැනි තොග පැවතීමට හේතුවී තිබුණි.

රෝහලේ ගෙවන වාට්ටුවලට ඇතුළත් වන රෝගීන්ගෙන් ලබා ගන්නා වෘත්තීය ගාස්තු

රෝහලේ ගෙවන වාට්ටුවල රෝගීන්ට සිදු කරනු ලබන ශල්‍යකර්ම හා රෝගී ප්‍රතිකාර සඳහා රෝගීන්ගෙන් වෘත්තීය ගාස්තු අයකර එම ගාස්තුවෙන් සියයට 99.85 ක් ශල්‍යකර්මය සඳහා සහභාගීවූ විශේෂඥ වෛද්‍ය නිලධාරීන්, වෛද්‍ය නිලධාරීන් හා සහාය කාර්ය මණ්ඩල වෙත ආපසු ගෙවා තිබුණි. 2015 වර්ෂය තුළදී පමණක් එසේ ගෙවා තිබුණු මුළු වෘත්තීය ගාස්තු වටිනාකම රු.මිලියන 243.8 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- සාමාන්‍ය රාජකාරි වේලාවෙන් බැහැරව වෛද්‍යවරුන්ට පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණත් අයකළ හැකි වෘත්තීය ගාස්තු වටිනාකම හෝ වෛද්‍යවරුන් හා සහායක කාර්ය මණ්ඩලය වෙත ආපසු ගෙවන වටිනාකම හා ගෙවන ආකාරය පිළිබඳව හෝ නිශ්චිත ක්‍රමවේදයක් කළමනාකරණය විසින් පිළියෙල කර නොතිබුණි. අදාළ ශල්‍ය වෛද්‍යවරයා විසින් තම පෞද්ගලික අභිමතය පරිදි වෘත්තීය ගාස්තු ප්‍රමාණය තීරණය කර තිබුණි.
- සාමාන්‍ය රාජකාරි කාලය තුළ සිදු කරන ශල්‍යකර්ම හා පරීක්ෂණ සඳහා වෘත්තීය ගාස්තු අයකළ නොහැකි වුවත්, වෛද්‍යවරු 14 දෙනෙකු විසින් 2015 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා සාමාන්‍ය රාජකාරි කාලය තුළ සිදුකර තිබුණු ශල්‍යකර්ම හා පරීක්ෂණ වෙනුවෙන් රු.මිලියන 1.9 ක වෘත්තීය ගාස්තු අයකර තිබුණි.

- විශේෂඥ වෛද්‍ය නිලධාරීන්, වෛද්‍ය නිලධාරීන් හා සහායක කාර්ය මණ්ඩලය වෙත ආපසු ගෙවා තිබුණු වෘත්තීය ගාස්තු මත උපයන විට ගෙවීම් බදු අයකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණු අතර 2014 හා 2015 වර්ෂවලදී එසේ අයකර නොතිබුණු ඇස්තමේන්තුගත උපයන විට ගෙවීම් බදු වටිනාකම පිළිවෙලින් රු.මිලියන 35 ක් හා රු.මිලියන 39 ක් වී තිබුණි.

රෝහලේ රථගාල පුළුල් කිරීමේ කොන්ත්‍රාත්තුවේ අඩුපාඩු

රෝහලේ රථගාල පුළුල් කිරීමේ කාර්යය රු.මිලියන 11 ක කොන්ත්‍රාත් වටිනාකමක් සහිතව දින 112 කින් නිම කිරීමේ එකඟතාව මත 2012 සැප්තැම්බර් 05 දින කොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා තිබුණි. ගිවිසුමේ සඳහන් කොන්දේසි ප්‍රකාරව, 2013 ජනවාරි 09 දින වන විට වැඩ අවසන් කළ යුතුව තිබුණු නමුත්, 2016 අගෝස්තු 22 දින වන විටත් වැඩ අවසන්කර නොතිබුණි. පිරවීම සඳහා යොදා ගෙන තිබුණු පස් සාම්පලවල තත්ත්වය හා පස් තෙරපීමේ තත්ත්වය පිළිබඳ පරීක්ෂණවලින් (Soil Compaction Test) අසමත්වී තිබුණු අතර Expansion Joints තාර සහ වැලි මිශ්‍ර කර වසා දමා නොතිබුණි. සමස්ථ ප්‍රමාද කාලය වර්ෂ 3 කට අධික බැවින් අයකළ යුතු ප්‍රමාද ගාස්තු රු.මිලියන 1 ක් වූ අතර කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත්කර තිබුණු රු.995,454 ක් වූ 3 වන අතුරු බිල්පත සඳහා මුදල් නොගෙවා ප්‍රමාද ගාස්තු සඳහා හිලව් කිරීමට උපදේශකවරු නිර්දේශ කර තිබුණත්, එම නිර්දේශයෙන් වර්ෂ 1 මාස 06 කට පසු එම අතුරු බිල්පත සඳහා ගෙවීම් කර තිබුණි. කාර්යසාධන බැඳුම්කරය මුදල් කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එය 2014 ඔක්තෝබර් 01 දින වන විට කල් ඉකුත්වී තිබුණි.

පරිත්‍යාග ලෙස ලැබී තිබුණු නිර්වින්දන යන්ත්‍ර දෝෂ සහිත බව ප්‍රකාශ කර අපහරණය කිරීම

2014 මාර්තු 19 දින පරිත්‍යාග ලෙස ලැබී තිබුණු, වර්ෂයකට වඩා අඩු කාලයක් භාවිතා කරන ලද නිර්වින්දන යන්ත්‍ර 3 ක් දෝෂ සහගත යැයි දක්වා අපහරණය කර / ඉවත් කර ඒ වෙනුවට රු.මිලියන 29.9 ක් වැය කර නව නිර්වින්දන යන්ත්‍ර 4 ක් 2015 අගෝස්තු 14 දින මිලදී ගෙන තිබුණි. අපහරණය කරන ලද යන්ත්‍ර 3 අපහරණය කිරීමට තරම් දෝෂ සහගතද යන්න පිළිබඳව තාක්ෂණික සමීක්ෂණ මණ්ඩලයක නිර්දේශ ලබා ගෙන නොතිබුණි. අපහරණය කරන ලද යන්ත්‍ර 3 මීගමුව, කළුතර හා මොණරාගල දිස්ත්‍රික් රෝහල් වෙත ලබාදී තිබුණු අතර යන්ත්‍ර 3 කිසිදු දෝෂයකින් තොරව භාවිතා කරන බව තහවුරු විය.

ඕස්ට්‍රේලියාවේ Royal Perth රෝහල විසින් එවා තිබුණු 2015 අප්‍රේල් 21 දිනැති ලිපිය මගින් තවත් නව යන්ත්‍ර 4 ක් පරිත්‍යාග ලෙස ලබා දෙන බව දන්වා තිබුණි. එසේ තිබියදී ඉහතින් සඳහන් නව යන්ත්‍ර 4 මිලදී ගැනීම සඳහා 2015 මැයි 14 දිනැති ගැණුම් ඇණවුම යවා තිබුණි. පරිත්‍යාග ලෙස නව යන්ත්‍ර 4 ක් ලැබෙන බව දැන දැනම රු.මිලියන 29.9 ක් වැය කර යන්ත්‍ර 4 මිලදී ගෙන තිබුණි. පරිත්‍යාග ලෙස ලැබී තිබුණු එම යන්ත්‍ර 2016 අගෝස්තු 22 වන විටත් නිෂ්කාර්යව තබා තිබුණි.

ජනමාධ්‍යය

ජනහිතකාමී වූත්, සංවර්ධන නම්‍යවූත්, නිදහස් හා වගකීම් සහිත ශ්‍රී ලාංකික ජනමාධ්‍ය කලාවක් ඇති කිරීම මෙම අංශයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය ළගා කර ගැනීම සඳහා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, ඒ යටතේ වන දෙපාර්තමේන්තු දෙකකින් ව්‍යවස්ථාපිත ආයතන 12 කින් පහත සඳහන් කාර්ය භාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- ජනතා ආකල්ප යහපත්මානයක් කරා කේන්ද්‍රගත කරමින් ආර්ථික, සමාජීයිය, සංස්කෘතික හා දේශපාලනමය ක්ෂේත්‍රයන්හි ප්‍රගමන කාරකයක් ලෙස ජනමාධ්‍යයෙහි දායකත්වය ලබාදීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායයන් සම්පාදනය කිරිම
- ජනතාව තුළ දැනුම ආකල්ප සහ රසඥතාවයන් ඇතිකරලිම උදෙසා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම
- ජනතාවගේ නිවැරදි තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගැනීම
- උසස් මාධ්‍ය සදාචාරයන් ඇති කිරිම සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරිම
- රාජ්‍ය නිල නිවේදන හා ප්‍රවෘත්ති නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම
- ශ්‍රී ලංකාව පිළිබඳ අදාළ තොරතුරු දේශීය හා විදේශීය ජනමාධ්‍ය ආයතනවලට නිකුත් කිරිම
- විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අවශ්‍ය තොරතුරු හා ප්‍රචාරක සේවා සැපයීම
- ප්‍රකාශනවලට අදාළ ජාත්‍යන්තර ගිවිසුම් හා සම්මුතීන් ක්‍රියාත්මක කිරිම
- දෙපාර්තමේන්තු ප්‍රකාශන හා රජයේ ප්‍රකාශන අලෙවිය, ගබඩා කිරීම සහ නිකුත් කිරීමේ කටයුතු
- ප්‍රවෘත්ති, චිත්‍රපට හා වාර්තාමය වැඩසටහන් නිෂ්පාදනය හා ප්‍රදර්ශනය කිරීම පිණිස උචිත ක්‍රියාමාර්ග ගැනීම
- වාණිජ රූපවාහිණි හා ගුවන්විදුලි ප්‍රචාර හා විදේශ විකාශනයන් ඇතුළු ප්‍රචාරක කටයුතු

ඉහත කාර්යභාරයන් ඉටු කළ යුතු රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් සිදු කළ විගණනයේදී අනාවරණය වූ නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

විද්‍යුත් නාලිකා සම්බන්ධව නියාමනයක් නොකිරිම

2015 වර්ෂය වන විට පෞද්ගලික ගුවන් විදුලි නාලිකා 32 ක් හා භෞමික කේබල් හා චන්ද්‍රිකා රූපවාහිනී නාලිකා පවත්වාගෙන යාම සඳහා ආයතන 35 කට පාර්ලිමේන්තු කටයුතු හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් බලපත්‍ර නිකුත්කර තිබුණ ද, එම සියළුම ආයතනවල කටයුතු නියාමනය කිරීම සඳහා වූ

"ජාතික විකාශන සංවර්ධන අධිකාරිය" පිහිටුවීමට අදාල පනත සම්මත කර ගැනීමට 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය අවසාන වන විටත් අපොහොසත් වී තිබුණි. එම නිසා බලපත්‍ර නිකුත් කරන ලද රූපවාහිනී, ගුවන් විදුලි නාලිකාවල කටයුතු කිසිදු ආකාරයකින් නියාමනයක් සිදු කර නොතිබුණි.

වැඩසටහන්වල ගුණාත්මකභාවය හා යෝග්‍යතාව පරීක්ෂා කිරීම

ශ්‍රී ලාංකීය ගති සිරිත් වර්ධනය කිරීමට අත්වැලක් සැපයීමේ සහ ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන ටෙලිනාට්‍ය, චිත්‍රපට සහ වාණිජ වැඩසටහන්වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ අරමුණින් විදේශීය ටෙලිනාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් ආනයනය සීමා කිරීම සඳහා එකී ආනයනික වැඩසටහන් සඳහා 2006 ජුනි 29 දිනැති අංක 1451/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත නියෝග ප්‍රකාරව බද්දක් පනවා තිබුණි. එම ආනයනික ටෙලිනාට්‍ය, චිත්‍රපට සහ වාණිජ වැඩසටහන් විකාශන යෝග්‍යතාව පරීක්ෂා කිරීම 11 දෙනෙකුගෙන් යුත් සමීක්ෂණ මණ්ඩලයක් මගින් සිදුකර තිබුණි. නමුත් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කර විකාශනය කරනු ලබන වැඩසටහන්වල ගුණාත්මකභාවය හා යෝග්‍යතාව පරීක්ෂා කිරීමට සහ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට අමාත්‍යාංශය විසින් වැඩ පිළිවෙලක් සකසා නොතිබුණි.

බදු පැනවීමේ අරමුණ ආදායම් ඉපයීමට පමණක් සීමාවීම

2015 වර්ෂයේදී නාලිකා 12 ක් සඳහා ආනයනික ටෙලිනාට්‍ය, චිත්‍රපට හා වෙළඳ දැන්වීම් 1947ක් වෙනුවෙන් රු. මිලියන 173.50 ක බදු ආදායමක් ලැබී තිබුණි. එම ආදායමෙන් රන්මිහිතැන්න ටෙලිසිනමා උද්‍යානයේ නඩත්තු හා පරිපාලන වියදම් සඳහා වැය කර ඉතිරිය භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණි. රන්මිහිතැන්න ටෙලි සිනමා උද්‍යානය පිහිටුවීමේ අරමුණ දේශීය ටෙලිනාට්‍ය හා චිත්‍රපට ක්ෂේත්‍රයේ උන්නතිය වුවත් දේශීය නිර්මාණවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම යන අරමුණට 2015 වර්ෂය අවසාන වන විටත් යොමු වී නොතිබුණි. ඒ අනුව බදු පැනවීමේ අරමුණ ආදායම් ඉපයීමට පමණක් සීමාවී තිබුණි.

භෞමික රූපවාහිනී විකාශන කටයුතු සඳහා අංකන තාක්ෂණය හඳුන්වා දීම

ශ්‍රී ලංකාවේ භෞමික රූපවාහිනී විකාශන කටයුතු සඳහා ප්‍රතිසම තාක්ෂණය (Analog) වෙතින් අංකන තාක්ෂණය (Digital) වෙත මාරුවීම සඳහා වන ව්‍යාපෘතිය ආරම්භ කිරීමට 2009 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. මේ සඳහා 2014 වර්ෂයේදී ජපන් රජයේ අනුග්‍රාහකත්වය මත ජපන් යෙන් මිලියන 13,717 ක ණය මුදලක් ලබාගැනීම සඳහා ජාත්‍යන්තර සහයෝගිතාවය සඳහා වන ජපාන නියෝජ්‍යායතනය (JICA) සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. එහෙත් 2015 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 1,900 ක ප්‍රතිපාදන (දේශීය හා විදේශීය) සලසා තිබුණි. 2015 වර්ෂය අවසන් වන විටත් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර නොතිබුණි.

ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සත්‍ය තොරතුරු දැනගැනීමට ජනතාවට ලබාදී ඇති අයිතිය තහවුරු කිරීමේ අරමුණ ඇතිව 1948 ජුලි 31 දින රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

ස්ථාපිත කර තිබුණි. දෙපාර්තමේන්තුව ආරම්භක අවධියේ සිට වර්තමානය දක්වා වූ වැදගත් සිදුවීම්, ජාතික වශයෙන් වැදගත් අවස්ථාවන් , (ලංකාවේ පළමු නිදහස් උත්සවය වැනි) සංවර්ධන ව්‍යාපෘතීන් හා වෙනත් විශේෂ ව්‍යාපෘතීන් පිළිබඳව නිෂ්පාදිත කෙටි චිත්‍රපට හා වාර්තා වැඩසටහන් සංරක්ෂණය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු වලින් එකක් වී තිබුණි. එහෙත් මෙම වැඩසටහන් සංරක්ෂණය සඳහා පවත්නා සංරක්ෂණාගාරයෙහි තත්ත්වය නිසි ප්‍රමිතියක නොමැති බැවින් සංරක්ෂිත උපකරණවලට මෙන්ම එහි සේවකයන්ගේ ශරීර සෞඛ්‍යයටද අහිතකර ලෙස බලපෑම් ඇති වී තිබුණි. මෙම සංරක්ෂණාගාරය නිසි ප්‍රමිතියකින් යුක්තව නවීකරණය කිරීමට දෙපාර්තමේන්තුව 2016 වර්ෂය වන විටත් අපොහොසත් වී තිබුණි.

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සතුව ජාතික නාලිකා 08 ක්, ප්‍රාදේශීය සේවා 06 ක්, ප්‍රජා ගුවන් විදුලි සේවා 02 ක්, විදේශීය සේවා 02 ක්, එෆ්.එම්.සම්ප්‍රේෂණ මධ්‍යස්ථාන 07 ක් හා මධ්‍යම තරංග සම්ප්‍රේෂණ මධ්‍යස්ථාන 01 ක් පවත්වා තිබුණි. ගුවන් විදුලි සංස්ථාවට, ඉංජිනේරුමය වශයෙන් වඩාත් සුදුසු ස්ථානවල විකාශන මධ්‍යස්ථාන පිහිටීම, මනා පරිචයකින් යුත් සම්පත් දායකයින්ගේ සේවය ලබාගැනීමේ හැකියාව, විවිධ සමාජීය තත්ත්වයන්ගෙන් යුත් පරිසරයන්හි ජීවත් වන බිම් මට්ටමේ ශ්‍රාවකයන් වෙත ළඟාවිය හැකි ප්‍රාදේශීය සහ ප්‍රජා ගුවන් විදුලි සේවාවක් තිබීම වැනි ශක්තීන් තිබුණද සම්පත් කළමනාකරණයෙහි පවතින අකාර්යක්ෂමතාවය නිසා පෞද්ගලික ගුවන් විදුලි සේවාවන් හා තරඟ කිරීමට නොහැකි තත්ත්වයකට පත්ව තිබුණි. ජනමාධ්‍ය අමාත්‍යාංශය මූලිකව සිදුකරන ලද "ජාතික ජනමාධ්‍ය දර්ශක පර්යේෂණ ව්‍යාපෘතියේ" වාර්තාවට අනුව ගුවන් විදුලි නාලිකා 47 ක් අතරින් ගුවන් විදුලි සංස්ථාවේ ජාතික නාලිකාව 27 වන ස්ථානයේ පසු වන බව අනාවරණය වී තිබුණි.

නීතිය හා සාමය

ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව, මහජන සාමය ආරක්ෂා කිරීම රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත පැවරී තිබුණි. ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව සැලැසීමේ වගකීම එලෙසින්ම තවදුරටත් තබමින් පශ්චාත් යුධ සමයක් තුළ මතුවිය හැකි අපරාධ, ප්‍රචණ්ඩත්වය, හිංසනය හා සමාජ විරෝධි ක්‍රියාවන් මැඩ පවත්වමින් රටේ සාමය ස්ථාපිත කිරීමේ ක්‍රියාවලිය කෙරෙහි විශේෂ අවධානය යොමු කර තිබුණි. එම අරමුණින් 2013 අගෝස්තු 16 දිනැති අංක 1823/07 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය ස්ථාපිත කර තිබුණි. සාමකාමී රටක සමබර සංවර්ධිත පිළිවෙතට අවතීර්ණවීමේ අභිලාශය මුදුන්පත් කර ගනිමින් අමාත්‍යාංශයේ කාර්ය භාර්ය අවස්ථා 03 ක් යටතේ සංශෝධනය කර තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා මාතෘභූමියෙහි මහජන සාමය ස්ථාවර කිරීම තුළින් සාමකාමී වටපිටාවක් නිර්මාණය කිරීමෙහි දක්ෂිණ ප්‍රදේශයේ සංවර්ධිත කාර්යයන් සඳහා උරදෙමින් රටේ සමබර සංවර්ධනයට දායක වීම මෙම අමාත්‍යාංශයෙන් ඉටු කරන කාර්යභාරය විය.

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපර්තමේන්තු හා ආයතන සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

අපරාධ, මාර්ග අනතුරු හා දූෂණ මර්ධන විසඳුම් ක්‍රියාවලිය දුර්වලවීම

රට තුළ වාර්තාවන අපරාධ කඩිනමින් විසඳීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය හා උපාය මාර්ගික කටයුතු සැලසීම සිදුකර තිබුණි. එසේ වුවත් 2014 වර්ෂයේ වාර්තා වූ 50,962 ක බල අපරාධ 2015 වර්ෂයේදී 40,188 දක්වා අඩු වී තිබුණද එම අපරාධ විසඳීම 2014 වර්ෂයේදී 29,396 ක් වූ අතර 2015 වර්ෂයේදී එය 13,049 දක්වා අඩු වී තිබීමෙන් 2014 වර්ෂයේදී සියයට 57 ක් වූ අපරාධ විසඳීමේ ප්‍රතිශතය 2015 වර්ෂයේදී සියයට 32 දක්වා අඩු වී තිබුණි

ජනතාවගේ ජීවිත ආරක්ෂාව සැලසෙන පරිදි රථවාහන ගමනාගමනය විධිමත් කිරීමට අවශ්‍ය පියවර ගෙන තිබුණද 2014 වර්ෂයේදී වාර්තා වූ මාරක අනතුරු සහ බරපතල තුවාල අනතුරු සංඛ්‍යාව 9108 ක් වූ අතර ඊට අනුකූලව 2015 වර්ෂයෙහි වාර්තා වූ අනතුරු සංඛ්‍යාව 10,786 ක් වූයෙන් අනතුරුවල වැඩි වීමක් පෙන්නුම් කෙරුණි.

නිද්‍රාජනක ද්‍රව්‍ය (හෙරොයින්, ගංජා, අබිං, හෂිස්, කොකේන්, වෙනත්) සම්බන්ධ වැරදි හෙළිදරව් කර ගැනීමට අවශ්‍ය පියවරයන් ගෙන තිබුණද, දිවයින තුළ නීති විරෝධි නිද්‍රාජනක ද්‍රව්‍ය භාවිතය 2014 වර්ෂයේ අවස්ථා 74,366 කදී අත්අංඩගුවට ගෙන තිබුණු කි.ග්‍රෑ.11,117 ක් වු නිද්‍රාජනක ද්‍රව්‍ය ප්‍රමාණය 2015 වර්ෂයේදී අවස්ථා 89,996 කදී කි.ග්‍රෑ. 13,548 දක්වා වැඩිවීමෙන් තවදුරටත් තහවුරු වේ.

දූෂණ මර්දන හා වැටලීම් සඳහා පොලීසියට සහය වීම සහ විශේෂ ප්‍රභූ ආරක්ෂාව සැලසීමේ අරමුණ ඇතිව විශේෂ කාර්ය බලකාය ස්ථාපිත කරන ලදි. ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රාදේශීය ව්‍යුහයෙත් මෙම බලකායෙත් කැපවීම සහ සහය මත සිදුකරන ලද විමර්ශන සහ වැටලීම්වල ප්‍රතිඵලයක් ලෙස 2015 වර්ෂයේ කසල තේ, නීති විරෝධී ගවයින් ප්‍රවාහනය කිරීම, පාරිභෝජනයට නුසුදුසු මාංශ,අවි ආයුධ හා පුපුරණ ද්‍රව්‍ය,

නීති විරෝධී මැණික් ගැරීම් වැනි අවස්ථා 160 ක් යටතේ පුද්ගලයින් 328 ක් විශේෂ කාර්ය බලකාය මගින් අත්අඩංගුවට ගෙන තිබුණි.

නිෂ්කාර්ය වත්කම්

කොටහේන පොලිස්පති ගබඩාවේ රු.මිලියන 13.25 ක් වැනි ඉතා ඉහල වටිනාකමකින් යුතු මෝටර් වාහන සෝදිසි කිරීමේ උපකරණ කට්ටල 08 ක් වසර 08 කට ආසන්න කාලයක් කිසිදු ප්‍රයෝජනයක් නොගෙන මිලදී ගත් ආකාරයෙන්ම ගබඩා කර තිබුණි.

බලපත්‍ර ලබා නොගත් ආයතනවලින් සතුන්, සත්ව ආහාර, සත්ව විටමින් හා ඖෂධ මිලදී ගැනිම

2011 සිට 2014 දක්වා කාලය තුළ රු.මිලියන 174.20 ක් වටිනා සතුන්, සත්ව ආහාර සත්ව විටමින් හා ඖෂධ ඒ සඳහා අවශ්‍ය බලපත්‍ර ලබා නොගත් පෞද්ගලික ආයතන දෙකකින් ශ්‍රී ලංකා පොලීසියට මිලදී ගෙන තිබීම.

ගාල්ල කොටුවේ අනවසර ඉදිකිරීම ඉවත් කිරීම

2010 ජනවාරි මාසයේ සිට 2016 මාර්තු මාසය දක්වා කාලය තුළ ගාල්ල කොටුවේ අනවසර ඉදිකිරීම් හා පුරාවිද්‍යා ස්මාරක හානි සිදුවීම් 70 ක් වාර්තා වී තිබුණි. මේ අතරින් අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම වෙනුවට රු.50,000 ක සිට රු.500,000 ක් දක්වා දඩ නියම කළ අවස්ථා 50 ක් පමණ තිබුණි. මෙම අනවසර ඉදිකිරීම ඉවත් කිරීමට ගාලු උරුමය පදනමට නීතිමය ප්‍රතිපාදන නොතිබුණු අතර සෙසු රාජ්‍ය ආයතන ඒ සඳහා කඩිනමින් යොමු කිරීමේ හැකියාවද අවම මට්ටමක පැවැතුණි. මෙම තත්ත්වය ගාලු උරුමය පදනම ස්ථාපිත කරන ලද පනතේ 3 වන වගන්තියේ සඳහන් අරමුණු ඉටු කිරීමේදී බාධාවක්ව පැවතුණි.

වරාය හා නාවික කටයුතු

බහුවිධ සංවිධාන කාර්යය සිදු කරන අතර විශාල නෞකා පිවිසිය හැකි පරිදි විශේෂිත නාවික පර්යන්ත ඉදිකරමින් අනර්ඝ වූ සමුද්‍රීය ප්‍රවේශයක් ඇති කෙරෙන ගැඹුරු මුහුද සමඟ වරාය විවෘත කිරීම මෙම අංශයෙන් අපේක්ෂා කරයි. එම අපේක්ෂාවන් ඉටු කර ගැනීම සඳහා වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය හා ඒයටතේ වන ව්‍යවස්ථාපිත ආයතන 04 ක් මගින් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- වරාය නාවික කටයුතු විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරිම හා පසු විපරම් කිරීම
- අද්මිරාල්තියට අයත් ඒවා හැර අනෙකුත් වරාය තෙල් ටැංකි උපකරණ, ප්‍රදීපාගාර සහ ප්‍රදීපස්ථම්භ සංවර්ධනය සහ පරිපාලන කටයුතු
- නාවික සේවා සැපයුම්කරුවන් හා පරිහරණය කරන්නන් අතර ආරවුල් බේරුම්කරණය
- නාවික සේවාවන් සඳහා තරඟ රීති මාලාවන් පැනවීම
- නාවික සැපයුම් කරුවන් සහ පරිහරණය කරන්නන් අතර උපදේශාත්මක සම්බන්ධීකරණය තහවුරු කිරීම හා සහාය වීම
- බූත් යාත්‍රා සහ සමුද්‍ර මුක්තාවශේෂ භාර ගැනීම
- නාවික කටයුතු සංවර්ධන අරමුදල පරිපාලනය කිරීම
- නැව් ගාස්තු හා නාවික සේවා කටයුතු
- වෙරළාසන්න මඟී ප්‍රවාහනය

ඉහත සඳහන් ආයතන විසින් අදාළ කාර්යභාරයන් ඉටු කිරීම පිළිබඳව සිදු කරන ලද නියැදි විගණනයෙන් පහත සඳහන් කරුණු අනාවරණය විය.

නාවික සංවර්ධන අරමුදල පරිපාලනය

නාවික සංවර්ධන අරමුදලේ කටයුතු සමාප්ත කිරීමේ අරමුණින් අරමුදලේ පැවති රු.මිලියන 461.84 ක්, 2011 හා 2012 වර්ෂවලදී මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර තිබුණි. අවසන්වරට අරමුදලේ මූල්‍ය ප්‍රකාශන 2015 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණි. එදින වන විට රාජ්‍ය ආයතන තුනකින් රු.මිලියන 422.64 ක් අරමුදලට අයවිය යුතුව තිබුණි. මෙම හිඟහිට් ශේෂ ලියා හැරීමට අමාත්‍යාංශය විසින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලා තිබුණි. 2014 නොවැම්බර් 05 දිනැති අංක PF/FD/04/134 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරායාගේ ලිපිය මගින් ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලෙස දන්වා තිබුණි. නමුත් 2015 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ කටයුතු

වෙළඳ හා නාවික ලේකම් කාර්යාලයේ කාර්යය හා කර්තව්‍යයට අදාල වෙරළාසන්න මඟී ප්‍රවාහනය, බූත් යාත්‍රා හා සමුද්‍ර මුක්තාවශේෂ භාර ගැනීම ආදී වූ කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් හා පිළිගත හැකි කාර්යසාධනයක් අත්පත් කර ගෙන නොතිබුණි.

වරාය සංවර්ධන කටයුතු

- **ගාලු වරාය සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම**

2015 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ මූල්‍යාණය යටතේ ගාලු වරාය සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රු.මිලියන 2,000 ක ප්‍රතිපාදන සළසා ගෙන තිබුණි. නමුත් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යාමේදී අවශ්‍ය නිෂ්කාශයන් හා අනුකූලතාවයන් පිළිබඳව පූර්ව සළකා බැලීමක් සිදුකර නොතිබුණි. එහෙයින් ලෝක උරුම සංරක්ෂණ වැඩපිළිවෙල යටතේ යුනෙස්කෝ ආයතනයෙන් ලැබිය යුතු නිෂ්කාශන නොලැබීමෙන් මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි වී තිබුණු අතර ඒ සඳහා සළසා තිබුණු සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

- **නැගෙනහිර බහළුම් පර්යන්තයේ මෙහෙයුම් කටයුතු**

කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 10,800 ක පිරිවැයකට 2015 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලද මීටර් 18 ක් ගැඹුරැති නැගෙනහිර බහළුම් පර්යන්තය, ඊට අවශ්‍ය දොඹකර හා අදාළ අනෙකුත් උපකරණ සවි නොකිරීමෙන් 2015 දෙසැම්බර් 31 දින වන විටත් මෙහෙයුම් කටයුතු ඇරඹීමට අපොහොසත් වී තිබුණි.

- **ඔලුවිල් වරාය උපයෝජනය නොකිරීම**

ඩෙන්මාර්ක් රජයෙන් ලබාගත් යූරෝ මිලියන 46 ක් හා වරාය අධිකාරිය විසින් රු.මිලියන 531 ක්ද උපයෝජනය කර ඔලුවිල් වරායේ ඉදිකිරීම් කටයුතු 2013 වර්ෂයේදී අවසන් කර තිබුණි. එසේ වුවද වරායේ මෙහෙයුම් කටයුතු හෝ වරාය සඳහා නැව් පැමිණීම සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සිදුවී නොතිබුණි. වර්තමානයේ ඔලුවිල් වරාය අභ්‍යන්තරය වැලි පිරීමට ලක් වෙමින් පවතින හෙයින් මෙම අභ්‍යන්තරික වැලි පිරීම වැළැක්වීම සඳහා යූරෝ මිලියන 1.8 ක් වැය කරමින් මීටර් 100 බැගින් වූ දියකඩන තුනක් ඉදිකර තිබුණද අපේක්ෂිත අරමුණ 2015 දෙසැම්බර් 31 දින වන විටත් ඉටුවී නොතිබුණි.

- **තෙල් ටැංකි සංකීර්ණවල ඉන්ධන මෙහෙයුම් කටයුතු ඇණහිටීම**

වරාය අධිකාරිය විසින් රු. මිලියන 11,104 ක් වැය කර ඉදි කර තිබුණු හම්බන්තොට තෙල් ටැංකි සංකීර්ණයේ ඉන්ධන මෙහෙයුම් කටයුතු 2015 මාර්තු මාසයෙන් පසුව නවතා තිබුණි. මෙම සංකීර්ණයේ ඉන්ධන මෙහෙයුම් කටයුතුවලින් 2015 වර්ෂය සඳහා ලබා තිබූ අලාභය රු.මිලියන 355.73ක් විය. මෙම සංකීර්ණය ඉදිකිරීම වෙනුවෙන් විදේශීය බැංකුවක් වෙත මහා භාණ්ඩාගාරය විසින් 2015 දෙසැම්බර් 31 දින දක්වා ගෙවා තිබූ ණය පොලිය රු. මිලියන 2,218.85 ක් විය.

බහළුම්ගත නාවික යාත්‍රා පැමිණීමේ වෙළෙඳපොල කොටස

ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී 2015 වර්ෂයේදී කොළඹ වරාය වෙත බහළුම්ගත නාවික යාත්‍රා පැමිණීම සියයට 12 ක වර්ධනයක් ලබා තිබුණි.

එසේ බහළුම්ගත යාත්‍රා පැමිණීමේ වර්ධනයක් සිදු වී තිබුණද, එම වර්ධනයේ වැඩි වෙළෙඳපොළ කොටස අත්කර ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය අපොහොසත් වී තිබුණි. එම වෙළෙඳපොළ කොටස ක්‍රමානුකූලව පෞද්ගලික ආයතන දෙකක් විසින් අත්පත් කර ගනිමින් පැවැතුණි. එය පහත සඳහන් රූපසටහන 12 න් පැහැදිලි වේ.



රූප සටහන 12 බහළුම්ගත නෞකා පැමිණීමේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වෙළෙඳපොළ කොටස අඩුවීම.
මූලාශය - කාර්යසාධන සමාලෝචන වාර්තාව - ශ්‍රී ලංකා වරාය අධිකාරය



රූපසටහන 13 - ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බහළුම් මෙහෙයුම් ගණන අඩුවීම
මූලාශ්‍රය - කාර්යසාධන සමාලෝචන වාර්තාව - ශ්‍රී ලංකා ශ්‍රී ලංකා වරාය අධිකාරිය

බහළුම් මෙහෙයුම් හැසිරවීමේ වෙළෙඳපොල කොටස

2015 වර්ෂය සඳහා වරාය මෙහෙයුම් පිළිබඳව නිකුත් කරන ලද ඇල්ෆා ලයිනර් වාර්තාව (Alpha liner Report) අනුව කොළඹ වරාය විසිසම ඒකක (Twenty Equivalent unit) 5,185,467 ක මෙහෙයුම් සිදුකරමින් ලෝකයේ 26 වෙනි ස්ථානයේ රැදී සිටි අතර 2014 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී සියයට 5.7 ක වර්ධනයක් ලඟා කරගෙන තිබුණි. එසේ වුවද වරාය අධිකාරිය සතුව පැවති ගැඹුර මීටර් 18 ක් හා 15 ක් වන තටාකාංගන දෙක අවුරුදු 35 බදු ගිවිසුම් මත පෞද්ගලික සමාගම්වලට පවරා තිබීම හේතුවෙන් පසුගිය වසර පහ තුළදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බහළුම් හැසිරවීම ක්‍රමානුකූලව පහත වැටෙමින් පැවැතුණි. විස්තර ඉහත සඳහන් රූපසටහන 13 හි දැක්වේ.

ශුද්ධ මෙහෙයුම් ලාභ/අලාභ

ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් ප්‍රධාන වරායන් මගින් පසුගිය වර්ෂ 05 ක කාලය තුළ ඉපයූ ශුද්ධ මෙහෙයුම් ලාභ/(අලාභ) පිළිබඳ විස්තර පහත සඳහන් රූප සටහන 14 හි දැක්වේ.



රූප සටහන 14. ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් වරායවල්වල මෙහෙයුම් ලාභය/(අලාභය)
මූලාශ්‍රය : මූල්‍ය ප්‍රකාශන - ශ්‍රී ලංකා වරාය අධිකාරිය

- ත්‍රිකුණාමල වරාය ඉකුත් වසර 05 ක් තුළ අඛණ්ඩව අලාභ ලබමින් පැවතුණු අතර එහි සමුච්චිත අලාභය රු.මිලියන 1,211.67 ක් වී තිබුණි.

- හම්බන්තොට වරාය ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු වෙනුවෙන් 2015 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 144,170 ක් වැය කර තිබූ අතර ඒ සඳහා රු.මිලියන 129,848 ක විදේශ ණය උපයෝජනය කර තිබුණි. මෙම වරාය විවෘත කළ දින සිට දිගින් දිගටම අලාභ ලබමින් පැවති අතර එහි වත්කම්ද ඌණ උපයෝජිතව පැවතුණි. සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 18,782 අලාභයක් වාර්තාවූ අතර 2015 වර්ෂය අවසානය දක්වා ලබා තිබූ සමුච්චිත පාඩුව රු.මිලියන 37,186 ක් විය.

ඔලුවිල් වරාය ඉදිකිරීම ආශ්‍රිත පාරිසරික ගැටළු

ඔලුවිල් වරාය ඉදිකිරීමෙන් පසු අවට මුහුදු ඛාදනය උග්‍රවීම හේතුවෙන් මුහුදු වෙරළ ආශ්‍රිතව ජීවිකාව ගෙන ගිය ධීවර ප්‍රජාවට තම දෛනික ක්‍රියාකාරකම් අහිමි වී තිබුණි. එමෙන්ම මුහුද ඛාදනය වැළැක්වීම සඳහා මීටර් 100 දක්වා වූ දියකඩන 3 ක් ඉදිකර තිබුණු අතර ඒ හේතුවෙන් ධීවර බෝට්ටු නවතා තැබීමට නොහැකි වීම මත ද සාම්ප්‍රදායික ධීවරයන්ට තම වෙරළ තීරය අහිමි වී තිබුණි.

සීමාසහිත ලංකා නැව් සංස්ථාව

ලංකා නැව් සංස්ථාව විසින් වෙනත් නැව් සමාගම්වලට අයත් නෞකාවල ඉඩ පහසුකම් මිලට ගැනීමේ ක්‍රමය (Non Vessel Operating Common Carrier) හා කුලී පදනම මත ලබා ගත් යාත්‍රා උපයෝගී කර ගනිමින් මෙහෙයුම් කටයුතු සිදු කර තිබුණි. කෙසේ වෙතත්, සංස්ථාවේ මෙහෙයුම් කටයුතු සඳහා ගැණුම් මිල එ.ජ.ඩො.මිලියන 70 ක් වූ නෞකා දෙකක් චීන සමාගමකින් 2013 වර්ෂයේ ඇණවුම් කර පළමු නෞකාව 2016 මාර්තු මාසයේ සිට වාණිජ ප්‍රවාහන කටයුතු සඳහා යොදවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- සමාගම 2014/15 වර්ෂය සඳහා ලබා තිබූ මෙහෙයුම් ලාභය රු.මිලියන 196.05 ක් වූ අතර 2013/14 වර්ෂයට සාපේක්ෂව එය සියයට 77 ක පිරිහීමක් විය.

- සමාලෝචිත කාලපරිච්ඡේදයේ සමාගමේ ප්‍රධාන මෙහෙයුම් කටයුත්ත වූයේ විදුලිබල මණ්ඩලයේ පරිපාලිත සමාගමක් වෙත ගල් අඟුරු සැපයීම වන අතර සමාගමේ මුළු මෙහෙයුම් ආදායමෙන් සියයට 62 ක් මෙම සමාගම සමග සිදුකළ ගනුදෙනු මගින් උපයා තිබුණි.

- සමාලෝචිත වර්ෂයේදී බන්ධිත ගුදම් ආශ්‍රිත නිෂ්කාශන කටයුතු වලින් රු.මිලියන 36.10 මෙහෙයුම් ආදායමක් ඉපයීමට සැලැසුම් කර තිබුණද, ඊට අදාල කිසිදු කාර්යසාධනයක් සමාලෝචිත වර්ෂයේදී සිදු කර නොතිබුණි.

- ගල් අඟුරු, බොර තෙල් වැනි ආනයනික අතර මැදි භාණ්ඩ ප්‍රවාහනය සඳහා විදේශීය නැව් සමාගම්වලට ගෙවීමේදී මෙරටින් පිටතට ගලා යන විදේශ විනිමයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමේ පරමාර්ථය ඇතිව ,පිරිවැය මත පදනම් වූ නැව් ගාස්තු මත ,රටට අවශ්‍ය ගල් අඟුරු හා බොර තෙල් ප්‍රවාහනය කිරීම සීමාසහිත ලංකා නැව් සංස්ථාවට පමණක් හිමිකර දීමට 2014 ජුනි 19 දින අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර තිබුණි .ඒ අනුව සමාගම විසින් 2014 නොවැම්බර් 07 දින සිට 2015 ජනවාරි 4 දින දක්වා කාලය තුළ බොර තෙල් මෙට්‍රික් ටොන් 258,190 ක් ප්‍රවාහනය කර ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව සපයා තිබුණි .එසේම 2015 වර්ෂයේදී බොර තෙල් මෙට්‍රික් ටොන් 1,710,000 ක් ප්‍රවාහනය කිරීමට සැලැසුම් කර තිබුණද, 2015 ජනවාරි මාසයෙන් පසු බොර තෙල් ප්‍රවාහන කටයුතු ඇණහිට තිබුණි . කෙසේ වුවත්, 2015 වර්ෂයේදී ලංකා ඛණිජ තෙල් සංස්ථාව විසින් වෙනත් පෞද්ගලික විදේශ නැව් සමාගම හරහා ආනයනය කර තිබුණු බොර තෙල් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 1,772,676 කට ආසන්න වී තිබුණු අතර ඒ අනුව අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි .

මාර්ග ඉදිකිරීම් කටයුතු

ඉහළ සංසරණ පද්ධතියක් තුළින් ගමන් කාලය පිරිවැය අවම කිරීම සහ මාර්ග ආරක්ෂාව සහ සුවපහසුව වැඩි කිරීම තුළින් මාර්ග භාවිතා කරන්නන්ගේ ජීවන ත ත්ත්වය ඉහළ නැංවීම සඳහා උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය සහ ඒ යටතේ වන ව්‍යාවස්ථාපිත ආයතන පහක් මගින් පහත සඳහන් කාර්ය භාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- මහාමාර්ග විෂයයන්ට හා එහි ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම
- පළාත් සභා සහ පළාත් පාලන ආයතන සමඟ ඒකාබද්ධව ජාතික ප්‍රතිපත්තිය පදනම් කරගත් සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරිම

අමාත්‍යාංශය හා ඒ යටතේ වන ව්‍යවස්ථාපිත ආයතන සම්බන්ධයෙන් සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය

අනුමැතියකින් තොරව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විදේශාධාර ව්‍යාපෘති 14 ක් වෙනුවෙන් රු.65,000 ක් බැගින් වූ මාසික වැටුපකට උපදේශකවරුන් 54 දෙනෙකු හා රු.25,000 ක් බැගින් වූ මාසික වැටුපකට මහජන සම්බන්ධතා නිලධාරීන් 94 දෙනෙකු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියෙන් තොරව බඳවා ගැනීමට කටයුතු කර තිබුණි. මේ සඳහා රජයට මසකට ගෙවීමට සිදුවන අතිරේක වියදම රු. මිලියන 5.86 ක් වී තිබුණි.

මාර්ග සංවර්ධන අධිකාරිය

මාර්ග සංවර්ධන අධිකාරියේ ඉහළ කළමනාකරණය 80 ක් ද, ඉංජිනේරු සේවයේ 663 ක් සහ තාක්ෂණ සේවයේ නිලධාරීන් 928 ක් ඇතුළු මුළු කාර්ය මණ්ඩලය 10,699 කින් සමන්විත වී තිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව අධිකාරියේ අතිරික්තය රු.මිලියන 1,674.93 ක් වූ අතර, මාර්ග වැඩිදියුණු කිරීම් හා නඩත්තු කටයුතු වෙනුවෙන් මහා භාණ්ඩාගාරයෙන් රු.මිලියන 23,488.18 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. 2015 වර්ෂයේදී අධිවේගී මාර්ගවලින් ගමන් ගන්නා වාහනවලින් රු.මිලියන 41,172.6 ක ආදායමක් රැස්කර ගෙන තිබුණි.

දේශීය බැංකු අරමුදල් මගින් මාර්ග පුළුල් කිරීම හා පුනරුත්ථාපනය කිරීම

මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ පවතින කිලෝ මීටර් 1,434 ක් වූ මාර්ග 64 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා දේශීය බැංකු මගින් රු.බිලියන 151.77 ක ණය මුදලක් ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය දී තිබුණි. ඒ අනුව මාර්ග 64 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා රු.බිලියන 151.77 ක් වූ අගයට කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණු අතර, 2012, 2013, 2014 හා 2015 වර්ෂවල දේශීය බැංකු 07 ක් මගින් එම මාර්ග පුනරුත්ථාපනය කිරීම සඳහා ලබාගත් මුළු ණය ප්‍රමාණය

රු.බිලියන 131.44 ක් වී තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කොන්ත්‍රාත්කරුවන් තෝරා පත්කර ගතයුතු වුවත්, කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් මත මෙම කොන්ත්‍රාත් ඍජුවම ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත් එම ඉදිරිපත් කළ මිල ගණන් සම්මත මාර්ග රේටයන්ට වඩා වැඩි බව නිරීක්ෂණය වු අතර මෙම කොන්ත්‍රාත්තු අතරින් මාර්ග 54 ක් සඳහා අමාත්‍යාංශ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කරන ලද රු.මිලියන 146,552.78 ක් වු කොන්ත්‍රාත් වටිනාකම අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුව විසින් රු.මිලියන 9,242.16 ක අගයකින් වැඩිකර තිබුණි. අධිකාරිය විසින් ලබාගත් ණය මුදලින් මාර්ග 28 ක් ඉදිකිරීම සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් අනුමත රු.මිලියන 55,392.2 ක ණය මුදලින් රු.මිලියන 28,000 ක් මාර්ග පුනරුත්ථාපනයෙන් පරිබාහිරව අධිකාරියේ හා අමාත්‍යාංශයේ වෙනත් කටයුතු සඳහා වැය කර තිබුණි. තවද මෙම මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතියේ එක් එක් මාර්ගවල ඉදිකිරීම් කටයුතුවලට අදාළ පිරිවිතරයන් සහ වැඩ විෂයන් කොන්ත්‍රාත්කරුවන් වෙත අධිකාරිය විසින් ලබාදීය යුතු වුවත්, එවැනි තොරතුරු ලබාදීමක් සිදු කර නොතිබුණි. මාර්ග 08 ක් පිළිබඳව සිදුකළ භෞතික පරීක්ෂා කිරීම්වලට අනුව මාර්ගවල දිග, පළල, කොන්ක්‍රීට් කාණු පද්ධති, බෝක්කු, පැතිබැමි සහ මාර්ගයේ මතුපිට ස්ථරයේ ඉදිකිරීම් යනාදී කළයුතු වැඩ කොටස් අඩුකර අදාළ මාර්ග ඉදිකිරීම් සිදුකර තිබුණි. තවද මෙම මාර්ග ව්‍යාපෘතියේ මාර්ග 25 ක් සඳහා වෙන් කෙරුණු කොන්ත්‍රාත්වල මුදල් ඉතිරි කිරීම් පැනනැගී ඇති බව දක්වමින් රු.මිලියන 3,333 ක් වු ව්‍යාපෘතියේ අරමුදල් වෙනත් පරිහාහිර ඉදිකිරීම් කටයුතු සඳහා වැය කර තිබුණි.

මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම් වලට අදාල කාර්යසාධනය

වැඩ ආරම්භ කර නොතිබුණු ව්‍යාපෘති

2015 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් අංශය විසින් ඉදිරිපත් කර තිබුණු ප්‍රගති වාර්තාවට අනුව සම්පූර්ණයෙන්ම වැඩ ආරම්භ නොකළ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 4,902 ක් වු ව්‍යාපෘතින් 84 ක් පැවතුණි. එම ව්‍යාපෘති අතරින් එක් ව්‍යාපෘතියක් සඳහා පමණක් රු.මිලියන 2.50 ක් වැය කර තිබුණි. මෙම ව්‍යාපෘති 84 න් ව්‍යාපෘති 54 ක් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන ව්‍යාපෘතින් වු අතර එහි කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 2,464.84 ක් වී තිබුණි. මාර්ග සංවර්ධන අධිකාරියට අයත් සම්පූර්ණයෙන් වැඩ ආරම්භ නොකළ ව්‍යාපෘති 30 කට අදාළ කොන්ත්‍රාත් පිරිවැය රුපියල් මිලියන 2,437.16 ක් වී තිබුණි.

සියයට 50 කට අඩුවෙන් වැඩ නිම කළ ව්‍යාපෘති

2015 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් අංශය විසින් ඉදිරිපත් කර තිබුණු ප්‍රගති වාර්තාව අනුව භෞතික ප්‍රගතිය සියයට 50 කට අඩුවෙන් නිම කළ ව්‍යාපෘතින් 259 ක ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 25,103.37 ක් වී තිබුණි. ඉන් ව්‍යාපෘති 103 ක් සඳහා රු.මිලියන 1,494.27 ක් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතින් 259 න් ව්‍යාපෘති 206 ක් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන ව්‍යාපෘතින් වූ අතර එහි කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 17,927.85 ක් වී තිබුණු අතර ඒ සඳහා රු. මිලියන 912.77 ක් වැයකර තිබුණි. තවද මාර්ග සංර්ධන අධිකාරියට අයත්

කොන්ත්‍රාත් පිරිවැය රු. මිලියන 7,175.52 ක් සහ වැයකළ වටිනාකම රු. මිලියන 581.50 ක් වූ ව්‍යාපෘති 53 ක සියයට 50 කට අඩු ප්‍රගතියක් ලබා ගෙන තිබුණි.

ණයගැතියන්ගෙන් මුදල් එකතු කිරීමේ අකාර්යක්ෂමතාව

1987 හා 2012 සිට 2014 දක්වා වර්ෂවල අයකර ගත යුතු රු. මිලියන 7,368.16 ක ණයගැති ශේෂ 2015 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් රජයේ අමාත්‍යාංශ හා මණ්ඩලවලට අදාළ ඉදිකිරීමේ කටයුතු සිදු කිරීම වෙනුවෙන් 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අයවිය යුතු රු. මිලියන 1,175.08 ක් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

කොන්ත්රාත්කරුවන්ගේ ප්‍රමාදය නිසා සිදු වූ අලාභ අයකර නොගැනිම

කොන්ත්‍රාත්කරුවන් හා අධිකාරිය විසින් එළඹ තිබුණු ගිවිසුම් අනුව නියමිත දිනට වැඩ අවසන් කිරිමට අපොහොසත් වීම මත ප්‍රමාද කළ අලාභයන් කොන්ත්‍රාත්කරුවන්ගෙන් අය කළ යුතුව තිබුණි. එසේ 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කොන්ත්‍රාත් 450 කට අදාළව අයකර ගත යුතු ප්‍රමාද කළ අලාභවල වටිනාකම (Liquidation Damages) රු.මිලියන 676.85 ක් වී තිබුණත්, අධිකාරිය විසින් පසුවිපරමක් කර ආදායම් එකතු කර ගැනීමට 2015 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

කුලී ආදායම් රැස්කර ගැනීම දුර්වලවීම

බොරැල්ල උමං මාර්ගයේ සාප්පුවලින් වර්ෂ 05 ක සිට වර්ෂ 08 ක් දක්වා කාලය තුළ අයකර ගත යුතු රු.මිලියන 1.78 ක් සහ මහනුවර උමං මාර්ගයේ සාප්පුවලින් වර්ෂ 03 ක සිට වර්ෂ 04 ක් දක්වා වූ කාලය තුළ අයකර ගතයුතු රු.මිලියන 1.11 ක් වූ කුලී ආදායම 2015 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

බේස්ලයින් මාර්ග ව්‍යාපෘතිය

බේස්ලයින් මාර්ග ව්‍යාපෘතියේ III වන අදියර යටතේ කිරුළපන සිට කොළඹ - හොරණ මාර්ගයේ දුටුගැමුණු මංසන්ධිය දක්වා වන මාර්ගයේ ඉදිකිරීම්වලට අදාළ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා 2015 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 525.13 ක් වැය කර තිබුණි. ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් මාර්ගයේ ඉදිකිරීම් කටයුතු 2015 වර්ෂය අවසාන වන විටත් ආරම්භ කර නොතිබුණි.

කොන්ත්‍රාත්කරුවන්ට ප්‍රමාද ගාස්තු ගෙවීම

නියමිත කාලපරිච්ඡේදය තුළ කොන්ත්‍රාත්කරුවන්ගේ බිල්පත්වලට මුදල් නොගෙවීම හේතුවෙන් 2015 වර්ෂයේදී ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය I යටතේ රු.මිලියන 29.16 ක් සහ ඇමෙරිකන් ඩොලර් 49,079.81 ක්ද, ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය II යටතේ රු.මිලියන 229 ක් සහ ඇමෙරිකන් ඩොලර් 393,301.68 ක් ද, ප්‍රමාද ගාස්තු වශයෙන් කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවීමට ව්‍යාපෘතියට සිදු වී තිබුණි.

ඉඩම් අත්පත් කර ගැනීමේ වන්දි ප්‍රමාද කර ගෙවීම

දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතියට ඉඩම් පවරාගැනීමේදී අදාළ පාර්ශවයන්ට වන්දි නියමිත දිනයන් තුළදී ගෙවා නොතිබීම නිසා 2015 දෙසැම්බර් 31 දින වන විට ප්‍රමාද පොලී ලෙස රු. මිලියන 384.82 ක් ගෙවා තිබුණි.

ඔපෙක් අරමුදල් මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය

ඔපෙක් අරමුදල් මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතියට අදාළ මාදම්පේ සිට රක්වාන දක්වා මාර්ගයේ මුල් ඉදිකිරීම් ප්‍රමාණ පත්‍රයේ (BOQ) පදික වේදිකා, බෝක්කු හා පැතිබැම් ඉදිකිරීම වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 478.07 ක් හා රු. මිලියන 688.57 ක පිරිවැයක් සඳහන් කර තිබුණි. එම අයිතමයන් පිළිවෙලින් රු. මිලියන 438.07 ක් ලෙස හා රු. මිලියන 376.59 ක් ලෙස සංශෝධනය කර තිබීම හේතුවෙන් එම අයිතම දෙකෙහි පිළිවෙලින් රු.මිලියන 40.00 ක හා රු. මිලියන 311.98 ක පිරිවැය ඉතිරියක් පැවතුණි. පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී කුසලතාවයක් හා ප්‍රවීණතාවයක් නොදැක්වීම හේතුවෙන් මෙවැනි තත්ත්වයක් ඇති වී තිබූ අතර මෙසේ ඉතිරිවූ මුදල් ව්‍යාපෘතියෙන් පරිබාහිර අතිරේක කටයුතුවලට යොදවා තිබුණි.

ඒකාබද්ධ මාර්ග ආයෝජන ව්‍යාපෘතිය (i - Road)

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට සහ කොන්ත්‍රාත්කරු සමඟ ඇති කරගත් කොන්ත්‍රාත් ගිවිසුමේ විශේෂිත විධිවිධාන (Particular Condition) අනුව කොන්ත්‍රාත්කරුවන් වෙත වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලබාදීමේදී ප්‍රමාණ පත්‍රයේ සඳහන් වෙන්කිරීමේ අයිතමයන් (Provisional Sums) අසම්භාව්‍ය වෙන්කිරීම් හා මිල ගණන් වෙනස්වීම් අඩු කර ඉතිරි කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20 ක් එනම් රු. මිලියන 4,122.46 ක් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස කොන්ත්‍රාත්කරුට ගෙවිය හැකිව තිබුණි. නමුත් එම අඩුකිරීම් සැලකිල්ලට නොගෙන කොන්ත්‍රාත්තුවේ මුළු පිරිවැය මත වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු.මිලියන 5,096.67 ක් කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවා තිබුණි. මේ නිසා කොන්ත්‍රාත්කරුවන් වෙත රු. මිලියන 974.21 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වැඩිපුර ගෙවා තිබුණි.

දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය

- උපදේශක කටයුතු සඳහා ඇති කර ගත් ගිවිසුමේ විශේෂ කොන්දේසිවල වගන්ති අංක 45.1(අ) අනුව ප්‍රතිපාදන වටිනාකම සහ අවිනිශ්චිතතා හැර කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 15 ක් එනම් විදේශ මුදලින් ඇමෙරිකන් ඩොලර් 193,782 ක් හෙවත් රු.මිලියන 25.37 ක් සහ දේශීය මුදලින් රු.මිලියන 19.37 ක් වූ අත්තිකාරමක් ලබා දිය හැකිව තිබුණි. නමුත් සේවාදායකයා විසින් සේවා සැපයු පස්වන මාසයේ සිට දොළොස්වන මාසය දක්වා කාලය තුළ සමාන වාරික 8 කින් එම අත්තිකාරම් මුදල පියවා දැමිය යුතුව තිබුණි. ඒ අනුව 2015 නොවැම්බර් මාසය වන විට වැඩ පූර්ව අත්තිකාරම සම්පූර්ණයෙන්ම අයකර ගත යුතුව තිබුණි. නමුත් පූර්ව අත්තිකාරම් මුදල වූ රු.මිලියන 44.76 ක් කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව වර්ෂය අවසාන වනවිට අයකර නොගෙන රු.මිලියන 204.51 ක් 2015 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය විසින් කරන ලද වැඩ සඳහා උපදේශක වෙත ගෙවා තිබුණි.

- තවද 2015 දෙසැම්බර් 31 දින වන විට ගෙවන ලද වැඩ පූර්ව අත්තිකාරම් අයකර ගෙන නොමැති වුවද, උපදේශක විසින් ඉහත මුදල් කොටස් දෙක සඳහා යොමු කරන ලද බැංකු ඇප පත්‍රය 2015 නොවැම්බර් 30 දින වන විට කල් ඉකුත් වී තිබුණි.

- උපදේශක කටයුතු ආරම්භ කළ 2014 දෙසැම්බර් 14 දින එකතු කළ අගය මත බදු නිදහස් කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කිරීම 2015 මැයි 19 දින දක්වා මාස 05 ක් ප්‍රමාද වීම හේතු කොටගෙන, ව්‍යාපෘතිය විසින් එකතු කළ අගය මත බදු (VAT) සහ ජාතිය ගොඩනැගීමේ බදු (NBT) සඳහා පිළිවෙලින් රු. මිලියන 6.78 ක් සහ රු.මිලියන 1.23 ක් ගෙවා තිබුණි.

නව කැළණි පාලම් ව්‍යාපෘතිය

නව කැළණි පාලම් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2017 ජනවාරි මාසයේදී ආරම්භ කිරීමට සැලැසුම් කර තිබුණද, පහත සඳහන් කරුණු හේතුවෙන් එම ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීම ප්‍රමාද වීමට හේතු වී තිබුණි.

- එම පාලම ඉදිකරණ පරිශ්‍රයේ පවතින කි.වොට් 220 ක් සහ කි.වොට් 132 ක් වු අධි බලති විදුලි රැහැන් 2 ක් වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීම සඳහා රු.මිලියන 1,240 කට පිරිවැය ඇස්තමේන්තු කර තිබුණි. නමුත් ඒ සම්බන්ධයෙන් වන ප්‍රසම්පාදන කටයුතු 2016 අගෝස්තු 31 දින වන විටත් සිදු කර නොතිබුණි. එම හේතුවෙන් විදුලි රැහැන් පද්ධතිය ස්ථානගත කිරීමේ ප්‍රමාදය නිසා පාලම් ඉදිකිරීම සඳහා වැඩ බිම කොන්ත්‍රාත්කරුට ලබා දීම සඳහා වැඩි කාලයක් ප්‍රමාදවන බව නිරීක්ෂණය විය.

- ඉදිකිරීම් පරිශ්‍රයේ පවතින වෙනත් විදුලි රැහැන් පද්ධති 03 ක් වෙනත් ස්ථානයකට ගෙනයාම සඳහා ඇස්තමේන්තු පිරිවැය වු රු.මිලියන 33.91 ක් ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණද, එම මුදල් ලබා දී මාස 8 ක් ගතවී තිබුණත් අදාළ කාර්ය ආරම්භ කර නොතිබුණි.

- නව කැළණි පාලම ඉදිකරන ලබන පරිශ්‍රය තුළ පිහිටා ඇති පරමාණු බල ශක්ති අධිකාරියට අයත් ගොඩනැගිල්ල ඉවත් කර මාළබේ ප්‍රදේශයේ ස්ථාපිත කිරීම සඳහා එම අධිකාරියට අයත් ඉඩමක ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ව්‍යාපෘතිය කටයුතු කර තිබුණි. පරමාණු බල ශක්ති අධිකාරිය එම ස්ථානයට ගෙන ඒම සම්බන්ධයෙන් ජනතාවගෙන් පසුව ඇති වු දැඩි විරෝධය නිසා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2015 ජුලි 17 දින තාවකාලිකව නවතා තිබුණි. ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 419.07 ක් වු මෙම ගොඩනැගිල්ල සඳහා 2015 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 34.72 ක් වැය කර තිබුණි. ඉදිකිරීම් නවතා වසරක් ගතවී තිබුණත් නැවත ඉදිකිරීම් ආරම්භ කර පරමාණු බල ශක්ති අධිකාරිය එම ස්ථානයේ ස්ථාපිත කිරීම හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීම සම්බන්ධයෙන් 2016 අගෝස්තු 31 දින වන විටත් අවසන් නිගමනයකට එළඹ නොතිබුණි. ඒ හේතුවෙන් කැළණි පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතියේ කටයුතු ප්‍රමාද වීමට විශාල බලපෑමක් සිදුවන බව නිරීක්ෂණය විය.

බ්‍රිතාන්‍ය යකඩ පාලම් ව්‍යාපෘතිය

- ශ්‍රී ලංකා රජය සහ සැපයුම්කරු අතර කොන්ත්‍රාත් ගිවිසුම බ්‍රිතාන්‍ය පවුම්වලින් අත්සන් කර තිබු නමුත් දෙපාර්ශවය අතර ණය ගිවිසුම් ඇමෙරිකානු ඩොලර්වලින් එළඹ තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ඇමෙරිකානු ඩොලර් බ්‍රිතාන්‍ය පවුම්වලට එරෙහිව අවප්‍රමාණය වීමෙන් පසුගිය වර්ෂ 3 ක කාලය තුළ ඇමෙරිකානු ඩොලර් 892,781 ක් හෙවත් රු.මිලියන 130.50 ක අලාභයක් සිදු වී තිබුණි.

- ආරම්භක පාලම් සැපයුම් කොන්ත්‍රාත්තුව අනුව, දිග මීටර් 3,077.9 ක් වූ පාලම් 104 ක් සැපයීමට නියමිත විය. කෙසේ වුවද, ව්‍යාපෘතිය විසින් පසුව අවස්ථා 6 කදී පාලම් සැලැසුම් කොන්ත්‍රාත්තුව වෙනස් කර තිබුණි. ඉහත වෙනස්කම් 6 න් 2 ක් පමණක් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර තිබූ අතර අනෙකුත් වෙනස්කම් 4 ක් ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර තිබුණි.

- ආරම්භක පාලම් සැපයුම් කොන්ත්‍රාත්තුවේ ඇතුළත් පාලම් 13 ක් ඉවත් කර රු.මිලියන 2,334.28 කට සමාන බ්‍රිතාන්‍ය පවුම් 10,739,262 ක පිරිවැයකට පොල්දූව පාලම ඉදිකිරීම ඇතුළත් කර තිබුණි. ඒකපාර්ශවීය (Unsolicited) ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් මෙම කොන්ත්‍රාත්තුව සීමිත සමාගමක් වෙත ප්‍රදානය කර තිබුණි. මේ අනුව තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් අත්වන වාසි ලබා ගැනීමට ව්‍යාපෘතිය කටයුතු කර නොතිබුණි.

- 2012 දෙසැම්බර් 19 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද 2011 ඔක්තෝබර් 24 දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩලය පත්කරන ලද විශේෂ ප්‍රසම්පාදන කමිටුවේ (SCAPC) නිර්දේශය අනුව මුළු ව්‍යාපෘති පිරිවැයෙන් රු.මිලියන 339.08 කට සමාන බ්‍රිතාන්‍ය පවුම් 1,560,000 ක වට්ටමක් ලබා දීමට සීමිත සමාගම එකඟ වී තිබුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත් ගිවිසුමට එළඹීමේදී ඉදිකිරීම් වැඩබිමට පාලම් බෑමට සහ පැටවීමට එකඟ වූ රු.මිලියන 17.38 කට සමාන බ්‍රිතාන්‍ය පවුම් 80,000 ක් වූ සහනය ඉවත් කර ඉතිරි අයිතම සඳහා රු.මිලියන 321.69 කට සමාන බ්‍රිතාන්‍ය පවුම් 1,480,000 ක් වූ වට්ටම පමණක් කොන්ත්‍රාත්තුවට ඇතුළත් කර තිබුණි.

ජාතික මහා මාර්ග ආංශික (අතිරේක මූල්‍යනය) ව්‍යාපෘතිය

විගණන සඳහා ලිඛිතමය සාක්ෂි නොමැතිවීම.

2015 වර්ෂය අවසාන වන විට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කර තිබුණත්, රු.මිලියන 1.59 ක වටිනාකමකින් යුතු වත්කම් ඇතුළත් භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

2003 ජුනි 2 දිනැති අංක පීඊඞී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 හා 8.6 ඡේදවලට පටහැනිව ව්‍යාපෘතියට අනුයුක්ත කරන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා රු. මිලියන 1.40 ක් හා පොදු කාර්ය වියදම් රු. මිලියන 2.61 ක් ව්‍යාපෘතිය විසින් මාර්ග සංවර්ධන අධිකාරියට ප්‍රේෂණය කර තිබුණි.

කාර්මික හා වෘත්තීය අධ්‍යාපන

රටේ ආර්ථික සංවර්ධනයට අවශ්‍ය නිපුණතාවයන්ගෙන් සවිබල ගැන්වුණු රැකියා ගත කළ හැකි ශ්‍රම බලකායක් බිහි කිරීමේ ප්‍රධාන අරමුණෙන් ක්‍රියාත්මක වන නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය වෙත එම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා වාර්ෂිකව පාසල් පද්ධතියෙන් පිටවන සිසුන් වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයට යොමු කිරීමට හා අනාගත රැකියා අවස්ථාවන්ට සරිලන පරිදි ගුණාත්මක වෘත්තීය පුහුණුවක් ලබාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුව තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතනයන්හි විවිධ ක්ෂේත්‍රයන්ට අයත් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 477ක් දිවයින පුරා පිහිටුවා තිබුණි. එහෙත් වාර්ෂිකව පාසල් පද්ධතිවලින් ඉවත්වන සිසුන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයකට වෘත්තීය පුහුණුව ලබාදීමට පවතින පහසුකම් ප්‍රමාණවත් නොවන බව 2015 වර්ෂයේ කරන ලද විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.

අධ්‍යාපන අමාත්‍යාංශ වාර්තා අනුව 2014 වර්ෂය තුළ අ.පො.ස (සා.පෙළ) හා (උ.පෙළ) අසමත්ව පාසල් පද්ධතියෙන් ඉවත්ව ගිය සිසුන් සංඛ්‍යාව 195,062 ක් වී තිබුණි. නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සියළුම වෘත්තීය පුහුණු ආයතනවලින් ලබාගත් තොරතුරු අනුව, 2015 වර්ෂය තුළ පවතින සම්පත් අනුව පූර්ණ කාලීන වෘත්තීය පුහුණුවක් ලබාදිය හැකි උපරිම සිසුන් සංඛ්‍යාව 109,320ක් පමණ වී තිබුණි. ඒ අනුව එම සිසුන්ගෙන් සියයට 44ක පමණ ප්‍රතිශතයක් වාර්ෂිකව නුපුහුණු ශ්‍රම බලකායට ඇතුළත් වන අතර ඔවුන්ට රැකියා වියුක්තව සිටීමට හෝ ඌන රැකියා නියුක්තව සිටීමට සිදුවනු ඇත.

විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව අමාත්‍යාංශය යටතේ ඇති වෘත්තීය පුහුණු ආයතනවල ක්‍රියාත්මක පූර්ණ කාලීන පුහුණු වැඩසටහන් 3,732 කින් ජාතික වෘත්තීය සුදුසුකම් සහිත (NVQ) පාඨමාලා සංඛ්‍යාව 2,532ක් විය. ඒ අනුව NVQ නොමැති පාඨමාලාවන් හදාරන සිසුන්ට දේශීයව හා විදේශීයව රැකියා අවස්ථා ලබාගැනීමේ හැකියාව අවම වන අතර නිසි ප්‍රමිතියකින් තොරව පවත්වනු ලබන පාඨමාලා මගින් ගුණාත්මක පුහුණුවක් ලබාගැනීමට නොහැකි වන බවද නිරීක්ෂණය විය. තවද මෙම පුහුණු පාඨමාලා සඳහා සිසුන්ගේ සහභාගීත්වය සැලකිය යුතු අවම මට්ටමක පවතින බව පාඨමාලා 1822 ක් සඳහා 2015 වර්ෂය වෙනුවෙන් සිසුන් ඇතුළත්ව නොතිබීමත් ආයතන 05ක සිසුන් 10ට අඩු සංඛ්‍යාවක් සහභාගී වූ පාඨමාලා 666 ක් තිබීමත් මත තහවුරු විය. එමෙන්ම අමාත්‍යාංශය යටතේ වූ වෘත්තීය පුහුණු ආයතනවල එකම ප්‍රදේශ තුළ සමාන ස්වරූපයේ පුහුණු වැඩසටහන් පැවැත්වීමද ඉහත තත්ත්වයට හේතුවක් වී තිබුණි. සියළුම පුහුණු මධ්‍යස්ථාන සම්බන්ධීකරණය කර ඒ ඒ ප්‍රදේශයට ආවේනික කර්මාන්තවලට අදාළ විශේෂිත ක්ෂේත්‍රයන්ට අදාළ පුහුණු වැඩසටහන් පැවැත්වීම, විශේෂ ප්‍රාගුණ්‍ය ඇති ආයතන වෙත ප්‍රමුඛතාවය ලබාදීම හා තෝරාගත් පුහුණු මධ්‍යස්ථාන උසස් තත්ත්වයෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සැපයීමේ මධ්‍යගත වැඩපිළිවෙළක් අමාත්‍යාංශ මට්ටමින් සිදු වී නොතිබීම අඩුපාඩුවක්ව පැවතුණි.

නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන

වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනය සඳහා සමස්ථ වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයම නියෝජනය වන පරිදි සත් අවුරුදු සැලැස්මක් මත ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන 2014 වර්ෂයේ සිට අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වෙමින් පැවැතුණි. එම වැඩසටහනෙහි සමස්ථ පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 125,891 (ඇ.ඩොලර් මිලියන 961) ක් වී තිබුණි. මේ සඳහා අයවැය සහයක ක්‍රමය යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 100 බැගින් ජාත්‍යන්තර සංවර්ධන සංගමය (IDA) හා ආසියානු සංවර්ධන බැංකුව මඟින් ණය සැපයීමට ගිවිසුම්වලට එළඹ තිබුණි. 2015 වර්ෂය නිම වන විට ක්ෂේත්‍රයට සම්බන්ධ ක්‍රියාත්මක කිරීමේ ආයතන 9 ක් මඟින් වැඩසටහන ක්‍රියාත්මක කරමින් පවතින අතර Disbursement Link Indicators (DLI) 9 යටතේ සැලැසුම්ගත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2015 වර්ෂය නිමවන විට රු.මිලියන 8,541ක විදේශ ණය උපයෝගී කරගෙන තිබුණි. වැඩසටහනට අදාළ සියළුම ක්‍රියාකාරකම් හා අපේක්ෂිත පිරිවැය ආවරණය වන පරිදි සංයුක්ත සැලැස්මක් සකස් නොකිරීම වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳ මූලික අඩුපාඩුවක් බව විගණනයේදී නිරීක්ෂණය විය. වාර්ෂික ක්‍රියාකාරි සැලැසුම් මඟින් අපේක්ෂා කරන අරමුණු ඉටුවීමේ මන්දගාමී ස්වරූපයක් 2014 හා 2015 වර්ෂවල වැඩසටහනෙහි ක්‍රියාකාරිත්වය අනුව නිරූපණය වී තිබුණි. 2015 ක්‍රියාකාරි සැලැස්ම අනුව ආයතන 10ක් හා නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය මඟින් වැඩසටහන් 74 ක් ක්‍රියාත්මක කිරිමට හා ඒ සඳහා රු.මිලියන 3,520.78 ක් වැය කිරීමට සැලැසුම් කර තිබුණි. වැඩසටහන් 44 ක් පමණක් ක්‍රියාත්මක කර ඒ සඳහා රු. මිලියන 1,374.33 ක් වැය කර තිබුණි. ඉහත තත්ත්වය මත වැඩසටහනෙහි අරමුණු සැලැසුම්ගත කාල පරිච්ඡේදය තුළ ඉටුකර ගැනීමේ හැකියාව පිළිබඳ අවදානමක් පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

විශ්වවිද්‍යාල විද්‍යායතන ආරම්භ කිරීම

අ.පො.ස (උ.පෙළ) තාක්ෂණවේදය විෂය ධාරාව හදාරා සමත්වන එහෙත් ජාතික විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට සුදුසුකම් නොලබන සිසුන් සඳහා, නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන යටතේ (SSDP Programme) විශ්වවිද්‍යාල විද්‍යායතන 20 ක් දිවයින පුරා ආරම්භ කිරීමට සැලැසුම් කර තිබුණි. 2015 වර්ෂය වන විට ඉන් 14 ක පාඨමාලා ආරම්භ කළ යුතුව තිබුණි. එහෙත් 2016 ජුනි මාසය වන විටත් විශ්වවිද්‍යාල විද්‍යායතන 6 ක් ඉදිකර ඉන් 5 ක පමණක් පාඨමාලා ආරම්භ කර තිබුණි. පවත්නා ධාරිතාව අනුව එම විශ්වවිද්‍යාල විද්‍යායතන සඳහා ඇතුළත් කළ හැකි මුළු සිසුන් සංඛ්‍යාව 1,260 ක් පමණ විය. කෙසේ වුවද අධ්‍යයන කාර්ය මණ්ඩලයේ අනුමත තනතුරුවලින් සියයට 42 ක් පමණ පුරප්පාඩු පැවතීම, දැනට ඉදිකර අවසන් විශ්වවිද්‍යාල විද්‍යායතන 6 ක ආරම්භ කිරීමට සැලැසුම් කර තිබූ පාඨමාලා 51 න් පාඨමාලා 42 ක් පමණක් ආරම්භ කර තිබීම හා එම විශ්වවිද්‍යාල විද්‍යායතනවල පාඨමාලා හැර යන අනුපාතය සියයට 27 ක් පමණ වීම හේතුවෙන් ආරම්භ කර ක්‍රියාත්මක තත්ත්වයේ පවතින විශ්වවිද්‍යාල විද්‍යායතනද අපේක්ෂිත පරිදි විධිමත්ව ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය විය. ඒ අනුව සැලැසුම් කළ පරිදි පාසල් විෂය නිර්දේශයන්ට තාක්ෂණවේදය විෂය ධාරාව හඳුන්වා දී තිබුණත්, එම විෂය ධාරාව හදාරන සිසුන්ට

ඉදිරි වෘත්තීය සංවර්ධනයට අවශ්‍ය පහසුකම් නිර්මාණය වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අරමුණු ඉටුකිරීමට අදාළව කරන ලද විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය වූ අතර විශ්වවිද්‍යාලය සතු මානව හා භෞතික සම්පත් කාර්යක්ෂම හා ඵලදායි අයුරින් භාවිතා කර නොතිබුණු බවද නිරීක්ෂණය විය.

පූර්ණ කාලීන පාඨමාලා විශ්වවිද්‍යාලයේ උපරිම ධාරිතාවයෙන් පැවැත්වීම.

විශ්වවිද්‍යාල පනත අනුව බඳවා ගන්නා සිසුන් වෙත නිදහස් වෘත්තීය අධ්‍යාපනයකට හිමිකම් පැවතියද විශ්වවිද්‍යාලය විසින් අර්ධ කාලීන (සති අන්ත) උපාධි පාඨමාලා ගාස්තු අයකරමින් පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය. මේ අනුව 2013 වර්ෂයේ සිට බඳවා ගන්නා ලද ශිෂ්‍යයන්ගෙන් එක් සමාසිකයක් සඳහා රු.10,000 බැගින් වර්ෂ තුනක් පැවැත්වෙන එක් උපාධි පාඨමාලාවක් සඳහා රු.60,000 ක පාඨමාලා ගාස්තුවක් අයකර තිබුණි. කෙසේ වුවද ගාස්තු අයකිරිමකින් තොරව පවත්වා ගෙන යනු ලබන (සතියේ දිනයන්හි) පූර්ණ කාලීන පාඨමාලා විශ්වවිද්‍යාලයේ උපරිම ධාරිතාවයෙන් පවත්වා නොතිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පීඨයන් දෙකෙහි පවත්වන ලද උපාධි පාඨමාලා 19 ක් අතරින් 2015 වර්ෂය තුළ අර්ධ කාලීන පාඨමාලා 13ක් මුදල් අය කරමින් පවත්වා තිබුණු අතර පූර්ණ කාලීන පාඨමාලා 6 ක් පමණක් පවත්වා තිබුණි.

ඉටු කරන ලද අධ්‍යයන පැය ප්‍රමාණය

විශ්වවිද්‍යාලයේ 41 කින් යුත් අධ්‍යයන කාර්ය මණ්ඩලයක් ස්ථිර පදනමින් බඳවාගෙන තිබුණු අතර ඉටු කරන ලද අධ්‍යයන පැය ප්‍රමාණය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මීට අමතරව 2015 වර්ෂයේදී බාහිර කථිකාචාර්යවරුන් 139 ක් වෙත අධ්‍යයන පැය 8,291 ක් හා ප්‍රායෝගික පුහුණුවීම් පැය 1,236 ක් සඳහා පත්වීම් ලබාදී තිබුණි.

පූර්ණ කාලීන පාඨමාලා සඳහා සිසුන් බඳවාගැනීම

2015 වර්ෂයේදී විශ්වවිද්‍යාලයට බඳවාගත් සිසුන් පිළිබඳ ලබා ගත් තොරතුරුවලට අනුව පූර්ණ කාලීන පාඨමාලා සඳහා සිසුන් 134 දෙනෙකු බඳවාගෙන තිබුණි. 2015 වර්ෂයේදී නව පාඨමාලාවක් හඳුන්වා දී තිබුණත්, ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ සිසුන් 19 කගේ වර්ධනයක් පෙන්නුම් කර තිබුණි. වර්ෂය තුළ ආරම්භ කරන ලද නව පාඨමාලා දෙක සඳහා බඳවාගත් සිසුන්ද ඇතුළුව අර්ධ කාලීන පාඨමාලා සඳහා වර්ෂය තුළ සිසුන් 416 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර එය පසුගිය වර්ෂයේ බඳවා ගත් සිසුන් ප්‍රමාණයට වඩා සිසුන් 99 ක වැඩි වීමකි. මේ අනුව පූර්ණකාලීන පාඨමාලා සඳහා සිසුන් බඳවාගැනීමේ ප්‍රගතිය අවම මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

උපාධිය සම්පූර්ණ නොකරන සිසුන්ගේ ප්‍රතිශතය වැඩිවීම

2012 අධ්‍යයන වර්ෂයේ උපාධි පාඨමාලාවන්ට බඳවාගත් සිසුන් හා පාඨමාලාව අවසන් කර උපාධිය ලබාගත් සිසුන් පිළිබඳ පරීක්ෂාවේදී පාඨමාලා 03 ක් සඳහා බඳවාගත් සිසුන්ගෙන් සියයට 65 කට වඩා අඩු ප්‍රමාණයක් උපාධිය

සම්පූර්ණ කර තිබුණි. ඒ අනුව මෙකාට්‍රොනික්, බහු මාධ්‍ය හා වෙබ් හා අධ්‍යාපන යන උපාධි පාඨමාලාවල සිසුන් සමත්වීමේ ප්‍රගතිය පහළ මට්ටමක පැවති බව නිරීක්ෂණය වූ අතර ඉන් මෙකාට්‍රොනික් හා බහු මාධ්‍ය හා වෙබ් යන පාඨමාලා හැරයාමේ ප්‍රතිශතය සියයට 20 ක සිට සියයට 31 ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. කළමනාකරණය විසින් මේ සම්බන්ධයෙන් කරුණු සොයාබලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන (SSDP) ක්‍රියාත්මක කිරීම

2015 වර්ෂය වෙනුවෙන් වෘත්තිය තාක්ෂණ විශ්වවිද්‍යාලය වෙත ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් ක්‍රියාකාරකම් 11ක් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 100.5ක ප්‍රතිපාදන සලසා තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කාර්යයන් ඉටු නොකිරිම

ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඒ සඳහා රු.මිලියන 3.05 ක ප්‍රතිපාදන සළසා තිබුණු පහත සඳහන් කාර්යයන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉටු කර නොතිබුණි.

- අධ්‍යයන තත්ත්ව සහතික අංශයක් පිහිටුවිම හා තත්ත්ව සහතිකයන් වැඩි දියුණු කිරීම

- ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයට පිළිගැනීම ලබා ගැනීම
  වර්ෂය තුළ ඉටු කළ යුතුව තිබුණු පහත දක්වා ඇති ක්‍රියාකාරකම්වලට අදාළව සළසා තිබූ ප්‍රතිපාදනයන්ට සාපේක්ෂව වියාපෘති ක්‍රියාත්මක කිරීමේ මූල්‍ය ප්‍රගතිය සියයට 50 ක සිට සියයට 60 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

- කර්මාන්තයේ අවශ්‍යතාව අනුව පිළිගත් විශ්වවිද්‍යාලවල මඟ පෙන්වීම යටතේ විෂයමාලා සංවර්ධනය කිරීම
- තාක්ෂණ වෘත්තීය අධ්‍යාපන හා පුහුණුව ක්ෂේත්‍රයේ පුහුණුවන්නන් සඳහා ජාතික වෘත්තීය පුහුණු සුදුසුකම් 5 මට්ටම් සැපයීම
- පවතින විෂයමාලා 20 ක් සංශෝධනය කිරිම

ජාතික වෘත්තීය සුදුසුකම් ඇගයීම්කරුවන් පුහුණු කිරිම ප්‍රමාණවත් නොවීම

ක්‍රියාකාරී සැලැස්මට අනුව මෙම කාර්ය සඳහා රු.මිලියන 1.5 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර කර්මාන්තයෙන් 50 දෙනෙකුද, ආයතන හා පාසල්වලින් 200 ක්ද, බැගින් මුළු සංඛ්‍යාව 450 ක් ලෙස පුහුණු කළ යුතු වුවත්, රු.මිලියන 1.13ක් වියදම් කර 219 දෙනෙකු පමණක් පුහුණු කර තිබුණි.

රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනය

රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනයේ කාර්යභාරයන් සම්බන්ධයෙන් සිදු කළ විගණනයේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

ජාතික වෘත්තීය සුදුසුකම (NVQ) සඳහා ලියාපදිංචිය වීම

2015 වර්ෂය තුළ පවත්වනු ලැබූ පාඨමාලා 09 ක් වෙනුවෙන් පවත්නා විද්‍යාගාර පහසුකම් ප්‍රමාණවත් නොවීම හා අධ්‍යයන උපකරණ ප්‍රමාණවත් නොවීම මත ජාතික වෘත්තීය සුදුසුකම (NVQ) සඳහා ලියාපදිංචිය ලබාගෙන නොතිබුණි.

පුහුණු පාඨමාලා ලෙස ප්‍රතීතනය කිරීම

විද්‍යායතනය පවත්වනු ලබන පාඨමාලා, පුහුණු පාඨමාලා ලෙස ප්‍රතීතනය කිරීමක් සිදු කළයුතු වුවද, ඒ සඳහා අවශ්‍ය තත්ත්ව පාලන පද්ධතිය විද්‍යායතනය තුළ ඇතිකර ගැනීමට අවශ්‍ය අධ්‍යයන උපකරණ හා විද්‍යාගාර පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කළමණාකරනය කටයුතු කර නොතිබුණි. ඒ අනුව අපේක්ෂිත පරිදි ජාත්‍යන්තරව පිළිගත් ගුණාත්මක හා තත්ත්වයෙන් උසස් පාඨමාලා ශිෂ්‍යයන් වෙත ලබා දීමට 2015 වර්ෂයේදී ආයතනයට හැකියාව ලැබී නොතිබුණි.

සැලැසුම් කර තිබුණු පාඨමාලා ආරම්භ නොකිරීම නිසා මිලදීගත් උපකරණ නිෂ්ක්‍රීයව පැවැතීම

2015 වර්ෂය තුළ ආරම්භ කිරීමට සැලැසුම් කර තිබූ රූපලාවන්‍ය තාක්ෂණ (Cosmetology Technology) පාඨමාලාව හා වෙනත් පාඨමාලා 03 ක් සඳහා අවශ්‍ය පහසුකම් සකස් කර නොතිබීම හේතුවෙන් ඒ වෙනුවෙන් මිලදී ගෙන තිබුණු රු.මිලියන 47.05 ක් වටිනා උපකරණ නිෂ්කාර්යව පැවතුණි.

පාඨමාලාව හැර යන සිසුන් ප්‍රමාණය වැඩිවීම

2015 වර්ෂය තුළ විද්‍යායතනයේ පාඨමාලා 08 ක් සඳහා බඳවාගත් සිසුන් 133 කින් සිසුන් 46 ක් පාඨමාලා හැර දමා තිබුණි. එක් එක් පාඨමාලාව වෙන් වෙන්ව සැලකීමේදී පාඨමාලා හැරගිය ප්‍රමාණය සියයට 18 ක සිට සියයට 52 ක් දක්වා වූ පරාසයක පැවතුණි. මෙම අනුපාතය අවම කර ගැනීම සඳහා, ඊට හේතුවූ කරුණු හඳුනාගෙන පිළියම් යෙදීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

පාඨමාලාවල ජාතික වෘත්තිය සුදුසුකම් මට්ටමට ප්‍රතීතනය කිරීම

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් මෙහෙයවන ලද පර්යේෂණයකට අනුව රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල වෘත්තීය පුහුණුව සම්බන්ධ පාඨමාලා 9,522 පැවැත්වෙන බවත්, එයින් ජාතික පුහුණු මට්ටම (NVQ) සඳහා ප්‍රතීතනය කර තිබූ පාඨමාලා සංඛ්‍යාව 2,323 ක් හෙවත් සියයට 21 ක් බවත් අනාවරණය වී තිබුණි. ජාතික වෘත්තිය සුදුසුකම් මට්ටමට පාඨමාලා ප්‍රතීතනය කිරීමේ වගකීම ආයතනය සතු වුවද, 2015 වර්ෂය අවසන් වන විටත් ඒ සඳහා ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉහළ වෘත්තීය මට්ටම සඳහා යොමුවන ශිෂ්‍ය සංඛ්‍යාව අඩුවීම

2015 වර්ෂය තුළදී ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 1 සිට 6 දක්වා සහතික පත්‍ර 44,811 ක් පමණක් නිකුත් කර තිබූ අතර එයින් සුදුසුකම් මට්ටම 5 සහ 6 සඳහා සහතිකපත් 1480 ක් පමණක් නිකුත් කර තිබුණි. මේ අනුව ඉහළ වෘත්තීය සුදුසුකම් මට්ටම් සඳහා යොමුවන පාඨමාලා සහ ශිෂ්‍ය සංඛ්‍යාව ඉතා සුළු ප්‍රමාණයක් වී තිබුණි.

ආයතන සංග්‍රහයේ විධිවිධාන අභිබවා කටයුතු කිරීම

කොමිෂන් සභාව විසින් ආයතන සංග්‍රහයේ විධිවිධාන අභිබවා අවුරුදු 48 ක් වූ නිලධාරියකු මහජන චීන සමූහ ආණ්ඩුවේ විශ්වවිද්‍යාලයක ආචාර්ය උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ අරමුදල් රු. මිලියන 8.05 ක් වෙන් කර තිබුණි.

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

2014 වර්ෂයේදී රු. මිලියන 34 ක් අවිධිමත් ලෙස වැය කරමින් පෙර ඉගෙනුම් පසු හඳුනා ගැනීම් (RPL) ක්‍රමය යටතේ අක්‍රමවත් ලෙස වැඩ සටහනක් පවත්වා ඒ සම්බන්ධ වගකිව යුතු නිලධාරින් වැඩ තහනමකට ලක්කර තිබියදී, 2015 වර්ෂයේදී නැවතත් එවන් වැඩ සටහනක් රු.මිලියන 4.5 ක් වැය කරමින් ගාල්ලේ දී උත්සවාකාරයෙන් පවත්වා තිබුණි. එහිදී බෙදා හැරීම සඳහා ගන්නා ලද භාණ්ඩ වටිනාකම රු. මිලියන 1.26 ක් වූ අතර වැඩ සටහන සංවිධානය සඳහා රු. මිලියන 3.44 ක් වැය කර තිබුණි.

ආපදා කළමනාකරණය

ශ්‍රී ලංකාව තුළ ස්වාභාවික හා මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන්නාවූ ආපදාවලින් ඇති වන අහිතකර බලපෑම් ඵලදායී ලෙස වැලැක්වීම සහ අවම කිරීම තුළින් විධිමත් සහ අභිමානවත් ජන ජීවිතයක් සඳහා පහසුකම් සැපයීමේ අරමුණින් යුතුව ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණය සම්බන්ධ කටයුතු සිදුකරනු ලැබේ. මේ කාර්යය සඳහා අමාත්‍යාංශය යටතේ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යන ආයතන ක්‍රියාත්මක වේ. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් ලබාදුන් තොරතුරු අනුව, 2011 – 2015 කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ සිදුවූ ස්වාභාවික සහ ස්වාභාවික නොවන ව්‍යවසන පිළිබඳ තොරතුරු වගුව 15 හි දැක්වේ.

ව්‍යවසන	2011	2012	2013	2014	2015
ස්වාභාවික					
ආපදා සංඛ්‍යාව	359	408	394	719	571
- **මරණ**	104	110	97	91	49
- **අතුරුදහන් වූවන්**	20	01	29	34	01
- **නිවාස පූර්ණ හානි**	8,457	3,164	544	5,206	612
- **නිවාස අර්ධ හානි**	20,584	11,243	10,036	19,381	6,351
ස්වාභාවික නොවන					
ආපදා සංඛ්‍යාව	39	63	44	34	70
- **මරණ**	04	20	08	08	19
- **අතුරුදහන් වූවන්**	02	-	-	-	01
- **නිවාස පූර්ණ හානි**	10	05	195	104	66
- **නිවාස අර්ධ හානි**	119	02	12	39	36

වගුව 15. - 2011 – 2015 කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ සිදුවූ ස්වාභාවික සහ ස්වාභාවික නොවන ව්‍යවසන

මූලාශ්‍රය - ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

උක්ත තොරතුරු අනුව, ශ්‍රී ලංකාව තුළ සිදුවන ස්වාභාවික සහ ස්වාභාවික නොවන ව්‍යවසන සංඛ්‍යාව වාර්ෂිකව වැඩි වී තිබෙන බව පැහැදිලි වේ. ඒ අනුව ස්වාභාවික සහ ස්වාභාවික නොවන ව්‍යවසන අවම කිරීම සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරනු ලැබේ.

2015 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුව මඟින් පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 1,292.5 ක් හා මූලධන වියදම් සඳහා රු.මිලියන 2,209 ක ප්‍රතිපාදන ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත සලසා දී තිබුණි. 2014 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් සඳහා සලසා තිබුණු රු.මිලියන 836 ක ප්‍රතිපාදන සහ මූලධන වියදම් සඳහා සලසා තිබුණු රු.මිලියන 1,894 ප්‍රතිපාදන සමඟ සසඳා බලන කළ අයවැය ඇස්තමේන්තු මඟින් සිදුකළ ප්‍රතිපාදනයන්ගේ වැඩිවීමක් පෙන්නුම් කර තිබුණි. කෙසේ වුවත් 2015 වර්ෂයේදී පුනරාවර්තන වැය වශයෙන් රු.මිලියන 733 ක් සහ ප්‍රාග්ධන වැය වශයෙන් රු.මිලියන 1,752 ක් පමණක් අමාත්‍යාංශය මඟින් උපයෝජනය කර තිබුණි.

රේඛීය අමාත්‍යාංශය සහ උක්ත සම්බන්ධිත ආයතන සම්බන්ධයෙන් වූ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාවල ඇතුළත්වූ නිරීක්ෂණ සාරාංශ කර පහත දැක්වේ.

- අමාත්‍යාංශය යටතේ පවතින ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, 1993 සැප්තැම්බර් 29 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණයක් මත පිහිටුවා තිබුණු අතර එය දිවයිනේ ස්වාභාවික විපත් අවදානම් කළාප තුළ සිදුකරනු ලබන ගොඩනැඟිලි හා වෙනත් ඉදිකිරීම් සම්බන්ධ නියාමන කටයුතු පිළිබඳ විධිමත් බලයක් සහිත ආයතනයක් වශයෙන් පාර්ලිමේන්තු පනතක් යටතේ පිහිටුවීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. ඒ අනුව අවදානම් කළාප තුළ සිදු කරනු ලබන විවිධ ඉදිකිරීම් පිළිබඳව සංවිධානය විසින් නිකුත් කරනු ලබන නියෝගවල වලංගු භාවය ප්‍රශ්නකාරී විය.

- 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යවසන කළමනාකරණ පනතේ 18 වන වගන්තිය යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවා තිබුණු අතර ආපදා කළමනාකරණ කටයුතු වඩා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යස්ථානයට තිබෙන බලතල විධිමත් කිරීමේ අරමුණින් මෙම පනත සංශෝධනය කිරීමට අමාත්‍යාංශය කටයුතු කර තිබුණි. අදාළ සංශෝධන සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට 2014 ජුනි 16 දින ඉදිරිපත් කර තිබුණු නමුත් සංශෝධිත කෙටුම්පත් පනත 2016 අගෝස්තු 31 දින වන විටත් ලැබී නොතිබුණි.

- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් 2009 වර්ෂයේදී රු.මිලියන 72.47 ක් වටිනා උපකරණ සහිත තොරතුරු සන්නිවේදන මධ්‍යස්ථානයක් පාදුක්ක ප්‍රදේශයේ ස්ථාපනය කර තිබුණු නමුත් එම මධ්‍යස්ථානය 2011 වර්ෂයේ සිට 2015 අගෝස්තු 31 දින වන විටත් ක්‍රියාත්මක නොවූ බව නිරීක්ෂණය විය. පසුව ලැබී තිබුණු තොරතුරු අනුව, අදාල උපකරණ එම සන්නිවේදන මධ්‍යස්ථානයෙන් ගලවා ඉවත් කර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට අයත් ගබඩාවට ගෙන ගොස් තිබුණු බව හෙළිදරව් විය. අදාළ

- උපකරණ ආයතනයේ අනෙකුත් උපකරණවල ක්‍රියාකාරිත්වයට සමපාත නොවූ හෙයින් ගලවා ඉවත් කරන ලද බව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් දන්වා තිබුණි.

- ඉදිරිපත් කරනු ලබන කාලගුණ අනාවැකි පිළිබඳ නිරවද්‍යතාව සම්බන්ධයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නිරන්තරයෙන් විවේචනයට ලක්ව තිබුණු නමුත් 2008 වර්ෂයේදී ලෝක කාලගුණ මධ්‍යස්ථානයේ උපදේශකත්වයෙන් රු.මිලියන 360 ක වියදමක් කර දෙනියාය ප්‍රදේශයේ පිහිටුවා තිබුණු ඩොප්ලර් රේඩාර් පද්ධතිය 2016 අගෝස්තු 31 දින වන විටත් දෙපාර්තමේන්තුව විසින් කාලගුණික තොරතුරු ලබාගැනීම සඳහා ක්‍රියාත්මක කර නොතිබුණි.

ක්‍රීඩා කටයුතු

ක්‍රියාශීලි ජාතියක් ගොඩනැගීම හා ජාතික ප්‍රතිරූපය අන්තර්ජාතිකව ඉහළ නැංවීමේ අරමුණින් දේශිය හා ජාත්‍යන්තර ක්‍රීඩාව වෙනුවෙන් ප්‍රතිපත්ති සකස් කිරිම, ක්‍රියාත්මක කිරිම හා අධික්ෂණය කිරිම මෙම අංශයෙන් රජය අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි. එම ප්‍රථිඵලය අත්කර ගැනිම සඳහා ක්‍රීඩා අමාත්‍යාංශය හා ඒ යටතේ දෙපාර්තමේන්තුවක්, ව්‍යවස්ථාපිත ආයතන 5ක් හා ක්‍රීඩා සංගම් 49 ක් මගින් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- ක්‍රීඩා විෂයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරිම, පසුවිපරම් කිරිම සහ ඇගැයීම
- ක්‍රිඩා කටයුතු දිරිගැන්විම සඳහා අවශ්‍ය පියවර ගැනිම හා ක්‍රීඩා ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරිම
- ක්‍රීඩා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරිම
- ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය අන්තර් ජාතික වශයෙන් ගොඩනැගිම සඳහා ක්‍රීඩාව යොදා ගැනිමට හැකිවන ලෙස නව ක්‍රමෝපායන් සම්පාදනය හා වැඩසටහන් ක්‍රියාත්මක කිරිම
- පොදු මහජනතාවගේ ශාරීරික සුවතාවය සැලසිමට අවශ්‍ය පහසුකම් ප්‍රවර්ධනය හා සම්බන්ධිකරණය සිදු කිරිම

අමාත්‍යාංශය හා ඒ යටතේ වන ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරයන් ඉටු කිරීමේදි අනාවරණය වූ විගණන නිරික්ෂණ සම්පිණ්ඩණය කර පහත දැක්වේ.

ක්‍රීඩා අමාත්‍යාංශය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ලබාගැනීමට එරෙහි සම්මුති පනතේ 33 වන වගන්තිය ප්‍රකාරව උත්තේජ ද්‍රව්‍ය ලබා ගැනීමට එරෙහිව රීති සම්පාදනය කර අමාත්‍යවරයාගේ අනුමැතිය යටතේ ගැසට් පත්‍රයෙහි පල කර බලාත්මක කළ යුතු වුවද, මෙම ආයතනය පිහිටුවා වසර දෙකක් ගත වී තිබුණත්, ආයතනයෙන් අපේක්ෂා කරන ලද ප්‍රධානතම කාර්ය වූ තහනම් උත්තේජක ලබා ගැනීමට එරෙහිව ක්‍රියා කිරීමට අදාල රීති සකස් කර නොතිබුණි.

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

ක්‍රීඩාවේ ප්‍රවර්ධනය හා සංවර්ධනයට අදාළව විධිමත් සැලැස්මක් පිළියෙල කිරිම

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රීඩා අමාත්‍යවරයා විසින් ගැසට් කරන ලද නියෝග මඟින් අදාල ක්‍රීඩා සංගම් අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුව විසින් නියාමනය කිරිම සිදු කළ යුතුව තිබුණි.

එසේ වුවද, ක්‍රීඩාවේ ප්‍රවර්ධනය හා සංවර්ධනයට අදාළව විධිමත් සැලැස්මක් පිළියෙල කිරීමට අදාළ අංශ අපොහොසත් වී තිබූ අතර, ජාතික හා ජාත්‍යන්තර තරඟ සඳහා සෑම ජාතික සංගමයක්ම යොමු කිරීම හා ඊට අනුග්‍රාහකත්වය දැරීම සඳහා විධිමත් ඇස්තමේන්තුගත අයවැය වාර්තා හා ප්‍රගති වාර්තා සමාලෝචනයකින් තොරව සිදුකර තිබුණි.

ක්‍රීඩා සංකීර්ණ නවයක් ඉදිකිරිම

පළාත් ක්‍රීඩා සංකීර්ණ නවයක් ඉදිකිරීමට අමාත්‍ය මණ්ඩලය අනුමත කර තිබූ අතර බස්නාහිර පළාත් ක්‍රීඩාංගනය ලෙස දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගනය වැඩි දියුණු කිරීමටත් තීරණය කර තිබුණි. දකුණු පළාත වෙනුවෙන් හම්බන්තොට ක්‍රීඩා නගර සංවර්ධනය යටතේ එහි ඉදිකිරීමටත්, ඉතිරි පළාත් හත සඳහා රු.මිලියන 2,022 ක වියදමින් පළාත් ක්‍රීඩා සංකීර්ණ හතකුත්, 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළ ඉදිකිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා තරඟයේ සත්කාරකත්වය ශ්‍රී ලංකාවට අහිමිවීම මත දකුණු පළාත වෙනුවෙන් ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීමට කටයුතු කර නොතිබුණි.

- දකුණ පළාත් හැර අනෙකුත් පළාත් හත සඳහා වූ ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීම 2015 වර්ෂය අවසාන වන විට නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. නමුත් එම ක්‍රීඩා සංකිර්ණ 04 ක භෞතික ප්‍රගතිය සියයට 45 ක සිට සියයට 79 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි. වයඹ ක්‍රීඩා සංකිරීණය ඉදිකිරීමේ කටයුතු 2015 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

දඹුල්ල ගලේවෙල ක්‍රීඩාංගණය ඉදිකිරීම

2017 ආසියානු ක්‍රීඩා උළෙල පැවැත්වීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීමේ පදනමෙන් රු.මිලියන 11.00 කට (එකතු කළ අගය බදු රහිත) ඇස්තමේන්තු කර දඹුල්ල ගලේවෙල ක්‍රීඩාංගණය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සමාගමක් වෙත ප්‍රදානය කර තිබුණි. දෙපාර්තමේන්තුව විසින් එම ඉදිකිරිම් වෙනුවෙන් කොන්ත්‍රාත්කාර සමාගම වෙත රු.මිලියන 2.46 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවා තිබුණි. එම අත්තිකාරම් ගෙවීමෙන් පසු වර්ෂයකට වැඩි කාලයක් ගත වී තිබුණත්, සමාගම විසින් ඉදිකිරීමේ කටයුතු ඉටු කර නොතිබුණු අතර එම මුදල් ක්‍රීඩාංගනය ඉදිකිරීමට නොයොදවා එම සමාගමේ කටයුතු සඳහා භාවිතා කිරීමට දෙපාර්තමේන්තුව විසින් ඉඩ ප්‍රස්ථා ලබා දී තිබුණි

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය

සූරියවැව මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිකිරීම

- 2011 වර්ෂයේදී ඉදිකිරීම් නිම කරන ලද සූරියවැව මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය සඳහා දේශීය හා විදේශීය කොන්ත්‍රාත්කරුවන් විසින් රු.මිලියන 4,648.96 ක් වැය කර තිබුණි. නමුත් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල එම වියදම

රු.මිලියන 420.55 කින් අඩුවෙන් රු.මිලියන 4,228.41 ක් ලෙස දක්වා තිබුණි.

- ඉදිකිරීම් කරන ලද විදේශීය සමාගමට අදාළ ගෙවීම් නියමිත වේලාවට නොගෙවීම හේතුවෙන් 2015 ජූලි 30 දින වන විට එකතුව රු.මිලියන 2,070.02 ක පොලිය ගෙවිය යුතු ලෙස ඉල්ලා තිබුණත්, එම මුදල මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

- ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ඉහත සඳහන් ඉදිකිරීමට අදාළව ශ්‍රී ලංකා වරාය අධිකාරියට ගෙවිය යුතු ලෙස රු.මිලියන 2,187.28 ක් හා ඒ මගින් ඇති වි තිබුණු වත්කම 2014 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි. නමුත් 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් එම බැරකම හා වත්කම කිසිදු තාර්කික පදනමකින් තොරව ඉවත් කිරීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ විධායක කමිටුවේ අනුමැතිය මත සිදුකර තිබුණි.

බැරකම් නිරවුල් නොකිරීම

ආර්. ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය හා පල්ලෙකැලේ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය වැඩි දියුණු කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට 2013 වර්ෂයේ සිට ගෙවිය යුතු රු. මිලියන 567.60 ක් 2015 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කිරීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය අපොහොසත් වී තිබුණි.

බැරකම් මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් නොකිරීම

ලෝක කුසලාන 2011 තරඟාවලිය මෙහෙයවීම පිණිස ලෝක කුසලාන 2011 ලේකම් කාර්යාලය පවත්වා ගෙන යාම සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතන පරිශ්‍රය ලබාදීම හේතුවෙන් නීත්‍යානුකූල එකී ලේකම් කාර්යාලය ඇති කර ගත් වියදම්වලට අදාළව රු. මිලියන 47.99 ක එකතු කළ අගය මත බදු මුදලක් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ගෙවිය යුතුව තිබුණත්, එය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණයට පැමිණෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ආහාර සහ ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීමේ අවශ්‍යතාවයන් ඉටු කිරීම පිණිස යටිතල සහසුකම් ලෙස අධිකාරිය විසින් රු.මිලියන 30.63 ක් වැයකර ඉදිකරන ලද කඩකාමර 4 ක් පූර්ණකාලීනව බදු දී නොතිබුණි. එමෙන්ම බදු දෙන ලද කඩකාමර දෙකක් වෙනුවෙන් විධිමත් පරිදි බදු අය නොකිරීම හේතුවෙන් 2015 වර්ෂයේදී අධිකාරියට රු.මිලියන 2.97 ක් වූ බදු අහිමි වී තිබුණි. කඩකාමර ඉදිකිරීමේ අරමුණ ඉටු වී නොතිබූ නමුත් එක් බදුකරුවකු විසින් සම්බාහන මධ්‍යස්ථානයක් පවත්වා ගෙන ගියද එය නතර කිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

කාන්තා හා ළමා කටයුතු

ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් සියයට 51 කට වඩා කාන්තාවන්ගෙන්ද සියයට 35 ක් පමණ ළමයින්ගෙන්ද සමස්ත පවුල් සංඛ්‍යාවෙන් සියයට 23 ක් ඉක්ම වූ වැන්දඹු හා ගෘහ මූලික කාන්තා පවුල් ද වේ. කාන්තා හා ළමා කටයුතු සම්බන්ධයෙන් පහත සඳහන් කාර්යභාරයක් ඉටු කිරීමට කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය හා ඒ යටතේ වන රාජ්‍ය අමාත්‍යාංශයට, දෙපාර්තමේන්තුවට හා ආයතන හතරක් වෙත පැවරී ඇත.

- ළමා සංවර්ධනය සහ කාන්තා කටයුතු සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම.
- උවදුරුවලට ලක්විය හැකි කාන්තාවන් සහ ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.
- අසරණභාවයට පත් කාන්තාවන් හා දරුවන් සඳහා සුභසාධන හා පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- අපයෝජනයට ලක්වූ ළමුන් සඳහා රැකවරණ නිවාස පහසුකම් සැපයීම.
- කාන්තාවන් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීම.

මෙම වැඩසටහන් බිම් මට්ටමින් ක්‍රියාත්මක කිරීමට ඉහත සඳහන් ආයතන යටතේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වනිතා සංවර්ධන නිලධාරී, උපදේශන සහකාර, මුල් ළමාවිය සංවර්ධන සහකාර, ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී, ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරි, මනෝ සමාජීය නිලධාරී සහ සහන සොයුරිය යනුවෙන් නිලධාරීන් අනුයුක්ත කර තිබේ.

අමාත්‍යාංශය සඳහා සමාලෝචිත වර්ෂයේදී මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 5,044.39 ක් වූ අතර ඉන් රු.මිලියන 4,157.86 ක් වැයකර තිබුණි. පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.මිලියන 323.20 ක් වූ අතර ඉන් රු.මිලියන 307.03 ක් වැයකර තිබුණි. මීට අමතරව එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලින් ලැබුණ රු.මිලියන 5.72 කින් රු.මිලියන 5.02 ක්ද, ලෝක ළමා අරමුදලින් ලැබුණු රු.මිලියන 3.24 කින් රු.මිලියන 1.63 ක්ද හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනින් ලැබුණු රු.මිලියන 12.05 කින් රු.මිලියන 11.44 ක්ද මෙම ක්ෂේත්‍රයේ කටයුතු සඳහා වැය කර තිබුණි.

අරමුණු ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කර තිබූ ප්‍රධාන වැඩසටහන්

- **අමාත්‍යාංශය විසින් පිළියෙල කළ නිති හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම**

  ළමා හා කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා යහපාලන භාවිතාවන් තහවුරු වන පරිදි අදාළ අවශ්‍යතා සම්පාදනය කිරීම සහ ප්‍රතිපත්ති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම අමාත්‍යාංශයේ මෙහෙවර වූ අතර ළමා හා කාන්තා අයිතිවාසිකම් තහවුරු කිරීම, ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සඳහා නීති අමාත්‍යාංශය විසින් සම්පාදනය කළ හා සකස් කළ නීති ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමක් සිදුකර නොතිබුණි.

- **ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම**

ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම සඳහා ප්‍රධාන උත්සව පැවැත්වීම, ප්‍රාදේශීය කාර්යාල මඟින් දැනුවත් කිරීමේ වැඩසටහන්, මාධ්‍ය වැඩසටහන්, කාන්තා දිනය සඳහා කොඩි නිර්මාණය, කාන්තා කාර්යාංශය විසින් කාන්තා දිනය සැමරීම යන කරුණු යටතේ එකතුව රු.මිලියන 15.87 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. ඉන් රු.මිලියන 11.15 ක් වැය කරමින් අනුරාධපුරය, කිලිනොච්චිය දිස්ත්‍රික්ක වල ජාතික මට්ටමේ උත්සව දෙකක්ද, සියළුම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඊට සමගාමීව උත්සව පැවැත්වීම සඳහා වැය කර තිබුණි. මෙම මුදල්ද කාන්තාවන් මුහුණ පාන බරපතල සමාජීය හා ආර්ථික ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා වූ තිරසාර ක්‍රමෝපායන් හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම සඳහා වැය කිරීමට තිබුණි. ජාත්‍යන්තර කාන්තා දින නිල උත්සවය අනුරාධපුරයේ පැවැත්වීම සඳහා සැලැසුම් කර තිබුණද, ඒ සඳහා සහභාගී වන ප්‍රමාණය හා උත්සව භූමිය, කුටි, වේදිකා සකස් කළ යුතු ආකාරය පිළිබඳව විධිමත් පරිදි සැලැසුම් නොකිරීම හේතුවෙන් ගිවිසගත් පරිදි කළ යුතුව තිබුණු වියදම් සීමාව ඉක්මවා රු.771,890 ක් වැය කර තිබුණි.

- **ලෝක ළමා දිනය**

ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය විසින් ළමා සවිය වැඩසටහන සඳහා රු.මිලියන 15 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණද, ඒ සඳහා රු.මිලියන 16.6 ක් වැයකර තිබුණි. මින් රු.මිලියන 7.2 ක් ලෝක ළමා දින උත්සවය සඳහා වැයකර තිබුණු අතර ඉන් රුපියල් මිලියන 6.17 ක් උත්සව සංවිධානය, පුවත්පත් දැන්වීම් පළකිරීම, නෘත්‍ය කණ්ඩායම් සහ වෙනත් විවිධ වියදම් සඳහා පෞද්ගලික ආයතනයකට ගෙවා තිබුණි. එමෙන්ම ළමුන්ට ත්‍යාග ලබාදීම සඳහා රු. මිලියන 0.61 ක් පමණක් වැයකර තිබුණි.

- **මුල් ළමාවිය දරුවන් පාසලට සූදානම් කිරීම**

මුල් ළමාවිය දරුවන් 1,250 ක් පාසලට සූදානම් කිරීම වෙනුවෙන් වැඩමුළු පැවැත්වීමට රු.මිලියනයක ප්‍රතිපාදන සළසා තිබුණ ද එවැනි වැඩමුළු පවත්වා නොතිබුණි.

- **ස්ත්‍රීන්ට සහ ගැහැණු ළමුන්ට සිදුවන සියලු ආකාරයේ ප්‍රචණ්ඩතාවයන් වැළැක්වීම සහ මුලිනුපුටා දැමීම**

උක්ත තේමාව යටතේ ළමා හා කාන්තා සංවර්ධන කේන්ද්‍ර සහකාර නිලධාරීන් අමාත්‍යාංශ 37කට අනුයුක්ත කර එම අමාත්‍යාංශවල සේවයේ නියුතු නිලධාරීන්, කාන්තාවන් හා දරුවන්ට සිදුවන අපයෝජනයන්, හිංසනයන් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව සංවේදී කිරීමට වැඩසටහන් 100 ක් පවත්වා ප්‍රතිලාභීන් 10,000 ක් දැනුවත් කිරීම සඳහා රු.මිලියන 4 ක ප්‍රතිපාදන සලසා තිබුණත් එම කටයුත්ත ඉටුකර නොතිබුණි. එම කාර්ය ඉටු කර ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් නිලධාරීන් සඳහා 2015 වර්ෂයේදී වැටුප් හා දීමනා වශයෙන් රු.මිලියන 24.14 ක් ගෙවා තිබූ නමුත් එම නිලධාරීන්ගෙන් ඉහත තේමාවට අයත් කාර්යයන් ඉටු කර

ගෙන නොතිබුණි. එමෙන්ම අමාත්‍යාංශය හා එම නිලධාරීන් අතර මනා සම්බන්ධීකරණයක්ද නොතිබුණි. තවද එසේ අනුයුක්ත කළ නිලධාරීන්ගෙන් 31 දෙනෙකු 2016 අප්‍රේල් මාසය වන විට වෙනත් දෙපාර්තමේන්තුවලට ස්ථානමාරුවීම් ලබා හා වෙනත් රැකියාවන් ලබා ඉවත් වී තිබුණි.

• සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ගැබිණි මව්වරුන්ට පෝෂණ මල්ලක් දීමේ වැඩසටහන සඳහා රු.මිලියන 2,500 ක්ද කිරි විදුරුව දීමේ වැඩසටහන සඳහා රු.මිලියන 260 ක්ද වශයෙන් සුභසාධන වැය විෂයය සඳහා රු.මිලියන 2,760 ක ප්‍රතිපාදන අමාත්‍යාංශය යටතේ සලසා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ගැබිණි මව්වරුන්ට පෝෂණ මල්ලක් ලබාදීමේ වැඩසටහන

පෝෂණ මල්ල වැඩසටහන සඳහා සලසා තිබුණු රු.මිලියන 2,500 ක ප්‍රතිපාදනයට අමතරව රු.මිලියන 500 ක අතිරේක ප්‍රතිපාදනද ලබාගෙන තිබුණි. නමුත් වර්ෂය අවසානයේදී එම සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 577.7 ක් හෙවත් සියයට 19 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. ඒ අනුව රු.මිලියන 2,422 ක් පමණක් වැය කර තිබුණි.

ගැබිණි මව්වරුන්ට පෝෂණය ලබාදීම සඳහා සලසා තිබු රු.මිලියන 2,500 ක ප්‍රතිපාදනවලින් පෝෂණ මල්ල වැඩසටහන ආරම්භ කිරීමේ උත්සව 04 ක් පැවැත්වීම සඳහා රු.මිලියන 7 ක් වැයකර තිබු අතර පුවත්පත් දැන්වීම් පළකිරීම සඳහා පමණක් රු.මිලියන 1.93 ක්ද, ආරාධනා පත් හා පෝස්ටර් සඳහා රු.මිලියන 0 .41 ක්ද වශයෙන් එකතුව රු. මිලියන 2.34 වැය කර තිබුණි.

- කිරි විදුරුව වැඩසටහන

කිරි විදුරුව වැඩසටහන සඳහා සලසා තිබුණු රු.මිලියන 260 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 39.39 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 15 ක් වෙනත් වැය විෂයයන් සඳහා මාරුකර තිබුණි. කිරි විදුරුව වැඩසටහන සඳහා රු.මිලියන 188.82 ක් පමණක් වැය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 31.78 ක් හෙවත් සියයට 14.4 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. කිරි විදුරුව වැඩසටහනේ ප්‍රධාන අරමුණ වූ අදාළ දරුවන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම වුවත්, අවුරුදු 2 කට වැඩි දරුවන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීමට පෝෂ්‍යදායී වැඩිහිටි ආහාරවලට ප්‍රමුඛත්වය දිය යුතු බවත්, දියර කිරි මිලි ලීටර් 100 ක ග්‍රෑම් 87.5 ක්ම ජලය බවත්, දරුවන්ට ලබාදිය යුතු ශක්තිය හා අනිකුත් පෝෂ්‍ය ද්‍රව්‍ය ඉන් සැපයීමට නොහැකි බවත් මාතෘ හා ළමා සෞඛ්‍ය අධ්‍යක්ෂක විසින් පෙන්වාදී තිබුණි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී නිලධාරීන් විසින් පෙන්වාදී තිබු ප්‍රායෝගික ගැටළු පහත දැක්වේ.

- ○ දියර කිරි නිෂ්පාදනය කිරීමේ සිට පෙර පාසල් දරුවන්ට එය ලැබෙන තෙක් දැඩි සනීපාරක්ෂක පියවර අනුගමනය කිරීමට සිදුවීම.

- විවිධ පළාත්වලට දියර කිරි ලබාගැනීමේ අපහසුතාව.
- කිරි ගොවීන් අඩු මිලට කිරි ලබාදීමට ඇති අකමැත්ත.
- ප්‍රවාහන අපහසුතා පැවතීම.
- දරුවන් රෝගීවීම පිළිබඳ මව්වරුන්ගේ සෘණ ආකල්ප.

ඉහත සඳහන් හේතූන් නිසා මෙම වැඩසටහනින් අපේක්ෂිත පෝෂණ මට්ටම් ඉහළ නැංවීමක් සිදුවී නොතිබූ අතර ඊට ඉදිරිපත් කර තිබූ විකල්පයක් ලෙස උදැසන ආහාර වේලක් ලබාදීමට 2016 පෙබරවාරි 12 දින පැවති විද්වතුන්ගේ සාකච්ඡාවේදී තීරණය කර තිබුණි. 2015 වර්ෂයේදී රු.මිලියන 188.82 ක් වැය කර තිබුණු මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට ප්‍රථම ඵලදායිතාවය පිළිබඳ පරීක්ෂා කර නොතිබීමත් හා ඵලදායිතාවය පහළ මට්ටමක පවතින මෙම වැඩසටහන සංශෝධනය නොකර 2016 වර්ෂයේදී ද තවදුරටත් ක්‍රියාත්මක කර තිබුණි.

• චක්‍රීය ණය වැඩසටහන

ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය විසින් 1990 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා රු.මිලියන 93 ක් ලබා දෙමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 304 ක චක්‍රීය ණය වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි. ඒ පිළිබඳ තොරතුරු කැඳවීමේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 304 න් 151 ක විස්තර පමණක් විගණනයට ඉදිරිපත් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- චක්‍රීය ණය වැඩසටහන ක්‍රියාත්මක නොවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 6 ක් පැවතුණි.

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 151 ක් සඳහා ලබාදී තිබූ රුපියල් මිලියන 43.31 ක ප්‍රතිපාදනවලින් 2015 දෙසැම්බර් 31 දින වන විට පැවති චක්‍රීය ණය ගිණුම්වල රු. මිලියන 46.81 ක ශේෂයක් පැවතීමෙන් එම වැඩසටහන චක්‍රීය ණය වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක නොවන බව තහවුරු විය.
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 7කට ලබාදී තිබූ එකතුව රු. මිලියන 1.60 ක ප්‍රතිපාදන එම කොට්ඨාශවලට ලැබී නොමැති බව සඳහන් කර තොරතුරු ඉදිරිපත් කර තිබුණි. එසේ ප්‍රතිපාදන ලැබී නොතිබුණු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හතරක චක්‍රිය ණය ගිණුම්වල ශේෂයන් ඉදිරිපත් කර තිබුණි.
- කොට්ඨාශ 14 ක ණය කරුවන් 95 දෙනෙකු විසින් එකතුව රු.943,541 ක ණය ගෙවීම් පැහැර හැර තිබුණි.

ළමා අපයෝජන හා කාන්තා හිංසන වැළැක්වීම පිළිබඳ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය සඳහා 2015 වර්ෂයේදී රු.මිලියන 200 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර ළමා අපයෝජන හා කාන්තා හිංසන වැළැක්වීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා රු.මිලියන 1.56 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

– සමාලෝචිත වර්ෂයේදී පුවත්පත් මගින් පමණක් අනාවරණය වී තිබූ කාන්තා හිංසන හා ළමා අපයෝජන

සිද්ධීන් 818 ක් විගණනයට අනාවරණය වූ අතර එම සිද්ධීන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

– අමාත්‍යාංශය විසින් ළමා මව්වරුන් පිළිබඳ හා වතුකරයේ කාන්තාවන්ට සිදුවන හිංසනය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා රු.මිලියන 2.42 ක් වැයකර තිබුණි. එම වැඩසටහන්වලින් හා අමාත්‍යාංශයේ දත්ත උපයෝගී කරගෙන පර්යේෂණවලින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට හැකියාව තිබියදී රු.මිලියන 3.65 ක් වැයකර ළමා මව්වරුන්, සයිබර් අපරාධ හා කාන්තා හිංසනය පිළිබඳව හා වතුකරයේ කාන්තාවන්ට සිදුවන හිංසනය යනුවෙන් පර්යේෂණ තුනක් පෞද්ගලික ආයතන දෙකක් ලවා සිදු කර ගෙන තිබුණි.

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

- ශ්‍රී ලංකා සමාජ පසුබිම තුළ අනාථ, අත්හල හා අසරණ ළමුන්ගේද, නීතිමය ගැටළුවලට බඳුන් වූ වෙනත් ළමුන්ගේද, අයිතිවාසිකම්, පූර්ණ සංවර්ධනය හා ආරක්ෂාව සුරැකෙන ලෙස ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ප්‍රතිපත්ති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම, ඇගයීම යන කටයුතු සම්බන්ධ කර ජාතික යන්ත්‍රණය ලෙස ක්‍රියාකිරීම පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මෙහෙවර වුවද, 1956 වර්ෂයේ ආරම්භ වූ දෙපාර්තමේන්තුව 2015 දෙසැම්බර් මාසය වන විටත් ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම හා නීති සම්පාදනය කිරීම සිදුකර නොතිබුණි.

- දෙපාර්තමේන්තුව විසින් ළමා නිවාස 400 ක් අධීක්ෂණය කිරීම සඳහා රු.මිලියන 2.00 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ළමා නිවාස 215 ක් අධීක්ෂණය කිරීමට රු.මිලියන 1.76 ක ප්‍රතිපාදන පළාත් පරිවාස දෙපාර්තමේන්තු වෙත යවා තිබූ නමුත් කාර්යාල 8 කින් අධීක්ෂණ වාර්තා හා නිරීක්ෂණ වාර්තා ලබා ගෙන ඉදිරි පියවර ගෙන නොතිබුණි. මෙම කාර්යාල 8 සඳහා යැවූ රු.මිලියන 1.58 ක ප්‍රතිපාදන උපයෝගී කර ගෙන අධීක්ෂණය කිරීමෙන් අපේක්ෂිත අරමුණ ඉටුවී නොතිබුණි.

- දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් 389 දෙනෙකු සඳහා වැටුප් දීමනා හා අනෙකුත් ප්‍රතිලාභ වෙනුවෙන් රු.මිලියන 200.42 ක් වැයකර තිබුණි. නමුත් ඔවුන් විසින් සිදුකරනු ලබන කාර්යයන් සම්බන්ධයෙන් දිස්ත්‍රික් නිලධාරීන් විසින් එවනු ලබන මාසික ප්‍රගති වාර්තා නිසි පරිදි ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම පසු විපරම් හා අධීක්ෂණ කටයුතු නිසි පරිදි සිදු නොවන බව එවා තිබූ ප්‍රගති වාර්තාවලින් නිරීක්ෂණය විය.

- සමාලෝචිත වර්ෂයේදී දැනුවත් කිරීමේ වැඩසටහන් 4,380 ක් සිදුකර තිබූ අතර දෙපාර්තමේන්තුවට ලැබී තිබූ ළමා අපයෝජන පැමිණිලි සංඛ්‍යාව 11,084 ක් වී තිබුණි. එය ඉකුත් වර්ෂයට වඩා පැමිණිලි 5,735 කින් වැඩිවී තිබුණි.

එයින් පැමිණිලි 5,068 ක් සඳහා පූර්ණ කාලීන විසඳුම්ද 3,829 සඳහා කෙටි කාලීන විසඳුම්ද ලබාදී තිබුණි. වර්ෂය තුළදී පැමිණිලි 2,097 ක් වෙනත් ආයතන වෙත යොමු කර තිබුණි. වර්ෂය තුළදී අවදානම් ළමුන් 3049 ක් හඳුනාගෙන තිබුණු නමුත් එයින් ළමුන් 2,738 කගේ පමණක් ආරක්ෂණ සැලැසුම් සකස් කිරිම හෝ ආරක්ෂාව තහවුරු කර ගෙන තිබුණි.

- ළමා නිවාස පුනරුත්ථාපනය හා ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් පළාත් පරිවාස කොමසාරිස්වරුන් වෙත රු.මිලියන 9.87 ක් යවා තිබූ නමුත්, එම අරමුණ ඉටුවිද යන්න තහවුරු කර ගැනිම සඳහා අනුමත ඇස්තමේන්තු, වැඩ පත්‍රිකා, ප්‍රමාණ පත්‍ර, ගෙවීම් පිළිබඳ ලිඛිත සාක්ෂි ලබාගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.
- දරුවන් 1,505 ක් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත රු. මිලියන 1.57 ක ප්‍රතිපාදන සලසා තිබූ නමුත් එම වැඩසටහන් ක්‍රියාත්මක කළ බවට පසුවිපරම් ක්‍රියාවලියක් අනුගමනය කර වැඩසටහන් වල සාර්ථකත්වය පිළිබඳ විමසා බැලීමක් සිදු කර නොතිබුණි.
- පරිවාස නිලධාරීන් පුහුණු කිරීම වෙනුවෙන් පළාත් සභා 8 කට රු.මිලියන 1.69 ක් යවා තිබුණද, එම වැඩසටහන් පැවැත්වූ බවට අදාළ විස්තර ලබාගෙන ප්‍රගතිය හෝ අරමුණු ඉටුවි තිබීම මැනිමට ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

ළමා සංවර්ධන අරමුදල

- ළමා සංවර්ධන අරමුදල පිහිටුවීමේ ප්‍රධාන අරමුණ යුද වාතාවරණය හා වෙනත් ස්වභාවික ආපදාවන් නිසා තම දෙමාපියන් හෝ භාරකරුවන් අහිමි වූ දරුවන්ට මෙන්ම ආර්ථික දුෂ්කරතා නිසා තමන්ගේ අධ්‍යාපන කටයුතු අඛණ්ඩව කර ගෙන යාමට හා සහජ කුසලතා හා වෙනත් දක්ෂතා වර්ධනය කර ගැනීමටද නොහැකි වූ ශ්‍රී ලාංකීක දරුවන්ට මූල්‍යමය ආධාර ලබාදීම වේ. 2014 ජනවාරි 02 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ අරමුදල්ද යොදවා යෝජිත වැඩසටහන් වඩාත් ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු බව මුදල් අමාත්‍යවරයාගේ නිර්දේශය වී තිබුණි. ඉකුත් වර්ෂයේදී ළමයින්ට ආධාර ගෙවීම් වශයෙන් රු.මිලියන 1.94 ක් වැයකර තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේදී කොඩි අලෙවියෙන් හා ස්ථාවර තැන්පත් ආයෝජන මඟින් රු. මිලියන 1.99 ක ආදායමක් උපයා තිබුණද, ඉන් කිසිදු ළමයෙකුට ආධාර මුදල් ගෙවීමක් සිදුකර නොතිබුණි.

- ජාතික ළමා සංවර්ධන අරමුදලේ මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව අරමුදල පාලනය කිරීම, අන්තර් අමාත්‍යාංශ අධික්ෂණ කමිටුව මගින් සිදු කළ යුතු අතර, අවම වශයෙන් මසකට වතාවක් එම කමිටුව රැස්විය යුතු වුවද, 2015 වර්ෂයේදී එක් වරක්වත් කමිටුවේ රැස්වීම් පවත්වා නොතිබිම හේතුවෙන් අරමුණුගත කාර්යයන් ඉටුකර ගැනීමට තීරණ ගෙන නොතිබුණි.

- අමාත්‍යාංශය ළමා සංවර්ධන අරමුදල ගොඩනැගීම සඳහා අරමුදල් සම්පාදන මාර්ග වශයෙන් ජාතික ළමා සංවර්ධන අරමුදලේ මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව පෞද්ගලික අංශයේ ආයතන වලින්, දානපතියන්ගෙන්, රාජ්‍ය බැංකු, ලොතරැයි මණ්ඩල, සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් මණ්ඩලය යන ආයතනවලින්, මෙරට ලියාපදිංචි රාජ්‍ය නොවන විදේශීය සංවිධාන, විදේශිය ආයතන හා විදේශීය දානපතියන්ගෙන් අරමුදල් රැස්කර ගැනීමට හැකියාව තිබුණි. ළමා දිනය වෙනුවෙන් නිකුත් කළ කොඩි ආදායම හා ස්ථාවර තැන්පත් පොලි ආදායම හැර වෙනත් කිසිදු ආදායම් මාර්ගයන් ගෙන් අරමුදල් රැස්කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. මෙවැනි තත්ත්වයක් යටතේ අරමුදල ආයෝජනය කටයුතු මෙහෙයවීම හැර සමාලෝචිත වර්ෂයේදී අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමේ කාර්යෙහි යෙදී නොතිබුණි.

සංචාරක කටයුතු

ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් බවට පත් කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම මගින් ශ්‍රී ලංකාවේ තරුණ ප්‍රජාවට සෘජු හා වක්‍ර රැකියා අවස්ථා උදා කිරීම තුළින් ආර්ථිකයට ඉහළ විදේශ විනිමයක් ඉපයීම සංචාරක කටයුතු අංශයෙන් අපේක්ෂා කර තිබුණි. එම අපේක්ෂාව ඉටු කිරිම සඳහා සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත ආයතන 4 ක් මගින් පහත සඳහන් කාර්ය භාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- සංචාරක සංවර්ධනය පිළිබඳ විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගැයීම
- සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සහ ප්‍රමිතීන් සම්පාදනය කිරිම
- සංචාරක නියෝජිතායතන ලියාපදිංචි කිරීම හා නියාමන කටයුතු කිරීම
- විවේකය ගත කිරීම සඳහා විනෝදාත්මක පහසුකම් සැපයීමට අදාළ කටයුතු ප්‍රවර්ධනය කිරීම

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක 2011-2016 පස් අවුරුදු සැලැස්ම මගින් සංචාරක ව්‍යාපාරයට ප්‍රමුඛතාවය දී තිබුණු අතර එමගින් එක්සත් ජනපද ඩොලර් බිලියන 2.75 කට වැඩි ආදායමක් හා සෘජු හා වක්‍ර රැකියා 500,000 ක වැඩි ප්‍රමාණයක් උත්පාදනය කිරිමට 2016 වර්ෂයේදී අපේක්ෂා කර තිබුණි. 2015 වර්ෂයේදී සංචාරක කර්මාන්තය යහපත් ක්‍රියාකාරීත්වයක් පෙන්වූ අතර, සංචාරක පැමිණීම මිලියන 1.8 ක් වූ අතර සංචාරක ව්‍යාපාරය සඳහා වූ ආයෝජන සැලකිය යුතු ලෙස ඉහළ යාම, යටිතල පහසුකම් සංවර්ධනය, නවතම සංචාරක ආකර්ෂණයකින් රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය මගින් සිදුකරන ලද ප්‍රවර්ධන වැඩසටහන් මෙම සංචාරක පැමිණීම ඉහල යාමට හේතු විය. කෙසේ වෙතත් 2015 වර්ෂයේ විදේශීය සංචාරකයින්ගේ පැමිණීමේ ඉලක්කය වූ මිලියන 2 ක ප්‍රමාණයට ළඟාවීමට නොහැකි වී තිබුණි.

ඉකුත් වර්ෂයේදී මෙන්ම 2015 වර්ෂයේ දී ද ප්‍රධාන කළාප බහුතරයක සංචාරක පැමිණීම වර්ධනය විය. ඒ අනුව නැගෙනහිර ආසියාවෙන් සියයට 29.4 ක්ද, මැදපෙරදිග කලාපයෙන් සියයට 13.6 ක්ද, බටහිර යුරෝපයෙන් සියයට 15.3 ක් හා දකුණු ආසියාවෙන් සියයට 24.1 ක් වශයෙන් ප්‍රමාණාත්මක වැඩිවීමක් නිරීක්ෂණය විය. එමෙන්ම රටක් වශයෙන් වැඩිම සංචාරකයන් සංඛ්‍යාවක් ඉකුත් වර්ෂයේදී මෙන් 2015 වර්ෂයේදී ඉංදියාවෙන් පැමිණ තිබුණි. එම ප්‍රමාණය 316,247ක් වී තිබුණි. මෙම වර්ෂයේදී ආකර්ෂණීය ලෙස මහජන චීන සමූහ ආණ්ඩුවෙන් සංචාරකයින් පැමිණ තිබුණි. එම ප්‍රමාණය 214,783 ක් වී තිබුණද, ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී එය සියයට 67.6 ක වැඩි වීමක් වී තිබුණි.

රටක් වශයෙන් ගත් කළ සංචාරක කර්මාන්තයෙන් ශ්‍රී ලංකාව බලාපොරොත්තු වන්නේ ඉහළ විදේශ විනිමය ඉපැයීමක් වන හෙයින් 2015 වර්ෂයේ දී මෙම කර්මාන්තයෙන් ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 2,980 ක ආදායමක් උපයා තිබුණි. එම ප්‍රමාණය පෙර වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 22.58 ක ඉහළ

වර්ධනයක් ලෙස සඳහන් කළ හැකිය. විදේශිය සංචාරක පැමිණීම ඉහළ යාම මෙන්ම සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදම සහ සංචාරකයකු ශ්‍රී ලංකාවේ ගත කරන සාමාන්‍ය දින ගණන ඉහළ යාම සංචාරක ඉපැයුම් වර්ධනය වීමට ප්‍රධාන සාධකයක් ලෙස සඳහන් කළ හැකිය. 2015 වර්ෂයේදී සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදම ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 164.1 ක් වූ අතර එම ප්‍රමාණය 2014 වර්ෂයේදී ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 160.8 ක් වී තිබුණි. ඒ අනුව සංචාරක ඉපයීම් කිසියම් අනුපාතයකින් ඉහළ යාමට එය බලපා තිබුණි. එමෙන්ම සංචාරකයකු ශ්‍රී ලංකාවේ ගත කරන සාමාන්‍ය දින ගණන 2015 වර්ෂයේ දින 10.1 ක් වූ අතර එය පෙර වර්ෂයේදී දින 9.9 ක් විය. එහෙත් 1987 වර්ෂයේ සංචාරකයෙකු ශ්‍රී ලංකාවේ ගත කරන ලද සාමාන්‍ය දින ගණන 13.2 ක් වූයෙන් එම ඉලක්කය දිනා ගැනීමට අප 2015 වර්ෂය අවසාන වන විටත් සමත් වී නොතිබුණි.

ශ්‍රී ලංකාව ලෝකයේ හොඳම ගමනාන්තයක් වශයෙන් චීනයේ "Travel & Leisure " සඟරාව හඳුන්වා දී තිබුණු අතර 2015 වර්ෂයේ දී සංචාරය කිරීමට ලෝකයේ සුවදායක රටවල් 10 අතරින් එකක් වශයෙන් "Forbes" සඟරාවේ ද ශ්‍රී ලංකාව නම්කර තිබුණි. අපට මෙම තත්ත්වයන් ලබා ගැනීමට හා ශ්‍රී ලංකාව ලෝක සංචාරක කර්මාන්තයේ උච්චතම ස්ථානයට රැගෙන යාමට 2015 වර්ෂයේ දී රු.මිලියන 2,988 ක් වැය කර තිබුණි. එම මුදල් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමණාකරන ආයතනය හා ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය යන ආයතන 04 විසින් පිළිවෙලින් සියයට 14 , සියයට 70, සියයට 12 හා සියයට 4 ක් බැගින් මූල්‍යනය කර තිබුණි. එහෙත් 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත මඟින් මෙම ආයතන 04 ට පවරා ඇති කාර්යයන් හා කර්තව්‍යයන් වලින්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි නොවී චාරිකා හෝ සංචාරක සේවාවන්හි නිරත වන යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් වරදකට වරදකරු කිරීමට රීති පැනවීම, සංචාරක කර්මාන්තය හෝ ඒ ආශ්‍රිත වෙනත් කර්මාන්තවලට අදාලව, දේශීයව හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ප්‍රමිත වැඩිදියුණු කිරීම, බලාත්මක කිරීම හා පවත්වාගෙන යාම සඳහා සංචාරක ව්‍යවසායකයන්ට බලපත් ලබා දීම, බලය ලබා දීම හා සංචාරක කර්මාන්තයට සහාය දීම සඳහා ආයතන සහ ව්‍යාපාර පිහිටුවීම යන කටයුතු සිදු කර නොතිබුණි.

සංචාරක පනත යටතේ ස්ථාපිත ආයතනවලට අදාළව විගණන නිරීක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

වියදම් කළ පසු ඉතිරි වූ මුදල් අධිකාරිය වෙත ලබා නොදීම

අධිකාරිය විසින් සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2014 සැප්තැම්බර් 3 දින ආයතනයෙන් ශ්‍රී ලංකා සංචරන සුහසාධක සංගමය වෙත රු. මිලියන 5.74 ක් ගෙවා තිබුණි. එම මුදලින් සංචරන සුහසාධක සංගමය 2014 සැප්තැම්බර් 3 දින සිට 9 දින දක්වා බලංගොඩ දෙහිඅත්තකණ්ඩිය, පදියතලාව, හසලක, ලුණුගම්වෙහෙර හා නුවරඑළිය යන ප්‍රදේශවලදී තෝරාගත් කණ්ඩායම්වලට ආහාර පාන සැපයීමට සහ කාර්ය මණ්ඩල පහසුකම් සඳහා රු. මිලියන 4.77 ක් වැයකර ඉතිරිය වූ රු.මිලියන 0.97 ක් සුහසාධක සංගමයට අයත් ගිණුමක තැන්පත් කර තිබුණි. එම මුදල 2015 දෙසැම්බර් 31 දින වන විටත් අධිකාරියට ලබා දී නොතිබුණි.

මුදල් ගෙවා තිබුණු ඉඩමක් අධිකාරියට පවරා නොගැනීම

නාගරික සංවර්ධන අධිකාරියට අයත් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ පිහිටි අක්.11 රූඩ් 03 පර්.13 ක ඉඩමක් වෙනුවෙන් 2015 වර්ෂයේදී රු.මිලියන 65.10 ක මුදලක් ගෙවා තිබුණද එකී ඉඩම අධිකාරිය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද එම ඉඩමෙහි ආරක්ෂණ වියදම් සඳහා රු.639,529 ක් වැයකර තිබුණි.

වැඩිපුර ගෙවීම් අයකර නොගැනීම

- කල්පිටිය වැඩබිමට කළුගල්, බොරළු සහ ඒ.බී.සී සැපයීම සඳහා යොදාගත් බව සඳහන් ටිපර් රථයක ධාරිතාව කියුබ් 3 ක් වුවද, කියුබ් 4 ක් බැගින් ද්‍රව්‍යය සැපයූ ලෙස සළකා ගෙවීම් කිරීම නිසා රු.මිලියන 2.55 ක් වැඩි පුර ගෙවා තිබුණි.

- කතරගම සංචාරක නිවාඩු නිකේතනයේ කාමර අංක 14 සිට 44 දක්වා අළුත්වැඩියා කිරීම සඳහා රු.මිලියන 29.2 ක් ගෙවා තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විටත් අය නොකළ රු.මිලියන 11.09 ක් වැඩිපුර ගෙවා තිබුණි. අලාභයට වගකිව යුතු නිලධාරීන්ගෙන් එම මුදල් අයකිරීමට හා විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

- පාසිකුඩා සංචාරක කළාපයේ ජාතික නිවාඩු නිකේතනය වෙත ඇති කි.මීටර්.1.126 ක පිවිසුම් මාර්ගය කාපට් කිරීම සඳහා ව්‍යාජ ලෙස අදියර 04 කට පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කර ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව කොන්ත්‍රාත්කරු තෝරාගෙන ඉදිකිරීම් සඳහා රු.මිලියන 22.01 ක් වැඩි පුර කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

- වෙළෙඳපල මිල කැඳවුම් ක්‍රමය යටතේ, කළුගල් සැපයීමට තෝරාගත් සැපයුම්කරු වෙනුවට ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ අභිමතය පරිදි වෙනත් පුද්ගලයෙකුගෙන් කළුගල් කියුබ් 1648 ක් වැඩි මිලට මිලදී ගැනීම නිසා රු.824,000 ක වැඩිපුර මුදලක් අධිකාරියට දැරීමට සිදුවී තිබුණි.

බණ්ඩාරවෙල නිවාඩු නිකේතනය පිහිටි ඉඩම පවරා නොගැනීම

බණ්ඩාරවෙල නිවාඩු නිකේතනය පිහිටා ඇති අක්කර 22 රූඩ් 1 පර්චස් 17.23 ක භූමි ප්‍රමාණය නිසි පරිදි මැනුම් සිදුකර ආයතනයට පවරා ගැනිමට කටයුතු කර නොතිබූ අතර නිකේතන භූමියේ ඇති මිල අධික ඉහල වටිනාකමින් යුත් ගස් 200 ක් පමණ ඉන්වෙන්ට්‍රිගත කර සුරක්ෂිත කිරීමටද කටයුතු කර නොතිබුණි.

භෞතිකව භාර නොගත් ද්‍රව්‍ය සඳහා මුදල් ගෙවීම

කළුගල් කියුබ් 1648 ක්, ඒ.බී.සී කියුබ් 368 ක් සහ බොරළු කියුබ් 40 ක් භෞතිකව භාර ගෙන නොතිබුණු අතර අධිකාරිය විසින් ඒ සඳහා රු. මිලියන 10.20 ක් ගෙවා තිබිණි.

ප්‍රසම්පාදන පටිපාටියෙන් බැහැර වීම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8 වන මාර්ගෝපදේශය ප්‍රකාරව අරමුණුවලට පටහැනිව 2009 වර්ෂයේ සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා බෙන්තොට පල්දෝරු පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ශ්‍රම කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදන පටිපාටියෙන් තොරව එක්තරා ආයතනයකට ලබා දී ඒ සඳහා රු.මිලියන 28.74 ක් ගෙවා තිබුණි.

චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව බඳවා ගැනීම්

කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සුදුසුකම් නොමැතිව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පරිපාටික රීති ඇතුළත් 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන ගැසට් පත්‍රයේ නියමයන් හා 2015 ජුනි 29 දිනැති අංක පීඊ/2015/04 දරන මැතිවරණ කොමසාරිස්ගේ ලිපියෙන් ප්‍රකාශිත මැතිවරණ නීතිරීති නොපිළිපදිමින් අධිකාරියට බඳවාගත් සහකාර අධ්‍යක්ෂකවරුන් 9 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 1.88 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

- සංචාරක ක්ෂේත්‍රය තුළ සමාජීය වගකීම් ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා පුද්ගලික ආයතන දෙකකට රු.මිලියන 99.44 (බදු රහිත) ක් ගෙවා තිබූ නමුත් එකී ගෙවීම් පිළිගැනීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

- හෝම්ස්ටේ ප්‍රචාරාත්මක වැඩසටහන නිර්මාණය සඳහා වන කොන්ත්‍රාත්තුව රාජ්‍ය ආයතනයකට භාර නොදී පුද්ගලික ආයතනයක් වෙත භාරදී තිබුණි. එකී කොන්ත්‍රාත්තුව විවෘත මිල ගණන් කැඳවීමකින් තොරව සීමිත මිල ගණන් කැඳවීමකින් පසු ඉහත කී පුද්ගලික ආයතනය වෙත රු. මිලියන 33.9 කට ප්‍රදානය කර තිබුණු අතර එකී ආයතනය සමඟ ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණි. එසේම අත්තිකාරම් ලෙස රු. මිලියන 14.50 ක් එම ආයතනයට ගෙවා තිබුණි. එම අත්තිකාරම් කොන්ත්‍රාත්කරු භාරයේ මාස 08 ක පමණ කාලයක් අත රඳවා තබා ගෙන නැවත කාර්යාංශය වෙත මුදලින් පියවා තිබුණි. මෙම ක්‍රියාපිළිවෙත නිසා රජයේ මුදල් තාවකාලික ලෙස අවභාවිතා කිරීමට ඉඩ ප්‍රස්ථා ලබා දී තිබුණි.

- 2011 පෙබරවාරි 11 දිනැති අංක 57 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව එක්තරා ආයතනයකට රු. මිලියන 5.00 ක අනුග්‍රාහක දීමනාවක් ලබා දී තිබුණි.

නාගරික සංවර්ධනය

සෑම එක් එක් නගරයක් සඳහා ආර්ථිකමය අවස්ථාවන් හා ගෝලීය තරඟකාරීත්වය ඉහළ නංවන නව නාගරික ආකෘතියක් නිර්මාණය කිරීම, කැලි කසල, පැල්පත්වාසින් සඳහා නිවාස ප්‍රශ්ණ නිරාකරණය සඳහා විසඳුම් සෙවීම සහ රටේ බස්නාහිර කළාපයේ හා තදාසන්න ප්‍රදේශවල නව නගර ඉදිකිරීම මෙම අංශයෙන් අපේක්ෂා කර තිබුණි. එම අපේක්ෂාව ඉටු කර ගැනීම මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුවකින් හා ව්‍යවස්ථාපිත ආයතන 2 කින් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- විෂයයන්ට අදාළ ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරිම හා ඇගැයීම
- කොට්ටාව, කඩුවෙල සහ කඩවත නගර සංවර්ධන ව්‍යාපෘතිය හා ඒ ආශ්‍රිත කටයුතු
- නාගරික ප්‍රදේශවල ආර්ථික, සාමාජික සහ භෞතික සංවර්ධනය ඒකාබද්ධව විධිමත් ලෙස ප්‍රවර්ධනය කිරිම හා නියාමන කටයුතු
- නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
- පහත් බිම් ගොඩකිරීම සහ සංවර්ධනයට අදාළ කටයුතු
- නාගරික ප්‍රදේශවල පිහිටි සේවා හා පහසුකම් අඩු ප්‍රදේශ සහ වගුරු බිම් පොදු සැලැස්මකට අනුව සංවර්ධනය කිරීමට අවශ්‍ය මඟ පෙන්වීම
- ජාතික හා භෞතික සැලැසුම් සහ ප්‍රාදේශීය භෞතික සැලැසුම් පිළියෙල කිරීම
- ඒකාබද්ධ නාගරික සංවර්ධනයන් සහතික කිරීම සඳහා ජාතික භෞතික සැලැසුම් පදනම් කරගෙන සියළු ඉදිකිරීම් කටයුතු මෙහෙයවීම හා නියාමනය කිරීම
- අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ආයතනයන්හි පැවැරී ඇති අනෙකුත් සියළුම විෂයයන්ට අදාළ කටයුතු

ඉහත සඳහන් කාර්යභාරයන් ඉටු කිරිමට පවරා තිබුණු ආයතනයන් සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවලදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

නාගරික සංවර්ධන අධිකාරිය

යෝජිත අඩු වියදම් නිවාස ඒකක ප්‍රමාණයේ ඉදිකිරීම් සම්පූර්ණයෙන් නිම නොකිරිම

ඉදිරි වර්ෂ 03 ක් තුළ අඩු වියදම් නිවාස 20,000 ක් සෑදීමේ වැඩපිළිවෙල නාගරික සංවර්ධන අධිකාරිය මුලිකත්වයෙන් ආරම්භ කර තිබුණි. එම වැඩසටහනේ පළමු අදියර යටතේ විවිධ ස්ථාන 09 ක අඩු වියදම් නිවාස ඒකක 4,943 ක් 2014 වර්ෂය අවසානය වන විට මුළුමණින්ම නිමකර තිබුණි. කෙසේ වුවද පළමු අදියර යටතේම ස්ථාන 11 කදී ඉදිකිරීමට යෝජිතව තිබු නිවාස ඒකක 5,610 ක ඉදිකිරීම් 2015 දෙසැම්බර් 31 දින වන විටද සම්පූර්ණයෙන්ම නිමකර නොතිබුණි.

දිවයිනේ විවිධ නගරවල සතිපොළ, බස්නැවතුම් පොළවල් හා උද්‍යාන ඉදිකිරීමේ ව්‍යාපෘතිය

නාගරික සංවර්ධන අධිකාරිය විසින් දිවයිනේ විවිධ නගරවල සතිපොළ, බස්නැවතුම් පොළවල් උද්‍යාන ඉදිකිරීම් වැනි විවිධ කාර්යයන් 31 ක් ඉදිකිරීම සඳහා රු. මිලියන 2,984 ක වියදම් ඇස්තමේන්තු කර තිබුණි. ඒ සඳහා 2015 වර්ෂය වෙනුවෙන් රු. මිලියන 862 ක ප්‍රතිපාදන සළසා තිබුණි. කෙසේ වුවද, 2015 වර්ෂය අවසානය වන විට එකී ව්‍යාපෘති වෙනුවෙන් රු. මිලියන 706.4 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- නාගරික සංවර්ධනයට අදාල ව්‍යාපෘති 31 න් 07 ක වැඩ ආරම්භ කිරීම 2015 වර්ෂයේ අවසානය වන විටද සිදුකර නොතිබුණි. ඉතිරි ව්‍යාපෘතිවල වැඩ ආරම්භ කිරීම නියමිත දින 3 ක සිට දින 520 ක් අතර කාල පරාසයකින් ප්‍රමාද කර තිබුණි.

- නාගරික සංවර්ධනයට අදාල ව්‍යාපෘති 14 කට අදාල සංවර්ධන ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 515 ක ප්‍රතිපාදන සළසා තිබුණද, එම ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.මිලියන 46.9 ක් උපයෝජනය කර තිබුණි. එසේම එම ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය සියයට 10 කට වඩා අඩු මට්ටමක පැවැතුණි.

- නාගරික සංවර්ධනයට අදාල ව්‍යාපෘති 17 ක් වෙනුවෙන් රු.මිලියන 808 ක ප්‍රතිපාදන සළසා තිබුණද එකී ව්‍යාපෘති, 2015 වර්ෂය අවසානය වන විටත් මුළුමණින්ම නිමකර නොතිබුණි.

- විවිධ කටයුතු 298 ක් වෙනුවෙන් එකතුව රු. මිලියන 1,460 ක වැඩ හා සේවාවන් සඳහා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරිමෙන් තොරව ඉකුත් වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් ගෙවීම් කර හෝ ගිවිසුම්වලට එළඹ හෝ තිබුණි. කෙසේ වුවද. එයින් රු. මිලියන 179 ක් ව්‍යාපෘති විවෘත කිරිම්, සමරු එලක ඉදිකිරීම්, ප්‍රචාරක, ආහාර පාන සැලැසීම වැනි ආර්ථික ප්‍රතිලාභ ජනිත නොවන කාර්යයන් සඳහා වැය කර තිබුණි.

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරිමේ හා සංවර්ධනය කිරිමේ සංස්ථාව

වගුරු බිම්, නිසරු හෝ මඩ ඉඩම් හඳුනාගෙන ගැසට් නිවේදන මගින් ප්‍රසිද්ධ කිරිම

දිවයින පුරා පළාත් මට්ටමින් පිහිටි පහත් වගුරු බිම්, නිසරු හෝ මඩ ඉඩම් හඳුනාගෙන අනවසර ඉඩම් ගොඩකිරිම් පාලනය කිරිම හා අධීක්ෂණය කිරිමට හැකිවන පරිදි ඒවා ගැසට් නිවේදන මඟින් ප්‍රසිද්ධ කිරීමට ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරිමේ හා සංවර්ධනය කිරිමේ සංස්ථා පනත මඟින් සංස්ථාව වෙත පවරා තිබුණද, 2015 වර්ෂය අවසානයට එලෙස ගැසට් නිවේදන මගින් ප්‍රසිද්ධ කරන ලද පළාත් ගණන 04 කට පමණක් සීමාවී තිබුණි.

වේරැස් ගඟේ වැසි ජලය අපවහනය පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

වේරැස් ගඟේ වැසි ජලය අපවහනය පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් රු.මිලියන 2,550 ක ණය මුදලක් ලබාගෙන තිබුණද්. එකී ණය මුදල වෙනුවෙන් පොළි සහ ණය වාරික ලෙස ගෙවිය යුතුව තිබූ රු. මිලියන 726.54 ක් මූල්‍යනය කරන ආකාරය පිළිබඳව හඳුනාගෙන නොතිබුණි.

සංස්ථාව දිගින් දිගටම පාඩු ලැබීම

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ 2015 වර්ෂයේ පිරිවැටුම සියයට 44 කින් පහළ වැටී තිබුණු අතර වසර කිහිපයක් මුළුල්ලේ පාඩු ලබමින් සිටි අතර 2015 වර්ෂයේදීද බදු පෙර අලාභය රු.මිලියන 169 ක් වී තිබුණි.

භාණ්ඩාගාර ප්‍රතිපාදන උපයෝජනය කිරීම.

- මහ කොළඹ ප්‍රදේශයේ ගංවතුර වැළැක්වීමේ හා පරිසර ප්‍රවර්ධන ව්‍යාපෘතිය සඳහා 2015 වර්ෂයේදී ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත භාණ්ඩාගාරයෙන් රු.මිලියන 100 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. එයින් රු. මිලියන 27.1 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව සළසා දී තිබුණු ප්රතිපාදනවලින් සියයට 72.9 ක් උපයෝජනය කර නොතිබුණි.

- 2015 වර්ෂයේදී වැඩසටහන් 5 ක් වෙනුවෙන් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට භාණ්ඩාගාරයෙන් රු.මිලියන 483 ක් ලබා දී තිබුණු අතර එම ප්‍රතිපාදනය රු.මිලියන 57 කින් ඉක්මවා රු.මිලියන 540 ක් උපයෝජනය කර තිබුණි.

- මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය හරහා සමාලෝචිත වර්ෂයේදී හතරලියැද්ද නගර සංවර්ධන ව්‍යාපෘතිය සහ මහ කොළඹ සන අපද්‍රව්‍ය වැළැක්වීමේ ව්‍යාපෘතිය සඳහා පිළිවෙලින් රු.මිලියන 55 ක් හා රු. මිලියන 2,000 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. එම ප්‍රතිපාදනවලින් පිළිවෙලින් සියයට 93.12 ක් සහ සියයට 99.99 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබීම නිසා සළසා දී තිබුණු ප්‍රතිපාදන නිෂ්ඵල වී තිබුණි.

අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘති කළමනාකරණය

උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය

උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 4,410 ක් ප්‍රතිපාදන සළසා තිබුණද, 2015 වර්ෂයේදී රු.මිලියන 533.4 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සළසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 87.9 ක් ඉතිරි වී තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කාලයෙන් මාස 19 ක් හෙවත් ව්‍යාපෘති කාලච්ඡේදයෙන් සියයට 28 ක් ඉකුත් වී තිබුණද ව්‍යාපෘතියේ මුළු අරමුදල් වලින් සියයට 12.1 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය

කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය සඳහා 2015 වර්ෂයේදි රු. මිලියන 7,100 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් රු.මිලියන 2,210 ක් වැය කර තිබුණි. ඒ අනුව සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 31 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එසේම වසර 03 ක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණද මුළු ණය මුදලෙන් සියයට 25 ක් පමණක් උපයෝජනය කර තිබු බැවින් ව්‍යාපෘතියේ සමස්ථ කාර්යසාධනය ඉතාම අඩු මට්ටමක පැවතුණි. එයට ව්‍යාපෘති කළමනාකරණයේ දුර්වලතාවය බොහෝදුරට බලපෑ අතර ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයා ලෙස පූර්ණකාලීන නිලධාරියෙක් වෙනුවට අර්ධකාලීන නිලධාරියෙකු පත්කර තිබීම එයට ප්‍රධාන හේතුවක් වී තිබුණි. එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- කොළඹ අගනගර තුළ ගංවතුර පාලනය මුලික කරගත් ව්‍යාපෘතියේ කටයුතු අධීක්ෂණයට වාහන මිලදී ගැනීමේදී විශාල දුරක් ගමන් කිරීමට අවශ්‍ය බව දක්වමින් අධි සුඛභෝගි ටොයෝටා ප්‍රාඩෝ ජීප් රථ 02 ක් මිලදී ගැනීම සඳහා රු.මිලියන 59.15 ක් වැය කර තිබුණි. මෙම ගනුදෙනුව ව්‍යාපෘති අරමුණෙන් බැහැර කළ වියදමක් වී තිබුණි.
- ගංවතුර පාලනය කිරීමට කටයුතු කිරීම යනු ගංවතුර හා වැසි ජලය එක්රැස් කරගැනීමේ කානු හා ඇල මාර්ග සැලසුම් කිරීම හා ඇදිම සඳහා පරිගණක මෘදුකාංග ගැනීම පමණක් නොවන නමුදු ඒ සඳහාම එකිනෙකට වෙනස් පරිගණක මෘදුකාංග 02 බැගින් මිලදී ගැනීමට රු.33,876,960 ක් ව්‍යාපෘති අරමුදලින් වැයකර තිබුණි.
- ව්‍යාපෘති සමාලෝචනය සහ ව්‍යාපෘතියේ ගිණුම් තැබීමට පරිගණක මෘදුකාංගයක් මිලදී ගැනීමට රු.මිලියන 1ක් වැයකර වසර දෙකකට ආසන්න කාලයක් ගතවී තිබුණද පරිගණක මෘදුකාංගය ස්ථාපිත කර නොතිබුණි.

කර්මාන්ත හා වාණිජ කටයුතු

සවිමත් වාණිජමය පරිසරයක් මගින් ජාත්‍යන්තර තරඟකාරී දේශීය කර්මාන්ත අංශයක් ශ්‍රී ලංකාව තුළ ගොඩනැඟීම කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ දැක්ම වන අතර ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට දායක වන්නාවූද, ඉහළ එකතු කළ අගයක් සහිත නිෂ්පාදන බිහිකරන්නාවූද, සවිමත් වාණිජ අංශයකින් සමන්විතවූද, ධරණීය හා තරඟකාරිත්වයකින් හෙබි නිෂ්පාදන ආයතනයන්හි අභිවෘද්ධිය සඳහා හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම අමාත්‍යාංශයේ මෙහෙවර වේ. අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තු 7 ක් ව්‍යවස්ථාපිත මණ්ඩල /ආයතන 06 ක් හා රාජ්‍ය ව්‍යාපාර 12 ක් පවතී. මෙම අංශය සම්බන්ධයෙන් පහත සඳහන් විගණන නිරීක්ෂණයන් කරනු ලැබේ.

කර්මාන්තපුර ඉදිකිරීමේ ප්‍රමාණවත් ප්‍රගතිය අත්කර නොගැනීම

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රාදේශීය සංවර්ධන අංශය විසින් 2015 දෙසැම්බර් 31 දින වන විට දිවයින පුරා කර්මාන්තපුර 32 ක් ආරම්භ කර ඉන් 29 ක කර්මාන්ත ආරම්භ කර තිබුණි. එම කර්මාන්තපුරවල තවදුරටත් සම්පූර්ණ කළ යුතු ඉදිකිරීම් හා විවිධ සේවා සැපයීම් වෙනුවෙන් 2015 වර්ෂය සඳහා රු.මිලියන 460 ක ප්‍රතිපාදන සළසා තිබූ අතර එම ප්‍රතිපාදනවලින් රු.මිලියන 448 ක් උපයෝජනය කර තිබුණි. 2015 වර්ෂයේ ක්‍රියාකාරි සැළැස්මට අනුව කර්මාන්තපුර 07 ක් සඳහා රු.මිලියන 153.3 ක ප්‍රතිපාදන සළසා තිබුණි. නමුත් 2015 වර්ෂයේදී ඒවායේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. තවද 2015 වර්ෂය තුළදී අවසන් කිරීමට සැලසුම් කළ කර්මාන්තපුර 08 ක ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් මූලික ගෙවීම් ලෙස රු.මිලියන 102.71 ක්වූ ගෙවීම් හැර ප්‍රමාණවත් භෞතික ප්‍රගතියක් අත්කර ගෙන නොතිබුණි.

කර්මාන්තපුරවල ස්ථාපිත කර ඇති කර්මාන්ත ශාලාවල සේවයේ නියුතු සංඛ්‍යාව අඩුවීම

2015 දෙසැම්බර් 31 දිනට කර්මාන්තපුරවල ස්ථාපිතකර ඇති කර්මාන්ත ශාලාවල සේවයේ නියුතු සංඛ්‍යාව ඉකුත් වසර දෙකකට පමණ පෙර පැවති තත්ත්වය හා සැසැඳීමේදී සියයට 13 කින් පමණ අඩු වී තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට ස්ථාපිතකර ඇති කර්මාන්ත ගණන 312 ක් හා ඒවායේ සේවයේ නියුතු සංඛ්‍යාව 17,203 ක් විය. එකිනෙක කර්මාන්තය සැළකූ විට සේවක සංඛ්‍යාව 10 කටත් වඩා අඩු ප්‍රමාණයක් ඇති කර්මාන්ත සංඛ්‍යාව 50 ක් වී තිබුණි.

කර්මාන්ත අමාත්‍යාංශයේ සංවර්ධන අංශ මගින් දේශීය කර්මාන්ත ක්ෂේත්‍ර දිරිගැන්වීමේ හා පුහුණුව ලබාදීමේ ව්‍යාපෘතීන් සඳහා 2015 වර්ෂ ය සඳහා සංශෝධිත අයවැය ඇස්තමේන්තුව මගින් රු.මිලියන 74.1 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර රු.මිලියන 45.2 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. රබර් ආශ්‍රිත නිෂ්පාදනකරුවන්ගේ තොරතුරු පද්ධතියක් ඇතිකිරීම, ඉලෙක්ට්‍රොනික් හා විද්‍යුත් භාණ්ඩවල ගුණාත්මක තත්ත්වය ගොඩනැගීමේ අරමුණින් ජාත්‍යන්තර සහතික නිකුත් කිරීමේ වැඩපිළිවෙල හා හම් නිෂ්පාදන කර්මාන්ත සංකීර්ණයක් ඇතිකිරීම යන කටයුතු මීට ඇතුළත් විය.

දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයෙහි පර්යේෂණ හා සංවර්ධන කටයුතු වෙනුවෙන් අරමුදල් සැපයීමේ ව්‍යාපෘතියට රු.මිලියන 5 ක ප්‍රතිපාදන සළසා තිබුණත්, ඒ සඳහා ව්‍යාපෘති 2 ක් පමණක් තෝරාගෙන තිබුණි.

ඉතිරි සහල් තොග අලෙවි නොකිරීම

සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේදී ආනයනය කරන ලද සහල් අලෙවියෙන් රු. මිලියන 43.50 ක අලාභයක් සිදු වී තිබුණි. ඉතිරි සහල් තොගය සම්බන්ධව පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය විසින් නිකුත් කළ වාර්තාව අනුව මෙට්‍රික් ටොන් 2501.97 ක් මනුෂ්‍ය පරිභෝජනයට සුදුසු බවත්, මෙට්රික් ටොන් 39.71 ක් සත්ත්ව ආහාර සඳහා අලෙවි කිරීම සුදුසු බවත් නිර්දේශ කර තිබුණද 2016 ජූලි 15 දින වන විටත් එම සහල් අලෙවි කර නොතිබුණි.

හිඟ ගබඩා කුලී අය කර ගැනීමේ දුර්වලතා

ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව සතු ගබඩාවන් සහ නිවාස මනා උපයෝගීතාවයකට ලක් කිරීම සඳහා අතිරික්ත ගබඩා සහ නිවාස කුලියට දීමෙන් රාජ්‍ය ආදායමට දායකත්වයක් දැක්වීම ආහාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වී තිබුණි. දෙපාර්තමේන්තුව සතු ගබඩා 122 කින් ගබඩා 56 ක් මාසික කුලී පදනම මත රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත ලබා දී තිබුණු අතර කුලී මුදල් කාලීනව අයකර ගැනීමේ දුර්වලතාවයන් හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දින වන විට මෙම ගබඩාවලින් රු. මිලියන 77.03 ක් අයවීමට තිබුණි. එසේම දිගු කාලයක සිට කුලී ගෙවීම පැහැර හැර ඇති ගබඩා දෙපාර්තමේන්තුවට ආපසු පවරා ගැනීමට හෝ හිඟ කුලී මුදල් ඇතුළු කුලිය අයකර ගැනීමට හෝ දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. මෙයට අමතරව තක්සේරු වටිනාකම රු. මිලියන 7.33 ක් වූ දෙපාර්තමේන්තුව සතු ගබඩා 8 ක් සීමාසහිත ලංකා සතොස සමාගම වෙත ලබා දී තිබුණද, 2015 වර්ෂයේදී ඉන් කිසිදු කුලී ආදායමක් ලැබී නොතිබුණි.

අපනයන ආදායම අඩුවීම

අපනයන ඉපැයීම් උපරිම කිරීම හා ජාතික ආර්ථිකයට දායකත්වයක් සැපයීම සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද දේශීය හා විදේශීය වෙළඳ ප්‍රදර්ශන හා ප්‍රවර්ධන වැඩසටහන් වෙනුවෙන් 2015 වර්ෂයේදී රු.මිලියන 245.62 ක් හා ඉකුත් වර්ෂයේදී රු.මිලියන 300.28 ක් වැය කර තිබුණි. එසේ වුවද ඉහත වැඩසටහන් ක්‍රියාත්මක කළ කෘෂිකර්ම, ධීවර හා කර්මාන්ත ක්ෂේත්‍රයේ 2015 වර්ෂයේ සමස්ථ ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 5.75 කින් අඩු වී තිබුණි.

හඳුනාගෙන තිබුණු අපනයන ප්‍රවර්ධන වැඩසටහන් අසාර්ථකවීම

2015 වර්ෂය සඳහා ඒකාබද්ධ කෘෂි ආදර්ශ, කෘෂි කලාප හා කෘෂිකර්මය සම්බන්ධ වැඩසටහන්, අපනයන ප්‍රවර්ධන වැඩසටහන් ලෙස ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් හඳුනා ගෙන රු.මිලියන 13.28 ක් වූ අපනයන සංවර්ධන වියදම් කර තිබුණි. එවැනි වැඩසටහන්වල ඉලක්කගත අරමුණු සාක්ෂාත් කර ගැනීම පිළිබඳ ඇගයීම් හා සමාලෝචනය සඳහා වූ පසුවිපරම් කටයුතු කිරීම වෙනුවෙන් නිර්ණායක හා පිළිවෙත් සැලැසුම් කර ක්‍රියාත්මක කර නොතිබුණු හෙයින් එවැනි වැඩසටහන් අසාර්ථක වී තිබුණි.

සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ අලාභය

1949 අංක 47 දරන සමූපකාර තොග වෙළඳ සංස්ථාව පනත මඟින් සමූපකාර තොග වෙළඳ සංස්ථාව සංස්ථාපනය කර තිබුණු අතර පාරිභෝගිකයින්ගේ වඩාත්ම කැමති තේරීම බවට පත්වීම එහි දැක්ම වශයෙන් දක්වා තිබුණි. 2014 වර්ෂයේදී රු. මිලියන 21.39 ක් වූ මෙහෙයුම් ලාභය 2015 වර්ෂයේදී රු. මිලියන 198.48 ක මෙහෙයුම් අලාභයක් බවට පත්ව තිබුණි. මෙය සියයට 1027 ක පිරිහීමක් විය. සංස්ථාවේ 2014 වර්ෂයේ සමස්ත අලාභය රු. මිලියන 310.87 ක් වූ අතර 2015 දී මෙම අලාභය රු. මිලියන 541.09 ක් හෙවත් සියයට 74 කින් තවදුරටත් පිරිහීමට පත්ව තිබුණි. 2015 වර්ෂයේදී සංස්ථාව වී කෙටීමේ කටයුතු නවතා දැමීම මෙම පිරිහීම කෙරෙහි විශේෂයෙන් බලපා තිබුණි.

සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ හිමිකරු ප්‍රාග්ධනය ඛාදනය වීම

සංස්ථාව දිගින් දිගටම පාඩු ලැබීම නිසා හිමිකරු ප්‍රාග්ධනය ඛාදනය වී අධිතෝලන තත්ත්වයකට පත් වී තිබුණි. ශුද්ධ වත්කම් සෘණ අගයක් ගෙන තිබූ අතර එය 2013 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී සියයට 64 කින් වැඩි වී තිබුණි. 2014 වර්ෂයේදී වත්කම් ප්‍රත්‍යාගණනය කර ඇති බැවින් එහි ලාභය ගැලපීම මත ශුද්ධ වත්කම්වල සෘණ අගය අඩුවීම ඊට හේතු විය. 2015 වර්ෂයේදී සංස්ථාවේ ද්‍රවශීලතා අනුපාතය 0.32:01 ක් වී තිබුණි.

සමාගම් නියාමනය කිරීම

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව විසින් සීමිත සමාගම් නියාමනය කිරීම 2007 අංක 07 දරන
සමාගම් පනතෙන් නියම කර ඇති පරිදි විධිමත්ව සිදු කර නොතිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට සීමිත සමාගම්වලින් අයකර ගතයුතු 2008 වර්ෂයේ සිට පැවත එන එකතුව රු. මිලියන 628.24 ක හිඟ වාර්ෂික වාර්තා ආදායම් හා ලියාපදිංචි සමිතිවලින් අයකර ගත යුතු රු.මිලියන 11.72 ක ආදායම් පැවතුණු අතර ඒවා අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. රු. මිලියන 5 කට වැඩි සියළු පොදු කොන්ත්‍රාත් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරවීමට හා සියලුම පොදු සීමිත සමාගම්වල මූල්‍ය වාර්තා ලියාපදිංචි කරවීමට අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. ඊ සමාගම් ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 13.5 වැය කර ක්‍රියාත්මක කර තිබුණත්, එය අතර මඟ නවතා තිබුණි. සමාගම් අරමුදල සතු රු.මිලියන 90 ක් බුන්වත් සමාගමක ආයෝජනය කර තිබුණි.

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලාවල දුර්වලතා

ආයතනයේ පාඨමාලා සඳහා ජාතික මට්ටමේ වෘත්තීය සුදුසුකම් (NVQ) ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. 2009 අංක 12 දරන ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය ස්ථාපිත කරන ලද පනත ප්‍රකාර පේෂකර්ම හා ඇඟලුම් ක්ෂේත්‍රය පිළිබඳ උපාධි සහ පශ්චාත් උපාධි පිරිනැමීමට අවශ්‍ය වැඩ පිළිවෙලවල් සකස් කර නොතිබුණි.

චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව දීමනා ගෙවීම

1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2014 ජනවාරි 01 දිනැති අංක 1/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇගළුම් ආයතනයේ නිලධාරීන් වෙත ඉංජිනේරු දීමනා හා වෙනත් දීමනා වශයෙන් රු. මිලියන 4.84 ක් ගෙවා තිබුණි

වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර හා කාර්මික සැලැසුම් ලියාපදිංචි කිරීමේ ප්‍රමාදය

2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත යටතේ ස්ථාපිත කර තිබුණු ශ්‍රී ලංකා බුද්ධිමය දේපළ කාර්යාලය විසින් වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර හා කාර්මික සැලැසුම් ලියාපදිංචිය සඳහා වසරකට වඩා අධික කාලයක් ගතවී තිබුණි.

ගොඩනැගිල්ලක් වෙනුවෙන් වැය කළ මුදලක් ආපසු ලබා නොගැනීම

ශ්‍රී ලංකා බුද්ධිමය දේපළ කාර්යාලයේ අරමුදලින් රු. මිලියන 22.30 ක් වැයකරමින් වෙනත් රාජ්‍ය ආයතනයකට අයත් ඉඩමක ඉදිකරන ලද බුද්ධිමය දේපළ අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානය රජයේ තීරණයක් මත ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණි. 2015 අප්‍රේල් 23 දිනැති අමාත්‍ය මණ්ඩලයේ තීරණයක් අනුව එම වියදම් කළ මුදල නාගරික සංවර්ධන අධිකාරියෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුව තිබුණත්, එම තීරණය පරිදි 2015 දෙසැම්බර් 31 දින වන විටත් එම මුදල අයකර ගෙන නොතිබුණි.

පේෂකර්ම දෙපාර්තමේන්තුවේ අඩුපාඩු

දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටුවා ඇති පේෂකර්ම පුහුණු පාසල් 12 ක් හා මෝස්තර පුහුණු පාසල් 02 ක් සඳහා අඩු සිසුන් ප්‍රමාණයක් බඳවා ගැනීම සහ ඉන් පාඨමාලාව සම්පූර්ණ කරන සිසුන් ප්‍රමාණය අවම ප්‍රමාණයක්වීම, දෙපාර්තමේන්තුව සතුව ඇති ඉඩම්, ගොඩනැගිලි සහ කර්මාන්තශාලා දිගුකාලීන පදනම මත පෞද්ගලික අංශයට බදු දීමෙන් අයකර ගත යුතු රු. මිලියන 12.32 ක මුදල නිසි පරිදි අයකර නොගැනීම විගණනයේදී නිරීක්ෂණය විය.

නිවාස හා ඉදිකිරීම්

ශ්‍රී ලංකා ව්‍යවසායකයින්, වෘත්තීයවේදීන් හා ශ්‍රම බලකාය, හැකියාවන් හා සම්පත්වලින් සන්නද්ධ කරමින් සැලැසුම්ගත, පරිසර හිතකාමී හා ගුණාත්මක ඉදිකිරීම් කර්මාන්තයක් ඇති කිරීම හා ප්‍රජා සහභාගීත්වයෙන් මූලික පහසුකම් සහිත ජනාවාස බිහි කිරීමෙන් ආර්ථික සංවර්ධනයට දායක වීම නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ මෙහෙවර වේ. අමාත්‍යාංශය යටතේ, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, රජයේ කර්මාන්තශාලාව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය, සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය, රාජ්‍ය සංවර්ධන සහ නීතිගත සංස්ථාව, ඉදිකිරීම් සංවර්ධන අධිකාරිය, ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව හා ඕෂන්වීව් සංවර්ධන සමාගම යන ආයතන පැවතුණි.

රටේ සියළුම පවුල් සඳහා මූලික පහසුකම් සහිතව නිවාස ලබාදීම හා ඉදිකිරීම් කර්මාන්තය සඳහා උපදේශන හා නීතිමය සේවා ලබා දීම හා පුහුණු ශිල්පීන් ඇති කිරීම අමාත්‍යාංශයෙන් අපේක්ෂිත අරමුණ වී තිබුණි. මෙම මූලික අරමුණ ළඟා කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය හා ඒයටතේ වන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන විසින් කාර්යභාරයන් ඉටු කිරීමේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය

රාජ්‍ය ව්‍යවසායන්වල සම්පත් අවිධිමත් භාවිතය

පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ විධිවිධානවලට පටහැනිව අමාත්‍යාංශය යටතේ ඇති රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය සහ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය යන ආයතනවලින් වැටුප් ගෙවනු ලබන නිලධාරීන් 41 දෙනෙකු 2007 දෙසැම්බර් මාසයේ සිට 2015 දෙසැම්බර් මාසය දක්වා අමාත්‍යාංශයේ සේවයේ යොදවා ගෙන තිබුණි.

තලවකැලේ නිවාස යෝජනා ක්‍රමයේ භෞතික ප්‍රගතිය අඩුවීම

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන තලවකැලේ නිවාස යෝජනා ක්‍රමය සඳහා සංශෝධිත අයවැය ඇස්තමේන්තුවෙන් ලබා ගත් ප්‍රතිපාදනය රුපියල් මිලියන 46 ක් වූ අතර ඉදිකිරීමට ඉලක්කගත නිවාස සංඛ්‍යාව නිවාස 96 ක් විය. ප්‍රතිපාදිත මුදලින් රු.මිලියන 43 ක් හෙවත් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 93 ක් වියදම් කර තිබුණ ද, ඉදිකිරීම්වල භෞතික ප්‍රගතිය සියයට 30 ක් විය.

සුනාමි අවතැන් වූවන් 28 දෙනෙකුට නිවාස අයිතිය නොපැවරීම

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය යටතේ ක්‍රියාත්මකවන සුනාමි අවතැන් වූවන් 28 දෙනෙකුට නිවාස අයිතිය පැවරීම සඳහා වූ වැඩසටහන සඳහා අමාත්‍යාංශයෙන්

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය වෙත රුපියල් මිලියන 10 ක් ලබා දී තිබුණ ද, අදාළ කාර්යය 2015 වර්ෂය අවසාන වන විටත් ඉටුකර නොතිබුණි.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

ශ්‍රී ලංකාවේ නිවාස සංවර්ධන කටයුතු කර ගෙන යාම සඳහා 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනතින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ස්ථාපිත කර ඇත. මෙම අධිකාරිය එහි කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයට අමතරව දිස්ත්‍රික් කාර්යාල 25 ක් සහ නාගරික කාර්යාල 02 ක් මගින් දිවයින පුරා කටයුතු කරගෙන යනු ලැබේ.

ආදර්ශ ගම්මාන වැඩසටහන යටතේ නිවාස ඉදිකිරීම

අමාත්‍යාංශය යටතේ ඇති ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් මෙහෙයවනු ලබන ආදර්ශ ගම්මාන වැඩසටහනේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 240 ක් වූ අතර 2015 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 237.5 ක් වැය කර තිබුණි. වර්ෂයේ ඉලක්කගත නිවාස සංඛ්‍යාව 950 ක් වුවද, 2015 දෙසැම්බර් 31 දින වන විට නිවාස 101 ක් නිමකර තිබුණි. මෙය ඉලක්කගත නිවාස සංඛ්‍යාවෙන් සියයට 11 ක් වී තිබුණි.

වර්ෂය තුළ නිම කළ යුතු ඉලක්කගත නිවාස ප්‍රමාණයට ළඟා නොවීම

නිවාස සංවර්ධන අධිකාරියට අයත් දිවයින පුරා පිහිටි දිස්ත්‍රික් හා නාගරික කාර්යාලවල ප්‍රාදේශිය හා ග්‍රාමීය මට්ටමේ සිය සේවාවන් ඉටුකරන කාර්ය මණ්ඩලය දායක කර ගනිමින් 2015 වර්ෂය තුළ නිවාස ඒකක 101,797 ක් නිම කිරීමේ ඉලක්කය සපුරා ගැනිමට කටයුතු කර තිබුණත්, 2015 වර්ෂය අවසාන වන විට නිම කර තිබුණු නිවාස 78,426 ක් වි තිබුණි. ඒ අනුව වසර තුළ වැඩ අවසන් කළ නිවාස ප්‍රමාණය අපේක්ෂිත ඉලක්කයෙන් සියයට 77 ක් වී තිබුණි.

ජනසෙවන නිවාස දස ලක්ෂයේ වැඩ සටහන

- රාජ්‍ය සහ පෞද්ගලික දායකත්ව නිවාස ව්‍යාපෘතිය යටතේ නිවාස යෝජනා ක්‍රම 05 ක නිවාස ඒකක 679 ක් ඉදිකිරීමට සැලසුම් කළද 2015 වසර අවසානයට ඉන් කිසිඳු නිවාස ඒකකයක් ඉදිකර නොතිබුණි.
- සහශ්‍ර ලංකා නිවාස වැඩසටහන යටතේ නිවාස ඒකක 40 ක් අළුත්වැඩියා කිරීම ආරම්භ කිරීමට සැලැසුම් කර තිබුණද, 2015 වර්ෂය අවසානය වන විට නිවාස 20 ක පමණක් වැඩ ආරම්භ කර තිබුණි.
- පැරණි නිවාස ව්‍යාපෘතිවල නිවාස පිළිසකර කිරීම (උදාගමින් උදාගමට) යටතේ නිවාස 10,000 ක් පිළිසකර කිරීමට සැලැසුම්කර තිබුණද, කිසිඳු නිවසක් පිළිසකර නොකර රු.මිලියන 5 ක් වියදම් කර තිබුණි.
- නගමු පුරවර වැඩසටහන යටතේ නිවාස 6,349 ක් අළුත්වැඩියා කිරීම සඳහා සැලැසුම් කර තිබුණද, නිවාස 1,305 ක් පමණක් අළුත්වැඩියා කර තිබූ බැවින් එහි භෞතික ප්‍රගතිය සියයට 21 ක් වී තිබුණි.

- සෙවන සරණ නිවාස ක්‍රමය යටතේ නිවාස ඒකක 5,000 ක වැඩ ආරම්භ කිරීමට සැලැසුම් කර තිබුණද 2015 වර්ෂය අවසාන වන විට නිවාස ඒකක 885 ක් හෙවත් සියයට 17.7 ක වැඩ පමණක් ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ 2015 වර්ෂය තුළදී නිවාස ඒකක 1,700 ක වැඩ නිම කිරීමට සැලැසුම් කර තිබුණද, 2015 වර්ෂය අවසාන වන විට නිවාස ඒකක 316 ක එනම් සියයට 19 ක වැඩ පමණක් නිමකර තිබුණි.
- සෙවන විශේෂ ආධාර ක්‍රමය යටතේ නිවාස ඒකක 2,500 ක් සඳහා ආධාර කිරීමට සැලැසුම් කර තිබුණද, 2015 වර්ෂය අවසාන වන විට නිවාස ඒකක 08 ක් නොහොත් සියයට 0.32 කට පමණක් ආධාර කර තිබුණි.

ඉඩම් අත්පත් කර ගැනීමට විශාල කාල පමාවක් සිදුවී තිබීම

වන්දි ගෙවිය යුතු ඉඩම්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(ආ) වගන්තියට අනුව අධිකාරිය විසින් භුක්තිය භාරගෙන තිබුණු නමුත් ගැටළු සහගත තත්ත්වයන් මත ඇතැම් ඉඩම් අධිකාරියට පවරා ගැනීමට විශාල කාලයක් ගතවී තිබුණි. ඒ හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දින වන විට ගෙවිය යුතුව තිබුණු වන්දි මුදල රු.මිලියන 233 ක් වූ අතර, ඒ සඳහා ගෙවිය යුතු හිඟ පොලිය රු.මිලියන 47 ක් වී තිබුණි.

හිඟහිටි ණය අයකර ගැනීම දුර්වල වී තිබීම

2015 වර්ෂය අවසානයට මුළු ණයගැති ශේෂය රු.මිලියන 4,186 කින් වර්ෂ 05 කට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවැති ණය ශේෂ එකතුව රු.මිලියන 2,505 ක් හෙවත් මුළු ණයගැති වටිනාකමින් සියයට 60 ක් වී තිබුණි. මෙම හිඟ ණය මුදල් අයකර ගැනිම සඳහා අධිකාරිය ඇතැම් පියවර ගෙන තිබුණද අයවීම් ප්‍රගතිය ඉතා පහළ මට්ටමක පැවතුණි.

ප්‍රවාහනය

දියුණු වන මිනිස් අවශ්‍යතා හමුවේ තම රට තුළ පමණක් නොව විදේශීය රටවල් සමඟද ආර්ථික හා සමාජ සම්බන්ධතා වර්ධනය විය. ඒ අනුව ප්‍රවාහනයේ වැදගත්කම තවදුරටත් වර්ධනය වූ අතර අද වන විට ප්‍රවාහනය රටක ජීවනාලිය බවට පත්වී ඇත. සමාජීය, ආර්ථික සහ පාරිසරික ක්‍රියාකාරකම් හි සක්‍රීයත්වය, කාර්යක්ෂමතාවය, ඵලදායිතාව ප්‍රවාහන සේවාව මත රඳා පවතින අතර ලෝකයේ වටිනාම සම්පත වී ඇති මිනිස් සම්පතෙහි කාර්යක්ෂමතාවය, ඵලදායීතාව කෙරෙහි සෘජුවම බලපෑම් කරන ප්‍රධානතම සාධකය ප්‍රවාහනයයි.

ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය.

රටේ සිදුවන ආර්ථික සංවර්ධනය වෙනුවෙන් සුවපහසු කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් ජනතාව වෙත ලබාදීම තහවුරු කිරීම පෙරදැරි කරගෙන ප්‍රධාන අරමුණු 12 ක් ඉටුකිරීම සඳහා ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ජාතික ගමනා ගමන කොමිෂන් සභාව, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය, සීමාසහිත ගුවන්තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම, සිවිල් ගුවන්සේවා අධිකාරිය, සහ ලක්දිව ඉංජිනේරු ආයතනය ස්ථාපිත කර තිබුණි.

දුම්රිය මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘති

අත්පත් කරගත් ඉඩම් කැබලි සඳහා වන්දි ගෙවීම

මාතර බෙලිඅත්ත නව දුම්රිය මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘති යටතේ 2006 වර්ෂයේ සිට ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ආරම්භ කර තිබුණි. එසේ අත්පත් කර ගත් ඉඩම් කැබලි 267 ක් වෙනුවෙන් 2016 ජුනි මාසය වන විටත් වන්දි ගෙවා අවසන් කර නොතිබුණි.

වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් පියවීමේ ප්‍රමාදය

මාතර බෙලිඅත්ත නව දුම්රිය මාර්ග ඉදිරිකිරීම් වෙනුවෙන් කොන්ත්‍රාත්කරු වෙත 2013 ජුනි මාසයේදී රු.මිලියන 10,847 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවා තිබුණි. 2016 මාර්තු මාසය වන විට කොන්ත්‍රාත්කරුගෙන් රු. මිලියන 1,100 ක් හෙවත් මුළු අත්තිකාරම් මුදලින් සියයට 10 ක් පමණක් නැවත අයකර ගෙන තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය අවසන් කළ යුතු දිනය වන 2016 දෙසැම්බර් 24 දින වන විට තව දුරටත් අයකර ගත යුතු අත්තිකාරම් ශේෂය රු.මිලියන 9,747 ක් වී තිබුණි. මෙම ඉතිරි අත්තිකාරම් මුදල මුළු කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 37 ක් හෙවත් රු.මිලියන 13,367 ක වැඩ වටිනාකමෙන් අයකර ගත යුතුව තිබුණි.

දුම්රිය මාර්ග ව්‍යාපෘති 6 ක කටයුතු ආරම්භ නොකිරීම

දුම්රිය මාර්ග ව්‍යාපෘති 7 ක් නව දුම්රිය මාර්ග සංවර්ධන ව්‍යාපෘති ලෙස හඳුනාගෙන ඒ සඳහා

ඉකුත් වර්ෂ 4 ක කාලයක සිට ප්‍රතිපාදන සළසා තිබුණි. 2015 අයවැය ඇස්තමේන්තු මගින්ද මෙම ව්‍යාපෘති සඳහා රු.මිලියන 260 ක ප්‍රතිපාදන සළසා තිබුණි. එම ප්‍රතිපාදනවලින් මාතර බෙලිඅත්ත දුම්රිය මාර්ගය හැර ඉතිරි දුම්රිය මාර්ග 6 සඳහා සළසා තිබුණු රු.මිලියන 55 ක ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම නිසා එම මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

දුම්රිය ප්‍රවාහනය.

සමස්ථ මෝටර්රථ ප්‍රවාහනයෙන් දුම්රිය ප්‍රවාහන සේවය සඳහා දායකත්වය සියයට 4.3 ක් වී තිබුණි. 2015 වර්ෂයේ ධාවන කටයුතු සඳහා විවෘතව තිබූ දුම්රිය මාර්ග ජාලය කි.මී.1,567 ක් වී තිබුණි. 2014 වර්ෂයේදී කි.මී.1,449 ලෙස පැවති දුම්රිය ජාලය පලෙයි සිට කන්කසන්තුරෙයි දක්වා සහ මඩු සිට තලෙයි මන්නාරම දක්වා දුම්රිය මාර්ගය ඉදිකිරීම නිසා 2015 වර්ෂය වන විට දුම්රිය මාර්ග දුර කි.මී. 194 ක ප්‍රමාණයකින් වර්ධනය වී තිබුණි. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව දුම්රිය මාර්ග 14 ක දුම්රිය මාර්ග ධාවන කටයුතු සිදුකර තිබුණි. 2015 වර්ෂයේදී උප දුම්රිය ස්ථාන 10 ක්, ප්‍රධාන දුම්රිය ස්ථාන 9 ක් සහ නව දුම්රිය දුර මාර්ග කි.මී. 194 ක් දුම්රිය මාර්ග පද්ධතියට එකතු කර තිබුණි. 2015 වර්ෂයේදී ශ්‍රී ලංකා දුම්රිය සේවයේ මෙහෙයුම් අලාභය රු.මිලියන 7,713 ක් වී තිබුණි. 2011 වර්ෂයේදී මෙහෙයුම් අලාභය මුළු මෙහෙයුම් ආදායමෙන් සියයට 96 ක සිට එය 2015 වර්ෂය වන විට සියයට 121 ක් දක්වා වර්ධනය වී තිබුණි. විස්තර පහත සඳහන් 16 වගුවෙහි හා රූපසටහන 13 හි දැක්වේ.

විස්තරය	2011	2012	2013	2014	2015
	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන
මෙහෙයුම් ආදායම	4,236	4,852	5,425	5,910	6,335
මෙහෙයුම් වියදම	8,295	8,648	10,586	16,943	14,048
මෙහෙයුම් අලාභය	4,059	3,796	5,161	11,033	7,713
මෙහෙයුම් අලාභය මෙහෙයුම් අදායමේ ප්‍රතිශතයක් ලෙස	95.82	78.24	95.13	186.68	121.75

වගුව 16 - මෙහෙයුම් අලාභයේ වැඩිවීම
මූලාශ්‍රය : ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය - නිල වෙබ් අඩවි සංඛ්‍යාලේඛන



රූපසටහන 13 - මෙහෙයුම් අලාභයේ වැඩිවීම
මූලාශ්‍රය : ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය - නිල වෙබ් අඩවි සංඛ්‍යාලේඛන

හිඟහිටි ආදායම් අයකර ගැනීමේ අකාර්යක්ෂමතාවන්

දෙපාර්තමේන්තුවේ ආදායම් ගිණුම අනුව 2015 වර්ෂයේ හිගහිටි දුම්රිය බලපත්‍ර ආදායම රු.මිලියන 1,201 ක් ද, භාණ්ඩ ප්‍රවාහන ආදායම රු.මිලියන 101 ක් ද, සිමෙන්ති නිෂ්පාදන සමාගමකට හුණුගල් ප්‍රවාහන සේවා සැපයීම වෙනුවෙන් රු.මිලියන 29 ක් ද, දුම්රිය ස්ථානවලින් ලැබිය යුතු ආදායම රු.මිලියන 18 ක් ද, දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් බදු දීම වෙනුවෙන් රු.මිලියන 1,277 ක ආදායම් හිඟහිටව පැවැති නමුත් එම හිඟ හිටි ආදායම් අයකර ගැනීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් පියවරයන් ගෙන නොතිබුණි.

සුඛෝපභෝගී දුම්රිය මැදිරි බදුදීමෙන් ලබන ආදායම

පෞද්ගලික ආයතනයක් සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවේ සුඛෝපභෝගී දුම්රිය මැදිරි බදු දීම වෙනුවෙන් 2014 වර්ෂය අවසන් වන විටත් රු.මිලියන 37 ක් අයවිය යුතුව තිබූ අතර එම හිඟහිටි ආදායම් 2015 වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි. එමෙන්ම එම ආයතනයෙන් 2014 හා 2015 වර්ෂවල ලැබී තිබුණු රු.මිලියන 61 ක දුම්රිය ආදායම, රාජ්‍ය ආදායමට බැර නොකර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පොදු තැන්පත් ගිණුමේ රඳවා තබා ගෙන තිබුණි.

සැපයුම්කරුවන්ට ගෙවා තිබුණු අත්තිකාරම් පියවා නොතිබීම.

1980 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සැපයුම්කරුවන්ට ගෙවා තිබුණු අත්තිකාරම්වලින් රු.මිලියන 16 ක් 2015 වර්ෂය අවසාන වන විටත් පියවා නොතිබුණි.

ණයවර ලිපි විවෘත කර ඇණවුම් කළ භාණ්ඩ ගබඩාවට නොලැබීම

1998 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා කාලය තුළ ණයවර ලිපි විවෘත කර රු.මිලියන 36 ක් වටිනා භාණ්ඩ ඇණවුම් කර තිබුණත්, ඒ සඳහා වර්ෂ 7 ක සිට වර්ෂ 18 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයක් සිදු කර තිබුණත්, එම භාණ්ඩ 2015 දෙසැම්බර් 31 දින වන විටත් ගබඩාව වෙත ලැබී නොතිබුණි.

මාර්ග ප්‍රවාහනය

ශ්‍රී ලංකාවේ මුළු මාර්ග ජාලය කිලෝමීටර් 116,000 ක් පමණ වන අතර ඒවා ජාතික මාර්ග, පළාත්බද මාර්ග හා පළාත් පාලන අධිකාරියන්ට අයත් වර්ග නොකරන ලද මාර්ගවලින් සමන්විත වේ. මෙම මාර්ග පද්ධතිය තුළ පොදු මගී ප්‍රවාහන කටයුතු රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය මගින් සිදු කරනු ලබයි. මෙහිදී බස්රථ ධාවනය පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය වනුයේ ලේඛණගත මුළු ධාවන ගමන් වාරවලින් පෞද්ගලික අංශය විසින් සියයට 60 ක් ද රාජ්‍ය අංශය විසින් සියයට 40 ක් ද වශයෙන් ධාවනයේ යෙදවීමයි.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය.

මුළු මෝටර් රථ ප්‍රවාහනය සඳහා පවතින ඉල්ලුමෙන් සියයට 8.2 ක් රාජ්‍ය අංශයේ බස් ප්‍රවාහනය සඳහා හිමි වන අතර එය බස්රථ හා දුම්රිය ඇතුළත් මුළු පොදු ප්‍රවාහන සේවාවෙන් සියයට 16.6 ක් වේ. රාජ්‍ය අශයේ බස් ධාවකයා ලෙස ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (ශ්‍රීලංගම) කටයුතු කරනු ලබන අතර මෙම බස්රථ දිවයින පුරා දළ වශයෙන් මාර්ග 1500 ක පමණ ධාවනය කරනු ලැබේ.

කිලෝ මීටරයකින් ලද ආදායම පහළයාම

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2015 වර්ෂයේදී මුළු ආදායම රුපියල් බිලියන 35.82 ක් වූ අතර ඉකුත් වර්ෂයේ ආදායම රු.බිලියන 33.66 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ ආදායම රු.බිලියන 2.15 ක් හෙවත් සියයට 5.86 කින් වැඩි වී තිබුණි. එසේම 2015 වර්ෂයේ ධාවනය කළ කිලෝ මීටර් ප්‍රමාණය මිලියන 440.42 ක් වී තිබුණු අතර ඉකුත් වර්ෂයේදී එය මිලියන 371.23 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ ධාවනය කළ ප්‍රමාණය කිලෝ මීටර් මිලියන 69.19 කින් වැඩි වි තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ ආදායම හා ධාවනය කළ දුර ප්‍රමාණය වැඩි වීම හේතුවෙන් කිලෝ මීටරයක් ධාවනය කිරීමෙන් 2015 වර්ෂයේ ලද ආදායම රු.81.34 ක් වී තිබුණු අතර 2014 වර්ෂයේදී එය රු.90.68 ක් වී තිබුණිමෙ නිසා ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී කිලෝ මීටරයක් ධාවනය කිරීමෙන් ලද ආදායම රු.9.35 කින් අඩුවී තිබුණි. මෙම තත්ත්වය ඉකුත් වර්ෂ කිහිපයක් සමඟ සසඳා පහත සඳහන් රූපසටහන 14 නිරූපනය වේ.



රූපසටහන 14- කිලෝ මීටරයක් ධාවනය කිරීමෙන් උපයන ආදායම

මූලාශය :සැලැසුම් හා සංවර්ධන අංශය ශ්‍රීලංගම

මණ්ඩලයේ ශුද්ධ වත්කම් බාදනය වීම

මණ්ඩලය දිගින් දිගටම අලාභ ලැබීම් මත ශුද්ධ වත්කම් විශාල ලෙස බාදනයට ලක් වෙමින් පවතින අතර අවසන් වරට පිළියෙල කර විගණනයට ඉදිරිපත් කරන ලද 2012 වර්ෂයේ මූල්‍ය ප්රකාශන අනුව 2012 වර්ෂය අවසාන වනවිට මණ්ඩලයේ ශුද්ධ වත්කම් රු. මිලියන 25,538.5 ක සෘණ අගයක් ගෙන තිබුණි.

ජාතික ගමනාගමන කොමිෂන් සභාව

අන්තර් පළාත් බස්රථවල නියාමකයා මෙන්ම ජාතික මගී ප්‍රවාහන බස්රථ ප්‍රවාහනයේ නියාමකයා වන ජාතික ගමනාගමන කොමිෂන් සභාව, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත යටතේ ස්ථාපිත කර තිබුණි. පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ කර්තව්‍යයන් වනුයේ ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය කෙරෙහි අවධානය යොමු කරමින්

මගී ප්‍රවාහන බස් රථවලින් මගීන් ප්‍රවාහනය කිරීම හා අදාළ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධව රජයට උපදෙස් ලබාදීමය.

විධිමත් ක්‍රමවේදයන්ට පටහැනිව මාර්ග බලපත්‍ර නිකුත් කිරීම

1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ විධිවිධාන හා අමාත්‍ය මණ්ඩලයේ තීරණයන් අනුව තරඟකාරී ලංසු කැඳවීම මගින් කොමිෂන් සභාව විසින් මාර්ග බලපත්‍ර නිකුත් කිරීම කළ යුතු වුවත්, ඊට පටහැනිව බලපත්‍ර නිකුත් කළ අවස්ථා අනාවරණය විය.

ධාවනයට සුදුසු බව පරීක්ෂා නොකර බස්රථ ධාවනයෙන් ඉවත් කිරීම

පවතින බලපත්‍ර වාර්ෂිකව අළුත්කිරීමේදී අදාල බස් රථ ධාවනයට සුදුසු තත්ත්වයේ තිබේද යන්න පරීක්ෂා නොකර බස්රථ ධාවනයෙන් ඉවත් කර තිබුණි.

ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර කොමිෂන් සභාවෙන් මුදල් ලබා ගැනීම

සිසුසැරිය බස්රථ ධාවනය සඳහා වූ ගෙවීම් පරීක්ෂා කිරීමේ දී අනාවරණය වූ පරිදි එකම බස්රථයක් මාර්ග දෙකක සිසුසැරිය ධාවනය සඳහා යොදවන බව හඟවා පුද්ගලයින් දෙදෙනෙකුගේ නමින් රු.මිලියන 6.94 ක් ව්‍යාජ ලෙස කොමිෂන් සභාවෙන් ලබාගෙන තිබුණි. එම අවිධිමත් ගනුදෙනුව සඳහා සහාය දක්වා තිබූ කොමිෂන් සභාවේ සේවකයන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනිම හා වංචාවට අදාළ වු මුදල් අයකර ගැනීමට 2015 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

අන්තර් පළාත් බස්රථ අධීක්ෂණය කිරිමේ දුර්වලතාවය

අන්තර් පළාත් බස්රථවල ජීපීආර්එස් උපකරණ සවිකිරීම මගින් චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ සෘජුවම අධීක්ෂණයට ලක් කිරීමට හැකියාව තිබුණි. නමුත් 2015 දෙසැම්බර් 31 දින වන විට බස්රථ 2095 කට මෙම උපකරණ සවිකිරීම සඳහා රු.මිලියන 79.06 ක් වැයකර තිබුණි. නිසි කළමනාකාරිත්වයකින් යුතුව මෙම උපකරණ නඩත්තු නොකිරීම නිසා 2015 දෙසැම්බර් 31 දින වන විට සියළුම උපකරණ අක්‍රියව පැවතුණි. 2016 ජූනි මාසය වන විට එම උපකරණ 800 ක් පමණක් යථා තත්ත්වයට පත් කර ගෙන තිබුණි. එමෙන්ම මෙම උපකරණ මගින් අධීක්ෂණ කටයුතු කිරීම සඳහා රු.මිලියන 20.29 ක් වැය කර නව පාලන මැදිරියක් සඳහා අවශ්‍ය ගොඩනැගිල්ලක් නවීකරණය කරගෙන තිබුණි. මෙම තත්ත්වය නිසා පාලන මැදිරියට අවශ්‍ය අනෙකුත් උපකරණ සවිකර ක්‍රියාත්මක කිරීමට නොහැකිවී තිබුණි.

බස් පර්යන්ත ඉදිකර ජනතා අයිතියට පත්කිරිම මන්දගාමී වි තිබීම.

ප්‍රධාන නගරවල බස් පර්යන්ත ඉදිකර ජනතා අයිතියට පත් කිරීම කොමිෂන් සභාවේ සේවාවක් වූ අතර 2015 වර්ෂයේදී වවුනියාව, තලවාකැලේ, මැදගම, කින්නියා හා වතුමුල්ල යන ස්ථානවල බස් පර්යන්ත ඉදිකර අවසන් කිරීමට සැලැසුම් කර තිබුණද , වවුනියාව පළමු අදියර හා තවත් බස් පර්යන්ත 02 ක් පමණක් ඉදිකර අවසන් කර තිබුණි. වවුනියාව දෙවන අදියර හා තවත් බස් පර්යන්ත 02 ක් ඉදිවෙමින් පැවතුණි.

සීසීටීවී කැමරා පද්ධතිය සම්පූර්ණයෙන් අක්‍රීය වී තිබීම

කොළඹ බැස්ටියන් මාවතේ පිහිටි ප්‍රධාන බස් නැවතුම්පල ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ පාලනය හා අධීක්ෂණය යටතේ පවතින අතර සභාපතිවරයාට හා බස්නැවතුම්පල කළමනාකරු හට තම කාර්යාලයේ සිටම අධීක්ෂණය කළ හැකි වන පරිදි සීසීටීවී කැමරා පද්ධතියක් රු.470,250 ක මුදලක් වැයකර ස්ථාපනය කර තිබුණද දැනට සම්පූර්ණ පද්ධතියම අක්‍රීයව පැවතුණි. එසේ වුවද අන්තර්ජාල පහසුකම් වෙනුවෙන් මාසිකව රු.61,862ක් බැගින් අඛණ්ඩව ගෙවමින් පැවතුණි.

අන්තර් පළාත් ධාවන කාලසටහන ඇතුළත් එල්ඊඩී පුවරු අක්‍රීය වී තිබීම

අන්තර් පළාත් බස්රථ ධාවන කාලසටහන පිළිබඳ මගීන් දැනුවත් කිරීමේ අරමුණ ඇතිව රු. මිලියන 62.42 ක් වැයකර කොළඹ බැස්ටියන් මාවත ප්‍රධාන බස් නැවතුම්පල ඇතුළුව ප්‍රධාන බස් නැවතුම්පලවල් 7 ක විශාල ප්‍රමාණයේ එල්ඊඩී කාල සටහන් පුවරු සවිකර තිබූ අතර 2015 දෙසැම්බර් 31 දින වන විට එම සියළුම පුවරු අක්‍රීයව පැවැති අතර ඒවා යථා තත්ත්වයට පත්කිරීමට කටයුතු කර නොතිබුණි.

දුර බස් ගමන් සේවා මගීන්ට අවශ්‍ය කෙටි විවේක ස්ථාන ඇති නොකිරීම

දුර බස් ගමන් සේවා මගීන්ට අවශ්‍ය කෙටි විවේක ස්ථාන ඇති කිරීම කොමිෂන් සභාවේ තවත් එක් කාර්යයක් වන අතර 2015 වර්ෂයේ එවැනි ස්ථාන 05 ක් ඇති කිරීමට සැලැසුම් කර තිබුණද, වර්ෂය තුළදී එවැනි ස්ථාන කිසිවක් ඇතිකර නොතිබුණි.

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය

ශ්‍රී ලංකාවේ මාර්ග අනතුරුවලින් මිය යන හා තුවාල ලබන පුද්ගලයින් සංඛ්‍යාව අඛණ්ඩව ඉහළ යමින් පවතින අතර මේ අතරින් මාර්ග අනතුරුවලින් තුවාල ලබන හා මියයන පදිකයින්ද විශේෂ තැනක් ගනී. එබැවින් මාර්ග අනතුරු අවම කිරීම මෙන්ම අනතුරට භාජනය වන පුද්ගලයින් හා ඒ සඳහා වැරදි කරුවන් වන පුද්ගලයින්ද අඩු කිරීමට ප්‍රයත්න දැරීම අත්‍යාවශ්‍ය කරුණක් වී ඇත. මෙම අනතුරු අඩු කිරීම සඳහා රියදුරන්ගේ පැත්තෙන් දායකවීම සඳහා ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය පිහිටුවා තිබුණි. ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය මගින් 2014 වර්ෂයේදී සිදු කරනු ලැබූ වෛද්‍ය පරීක්ෂණ සංඛ්‍යාව 548,758 ක් වූ අතර මෙය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 46.6 ක වර්ධනයකි. මෙම පරීක්ෂණවලදී හඳුනාගත් රෝගාබාධ සහිත රියදුරු බලපත් අයදුම්කරුවන් සංඛ්‍යාව 40,951 කි. මෙය මුළු වෛද්‍ය පරීක්ෂණ වලින් සියයට 7.46 ක ප්‍රමාණයකි. 2014 වර්ෂයේදී මාර්ග අනතුරු 39,969 කින් පුද්ගලයන් 2,440 ක් මිය ගිය අතර තවත් පුද්ගලයින් 19,855 ක් තුවාල ලබා තිබුණි. ඊට සාපේක්ෂව 2015 වර්ෂයේදී මාර්ග අනතුරු 36,916ක් සිදු වී තිබුණු අතර එයින් පුද්ගලයින් 2,801ක් මිය ගිය අතර තවත් පුද්ගලයින් 20,814 තුවාල ලබා තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී මාර්ග අනතුරු949 සිදු වී තිබීම නිසා අපේක්ෂිත අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය අඩු වී තිබුණි.

මාර්ග ආරක්ෂාව පිළිබද ජාතික සභාව

1998 අංක 05 දරන මෝටර් වාහන සංශෝධන පනතෙහි 213(අ) වගන්තිය ප්‍රකාරව 2005 අප්‍රේල් මාසයේදී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පල කරන ලද නියෝගයක් මගින් මෙම සභාව ස්ථාපනය කර 21 ඊ (ආ) වගන්තිය මගින් මාර්ග ආරක්ෂක අරමුදල පිහිටුවා තිබුණි. ශ්‍රී ලංකාවේ ස්ථාපිත රක්ෂණ සමාගම් සිය තෙවන පාර්ශවීය රක්ෂණ ආදායමෙන් සියයට 1 ක වාර්ෂික දායකයක් සභාවේ අරමුදලට බැර කරනු ලැබේ.

ව්‍යවස්ථාපිත ආයතනයක් වශයෙන් ස්ථාපිත කිරිමට කටයුතු නොකිරීම

මාර්ග ආරක්ෂාව පිළිබද ජාතික සභාව වෙනුවට එහි සංයුතිය, ව්‍යුහය, කාර්යභාරය ඇතුළත් නව පනතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ඇතුළුව කරුණු 4 ක් සදහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් 2010 අගෝස්තු මාසයේදී ඉදිරිපත් කර ඒ සදහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි. එම අනුමැතිය ලැබී වසර 05 කට ආසන්න කාලයක් ගත වී තිබුණත්, ව්‍යවස්ථාපිත ආයතනයක් වශයෙන් මෙම සභාව ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි

හදුනා නොගත් වාහන මගින් සිදු වු අනතුරු ගණන තහවුරු කර නොතිබීම

2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වාර්තා වු බරපතල අනතුරු 56,392 කින් හදුනා නොගත් වාහන මගින් සිදු වු අනතුරු කොපමණ ද යන්න තහවුරු කර නොතිබුණි. පසුගිය වර්ෂ 6 ක කාල සීමාව තුළ වන්දි ගෙවීම් අයදුම්පත් 217 ක් ලැබී තිබුණු අතර ඉන් රු.මිලියන 13.3 ක් වන්දි වශයෙන් ගෙවා තිබුණි.

සභාව පිහිටුවීමේ අරමුණු ප්‍රමාණවත් පරිදි ඉටු නොකිරිම

සභාව පිහිටුවීමේ ප්‍රධාන කාර්යයන් 11 ක් නිශ්චිතව හඳුන්වා දී තිබුණද, සභාව ආරම්භ කර වසර 10 කට ආසන්න කාලයක් ගත වී තිබුණත්, මෙම කාර්යයන්වලින් කාර්යයන් 02 ක් කෙරෙහි පමණක් අවධානය යොමු කර තිබුණි. අනෙකුත් කාර්යයන් දීර්සකාලීන සැලැසුමකට හෝ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මකට ඇතුළත් කර ක්‍රියාත්මක කිරීමකට සැලැසුම් කර නොතිබුණි.

තරුණ කටයුතු

දැනුමෙන් හා කුසලතාවයෙන් පරිපූර්ණ, දේශීයත්වය ගරු කරන ජාත්‍යන්තරය ජය ගත හැකි, විනය ගරුක ශ්‍රී ලාංකේය තරුණ පරපුරක් බිහි කිරීමේ මෙහෙවර පෙරදැරි කරගෙන තරුණ සංවර්ධනයට අදාලව ප්‍රධාන අරමුණු 14 ක් යටතේ ජාතික තරුණ සේවා සභාව ක්‍රියාත්මක වේ. මෙම ජාතික මෙහෙවර වෙනුවෙන් 2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් රු.මිලියන 1,082.22 ක්ද, විදේශ සංවිධානවලින් රු. මිලියන 31.44 ක් ද අමාත්‍යාංශය හා වෙනත් රාජ්‍ය ආයතන ලැබීම් රු. මිලියන 204.61 ලෙස එකතුව රු. මිලියන 1,318.27 ක් ද ලැබී තිබුණි. වර්ෂයේ අභ්‍යන්තර ඉපයීම් රු.මිලියන 170.45 ක් ද ඇතුළුව මුළු ආදායම රු. මිලියන 1,488.72 ක් වී තිබුණි. ඊට සාපේක්ෂව වර්ෂයේ මුළු වියදම රු. මිලියන 1,617.14 ක් වී තිබුණි. උක්ත අරමුණු පෙරදැරි කරගනිමින් තරුණ සංවර්ධනයට අදාල විවිධ වැඩසටහන් 2015 වර්ෂයේදි ක්‍රියාත්මක කර තිබුණි. 2015 වර්ෂයේ විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

සැලැසුම් කළ වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීම.

1979 අංක 69 දරන ජාතික තරුණ සේවා පනතේ 4 වන වගන්තියේ සඳහන්ව ඇති ප්‍රධාන අරමුණු 03 ක් ඉටු කිරීම සඳහා වැඩසටහන් 6 ක් සැලැසුම් කර 2015 වර්ෂයේදි ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 141 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, එම වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ සංවර්ධනය කෙරෙහි අවදානය අඩුවීම.

2015 වර්ෂයේදී සභාව විසින් පුහුණු මධ්‍යස්ථාන 46 ක පුහුණු පාඨමාලා 519 ක සිසුන් 14,511 ක් පුහුණුව ලබා තිබුණු අතර එම පුහුණු මධ්‍යස්ථානවල පවත්වා තිබුණු කෙටිකාලීන පාඨමාලා 262 කට සහභාගී වි තිබුණු 5,984 ක සිසුන් ප්‍රමාණයද ඒ තුළ විය. වර්තමාන තරුණ පරපුර මුහුණ දෙන විරැකියා ප්‍රශ්නයට විසඳුමක් ලෙස දේශීයව හා විදේශීයව පවතින රැකියා අවස්ථාවන්ට ගැලපෙන පරිදි ගුණාත්මක වෘත්තීය පුහුණුවක් ලබාදීමට සභාව විසින් 2015 වර්ෂය අවසන් වන විටත් අවශ්‍ය පියවර ගෙන නොතිබුණු බව පහත සඳහන් කරුණු අනුව නිරීක්ෂණය විය.

- සමාලෝචිත වර්ෂයේදී පවත්වන ලද පාඨමාලා 519 කින් පාඨමාලා 439 ක් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහිත පාඨමාලා වී නොතිබුණි. එමෙන්ම සිසුන් 2,267 ක් සහභාගී වී තිබුණු පාඨමාලා 75 ක් භාෂා පුහුණු පාඨමාලා වී තිබුණි.

- පාඨමාලා ක්‍රියාත්මක කරන උපදේශකයින් 72 ක් පමණක් ස්ථිර උපදේශකයන් වූ අතර බාහිර උපදේශකයින් 279 ක් වී තිබුණි. බාහිර උපදේශකයන් බඳවාගැනීමට විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

- සභාව සතු ගොවිපල 14 කින් ගෙවිපල 5 ක කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අයත් පුහුණු පාඨමාලා 05 ක් පමණක් පවත්වා තිබුණි.
- පුහුණු වැඩසටහන් සඳහා ගාස්තු අයකිරීමට අදාළව විධිමත් පදනමක් හා ක්‍රමවේදයක් නොතිබුණු අතර එකම පාඨමාලාව සඳහා විවිධ මධ්‍යස්ථානවල විවිධ ගාස්තු අය කර තිබුණි.

- පුහුණු මධ්‍යස්ථානවල අළුතින් පාඨමාලා ආරම්භ කිරීම සඳහා අනුමත මධ්‍යගත වැඩපිළිවෙළක් නොතිබුණි.

- පාඨමාලා අවසන් කරන සිසුන් රැකියාගත කිරීමේ වැඩපිළිවෙළක්ද ඒ පිළිබඳ පසු විපරම් කිරිමක්ද කර නොතිබුණි.

ගොවිපල සංවර්ධන කටයුතු විධිමත්ව සිදු නොවීම.

ජාතික තරුණ සේවා සභාව සතුව ප්‍රදේශ 14 ක අක්කර 290 ක පමණ කෘෂිකාර්මික ඉඩම්වලින් 2015 දෙසැම්බර් 31 දින වන විට අක්කර 134 ක පමණ ස්ථිර භෝග මෙන්ම එළවලු හා පලතුරු වගාකර තිබුණි. ගොවිපල 04 ක සත්ත්ව පාලනය සුළු වශයෙන් සිදු කර තිබුණි. ගොවිපොල කාරක ගිණුම අනුව වර්ෂයේ වියදම රු.මිලියන 13.05 ක් ද, ආදායම රු.මිලියන 12.59 ක් වී තිබුණි. ඒ අනුව 2015 වර්ෂයේ ගොවිපල අංශයේ සමස්ථ පාඩුව රු.මිලියන 0.46 ක් වී තිබුණි. රටේ අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි කෘෂිකාර්මික ක්ෂේත්‍රයට තරුණ තරුණියන් ආකර්ෂණය කරගැනීමට සහ ආයතනයට හා රටට වැය බරක් නොවී ඵලදායී ලෙස ගොවිපල පවත්වාගෙන යාමට සභාව අපොහොසත් වීමට පහත සඳහන් මූල්‍ය හා පරිපාලන දුර්වලතා හේතු වි තිබුණු බව නිරීක්ෂණය විය.

- 2015 වර්ෂයේ ගොවිපල සංවර්ධන කටයුතු සඳහා සලසා තිබුණු රු.මිලියන 17.5 ක ප්‍රතිපාදනයෙන් සියයට 74 ක් එනම් රු. මිලියන 12.95 ක් අදාල සංවර්ධන කටයුතු සිදු නොකිරිම නිසා වගා කළ හැකි භූමි ප්‍රමාණයෙන් සියයට 54 ක් පමණ වල් බිහි වී තිබුණි.

- ගොවිපල සංවර්ධනයට අදාලව කෙටිකාලීන හා දිගුකාලීන සැලැසුම් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

- ගොවිපල ආශ්‍රිතව සේවය කරන කාර්ය මණ්ඩලයේ ආකල්ප සංවර්ධනයට හා දිරිගැන්වීමට වැඩ පිළිවෙළක් නොතිබුණි.

- ගොවිපල ආශ්‍රිතව මූල්‍ය විනයක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රම ක්‍රියාත්මක කර නොතිබුණි.

- ගොවිපල ආශ්‍රිත කටයුතු පිළිබඳ නිසි අධීක්ෂණයක් ඉහළ කළමනාකරණය විසින් සිදු කර නොතිබුණි.
- .ගොවිපල නිෂ්පාදන තත්ත්වය හා ප්‍රමාණය ඉහළ නැංවීම සඳහා කෘෂි ක්ෂේත්‍ර නිලධාරී සේවය නිසි පරිදි ලබා ගෙන නොතිබුණි.

වොලිබෝල් හා කබඩි ක්‍රීඩා සංචිතය

තරුණයන් අතර ශාරීරික ප්‍රාගුණ්‍ය සහ ක්‍රීඩා සංවර්ධනය සඳහා දිරිගැන්වීමේ අරමුණෙන් වසර 4 ක නේවාසික පුහුණුවක් මත වොලිබෝල් හා කබඩි ක්‍රීඩා සංචිතයක් ආරම්භ කර තිබුණි. 2015 වර්ෂය නිම වන විට

පුහුණුව ලබමින් සිටි සංඛ්‍යාව 28 දෙනෙකු වී තිබුණි. සිසුන්ගේ ආහාර හා නේවාසික පහසුකම් වෙනුවෙන් 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වර්ෂ 3 ක කාලය තුළදී එකතුව රු.මිලියන 28.26 ක් වැය කර තිබුණි. එම වර්ෂවල සංචිතය සඳහා බඳවාගත් තරුණ තරුණියන්ගෙන් 24 ක් සංචිතය හැරයාම, ජාතික මට්ටමේ තරඟ සඳහා මෙම කණ්ඩායම සහභාගී කර ජයග්‍රහණ ලබා නොතිබීම, ජාතික සංචිතය සඳහා මෙම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අවස්ථාව නොලැබීම හා විදේශ පුහුණු සහ ක්‍රීඩා තරඟ සඳහා සහභාගී වීමේ අවස්ථා නොලැබීම යන කරුණු අනුව එම පුහුණුව සඳහා යොමුවන තරුණ තරුණියන්ගේ ක්‍රීඩා කුසලතා උපරිම අයුරින් වැඩි දියුණු කර ජාතික හා ජාත්‍යන්තර ජයග්‍රහණ දක්වා යොමු කිරීමට සැලසුම්ගත වැඩ පිළිවෙළක් නොතිබුණු බව තහවුරු විය.

යොවුන් පාර්ලිමේන්තුව වැඩසටහන

සමාජයේ ප්‍රජාතාන්ත්‍රීය රාමුවට තරුණ පරපුර අනුගත කිරීමේ අරමුණෙන් 2010 වර්ෂයේ ආරම්භ කරන ලද යොවුන් පාර්ලිමේන්තු වැඩසටහන සඳහා 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වර්ෂවල එකතුව රු.මිලියන 153.56 ක් හා 2015 වර්ෂයේදී රු.මිලියන 23.86 ක් වැයකර තිබුණි. මූල්‍ය ප්‍රකාශන අනුව 2015 වර්ෂය සඳහා එම අරමුණ වෙනුවෙන් සිදු කර තිබුණු වියදමෙන් සියයට 98 ක් හෙවත් රු.මිලියන 23.62 ක් 2015 වර්ෂයේ යොවුන් පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීම සඳහා වැයකර තිබුණි. නමුත් මැතිවරණය සඳහා කර තිබුණු වියදමට සාපේක්ෂව ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව වූ 340,463 කින් සියයට 17 ක් එනම් 57,621 ක් පමණක් ඡන්දය ප්‍රකාශ කර තිබීමෙන් අපේක්ෂිත තරුණයන්ගේ සහභාගීත්වය ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

අරමුණට පටහැනි ගනුදෙනු

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මොබිටෙල් පෞද්ගලික සමාගම, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හා ජාතික තරුණ සේවා සභාව එක්ව ඇතිකරගත් අවබෝධතා ගිවිසුමක් මත මොබිටෙල් M – CASH සේවාව මඟින් විශ්‍රාම වැටුප් ලබාගැනීමේ වැඩසටහනක් ආරම්භ කර තිබුණි. වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික තරුණ සේවා සභාව මඟින් ජංගම දුරකථන බෙදාහැරීමට එකඟතාවයකට පැමිණ තිබුණි. 2015 පෙබරවාරි 05 වන විට ජංගම දුරකථන 9600 ක් සභාවට ලැබී තිබුණු අතර 2016 අප්‍රේල් 20 දින වන විට ඉන් 4633 ක් බෙදාහැර තිබුණි. ගිවිසුම් ප්‍රකාරව බෙදාහරින ලද දුරකථන සඳහා එකකට රු. 200 ක් බැගින් රු. 926,600 ක මුදලක් සභාවට ලැබිය යුතුව තිබුණද, එම මුදල සභාවට ලැබී නොතිබුණි. තවද සභාව වෙත ලබාදුන් දුරකථන එම සමාගමට නැවත භාරදී නොමැති බවත්, ඒ අනුව ගිවිසුම් කඩකිරීමක් සිදුකර ඇති බවත් අදාල දුරකථන සමාගම විසින් සභාව වෙත දන්වා තිබුණි.

සීමාසහිත තරුණ සේවා සමාගමෙහි ආයෝජනය සඳහා ප්‍රතිලාභ නොලැබීම

ජාතික තරුණ සේවා සභාවේ සියයට 98 ක කොටස් හිමිකාරත්වයක් ඇතිව 1981 වර්ෂයේ ආරම්භ කරන ලද, පාලිත සමාගමක් වන සීමාසහිත තරුණ සේවා සමාගමේ ආයෝජනය කරන ලද රු.මිලියන 1.8 ක ආයෝජනවලට අදාළ කිසිදු ප්‍රතිලාභයක් 2015 වර්ෂයේදීද සභාව වෙත ලැබී

නොතිබුණි. එමෙන්ම ඊට අදාල ඒකාබද්ධ මූලාා ප්‍රකාශන සමාගම ආරම්භයේ සිටම පිළියෙළ කර නොතිබුණි. සමාගමෙහි පරිපාලන කටයුතු මෙන්ම ව්‍යාපාරික ස්ථානද සභාවෙහි ප්‍රධාන කාර්යාලය පිහිටි භූමියෙහි සභාවට අයත් ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන අතර එසේ භාවිතා කරන වත්කම් තක්සේරු කර ඊට අදාල බිම් කුලී හා විදුලිය, ජලය ඇතුළු යටිතල පහසුකම් පරිභෝජනය වෙනුවෙන් අයකිරීමක් සභාව විසින් සිදු කර නොතිබුණි.

සමාජ සේවා හා සමාජ සවිබල ගැන්වීම

සමාජ සේවා හා සමාජ සවිබල ගැන්වීමේ කාර්ය භාරයන් ඉටු කිරිම අමාත්‍යාංශය, ඒ යටතේ වන දෙපාර්තමේන්තු දෙකකින් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 05 කින් අපේක්ෂා කර තිබුණි. එම ආයතන මගින් පහත සඳහන් කාර්යයන් ඉටු කළ යුතු විය.
සමාජ සවිබල ගැන්විම හා සුභසාධනයට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරිම, වැඩිහිටියන් රැකබලා ගැනිම හා ආරක්ෂණය, විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ දුබලතාවයන් හඳුනා ගැනිම සහ පුනරුත්ථාපනය සිදු කිරිම, දිවි නැගුම වැඩසටහන ක්‍රියාත්මක කරමින් ග්‍රාමීය හා ප්‍රාදේශිය ආර්ථික සංවර්ධනය කිරිම, මහජන ආධාර යෝජනා ක්‍රමය සමාලෝචනය කිරීම, ප්‍රතිසංවිධානය හා උචිත නව ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම, ක්ෂය රෝගීන්ට, වකුගඩු රෝගින්ට, ලාදුරු රෝගීන්ට, පිළිකා, තැලසීමියා රෝගීන්ට සහ ඔවුන්ගේ යැපෙන්නන්ට ආධාර ලබාදීම, උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම, ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීමට හා රැකියා අවස්ථා ඇති කරලීමට අවශ්‍ය ක්‍රමෝපායන් සැලසීම හා සමාජ රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරිම යන කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබුණි.

එම කාර්යභාරයන් ඉටු කළ පසු ග්‍රාමීය ප්‍රජාව හා අවධානම් සහිත කණ්ඩායම් සවිබල ගැන්වීම හා ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම මගින් සෞභාග්‍යය කරා යොමු කිරීම අමාත්‍යාංශයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි.

වැඩිහිටි නිවාස පිළිබඳ සුපරීක්ෂණය දුර්වල වී තිබීම

2015 වර්ෂයේ වැඩි හිටි නිවාස 87 ක් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව යටතේ ලියාපදිංචි කර තිබුණි. එම වැඩිහිටි නිවාසවලින් 72 ක් පිළිබඳව සුපරීක්ෂණයක් සභාව විසින් සිදු කර නොතිබුණි.

සංශෝධිත සැලැස්ම පාදක කරගෙන අධ්‍යාපන ආධාර ලබාදීම වැඩිකර නොතිබීම

2015 වර්ෂයේදී සංශෝධිත සැලැස්මක් මගින් අධ්‍යාපන ආධාර ප්‍රමාණය රු.මිලියන 1.2 ක සිට රු.මිලියන 8.8 ක් දක්වා වැඩි කර තිබුණත්, සභාව විසින් එම වැඩිවීම කෙරෙහි අවධානය යොමු නොකර අධ්‍යාපන ආධාර ගෙවා තිබුණි. ඒ අනුව 2015 වර්ෂයේදී ගෙවිය හැකිව තිබුණු රු.මිලියන 8.8 ක ආධාර ප්‍රමාණයකින් රු.මිලියන 1.8 ක අධ්‍යාපන ආධාර ගෙවා තිබුණි.

ශ්‍රී ලංකා පවුල් ප්‍රතිපත්ති පිළිබඳ මාර්ගෝපදේශ නිම කර නොතිබීම

2012 පෙබරවාරි 22 දින අමාත්‍ය මණ්ඩල තීරණයකින් ශ්‍රී ලංකාවේ පවුල් ප්‍රතිපත්ති පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයක් පිළියෙල කිරිමට අනුමැතිය ලබා දී තිබුණත්, 2015 දෙසැම්බර් 31 දින වන විටත් එම සංග්‍රහය පිළියෙල කර නොතිබුණි. 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළ මේ සඳහා රු.මිලියන 1.09 ක් වැය කර තිබුණි.

තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතනයේ නේවාසිකාගාර ඉදිකර නිම කිරීම

ආබාධ සහිත තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව නේවාසිකව ලබාදීමේ අරමුණ යටතේ සමාජ සේවා දෙපාර්තමේන්තුව හම්බන්තොට දිස්ත්‍රික්කයේ පවත්වා ගෙන යනු ලබන තෙළඹුයාය පුහුණු ආයතනයේ නේවාසිකාගාර දෙකක් (පිරිමි හා ගැහැණු) ඉදිකිරිමට කටයුතු කර තිබුණි. මේ සඳහා 2013 දෙසැම්බර් 13 දින සමාජ සේවා අමාත්‍යාංශය විසින් දකුණු පළාත් ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාලය වෙත රු.මිලියන 174.82 ක වටිනාකමකට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. එම කොන්ත්‍රාත්තුව 2015 මැයි 08 දින නිම කළ යුතුව තිබුණි. නමුත් 2015 වර්ෂය අවසාන වන විට ඉදිකිරීම සඳහා රු.මිලියන 50.2 ක් වැය කර තිබුණත්, ඉදිකිරීම් නිම කර නොතිබුණි. එදින වන විට කොන්ත්‍රාත්තුවේ කාලය දීර්ඝ කර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

දිරිසවිය ව්‍යාපෘතිය කාර්යක්ෂමව හා ඵලදායි ලෙස නිම නොකිරීම

ආබාධිතයන්ට මාසිකව රු.3,000 ක මූල්‍යාධාර ගෙවීම හා වෘත්තීය පුහුණුව ලබාදීම වෙනුවෙන් ලෝක බැංකුව හා සමාජ සේවා අමාත්‍යාංශය අතර 2013 වර්ෂයේදී ඇති කර ගත් දිවිසවිය ව්‍යාපෘති ගිවිසුම අනුව එම ව්‍යාපාතිය 2015 මාර්තු 31 දින නිම කර තිබුණි. එකඟ වූ අරමුණුගත කාර්යයන් ඉටුකර ගැනීම සඳහා ඵලදායි හා කාර්යක්ෂමව අරමුදල් යෙදවීම සිදු නොකිරිම නිසා උපයෝජනය කර නොතිබුණු රු.මිලියන 12.87 ක් නැවත මහා භාණ්ඩාගාරය වෙත ආපසු යවා තිබුණි.

දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව

''ප්‍රජාව සවිබල ගැන්වීම, මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම හා ජීවනෝපාය කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය මඟින් ජාතික සංවර්ධනය වේගවත් කිරීමට දායක වීම හා ආහාර සුරක්ෂිතාවය තහවුරු කරමින්, දිළිඳුබව තුරන් කළ හා සමාජ සාධාරණත්වය සහතික කෙරෙන සමෘද්ධිමත් ජාතියක් ගොඩනැගීමට ප්‍රබලව දායකවීම" අරමුණු කරගෙන 2013 අංක 1 දරන දිවිනැගුම පනත යටතේ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය, සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව සහ උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව යන ආයතන ඒකාබද්ධ කර පිහිටුවන ලද දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතු 2014 ජනවාරි 03 දින ආරම්භ කර තිබුණි.

දෙපාර්තමේන්තුවට ඒකාබද්ධ කරන ලද ආයතනවල වත්කම් පවරා නොගැනීම

දෙපාර්තමේන්තුවට ඒකාබද්ධ කරන ලද ආයතන විසින් විධිමත් ලෙස ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොතිබූ හෙයින් එම ආයතන සතු වත්කම් හඳුනාගෙන නිවැරදිව පවරා ගත් බව සනාථ කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය විසින් බදු දී තිබූ ඉඩම් හා ගොඩනැගිලි ඇතුළු දේපල 15 ක් දෙපාර්තමේන්තුවට පවරාගෙන නව බදු ගිවිසුම්වලට එළැඹීමට කටයුතු කර නොතිබූ අතර පැරණි ගිවිසුම් ප්‍රකාරව දේපල 11 ක වසර කිහිපයක සිට අයවීම් හිඟ හිටව තිබූ බදු ආදායම රු.මිලියන 1.67 වී තිබුණි. එමෙන්ම ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ රු.මිලියන 110.43 ක් වටිනා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඌන උපයෝජිතව පැවතුණි.

ප්‍රධාන කාර්යාලය සෙත්සිරිපාය ගොඩනැගිල්ලේ ස්ථාපනය කිරීම

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය විසින් ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි ඉඩමට 2004 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා රු. මිලියන 38.08 ක බදුකුලී ගෙවා ගෙවා තිබුණි. නමුත් ඒ සඳහා වූ ගිවිසුම ප්‍රකාරව ගොඩනැගිලි ඉදිකිරීමට කටයුතු නොකිරීම නිසා බදු ගිවිසුම අවලංගු කර තිබූණි. එම කාලය තුළ ගබඩා ගොඩනැගිල්ලක් පමණක් ඉදිකර තිබුණි. බදු කාලය දීර්ඝ කරවාගෙන දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය එම ඉඩම තුළ ඉදිකිරීමට අපොහොසත් වීම නිසා දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇති සෙත්සිරිපාය පරිශ්‍රය සඳහා මාසිකව රු.මිලියන 4.25 ක් බැගින් කුලියක් ගෙවීමට සිදු වි තිබුණි. ඒ අනුව 2015 අවසාන වන විට ගෙවා තිබූ මුළු ගොඩනැගිලි කුලිය රු.මිලියන 571.075 ක් වී තිබුණි.

බැංකු ගිණුම් මෙහෙයවීම

දෙපාර්තමේන්තුවේ නිල බැංකු ගිණුමෙහි 2015 වර්ෂය අවසානයට වූ මුදල් ශේෂය රු.මිලියන 715.75 ක් වී තිබුණු අතර, එදින වන විට දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර තිබුණු චෙක්පත්වලින් රු.මිලියන 1,055.87 ක චෙක්පත් බැංකුව වෙත ඉදිරිපත් වී නොතිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් බැංකු ගිණුම මගින් ගනුදෙනු කිරීමේදි මුදල් පොත අනුව බැංකු ශේෂය පිළිබඳ සැලැකිලිමත් වි නොතිබුණි. නිකුත් කර තිබුණු චෙක්පත් සියල්ල බැංකුවට ඉදිරිපත් වුවහොත් ඒ සඳහා මුදල් ගෙවිමට බැංකු පොතේ පවතින මුදල් ශේෂය ප්‍රමාණවත් වි නොතිබුණි
දෙපාර්තමේන්තුවට ඒකාබද්ධ කරන ලද ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ නිල බැංකු ගිණුම 2015 සැප්තැම්බර් 21 දින පියවා තිබුණ ද, එමගින් මුදල් ලබා දී තිබූ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 42 ක බැංකු ගිණුම්වල පැවති රු.මිලියන 3.62 ක ශේෂ ඊට පසුව පියවා තිබීමෙන් එම බැංකු ගිණුමවල පවතින මුදල් අනුචිත පරිහරණයක් කිරිමට ඉඩකඩ සළසා දී තිබුණි.

නිවාස සංවර්ධන ලොතරැයි ජයග්‍රහකයින්ට ත්‍යාග ප්‍රදානය නොකිරිම

ප්‍රතිලාභීන්ගේ නිවාස ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුමක් ලබාදීමේ අරමුණ ඇතිව මාසිකව දිනුම් ඇදිය යුතු නිවාස සංවර්ධන ලොතරැයි අරමුදලක් ස්ථාපිත කර තිබුණි. 2012 හා 2013 වර්ෂයන්ට අදාළව එම ලොතරැයියේ දිනුම් ඇදීම පිළිබඳ තොරතුරු යාවත්කාලීන කර නොතිබුණි. මේ නිසා තොරතුරු සොයා ගැනිමට නොහැකි වූ එකතුව රු.මිලියන 22.65 ක ත්‍යාග හිමිකරගත් සහනාධාරලාභින් 151 දෙනෙකුට එම ත්‍යාග ප්‍රදානය කිරිමට නොහැකි වි තිබුණි. .

දැයට කිරුළ - 2015 වැඩසටහන යටතේ අඩු ආදායම්ලාභීන් සඳහා උළු ලබාදීම

දැයට කිරුළ 2015 ජාතික සංවර්ධන වැඩසටහන යටතේ ගාල්ල, මාතර, හම්බන්තොට සහ රත්නපුර යන දිස්ත්‍රික්කවල පදිංචි ස්ථිර නිවාස නොමැති අඩු ආදායම්ලාභීන් සඳහා උළු ලබාදීම වෙනුවෙන් එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත 2015 වර්ෂයේදී රු.මිලියන 9.77 ක් වැයකර තිබුණි. වර්ෂය අවසානයේදී එම වැඩ සටහන අතරමඟ නවතා තිබූ අතර නිවසක් තනාගැනීමට හැකියාවක් නොමැති අයට ඒ සඳහා අවශ්‍ය අනෙකුත් පහසුකම් නොසපයා උළු පමණක් ලබාදී තිබුණි. මේ නිසා ඇතැම් ප්‍රතිලාභීන්ට උළු සෙවිලි කර ගැනීමට නොහැකි වී තිබුණි.

සහනාධාර ගෙවීම සඳහා ලබාගත් මුදල් ආපසු නොපියවීම

2013 වර්ෂයේ සමෘද්ධි සහනාධාර ගෙවීම සඳහා බැංකු මූල්‍ය අංශයේ ආයෝජනවලින් රු.මිලියන 2,449.50 ක් ලබා ගෙන තිබුණත්, 2015 වර්ෂය අවසාන වන විටත් එම මුදල නොපියවා නොබුණි.

'ඉසුරුමත් නිවහනක්' නිවාස සංවර්ධන වැඩසටහන

දිවයින පුරා විසිරී සිටින දිවිනැගුම (සමෘද්ධි) සහනාධාරලාභී පවුල් 1,484,710 ක ගේ නිවාස සංවර්ධනය කිරීම සඳහා 'ඉසුරුමත් නිවහනක්' යන වැඩසටහන යටතේ එක් පවුලකට රු.10,000 බැගින් ලබාදීමට සැලැසුම් කර තිබුණි. එහි පළමු අදියර වශයෙන් 2014 වර්ෂයේදී පවුල් 1,197,111 ක් වෙත රු.2,500 බැගින් එකතුව රු.මිලියන 2,992.78 ක් දිවිනැගුම ප්‍රජා මූල බැංකුවල තැන්පත් උපයෝගී කරගෙන කර ගෙන දෙපාර්තමේන්තුව විසින් එම වැඩසටහන සඳහා මුදල් යොදවා තිබුණද, එම වැඩසටහන අතරමඟ නවතා තිබුණි.

පනතේ කාර්යයන් ඉටු නොකිරීම

2013 අංක 01 දරන දිවිනැගුම පනත ප්‍රකාරව දිවිනැගුම ප්‍රජා මූල සංවිධාන, දිවිනැගුම ප්‍රජා මූල බැංකු මහා සංගමය හා දිවිනැගුම සංවර්ධන අරමුදල පිහිටුවා නොතිබුණි.

රටවිරු නිවාස ණය යෝජනා ක්‍රමය

මැද පෙරදිග රටවල සේවයේ නියුතු ශ්‍රමිකයන්ගේ නිවාස තනාගැනීම සඳහා රටවිරු නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ 2015 වර්ෂය අවසානය වනවිට දිස්ත්‍රික්ක 23 ක ශ්‍රමිකයින් 8,850 දෙනෙකු වෙත නිවාස තනා ගැනීම වෙනුවෙන් රු. මිලියන 1,159.52 ක ණය මුදලක් ලබාදී තිබුණි. ණය මුදලින් ශ්‍රමිකයන් 1,625 දෙනෙකුට ලබා දී තිබූ රු.මිලියන 132.68 ක ණය ගෙවීම පැහැර හැර තිබූ බැවින් එම මුදල් රු. මිලියන 100 ක් වූ තැන්පතු මුදලින් පියවා ගැනීමේ හැකියාවක් තිබේද යන්න තහවුරු කරගෙන නොතිබුණි.

ලැබිය යුතු ණය ශේෂ අයකර ගැනීම

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව තිබූ ලැබිය යුතු ණය ශේෂය රු.මිලියන 130.16 ක් වී තිබුණි. එම ශේෂය අයකර ගැනිමට කටයුතු කළ බව සනාථ වන තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

බදු මුදල් හා දඩ මුදල් ගෙවීම

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය විසින් පාවිච්චි කළ වාහන සඳහා ගෙවා නොතිබූ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය බදු මුදල් හා දඩ මුදල් එකතුව රු.1,284,000 ක් දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි.

විද්‍යා, තාක්ෂණය හා පර්යේෂණ කටයුතු

විද්‍යාත්මක පර්යේෂණවල නිරතවීමෙන් හා විද්‍යා හා තාක්ෂණය ප්‍රචලිත කිරීම හරහා ශ්‍රී ලංකාව විද්‍යාත්මකව හා ශ්‍රී ලංකාව තාක්ෂණිකත්වයෙන් උසස් රටක් බවට දියුණු කිරීම විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය හා ව්‍යවස්ථාපිත මණ්ඩල 11 කින් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි. එම කාර්ය භාරයයන් ඉටු කිරීම සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

විදේශාධාර ව්‍යාපෘතියක් ගිවිසුම් ප්‍රකාරව ඉටු කර නොතිබීම

යුරෝපා සංගමයේ මූල්‍ය ආධාර යටතේ ආරම්භ කළ ව්‍යාපෘතියක් ගිවිසුම්ගත පරිදි ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් සිදු වූ අලාභ පියවීම සඳහා රු. මිලියන 13.28 ක් යුරෝපා සංගමය වෙත ආපසු ගෙවීමට 2014 වර්ෂයේදී කාර්මික තාක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. නමුත් 2015 වර්ෂයේ එම ගෙවීම සිදු කර නොතිබුණු අතර, මූල්‍ය ප්‍රකාශනවලින්ද ඒ සඳහා ප්‍රතිපාදන සළසා ගෙන නොතිබුණි.

පේටන්ට් බලපත්‍ර ලබාදිය යුතු පර්යේෂණ සඳහා එම බලපත්‍ර ලබා නොදීම

කාර්මික තාක්ෂණ ආයතනය විසින් පසුගිය වර්ෂ 05 ක කාලය තුළ පේටන්ට් අයිතිය ලබාගත හැකි පර්යේෂණ 19 ක් සිදු කර තිබුණද, ඉන් පර්යේෂණ 10 කට පේටන්ට් අයිතිය ලබා ගෙන නොතිබුණි.

ක්‍රියාත්මක කළ ව්‍යාපෘතියක් නවතා දැමීම

කාර්මික තාක්ෂණ ආයතනය හා විදේශීය රාජ්‍ය නොවන සංවිධානයක් සමඟ ඇති කරගත් ගිවිසුමක් අනුව පිළිවෙලින් රු. මිලියන 3 ක් හා රු. මිලියන 7 ක මූල්‍ය දායකත්වයෙන් 2014 අප්‍රේල් මාසයේදී ආරම්භ කර 2015 දෙසැම්බර් මාසයේදී අවසන් කිරීමට සැලැසුම් කළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 2.11 ක් වැය කර තිබුණි. නමුත් එම ව්‍යාපෘතිය නවතා තිබුණි.

නිම කර තිබුණු පර්යේෂණවල ඉදිරි ක්‍රියාමාර්ග දුර්වලවීම

ජාතික විද්‍යා පදනම මගින් නිම කර තිබුණු පර්යේෂණ ව්‍යාපෘති 150 කින් රු. මිලියන 3.05 ක් වටිනා ව්‍යාපෘති 02 ක් පමණක් තාක්ෂණ පැවරීම් ලබාදීම (වාණිජකරණය කිරීම සඳහා වැඩිදියුණු කිරීම) සඳහා ද, රු. මිලියන 1.78 ක් වටිනා ව්‍යාපෘති 2 ක් පේටන්ට් ලබාගැනීම සඳහා පමණක් යොමුකර තිබුණි. නිම කර තිබුණු පර්යේෂණ ව්‍යාපෘති 150 අතරින් පර්යේෂණ 59 ක් දේශීය ප්‍රකාශන මට්ටමේද, පර්යේෂණ 27 ක් ජාත්‍යන්තර ප්‍රකාශන මට්ටමේද, පර්යේෂණ 37ක් සන්නිවේදන මට්ටමේද පැවැති අතර ඉතිරි පර්යේෂණ 27 ක් සඳහා කිසිදු ප්‍රකාශනයක් සිදු කර නොතිබුණි.

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් පහත සඳහන් කටයුතු ඉටු කර නොතිබුණි.

- "රාජ්‍ය හා පෞද්ගලික අංශවල ව්‍යාපාර විසින් විද්‍යා හා තාක්ෂණය භාවිතා කිරීම පිළිබඳව ඉකුත් වර්ෂයේ ශ්‍රී ලංකාව තුළ කරන ලද විද්‍යා හා තාක්ෂණ කටයුතු සමාලෝචනය" සඳහා කොමිෂන් සභාව සකස් කළ වාර්තාව ප්‍රකාශයට පත්කර නොතිබුණි.

- 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ අරමුණුවලට අදාළව විද්‍යාව හා තාක්ෂණ ආයතන හඳුනාගෙන සමාලෝචන ආරම්භ කිරීමට 2015 වර්ෂයේදී කටයුතු කර නොතිබුණි.

- 2014 වර්ෂයේදී පැවැත්වූ 7 වන ද්විවාර්ෂික සමුළුවේදී එකඟතාවයකට පැමිණ තිබූ ක්ෂේත්‍ර 10 කට අදාලව විද්‍යාව හා තාක්ෂණය දියුණුවක් ඇති කිරීමේ ක්‍රියාවලිය අක්‍රීයවී තිබුණි.

- විද්‍යා හා තාක්ෂණික ආයතන වාණිජකරණ ඒකකය පිහිටුවීම සම්බන්ධ ව්‍යාපෘති යෝජනාව 2015 වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණි.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත යටතේ කාර්මික හා වාණිජ ක්ෂේත්‍රවල ප්‍රමිතිකරණය, මිනුම්, තත්ත්ව සහතික කිරීම හා ඒ සම්බන්ධ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමේ හා ඒ සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පිහිටුවා තිබූ නමුත්, ආයතනයේ අරමුණුවලට පටහැනි පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකර තිබුණි.

- ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර 107:2008හි සඳහන් පිරිවිතරවලට අනුගත නොවූ 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අවස්ථා 46 කදී ආනයනය කරන ලද ඇමරිකානු ඩොලර් 2,603,490 ක් වටිනා සිමෙන්ති කිලෝග්‍රෑම් 43,960,000ක් වෙළෙඳපොලට නිකුත් කර තිබුණි.

- 2015 වර්ෂයේදී අවස්ථා 96 කදී ආනයනය කරන ලද ඇමරිකානු ඩොලර් 5,609,936ක් වටිනා සිමෙන්ති කිලෝ ග්‍රෑම් 95,480,000 ක් පරීක්ෂණ වාර්තා ලබාගැනීමට පෙර වෙළෙඳපොලට නිදහස් කර තිබුණි.

- ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර 731:2008 ට අනුව ආනයනිත කිරිපිටිවල සංයුතිය සඳහා පරාමිතික 8 ක්ද, ක්ෂුද්‍ර ජීවී පරික්ෂාව සඳහා පරාමිතික 5 ක් ද පරික්ෂා කළ යුතුව තිබුණත්, සියලුම පරාමිතින් පරික්ෂා කිරීමකින් තොරව 2015 ජනවාරි සිට ජූනි මාසය දක්වා අවස්ථා 25කදී ආනයනය කළ ඇමරිකානු ඩොලර් 6,530,430 ක් වටිනා කිලෝ ග්‍රෑම් 2,300,800ක කිරිපිටි තොග වෙළඳපොලට නිදහස් කිරීම.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

භෞතික කාර්යසාධනය

ශ්‍රී ලංකා නව නිපයුම්කරුවන්ගේ කොමිසමේ භෞතික කාර්යසාධනය පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- නව නිපැයුම් පරීක්ෂා කිරීමෙන් පසු නව නිපැයුම්කරුවන්ට තාක්ෂණික ආධාර දීම හා පේටන්ට් බලපත්‍ර ලබාදීම සඳහා වූ ඉල්ලුම්පත්‍ර පිළියෙල කිරීමට උපකාර කිරීම කළ යුතු වුවද, කොමිසම විසින් 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ පේටන්ට් ලබා ගැනීම සඳහා නව නිපැයුම්කරුවන් යොමුකර තිබූ බව තහවුරු කිරීමට ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

- නව නිපැයුම් වැඩි දියුණු කිරීම, පරිපූර්ණ කිරීම හා නිෂ්පාදනය කිරීම සඳහා කොමිසම විසින් නියම කරනු ලබන නියමවලට හා කොන්දේසිවලට යටත්ව නව නිපැයුම්කරුවන්ට මුදල් ආධාර ලබාදීම කොමිසමේ කාර්යයක් වුවද, 2015 වර්ෂයේ අවසාන දින වන විට නව නිපැයුම්කරුවන්ගේ අරමුදලේ රු. මිලියන 9.79 ක ශේෂයක් පැවැතුණි. ක්‍රියාකාරී සැලැස්මට අනුව රු. මිලියන 8.00 ක ණය හා ආධාර ප්‍රදානය කිරීමට සැලැසුම් කර තිබියදී රු.400,000 ක ණය මුදලක් පමණක් ලබා දී තිබුණි.

- ශ්‍රී ලාංකික යෞවනයන් අතර නිර්මාණශීලීත්වය වැඩි දියුණු කිරීම සහ ඊට ධෛර්ය දීම සඳහා පාසල්වල, කාර්මික විද්‍යාලවල සහ විශ්වවිද්‍යාලවල නිර්මාණාත්මක සමිති සංවිධානය කිරීම කොමිසමේ කාර්යයක් වුවද, කාර්මික විද්‍යාල හා විශ්ව විද්‍යාල තුළ නිර්මාණාත්මක සමිති සංවිධානය කර තිබූ බව විගණනයේදී තහවුරු නොවුණි.

- නව නිපැයුම් ශ්‍රී ලංකාවේ හා විදේශයන්හි අලෙවි කිරීම සඳහා නව නිපැයුම්කරුවන්ට උපකාර කිරීම කොමිසමෙහි කාර්යයකි. එසේවුවද 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී නව නිපැයුම් 468 ක් සඳහා ජයග්‍රහන ලබා දී තිබියදී නිපැයුම් 437ක් සම්බන්ධයෙන් පේටන්ට් බලපත්‍ර ලබාදී වාණිජකරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා අනුකූලතා තක්සේරු පිළිබඳ ප්‍රතීතන මණ්ඩලය

2005 අංක 32 දරන ශ්‍රී ලංකා අනුකූලතා තක්සේරු පිළිබඳ ප්‍රතීතන මණ්ඩල පනත මඟින් මෙම මණ්ඩලය ස්ථාපිත කර තිබුණි. ජාත්‍යන්තර ප්‍රමිතිමත පදනම් වූ ජාතික ප්‍රමිතිවලට අනුකූලව, අනුකූලතා තක්සේරු කරගෙනයාමට අදාල ප්‍රතීතන ප්‍රදානය කිරීමට පිහිටවූ ආයතනයකි. එසේ වුවද පරීක්ෂණාගාර හා ක්‍රමාංකන ආයතන ප්‍රගතිය හැර අනෙකුත් ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සැලකිය යුතු තරමේ ප්‍රගතියක් සිදුවී නොතිබුණි. එයට හේතුව ප්‍රතීතන ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම ස්වේඡා පදනම මත සිදු කරන ක්‍රියාවලියක් වන අතර අනිවාර්යය කිරීමේ නීත්‍යානුකූල හැකියාවක් නොතිබුණි. මණ්ඩලයේ කාර්යසාධනය පරීක්ෂා කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- 2005 වර්ෂයේ සිට ප්‍රතීතනයට ලක් කළ යුතු පරීක්ෂණාගාර හා වෛද්‍ය රසායනාගාර පිළිවෙලින් 184 ක් හා 311 ක් හඳුනාගෙන තිබුණද, 2005 වර්ෂයේ සිට සිට 2015 වර්ෂය දක්වා පරීක්ෂණාගාර 62

ක් හා වෛද්‍ය රසායනාගාර 20 ක් පමණක් ප්‍රතීතනයට ලක් කර තිබුණි.

- 2005 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා පරීක්ෂා කිරීමේ ආයතනයකට පමණක් ප්‍රතීතනයක් නිකුත් කර තිබුණද, එම ආයතනයද 2015 වර්ෂය අවසාන වන විට ප්‍රතීතන ක්‍රියාවලියෙන් ඉවත්ව තිබුණි.
- 2009 වර්ෂයේදී සහතික නිකුත් කිරීමේ ආයතනවල ප්‍රතීතනය ආරම්භ කර තිබුණද, 2014 වර්ෂය වන විට සහතික නිකුත් කිරීමේ ආයතන 6 ක පමණක් ප්‍රතීතනය සිදු කර තිබුණි. ඉන් එක් ආයතනයක් 2015 වර්ෂයේ ප්‍රතීතන ක්‍රියාවලියෙන් ඉවත්ව ගොස් තිබුණි.
- ප්‍රතීතන සහතිකය ලබා ගත් ප්‍රතීතන සේවා සැපයීම් ආයතන වසර 3 කට පසුව නැවත ප්‍රතීතනය අලුත් කර ගත යුතු වුවත්, 2015 වර්ෂයේදී එලෙස කළ යුතු ලෙස හඳුනා ගත් ආයතන 33 කින් 12ක් ප්‍රතීතනය අළුත් කර නොතිබුණි.

සන්නිවේදනය

ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් විෂයයන්ට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම යන කාර්යයන් විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අංශය 2015 ජනවාරි මාසයේ සිට අගෝස්තු මාසය දක්වා විදේශ කටයුතු අමාත්‍යාංශය යටතේද, 2015 සැප්තැම්බර් මාසයේ සිට එය විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය නමින් නව අමාත්‍යාංශයක් යටතේ ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය, ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම හා එහි පාලිත සමාගම් මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. මෙම අංශය සම්බන්ධයෙන් සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණයන් සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ස්ථාවර දුරකථන සේවා ග්‍රහක සංඛ්‍යාව අඩුවීම

ශ්‍රී ලංකාවේ ස්ථාවර දුරකථන සේවා ග්‍රාහක සංඛ්‍යාව 2005 වර්ෂයේදී 1,243,994 ක් වූ අතර එය 2011 වර්ෂයේදී 3,608,932 දක්වා සියයට 190 කින් සිඝ්‍රයෙන් වර්ධනය වී තිබුණි. එසේ වුවත් එම සංඛ්‍යාව 2015 වර්ෂය වන විට 2,601,196 ක් වී තිබුණි. ඒ අනුව ස්ථාවර දුරකථන සේවා ග්‍රාහක සංඛ්‍යාව 2011 වර්ෂයට සාපේක්ෂව සියයට 28 කින් ක්‍රමයෙන් 2015 වර්ෂය වන විට අඩුවී තිබුණි. ස්ථාවර ග්‍රාහක සංඛ්‍යාව මෙසේ අඩුවීමට ජංගම දුරකථන ග්‍රාහක සංඛ්‍යාව වේගයෙන් ඉහළ යාම හේතු වී තිබුණි. පසුගිය වසර 10 ක කාලය තුළ ජංගම දුරකථන අංශයේ සංයුක්ත වාර්ෂික වර්ධනයක් පෙන්නුම් කරමින් 2005 වර්ෂයේදී සිට ජංගම දුරකථන ග්‍රාහක සංඛ්‍යාව 3,361,775 ක් වී තිබුණු අතර 2015 වර්ෂය අවසාන වන විට එය 24,384,544 ක් දක්වා වර්ධනය වී තිබුණි. මෙහිදී දුරකථන ඝනත්වය පුද්ගලයන් 100 කට 119.96 දක්වා වැඩි වී තිබුණද සක්‍රීය ග්‍රාහක අනන්‍යතා මොඩියුල් පත් (sim cards) සැලකිය යුතු ප්‍රමාණයක් තනි හා එකම පුද්ගලයකු විසින් භාවිතා කරන බැවින් මෙම සංඛ්‍යාවලින් සත්‍ය තත්ත්වය පිළිඹිබු නොකෙරෙණ අතර සත්‍ය තත්ත්වය මීට වඩා අඩුවිය හැකි බව නිරීක්ෂණය විය.

2005 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා දුරකථන හා අන්තර්ජාල ග්‍රාහක සංඛ්‍යා පිළිබඳ තොරතුරු පහත සඳහන් රූප සටහන 15 හි දැක්වේ.



රූපසටහන 15 දුරකථන හා අන්තර් ජාල ග්‍රාහක සංඛ්‍යාව
මූලාශ්‍රය . ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ තොරතුරු

විද්‍යුත් තැපැල භාවිතා කරන ප්‍රමාණය අඩුවීම

අන්තර්ජාල ග්‍රාහක සංඛ්‍යාව 2005 වර්ෂයේදී 115,000 සිට 2015 වර්ෂයේ 4,090,920 දක්වා වර්ධනය වී තිබුණද සමස්ථයක් ලෙස සැලකීමේදී අන්තර්ජාලය හා විද්‍යුත් තැපැල භාවිතය පහළ මට්ටමක පැවතිණි. මෙය තවදුරටත් වැඩි දියුණු කළ යුතු ක්ෂේත්‍රයක් වන අතර අන්තර්ජාලය ඇති/ නැති වශයෙන් බෙදීමක්ද පැවතිණි. අන්තර් ජාල පහසුකම් තිබෙන්නාවූ වැඩිදෙනෙක් නාගරික ප්‍රදේශවල සිටින අතර ග්‍රාමීය ප්‍රදේශවලට මෙම පහසුකම් බහුල වශයෙන් ව්‍යාප්ත වී නොතිබුණි. පළාත් ලෙස සැලකීමේදී ADSL පමණක් භාවිතය ව්‍යාප්ත වී ඇති ආකාරය පහත පරිදි විය. ඒ අනුව ADSL භාවිතා කරන්නන්ගෙන් සියයට 57 ක් බස්නාහිර පළාතට පමණක් විය. එය රූප සටහන 16 හි දැක්වේ.



රූප සටහන 16 – ADSL අන්තර් ජාල පහසුකම් ව්‍යාප්තිය

මූලාශ්‍රය - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ තොරතුරු

පාසල් පරිගණක විද්‍යාගාර ස්ථාපිත කිරීම

විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයේ අපේක්ෂිත ඉලක්ක ලඟාකර ගැනීම සඳහා පාසල් පරිගණක විද්‍යාගාර ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය අමාත්‍යාංශය මගින් සිදුකර තිබුණි. දිස්ත්‍රික් තොරතුරු මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය, තොරතුරු තාක්ෂණ උද්‍යාන පවත්වාගෙන යාම හා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මගින් නැණසල මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම ඇතුළු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදන ලබා දී තිබුණි. 2015 වර්ෂය අවසානය වන විට ඉහත සඳහන් ව්‍යාපෘති සඳහා රු. මිලියන 3,129 ක ප්‍රතිපාදන සළසා තිබුණද ඉන් රු.මිලියන 2,006 ක් පමණක් උපයෝජනය කර තිබුණි. අමාත්‍යාංශය 2015 වර්ෂයේදී ඉටු කිරීමට අපේක්ෂා කරන ඉලක්ක සඳහා රජය විසින් ප්‍රතිපාදන ලබා දී තිබුණත්, එම ප්‍රතිපාදන මනා ලෙස උපයෝජනය කර අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි. පාසල් පරිගණක විද්‍යාගාර ස්ථාපිත කිරීමේ කාර්යයන් ඉටු කිරීමේදී පහත සඳහන් අඩුපාඩු සිදු වී තිබුණු බව විගණනයේදී අනාවරණය විය.

- 2015 වර්ෂයේදී පාසල් පරිගණක විද්‍යාගාර 79 ක් ස්ථාපනය කිරීමට සැලැසුම් කර තිබුණද, එයින් විද්‍යාගාර 39 ක් ස්ථාපිත කර තිබුණි. විද්‍යාගාර 79 ක් ස්ථාපිත කිරිමට රු.මිලියන 400 ක ප්‍රතිපාදන සළසා තිබුණත්, ඉන් රු.මිලියන 152 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

- පාසල් පරිගණක විද්‍යාගාර ව්‍යාපෘතිය සඳහා පාසල් තෝරා ගැනීම ප්‍රමුඛතා පදනමක් මත සිදුකර නොතිබුණ අතර 2012 වර්ෂයේදී ආරම්භ කර තිබූ මෙම ව්‍යාපෘතිය තුළ 2015 දෙසැම්බර් 31 දින වන විට ස්ථාපිත කිරීමට අපේක්ෂා කර තිබුණු මුළු පාසල් විද්‍යාගාර 684 න් පරිගණක විද්‍යාගාර 444 ක් දිස්ත්‍රික්ක 03 කට පමණක් සීමා කිරීම නිසා සම්පත් බෙදී යාමේ විෂමතාවයක් පැවැතුණි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව:

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විදුලි සංදේශ ක්ෂේත්‍රය නියාමනය කරනු ලබන හා විදුලි සංදේශ කටයුතුවලට අදාළ ආදායම් එකතු කරනු ලබන ආයතනය වේ. විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයෙන් වෙන්ව ජනාධිපතිවරයා යටතේ පාලනය වන ආයතනයකි. මෙම ආයතනය සම්බන්ධයෙන් සිදු කළ විගණනයේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

සංඛ්‍යාත භාවිතයේදී සිදුවන විවිධ බාධාවීම් නිසි පරිදි හඳුනා ගැනීමට නොහැකි වීම

ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වල විදුලි සංදේශ ජාලය නිසියාකාරව ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම කොමිෂන් සභාවේ අරමුණක් වී තිබුණත්, සංඛ්‍යාත භාවිතයේදී විවිධ බාධාවීම් සිදුවන බව අනාවරණය විය. බාධාවීම් පරීක්ෂා කිරීම සඳහා කොමිෂන් සභාවේ පවතින සංඥා පද්ධතිය අවුරුදු 17 කට වඩා පැරණි බැවින්, එම බාධාවීම් නිසි පරිදි හඳුනා ගැනීමට නොහැකි වී තිබුණි. එසේ වුවත් පැරණි පද්ධතිය වෙනුවට නව පද්ධතියක් ස්ථාපනය කිරීමේ කටයුතු සමාලෝචිත වර්ෂයේදී සිදුකර නොතිබුණි.

සංඛ්‍යාත ගාස්තු අයකර ගැනීමේ ක්‍රියාවලිය දුර්වලවීම

කොමිෂන් සභාව විසින් ස්ථාවර හා ජංගම මෙහෙයුම් මධ්‍යස්ථාන (Fixed and Mobile Monitoring Stations) ස්ථාපිත කර තිබුණද, සංඛ්‍යාත භාවිතා කරනු ලබන පාර්ශවයන් සංඛ්‍යාත ගාස්තු නොගෙවන අවස්ථාවලදී එම පාර්ශවයන් සඳහා වෙන් කරන ලද සංඛ්‍යාත භාවිතා කරන්නේද නැද්ද යන්න පිළිබඳ පිරික්සුම් කටයුතු ක්‍රමානුකූලව සිදුකර නොතිබුණි.

සංඛ්‍යාත ගාස්තු ගෙවීම පැහැර හැරීම හා ප්‍රමාදයන් සහිතව ගෙවීම් සිදුකරන බව අනාවරණය වී තිබුණ අතර 2015 වර්ෂය අවසානයේදී අය නොවී පවතින ණය ශේෂ රු. මිලියන 372 ක් වර්ෂ 02 ක සිට වර්ෂ 30 කට වැඩි කාල පරාසයක සිට පැවතිණි. මෙයින් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් රු.මිලයන 120 ක් අයවිය යුතුව තිබුණි. සංඛ්‍යාත ගාස්තු පැහැර හැරීම හෝ ප්‍රමාද වී ගෙවීම් කරන ක්‍රියාකරුවන් සඳහා දඩ මුදලක් අයකරගැනීමට නීතිමය බලය ලබාගැනීමේ වගන්ති විදුලි සංදේශ පනතට ඇතුළත් කරන බව 2011 වර්ෂයේ සිටම වරින් වර විගණකාධිපතිවරයා වෙත දන්වා තිබුණත් එපරිදි කටයුතු කර නොතිබුණි.

කොළඹ - නෙළුම් කුළුණ ඉදිකිරීම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මගින් මීටර් 350 ක් උසැති මහල් 09 කින් යුත් දකුණු ආසියාවේ උසම බහු සම්ප්‍රේෂණ කුළුණක් වශයෙන් භාවිතා කළ හැකි කොළඹ නෙළුම් කුළුණ ඉදි කෙරෙමින් පවතී. මෙම කුළුණෙහි පළමු හා දෙවන මහල තුළ රූපවාහිනී සේවා සපයන්නන්, විදුලි සංදේශ සේවා සපයන්නන් හා ගුවන් විදුලි සේවා සපයන්නන් සඳහා අවශ්‍ය විකාශනාගාර පහසුකම් සැපයීමට අපේක්ෂා කර තිබුණි. මෙම ඉදිකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- නෙළුම් කුළුණ ඉදිකිරීම අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත චීන සමාගම් දෙකක් වෙත එක්සත් ජනපද ඩොලර් මිලියන 104.3 කට ලබාදී තිබුණද එම සමාගම් ව්‍යාපාර බලපත්‍රයට අනුව සමාගමේ ව්‍යාපාරික විෂය පථයට බහු සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීම් හෝ විශාල පරිමානයේ කොන්ත්‍රාත්තු ඉදිකිරීම් ඇතුළත් වී නොතිබුණි.

- කොන්ත්‍රාත් ගිවිසුමට අනුව ඉදිකිරීම් කටයුතු 2012 නොවැම්බර් 12 දිනෙන් ආරම්භ කර 2015 මැයි 12 දින වන විට දින 912 කින් නිම කළ යුතුව තිබුණද, අපේක්ෂිත පරිදි වැඩ නිමකළ නොහැකිවීම නිසා කොන්ත්‍රාත් කාලය 2017 ඔක්තෝබර් මාසය දක්වා දීර්ඝ කර තිබුණි. නමුත් ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

- කොන්ත්‍රාත් ගිවිසුම සමඟ ඉදිරිපත් කර තිබූ නිශ්චයාත්මක මාර්ගයට (Critical Path) අනුව සවිකළ යුතු යාන්ත්‍රික විදුලි හා විශේෂ උපකරණ සවිකිරීමේ කටයුතු 2014 ජූලි මාසයේදී ආරම්භ කර මාස 08 ක් තුළ එනම් 2015 මාර්තු 12 දින වන විට අවසන් කළ යුතු වුවත්, එදින වන විට කිසිදු උපකරණයක් සවිකර නොතිබුණි.

- විදුලි සෝපාන හා විදුලි තරප්පු පෙළ සවි කිරීම සඳහා ව්‍යාපෘති උපදේශක ඒකකය (PCU) මගින් තාක්ෂණික හා මූල්‍යාමය ඇගයීම් වාර්තාව කොමිෂන් සභාවේ

අනුමැතිය සඳහා 2014 ඔක්තෝබර් 13 දින ඉදිරිපත් කර තිබුණද, අනුමැතිය 2016 මාර්තු 29 දින ලබාදී තිබුණි.

- ණය පොලී අනුපාතය ලන්ඩන් අන්තර් බැංකු ණය අනුපාතයට සියයට 4 ක් එකතු කිරීමෙන් සකස් කර තිබුණද, ණය ගැණුම් පිරිවැය ගණනයේදී ස්ථාවර පොලී ආන්තිකය සියයට 3.5 ක් ලෙස සළකා තිබූ බැවින් ව්‍යාපෘතියේ ණය ගැණුම් පිරිවැය රු. මිලියන 265 ක් අඩුවෙන් හා ව්‍යාපෘතියේ රක්ෂණ පිරිවැය රු.මිලියන 682 ක් අඩුවෙන් ඇස්තමේන්තු කර තිබුණි. ව්‍යාපෘතියේ අයවැයගත ආදායමෙහි වර්තමාන අගය (Present Value) ගණනය කිරීම සඳහා වන ප්‍රාග්ධන පිරිවැය අනුපාතය වූ (වට්ටම් අනුපාතය) සියයට 4.32 වෙනුවට සියයට 4 ක වට්ටම් අනුපාතිකය ලෙස යොදා ගැනීමේ ප්‍රමාණාත්මක විචලතා හේතුවෙන් තක්සේරු කර තිබුණු ව්‍යාපෘතියේ පිළිගෙවුම් කාලය වෙනස් විය හැකි බව නිරීක්ෂණය විය.

උසස් අධ්‍යාපනය

උසස් අධ්‍යාපන ප්‍රවේශ අවස්ථා වැඩිකිරීම, ගුණාත්මක වර්ධනයන් හා අන්තර් ජාතික මට්ටමේ විශ්වවිද්‍යාල හා පශ්චාත් උපාධි ආයතන බිහිකිරීම මගින් දැනුම පාදක ආර්ථිකයක් කරා ළඟාවීමට හැකිවන පරිදි පුළුල් උසස් අධ්‍යාපන අවස්ථාවන් තහවුරු කිරීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, විශ්ව විද්‍යාල 17 කින් හා ව්‍යවස්ථාපිත ආයතන 20 කින් පහත සඳහන් කාර්යභාරයයන් ඉටු කිරීමෙන් අපේක්ෂා කර තිබුණි.

- උසස් අධ්‍යාපන විෂයයන්ට හා එහි ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම
- විශ්වවිද්‍යාල හා අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවලට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- පළාත් සභා හා පළාත් පාලන ආයතන සමඟ ඒකාබද්ධව ජාතික ප්‍රතිපත්ති පදනම් කරගත් සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීම.

මෙම ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වූ වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම

2015 වර්ෂයේදී ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීමේ ලේඛනය අනුව කොළඹ විශ්වවිද්‍යාලය 2092 වැනි ස්ථානයේද, පේරාදෙණිය විශ්වවිද්‍යාලය 2361 වැනි ස්ථානයේද, මොරටුව විශ්වවිද්‍යාලය 2515 වැනි ස්ථානයේද හා කැලණිය විශ්වවිද්‍යාලය 2815 වැනි ස්ථානයේද ශ්‍රේණි ගත කර පැවති දෙසැම්බර් මාසය අතර කාල පරාසය තුළ සිදු කර තිබුණි. සමස්ථයක් ලෙස ඉකුත් වසර කිහිපය තුළදී උසස් අධ්‍යාපනය සඳහා අතර ශ්‍රී ජයවර්ධනපුර සහ රුහුණු යන විශ්වවිද්‍යාල පිළිවලින් 3752 සහ 4318 යන ස්ථාන වල පසුවිය. අනෙකුත් විශ්වවිද්‍යාල 5000 සිට 15400 අතර ද ශ්‍රේණි ගත වී තිබුණි. 2014 වර්ෂයේ ශ්‍රේණිගත කිරීම් සමඟ සැසඳීමේදී 2015 වර්ෂයේදී විශ්වවිද්‍යාල 7 ක් පහත වැටී තිබුණි.

උසස් අධ්‍යාපනය සඳහා අවස්ථාවන්

2014/2015 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලවලට ඇතුළු වීමට පැරණි හා නව නිර්දේශ වලින් සුදුසුකම් ලත් ශිෂ්‍යයන් 149,572 කින් ශිෂ්‍යයන් 25,676 දෙනෙකුට අවස්ථාව ලබා දී තිබූ අතර එය සුදුසුකම් ලැබූවන්ගෙන් සියයට 17.1 ක් වී තිබුණි. පසුගිය වර්ෂයේ ශිෂ්‍යයන් 143,740 ක් සුදුසුකම් ලබා තිබූ අතර ශිෂ්‍යයන් 25,200 ක් විශ්වවිද්‍යාලවලට බඳවා ගෙන තිබුණි. එය සුදුසුකම් ලැබූවන්ගෙන් සියයට 17.5 ක් වී තිබුණි. කෙසේවුවද, පසුගිය අධ්‍යයන වර්ෂයට සාපේක්ෂව 2014/2015 වර්ෂයේදී බඳවා ගත් ශිෂ්‍ය ප්‍රමාණය සියයට 1.8 කින් වර්ධනය වී තිබුණි. මෙම බඳවා ගැනීම්වලට අතිරේකව විදේශීය සිසුන් 76 දෙනෙකු සමාලෝචිත වර්ෂයේදී බඳවා ගෙන තිබුණි.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් පරිදි පෙර වර්ෂයේ සුදුසුකම් ලද ශිෂ්‍යයන් බඳවා ගැනීම සඳහා විශ්වවිද්‍යාලවල අධ්‍යයන වැඩසටහන් ඔක්තෝබර් මාසයේදී ආරම්භ කිරීමට සැලැසුම් කර තිබුණි. ඒ අනුව කොමිෂන් සභාව විසින් 2014/2015 අධ්‍යයන වර්ෂවලට අදාළ විශ්වවිද්‍යාලය වෙත සිසුන් බඳවා ගැනීම ඔක්තෝබර් මාසයේ සිට

සුදුසුකම් ලද ශිෂ්‍යයකු වර්ෂ 1 කට ආසන්න කාලයක් විශ්වවිධ්‍යාලයට ඇතුළුවීමට රැඳී සිටීමට සිදු වී තිබුණි. විභාග දෙපාර්තමේන්තුව

විසින් ප්‍රතිඵල පිළිබඳ තොරතුරු ලබාදීම සඳහා දීර්ඝ කාලයක් ගත වීමද මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රතිපාදන

2015 වර්ෂයේ විශ්වවිද්‍යාල සඳහා පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 25,898 ක් සහ ප්‍රාග්ධන වියදම් සඳහා රු.මිලියන 8,860 ක් වශයෙන් රු.මිලියන 34,578 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. 2014 වර්ෂයේ ලබා දී තිබූ පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රතිපාදන සමඟ සැසඳීමේදී පුනරාවර්තන ප්‍රතිපාදන රු.මිලියන 5,057 කින් වැඩිවීමක් සිදු වී තිබූ නමුත් ප්‍රාග්ධන ප්‍රතිපාදන රු.මිලියන 2,085 කින් අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාල 10 කට ලබාදුන් ප්‍රතිපාදනවලින් රු.මිලියන 635 ක් උපයෝජනය කර නොතිබුණි.

ඉඩම් හා දේපළ

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණ අයිතම සාධාරණ වටිනාකම් සැලකිය යුතු තරම් වෙනස්වීම්වලින් යුක්ත වන්නේ නම් ප්‍රත්‍යාගණනය කිරීම අවශ්‍ය වුවත්, 2015 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු. මිලියන 15,286 ක් ලෙස දක්වා තිබුණු විශ්වවිද්‍යාල 8 ක ඉඩම් වර්ෂ ගණනාවකින් තක්සේරු කර සාධාරණ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. තවද, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අක්කර 1391 ක් ඇතුළු විශ්වවිද්‍යාල 4 ක ඉඩම් අක්කර 2562 ක නීත්‍යානුකූල අයිතිය තිබුණත් වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබූ අතර විට රු.මිලියන 10,612 ක් වැයකර තිබූ අතර නේවාසිකාගාර 30 ක වැඩ අවසන් කර තිබුණු අතර නේවාසිකාගාර 18 ක වැඩ ප්‍රගතිය විශ්වවිද්‍යාල 8 ක අක්කර 1741 ක් 2015 දෙසැම්බර් 31 දින දක්වා පවරා ගෙන නොතිබුණි.

ශිෂ්‍ය සුබසාධනය

මහපොළ ශිෂ්‍යත්ව හා ශිෂ්‍යාධාර

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තොරතුරුවලට අනුව 2015 වර්ෂයේ විශ්වවිද්‍යාල 14 ක ශිෂ්‍යයන් 43,521 කට හා 2014 වර්ෂයේ ශිෂ්‍යයන් 41,310 කට මහපොළ ශිෂ්‍යත්ව ලබා දී තිබුණු අතර 2014 වර්ෂය හා සැසඳීමේදී 2015 වර්ෂයේදී ශිෂ්‍යයන් 2,211 කින් වැඩි වී තිබුණු අතර 2015 වර්ෂයේ වියදම රු.මිලියන 1,850 ක් වී තිබුණි. 2015 වර්ෂයේ ශිෂ්‍යයන් 24,997 කටද 2014 වර්ෂයේ ශිෂ්‍යයන් 25,685 කටද ශිෂ්‍යාධාර ලබා දී තිබූ අතර දෙමව්පියන්ගේ ආදායම් තත්ත්වය ඉහළයාම හේතුවෙන් 2014 ට සාපේක්ෂව 2015 වර්ෂයේ ශිෂ්‍යාධාර ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවේ 688 කින් අඩුවී තිබුණි. ඒ සඳහා 2015 වර්ෂයේදී රු.මිලියන 650 ක වියදමක් කර තිබුණි.

නේවාසිකාගාර

රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ නේවාසික ශිෂ්‍යයන් සංඛ්‍යාව 12,000 කින් වැඩි කිරීමේ මූලික අරමුණින් රු.මිලියන 13,200 ක ප්‍රතිපාදන සළසා තිබුණි. එක් නේවාසිකාගාරයක් සඳහා රු.මිලියන 220 ක සාමාන්‍ය වියදම් ඇස්තමේන්තු කර විශ්වවිද්‍යාල තුළ නේවාසිකාගාර 60 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2013 වර්ෂයේ දී ආරම්භ කර තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන සියයට 60 ක් ඉක්මවා තිබුණි. එමෙන්ම නේවාසිකාගාර 6 ක භෞතික ප්‍රගතිය සියයට 5 ක සිට සියයට 30 ක් අතර පරාසයක පැවති

අතර නේවාසිකාගාර 6 ක වැඩ ආරම්භ කර නොතිබුණි. කෙසේ වෙතත් මෙම ව්‍යාපෘතිය අදාල අමාත්‍ය මණ්ඩල තීරණ අනුව 2015 දෙසැම්බර් 31 දින වන විට අවසන් කළ යුතුව තිබුණි.

2015 වර්ෂයේ විශ්වවිද්‍යාල 13 ක ශිෂ්‍ය ශිෂ්‍යාවන් 38,269 කට එනම් සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 48 කට නේවාසිකාගාර පහසුකම් ලබා දී තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 236 ක් වැයකර තිබුණි. 2014 වර්ෂයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 35,585 කට එනම් සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 43 කට රු.මිලියන 258 ක් වැයකර නේවාසිකාගාර පහසුකම් සපයා දී තිබු අතර 2015 වර්ෂයේදී 2014 වර්ෂයට සාපේක්ෂව ශිෂ්‍යයන් 2684 කට වැඩියෙන් පහසුකම් ලබා දී තිබුණි. යථෝක්ත ව්‍යාපෘතිය සැලැසුම පරිදි නිමකර වියදමෙන් සැලකිය ප්‍රමාණයක් අඩු කර ගැනීමට හැකියාව පැවතුණි.

කාර්යය මණ්ඩල

විශ්වවිද්‍යාල 13 ක අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලය 6390 ක් වු අතර පුරප්පාඩු 1605 ක් ද අතිරික්ත සංඛ්‍යාව 142 ක්ද වී තිබුණි. අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ අනුමත සංඛ්‍යාව 9426 ක් වු අතර පුරප්පාඩු 1399 ක් හා අතිරික්ත සංඛ්‍යාව 91 ක් ද විය. මේ හේතුවෙන් වර්ෂය තුළ බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගෙන තිබු අතර අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි පුරප්පාඩු සඳහා කාර්ය පැවරුම් පදනම මත හා දෛනික වැටුප් ගෙවීමේ පදනම මත පුහුණුවන්නන් බඳවා ගෙන තිබුණි.

ඒක ශිෂ්‍ය පිරිවැය

විශ්වවිද්‍යාල 13 ක 2015 වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැයේ සාමාන්‍ය රු.265,100 ක් වු අතර එහි උපරිම වියදම වු රු.363,271 ක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ද අවම වියදම වු රු.171,481 ක් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයෙන්ද වාර්තා වී තිබුණි.

අධ්‍යයන කාර්යසාධනය

2015 හා 2014 වර්ෂයන්වලදී විවිධ උපාධි පාඨමාලා හැදෑරූ උපාධිධාරීන් පිළිවෙලින් 37,058 ක් හා 32,905 ක් පිටවී තිබුණි. 2014 වර්ෂය සමඟ සැසඳීමේදී එය සියයට 13 ක වර්ධනයකි. 2014/2015 අධ්‍යයන වර්ෂය සඳහා නව පාඨමාලා 02 ක් පමණක් හඳුන්වාදී තිබුණි. කෙසේ වෙතත් රැකියා වෙළඳපොලට සරිලන ආකාරයෙන් පාඨමාලා හඳුන්වාදීමේ ක්‍රමවේදයන් තවදුරටත් වර්ධනය කර ගැනීම වඩාත් ඵලදායී බව නිරීක්ෂණය විය.

උපයන ලද ආදායම්

විශ්වවිද්‍යාල පනත ප්‍රකාරව විශ්වවිද්‍යාල පිහිටුවීමේ අරමුණු උසස් අධ්‍යාපනය වර්ධනය කිරීම සඳහා උපාධි, පශ්චාත් උපාධි, ආචාර්ය උපාධි වැනි පාඨමාලාවන් පැවැත්වීම වුවත්, සෑම විශ්වවිද්‍යාලයක්ම හා ඒ සම්බන්ධ ආයතන විසින් සහතික පත්‍ර ඩිප්ලෝමා පාඨමාලා වැනි ද පවත්වා තිබුණි. විශ්වවිද්‍යාල 12 කින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව පශ්චාත් උපාධි, ඩිප්ලෝමා හා සහතික පත්‍ර පාඨමාලා 343 ක් පවත්වා රු. මිලියන 808.41 ක ආදායමක් උපයා තිබුණි. මෙම ආදායමින් සියයට 5 ක් පමණ ප්‍රමාණයක් විශ්වවිද්‍යාල කිහිපයකින් විශ්වවිද්‍යාල ආදායමට බැර කර තිබු අතර සමහර විශ්වවිද්‍යාලවලින් කිසිදු ආදායමක් විශ්වවිද්‍යාල ආදායමට බැර නොකර විවිධ අරමුදල්වලට බැර කර තිබුණි.

පර්යේෂණ දීමනා

2015 වර්ෂයේ විශ්වවිද්‍යාල 11 ක ආචාර්යවරු 4375 ක් සඳහා පර්යේෂණ දීමනා වශයෙන් රු.මිලියන 816 ක් ගෙවා තිබුණද, පර්යේෂණ යෝජනා සනාතන සභාව විසින් පිළිගත් කමිටුවකට ඉදිරිපත් කර නොතිබුණි. ප්‍රගතිය පිළිබඳ සමාලෝචනයක් සිදු කර ආචාර්යවරුන් සඵලදායීව මෙම කටයුතු සඳහා යොදා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කර තිබුණද, එයට අනුකූලව ක්‍රියාත්මක නොතිබුණි.

ගිවිසුම් කඩකිරීම්

1980 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා විශ්වවිද්‍යාල 13 ක ගිවිසුම් හා බැඳුම්කර කඩකරන ලද කථිකාචාර්යවරුන් සංඛ්‍යාව 463 ක් විය. මෙම කථිකාචාර්යවරුන්ගෙන් රු.මිලියන 387.5 ක මුදලක් අයකර ගැනීමට තිබුණු අතර ඒ තුළ 2010 වර්ෂයට පෙර විශ්වවිද්‍යාලය විසින් විශ්වවිද්‍යාල අණ පනත්වලට අනුකූල වන පරිදි ගිවිසුම් කොන්දේසි ඇතුළත් නොකිරීම හේතුවෙන් එම මුදල් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. නිසි පරිදි ගිවිසුම් අත්සන් නොකර විදේශ ගත වු අවස්ථාවන් ද අනාවරණය වී තිබුණි.

සංග්‍රහ වියදම් දීමනා

සංග්‍රහ වියදම් සඳහා ගෙවීම් ලෙස මාසිකව නිලධාරීන්ගේ මූලික වැටුපෙන් සියයට 8 සිට 20 දක්වා ප්‍රමාණයක සංග්‍රහ වියදම් ප්‍රතිපූර්ණය කිරීම වෙනුවට දීමනාවක් ලෙස මාසිකව ගෙවීමට හා හිමිකම් ලබන තනතුරු සංඛ්‍යාව හා ගෙවීම් ප්‍රතිශතය වැඩි කිරීමටද 2014 මාර්තු 26 දිනැති අංක 06/2014 හා 2014 ජූලි 21 දිනැති අංක 06/2014(i) දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛ ලිපිවලට අනුව අනුමත කර තිබුණි. මේ සඳහා විධිමත් පරිදි භාණ්ඩාගාර අනුමැතියක් ලබා ගෙන නොතිබුණු අතර විශ්වවිද්‍යාල 10 ක 2015 වර්ෂයේදී රු. මිලියන 14.02 ක මුදලක් සංග්‍රහ වියදම් දීමනා ලෙස ගෙවා තිබුණි.

සම්බන්ධිත පාර්ශවයන් සමඟ ඇති ගනුදෙනු හෙළිදරව් නොකිරීම

විශ්වවිද්‍යාලයේ කටයුතුවලට අදාල වන්නා වූ කාර්යයන් ඉටු කිරීම සඳහා ඇපයෙන් සීමිත සමාගම් ආරම්භ කර තිබුණු අතර මෙම සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලයේ විශ්වවිද්‍යාල පරිපාලනයට හා මූල්‍ය කළමණාකරණයට සම්බන්ධ ආචාර්යවරුන් හා ඉහළ විධායක නිළධාරීන් සම්බන්ධ වී තිබුණි. නමුත් සම්බන්ධිත පාර්ශව සමඟ වූ බැඳියාව මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි. විශ්වවිද්‍යාලයේ කටයුතු සංවර්ධනය කිරීම සඳහා මෙය වැදගත් කටයුත්තක් විය හැකි වුවද ප්‍රතිපත්තිමය වශයෙන් සිදු වන මෙවැනි වෙනස්කම් සඳහා අදාල අනුමැතීන් හා ඒවායේ මූල්‍ය කටයුතු පාලනය කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කිරීම අත්‍යවශ්‍ය වී තිබුණි.

සප්ත වාර්ෂික නිවාඩු

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ 36 පරිච්ඡේදයේ 36.1 වැනි වගන්තිය ප්‍රකාරව සප්ත වාර්ෂික නිවාඩු පිළිබඳ විධිවිධාන සළසා තිබුණු අතර මෙම නිවාඩු ලබා ගත් නිලධාරීන් වෙත ගෙවීම්

කිරීමේදී යම් නිශ්චිත ක්‍රියාකාරකමක් වෙනුවෙන් ගෙවන දීමනා එම කටයුත්ත ඉටු නොකරන අවස්ථාවලදී සප්ත වාර්ෂික නිවාඩු ගෙවීම්වලට ඇතුළත් කර විශ්වවිද්‍යාලය විසින් ගෙවා තිබුණි. මෙයට අතිරේකව ජීවන වියදම් දීමනා එක් නිලධාරියෙකු එක් දීමනාවකට පමණක් හිමිකම් තිබුණද, රාජ්‍ය ආයතන දෙකකින්ම ජීවන වියදම් දීමනා ලබා තිබූ අවස්ථා අනාවරණය විය.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

විශ්වවිද්‍යාල පද්ධතිය තුළට ඇතුළත්වීමට නොහැකි වූ ශිෂ්‍යයන්ට විශ්වවිද්‍යාල අධ්‍යාපනය හැදෑරීමේ අවස්ථාව ලබා දීමේ මූලික අරමුණින් ගාස්තු අය කිරීමේ පදනමට ආරම්භ කර පවත්වාගෙන යන විවෘත විශ්වවිද්‍යාලයෙන් 2015 වර්ෂයේදී පාඨමාලා 67 ක් සඳහා සිසුන් 38,562 ක් බඳවාගෙන තිබුණි. 2015 වර්ෂයේදී රු.මිලියන 755.5 ක් වූ ආදායමක් ලබා ගෙන තිබුණි. 2014 වර්ෂයේදී පාඨමාලා 67 ක් සඳහා සිසුන් 41,344 ක් බඳවාගෙන රු.මිලියන 953 ක් උපයාගෙන තිබුණි. ඒ අනුව 2014 වර්ෂය හා සැසඳීමේදී 2015 වර්ෂයේ සිසුන් බඳවා ගැනීම සියයට 6.7 කින් අඩු වී තිබුණු අතර ආදායම සියයට 21 කින් අඩු වී තිබුණි. එමෙන්ම 2015 වර්ෂයේදී සිසුන් 3,472 ක් උපාධි හා පශ්චාත් උපාධි පාඨමාලා ද සිසුන් 4,725 ක් විවිධ සහතික පත් පාඨමාලා ද හදාරා නිමකර උපාධි සහ සහතික පත් ලබා ගෙන තිබුණි.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනය

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනය විසින් විශ්වවිද්‍යාලවලට ඇතුළත්වීමට අවස්ථාව අහිමි වූ ශිෂ්‍යයන් වෙනුවෙන් ඩිප්ලෝමා හා සහතික පත් පාඨමාලා පවත්වනු ලබන අතර මෙම ආයතනය උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන 11 කින් හා අංශ 6 කින් සමන්විත වේ. 2015 වර්ෂයේදී පාඨමාලා 12 ක් සඳහා ශිෂ්‍යයන් 6,942 ක් බඳවා ගෙන තිබුණි. 2015 වර්ෂයේදී ආයතනය වෙනුවෙන් රු.මිලියන 445 ක ප්‍රාග්ධන ප්‍රදාන ලබාදී තිබූ නමුත් එයින් රු.මිලියන 204 ක් හෙවත් සියයට 46 ක් උපයෝජනය කර නොතිබුණි.

බලශක්තිය

ශ්‍රී ලංකාව විදුලිය හා බලශක්තියෙන් ස්වයංපෝෂිත කිරීම සඳහා පුනර්ජනනීය බලශක්ති උත්පාදන මාර්ග ඇතුළු විවිධ මාර්ගයන්ගෙන් විදුලිය උත්පාදනය කිරීම සහ බොරතෙල් ආනයන කිරීම, පිරිපහදු කිරීම, ගබඩා කිරීම හා බෙදා හැරීම මගින් රටේ ඛනිජතෙල් ඉල්ලුම සපුරාලීම සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය, ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යන අමාත්‍යාංදෙක යටතට පැවැරෙන ව්‍යවස්ථාපිත ආයතන පහත සඳහන් කාර්යයන් ඉටු කළ යුතුය. ඛනිජ තෙල් සම්පත් සංවර්ධනය පිළිබඳ විෂයයන්ට හා විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩ සටහන් සහ ව්‍යාපෘති සම්පාදනය, පසු විපරම් කිරීම හා ඇගැයීම

- ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන හා ස්වභාවික ගෑස් ආනයනය කිරීම, පිරිපහදුව, ගබඩා කිරීම, බෙදාහැරීම සහ අලෙවි කිරීම.
- ඛනිජ තෙල් නිෂ්පාදනය සහ පිරිපහදුව සම්බන්ධ කටයුතු
- ඛනිජ තෙල් ගවේශණය හා ඒ ආශ්‍රිත කටයුතු
- ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රභවයන්ගෙන් ගෑස් නිෂ්පාදනය හා බෙදා හැරීම
- ඉන්ධන සැපයීම හා බෙදාහැරීමට අදාළ වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
- විදුලිබල සම්පත් පාලනය, නියාමනය හා උපයෝගීකරණය උදෙසා උචිත විදුලිබල ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම
- උචිත විදුලිබල ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම
- ජලය, තාපය, ගල් අඟුරු සහ සුළං යන මූලාශ්‍රයන් මගින් විදුලි බලශක්තිය නිපදවීම සම්බන්ධ කටයුතු ගවේශනය, සැලැසුම්කරණය, අධීක්ෂණය සහ සංවර්ධනය
- ග්‍රාමීය විද්‍යුත්නය
- බලශක්ති කාර්යක්ෂමතාව ඇතිවන පරිදි ඉල්ලුම කළමනාකරණය කිරීම සහ පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය

මෙම අංශයට අදාළ ආයතනයන්වලට අදාළව අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ භූගත තෙල් නල පද්ධතිය

බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ භූගත තෙල් නල පද්ධතිය ඉදිකිරීම සඳහා රු.මිලියන 1,000 ක වියදම් ඇස්තමේන්තු කර තිබුණි. එසේම 2010 වර්ෂයේදී රු.මිලියන 5 ක් වැය කර තාක්ෂණික අධ්‍යයනයක්ද 2012 වර්ෂයේදී රු.මිලියන 1 ක් වැයකර විස්තරාත්මක සැලැසුම්ද සකස්කර තිබුණි. කෙසේ වුවද වාර්ෂික මගී ධාරිතාවය මිලියන 9 ක් දක්වා වැඩි කිරීමට 2013 සැප්තැම්බර් 5 දින අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කිරීම හේතුවෙන් එහි භූගත ඉන්ධන නල පද්ධතියෙහි විෂය පථයද වෙනස් කිරීමට සිදුවී තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා මූලධනය සපයා ගැනීමේ ගැටළු හේතුවෙන් මූල්‍ය පහසුකම් සහිතව ලංසු

කැඳවා තිබුණු අතර ඇගයීමේ කටයුතු 2016 අගෝස්තු 18 දින වන විටත් අවසන් කර නොතිබුණි.

ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය

2007 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය විසින් පුනරාවර්තන හා මූලධන වියදම් වශයෙන් පිළිවෙලින් රු.මිලියන 371.08 ක් හා රු.මිලියන 645.70 ක් වැය කර තිබුණි. එම කාල පරිච්ඡේදය තුළ ගැඹුරු මුහුදේ ගවේෂණ කටයුතුවලින් ලබාගත් දත්ත අලෙවි කිරීමෙන් රු. මිලියන 649.41 ක ආදායමක් ලබා ගෙන තිබුණි. කෙසේ වුවද ලබා ගෙන තිබුණු ද්විමාන භූකම්පන දත්තවලට සෑහෙන කාලයක් ගතවී තිබුණු හෙයින්ද, මන්නාරම් ද්‍රෝණියෙන් එකතු කරගෙන ඇති දත්ත ප්‍රමාණවත් නොවන නිසාද 2015 වර්ෂයේදී එම දත්ත අලෙවි කිරීමෙන් රු.මිලියන 5.63 ක ආදායමක් පමණක් රැස්කර ගෙන තිබුණි.

තෙල් ගවේෂණ කටයුතුවලින් පරිසරයට හා ජලයට වන හානිය පිළිබඳව සමීක්ෂණ කිරීම වෙනුවෙන් ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය වෙත 2015 වර්ෂයේදී රු.මිලියන 50 ක ප්‍රතිපාදන සළසා දී තිබුණි. මෙම කාර්යය නාරා ආයතනයට පවරා 2015 දෙසැම්බර් 31 දින ගිවිසුම් අත්සන් කර වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරමක් වශයෙන් රු.මිලියන 7.43 ක් ගෙවා තිබුණි. 2016 අගෝස්තු 31 දිනට පෙර මෙම කටයුතු අවසන් කළ යුතු වුවත්, විගණන දිනය වූ 2016 අගෝස්තු 19 දින වන විටත් සැලකිය යුතු ප්‍රගතියක් අනාවරණය වී නොතිබුණි.

සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵල

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

2015 වර්ෂය තුළ ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඉන්දියානු තෙල් සමාගම ඛනිජ තෙල් ආනයනය කිරීම සඳහා රු. බිලියන 345 ක් (එ.ජ.ඩො. මිලියන 2,541 ක්) වැය කර තිබුණු බව ශ්‍රී ලංකා මහ බැංකුවේ 2015 වාර්ෂික වාර්තාවේ සඳහන් වී තිබුණි. එම ආනයන වියදම 2015 වර්ෂයේ වර්තමාන වෙළඳපල මිලට දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 3 ක පමණ නියෝජනයක් ව තිබුණි. එය 2015 වර්ෂයේ ශ්‍රී ලංකාවේ සමස්ථ ආනයන වියදමෙන් සියයට 13 ක ප්‍රමාණයක් වී තිබුණි. තවද, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් නිමි තෙල් ආනයනය කිරීම සඳහා 2014 සහ 2015 වර්ෂවල කර තිබුණු වියදම පිළිවෙලින් රු. බිලියන 294 ක් හා රු. බිලියන 208 ක් වී තිබුණි.

සංස්ථාව විසින් ආනයනය කරනු ලබන බොර තෙල් බැරලයක සාමාන්‍ය මිල 2014 වර්ෂයේ දී එ.ජ.ඩො.104.53 ක් වූ අතර, එය 2015 වර්ෂයේදී එ.ජ.ඩො. 54.80 දක්වා සියයට 47.6 කින් අඩු වී තිබුණි. 2014 වර්ෂයේ දී එ.ජ.ඩො. 886.26 ක් වූ නිමි තෙල් මෙට්‍රික් ටොන් එකක ආනයන මිල, 2015 වර්ෂයේදී එ.ජ.ඩො. 542.61 දක්වා සියයට 38.8 කින් අඩු වී තිබුණි. ජාත්‍යන්තර වෙළඳපොළේ ඛනිජ තෙල් මිල ගණන්වල අඩුවීමේ වාසිය පාරිභෝගිකයන් වෙත ලබා දීමේ රජයේ තීරණය අනුව ඒවායේ දේශීය වෙළඳපොළ මිල ගණන්ද අඩු වී තිබුණි.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 වර්ෂයේ සංස්ථාවේ මෙහෙයුම් කටයුතුවලින්

රු. මිලියන 20,176 ක බදු පෙර ශුද්ධ අලාභයට එරෙහිව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු. මිලියන 1,129 ක් වී තිබුණි. ඒ අනුව 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී පිරිහීම රු.මිලියන 21,305 ක් වී තිබුණි. ජාත්‍යන්තර වෙළඳපොළේ බනිජ තෙල් මිල ගණන්වල පහළ බැසීමේ වාසිය සංස්ථාවට නොලැබීම, 2015 වර්ෂයේ එ.ජ.ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය අඛණ්ඩව හීන වීම නිසා සිදුවූ විනිමය අලාභය, අධික බැංකු ණය හේතුවෙන් ඇතිවූ ඉහළ මූල්‍ය පිරිවැය, බනිජ තෙල් ආනයන මත අයකරනු ලබන බදු ප්‍රමාණය ඉහළ දැමීම, දැවි තෙල් සහ නැප්තා අලෙවියෙන් පාඩු සිදුවීම, හෙජින් ගනුදෙනු නිසා ඇතිවූ තිබූ පාඩු ආදිය සංස්ථාව 2015 වර්ෂයේදී අධික ශුද්ධ පාඩුවක් ලැබීමට හා මූල්‍ය ප්‍රතිඵලයේ තවදුරටත් පිරිහීමට හේතු වී තිබුණි. ඉකුත් වර්ෂයේ සංස්ථාවේ මූල්‍ය කාර්යසාධනය වර්ධනය වී තිබූ නමුත්, 2008 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අධික අලාභ ලැබීම හේතුවෙන් තව දුරටත් සංස්ථාවේ ශුද්ධ වත්කම් තත්ත්වය ඛාදනය වී තිබුණි. එබැවින් රජයේ මූල්‍ය සහාය නොමැතිව සංස්ථාව ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙසට අඛණ්ඩව පවත්වා ගැනීමට ඇති හැකියාව මතභේදයට තුඩුදෙන්නක් වී තිබුණි. .

2015 වර්ෂය සහ ඉකුත් වර්ෂ 4 ක් සඳහා සංස්ථාවේ ශුද්ධ ලාභය/(පාඩුව) හා ශුද්ධ වත්කම් තත්ත්වය පහත රූප සටහන 17 හි දැක්වේ.



රූප සටහන 17- සංස්ථාවේ ශුද්ධ ලාභය/(අලාභය)- ශුද්ධ වත්කම්වල තත්ත්වය

මූලාශ්‍රය - සංස්ථාවේ සහතික කළ මූල්‍ය වාර්තා

සංස්ථාව විසින් 2015 වර්ෂයේදී රු.මිලියන 20,176 ක අලාභයක් ලබා තිබුණද, සංස්ථාව පවත්වා ගැනීම මගින් සේවකයන්ට වැටුප් ලබාදීම, රජයට බදු ගෙවීම, රජයට විශේෂ ගාස්තු ගෙවීම හා ක්ෂයවීම් ප්‍රමාණය සැලැකිල්ලට ගත් විට 2015 වර්ෂයේදී සංස්ථාව විසින් රු.මිලියන 100,175 ක දායකත්වයක් ලබා දී තිබුණි. 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සංස්ථාව විසින් රටට ලබා දී තිබුණු දායකත්වය හා සංස්ථාව ලබා තිබුණු ලාභය/(අලාභය) පිළිබඳ තත්ත්වය රූප සටහන 18 හි දැක්වේ.



රූපසටහන 18.- සංස්ථාව ලැබූ ලාභය/(අලාභය) හා රටට එකතු කළ අගය

ඛනිජ තෙල් නිෂ්පාදනය සහ පිරිපහදුව සම්බන්ධ කටයුතු

වර්ෂ 46 ක් පැරණි සපුගස්කන්ද තෙල් පිරිපහදුවෙන් රටේ වැඩිවන ඛනිජතෙල් නිෂ්පාදන අවශ්‍යතාවය සැපයීමට නොහැකි වී තිබුණි. ඉතා අඩු පිරිවැයකට ඉන්ධන නිපදවීම සඳහා පහසුකම් සහිත නවීන පිරිපහදු සමඟ සැසඳීමේදී මෙය අඩු කාර්යක්ෂමතාවයකින් යුතුව මෙහෙයුම් සිදු කර තිබුණි. කෙසේ වුවද, තෙල් පිරිපහදුව පුළුල් කිරීම හා නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය (SOREM) 2016 ජුලි 15 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබූ අතර, මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් 2015 දෙසැම්බර් 31 දින වන විට දරන ලද රු. මිලියන 837 ක වියදම් ආර්ථික නොවන ගනුදෙනු ලෙස අනාවරණය වී තිබුණි.

ඉදිරි සුරැකුම් ගනුදෙනු (හෙජින්)

සංස්ථාව විසින් සිදු කර තිබුණු ඉදිරි සුරැකුම් ගනුදෙනු (හෙජින්) මගින් 2015 දෙසැම්බර් 31 දින වන විට රටට සිදු වී තිබුණු මුළු අලාභය රු.බිලියන 14.08 ක් වී තිබුණි. විස්තර පහත සඳහන් වගුව 17 හි දැක්වේ.

විස්තරය	වටිනාකම රු. මිලියන
සංස්ථාව මගින් දැරූ අලාභය :	
- ස්ටැන්ඩර්ඩ් චාටර්ඩ් බැංකුව	508.16
- ඩොයිෂ් බැංකුව	664.30
- කොමර්ෂල් බැංකුව	53.12
- මහජන බැංකුව	52.95
ස්ටැන්ඩර්ඩ් චාටර්ඩ් බැංකුවට පියවීම – (බේරුම් කිරීම)	7,712.98
මුදල් ලැබීම්:	
- සිටි බැංකුව (මුදල් ලැබීම්- බේරුම් කිරීම)	(152.16)
- සිටි බැංකුව (ගනුදෙනුව මත ලාභය)	(137.99)
නීති වියදම්	231.91
ගමන් වියදම්	5.26
බැංකු පොළී	250.57
අනෙකුත් වියදම්	20.14
උප එකතුව	**9,209.24**
සංස්ථාව විසින් ප්‍රතිපූර්ණය කළ මහ බැංකුව විසින් දැරූ නීති වියදම්	567.49
ඩොයිෂ් බැංකුව විසින් ශ්‍රී ලංකා ජනරජයට එරෙහිව ජාත්‍යන්තර මතභේද බේරුම් කිරීම සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානය ඉදිරියේ පවරන ලද නඩුවකට අනුව ඩොයිෂ් බැංකුව සමඟ සමථයකට එළඹීම සඳහා 2016 තුළ ගෙවන ලද මුදල (එ.ජ.ඩො.26,562,927)	3,880.84
ඉදිරි සුරකුම් ගනුදෙනු (හෙජින්) මත සංස්ථාව දැරූ මුළු පාඩුව - 2015 දෙසැම්බර් 31 දිනට	**13,6575711.**
සංස්ථාව වෙනුවෙන් මහ බැංකුව විසින් දැරූ නීති වියදම – ප්‍රතිපූර්ණය නොකළ	3.15
ශ්‍රී ලංකා රජයට එරෙහිව ඩොයිෂ් බැංකුව ඒජී ආරම්භ කර ඇති බේරුම් කිරීමේ ක්‍රියාවලිය සඳහා පෙනී සිටි විදේශ නීතිඥයින් වෙනුවෙන් මහ බැංකුව විසින් ගෙවූ මුදල	404.29
ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදුකළ වෙන්කිරීම් – ඩොයිෂ් බැංකුව ඒජී	13.08
ඉදිරි සුරකුම් ගනුදෙනුව (හෙජින්) මත රට විසින් දැරූ සමස්ථ අලාභය	**14,078.09**

වගුව 17 ඉදිරි සුරකුම් ගනුදෙනු (හෙජින්) මගින් සංස්ථාවට සිදු වී තිබුණු මුළු අලාභය

- ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉදිරි සුරකුම් ගනුදෙනුවලට අනුව වාණිජ බැංකු කීපයක් සමඟ එළඹ තිබුණු ඉදිරි සුරකුම් ගිවිසුම් සම්බන්ධයෙන් බේරුම් කිරීමේ ක්‍රියාවලියේ පාර්ශවයක් වශයෙන් සංස්ථාව කැඳවා තිබුණි. පාර්ශව අතර එළඹ තිබූ බේරුම් කිරීමේ ඔප්පුව යටතේ එ.ජ.ඩො. මිලියන 60 ක් (රු. මිලියන 7,612 ක්) ස්ටැන්ඩඩ් චාටර්ඩ් බැංකුවට 2013 ජූනි 03 දින ගෙවා තිබූ අතර ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 27 ක් (රු.මිලියන 3,880.84 ක්) ඩොයිස් බැංකුවට 2016 අගෝස්තු 04 දින ගෙවා තිබුණි. ලැබී තිබුණු

තොරතුරුවලට අනුව 2015 දෙසැම්බර් 31 දින වන විට සංස්ථාව රු.මිලියන 13,657.57 ක පාඩුවක් ලබා තිබුණි.

- සංස්ථාවේ ඉදිරි සුරකුම් ගනුදෙනුව (හෙජින්) සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නීති වියදම් වශයෙන් රු. මිලියන 570.6 ක් වැය කර තිබුණු අතර එයින් රු. මිලියන 567.5 ක් ශ්‍රී ලංකා මහ බැංකුවට 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ සංස්ථාව විසින් ප්‍රතිපූර්ණය කර තිබුණි.

- මීට අමතරව ශ්‍රී ලංකා ජනරජයට එරෙහිව ඩොයිෂ් බැංකුව ඒජී ආරම්භ කර ඇති බේරුම් කිරීමේ ක්‍රියාවලිය සඳහා පෙනී සිටි විදේශ නීතිඥයින්ගෙන් ලබාගත් සේවා සඳහා 2015 දෙසැම්බර් 31 දින වන විට ශ්‍රී ලංකා මහ බැංකුව රු. මිලියන 404.3 ක් ගෙවා තිබුණි. තවදුරටත් ශ්‍රී ලංකා මහ බැංකුව මේ සම්බන්ධයෙන් 2015 වර්ෂයේදී රු. මිලියන 13.1 ක ප්‍රතිපාදන සළසා තිබුණි.

- ඛනිජ තෙල් සංස්ථාවට එරෙහිව එ.ජ.ඩො 8,648,300 ක අයිතියක් සඳහා කොමර්ෂල් බැංකුව විසින් කොළඹ වාණිජ ඉහළ අධිකරණයේ නඩුවක් පවරා තිබුණි.

කළමනාකරණ අකාර්යක්ෂමතා

තෙල් ප්‍රවාහනය සඳහා නල මාර්ග ජාලය

කොළඹ වරාය සිට කොළොන්නාවේ පිහිටි ඛනිජතෙල් ස්ථාපිතයට ආනයනික පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් සහ දැව්තෙල් වැනි ඛනිජ තෙල් නිෂ්පාදිත ප්‍රවාහනය දශක කිහිපයකට පෙර ස්ථාපනය කරන ලද නල මාර්ගයෙන් සිදු කර තිබුණි. එම නල මාර්ග අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පවතින අතර ඉන් නල මාර්ග කිහිපයක් අළුත්වැඩියා කිරීමට නොහැකි තත්ත්වයේ පැවතීම හේතුවෙන් දැනටමත් අත්හැර දමා තිබුණි. ඛනිජ තෙල් නිෂ්පාදනවල ජාතික අවශ්‍යතාවයෙන් විශාල ප්‍රමාණයක් මෙම දිරාපත් වූ නල මාර්ග මගින් කොළොන්නාව ඉන්ධන ගබඩා පර්යන්තයට ගෙන යන බැවින් මෙම නල මාර්ග අළුත්වැඩියා කිරීම හා නවීකරණය කිරීම වහා කළ යුතු අවශ්‍යතාවයක් වී තිබුණි. එම අබලන් වූ නල මාර්ගවලින් ආනයනික පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රවාහනය කිරීම නිසා උග්‍ර ඉන්ධන අර්බුදයක් ඇතිවීමේ අවදානම විගණනයේදී බැහැර කළ නොහැකි විය.

මෙම නල මාර්ග පද්ධතියේ එක් කොටසක් එනම් කොළඹ වරාය සිට සපුගස්කන්ද තෙල් පිරිපහදුව දක්වා බොර තෙල් ප්‍රවාහනය කිරීම සඳහා ස්ථාපනය කර තිබුණු අතර නල මාර්ග පද්ධතියේ ඉතිරි කොටස පිරිපහදුවේ සිට කොළොන්නාව ඛනිජතෙල් ස්ථාපිතයට දක්වා ඛනිජ තෙල් ආශ්‍රිත නිමි නිෂ්පාදිත ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කර තිබුණි. මෙම නල මාර්ග පද්ධතිය සංස්ථාව සතුව පැවැතුණි. කොළඹ වරාය සිට කොළොන්නාව ඛනිජතෙල් ස්ථාපිතයට ආනයනික නිමි ඛනිජ තෙල් නිෂ්පාදිත ප්‍රවාහනය කිරීම සඳහා ස්ථාපනය කරන ලද නල මාර්ග පද්ධතිය සංස්ථාවේ පරිපාලිතය වන ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම (CPSTL) සතුව පැවැතුණි. එයින් සංස්ථාව සතු නල 4 කින් විෂ්කම්භය 24″ක් වූ නලය බොරතෙල් ප්‍රවාහනය සඳහාද, අනෙකුත් නල (විෂ්කම්භය 12″,8″,හා 6″) පිරිපහදුවේ සිට කොළොන්නාව ඛනිජතෙල් ස්ථාපිතයට නිමි නිෂ්පාදිත ප්‍රවාහනය සඳහාද භාවිතා කර තිබුණි. ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම යටතේ පාලනය වන ඉන්ධන නල මාර්ග 5 ක් ඇති අතර ඉන් 3 ක් අළුත්වැඩියා කිරීමට නොහැකි

තත්ත්වයේ පැවතීම හේතුවෙන් දැනටමත් එම නල මාර්ගය අත්හැර තිබුණි.

"රට හරහා නල මාර්ග ව්‍යාපෘතිය" ක්‍රියාත්මක කිරීමට 2008 වර්ෂයේ සිට වරින් වර අමාත්‍ය මණ්ඩල තීරණය කර තිබුණි. මෙම සම්පූර්ණ ව්‍යාපෘතියම ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීමේ කටයුතු කොන්ත්‍රාත්කරු විසින්ම සිදුකිරීමේ පදනම (EPC Turnkey Contract) මත සියයට 100 ක් මූල්‍යනය වන රජයෙන් රජයට (G to G) ප්‍රසම්පාදන ක්‍රමවේදය මත ක්‍රියාත්මක කිරීමට හා අදාල විදේශ දූත මණ්ඩල මගින් නිර්දේශ කරන එක් පරිපූර්ණ යෝජනාවක් පමණක් අදාල රටවල් 4 කින් කැඳවීමටද අමාත්‍ය මණ්ඩලය 2016 මැයි 10 දින තීරණය තිබුණි. ඒ අනුව ව්‍යාපෘති යෝජනා කැඳවීමට (RFP – Request for Proposal) අවශ්‍ය යෝජනාව සකස් කර ලංකා ඛනිජතෙල් ගබඩා පර්යන්ත සමාගම විසින් තාක්ෂණික ඇගයීම් කමිටුවට (TEC) යොමුකර තිබුණි.

ධීවර ඉන්ධන සහනාධාර කූපන් වැඩසටහන

ඉන්ධන මිල සංශෝධනය කිරීම මගින් ධීවර කර්මාන්තයට වූ අහිතකර බලපෑම අවම කිරීමේ අරමුණින් රජය විසින් 2012 මාර්තු සිට 2013 සැප්තැම්බර් දක්වා කාලය තුළ ධීවර කූපන් ක්‍රමය ක්‍රියාත්මක කර තිබුණු අතර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හා මහා භාණ්ඩාගාරයේ සහයෝගීත්වයෙන් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලදී. කෙසේ වෙතත්, පාලන ක්‍රමවල දුර්වලතා නිසා මෙම වැඩසටහනෙන් අපේක්ෂිත අරමුණු ඉෂ්ට කර ගැනීමට නොහැකි වී තිබුණි. අනාවරණය වූ එවැනි දුර්වලතා කිහිපයක් පහත සඳහන් කර ඇත.

- ධීවර යාත්‍රා හිමියන්, ඉන්ධන බෙදා හරින්නන් සහ මෙම කූපන් ක්‍රමය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ වෙනත් පුද්ගලයින්ගේ අවභාවිතයන් සහ අවකල් ක්‍රියාවන් නිසා රජය විසින් 2013 සැප්තැම්බර් මාසයේදී මෙම ක්‍රමය අත්හිටුවා තිබුණි.

- ධීවර යාත්‍රා හිමියන් විසින් කූපන්වලට හිමි මුළු ඉන්ධන ප්‍රමාණයම ඉන්ධන බෙදා හරින්නන්ගෙන් ලබා ගෙන ඉන්ධන සහනාධාරය භුක්ති විඳීම වෙනුවට, ධීවර කූපන්පත් වට්ටම් කර මුදල් ලබා ගැනීම හා ධීවර කූපන්වල මුහුණතෙහි සඳහන් සහනාධාර මුදලට පමණක් ඉන්ධන ලබාගැනීම සිදුවී තිබුණි.

- ව්‍යාජ කූපන් වෙනුවෙන් සංස්ථාව විසින් බෙදුම්කරුවකුට ආසන්න වශයෙන් රු. මිලියන 3 ක් පමණ ගෙවා තිබූ අතර, ව්‍යාජ කූපන්පත් අමුණා තිබීම, වෙනත් දිස්ත්‍රික්කවලට අයත් කූපන්පත් ලබාගෙන අවිධිමත් ලෙස ඉදිරිපත් කිරීම වැනි විවිධ හේතු නිසා මෙම බෙදුම්කරුට ප්‍රතිපූරණය කළ යුතු රු.මිලියන 18 කට ආසන්න මුදලක් සංස්ථාව විසින් රඳවා තබා ගෙන තිබුණි. තවද, ආසන්න වශයෙන් රු. මිලියන 6 ක් පමණ වටිනා කූපන්පත් සංස්ථාව භාර නොගැනීම නිසා එම බෙදුම්කරුභාරයේ තවදුරටත් පවතින බව අනාවරණය විය.

- ධීවර යාත්‍රා හිමියන් විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ බෙදුම්කරුවන් වෙත ඉදිරිපත් කරන ලද කූපන්පත්වල සත්‍ය වටිනාකම ඉක්මවා සංස්ථාව විසින් මහා භාණ්ඩාගාරයෙන් ආසන්න වශයෙන් රු. මිලියන 178 ක් පමණ වැඩිපුර ලබාගෙන තිබූ අතර එම මුදල නිරවුල් කිරීමට 2016 අගෝස්තු 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

- ප්‍රතිපූරණය කළ යුතු මුදල නිවැරදි බවට තහවුරු කර ගැනීමකින් තොරව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් වරින් වර බෙදුම්කරුවන්ගේ ගිණුම්වලට ආසන්න වශයෙන් රු. මිලියන 10 ක් පමණ වැඩිපුර බැර කර තිබුණි.

- ධීවර යාත්‍රා හිමියන්ට ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද නමුත් 2016 අගෝස්තු 31 දින වන විටත් ගෙවීම් සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ඉදිරිපත් කර නොතිබූ ඉන්ධන සහනාධාර කූපන්පත්වල වටිනාකම ආසන්න වශයෙන් රු. මිලියන 82 ක් පමණ විය.

ලංකා විදුලිබල මණ්ඩලය

මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලයේ වැඩිවීම

ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2014 වර්ෂයේදී උපයන ලද රු.මිලියන 15,002 ක බදු පෙර අලාභයට එරෙහිව 2015 වර්ෂයේදී රු.මිලියන 19,766 ක බදු පෙර ලාභයක් උපයා තිබුණි. ඒ අනුව 2015 වර්ෂයේදී මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 34,768 වර්ධනයක් පෙන්නුම් කෙරුණි. එම වර්ධනය කෙරෙහි ඉන්ධන ගැණුම් පිරිවැය සියයට 50 කින් අඩුවීම, විදුලි බලය මිලදී ගැනීමේ පිරිවැය සියයට 52 කින් අඩුවීමට හේතුවී තිබුණි. එසේම ජලාශවල ඉහල ජල මට්ටමක් පැවතීම හේතුවෙන් 2015 වර්ෂයේ ජනනය කරන ලද විදුලිය ගි.වො.පැය 1,435 ක් හෙවත් සියයට 32 කින් ඉහළයාම ගල් අඟුරු මත විදුලි බල නිෂ්පාදනය සියයට 39 කින් ඉහල යාම හා ඉන්ධන මත විදුලි බල නිෂ්පාදනය සියයට 47 කින් පහළ යාමද බලපා තිබුණි. එක් එක් ප්‍රභවයෙන් ජනනය කරන ලද විදුලිය පිළිබඳව සාරාංශයක් පහත වගුව 18 හි දැක්වේ.

මූලාශ්‍රය	2015 ගි.වො.පැය	2014 ගි.වො.පැය	වෙනස	
			ගි.වො.පැය	ප්‍රතිශතය
ජල විදුලිය	5,969	4,534	1,435	31.64
ඉන්ධන	2,275	4,305	(2,030)	(47.15)
ගල් අඟුරු	4,443	3,202	1,241	38.75
සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බල ශක්තිය	401	315	86	27.30
එකතුව	**13,088**	**12,356**	**732**	**5.92**

වගුව 18- 2015 මෙහෙයුම් ප්‍රතිඵලයේ වර්ධනය කෙරෙහි බල පා තිබුණු සාධක
මූලාශ්‍රය :- ලංකා විදුලිබල මණ්ඩලය විසින් නිකුත් කර ඇති සංඛ්‍යා ලේඛන දත්ත වාර්තාව

මේ අනුව මණ්ඩලය විසින් පෞද්ගලික විදුලි උත්පාදකයින්ගෙන් තාප විදුලිය මිලදී ගැනීම සඳහා 2015 වර්ෂයේදී අඩු වියදමක් කර තිබුණි. එම වියදම අඩුවීම රු.මිලියන 41,824 ක් හෙවත් සියයට 52 ක් වී තිබුණි. එමෙන්ම මුළු මෙහෙයුම් වියදම 2014 වර්ෂය හා 2015 වර්ෂය හා සැසඳීමේදී සියයට 14 කින් අඩු වී තිබුණි.

මණ්ඩලය විසින් උපයන විට බදු ගෙවීම

2007 දෙසැම්බර් 13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව 2009 වර්ෂයේ වැටුප් සංශෝධන මගින් සේවකයින්ගෙන් අයකර ගතයුතු උපයන විට ගෙවීමේ බදු එසේ අයකිරීමෙන් තොරව මණ්ඩලය විසින් රු.මිලියන 2,006 ක් ගෙවා තිබුණි.

අනුමැතියකින් තොරව කාර්යමණ්ඩලයට දීමනා ගෙවීම

1994 ජුනි 04 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව 2014 වර්ෂයේදි රු.මිලියන 849 ක් හා 2015 වර්ෂයේදී රු.මිලියන 1,144 ක් වශයෙන් එකතුව රු.මිලියන 1,993 ක් කාර්ය මණ්ඩලය වෙත විවිධ දීමනා ලෙස වරින් වර ගෙවා තිබුණි.

"විදුලක්පාය" ගොඩනැගිල්ල ඉදිකිරීම

මණ්ඩලයේ පධාන කාර්යාලය සඳහා මෙම ගොඩනැගිල් ඉදිකිරීමේ කටයුතු විකල්ප භාවිතයන් තීරණය කිරිම සඳහා 2014 වර්ෂයේදී නතරකර තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 401 ක් වැය කර තිබුණි. මෙම ඉදිකිරීම පමා කිරිමට/නවතා දැමීට හේතු වූ සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කිරිමක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

ව්‍යාපෘති සැලැසුම් කළ පරිදි ඉටු නොකිරිම

ආසියානු සංවර්ධන බැංකු ණය යටතේ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරණු ලබන ව්‍යාපෘති සැලැසුම් කළ පරිදි ක්‍රියාත්මක නොකිරීම නිසා ආසියානු සංවර්ධන බැංකුව විසින් ප්‍රමාද ගාස්තු ලෙස රු.මිලියන 64 ක ආපසු අයකර ගෙන තිබුණි.

ලක්විජය බලාගාරය

ලක්විජය බලාගාරය සඳහා 2009 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු ඇදගෙන යාමේ බෝට්ටු 02 ක්, බත්තල් 03 ක් සහ ලයින් බෝට්ටුවක් ගල් අඟුරු මෙහෙයුම් කටයුතු සඳහා නුසුදුසු බැවින් ත්‍රිකුණාමලය සහ කොළඹ වරායන්හි නිෂ්කාර්යව නවතා තබා ඇත. ඒ අනුව 2015 දෙසැම්බර් 31 දින වන විට මණ්ඩලය විසින් වැය කළ රු. මිලියන 1,307 ක් මුදල අනාර්ථික වියදමක් බවට පත්ව තිබුණි.

ග්‍රාමීය ආර්ථික කටයුතු

ශ්‍රී ලංකාවේ සමස්ථ ජනගහනයෙන් සියයට 81.6 ක් නියෝජනය කරන ග්‍රාමීය ජනතාවගේ ජීවෝනෝපායට සම්බන්ධ ග්‍රාමීය ආර්ථික කටයුතු ශ්‍රී ලංකා ආර්ථිකයේ වැදගත් කර්යභාරයක් ඉටු කරනු ලබයි. ග්‍රාමීය ජනතාවගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීම උදෙසා ජීවනෝපාය සංවර්ධනය, දේශීය ඉල්ලුමට සරිලන පරිදි ඉහළ ගුණත්වයකින් යුත් පශු සම්පත් නිෂ්පාදන වර්ධනය සහ දේශීය හා අන්තර් ජාතික වෙළඳපොල තුළ තරඟකාරීත්වයට සාර්ථකව මුහුණ දිය හැකි අයුරින් සමෘද්ධිමත් දේශීය නිෂ්පාදකයින් බිහි කිරීම මෙම අංශයෙන් අපේක්ෂා කර ඇත.

අමාත්‍යාංශය හා ඒ යටතේ දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත ආයතන 9 කින් ඉහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි. මෙම ආයතන අතරින් අරමුදල් දෙකක කටයුතු 2015 වර්ෂයේදී ආරම්භ කර නොතිබුණි. ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය හා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ඇතුළත්ව අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සඳහා 2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් රු.මිලියන 19,492 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර, වර්ෂය අවසාන වන විට රු.මිලියන 12,929 ක් උපයෝජනය කර තිබුණි. අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන විගණනයේදී පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

කිරි නිෂ්පාදන පිරිවැය වැඩිවීම

අමාත්‍යාංශයේ පශු සම්පත් අංශය විසින් කිරි නිෂ්පාදනය වැඩිකිරීම වෙනුවෙන් 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වර්ෂ 6 ක කාලපරිච්ඡේදය තුළදී රු.මිලියන 5,213.4 ක් වැය කර තිබුණි. (සත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ වියදම් හැර) 2010 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 126.89 කින් වැඩි කර තිබුණි. ඒ අනුව ලීටරයක කිරි නිෂ්පාදනය වැඩිකිරීමට රු.41 ක් වැය කර තිබුණි. දියර කිරි නිෂ්පාදනය සඳහා දියර කිරි ලීටරයකට රු.32.42 ක වැය වන බව ශ්‍රී ලංකා මහ බැංකුවේ 2015 වාර්ෂික වාර්තාවේ සඳහන් කර තිබුණි. ඒ අනුව ලීටරයක කිරි නිෂ්පාදනය වැඩි කිරිමට වැය කර තිබුණු පිරිවැය, ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවේ සඳහන් නිෂ්පාදන පිරිවැය සමඟ සැසඳිමේදි කිරි ලීටර් 1 ක් නිෂ්පාදනය කිරීමට වැය වන වියදම ද ඉක්මවා තිබුණි.

දියර කිරි ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය

2004 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණු දියර කිරි ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය යටතේ කිරි අලෙවි සැල් 1,250 ක් පිහිටුවීමට සැලැසුම් කර තිබුණි. 2013 දෙසැම්බර් 31 දින වන විට අලෙවි සැල් 685 ක් ආරම්භ කර තිබුණි. ඉන් අලෙවි සැල් 283 ක් පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් ආරම්භ කර තිබුණු අතර, 2015 වර්ෂය අවසන් වන විට එයින් අලෙවි සැල් 43 ක් හෙවත් සියයට 15 ක් පමණක් ක්‍රියාත්මක තත්ත්වයේ පැවතුණි. පළාත් මට්ටමින් ආරම්භ කර තිබු ඉතිරි අලෙවි සැල් 402 න් වර්තමානයේ අලවිසැල් 112 ක් හෙවත් සියයට 28 ක් පමණක් ක්‍රියාත්මක තත්ත්වයේ පැවැතුණි. අලෙවි සැල් වැසීයෑම සම්බන්ධව පසු විපරම් කිරිමක් කළ බව තහවුරු කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. 2014 වර්ෂයේදි හා 2015

වර්ෂයේදී පිළිවෙලින් රු.මිලියන 73.10 ක් හා රු.මිලියන 46.37 ක් වැය කර තිබුණත්, එම මුදල් උපයෝජන කර ආරම්භ කළ අලෙවි සැල් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

ආනයනික කිරි ගවයින් මිලදී ගැනිම

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය යටතේ ඇති ගොවිපලවල් සඳහා ආනයනික කිරි ගවයින් මිලදී ගැනීම සඳහා වූ ව්‍යාපෘතියේ පළමු හා දෙවන අදියර වෙනුවෙන් එකතුව රු.මිලියන 4,309.93 ක (ඇමරිකන් ඩොලර් මිලියන 33.69) ක මුදලක් එම කාර්ය සඳහා ටර්න් කී (Turnkey) ක්‍රමය යටතේ තෝරා ගෙන විදේශීය ආයතනයක් වෙත ගෙවා තිබුණි. ඊට අදාල සැපයුම් හා සේවාවන් සඳහා සුරක්ෂණ සහතික හා ගුණත්වය සම්බන්ධයෙන් තහවුරුවක් ලබා ගෙන නොතිබුණු අතර, ශ්‍රී ලංකාව තුළ සිදුකරන ලද ඉදිකිරීම් හා සේවාවන් සම්බන්ධයෙන් හෝ ගෙවීම් තහවුරු කිරීමට අදාළව තොරතුරු හා ලිපි ලේඛන, කිසිවක් ඉදිරිපත් කර නොතිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාවක්ද ලබාගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් 2016 ජුනි 02 දින රිදීගම ගොවිපලේ භෞතික පරීක්ෂාවේදී එහි සිදු කර තිබුණු ඉදිකිරීම්වලට අදාලව පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- 2015 වර්ෂයේදී රු. මිලියන 16.70 ක් වැය කර නිම කරන ලද දිග කිලෝ මීටර් 4.9 ක් හා පලල මීටර් 3 ක් වන අභ්‍යන්තර මාර්ගය වර්ෂයක් ඉක්මවීමටත් පෙර ඉතා අබලන් තත්ත්වයට පත්ව තිබුණි.

- ගව පැටවුන් සඳහා ගොඩනැගිලි /මඩු අළුත්වැඩියාවන් යටතේ 1” x 2” ලී භාවිතයෙන් කුඩු 600 ක් (කල් පැවැතිය නොහැකි) ඉදිකිරීම සහ කැඩුණු ඇස්බැස්ටස් තහඩු වෙනුවෙන් අළුත් තහඩු නැවත ඇතිරීම හා කොන්ක්‍රීට් බන්කරයක් සැකසීම වෙනුවෙන් පමණක් රු.මිලියන 160.15 ක් වැය කර තිබුණි. අළුත්වැඩියාව පිළිබඳ පිරිවිතරයෙහි කිසිදු විස්තරයක් නොතිබුණි.

ආනයන කිරි ගවයින්ගෙන් අපේක්ෂිත කිරි ලීටර් ප්‍රමාණයක් නොලැබිම

දෙවන අදියර යටතේ කිරි ගවයින් ආනයනයට අදාලව 2013 ජුලි 11 දිනැති අමාත්‍ය මණ්ඩල යෝජනාව සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ අනුව ඒක පුද්ගල කිරි පරිභෝජනය වැඩි කිරිමේ අරමුණින් 2012 වර්ෂයේ පළමුවන අදියර යටතේ ආනයනය කරන ලද කිරි ගවයින් 2000 ක් සාර්ථකව දේශීය පරිසරයට අනුගත වී තිබුණි. ඒ අනුව දෙවන අදියර යටතේ කිරි ගවයින් 2500 ක් ගෙන්වීම නිර්දේශ කර තිබුණි. එසේම අමාත්‍ය මණ්ඩල යෝජනාවට පදනම් වු 2009 මාර්තු 24 දිනැති ශක්‍යතා අධ්‍යයන වාර්තාව අනුව ආනයනිත එක් කිරි ගවයකුගෙන් අපේක්ෂිත කිරි ප්‍රමාණය දිනකට ලීටර් 20 ක් ලෙස තක්සේරු කර තිබුණි. 2016 මැයි මාසය වන විට ආනයනිත කිරි ගවයින්ගේ දිනකට ලබාගන්නා සාමාන්‍ය කිරි ප්‍රමාණය කිරි ගවයෙකුගෙන් පළමුවන අදියරේ ලීටර 15 ක් හා දෙවන අදියරයේදී ලීටර 16 ක කිරි ප්‍රමාණයකි. ඒ අනුව අපේක්ෂිත පරිදි කිරි නිෂ්පාදනය සිදු වී නොතිබුණි.

ආර්ථික මධ්‍යස්ථානවල ගිණුම් ඉදිරිපත් කිරීම

2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 2 ක් ඇතුළත

ආර්ථික මධ්‍යස්ථානවල මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතුව තිබුණි. කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්කවල පිහිටි ආර්ථික මධ්‍යස්ථාන 6 ක 2008 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන 26 ක් 2016 ජූනි 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද, විගණනයට ඉදිරිපත් කළ මධ්‍යස්ථාන 17 ක මූල්‍ය ප්‍රකාශන මාස 7 ක සිට වර්ෂ 6½ ක පරාසයක කාල ප්‍රමාදයකින් පසුව විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2003 පෙබරවාරි 25 දින ආරම්භ කර තිබුණු ඇඹිලිපිටිය ආර්ථික මධ්‍යස්ථානයේ 2003 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණු අතර, වීරවිල ආර්ථික මධයස්ථානයේ මූල්‍ය ප්‍රකාශන කිසිවක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

වාරියපොල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය වසා දැමීම

වාරියපොල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ කළමනාකරණ භාරයේ සමාජිකයින් 2015 අප්‍රේල් 06 දින සිට පත් කර තිබුණි. ඒ සඳහා කළමනාකරණ භාර ඔප්පුවක් විගණන දිනය වූ 2016 අප්‍රේල් 04 දින වන විටත් සකස් කර නීතිගත ලියවිල්ලක් බවට පත් කර නොතිබුණි. 2014 අප්‍රේල් 28 දින ආර්ථික මධ්‍යස්ථානය විවෘත කර කෙටි කාලයක් තුළ වසා තිබුණි. පසුව සිදු කළ නිරීක්ෂණ චාරිකාවකට අනුව එම අවස්ථාවේදී එය විවෘත කිරීම යෝග්‍ය නොවන බව වාර්තා කර තිබුණත්, එය බැහැර කරමින් රු.773,850 ක වියදමක් කර 2015 මැයි 31 දින නැවත මෙය විවෘත කර තිබුණි. 2015 ඔක්තෝබර් 26 දින වන විටත් ව්‍යාපාර පරිශ්‍රයේ සියලු කඩ නැවත වසා තිබුණි.

බූස්ස ආර්ථික මධ්‍යස්ථානය ආරම්භ නොකිරීම

බූස්ස ආර්ථික මධ්‍යස්ථානයෙහි ගොඩනැගිලි ඉදිකර තිබුණද, ආර්ථික මධ්‍යස්ථානය ආරම්භ කර නොතිබුණි. ගොඩනැගිලි සහිත භූමිය හික්කඩුව ප්‍රාදේශීය ලේකම් විසින් 2014 ජූනි 05 දින සාගර විශ්ව විද්‍යාලය වෙත විධිමත්ව පවරා තිබුණි. ඉදිකර තිබුණු ගොඩනැගිලි වල් බිහිවෙමින් පැවතුණි.

මිලදී ගත් වී තොගය රජයට අලාභවන පරිදි විකිණීම

රටේ සමස්ථ වී තොග නිෂ්පාදනයෙන් සියයට 7 ක් පමණක් වී අලෙවි මණ්ඩලය මිලදී ගන්නා අතර, ඉතිරි සියයට 93 ක ප්‍රමාණය පෞද්ගලික අංශය විසින් මිලදී ගනු ලබයි. 2015 වර්ෂයේ රජය පැනවූ වී සහතික මිල මත නාඩු වී කිලෝවක් රු.45 ක් බැගින් වූ මිලකට වී අලෙවි මණ්ඩලය මිලදී ගෙන තිබුණි. 2014/15 මහ කන්නයේ සහ 2015 යල කන්නයේ මිලදී ගත් නාඩු වී තොග මෙට්‍රික් ටොන් 226,126 ක් විකිණීම සඳහා 2015 නොවැම්බර් 30 දින ලංසු කැඳවා තිබුණි. මෙට්‍රික් ටොන් 194,859 ක් වූ වී තොගය මිලදී ගැනීම සඳහා ලංසුකරුවන් 42 ක් විසින් වී කිලෝග්‍රෑම් එකක් රු.35 ක සිට රු.40 ක් දක්වා පරාසයක මිලක් මත මිලදී ගැනීමට ලංසු ඉදිරිපත් කර තිබුණි. එම මිල ගණන් මත වී තොගය අලෙවි කිරීමට කටයුතු කර නොතිබුණි. ඉදිරියේදී වෙළඳපලට අධික ලෙස සහල් ලැබීමෙන් අස්වැන්න නෙලන කාලය වන විට වී මිල පහත වැටීමේ හේතුවෙන් වී තොග සත්ත්ව ආහාර සහ සහල් පිටි සකස් කිරීම සඳහා වී කිලෝවක් රු.24 බැගින් විකුණා ගබඩා හිස් කිරීමට 2016 පෙබරවාරි 29 දින අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිලධාරී කමිටුව නිර්දේශ කර තිබුණි.

එකී නිර්දේශය අමාත්‍ය මණ්ඩල අනු කමිටුව මඟින් 2016 මාර්තු 01 දින අනුමත කිරීමෙන් පසු එය 2016 මාර්තු 2 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. එම අනුමැතිය පදනම් කරගෙන වී අලෙවි මණ්ඩලය විසින් 2015 වර්ෂයේ මිලදී ගත් වී තොගයෙන් මෙට්‍රික් ටොන් 93,089 ක් සත්ත්ව ආහාර සහ සහල් පිටි සකස් කිරීම සඳහා (ප්‍රසිද්ධ ලංසු කැඳවීමෙන් තොරව) සමාගම් කිහිපයක් වෙත රජයට අලාභ වන පරිදි රු.24 ක් බැගින් විකුණා තිබුණි.

වැසි පැටවුන් ඇති දැඩි කිරීමේ ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක කරා ළඟා නොවීම

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් දේශීය කිරි නිෂ්පාදනය වැඩි කිරීමේ අරමුණ ඇතිව "වැස්සි පැටවුන් ඇති දැඩි කිරීමේ ව්‍යාපෘතිය" නමින් ව්‍යාපෘතියක් 2008 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුල ක්‍රියාත්මක කර තිබුණි. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් දේශීය අරමුදල්වලින් රු.මිලියන 512.47 ක මූල්‍ය ප්‍රතිපාදන සළසා තිබුණු අතර, ඉන් රු.මිලියන 282.70 ක් වැය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ කිරි දෙනුන් 125,000 ක් ජාතික කිරි නිෂ්පාදන ක්‍රියාවලියට එක් කිරීමට ඉලක්ක කර තිබුණද, 2015 වර්ෂය අවසානයට එසේ එක්කර තිබුණු දෙනුන් සංඛ්‍යාව 54,816 ක් විය. එමෙන්ම ව්‍යාපෘතිය මඟින් ජාතික කිරි නිෂ්පාදනයට එක් කිරීමට ඉලක්කගත කිරි ප්‍රමාණය ලීටර් දශ ලක්ෂ 225 ක් වුවද, එසේ කිරි ලීටර් දශ ලක්ෂ 130.37 ක් පමණක් එක් කිරීමට හැකිවී තිබුණි. ඒ අනුව අදාල ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණුවල කාපී පෙනෙන ප්‍රගතියක් පෙන්නුම් කර නොතිබුණි.

ජල සම්පාදන හා ජලාපවහනය

ජල මූලාශ්‍රයන් හා පාරිසරික සමතුලිතතාවය සුරකිමින් පවිත්‍ර වූ පානීය ජලය නිෂ්පාදනය හා විකිණීම ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රධාන අරමුණ වන අතර රටේ මුළු ජනගහනයෙන් සියයට 46 කට නල ජලය ලබාදීම වෙනුවෙන් 2015 දෙසැම්බර් 31 දින වන විට කරන ලද ආයෝජනයේ වටිනාකම රු.බිලියන 332 ක් වි තිබුණි. ඒ අනුව මුළු ජනගහනයෙන් සියයට 54 ක් තවදුරටත් ළිං,ඇළ දොළ, ගංගා සහ වැව් යනාදී අනාරක්ෂිත ජල මූලාශ්‍ර මඟින් තම ජල අවශ්‍යතා සපුරාගන්නා අතර 2020 වර්ෂය වන විට රටේ මුළු ජනගහනයෙන් සියයට 60 කට නල ජලය ලබා දීම අපේක්ෂාව වි තිබුණි.

ජල සම්පාදන හා ජලාපවහන අංශය සම්බන්ධයෙන් 2015 වර්ෂයේදී මෙහෙයවන ලද විගණනයේ දී අනාවරණය වූ ප්‍රධාන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

මහජනයාට අවශ්‍ය ආරක්ෂිත පානීය ජලය ලබාදීම

නළ ජලය බෙදාහැරීම සඳහා අවශ්‍ය ජලය බොහෝ විට ගංගා මඟින් ලබා ගන්නා අතර අපවිත්‍ර වූ ජලය පිරිසිදු කිරීම සඳහා විශාල පිරිවැයක් දැරීමට රජයට සිදු වී තිබුණි. ආරක්ෂිත පානිය ජලය ලබාදීම හා ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් ලබාදීම සඳහා වාර්ෂිකව රජය විශාල ප්‍රාග්ධන වියදමක් කර තිබුණු අතර එය දේශීය හා විදේශීය ණය හා ආධාර වලින් මූල්‍යණය කර තිබුණි. පසුගිය වර්ෂ 5 ක කාල පරිච්ඡේදය තුළ සිදු කර තිබුණු රාජ්‍ය වියදම පහත රූප සටහන 19 හි දැක්වේ.



රූපසටහන 19- ජනතාවට අවශ්‍ය පානිය ජලය ලබාදීමට රජය වැය කළ මුදල

දේශීය අරමුදල් හා විදේශාධාර යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

නියමිත කාලය තුළ ව්‍යාපෘති නිම නොකිරිම

මූලික සැලැසුම් හා අධ්‍යයනයන් අනුව ව්‍යාපෘති නිමකිරීමේ අපේක්ෂිත කාලය තීරණය කර තිබුණද, නියැදියට භාජනය වූ ව්‍යාපෘති අතරින් සියයට 90 කට වඩා වැඩි ප්‍රමාණයක් අපේක්ෂිත කාල පරිච්ඡේදය තුළ නිමකර නොතිබුණි. මේ සඳහා විවිධ හේතූන් බලපා තිබුණද, අතිරේක කාර්යයන් හා මිල වැඩිවීම හේතුවෙන් විශාල අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් නොකිරීම

විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධව ණය දෙන ආයතන සමග ඇති කරගෙන තිබුණු ගිවිසුම් අනුව හා භාණ්ඩාගාර චක්‍රලේඛ හා නියමයන් පරිදි එක් එක් ව්‍යාපෘතිය වෙනුවෙන් ගිණුම් පිළියෙල කර විගණනය වෙත ඉදිරිපත් කළ යුතු නමුත්, විදේශාධාර ව්‍යාපෘති 12 ක් සම්බන්ධව එම අවශ්‍යතාව ඉටුකර නොතිබුණි. ඉදිරිපත් කරන ලද ගිණුම්ද නිශ්චිත කාලවකවානුව තුළ ඉදිරිපත් කිරීමට අසමත් වී තිබුණි.

උප ණය ගිවිසුම්වලට එළඹ නොතිබීම

විදේශාධාර ව්‍යාපෘති වෙනුවෙන් ශ්‍රී ලංකා රජය හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමඟ උප ණය ගිවිසුම්වලට එළඹීමෙන් තොරව ව්‍යාපෘති 16 ක් ක්‍රියාත්මක කර තිබුණි.

දේශීය බැංකු ක්‍රමයෙන් මූල්‍යාණය කිරීමෙන් අපේක්ෂිත ප්‍රතිඵල ඉටු නොවීම

විදේශාධාර ව්‍යාපෘති මගින් ඇති කර ගන්නා ගිවිසුම්වල සඳහන් කොන්දේසි අනුව විදේශීය කොන්ත්‍රාත්කරුවන් මගින් ඉදිකිරීම් සිදු කළ යුතු වීම නිසා, ඒ සඳහා ඉහළ පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි. ඒ කෙරෙහි භාණ්ඩාගාරය අවධානය යොමු කර භාණ්ඩාගාරයේ ඇපවීම මත දේශීය බැංකු මගින් මූල්‍යාණය කර ගැනීමෙන් දේශීය කොන්ත්‍රාත්කරුවන්ගේ තාක්ෂණ හා මූල්‍ය යෝජනා අනුව ඉදිකිරීම් සිදු කිරීමට තීරණය කර තිබුණි. ඒ අනුව ජල හා සනීපාරක්ෂක යෝජනා ක්‍රම 52 ක් රු.බිලියන 62.7 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. ඒ සඳහා ගෙවිය යුතු ණය පොලී අනුපාතිකය ඉහළ මට්ටමක පැවතීමත්, මූලික ඇස්තමේන්තු පිරිවැය විශාල ලෙස වැඩිවීම නිසා ආර්ථික, කාර්යක්ෂම හා ඵලදායි ලෙස අරමුදල් උපයෝජනයක් ඉන් සිදු වී නොතිබුණි.

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල නොවීම

සළකා බැලූ ව්‍යාපෘති 11 ක මූලික තක්සේරු පිරිවැය සියයට 15 ක සිට සියයට 338 ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයකින් වැඩි වී තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.1 මාර්ගෝපදේශයට පටහැනිව එකතුව රු.මිලියන 54,254.3 ක් වූ ව්‍යාපෘති 15 ක් සම්බන්ධයෙන් තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණි. ඊට අමතරව ව්‍යාපෘති 07කට අදාළව, පවත්නා අරමුදල් තහවුරු කර ගැනීමෙන් තොරව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.7.1(අ) මාර්ගෝපදේශයට පටහැනිව කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණි.

ව්‍යාපෘතිය සඳහා මිලදී ගෙන තිබුණු කැබ් රථ අපේක්ෂිත ප්‍රමිතියෙන් නොවීම

විසල් දඹුල්ල සමෝදානිත ජල සම්පාදන ව්‍යාපෘතිය ((Unsolicited) සඳහා වාහන මිලදී ගැනීමේදී වාහනවල නිෂ්පාදිත රට හා පිරිවිතර නිසි පරිදි තීරණය නොකර කුට්ටි මුදල් (LUM SUM) ක්‍රමය යටතේ වාහන 4 ක් සැපයීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට රු.මිලියන 56.05 ක් ගෙවා තිබුණි. සපයා තිබුණු ඉන්දියාවේ නිෂ්පාදිත වාහනවල ඉන්වොයිස් වටිනාකම රු.මිලියන 13.32 ක් වී තිබීමෙන් නිෂ්පාදිත රට හා පිරිවිතර තීරණය නොකිරීම හේතුවෙන් රු.මිලියන 42.73 ක අලාභයක් සිදු වී තිබුණි. ඊට අමතරව ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර කොන්ත්‍රාත්කරු විසින් යන්ත්‍ර උපකරණ, බට හා උපාංග වලින් සියයට 90 කට ආසන්න ප්‍රමාණයක් ආනයනය කර තිබූ අතර

ව්‍යාපෘතිය ආරම්භ කිරීම ප්‍රමාදවීම නිසා එම වත්කම්වල පළුදු වගකීම් කාලය ඉක්මවා තිබුණි.

ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීම

විසල් මහනුවර ජල සම්පාදන ව්‍යාපෘතියේ පළමු හා දෙවන අදියරයන්ට අදාල ණය ගිවිසුම් අනුව ප්‍රතිපූර්ණය කර ගැනිමට සුදුසුකම් නොලබන එකතුව රු.මිලියන 184.32 ක් වූ පොදු පරිපාලන හා අනෙකුත් වක්‍ර වියදම් ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනයෙන් (JICA) ප්‍රතිපූරණය කර ගෙන තිබුණි.

අසාර්ථක වූ විදේශාධාර ව්‍යාපාති

ජල පවිත්‍රාගාරය ඉදිකිරීමේ අපේක්ෂිත අරමුණු ඉටුනොවීම

අඹතලේ පානීය ජල පවිත්‍රාගාරය හා මීගමුව මුහුදු ජල පවිත්‍රාගාරය ඉදිකිරීම සඳහා ස්පාඤ්ඤ ආධාර (SETA) ලෙස යුරෝ මිලියන 12.9 ක් ලැබී තිබුණි. එසේ ලබා දී තිබුණු අරමුදල්වල ස්වභාවය කුමක්ද යන්න භාණ්ඩාගාරය විසින් මණ්ඩලය වෙත නිශ්චිතව දන්වා නොතිබුණි. ව්‍යාපෘතියේ මීගමුව මුහුදු ජල පවිත්‍රාගාරය සඳහා පානීය ජලය ලබාදෙන නල ළිඳෙහි ජල ධාරිතාව අඩුවීම, ජලයේ යකඩ හා රසායනික ද්‍රව්‍ය නිර්දේශිත මට්ටමට වඩා අඩුවීම යන හේතු මත 2010 වර්ෂයේ සිට ව්‍යාපෘතිය අක්‍රියව පැවැති අතර ජල පවිත්‍රාගාරය සඳහා රු.මිලියන 363 ක් වැය කර තිබුණි. මෙම ජල පවිත්‍රාගාරයේ වැඩ නිමකර වසර 6 ක් ඉක්මවා තිබුණද ඉන් අපේක්ෂා කළ පාරිභෝගික පානීය ජල සම්බන්ධතා 3,000 ක් ලබාදීමට මණ්ඩලය සමත් වී නොතිබුණි.

ශක්‍යතා අධ්‍යනයකින් තොරව ණය ගිවිසුම්වලට එළඹීම

යාපනය කිලිනොච්චිය ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා ජලය ලබාගැනීමේ ප්‍රධාන මූලාශ්‍රය ඉරනමඩු ජලාශය වු නමුත් ප්‍රදේශවාසි ජනතාවගේ විරෝධතා හා මූලික ශක්‍යතා අධ්‍යයනය විධිමත් පරිදි සිදුනොවීම හේතුවෙන් ව්‍යාපෘතිය 2015 වර්ෂයේ අවසාන වන විට අසාර්ථක වී තිබුණි. මෙයට විසඳුම් ලෙස මුහුදු ජලය පිරිසිදු කර ලබාදීමට සැලැසුම් කර තිබුණද ප්‍රදේශයේ ධීවරයින්ගේ විරෝධතා හේතුවෙන් එයද ක්‍රියාත්මක කළ නොහැකිය විය. ඊට විසඳුමක් ලෙස වෙනත් ප්‍රදේශයක මුහුදු ජලය පිරිසිදු කර බෙදාහැරීමට යෝජනා වී තිබුණද, ඒ හේතුවෙන් සාමාන්‍ය ජල ඒකකයක පිරිවැය කිහිප ගුණයකින් වැඩිවීමක් සිදු වන බව ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව නිවැරදි ශක්‍යතා අධ්‍යනයකින් තොරව ණය ගිවිසුම්වලට එළඹීම නිසා ව්‍යාපෘතිය යටතේ වැය කර තිබුණු රු.මිලියන 151.75 ක් අනාර්ථික වියදමක් වී තිබුණි.

කොන්ත්‍රාත්කරු බුන්වත් වීම නිසා සිදු වු අලාභයන්

මොරටුව, රත්මලාන, ජාඇල, ඒකල අප ජල ව්‍යාපෘතියේ ප්‍රධාන කොන්ත්‍රාත්කරු බුංවත් වීම හේතුවෙන් කොන්ත්‍රාත්තුව අතරමග නවතා තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6 සහ 5.4.7 මාර්ගෝපදේශ ප්‍රකාර විදේශ බැංකුවකින් රඳවාගැනීමේ සහ කාර්යසාධන සුරක්ෂිත ලබා ගැනීමේදී දේශීය බැංකුවකින් තහවුරුවක් ලබා ගත යුතු වුවද ඊට පටහැනිව ක්‍රියාකිරීම හේතුවෙන් මණ්ඩලයට එම සුරක්ෂණවලින් සිදුවූ මූල්‍යමය පාඩුව පියවා ගැනීමට නොහැකි වී තිබුණි. ඒ සඳහා අයකර ගත හැකිව තිබුණු එ.ජ.ඩො. 9,065,048 ක් වටිනා කාර්යසාධන

සුරක්ෂණය හා එ.ජ.ඩො. 7,959,086 ක ඉදිකිරීම් කොන්ත්‍රාත් වැඩ සඳහා රඳවාගැනීමේ මුදල් අයකර ගැනීමට මණ්ඩලය අසමත් වී තිබුණි. මෙම සුරක්ෂණ අයකර ගැනීමට අදාලව විදේශ නීති උපදෙස් ලබාගැනීමට රු. මිලියන 3.55 ක්ද, කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණු එ.ජ.ඩො. 6,742,787 ක්ද, තෙවන පාර්ශවයන්ට සිදු වූ හානි වෙනුවෙන් රු. මිලියන 17.81 ක්ද, ව්‍යාපෘතිය යටතේ හානි වූ මාර්ග යථා තත්ත්වයට පත්කිරීම සඳහා රු. මිලියන 23.75 ක්ද හා ව්‍යාපෘති අරමුණුවලින් බැහැරව සිදු කළ වියදම් වෙනුවෙන් රු. මිලියන 37.44 ක්ද ව්‍යාපෘතිය වැය කර තිබුණි.

ග්‍රාමීය ජල යෝජනා ක්‍රම 393 ක් අතහැර දැමීම හෝ අක්‍රියවීම

ජල මූලාශ්‍ර සිඳියාම,ජලයේ ගුණාත්වය ප්‍රමිත පරිදි නොමැති වීම ,ප්‍රජා මූල සංවිධාන විසින් නිසි පරිදි නඩත්තු කටයුතු නොකිරීම හා ඒවායේ අකාර්යක්ෂමතා ,ප්‍රජා මූල සංවිධාන මූල්‍ය පාලනය නිසි පරිදි සිදු නොවීම,නල පද්ධතියට හානි වීම, ප්‍රජා මූල සංවිධානවලට අවශ්‍ය තාක්ෂණික සහාය මණ්ඩලයෙන් නොලැබීම යන දුර්වලතා හේතුවෙන් ග්‍රාමීය ජනතාවට ජලය සැපයීම සඳහා ක්‍රියාත්මක කරන ලද ග්‍රාමීය ජල යෝජනා ක්‍රම 2,376 කින් යෝජනා ක්‍රම 393 ක් 2015 දෙසැම්බර් 31 දින වන විට අතහැර දමා හෝ අක්‍රියවී හෝ පැවැතුණි.

ඉඩමේ නිරවුල් අයිතිය තහවුරු කර ගැනීමකින් තොරව අත්තිකාරම් ගෙවීම

ගාලු ප්‍රදේශයේ අප ජලය බැහැර කිරීමේ ව්‍යාපෘතිය යටතේ අප ජලය පිරිසිදු කිරීමේ යන්ත්‍රාගාරයක් ඉදිකිරීමට ඉඩමක් ලබා ගැනීම සඳහා ඉඩමේ නිරවුල් අයිතිය තහවුරුකර ගැනීමෙන් තොරව එහි වටිනාකමෙන් සියයට 30 ක් හෙවත් රු.මිලියන 21.45 ක අත්තිකාරම් 2014 අප්‍රේල් මාසයේදී ගෙවා තිබුණි. අත්තිකාරම් මුදල ලබාගැනීමෙන් අනතුරුව අයිතිකරු ලෙස කටයුතු පෙනී සිටි පුද්ගලයා විසින් ඉඩමේ පස් ඉවත් කර තිබුණු අතර 2015 දෙසැම්බර් මාසය අවසන් වන විටත් ඉඩමේ අයිතිය නිරවුල් කරගෙන නොතිබුණි.

ගල් කැනීමේ ආදායම රාජ්‍ය ආදායමට බැර නොකිරීම

ව්‍යාපෘති වැඩබිම්වල කැනීම් කිරීමේදී ලැබෙන ගල්වලින් ලබන ආදායම් 1992 අංක 33 දරන පතල් හා ලෝහ පනතේ 26 වගන්තිය ප්‍රකාරව රජයේ ආදායමට බැර කළ යුතු වුවත්, ජල සම්පාදන ව්‍යාපෘති දෙකක් මඟින් ලැබී තිබුණු එකතුව රු. මිලියන 79.97 ක් වූ ගල් කැනීම් ආදායම් රජයේ ආදායමට බැර කර නොතිබුණි.

ඉදිකිරීම් කර්මාන්ත ඇපකාර අරමුදල් බද්ද

2005 අංක 5 දරන මුදල් පනතේ 3 වගන්තිය ප්‍රකාරව ජල සම්පාදන ව්‍යාපෘති තුනකට අදාළව එකතුව රු.මිලියන 55.9 ක ඉදිකිරීම් කර්මාන්ත ඇපකාර අරමුදල් බද්ද (CIGFL) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

ගෙවීම් නිම කර තිබුණද අමතර කොටස් සපයා නොතිබීම

අනුමත සහ අත්‍යවශ්‍ය අමතර කොටස් මිලදී ගැනීම සඳහා ආසියානු සංවර්ධන බැංකු IV ව්‍යාපෘතිය යටතේ සම්පූර්ණ මුදල වූ රු.මිලියන 23.6 ක් 2014 වසරේදී කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවා තිබුණි. එහෙත් 2015 ජූලි 30 දින වන විටත් ඉන් රු.මිලියන 17.8 ක් වටිනා අමතර කොටස් සපයා නොතිබුණි.

ආදායම් නොලබන සමස්ථ ජල ප්‍රතිශතය අඩු නොවීම

ජල කාන්දුවීම, නීත්‍යානුකූල නොවන ජල සම්බන්ධතා , නොමිලේ ලබාදෙන ජලය හා පරිපාලන ගැටළු යනාදී හේතුන් නිසා 2015 වර්ෂයේදී මණ්ඩලයේ සමස්ථ ජල නිෂ්පාදිතය වූ ඒකක මිලියන 600 කින් සියයට 27.27 ක් හා කොළඹ නගරය තුළ බෙදාහරින ලද ජල ඒකක මිලියන 106.21 කින් සියයට 46 ක ප්‍රමාණයක් ආදායම් නොලබන ජලය ලෙස වාර්තා වී තිබුණි. එය අඩු කිරීම සඳහා විදේශාධාර ව්‍යාපෘති හයක් යටතේ එකතුව රු. මිලියන 3,100 ක වැය කර තිබූ නමුත් ආදායම් නොලබන ජල අනුපාතයේ සැලකිය යුතු අඩුවීමක් සිදු වී නොමැති බව පහත රූපසටහන 20 හි දැක්වේ.



රූප සටහන 20.ආදායම් නොලබන සමස්ථ ජල අනුපාතය

ඒ අනුව ආදායම් නොලබන එක් ජල ඒකකයක් වෙනුවෙන් පාරිභෝගිකයෙකු දැරූ අතිරේක පිරිවැය රු.7.70 ක් වූ අතර ඉකුත් වර්ෂයේ ඒකකයක අතිරේක පිරිවැය වූ රු.7.86 සමඟ සන්සන්දනය කිරීමේ දී ඒකක පිරිවැයේ අඩුවීම සියයට දෙකක් වී තිබුණි. එමෙන්ම කොළඹ නගරය තුළ ආදායම් නොලබන ජල ප්‍රමාණය 2014 වසරේ සියයට 47 ක් වූ අතර එය සියයට 40 දක්වා සියයට හතකින් අඩුකිරීමට සමාලෝචිත වර්ෂයේ දී අපේක්ෂා කළද එම ප්‍රතිශතය තවදුරටත් සියයට 46.03 ක මට්ටමේ පැවතිණ. තවද, කොළඹ නගරය තුළ එලා ඇති වසර 80 ක් පමණ පැරණි ජල නල පද්ධතිය ප්‍රතිසංස්කරණය හෝ ප්‍රතිස්ථාපනය කිරීමේ කාලීන අවශ්‍යතාවයක් තිබුණද එය ක්‍රියාත්මක වීම මන්දගාමී තත්ත්වයක පැවතුණි

වාරිමාර්ග හා ජල සම්පත්

සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් උදෙසා වාරිමාර්ග පහසුකම් සැපයීම හා ජලජසම්පත් කළමනාකරණය කිරීම සඳහා වාරිමාර්ග හා ජලජ සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ව්‍යවස්ථාපිත ආයතන 02 ක් මගින් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- වාරිමාර්ග, ජලාශ, ජල සම්පත් කළමනාකරණ විෂය පථය යටතට එන සෑම විෂයකටම අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා වැඩසටහන් හා ව්‍යාපෘති සැකැසීම හා ක්‍රියාත්මක කිරීම
- වාරිමාර්ග යෝජනා ක්‍රම ජලාපවාහන සහ ගංවතුර ආරක්ෂණ යෝජනා ක්‍රම, ලවන ජලය ඉවත් කිරීමේ යෝජනා ක්‍රම, ප්‍රවර්ධනය, ඉදිකිරීම, මෙහෙයවීම, නඩත්තුව කිරීම, නැවත සංවර්ධනය කිරිම සහ කළමනාකරණය කිරීම
- ගංගා, ඇළ දොළ සහ අනෙකුත් ජල මාර්ග දූෂණය වැලැක්වීම
- වැසි ජලය රැස්කිරීම
- ඉංජිනේරු උපදේශන සේවා සහ ඉදිකිරීම්
- ජල සම්පත් මණ්ඩල පනත ක්‍රියාත්මක කිරීම

අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව හා ව්‍යවස්ථාපිත ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරයන් ඉටුකිරීමේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

ගිංනිල්වලා හැරවීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරිම

අමාත්‍යාංශය විසින් ගිං නිල්වලා හැරවීමේ ව්‍යාපෘතිය සඳහා 2014 වර්ෂයේදී රු.මිලියන 998.58 ක් ද 2015 වර්ෂයේදී රු.මිලියන 3,012.48 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 4,011.05 ක් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් විදේශීය සමාගමකට ගෙවා තිබුණද, ව්‍යාපෘතියට අදාළ කිසිදු කාර්යයක් 2016 අප්‍රේල් 30 දින වන විටත් ඉටුකර නොතිබුණි. 2014 වර්ෂයේදී ගෙවන ලද අත්තිකාරම්වලින් රු.මිලියන 998.58 ක් එම වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. 2015 වර්ෂයේදී ගෙවා තිබුණු අත්තිකාරම් වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් තැබීම නිසා එම වැය විෂයේ රු.මිලියන 2,972.49 ක අධිවැය නිරීක්ෂණය විය.

අමාත්‍යාංශයේ විෂය පථයට නොවැටෙන කාර්යයන් ඉටු කිරිම

ත්‍රිවිධ හමුදාව සහ ශ්‍රී ලංකා පොලීසිය වෙත බෙදාහැරීම සඳහා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය වෙනුවෙන් පෙරසවි ගොඩනැගිලි මිලදී ගෙන වාරික 07 කින් ගෙවීම සඳහා 2012 ජූලි 05 දින වීන සමාගමක් සමග ගිවිසුමකට එළඹ තිබුණු අතර 2015 වර්ෂයේදී රු.මිලියන 2,774.80 ක් ගෙවා තිබුණි. 2012 වර්ෂයේ සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා රු.මිලියන 11,351.39 ක් ගෙවා තිබුණි. එම පෙරසවි ගොඩනැගිලි මිලදී ගැනීම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් කාර්යභාරයක් නොවන අතර අමාත්‍යාංශ ක්‍රියාකාරී සැලැස්මේද ඇතුළත්වී නොතිබුණි. තවද ත්‍රිවිධ හමුදාව හා පොලීසිය වෙත භාරදුන් මුලු නිවාස සංඛ්‍යාව සහ එම නිවාස සතුටුදායක ලෙස සවිකළ බවට ආයතන ප්‍රධානීන්ගෙන් ලබාගත් සහතිකද 2016 අප්‍රේල් 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

සළසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම

අමාත්‍යාංශයේ සංවර්ධන වැඩසටහන යටතේ මූලධන වැය විෂයයක් සඳහාද මෙහෙයුම් වැඩසටහන යටතේ පුනරාවර්තන වැය විෂයන් 12 ක් සඳහාද සළසා තිබුණු රු. මිලියන 47.45 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම කිසිදු උපයෝජනයක් කර නොතිබුණි.

චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව සේවකයින්ගේ පත්වීම් ස්ථිර කිරීම

2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව පත්වීම් ලිපි මගින් සනාථ නොවූ, සේවා කාලය දින 180 කට වඩා අඩු, බණ්ඩනය වූ සේවා කාලයක් සහිත සහ රජයේ සේවයට බඳවා ගැනීමේ උපරිම වයස් සීමාව ඉක්මවූ සේවකයින් 1686 දෙනෙකුට ස්ථිර පත්වීම් ප්‍රදානය කර තිබුණු අතර සේවකයින් 20 දෙනෙකුව බඳවාගෙන තිබුණු තනතුරට වඩා වෙනස් තනතුරක ස්ථිර කර තිබුණි.

කූඨ ලේඛන පදනම් කරගෙන සේවයේ ස්ථිර කිරීම

2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව අඛන්ඩ දින 180 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බව සනාථ කිරීම සඳහා කූඨ ලිපි ලේඛන සකස් කර තිබුණු සේවකයින් 03 දෙනෙකු හට ස්ථිර පත්වීම් ලබාදී තිබුණි.

ගිවිසුම් කඩකළ නිලධාරියකුගෙන් අදාළ සම්පූර්ණ මුදල අය නොකිරීම

විදේශ ශිෂ්‍යත්වයක් සඳහා විදේශ ගතවීමට සහ වෙනත් ආයතනයක සේවය සඳහා ඇප ගිවිසුම් 2 ක් මත නිලධාරිණියක ජල සම්පත් මණ්ඩලයේ සේවයෙන් මුදාහැර තිබුණද, එම ඇප ගිවිසුම් 02 කම කඩකිරීම හේතු කොටගෙන රු. මිලියන 1.38 ක් අදාල නිලධාරිණියගෙන් අය කර ගත යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු නොකර ස්ථිර වශයෙන්ම ඇය වෙනත් ආයතනයකට මුදා හැර තිබුණි.

භූගත ජලය පිළිබඳ පර්යේෂණ සැලැසුම් කළ පරිදි නිම නොකිරීම

භූගත ජලය පිළිබඳ පර්යේෂණ පැවැත්වීම ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන අරමුණක් වී තිබුණු අතර ඒ සඳහා 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පර්යේෂණ අධ්‍යයන 11 ක් ආරම්භ කර රු. මිලියන 84.41 ක් වැය කර තිබුණි. 2016 ජුනි 30 දින වන විටත් එම කිසිදු පරීක්ෂණයක් සැලැසුම් කළ පරිදි නිම කර නොතිබුණි.

මණ්ඩලයේ සේවකයින් වෙනත් ආයතනවලට මුදා හැරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 ඡේදයට පටහැනිව සේවකයින් 06 දෙනෙකු වෙනත් ආයතනවලට මුදාහැර ඔවුන්ගේ වැටුප් හා දීමනා වශයෙන් රු. මිලියන 1.70 ක් මණ්ඩලය ගෙවා තිබුණි.

රජයේ සේවය සඳහා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ

රාජ්‍ය සේවය සඳහා උරදුන් නිලධාරීන්ගේ සේවා අවසාන ප්‍රතිලාභ සහතික කිරීම තුළින් ඔවුන්ගේ විශ්‍රාමික ජීවන තත්ත්වය නගා සිටුවීම හා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සක්‍රීය දායකත්වය නිබඳව ලබාදීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මෙහෙවර වී තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාමිකයන් 560,499 කට විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබා දී තිබුණි. 2015 වර්ෂයේ රාජ්‍ය විශ්‍රාම වැටුප් වශයෙන් රු. මිලියන 157,988 ක් ගෙවා තිබුණි. එය මුළු රාජ්‍ය පුනරාවර්තන වියදමෙන් සියයට 10 ක් වී තිබුණු අතර එය මුළු රාජ්‍ය ආදායමෙන් සියයට 11 ක් වී තිබුණි.

2014 වර්ෂයේ සිට අනාවරණය වූ පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා විශ්‍රාම වැටුප් ගෙවීමේදි, වැඩිපුර ගෙවීම්, ද්විත්ව ගෙවීම්, වංචා සහගත ගෙවීම් සිදු වී තිබුණි. එම වැඩිපුර ගෙවීම් වළක්වා ගැනීමේ අරමුණ මත පදනම්ව විශ්‍රාම වැටුප් ගෙවීම ප්‍රතිව්‍යුහගත කර තිබුණි. ඒ යටතේ 2014 ජූනි මාසයේ සිට හිඟ විශ්‍රාම වැටුප් ගෙවීමද, 2014 ඔක්තෝබර් මාසයේ සිට ප්‍රථම විශ්‍රාම වැටුප් ගෙවිමද, 2015 ජනවාරි මාසයේ සිට මධ්‍යගත දත්ත පද්ධතිය ආරම්භ කර විශ්‍රාම වැටුප් ගෙවිමද හා 2015 සැප්තැම්බර් මාසයේ සිට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීමද දෙපාර්තමේන්තුව මඟින් සිදු කිරිම ආරම්භ කර තිබුණි.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය සේවයේ නියුක්තව සිට විශ්‍රාම ගිය නිලධාරින් වෙත විශ්‍රාම වැටුප් ගෙවීමේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ප්‍රතිව්‍යුහගත කිරීම තුළින් මධ්‍යගතව විශ්‍රාම වැටුප් ගෙවීම

ප්‍රතිව්‍යුහගත කිරීම තුළින් මධ්‍යගතව විශ්‍රාම වැටුප් ගෙවීමේදී ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ඇති කර නොතිබිම නිසා විවිධ අඩුපාඩු අනාවරණය විය. එවැනි අවස්ථා කිහිපයක් පහත සඳහන් වේ.

- 2015 ජනවාරි මාසයේ සිට 2015 දෙසැම්බර් මාසය දක්වා කාලය තුළ විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය පිළිබඳව සිදුකළ නියැදි පරීක්ෂාවේදී දෙපාර්තමේන්තුව මඟින් ප්‍රතිව්‍යුහගතකරණය යටතේ විශ්‍රාම වැටුප් ගෙවිමේදී විශ්‍රාමිකයෙකු වෙත දෙවරක් බැගින් විශ්‍රාමිකයින් 31 දෙනෙකුට රු.මිලියන 5.55 ක් ද, දෙවරක් බැගින් විශ්‍රාමිකයින් 134 දෙනෙකුට හිඟ විශ්‍රාම වැටුප් වශයෙන් රු.මිලියන 19.19 ක්ද, වැඩිපුර ගෙවා තිබුණි.

- පුණ්‍යාධාර දීමනාව ලබන්නන් හට හිමි නොවන රු. 2,500 ක අන්තර් දීමනාව විශ්‍රාමිකයින් 32 ක් වෙත ගෙවිම නිසා රු.මිලියන 0.47 ක් වැඩිපුර ගෙවා තිබුණි.

- යැපීම් දීමනාව විශ්‍රාමිකයින් කිහිපදෙනෙකු අතර බෙදී යන විට, අන්තර් දීමනාව නොබෙදා තනි තනි වශයෙන් මුළු දීමනාවම විශ්‍රාමිකයින් 1552 දෙනෙකු සඳහා ගෙවීම නිසා රු.මිලියන 8.54 ක් වැඩිපුර ගෙවා තිබුණි.

- ඒකාබද්ධ කර ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ඒකාබද්ධ නොකර ගෙවීම හේතුවෙන් අන්තර් දීමනාව නොබෙදා මුළු ප්‍රමාණයම විශ්‍රාමිකයන් 1575 දෙනෙකු වෙත ගෙවීම නිසා රු.මිලියන 80.61 ක් වැඩිපුර ගෙවා තිබුණි.

- රාජ්‍ය සේවයේ නියුතු වැන්දඹු විශ්‍රාම වැටුප් ලබන්නන්ට ගෙවිය හැකි උපරිම ජීවන වියදම් දීමනාව ඉක්මවා විශ්‍රාමිකයින් 102 දෙනෙකු සඳහා ජීවන වියදම් දීමනාව වශයෙන් රු.මිලියන 15.67 ක් වැඩිපුර ගෙවා තිබුණි.

විශ්‍රාම පාරිතෝෂිකයෙන් සියයට 60 ක ප්‍රමාණය මාසිකව අයකර නොතිබීම

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 වන හා 25 වන වගන්ති අනුව විශ්‍රාම පාරිතෝෂික ලබාගැනීමට මනාපය පලකර විශ්‍රාම පාරිතෝෂිකය ලබා ගෙන තිබුණු විශ්‍රාමකයන්ගෙන් ලබා ගත් පාරිතොෂිකයෙන් සියයට 60 ක ප්‍රමාණයක් ආපසු මාසික වාරික ලෙස රජය විසින් ආපසු අයකර ගත යුතුව තිබුණි. එසේ මනාපය පල කර විශ්‍රාම පාරිතෝෂික ලබා ගත් විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිසුරුවරුන්ගෙන් ලබාගෙන තිබුණු විශ්‍රාමික පාරිතෝෂික ප්‍රමාණයෙන් සියයට 60 ක ප්‍රමාණය මාසික වාරික ලෙස ආපසු අයකර ගෙන නොතිබුණි.

විශ්‍රාමික පාරිතෝෂික බැංකු ණය මගින් ගෙවීම

2014 අප්‍රේල් 09 දින වන විට 2013 හා 2014 වර්ෂවලට අදාලව ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂික අයදුම්පත් 17,029 ක් දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබිණි. එම අයදුම්පත් සම්බන්ධයෙන් විධිමත් පරිදි තොරතුරු ලබා ගැනීමෙන් තොරව බැංකු ක්‍රමය උපයෝගී කරගෙන විශ්‍රාමිකයන් වෙත පාරිතෝෂික එම විශ්‍රාමිකයන්ගේ බැංකු ගිණුම්වලට ඍජුව බැර කර තිබුණි. අයදුම්කළ විශ්‍රාමිකයන් අතර සිටි සියළු විශ්‍රාමික පළාත් සභා නිලධාරින්ගෙන් රජයට අයවිය යුතු අවකරණ මුදල්ද සමඟ පාරිතෝෂිකය විශ්‍රාමිකයින් වෙත ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කළ විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- විශ්‍රාමිකයින් 182 දෙනෙකුට රු.මිලියන 9.96 ක් විශ්‍රාම පාරිතෝෂික වැඩිපුර ගෙවා තිබුණි.

- විශ්‍රාමික පාරිතෝෂිකය බැංකු ණයක් වශයෙන් ගෙවන බැවින්, වැඩිපුර ගෙවා තිබුණු විශ්‍රාම පාරිතෝෂික වෙනුවෙන්ද රජයට සියයට 12 ක අතිරේක පොලියක් ගෙවීමට සිදු වි තිබුණි.

- ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.3 වගන්තිය ප්‍රකාරව සමස්ථ වැඩිපුර ගෙවීම් අනාවරණය කර ගැනීමට කඩිනම් පියවර ගෙන නොතිබුණි.

- 2015 වර්ෂයේදී පාරිතෝෂික ගෙවීම සඳහා රු. මිලියන 18,000 ක ප්‍රතිපාදන සළසා තිබුණද එය වැය නොකර පාරිතෝෂික මුදල් ගෙවීම සඳහා 2014 අප්‍රේල් 09 දින සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා රු. මිලියන 20,402.44 ක් රාජ්‍ය බැංකු 3 මඟින් ණය වශයෙන් ලබාගෙන ඒ සඳහා පොලී වශයෙන් රු. මිලියන 2,209.06 ක් ගෙවා තිබුණි. ඒ අනුව 2015 දෙසැම්බර් 31 දින වන විට මුළු ණය ශේෂය රු.මිලියන 19,289.29 ක් විය.

- ප්‍රථම විශ්‍රාම වැටුප ගෙවීම හා ණය යටතේ පාරිතෝෂික ගෙවීම පදනම් කර ගනිමින් පාලන ගිණුමක් පවත්වා නොතිබුණි.

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට අහිමි වූ පොලී ආදායම

2014 දෙසැම්බර් 31 දින රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට නිකුත් කරන ලද රු. මිලියන 454.00 ක් වටිනා චෙක්පත 2015 ඔක්තෝබර් මාසයේදී, මාස 9 ක ප්‍රමාදයකින් පසුව එම අරමුදල් ගිණුමට බැර කිරීම හේතුවෙන් රු. මිලියන 24 ක පොලී ආදායමක් එම අරමුදලට අහිමි වී තිබුණි.

යුද්ධයේදී මියගිය හා ආබාධිත වූ රණවිරුවන් සඳහා විශ්‍රාම වැටුප් හා දීමනා ගෙවීම

යුද්ධයේදී මියගිය හා ආබාධිත වූ රණවිරුවන් සඳහා අවුරුදු 55 දක්වා වැටුප් හා දීමනා ගෙවීම සඳහා සන්නද්ධ අංශයන් හා පොලිසීය වෙත රු.මිලියන 23,432.65 ක් ලබා දී තිබුණි. එම ගෙවීම්වලට අදාළව වියදම් වාර්තා, ප්‍රතිලාභීන් සංඛ්‍යාවන්ගේ වෙනස් වීම් හා ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අංක හෝ වැන්දඹු අනත්දරු අංක, ජාතික හැඳුනුම්පත් අංක, යැපෙන්නන් පිළිබඳ විස්තර, අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යනාදි තොරතුරු පිළිබඳව අවශ්‍ය සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොකිරීම නිසා එම වියදම් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

විදේශ තානාපති කාර්යාලයක් විසින් නොගෙවූ විශ්‍රාම වැටුප්

විදේශ තානාපති කාර්යාල වෙතින් මාසිකව නොගෙවූ විශ්‍රාම වැටුප් ආපසු ගෙන්වා ගැනීමට සුදුසු පියවර ගෙන නොතිබුණි. 2015 සැප්තැම්බර් මාසයේදී ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂාවේදී ඕස්ට්‍රේලියාවට සහ නවසීලන්තයට අදාලව 2012 වර්ෂයේ සිට 2015 සැප්තැම්බර් මාසය දක්වා රු.මිලියන 58.88 ක් වූ නොගෙවූ විශ්‍රාම වැටුප් මහ කොමසාරිස් කාර්යාලයේ රඳවාගෙන තිබුණි.

කැනඩාවේ පදිංචි විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් ගෙවීමට අදාළ අඩුපාඩු

මධ්‍යගතව දෙපාර්තමේන්තුව තුළ පවත්වාගෙන යනු ලබන විදේශ විශ්‍රාම වැටුප් ලේඛනාගාරයේ කැනඩාවේ පදිංචි විශ්‍රාමිකයන් 2773 දෙනෙකුගෙන් 762 ක නියැදියක් පරීක්ෂා කරන ලදී. එම ලිපිගොනුවල ජාතික හැඳුනුම්පත් අංකය නොමැති විශ්‍රාමිකයන් 304 දෙනෙකු ද, නියැදියට ආදාළව දත්ත පද්ධතියට ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කර නොතිබුණු 369 දෙනෙකුද, විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රය නොතිබුණු විශ්‍රාමිකයන් 162 ක්ද, ජීවත්වීමේ සහතික ඉදිරිපත් නොකළ විශ්‍රාමිකයන් 231 ක්ද, විශ්‍රාම වැටුප බැංකුව මගින් හෝ දූත මණ්ඩලය හරහා ලබා ගන්නා ආකාරය පිළිබඳ විස්තර සඳහන් කර නොතිබුණු විශ්‍රාමිකයන් 169 ක්ද සිටින බව විගණනයේදී නිරීක්ෂණය විය.

පළාත් සභා විගණන නිරීක්ෂණවල සාරාංශය

බස්නාහිර පළාත් සභාව

බස්නාහිර පළාත් සභාව විසින් 2015 වර්ෂය සඳහා රු.මිලියන 21,000 ක් රජයේ ප්‍රදාන මඟින්ද, අභ්‍යන්තර මාර්ගවලින් රු. මිලියන 35,890 ක්ද, වශයෙන් එකතුව රු.මිලියන 56,890 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. 2015 වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 50,405 ක්ද, මූලධන වියදම් සඳහා රු.මිලියන 6,455 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 56,890 ක් උපයෝජනය කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව 2015 වර්ෂයේදී රජයේ ප්‍රදාන මඟින් රු.මිලියන 21,755 ක්ද අභ්‍යන්තර මාර්ග මඟින් රු.මිලියන 34,809 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 56,564 ක් වශයෙන් ආදායම් රැස්කර තිබුණි. 2015 වර්ෂයේදී පුනරාවර්තන වියදම රු.මිලියන 49,434 ක් හා මූලධන වියදම රු.මිලියන 5,284 ක් වශයෙන් රු.මිලියන 54,718 ක් උපයෝජනය කර තිබුණි.

මේ සම්බන්ධයෙන් සිදු කරන ලද විගණනයේදි ආවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ පහත දැක්වේ.

හිඟහිටි ආදායම් එකතු කිරිමට අපොහොසත් වී තිබීම

- බස්නාහිර පළාතේ ඉඩම් බදුදීම් යටතේ දේපළ 5 කට අදාලව දීර්ඝ කාලයක සිට පැවත එන රු.මිලියන 6.83 ක ඉඩම් බදු ආදායමක් හිඟ හිටිව පැවැතුණි. එමෙන්ම වෙනත් දේපළ 10 කට අදාළව බදු ගිවිසුම් නියමිත දින වන විට අත්සන් නොකිරීම, දේපළවල වටිනාකම වර්තමානයට අනුකූල වන සේ තක්සේරු නොකිරීම හා අදාල දේපළ නිශ්චිත කාර්යයකට නොයෙදීම වැනි හේතු නිසා බදු මුදල් විධිමත් පරිදි අයකර ගැනීමට නොහැකි වී තිබුණි. එකී දේපළවලින් දේපළ 4 කට අදාලව රු.මිලියන 10.75 ක් බදු ආදායමක් ලෙස ගණනය කළ හැකිව තිබුණි.

- මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් බදුදී තිබූ බස්නැවතුම්පළ 04 ක කඩ කාමර 44 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානය වනවිට රු. මිලියන 6.38 ක හිඟ කඩ කුලියක් පැවතුණි.

රජයේ ඉඩම්වල අනවසර පදිංචිකරුවන් ඉවත් කිරිමට කටයුතු නොකිරිම

- මීගමුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් රජයේ ඉඩම් හා රක්ෂිතවල 2015 වර්ෂය අවසන් වනවිට අනවසර පදිංචිකරුවන් 712 ක් පමණ සිටින බව වාර්තා වී තිබුණි. එයින් 444 ක් පමණ 2000 වර්ෂයට පෙර සිට සිටි අනවසර පදිංචිකරුවන් විය. එමෙන්ම 44 ක අනවසර පදිංචි කාලය හඳුනාගත නොහැකි වී තිබුණි.

- දොඩම්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 800/B බටහිර දොඩම්ගොඩ උතුර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පළාත් සභාවට අයත් අක්කර 11 යි පර්චස් 26 ක් වන ගල්ලෙනයාලන්ද නැමති ඉඩමේ බදුකරු විසින් එකී ඉඩම ව්‍යාජ ඔප්පු සකස් කර පුද්ගලයන් 20 දෙනෙකුට පමණ විකුණා තිබුණි. ඒ හේතුවෙන් රජයේ ඉඩම් නියෝග 214 අනුව බදුකරය අවලංගු කරන ලෙස පළාත් ඉඩම්

- කොමසාරිස් විසින් 2014 සැප්තැම්බර් 23 දිනැතිව ප්‍රාදේශීය ලේකම් වෙත දැනුම්දී ඇත. එහෙත් 2016 ජුනි විගණන අවස්ථාව දක්වාම බදුකරය අවලංගු කිරීමක් සිදුව නොතිබුණි.

මිලදී ගෙන තිබුණු ඉදිකිරීම් හා උපකරණ ව්‍යාපෘතිය සඳහා යොදා නොගැනීම

කර්මාන්ත සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක 'පිළියන්දල' දැල්තර දැව භාණ්ඩ නිමාව සකස් කිරීමේ ව්‍යාපෘතිය 2012 වර්ෂයේදී ආරම්භ කර ඉදිකිරීම් හා උපකරණ සඳහා රු.මිලියන 2.58 ක් වැය කර තිබුණි. එම වත්කම් 2015 වර්ෂය අවසාන වන විටත් ව්‍යාපාතියේ අරමුණු ඉටු කැර ගැනීම සඳහා යොදා ගෙන නොතිබුණි.

ඵලදායක නොවූ වියදම්

2010 වර්ෂයේදී සංචාරක මණ්ඩලය විසින් මීගමුව ඒත්තුකාල වෙරළ උද්‍යානය ඉදිකිරීම ආරම්භ කර තිබුණු අතර 2015 වර්ෂය අවසාන වන විට රු.මිලියන 165.92 ක් වැය කර තිබුණි. 2015 වර්ෂය අවසාන වන විටත් එම උද්‍යානය ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා යොදවා ගෙන නොතිබුණි.

පළාත් සභා අරමුදලට බැර නොකළ ආදායම්

පෞද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව විසින් 2011 හා 2012 වර්ෂවලදී පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ ගාස්තු ලෙස රු. මිලියන 1.69 ක් වටිනා චෙක්පත් 4 ක් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙත ලබාදී තිබුණි. නමුත් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක විසින් පළාත් සභා ආදායමට එම චෙක්පත් බැර කර නොතිබුණි. එමෙන්ම එම මුදල් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් එම මුදල් යොදවා ඉටු කළ කාර්යයන් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

අපද්‍රව්‍ය මගින් විදුලිජනන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම

- අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය මගින් ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබූ කරදියාන 'අපද්‍රව්‍ය මගින් විදුලිජනන ව්‍යාපෘතිය' ආරම්භ කිරීම සඳහා 2011 වර්ෂයේදී පුද්ගලික ආයතනයක් සමඟ ගිවිසුමකටඑළඹ තිබුණි. 2015 වර්ෂය අවසාන වන විට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක මට්ටමක නොතිබුණි.

- කඩුවෙල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි ඉඩමක් 'අපද්‍රව්‍ය මගින් විදුලිය නිපදවීමේ' ව්‍යාපෘතියක් සඳහා 2012 වර්ෂයේදී අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය වෙත පවරාගෙන තිබුණි.2014 වර්ෂය අවසාන වන විටත් එම ඉඩමේ ජල, විදුලි හා ආරක්ෂක වියදම් සඳහා රු.මිලියන 1.37 ක් වැය කර තිබුණද එදින වන විටත් ව්‍යාපාතිය ක්‍රියාත්මක මට්ටමකට පත්ව නොතිබුණි.

ජලජීවී වගා ව්‍යාපෘතිය අක්‍රීය වී තිබීම

ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපාකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය විසින් 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය අවසාන විට රු.මිලියන 29.92 ක වැය කර පිටිපන ජල ජීවී වගා මධ්‍යස්ථානය ආරම්භ කර තිබුණි. එම වියදමෙන් රු.මිලියන 6.00 ක වියදමක් කර ඉදිකර තිබූ මත්ස්‍ය අභිජනන ටැංකි 68 ක්ද, රු.මිලියන 1.32 ක් වැයකර ලබාගෙන තිබූ රසායනාගාර උපකරණද ප්‍රයෝජනයට නොගැනීම නිසා ඒවා විනාශ වෙමින් පැවතුණි. එමෙන්ම මෙම පරිශ්‍රයේ පිහිටා තිබූ භූමියෙන් පර්චස් 35 ක පමණ කොටසක අනවසර කරවල වාඩියක් පවත්වාගෙන යන අතර එහි අපද්‍රව්‍ය ආසන්න කලපුවට මුදාහරිමින් පැවතුණි.

මධ්‍යම පළාත් සභාව

2015 වර්ෂයේදී මධ්‍යම පළාත් සභාව විසින් රු.මිලියන 33,584.62 ක ආදායමක් රැස්කර තිබුණු අතර රු.මිලියන 31,785.94 ක වියදමක් කර තිබුණි. 2015 වර්ෂයේදී රු.මිලියන 1,264.48 ක ආයෝජනයක් සිදු කර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කරන ලද විගණනයේදී ආවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ පහත දැක්වේ.

විධිමත් අනුමැතියකින් තොරව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන උපයෝජනය කිරීම

කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවට අයත් ජනසවිගම ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම හා ඇවිදින මන්තීරු සැකසීම සඳහා මහවැලියෙන් පවරාගත් වත්කම් ලෙස සළකා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ව්‍යාපෘති අරමුදලින් 2014 හා 2015 වර්ෂයන්හිදී රු. මිලියන 7.13 ක් ලබා දී තිබුණි. පළාත් සභා අරමුදලින් රු.මිලියන 3.29 ක් යොදවා ක්‍රීඩාපිටියේ සංවර්ධන කටයුතු කිරීම සඳහා එකතුව රු.මිලියන 10.42 ක් වැයකර තිබුණි. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ව්‍යාපෘති ප්‍රතිපාදනවලින් මෙම ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම සඳහා මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් විසින් මුදල් කොමිෂන් සභාවේ අනුමැතිය ඉල්ලා තිබුණත්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් මහවැලියෙන් පවරාගත් වත්කම්වලට අදාළව ප්‍රතිපාදන ලබා දී ඇති බැවින්, මෙම ව්‍යාපෘතිය එවැන්නක් නොවන බැවින් ඒ සඳහා එකඟතාවය ලබාදිය නොහැකි බව දැනුම්දී තිබුණි. නමුත් එම අනුමැතිය ලබා ගැනිමකින් තොරව පළාත් සභාව විසින් වියදම් කර තිබුණි.

පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ක්‍රීඩා ඇඳුම් කට්ටල 3,000 ක් මිලදී ගැනීම

2015 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව සමස්ථ ලංකා පාසල් ක්‍රීඩා තරඟ සඳහා සහභාගිවන පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ක්‍රීඩා ඇඳුම් කට්ටල 2,400 ක් ලබාදීම සඳහා මධ්‍යම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත රු.මිලියන 3.00 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා පුහුණුකරුවන් සඳහා එම ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2.93 ක් වැය කර ක්‍රීඩා ඇඳුම් කට්ටල 3,000 ක් මිලදී ගෙන තිබුණි. එම ඇඳුම් කට්ටල සමස්ථ ලංකා ක්‍රීඩා තරඟ අවසන්වූ පසු දින 66 කින් හා දින 89 කින් යන අවස්ථා දෙකකදී සපයා තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාවලියේ වූ අඩුපාඩු නිසා නිවැරදි කාල වේලාවට පාසල් ක්‍රිඩක ක්‍රීඩිකාවන්ට ඇඳුම් කට්ටල ලබා දිමට නොහැකි වි තිබුණි.

තායිලන්තය හා පිලිපීනය යන රටවල පැවති ගුරු පුහුණු වැඩමුළුව

දැනුම් ආර්ථිකයක් උදෙසා මානව ප්‍රාග්ධන පදනම ලෙස පාසල් පද්ධතිය පරිවර්තනය කිරීමේ ව්‍යාපෘති (TSEP) අරමුදලින් මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 24.23 ක් වැය කර ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 23 ක් තායිලන්තයේ හා පිලිපීනයේ පාසල් පාදක කළමනාකරණය හා පාසල් පාදක ගුරු සංවර්ධනය සඳහා පුහුණු වැඩමුළුවකට සහභාගි කර තිබුණි. මෙම

වැඩමුළුව මගින් ගුරු පුහුණුවට සෘජුවම සම්බන්ධ පූර්ව අත්දැකීම් ඇති, තමා ලබාගන්නා දැනුම බෙදාහැරීමේ හැකියාව මත පදනම්ව අදාල අරමුණට සෘජු සම්බන්ධයක් සහිත නිලධාරීන් සහභාගි කළ යුතු වුවත්, එසේ නොකර එම ව්‍යාපෘතියට සම්බන්ධිත වෙනත් නිලධාරීන් 23 ක් සහභාගි කර කරවීම නිසා අපේකෂිත අරමුණ ඉටු වී නොතිබුණි. මේ නිසා වැය කළ රු.මිලියන 24.23 ක් නිෂ්ඵල වී තිබුණි.

විදුලි ජනක යන්ත්‍ර සපයා සවි කිරිම

මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය මඟින් මධ්‍යම පළාත් සභා සංකීර්ණය සඳහා 300 KVA සහ 400 KVA ධාරිතාවයෙන් යුත් විදුලි ජනක යන්ත්‍ර 02 ක් සපයා සවිකිරීම සඳහා 2013 ජනවාරි 28 දින ලංකා විදුලිබල මණ්ඩලය වෙත රු.මිලියන 31.30 ක් ගෙවා තිබුණි. 2015 ජුනි 05 දින වන විට මුදල් ගෙවා වර්ෂ 02 කුත් මාස 04 ක් ඉක්මවා තිබුණද ඉන් රු.මිලියන 14.72 ක් වටිනා 300 KVA විදුලි ජනක යන්ත්‍රය සපයා සවිකර නොතිබුණි. පළාත් සභාව හා විදුලි බල මණ්ඩලය සමඟ ඇති කරගෙන තිබුණු ගිවිසුමේ සඳහන් කොන්දේසි විදුලිබල මණ්ඩලය මඟින් කඩකර තිබුණද, ඒ සම්බන්ධයෙන් මධ්‍යම පළාත් සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

ගැහැණු ළමයින් සඳහා රැඳවුම් මධයස්ථානයක් ඉදිකිරිම

මධ්‍යම පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන සහ පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශය විසින් උඩුනුවර වේරලවත්ත ප්‍රදේශයේ ගැහැණු ළමුන් සඳහා රැඳවුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් රු. මිලියන 10.14 ක් වැයකර තිබුණි. ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා නිර්දේශිත ස්ථානයෙන් බැහැරව හා පස් සාම්පල පරීක්ෂණයකින් තොරව බෑවුම් හා මඩ සහිත කුඹුරු යායක් ආසන්නයේ ඉදිකිරීම සිදු කර තිබුණි. මේ හේතුවෙන් ගොඩනැගිල්ල සහ ආරක්ෂිත බැම් පුපුරා ගිලා බැස තිබුණු අතර ගොඩනැගිල්ල අනාරක්ෂිත තත්ත්වයට පත්වී තිබුණි. නිර්දේශිත ස්ථානයෙන් බැහැර වීම නිසා ආරක්ෂිත බැම් ඉදිකිරීමට අමතරව වැය කළ රු.මිලියන 1.37 ක්ද ඉහත වියදමට ඇතුළත්ව තිබුණි. විගණනය සිදුකළ 2015 දෙසැම්බර් මාසය වනවිටත් මෙම ගොඩනැගිල්ල රැඳවුම් මධ්‍යස්ථානයක් ලෙස උපයෝජනය කර නොතිබුණි.

දෙවන සෞඛ්‍ය සංවර්ධන වැඩසටහන

මධ්‍යම පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දෙවන සෞඛ්‍ය සංවර්ධන වැඩසටහන යටතේ වූ රු.මිලියන 355.00 ක ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට උපයේජනය කළ පසු රු.මිලියන 103.52 ක් හෙවත් සියයට 29 ක ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි. නමුත් එම ඉතිරි වූ ප්‍රතිපාදන වියදමක් ලෙස ගිණුම්ගත කර පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

සුනඛ වන්ධ්‍යාකරණ වැඩසටහන ක්‍රියාත්මක නොකිරිම

සමාලෝචිත වර්ෂයේදී මධ්‍යම පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන සහ පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශය යටතේ සුනඛ වන්ධ්‍යාකරණ වැසටහන සඳහා රු.මිලියන 15.00 ක ප්‍රතිපාදන සළසා තිබුණි. අදාළ වැඩසටහන ක්‍රියාත්මක නොකිරීම නිසා සළසා තිබුණු මුළු ප්‍රතිපාදනය ඉතිරි කර තිබුණි.

ප්‍රසම්පාදන පටිපාටියෙන් බැහැරව කටයුතු කිරීම

මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ආරක්ෂක සේවා ගිවිසුම 2014 ජූලි 15 දින අවසන් වීමෙන් අනතුරුව එදින සිට 2015 මැයි 29 දින දක්වා මාස 10 1/2 ක කාල පරිච්ඡේදයකට සඳහා ලංසු කැඳවීමෙන් තොරව නැවතත් පෙර සැපයුම්කරු වෙතම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. අධිකාරිය විසින් ඒ සඳහා රු.මිලියන 4.33 ක් වැය කර තිබුණි.

චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව අනියම් සේවකයින් ස්ථිර කිරීම

2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 5 ඡේදය ප්‍රකාර 2014 ඔක්තෝබර් 24 දිනට දින 180 ක අවම සේවා කාලයක් සපුරා තිබුණු අනියම් සේවකයින් ස්ථිර කිරීමට හැකියාව තිබුණි. නමුත් මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් දින 180 ක සේවා කාලය සම්පූර්ණ නොකළ සේවකයින් 73 දෙනෙකු මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් චක්‍රලේඛයට පටහැනිව ස්ථිර කර ඔවුන්ට 2015 වර්ෂය සඳහා රු.මිලියන 26.55 ක වැටුප් ගෙවා තිබුණි.

උතුරු මැද පළාත් සභාව

2015 වර්ෂයේදී උතුරු මැද පළාත් සභාව විසින් රු.මිලියන 2,818 ක ආදායමක් රැස්කර තිබුණු අතර රු.මිලියන 14,903 ක වියදමක් කර තිබුණි. 2015 වර්ෂයේදී රු.මිලියන 2585 ක ආයෝජනයක් සිදු කර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කරන ලද විගණනයේදී ආවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ පහත දැක්වේ.

අතිරික්ත කාර්ය මණ්ඩලය වැටුප් හා දිමනා ගෙවීම

උතුරු මැද පළාතේ පළාත් සභා පාසල් 805 ක් තුළ අධ්‍යයන (විදුහල්පති, උප විදුහල්පති හා ගුරු භවතුන්) කාර්ය මණ්ඩලයේ සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පිළිවෙලින් 1,050 ක් හා 828 ක් පුරප්පාඩුව පැවතුණි. එම අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු හේතුවෙන් පාසල්වල ඉගෙනුම් සහ ඉගැන්වීම් කටයුතු අපේක්ෂිත මට්ටමකින් සිදු කිරීමට නොහැකි වී තිබුණි. අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සමහර තනතුරුවල 110 දෙනෙකුගේ අතිරික්ත කාර්ය මණ්ඩලයක් සිටින තත්ත්වය තුළ ඔවුන් වෙත මාසිකව ගෙවනු ලබන වැටුප් හා දිමනා අනාර්ථික වී තිබුණි.

කල් ඉකුත් වූ හා තත්ත්වයෙන් බාල ඖෂධ

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය රෝහල් 04 ක සහ සෞඛ්‍ය හා ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකයක එකතු වටිනාකම රු.මිලියන 1.43 ක් වූ ඖෂධ වර්ග 110 කට අයත් අයිතම 732,407 ක් වූ ඖෂධ ප්‍රමාණයක් කල් ඉකුත් වූ හා තත්ත්වයෙන් බාල යැයි හඳුනාගෙන භාවිතයෙන් ඉවත් කර තිබුණි.

වාහන 73 ක් වෙළෙඳ පොළ අගය ඉක්මවූ වටිනාකමකට රක්ෂණය කිරීම

උතුරු මැද පළාත් සභාවට 2015 වර්ෂයේදී තීරු බදු රහිතව මිලදී ගෙන තිබුණු ඉන්වොයිස් වටිනාකම රු.මිලියන 216.02 ක් වූ වාහන 73 ක් රක්ෂණය කිරීම සඳහා ලංසු කැඳවා තිබුණි. වාහන සැපයුම්කරුවන්ගෙන් ඒවායේ වෙළඳපොල වටිනාකම තහවුරු කර ගැනීමකින් තොරව පිරිවැය, රක්ෂණ හා ගැල් කුලී (CIF) වටිනාකම ප්‍රධාන ලේකම් විසින් රක්ෂණ සමාගම් වෙත ලබාදී තිබුණි. වාහන රක්ෂණය සඳහා මිල ගණන් ඉදිරිපත් කර තිබුණු රක්ෂණ සමාගම් විසින් විවිධ වෙළඳපොල වටිනාකම් දක්වමින් තම මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. වාහනවල ඉන්වොයිස් වටිනාකම්, රේගු බදු සහ අනෙකුත් ගෙවීම් ඇතුළත්ව රු.මිලියන 450.51 ක් වූ මුළු වටිනාකම රු.මිලියන 58.84 කින් ඉක්මවා රු.මිලියන 509.35 ක වෙළඳපොල වටිනාකමකට එකී වාහන 73 රක්ෂණය කර තිබුණි.

අලාභය පොත්වලින් ඉවත් කිරීම

අතිගරු ජනාධිපතිතුමාගේ එකඟතාවය ලබා නොගෙන ගරු පළාත් සභා මන්ත්‍රීවරුන් හා නිලධාරීන් ඇතුළු 45 දෙනෙක් 2013 වර්ෂයේදී තායිලන්තය හා කොරියාව යන රටවල සංචාරය කිරීමට සැලසුම් කර තිබුණි. සංචාරයේ අදාළ කටයුතු සූදානම් කිරීම සඳහා විදේශ සංචාරයන් සංවිධානය කරනු ලබන

ආයතනයකට රු.මිලියන 7.92 ක අත්තිකාරම් 2013 වර්ෂයේදී ගෙවා තිබුණි. අතිගරු ජනාධිපතිතුමා විසින් අදාළ සංචාරය අත්හිටුවීම හේතුවෙන් එකී අත්තිකාරම්වලින් රු.මිලියන 3.92 ක් ආපසු අයකර ගැනීමට නොහැකි වී තිබුණි. මෙම කරුණ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා උතුරු මැද පළාතේ ප්‍රධාන ලේකම් විසින් කමිටුවක් පත් කර තිබුණි. එම කමිටුව විසින් සංචාරය සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය ලබාගැනීමේ අවශ්‍යතාවයක් නොමැති බැවින් අලාභය සඳහා නිලධාරීන් වගකීමට නොබැඳෙන බව නිර්දේශ කර තිබුණි. ඒ අනුව රු.මිලියන 3.92 ක අලාභය 2014 දෙසැම්බර් 31 දින අදාළ ලේඛනවලින් කපාහැර තිබුණි.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය දුර්වලවීම

පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේදී කමත් අතුරන 365 ක් මිලදී ගෙන ගොවීන්ට ලබාදීම සඳහා ලංසු කැඳවා තිබුණි. ඒ අනුව රු.4,180 ක් වූ අවම මිල ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරු විසින් 20’ x 20’ ප්‍රමාණයේ සම්පූර්ණ කමත් අතුරනයක් වෙනුවට සියළු පිරිවිතරවලට අනුව වූ 4’ x 4’ ප්‍රමාණයේ සාම්පලයක් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවද, මෙහිදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදෙශවලට අනුව එම සැපයුම්කරු සමඟ සාකච්ඡා කර සම්පූර්ණ කමත් අතුරනයක් සාම්පල් ලෙස ලබාගැනීමට කටයුතු කිරීමකින් තොරව එම අවම මිල ප්‍රතික්ෂේප කර ඊළඟ මිල වූ එකක් රු.6,950 ක් වූ මිලට කමත් අතුරන 365 ක් ලබාගැනීම හේතුවෙන් රු.1,011,050 ක මූල්‍යමය අලාභයක් සිදුවී තිබුණි.

අනවසරයෙන් ඉදිකිරීම්

කහටගස්දිගිලිය, කැකිරාව හන්දියේ කෘෂිකර්ම උපදේශක නිල නිවාසය පිහිටි අක්කරයක් පමණ වන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ඉඩමේ බාහිර පාර්ශවයක් විසින් අනවසරයෙන් අඩි 40 x 30 ප්‍රමාණයේ වායුසමනය කරන ලද ස්ථිර ගොඩනැගිල්ලක් ඉදි කර තිබුණි. එමෙන්ම, එම ඉඩමේ අඩි 60 x 40 ප්‍රමාණයේ තවත් ස්ථිර ගොඩනැගිල්ලක් අනවසරයෙන් ඉදිකරමින් සිට වර්තමානයේදි එය අත්හැර දමා තිබුණි.

කොන්ත්‍රාත් ගිවිසුම්වල පිටපත්

පළාත් සභාවට අයත් ආයතන විසින් වාර්ෂිකව සිදු කරනු ලබන කොන්ත්‍රාත් ව්‍යාපෘති සම්බන්ධයෙන් එළඹෙන ගිවිසුම් පිටපත්වලින් විගණකාධිපති සඳහා වූ පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මේ අනුව 2015 වර්ෂයේ පළාත් සභාවේ ආයතන තුනක් සම්බන්ධයෙන් වූ පරීක්ෂාවට අනුව ගිවිසුම්ගත වටිනාකම රු.මිලියන 960.92 ක් වූ කොන්ත්‍රාත් ව්‍යාපෘති 455 කට අදාළ ගිවිසුම් පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

දකුණු පළාත් සභාව

දකුණු පළාත් සභාව විසින් 2015 වර්ෂය සඳහා රු.මිලියන 20,382 ක් රජයේ ප්‍රදාන මඟින්ද, අභ්‍යන්තර මාර්ගවලින් රු. මිලියන 6,422 ක්ද, වශයෙන් එකතුව රු.මිලියන 26,804 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. 2015 වර්ෂයේ පුනරාවර්තන වියදම් වශයෙන් රු.මිලියන 21,757 ක්ද, මූලධන වියදම් සඳහා රු.මිලියන 5,047 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 26,804 උපයෝජනය කිරිමට ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව 2015 වර්ෂයේදී රජයේ ප්‍රදාන මඟින් රු.මිලියන 23,939 ක්ද අභ්‍යන්තර මාර්ග මඟින් රු.මිලියන 6,304 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 30,243 ක ආදායම් රැස්කර තිබුණි. 2015 වර්ෂයේදී පුනරාවර්තන වියදම රු.මිලියන 25,626 ක් හා මූලධන වියදම රු.මිලියන 2,613 ක් වශයෙන් එකතුව රු.මිලියන 28,239 ක් උපයෝජනය කර තිබුණි.

දකුණු පළාත් සභාවට අදාලව 2015 වර්ෂයේදී සිදු කරනු ලැබූ නියැදි විගණනයේදී අනාවරණයවූ ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණයන් සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරිම

සමාලෝචිත වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත රු. මිලියන 175.00 ක් වශයෙන් ඇස්තමේන්තු කර තිබුණු ව්‍යාපෘති 101 ක්ද, උපමාන පාදක සංවර්ධන ප්‍රදාන යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබුණු රු. මිලියන 39.39 කට ඇස්තමේන්තු කර තිබුණු ව්‍යාපෘති 41 ක් සහ උපමාන පාදක සංවර්ධන ප්‍රදාන - මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත රු. මිලියන 19.57 කට ඇස්තමේන්තු කර තිබුණු ව්‍යාපෘති 284 ක වැඩ 2015 වර්ෂය අවසන් වන විටත් ආරම්භ කර නොතිබුණි.

වැටුප් හා දීමනා වැඩිපුර ගෙවීම

දකුණු පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අලුතින් බඳවාගත් මුරකරුවන් 42 දෙනෙකුට නියමිත වැටුප් තලයේ ආරම්භක වැටුප් පියවරේ පිහිටුවා වැටුප් නොගෙවා , 12 වන පියවරේ පිහිටුවා වැටුප් ගෙවීම හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු. මිලියන 5.16 ක් වැටුප් හා දීමනා වැඩිපුර ගෙවා තිබුණි.

හිඟ හිටි ආදායම් එකතු කිරීම

2015 වර්ෂය අවසානයට වගුව 19 හි සඳහන් ආදායම් එකතුව රු.මිලියන 716.46 ක් හිඟහිටව පැවැතුණි.

ආදායම් වර්ගය	2015 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ශේෂය
	රු.මිලියන
පිරිවැටුම් බදු	657.10
ඛණිජ බදු	2.21
ඖෂධ හා රසායන බදු	9.92
මුද්දර ගාස්තු	47.23
එකතුව	**716.46**

වගුව 19 - දකුණු පළාත් සභාවේ හිඟහිටි ආදායම්

මූලාශ්‍රය . දකුණු පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ හිඟ ආදායම් වාර්තා

මේ අනුව හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය සතුටුදායක තත්ත්වයක නොතිබුණි.

දකුණු පළාත් ක්‍රීඩා මධ්‍යස්ථානය හා ක්‍රීඩා පිටිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

බද්දේගම මාකුරුගොඩ පිහිටි දකුණු පළාත් ක්‍රීඩා මධ්‍යස්ථානය සහ ක්‍රීඩාපිටිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා 2001 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා රු. මිලියන 142.40 ක ප්‍රතිපාදන සළසා තිබුණි. ඉන් එකතුව රු. මිලියන 59.96 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- 2012 වර්ෂයේදී සළසා තිබුණු රු.මිලියන 40.00 ක ප්‍රතිපාදනයෙන් රු. මිලියන 26.43 ක් 2012 වර්ෂය අවසානයේදී ව්‍යාපෘතිය වෙනුවෙන් වැය නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. එම මුදලින් රු.මිලියන 22.29 ක් 2016 ජුනි 30 දින වන විටත් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

- ව්‍යාපෘතිය ආරම්භයේ සිට ඉදිකිරීම් කටයුතු ඉතා දුර්වල මට්ටමක පැවති අතර, 2015 හා 2016 වර්ෂයන්හිදී කොන්ත්‍රාත්කරු විසින් බිල්පත් කිසිවක් ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය ආරම්භ කර වසර 15 ක් ඉක්ම ගියද, එකී ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමට හා වැය කළ මුදලින් ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

පළාත් සභාව විසින් අක්කර 16 ක ඉඩම අත්පත් කර නොගැනීම

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් අක්කර 16 ක විශාලත්වයෙන් යුතු ඉඩම අත්පත්කර ගැනීම සඳහා 2001 වර්ෂයේදී රු. මිලියන 0.80 ක් බද්දේගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ තැන්පත් කර තිබුණු අතර, එම මුදල 2016 වර්ෂය වන විටත් එම ගිණුමේ රඳවාගෙන තිබුණි. රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් 2008 වර්ෂයේදී එම ඉඩමට රු. මිලියන 31.50 ක තක්සේරුවක් නිකුත් කර තිබුණු නමුත්, 2016 ජුනි 30 දින වන විටත් අදාළ මුදල ගෙවා එම ඉඩම අත්පත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

අභ්‍යන්තර මාර්ග වැඩි දියුණු කිරීමේ කර්මාන්තය

දකුණු පළාත් සංවර්ධන අධිකාරිය, වැලිගම වාර්ලිමවුන්ට් කර්මාන්තපුරයේ අභ්‍යන්තර මාර්ග වැඩිදියුණු කිරීමේ කර්මාන්තයේ අදියර අංක 5 සහ අදියර අංක 6 යටතේවූ මාර්ග කොටස් නවීකරණය කිරීමේදී මිලි මීටර් 100 ගල් යොදා නොතිබියදී යෙදූ බව සහතික කර රු. මිලියන 0.41 වැඩිපුර ගෙවා තිබුණි. මාර්ගයේ මිලි මීටර් 100 ගල් ස්ථරය නොයොදා මිලි මීටර් 37.5 සහ මිලි මීටර් 19 ගල් පමණක් යොදා තාර දමා නිසි ප්‍රමිතියෙන් තොරව ඉදිකර තිබුණු බැවින් එම මාර්ග කොටස් දෙක වැඩිදියුණු කිරීම සඳහා වැය කර තිබුණු රු. මිලියන 1.69 ක වියදම නිශ්ඵල වී තිබුණි.

දේනුවල සංචාරක විවේකාංගනය

රුහුණු සංචාරක කාර්යාංශයට අයත් දේනුවල සංචාරක විවේකාංගනය ඉදිකිරීම හා උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රු. මිලියන 14.31 ක්ද, නඩත්තු , පරිපාලන හා ආරක්ෂක සේවා සඳහා රු. මිලියන 1.23 ක් වශයෙන් එකතුව රු. මිලියන 15,54 ක් වැය කර තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විටත් එමගින් සංචාරක කර්මාන්තයට කිසිදු දායකත්වයක් ලැබී නොතිබුණි.

සමුද්‍ර පුරාවිද්‍යා සංචාරක නියමු ව්‍යාපෘතිය

රුහුණු සංචාරක කාර්යාංශයේ සමුද්‍ර පුරා විද්‍යා සංචාරක නියමු ව්‍යාපෘතිය යටතේ 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා උපකරණ මිලදී ගැනීමට, ප්‍රචාරක කටයුතු හා සේවක වැටුප් ගෙවීම යන කටයුතු වෙනුවෙන් එකතුව රු. මිලියන 6.34 ක් වැය කර තිබුණි. කෙසේ වුවත්, 2015 වර්ෂය අවසාන වන විටත් එම උපකරණ කිසිදු ඵලදායී කටයුත්තකට යොදවා ගෙන නොතිබුණි. එමෙන්ම ඉන් කිසිදු ආදායමක් ලබාගැනීමට නොහැකිවීම නිසා දරන ලද වියදමෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නොතිබුණි.

ව්‍යාජ සහතික ඉදිරිපත් කර තිබුණු පුද්ගලයින්ට පත්වීම් ලබාදීම

ව්‍යාජ සහතික (කූඨ ලේඛන) ඉදිරිපත් කර විදුහල්පති සේවයට, ගුරු සේවයට හා අනිකුත් සේවාවලට පත්වීම් ලබාගෙන දකුණු පළාත තුළ සේවය කරන පුද්ගලයින් 76 දෙනෙකු සිටින බව 2015 වර්ෂය ආරම්භයේදී හඳුනාගෙන තිබුණි.

විනය පරීක්ෂණ අවසන් කිරීමේ ප්‍රමාදය

පවත්වන ලද විනය පරීක්ෂණවලට අනුව පුද්ගලයින් 5 දෙනෙකු එකී චෝදනාවලින් නිදහස් කර තිබුණු අතර, තවත් 12 දෙනෙකුගේ සේවය අවසන් කර තිබුණි. 59 දෙනෙකුට අදාළ විනය පරීක්ෂණ අවසන්වී නොතිබුණු අතර, ඉන් 39 දෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා ලෙස රු. මිලියන 16.29 ක් ගෙවා තිබුණි.

මත සහතිකයේ වටිනාකමට වඩා අඩුවෙන් විකුණුම්කරයක් සහතික කිරීම

2014 ඔක්තෝබර් 16 දින රු. මිලියන 7.08 ක වටිනාකමට දකුණු පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් මත සහතිකයක් ලබාදී තිබුණු ඉඩමක් ඊට දින 8 කට පසුව එනම් 2014 ඔක්තෝබර් 24 දින එකම නීතිඥවරයෙකු විසින් එක ලඟ අංක සහිත විකුණුම්කර දෙකක් මගින් රු. මිලියන 0.60 කට හා රු. මිලියන 7.08 කට හුවමාරු කර ගෙන තිබුණි. මත සහතිකයේ වටිනාකම වඩා අඩුවෙන් විකුණුම්කරයක් සහතික කිරීම නිසා රජයට රු. මිලියන 0.26 ක මුද්දර බදු අහිමි වී තිබුණු අතර නියමිත මිලටවූ විකුණුම්කරයට අදාළ මුද්දර බදු මුදල විධිමත් අනුමැතියක් නොමැතිව පළාත් ආදායම් කොමසාරිස් විසින් නිදහස් කර තිබුණි.

රජයේ ඉඩම් බදු දීම

- ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක රජයේ ඉඩම් දීර්ඝකාලීන බදු දීම් වෙනුවෙන් බදුකරුවන් 22 දෙනෙකුගෙන් 2015 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 2.49 ක හිඟ බදු මුදලක් හා දඩ මුදලක්ද ප්‍රාදේශිය ලේකම් කාර්යාල 03 ක වාර්ෂික අවසර පත්‍ර ලාභීන් 466 දෙනෙකුගෙන් රු. මිලියන 0.91 ක හිඟ බදු හා දඩ මුදලක්ද අයවීමට තිබුණි.
- තංගල්ල හා තිස්සමහාරාම යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල බදුකරුවන් 13 දෙනෙකුගෙන් රු. මිලියන 7.57 ක දීර්ඝ කාලීන බදු හා හිඟ දඩ මුදලක් අයකර ගැනීමට 2015 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.
- ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල බල ප්‍රදේශ 05 කට අයත් බලපත්‍රධාරීන් 27 දෙනෙකුට ලබාදී තිබූ සුරාබදු බලපත්‍ර 39 ක් වෙනුවෙන් අයවිය යුතු එකතුව රු. මිලියන 12.14 ක සංශෝධිත බලපත්‍ර ගාස්තු, ප්‍රමාද ගාස්තු හා 2015 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු නොගෙවා ව්‍යාපාර කටයුතු පවත්වා තිබුණි.
- ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක් තුළ පිහිටි රජයේ ඉඩම් කට්ටි 19 ක පෞද්ගලික දුරකථන සමාගම් 06 ක් විසින් දුරකථන සන්නිවේදන කුළුණු 19 ක් ස්ථාපිත කර සම්ප්‍රේෂණ කටයුතුද ආරම්භ කර තිබුණු නමුත් ඒ වෙනුවෙන් අදාළ බදු මුදල් රජයට ගෙවා නොතිබුණි.

කිසිදු දායකත්වයක් ලබා නොගෙන වැටුප් හා දීමනා ගෙවීම

2009 ජුලි 26 දින සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා ජාතික සවිය ගම නැඟුම කාර්යයන් සඳහා අනුයුක්ත කර තිබුණු මාතර පාසලක ගුරුවරියක් අදාළ පාසලේ සේවය සඳහා වාර්තා නොකර හා දකුණු පළාත් අධ්‍යාපන සේවාවට කිසිදු දායකත්වයක් ලබා නොගෙන එම කාලපරිච්ඡේදය සඳහා වැටුප් හා දීමනා ලෙස රු. මිලියන 1.77 ක් ලබාගෙන තිබුණි.

නැගෙනහිර පළාත් සභාව

නැගෙනහිර පළාත් සභාව විසින් 2015 වර්ෂය සඳහා රු.මිලියන 20,202 ක් රජයේ ප්‍රදාන මඟින්ද, අභ්‍යන්තර මාර්ගවලින් රු. මිලියන 2,715 ක්ද, වශයෙන් එකතුව රු.මිලියන 22,917 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. 2015 වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 20,202 ක්ද, මූලධන වියදම් සඳහා රු.මිලියන 2,869 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 23,071 උපයෝජනය කිරිමට ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව 2015 වර්ෂයේදී රජයේ ප්‍රදාන මඟින් රු.මිලියන 20,158 ක්ද අභ්‍යන්තර මාර්ග මඟින් රු.මිලියන 2,705 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 22,863 ක් වශයෙන් ආදායම් රැස්කර තිබුණි. 2015 වර්ෂයේදී පුනරාවර්තන වියදම රු.මිලියන 19,896 ක් හා මූලධන වියදම රු.මිලියන 2,634 ක් වශයෙන් එකතුව රු.මිලියන 22,530 ක් උපයෝජනය කර තිබුණි.

නැගෙනහිර පළාත් සභාවට අදාලව 2015 වර්ෂයේදී සිදු කරනු ලැබූ නියැදි විගණනයේදී අනාවරණයවූ ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

හිඟහිටි ඉඩම් බදු අය කිරීම

ප්‍රාදේශිය ලේකම් කාර්යාල 5 ක් යටතේ රු.මිලියන 174.58 ක රජයේ ඉඩම් බදු ආදායම 1991 වර්ෂයේ සිට හිඟහිටව පැවැතුණු අතර 2015 දෙසැම්බර් 31 දින වන විටත් අයකර කර ගෙන නොතිබුණි.

නිවාස සංවර්ධන සැලැසුම් ප්‍රකාරව නිවාස ඉදිකිරීම

2015 වර්ෂයේදි පළාත් නිවාස අධිකාරිය විසින් පිළියෙල කර තිබුණු නිවාස සංවර්ධන සැලැස්ම ප්‍රකාරව, රු.මිලියන 2,450 ක පිරිවැය ඇස්තමේන්තුවක් යටතේ නිවාස 5,000 ක් ඉදිකිරිම සඳහා සැලැසුම් කර තිබුණි. නමුත් 2015 වර්ෂයේදි කිසිදු නිවාසයක් ඉදිකර නොතිබුණි.

Mortuary Cooler යන්ත්‍රයක් සපයා ගැනිම

කොන්ත්‍රාත්කරුවෙකු වෙත Blue Star Mortuary Cooler යන්ත්‍රයක් මිලදී ගැනිම සඳහා වූ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. එම කොන්ත්‍රාත්කරු වෙත ලංසු සුරක්ෂණයක් රහිතව රු.මිලියන 2.39 ක් 2015 දෙසැම්බර් 31 දින ගෙවා තිබුණි. 2016 ජූලි 26 දින වන විටත් එම යන්ත්‍රය සපයා නොතිබුණි.

කල් ඉකුත් වූ ඖෂධ

පළාත තුළ ක්‍රියාත්මක වූ වෛද්‍ය ආයතන 49 ක් සඳහා තථ්‍ය අවශ්‍යතාවය ඉක්මවා රු.මිලියන 7.59 ක ඖෂධ සපයා ගෙන තිබීම නිසා වර්තමානය වන විට ඒවා කල් ඉකුත් වූ තත්ත්වයේ පැවැතුණි.

ප්‍රමිතියට අනුකූල නොවූ ඖෂධ

2015 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.මිලියන 4.29 ක් වටිනා ප්‍රමිතියෙන් තොර වූ ඖෂධ විශාල ප්‍රමාණයක් ගබඩාවේ පැවතුණි. එම ඖෂධ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

ලැප්ටොප් පරිගණක හා ෆැක්ස් යන්ත්‍ර

2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ එවකට පළාත් සභා මන්ත්‍රීවරුන් සිට ලබා ගෙන තිබුණු එකතුව රු.මිලියන 3.85 ක් වටිනා ලැප්ටොප් පරිගණක 21 ක් හා ෆැක්ස් යන්ත්‍ර 21 ක් 2016 අගෝස්තු 26 දින වන විටත් ආපසු භාර දී නොතිබුණි.

මහන මැෂින් නිෂ්ක්‍රීයව පැවැතිම

2015 දෙසැම්බර් 31 දින එකතුව රු.මිලියන 1.95 ක් වටිනා මහන මැෂින් 57 ක් මිලදී ගෙන තිබුණි. 2016 අගෝස්තු 31 දින වන විටත් මැහුම් මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු නිම නොකිරීම නිසා මිලදී ගෙන තිබුණු මෙම මහන මැෂින් නිෂ්ක්‍රීයව පැවැතුණි.

britol fiber යන්ත්‍රය ක් මිලදී ගැනීම

2014 වර්ෂයේදි රු.මිලියන 1.22 ක් වැය කර මිලදි ගෙන තිබුණු britol fiber යන්ත්‍ර 2 ක් 2016 අගෝස්තු 31 දින වන විටත් අදාළ කාර්යයට සඳහා යොදා නොගෙන නිෂ්ක්‍රීයව පැවැතුණි.

ආබාධිත පුද්ගලයන්ගේ පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම

2015 වර්ෂයේදී එකතුව රු.මිලියන 16.86 ක් වැය කර ඉදිකර තිබුණු ආබාධිත පුද්ගලයින් සඳහා වන පුහුණු මධ්‍යස්ථානය 2016 අගෝස්තු 31 දින වන විටත් අදාළ කාර්යයන් සඳහා යොදා ගෙන නොතිබුණි.

මාර්ග ඉදිකිරීම සඳහා භාවිතා කරන යන්ත්‍ර නිෂ්ක්‍රීයව පැවැතිම

මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මාර්ග ඉදිකිරීමේ කටයුතු සඳහා යොදා ගන්නා එකතුව රු.මිලියන 140.28 ක් වටිනා යන්ත්‍ර වර්ග 49 ක් වසර 5 කට වැඩි කාලයක් මුළුල්ලේ නිෂ්ක්‍රියව පැවැතුණි. එම යන්ත්‍ර වෙන්දේසි කිරීමට හෝ අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

ශිෂ්‍යයින්ගෙන් හා දෙමාපියන්ගෙන් ආධාර එකතු කිරිම

පළමු ශ්‍රේණියට හා අධ්‍යායන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) හැදෑරීම සඳහා පාසලට ඇතුළත් කර ගනු ලබන ශිෂ්‍යයන්ගෙන් හා එම සිසුන්ගේ දෙමාපියන්ගෙන් ආධාර ලබා ගැනීම රජය විසින් සම්පූර්ණයෙන් තහනම් කර තිබුණත්, අම්පාර හා මඩකලපුව දිස්ත්‍රික්ක දෙකෙහි පාසල් 6 ක විදුහල්පතිවරුන් විසින් රු.මිලියන 4.79 ක ආධාර එකතු කර තිබුණි.

ගුරු පුරප්පාඩු හා අතිරික්තතා

අම්පාර දිස්ත්‍රික්කයේ පාසල්වල ගුරු අතිරික්තතා 447 ක් පැවැති අතර, මඩලකපුව හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්ක දෙකෙහි පාසල්වල ගුරු පුරප්පාඩු 152 ක් පැවැතුණි. පළාත තුළ ගුරු ස්ථාන මාරු කිරීමේ ප්‍රතිපත්තිය නිවැරදිව ක්‍රියාත්මක නොවීම නිසා මෙම පුරප්පාඩු හා අතිරික්තතා ඇති වී තිබුණි.

හිටපු පළාත් සභා මන්ත්‍රීවරුන් විසින් ලබා ගත් ණය

හිටපු පළාත් සභා මන්ත්‍රීවරුන් විසින් ලබා ගෙන තිබුණු ණය වෙනුවෙන් ගෙවිය යුතු වූ ණය වාරික හා පොලිය එකතුව රු.මිලියන 1.02 ක් වර්ෂ 4 ක සිට හිඟහිට තිබුණි.

සැපයුම්කරුවන් වෙත ලියා තැබූ චෙක්පත් කාර්යාලයේ රඳවා ගැනීම

දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය මගින් 2015 වර්ෂයේදී සෞඛ්‍ය අංශයේ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට ලබා දී තිබුණු මුදලින් ඉතිරිවන මුදල වර්ෂය අවසාන වන විට ව්‍යාපෘති කාර්යාලයට යැවිය යුතුව තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට ගනුදෙනු සිදු කිරීමකින් තොරව සැපයුම්කරුවන් කිහිපදෙනෙකුගේ නමට එකතුව රු.මිලියන 98.83 ක් වටිනා චෙක්පත් 32 ක් ලියා 2016 ජනවාරි 13 දින වන විටත් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ රඳවා ගෙන තිබුණි. ඒ අනුව වර්ෂය අවසාන වන විට ඉතිරි වූ මුදල අදාළ විධිවිධාන ප්‍රකාරව ව්‍යාපෘති කාර්යාලයට යවා නොතිබුණි.

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට ඉදිරිපත්වීම

මඩකලපුව දිස්ත්‍රික්කයේ පාසල් 3 ක් විසින්, දිස්ත්‍රික්කයේ පවතින අනෙකුත් පාසල් සමඟ සැසඳීමේදී සමත්වීමේ ප්‍රතිශතය ඉහළ මට්ටමක පවත්වා ගැනීම සඳහා 2015 වර්ෂයේදී සිසුන් 83 දෙනෙකු අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටීම වලක්වා තිබුණි. එම තත්ත්වය එම සිසුන්ගේ උසස් පෙළ අධ්‍යාපනයට බලපා තිබුණි.

උතුරු පළාත් සභාව

උතුරු පළාත් සභාව විසින් 2015 වර්ෂය සඳහා රු.මිලියන 16,268 ක් රජයේ ප්‍රදාන මඟින්ද, අභ්‍යන්තර මාර්ගවලින් රු. මිලියන 2,323 ක්ද, වශයෙන් එකතුව රු.මිලියන 18,591 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. 2015 වර්ෂයේ පුනරාවර්තන වියදම් වශයෙන් රු.මිලියන 18,591 ක්ද, මූලධන වියදම් සඳහා රු.මිලියන 2,759 ක් වශයෙන් එකතුව රු.මිලියන 21,350 ක් උපයෝජනය කිරිමට ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව 2015 වර්ෂයේදී රජයේ ප්‍රදාන මඟින් රු.මිලියන 18,815 ක්ද අභ්‍යන්තර මාර්ග මඟින් රු.මිලියන 2,232 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 21,047 ක ආදායම් රැස්කර තිබුණි. 2015 වර්ෂයේදී පුනරාවර්තන වියදම රු.මිලියන 18,373 ක් හා මූලධන වියදම රු.මිලියන 2,531 ක් වශයෙන් රු.මිලියන 20,904 ක් උපයෝජනය කර තිබුණි.

උතුරු පලාත් සභාවේ කටයුතු හා සම්බන්ධයෙන් 2015 වසර සඳහා වැදගත් විගණන නිරික්ෂණ පහත දක්වා ඇත.

විගණකාධිපති වාර්තා පළාත් සභාවේ සභාගත නොකිරිම

උතුරු පළාත් සභාව 2013 වර්ෂයේ ඔක්තෝබර් 25 දින ස්ථාපිත කළද, 2007 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ උතුරු පළාත් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තා 2016 අගෝස්තු 31 දින වන විටත්, 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 (2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාවේ සභාගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2007 වර්ෂයේ සිට විගණකාධිපති වාර්තාවල සඳහන් විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් පළාත් සභාවේ අවධානය යොමු කර ඒවා නිවැරදි කිරීමේ කටයුතු සිදු කර නොතිබුණි.

ආණ්ඩුකාරවරයාගේ භාර අරමුදල

උතුරු පළාත් සභාවේ අනුමැතිය ලබා නොගෙන උතුරු පළාතේ ආණ්ඩුකාරවරයාගේ භාර අරමුදලක් ඇති කර තිබුණි.

උතුරු පලාත් සභාවේ ආණ්ඩුකාරගේ භාරකාර අරමුදල 2007 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වී තිබිණි. 2007 ජනවාරි 01 දිනැති අංක 01/2007 දරන ආණ්ඩුකාර වරයාගේ සංදේශයේ 3 ජේදය ප්‍රකාරව මහජනයාගෙන්, සංවිධානයවලින්, සමාජ සේවා සංවිධානවලින් සහ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්ගෙන් උත්පාදනය කරන ආදායම්වලින් ලැබෙන පරිත්‍යාගයන් හෝ දායක මුදල්වලින් අරමුදලේ ආදායම් ප්‍රභවයන් සැකැසී තිබුණි. කෙසේ වුවද, 2015 වර්ෂයේදී ඉහත සඳහන් ප්‍රභවයන්ගෙන් එවැනි දායක මුදල් ලැබී නොතිබුණු අතර 2015 වර්ෂය සඳහා ආණ්ඩුකාරවරයාගේ අරමුදලේ මූල්‍ය ප්‍රකාශන විගණනයට 2015 අප්‍රේල් 24 දින ඉදිරිපත් කර තිබුණි. 2015 වසර සඳහා ආණ්ඩුකාරවරයාගේ භාර අරමුදට රු. මිලියන 140.90 ක් ලැබී තිබුණත්, එම ආදායම් විගණනය කිරීම සඳහා 2014 ජනවාරි 10 දිනැති අංක 1/2014 දරන ආණ්ඩුකාර වරයාගේ සංදේශය මගින් අවලංගු කර තිබුණි.

පාඩු සම්බන්ධයෙන් කටයුතු කිරිම

උතුරු පළාත් සභාවේ එකතුව රු.මිලියන 48.96 ක් වටිනා භාණ්ඩ අයිතම 30 කට අලාභහානි සිදු වී තිබුණත්, ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

උතුරු පළාතේ පුර නැගුම ව්‍යාපෘතිය යටතේ සිවිල් ජනයා පදිංචිව සිටින දුරස්ථ ප්‍රදේශවල ඉදිකිරීම් කාර්යයන් සඳහා රු.මිලියන 459.9 ක් වැය කර ළමා උයන්, පොළවල්, බස් නැවතුම්පල, සාප්පු සංකීර්ණය, පුහුණු මධ්‍යස්ථාන සහ සංස්කෘතික ශාලා ආදී සංවර්ධන කටයුතු 32ක් නිම කර තිබුණත්, ඒවා වර්ෂ දෙකකට අධික කාලයක් නිෂ්ක්‍රියව පැවැතුණි.

හිඟ මුදල් අයකර ගැනීම

උතුරු පළාතේ ක්‍රියාත්මක වන ජීවනෝපාය ණය කළමනාකරණ මධ්‍යස්ථානය යටතේ ප්‍රතිලාභ ලබන්නන්ගෙන් අය විය යුතුව තිබුණු රු. මිලියන 46.07 ක ණය ශේෂ 2015 වර්ෂය අවසාන වන විටත් අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

සැපයීම් හා සේවා ඉටු කර ගැනීමෙන් තොරව ගෙවීම් කිරීම

පළාත් සභා ආයතන විසින් 2015 වර්ෂයේදී සැපයීම් හා සේවා ඉටු කර ගැනීමෙන් තොරව හෝ සම්පූර්ණ නොකර එකතුව රු.මිලියන 47.3 ක් වටිනා චෙක්පත් 23ක් ලියා තබා අත රඳවා ගෙන තිබුණි.

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය සහ දිසා රෝහල ඉදි කිරීම

කිලිනොච්චියේ පුනරීන්හි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හා දිසා රෝහල ඉදිකිරිම සඳහා රජයේ ඉඩමක් අත්පත් කර ගැනීමට 2011 දෙසැම්බර් 31 දින කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රු. මිලියන 3.75 ක් තැන්පත් කර තිබුණි. 2015 වර්ෂය අවසාන වන විටත් එම ඉඩම අත්පත් කර ගැනීමටත්, අදාළ අමාත්‍යාංශයට හිඟ මුදල නිරවුල් කිරීමටත් පළාත් සභාව විසින් කටයුතු කර නොතිබුණි. ගැටළුව ඉක්මනින් විසඳීම සඳහා පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් නියෝග නිකුත් කර තිබුණත්, කිලිනොච්චියේ දිස්ත්‍රික් ලේකම් විසින් පළාත් සභාව වෙත එම මුදල් නැවත ගෙවීම සඳහා කටයුතු කර නොතිබිණි.

වැටුප් හා දීමනා වැඩියෙන් ගෙවීම

2012 වර්ෂයේදී නැවත රාජකාරියේ යොදවන ලද නිලධාරීන් වෙත වැටුප් වශයෙන් ගෙවා තිබුණු රු. මිලියන 3.75 ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

අයවැය ප්‍රතිපාදන රහිතව කාර්යාලයීය උපකරණ මිලදී ගැනීම

ප්‍රසම්පාදන පරිපාටිය සහ අයවැය ප්‍රතිපාදන ලබා ගැනීමෙන් තොරව එකතුව රු.මිලියන 7.5 ක් වැය කර කාර්යාලීය උපකරණ මිලදී ගෙන තිබුණි.

සබරගමුව පළාත් සභාව

සබරගමුව පළාත් සභාව විසින් 2015 වර්ෂය සඳහා රු.මිලියන 19,760 ක් රජයේ ප්‍රදාන මඟින්ද, අභ්‍යන්තර මාර්ගවලින් රු. මිලියන 3,040 ක්ද, වශයෙන් එකතුව රු.මිලියන 22,800 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. 2015 වර්ෂයේ පුනරාවර්තන වියදම් වශයෙන් රු.මිලියන 18,040 ක්ද, මූලධන වියදම් සඳහා රු.මිලියන 4,760 ක් මූලධන වියදම් වශයෙන්ද එකතුව රු.මිලියන 22,800 ක් උපයෝජනය කිරිමට ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව 2015 වර්ෂයේදී රජයේ ප්‍රදාන මඟින් රු.මිලියන 21,508 ක්ද අභ්‍යන්තර මාර්ග මඟින් රු.මිලියන 3,558 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 25,066 ක ආදායම් රැස්කර තිබුණි. 2015 වර්ෂයේදී පුනරාවර්තන වියදම රු.මිලියන 20,858 ක් හා මූලධන වියදම රු.මිලියන 3,968 ක් වශයෙන් රු.මිලියන 24,826 ක් උපයෝජනය කර තිබුණි.

සබරගමුව පළාත් සභාවට අදාලව 2015 වර්ෂයේ සිදු කරනු ලැබූ විගණනයේ දි අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් එකතු කරන ලබන ආදායම් අනවශ්‍ය ලෙස ප්‍රමාද කර ප්‍රේෂණය කිරීම

සබරගමුව පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහයේ මුදල් රීති 117.4 ප්‍රකාරව පළාත් සභාව වෙනුවෙන් එකතු කරනු ලබන මුදල් පළාත් සභාව වෙත ප්‍රේෂණය කළ යුතුව තිබුණි. නමුත් රත්නපුර දිස්ත්‍රික්කය තුළ වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එකතු කරන ලද රු.මිලියන 101.50 ක ආදායම් පළාත් සභාවට ප්‍රේෂණය නොකර 2015 දෙසැම්බර් 31 දින වන විටත් බැංකු ජංගම ගිණුමේ රඳවා ගෙන තිබුණි. පළාතේ සංවර්ධනය වෙනුවෙන් යෙදවිය හැකි මුදල් කිසිදු පොලියක් රහිතව බැංකු ජංගම ගිණුමේ වර්ෂය අවසානය වන විටත් නිෂ්කාර්යව පැවැතුණි.

මිලදී ගෙන තිබුණු අභ්‍යාස පොත් පාසල් යන දරුවන් වෙත බෙදා නොදීම

පළාත් සභා මන්ත්‍රීවරයෙකුගේ යෝජනාවක් පරිදි පළාත් සභා උපමාන පාදක අරමුදල් යටතේ ඇලපාත, කහවත්ත හා කලවාන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල අඩු ආදායම්ලාභි පවුල්වල දරුවන් වෙත බෙදාදීම සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් එකතුව රු. මිලියන 1.18 ක් වැය කරමින් පිටු 80 තනිරුල් අභ්‍යාස පොත් 54,719 ක් 2014 දෙසැම්බර් මාසයේදී මිලදී ගෙන තිබුණි. මෙම අභ්‍යාස පොත් මුද්‍රණයේදී අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඇණවුමට පරස්පරව දේශපාලන අධිකාරියේ ඡායා රූප ඇතුළත් කර පිටකවරය මුද්‍රණය කර තිබීම හේතුවෙන් රත්නපුර දිස්ත්‍රික් ලේකම්වරයා විසින් එම පොත් ප්‍රාදේශිය ලේකම් කාර්යාල මඟින් බෙදාදීම ප්‍රතික්ෂේප කර පළාත් සභාවේ සභා ලේකම් වෙත 2015 අප්‍රේල් මාසයේදී භාර දී තිබුණි. සියළුම පොත් 2016 ජුනි 15 දින වන විටත් පළාත් සභාවේ ගබඩාවේ රඳවා ගෙන තිබුණි.

පළාත් සභාවේ ප්‍රතිපාදනවලින් තිළිණ මිලදී ගෙන ප්‍රදානය කිරීම

පළාත් සභා ලේකම් කාර්යාලයට සලසන ලද පුනරාවර්තන ප්‍රතිපාදනවලින් රු. මිලියන 4.24 ක් වැයකර ජංගම දුරකථන 70 ක් ද, ඩිජිටල් කැමරා 105 ක් ද, රැහැන් රහිත දුරකථන 40 ක් ද, බ්ලූ රේ ප්ලේයර් 68 ක් ද හා ෆැක්ස් යන්ත්‍ර 45 ක් ද මිලදී ගෙන සභාපතිවරයාගේ තිළිණ ලෙස පළාත් සභාවේ මැති ඇමතිවරුන්ට, මන්ත්‍රීවරුන්ට, සභා ලේකම් කාර්යාලයේ කාර්යය මණ්ඩලයට, ප්‍රධාන ලේකම් කාර්යාලයේ මාණ්ඩලික නිලධාරින්ට සහ මාධ්‍යවේදීන්ට 2013,2014 හා 2015 වර්ෂවලදී බෙදා හැර තිබුණි.

ආවරණ කුට් මිලදී ගෙන බෙදා හැරීම

ප්‍රධාන ලේකම් කාර්යාලයේ පුහුණු හා ධාරිතා සංවර්ධන වැය විෂයය මගින් රු.මිලියන 33.75 ක් වැයකර ආවරණ කුට් 1050 ක් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.1 මාර්ගෝපදේශය ප්‍රකාර ගුණාත්මකභාවය පිළිබඳව පරික්ෂාවකින් තොරව ආවරණ කුට් භාරගෙන අවමංගල්‍යා ආධාර හා වෙනත් සුභසාධන සමිති වෙත බෙදා හැර තිබුණි.
- ජලය කාන්දුවිම වැලැක්වීමට අමතර මුද්‍රාවන් යොදා නොතිබීම නිසා අවම මිල ඉදිරිපත් කළ ලංසුකරුගේ ලංසුව ප්‍රතික්ෂේප කර තිබුණි. ඒ අනුව එම අවශ්‍යතාවය ඉටු කරන බව සඳහන් කර තිබුණු දෙවන අවම මිල ඉදිරිපත් කළ ලංසුකරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. නමුත් දෙවන අවම මිල ඉදිරිපත් කළ ලංසුකරුගෙන් මිලදී ගෙන තිබු ආවරණ කුට්වල අමතර මුද්‍රා යොදා නොතිබු අතර, අවම මිල නොසලකා හැරීම නිසා රු.මිලියන 2.86 ක පාඩුවක් සිදු වී තිබුණි.
- විෂය පිළිබඳ කුසලතාවයකින් යුතු තෙවන පාර්ශවයක් විසින් මෙම ආවරණ කුට්යක වටිනාකම රු.19,330 ක් ලෙස තක්සේරු කර තිබුණි. ඒ අනුව සියලු ආවරණ කුට් සඳහා රු.මිලියන 11.22 ක් වැඩිපුර ගෙවා තිබුණි.

නිකුත් කළ ලදුපත් හා ලේඛන කූඨ ලෙස වෙනස් කර සභාවට ලැබෙන ආදායම් වැලැක්වීම

රත්නපුර මහා නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි දේපලකට වරිපනම් අංක ලබා දීමේදී සහ වරිපනම් නාම ලේඛනවල නම සංශෝධනය කිරීමේදී දේපලෙහි වාර්ෂික වටිනාකම මත හෝ ඔප්පුවේ වටිනාකම මත සියයට 1 ක්වූ ගාස්තුවක් අය කළ යුතුව තිබුණි. එම අයකිරීම්වලට අදාළ විෂයට සම්බන්ධ නිලධාරින් දූෂ්සන්ධානයෙන් යුතුව කටයුතු කර නිකුත් කළ ලදු පත් හා සභාවේ පවත්වාගෙන යනු ලබන ලේඛන කූඨ ලෙස වෙනස් කර හා තොරතුරු ලේඛනවලින් අත්හැරීමෙන් එකතුව රු. මිලියන 2.31 ක ආදායමක් සභා අරමුදලට ලැබීම වලක්වා තිබුණි

.

කොන්ත්‍රාත්කරු විසින් ඉටු නොකළ වැඩ සඳහා ගෙවීම් කිරීම

ගොඩකවෙල ප්‍රාදේශීය සභාව විසින් සභා බල ප්‍රදේශයට අයත් රත්නපුර ඇඹිලිපිටිය, ප්‍රධාන මාර්ගයේ මාදම්පේ මංසන්ධිය අසල වගුරු භූමිය රජයට අත්පත් කර ගෙන තිබුණි. ඉන් පසුව එහි මාළු වෙළඳ මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ මූලික පියවර වශයෙන් අදාළ බිම පස් පුරවා සංවර්ධනය කිරීමට ගොවි සංවිධානයක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. පෞද්ගලික සමාගමක් විසින් ඔවුන්ගේ වැඩ බිමෙන් ඉවත් කරන පස් මෙම ස්ථානය දක්වා ප්‍රවාහනය කර භූමිය ගොඩකර තිබූ අතර, කොන්ත්‍රාත්කාර සමිතිය විසින් එම වැඩ කොටස් අදාළ සමිතිය මඟින් ඉටු කළ බවට සාවද්‍ය ලෙස තොරතුරු ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව සභාව විසින් ඉටු නොකළ වැඩ වෙනුවෙන් අදාළ කොන්ත්‍රාත්කාර සමිතිය වෙත රු. මිලියන 10.00 ක් ගෙවා තිබුණි.

පනතේ සඳහන් විධිවිධානවලට අමතරව කාර්යයන් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තියේ සඳහන් ප්‍රාදේශීය සභා අරමුදල් යෙදවිය හැකි කාරණාවලට පරිබාහිර කටයුතු වෙනුවෙන් විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, එවැනි අනුමැතියකින් තොරව 2015 වර්ෂයේදී රු. මිලියන 4.33 ක් වරකාපොල ප්‍රාදේශීය සභාව විසින් වැය කර තිබුණි.

පළාත් සභා මන්ත්‍රීවරුන්ට දෙනු ලබන ණය සීමාව අමාත්‍යාංශය දැණුවත් නොකර වැඩි කිරීම

ජනාධිපති කාර්යාලයේ සහ භාණ්ඩාගාරයේ එකඟත්වය මත නිකුත් කරන ලද 2001 මාර්තු 28 දිනැති අංක මුදල් 01/2001 දරන පළාත් සභා සහ පළාත් පාලන චක්‍රලේඛය ප්‍රකාරව විවිධ පළාත් සභාවන් තුළ ඒවායේ මන්ත්‍රීවරුන්ට ණය ලබා දීමට ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රමයන්හි පවතින වෙනස්කම් දුරලමින් ඒකාකාරී ක්‍රමයක් ඇති කර ගැනීම අරමුණු කර ගෙන ලබා දිය හැකි උපරිම ණය රු.250,000 කට සීමා කර තිබුණි. නමුත් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කිරීමක් හෝ ඉන් උපදෙස් හෝ අදහස් විමසීමකින් තොරව 2012 නොවැම්බර් 7 සහ 2014 අප්‍රේල් 23 දිනැති සබරගමුව පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩල තීරණ මඟින් එම ණය සීමාව රු.672,000 දක්වා වැඩි කරගෙන තිබුණි.

චක්‍රලේඛ විධිවිධාන නොසලකා සම්මන්ත්‍රණ ආදිය හෝටල්වල පැවැත්වීම

2007 පෙබරවාරි 28 දිනැති අංක සීඑස්ඒ/පී1/40 දරන ජනාධිපති ලේකම්ගේ ලිපිය ප්‍රකාරව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා රාජ්‍ය ආයතන සිය රැස්වීම්, සම්මන්ත්‍රණ, වැඩමුළු ආදිය පැවැත්වීම සඳහා හෝටල් තෝරා නොගත යුතු අතර, දේශීය සංචාරවලදී ආහාර හා නවාතැන් වෙනුවෙන් ගෙවිය යුතු හෝටල් ගාස්තු රජයේ මුදලින් නිරවුල් නොකළ යුතු බව සඳහන් කර තිබුණද, ඊට අනුකූල නොවන පරිදි,

- පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේ දී පවත්වන ලද සම්මේලන 03 ක් සඳහා එකතුව රු. මිලියන 1.11 ක් පෞද්ගලික හෝටල්වලට ගෙවා තිබුණි.

- සභා ලේකම් කාර්යාලය විසින් 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාල පරාසය තුළ අවස්ථා 04 ක දී එකතුව රු. මිලියන 7.77 ක් පෞද්ගලික හෝටල්වලට ගෙවා තිබුණි. ප්‍රදේශයෙන් බැහැරව වැඩමුළු පැවැත්වීම හේතුවෙන් ඉන්ධන , දෛනික දීමනා, ගමන් වියදම් හා කුලී රථ වියදම් සඳහා එකතුව රු. මිලියන 1.35 ක අතිරේක වියදමක් කර තිබුණි. සහභාගීවන්නන්ගේ සංඛ්‍යාව නිවැරදිව තහවුරු කර නොගැනීම නිසා අතිරික්ත කාමර කුලී සඳහා රු. මිලියන 2.68 ක් වැය කර තිබුණි.
- 2015 ඔක්තෝබර් 02 දිනැති අංක 4/2015 දරන භාණ්ඩාගාර ලේකම්ගේ ජාතික අයවැය චක්‍රලේඛ ප්‍රකාරව රජයේ සමාගම්, ව්‍යවස්ථාපිත මණ්ඩල ඇතුළු සියලුම රාජ්‍ය ආයතන විසින් මහ ජනතාවට, සේවකයන්ට සහ සේවය ලබා ගන්නා වෙනත් පාර්ශවයන්ට නොමිලයේ බෙදා හැරීමට මුද්‍රණය කරනු ලබන දින පොත් හා දින දර්ශන මුද්‍රණය 2016 වර්ෂයේ සිට නතර කරන ලෙස අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇති බව දන්වා සිටිය ද, ඊට අනුකූල නොවන ලෙස සභා ලේකම් කාර්යාලය 2016 වර්ෂය සඳහා එකතුව රු. මිලියන 1.79 ක දින පොත් මුද්‍රණය කර බෙදා හැර තිබුණි.

මගී ප්‍රවාහන බලපත්‍ර හා මාසිකව ලොග් පත්‍ර රහිතව ධාවනය කළ බස් රථ

සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ හිටපු සභාපතිවරයෙකුට අයිති බස් රථ 05 කට මගී ප්‍රවාහන බලපත්‍ර හා මාසිකව ලොග් පත්‍ර ලබා ගැනීමකින් තොරව ධාවනය කර තිබූ අතර, 2010 වර්ෂයේ සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා ඒ සඳහා රු. මිලියන 1.00 ක් අයකර නොතිබුණි.

පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීම

ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලයේ 2015 වාර්ෂික ඇස්තමේන්තුව මඟින් පුහුණු හා ධාරිතා සංවර්ධනය සඳහා රු. මිලියන 5.00 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද, එකී අරමුණට පටහැනිව 2015 වර්ෂයේදී ඉන් රු. මිලියන 1.94 ක් වැය කරමින් පොත් මිලදී ගෙන පළාත තුළ දහම් පාසල්, පුස්තකාල, නගර සභා ඇතුළු ආයතන හා විවිධ පුද්ගලයින් වෙත බෙදා හැර තිබුණි. 2015 වර්ෂය අවසාන වන විට මුළු ප්‍රතිපාදනයෙන් සියයට 61 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. එමෙන්ම ප්‍රධාන ලේකම් කාර්යාලයේ 2014 වර්ෂයේ ප්‍රාදේශීය සංවර්ධන සැලැස්ම යටතේ පුහුණු හා ධාරිතා සංවර්ධනය සඳහා සලසා තිබූ ප්‍රතිපාදන වලින් රු. මිලියන 6.32 ක් 2014 දෙසැම්බර් 31 දින පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරුන් 44 දෙනා වෙත ලැප්ටොප් පරිගණක 04 ක්, ටැබ් පරිගණක 13 ක් හා ජංගම දුරකථන 27 ක් ලබා දීම සඳහා වැය කර තිබුණි. පුහුණු හා ධාරිතා සංවර්ධන සඳහා සලසා තිබූ ප්‍රතිපාදන අරමුණුගත නොවන කාර්යයක් සඳහා වැයකර තිබුණු අතර මිලදී ගෙන තිබූ උපකරණ වත්කම් ලේඛනවල ඇතුළත් කිරීමකින් තොරව හා කිසිදු කොන්දේසියකින් ද තොරව අදාළ මන්ත්‍රීවරුන් වෙත නිකුත් කර තිබුණි.

ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීම හා බෙදාහැරීමේ ඌනතා

රත්නපුර දිස්ත්‍රික්කයේ සියළුම යෞවන සමාජවල ක්‍රීඩක ක්‍රීඩිකාවන් තෝරා ගෙන ඔවුන්ට ක්‍රිකට් කට්ටල හා වොලිබෝල් කට්ටල ලබා දීමට සැලැසුම් කර ඒ සඳහා රු. මිලියන 1.72 ක් වැය කර ක්‍රීඩා භාණ්ඩ කට්ටල 575 ක් 2014 දෙසැම්බර් 31 දින මිලදී ගෙන තිබුණි. මිලදී ගත් ක්‍රීඩා භාණ්ඩ නියමිත ප්‍රමිතීන්ට අනුකූල බවට තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිලධාරීන් විසින් පරීක්ෂා කර නොතිබුණි. භාරගත් භාණ්ඩවලින් රු. මිලියන 1.47 ක් වටිනා භාණ්ඩ පළාත් සභා මන්ත්‍රීවරයකු වෙත භාර දී තිබුණි. එම ක්‍රීඩා භාණ්ඩ අදාළ මන්ත්‍රීවරයාගේ නිවසේ ගබඩා කර තිබූ අතර ඉන් කිසිවක් 2016 මාර්තු 01 දින වන විටත් බෙදා දී නොතිබුණි. උක්ත ක්‍රීඩා භාණ්ඩ සම්බන්ධව සිදු කළ භෞතික පරීක්ෂාවේදී ප්‍රධාන අමාත්‍යාංශයේ ගබඩාවේ ගබඩා කර තිබූ රු.22,750 ක් වටිනා වොලිබෝල් 07 ක් හා අදාළ මන්ත්‍රීවරයාගේ නිවසේ ගබඩා කර තිබූ රු.14,940 ක් වටිනා වොලිබෝල් නෙට් 06 ක ඌනතාවයක් අනාවරණය විය.

බෙලිහුල්ඔය සංචාරක මධ්‍යස්ථානය මහජන උපයෝජනය සඳහා යොදා නොගැනීම

බෙලිහුල්ඔය හරහා ගමන් ගන්නා සංචාරකයන්ට ආහාර පාන ලබා ගැනීමේ පහසුකම්, තොරතුරු ලබා ගැනීමේ පහසුකම් හා සනීපාරක්ෂක පහසුකම් සැලැස්වීම අරමුණු කරගෙන රු. මිලියන 7.99 ක් වැය කර 2015 පෙබරවාරි 15 දින වැඩ නිමකර තිබුණු බෙලිහුල්ඔය සංචාරක මධ්‍යස්ථානය වසරකට අධික කාලයක් මහජන උපයෝජනය සඳහා යොදාගෙන නොතිබුණි.

ලැප්ටොප් පරිගණක භාවිතයට ගෙන නොතිබීම

කරවනැල්ල රෝහලේ බාහිර රෝගී අංශය සහ සායන කටයුතු පරිගණක ජාලගත කිරිම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික ආයතන විසින් 2013 දෙසැම්බර් 30 දින ලබා දී තිබූ ලැප්ටොප් පරිගණක 20 ක් භාවිතයට නොගෙන වෛද්‍ය අධිකාරි කාර්යාලයේ තැන්පත් කර තිබුණි. 2015 දෙසැම්බර් 30 දින වන විට ද මෙම උපකරණ භාවිතයට ගෙන නොතිබූ අතර, පරිගණක සඳහා ලබා දී තිබුණු වගකීම් කාලයද ඉක්මවා තිබුණි.

කරවනැල්ල රෝහලේ දැඩි සත්කාර ඒකකය ආරම්භ කර නොතිබීම

කරවනැල්ල රෝහල් පරිශ්‍රයේ වර්ග අඩි 900 ක ප්‍රමාණයක් දැඩි සත්කාර ඒකකය සඳහා වෙන්කර, රු. මිලියන 4 ක් වටිනා ICU ventilator දෙකක් 2012 ජුනි 02 දිනද, හා Patient Monitor with Accessories යන්ත්‍ර තුනක් 2014 ජුනි 02 දින ද ලබා දී තිබුණ ද අවශ්‍ය කාර්ය මණ්ඩලය ලබා නොදීමෙන් 2015 දෙසැම්බර් 30 දින වන විටත් දැඩි සත්කාර ඒකකය ආරම්භ කර නොතිබුණි.

පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශය විසින් සැලැසුම් කළ පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම

පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශය සඳහා 2015 වර්ෂයේදී ව්‍යාපෘති 1106 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 1,303.51 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු. මිලියන 237.83 ක ව්‍යාපෘති 261 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

ව්‍යාපෘතිය නියමිත දිනයට ඉටු නොකිරීම වෙනුවෙන් ප්‍රමාද ගාස්තු අය නොකිරීම

ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය මගින් ලබා දුන් අරමුදල් මගින් පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ පල්ලෙබැද්ද බුළුතොට මාර්ගය සංවර්ධනය සඳහා 2011 දෙසැම්බර් 05 දින ප්‍රධාන ලේකම් විසින් පුද්ගලික සමාගමක් සමග ගිවිසුමකට එළැඹ තිබුණි. එම ගිවිසුම අනුව වැඩ අවසන් කළ යුතු දිනය 2013 අප්‍රේල් 04 දින වී තිබුණි. කිසිදු නිශ්චිත හා සාධාරණ පදනමක් රහිතව දින 323 කින් කාලය දීර්ඝ කිරීම ලබා දී තිබූ බැවින් අතිරේකව දැරීමට සිදු වූ පොදු කාර්ය වියදම් හා මිල විචලතා මෙන්ම, අයකරගත හැකි වූ ප්‍රමාද ගාස්තු අහිමි වීමෙන් රජයට සිදු වූ සමස්ත මූල්‍යමය හානිය රු. මිලියන 37.13 ක් වී තිබුණි.

චක්‍රලේඛය පරිදි ගුරුවරුන් ස්ථාන මාරුවීම් නොකිරීම

2007 දෙසැම්බර් 13 දින අංක 2007/20 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය පරිදි ගුරුභවතුන්ගේ සේවා කාලය එක් පාසලක වර්ෂ 08 කට සීමා කළ යුතු වුවද, ඊට පටහැනිව මාවනැල්ල කළාපය තුළ පාසල් 129 ක වර්ෂ 08 ක සිට වර්ෂ 36 ක් දක්වා එකම පාසලේ ගුරුභවතුන් 1,295 ක් සේවය කර තිබුණි. එමෙන්ම දෙහිඕවිට අධ්‍යාපන කළාපයේ පළාත් සභා පාසල් 181 ක වර්ෂ 09 ක සිට 28 ක් දක්වා ස්ථාන මාරුවීම් නොලබා එකම පාසලේ ගුරුභවතුන් 922 ක් සේවය කර තිබුණි.

වයඹ පළාත් සභාව

වයඹ පළාත් සභාව විසින් 2015 වර්ෂය සඳහා රු.මිලියන 21,525 ක් රජයේ ප්‍රදාන මඟින්ද, අභ්‍යන්තර මාර්ගවලින් රු. මිලියන 6,175 ක්ද, වශයෙන් එකතුව රු.මිලියන 27,700 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. 2015 වර්ෂයේ පුනරාවර්තන වියදම් වශයෙන් රු.මිලියන 24,417 ක්ද, මූලධන වියදම් සඳහා රු.මිලියන 3,402 ක් වශයෙන්ද උපයෝජනය කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව 2015 වර්ෂයේදී රජයේ ප්‍රදාන මඟින් රු.මිලියන 24,417 ක්ද අභ්‍යන්තර මාර්ග මඟින් රු.මිලියන 6,387 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 30,804 ක ආදායම් රැස්කර තිබුණි. 2015 වර්ෂයේදී පුනරාවර්තන වියදම රු.මිලියන 26,688 ක් හා මූලධන වියදම රු.මිලියන 2,783 ක් වශයෙන් රු.මිලියන 29,471 ක් උපයෝජනය කර තිබුණි.

වයඹ පළාත් සභාවේ කටයුතු සම්බන්ධයෙන් 2015 වර්ෂයට අදාලව වැදගත් විගණන නිරීක්ෂණයන් සම්පිණ්ඩණය කර පහත දැක්වේ.

ප්‍රතිපාදන සළසා නොගෙන වාහන මිලදී ගෙන තිබීම

2015 අගෝස්තු 13 දිනැති අංක: NWP/CS/F/2/1/BUD/5 දරන නියෝජ්‍ය ප්‍රධාන ලේකම්ගේ ලිපිය මගින් වාහන මිලදී ගැනීම සඳහා ප්‍රතිපාදන සළසා ගැනීමට ප්‍රථම රු.මිලියන 68.40 ක වටිනා ඩබල් කැබ් රථ 08 ක් හා වෑන් රථ 02 ක් මිලදී ගැනීම සඳහා ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් වෙත අනුමැතිය ලබා දී තිබුණි.

ප්‍රඥප්ති මගින් ස්ථාපිත ආයතනවල කාර්යභාරයන් ඉටු කිරීමට ලබා දුන් ප්‍රතිපාදන

ප්‍රධාන අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යවස්ථාපිත ආයතන සඳහා 2015 වර්ෂයේදී රු.මිලියන 32.00 ක් ප්‍රදානයන් ලෙස ලබාදී තිබුණු අතර, එකී ව්‍යවස්ථාපිත ආයතන විසින් එම ප්‍රතිපාදන අදාළ කාර්යයන් ඉටු කිරීම සඳහා උපයෝජනය නොකර ආයෝජනවල යොදවා තිබුණි. ඒ අනුව 2015 වර්ෂය අවසානය වන විට සමුච්චිත වටිනාකම රු.මිලියන 74.57 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

වත්කම් ඵලදායි ලෙස යොදා නොගැනීම

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රු. මිලියන 5.18 ක් වැය කර ඉදිකර තිබූ යාකරවත්ත ගුරු මධ්‍යස්ථානය 2012 නොවැම්බර් 18 දින විවෘත කර තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදු කළ විගණනයේදී අනාවරණය වූ අඩුපාඩු පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි. එම ගොඩනැගිල්ල විවෘත කළ පසු වර්ෂ 3 ක් ගතවී තිබුණත්, එය ඵලදායී අරමුණකට යෙදවීමට අධ්‍යාපන බලධාරීන් අවධානය යොමු කර නොතිබුණි.

පංති කාමරවල ඩෙස්, පුටු, ගුරු මේස හා ගුරු පුටු ප්‍රමාණවත් නොවීම

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ ඇති අධ්‍යාපන කළාප 08 කට අයත් පාසල් 184 ක ඉගැන්වීම් ක්‍රියාවලිය ඵලදායීව ඉටුකිරීම සඳහා පාසල් දරුවන් වෙනුවෙන් පංති කාමරවල පවතින ඩෙස් 27,604 ක්ද, පුටු 29,697 ක්ද, ගුරු මේස 2,330 ක්ද, ගුරු පුටු 3,015 කද ඌනතාවයක් පැවැතුණි.

ගුරු පුරප්පාඩු පැවැතීම

2015 වර්ෂය සඳහා කුලියාපිටිය අධ්‍යාපන කළාපයේ පාසල් 67 ක විෂයයන් 15 ක් සඳහා සිංහල මාධ්‍ය ගුරු පුරප්පාඩු 104 ක්ද, පාසල් 09 ක විෂයයන් 09 ක් සඳහා සිංහල මාධ්‍ය උසස් පෙළ ගුරු පුරප්පාඩු 15 ක්ද, පාසල් 17 ක විෂයයන් 12 ක් සඳහා දෙමළ මාධ්‍ය ගුරු පුරප්පාඩු 66 ක්ද පැවැතුණි.

පුරප්පාඩු වූ ශ්‍රේණිධාරී විදුහල්පති තනතුරුවල රාජකාරි ආවරණය කිරීම

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ පැවැති කළාප අධ්‍යාපන කාර්යාල 6 කට අයත් පාසල් 320 ක සිටිය යුතු ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් හා නියෝජ්‍ය විදුහල්පතිවරුන් වෙනුවට පහල ශ්‍රේණියක නිලධාරීන් රාජකාරි ඉටු කර තිබුණි. තවද, නියෝජ්‍ය විදුහල්පතිවරු අවශ්‍ය නොවන පාසල් 90 ක නියෝජ්‍ය විදුහල්පති රාජකාරි ඉටුකිරීමත්, නියෝජ්‍ය විදුහල්පතිවරු සිටිය යුතු පාසල් 66 ක නියෝජ්‍ය විදුහල්පතිවරු සේවය කර නොතිබුණි.

එකම පාසලක වර්ෂ 6 කට වැඩි කාලයක් සේවය කිරීම

2007 දෙසැම්බර් 13 දිනැති අංක FD/1/27/1/5/1/2007 හා අංක 2007/20 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛවල 3:2 ඡේදය ප්‍රකාරව වඩාත් පහසු පාසල් වර්ගයට අයත් පාසලක උපරිම සේවා කාලය අවුරුදු 6 ක් වශයෙන් දක්වා තිබුණද, කලාප 08 කින් ලබාගත් තොරතුරු මත පාසල් 166 ක ගුරුභවතුන් 2565 ක් වසර 6 කට වඩා එකම පාසලේ සේවය කර තිබුණි.

පාසල් සිසුන්ගේ විභාග ප්‍රතිඵලවල වර්ධනයක් සිදු වී නොතිබීම

ඉබ්බාගමුව කළාපයේ පාසල් සඳහා 2014 හා 2015 වර්ෂවල සේවස්ථ හා ප්‍රතිඵල නැංවීමේ වැඩසටහන සඳහා පිළිවෙලින් රු. මිලියන 11.42 ක් හා රු.මිලියන 12.25 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර, එයින් පිළිවෙලින් රු.මිලියන 9.38 ක් හා රු.මිලියන 9.87 ක් වූ ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. නමුත් වියදමට සාපේක්ෂව විභාග ප්‍රතිඵලවල වර්ධනයක් සිදුවී නොතිබූණි.

ඉදිකර තිබුණු ගුරු විවේකාගාරවල අඩුපාඩු පැවැතීම

ගුරු විවේකාගාර ඉදිකිරීම සඳහා රු. මිලියන 129 ක් ඇස්තමේන්තු සකස් කර තිබුණි. ඒ අනුව වයඹ පළාත තුළ ගුරු විවේකාගාර 31 ක් වෙනුවෙන් රු. මිලියන 128.92 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණද, ගුරු විවේකාගාර සඳහා සැලැසුම් සහ ඇස්තමේන්තු සකස් කිරීමේදී අඩුපාඩු පැවතීම හේතුවෙන් ගුරුභවතුන්ට නිසි පරිදි ඒවා පරිහරණය කිරීමේ අවකාශ ලැබී නොතිබුණි.

නාරම්මල දිසා රෝහලේ පල්දෝරු පද්ධතිය අක්‍රියවීම

නාරම්මල දිසා රෝහලේ පල්දෝරු පද්ධතියේ ඉදිකිරීම් කටයුතු සඳහා 2012 වර්ෂයේදී රු. මිලියන 2.60 ක් ගෙවා තිබුණි. ඊට අමතරව මෝටර් 02 ක් සහ අමතර කොටස් වෙනුවෙන් රු. 79,252 ක්ද වැය කර තිබුණි. මෙම පද්ධතියට 2015 දෙසැම්බර් වන විට වර්ෂ 3 ක කාලයක් ගතවී තිබුණත්, එය දැනට අක්‍රිය වී පැවැතුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද මුළු මුදලම නිෂ්ක්‍රිය වියදමක් වී තිබුණි.

පොළ භූමියට ප්‍රවේශවීමේ දොරටු ඉදිකිරීමෙන් ජනතාවට ප්‍රතිලාභයක් නොලැබීම

වයඹ පළාත තුළ සතිපොලවල් 31 ක්, එකක් රු. මිලියන 6.86 බැගින් එකතුව රු.මිලියන 439.00 ක් වැය කර ඉදිකර තිබුණි. වැඩ නිම කළ අයිතම වෙනුවෙන් Testing කිරීමට ඇස්තමේන්තු ගත කිසිදු මුදලක් වෙන්කර නොතිබුණි. නමුත් පොල භූමියට ප්‍රවේශ වීමේ දොරටුවට අදාල සැලැස්ම වෙනුවෙන් රු.789,506 ක් ඇස්තමේන්තු කර තිබුණි. එවැනි වියදමක් කර ප්‍රවේශ දොරටුව ඉදිකිරීමෙන් ප්‍රදේශයේ ජනතාවට කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

ගිරිඋල්ල කළාප කාර්යාලයේ සිදු වූ මුල්‍ය වංචාව

ගිරිඋල්ල කලාප කාර්යාලයේ සිදුවූ මූල්‍ය වංචාව සඳහා පළාත් භාණ්ඩාගාර තැන්පතු ගිණුම ලබා දි තිබුණු රු. මිලියන 13.61 අත්තිකාරම් 2015 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. එම මූල්‍ය වංචාව සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය පියවර ගෙන අදාළ පාර්ශවයන්ගෙන් එම මුදල අයකරගෙන අත්තිකාරම් මුදල නිරවුල් කළ යුතු වුවත්, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් එසේ කටයුතු කර නොතිබුණි.

කොෆී ටේබල් වර්ගයේ ශාස්ත්‍රීය ග්‍රන්ථ මුද්‍රණය කිරීම

කොෆී ටේබල් වර්ගයේ ශාස්ත්‍රීය ග්‍රන්ථ මුද්‍රණය කිරීම සඳහා රුපියල් මිලියන 2.9 ක් වැයකර පොත් 335 ක් මුද්‍රණය කර තිබුණි. ඉන් රු. 500,000 ක් වටිනා පොත් 50 ක් වයඹ සංවර්ධන අධිකාරිය වෙත භාර දී ඇති බව සඳහන් කර තිබුණත්, එම පොත් ආයතනය වෙත ලැබී නොතිබුණි. මුද්‍රණය කරන ලද පොත්වලින් අලෙවි නොකරන ලද රු. මිලියන 2.39 ක් වටිනා පොත් 239 ක් ආයතනයේ තිබුණි.

හිඟහිටි මුද්දර බදු ආදායම

2015 වර්ෂය ආරම්භයේදී පැවති රු.මිලියන 76.55 ක දේපල පැවරීම මත මුද්දර බදු හිඟ ආදායමින් 2015 වර්ෂයේදී රු.මිලියන 23.25 ක් පමණක් අයකර ගෙන තිබුණි. 2015 වර්ෂයේ හිඟ හිටි ආදායම සමඟ වර්ෂය අවසාන වන විට රු.මිලියන 60.50 ක අදායමක් හිඟහිට තිබුණි.

හිඟහිටි පිරිවැටුම් බදු අයකර ගැනීම මන්දගාමී වීම

වයඹ පළාත් සභාවේ 1990 අංක 8 දරන මුදල් ප්‍රඥප්තියේ VI වන පරිච්ඡේදයේ 11 වගන්තිය ප්‍රකාරව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ 2010 දෙසැම්බර් 31 දින පැවති රු.මිලියන 243.39 ක හිඟ පිරිවැටුම් බදු මුදලින් 2015 වර්ෂය අවසාන වන විට රු.මිලියන 38.52 ක් අයකර ගෙන තිබුණි. තවත් රු.මිලියන 32.37 ක් නිදහස් කර තිබුණු අතර, 2015 වර්ෂය අවසාන වන විට රු.මිලියන 172.50 ක හිඟ හිටි බදු අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

නිෂ්කාර්යව පැවැති වාහන හා යන්ත්‍ර

එකතුව රු.මිලියන 10.19 ක් වූ වාහන හා යන්ත්‍ර උපකරණ 5 ක් වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරියේ පරිශ්‍රයේ වර්ෂ ගණනාවක සිට පැවැත එමින් තිබුණි. එම වාහනවල හා යන්ත්‍රවල සුළු සේවා කටයුතු නොකිරීම හෝ සේවා සඳහා අවශ්‍ය අමතර උපාංග ලබා නොගැනීම හේතුවෙන් එම වත්කම් නිෂ්කාර්යව පැවතුණි.

පේෂකර්මාන්ත ගම්මාන ආරම්භ කිරීමේ විශේෂ ව්‍යාපෘතිය

2015 වර්ෂය සඳහා පේෂකර්මාන්ත ගම්මාන ආරම්භ කිරීමේ විශේෂ ව්‍යාපෘතිය යටතේ ගම්මාන 04 ක් ආරම්භ කිරීම සඳහා සැලසුම් කර තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 4.92 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. 2015 දෙසැම්බර් මාසය වන විටත් එක් පේෂකර්මාන්ත ගම්මානයක් පමණක් ආරම්භ කර තිබුණි. යෝජිත පේෂ කර්ම ගම්මාන 04 ක් සඳහා රු. 990,000 ක නූල් තොගයක් වර්ෂයේදී මිලදී ගෙන තිබුණු අතර, 2015 දෙසැම්බර් 31 දින වන විට මකුල් වැව පේෂ කර්ම ගම්මානය සඳහා පමණක් රු.144,403 ක නූල් තොගයක් ලබා දී තිබුණි.

ගොඩවෙල ජල පිරිපහදු ඒකකය ස්ථාපිත කිරීම

2015 වර්ෂයේදී ගොඩවෙල ජල පිරිපහදු ඒකකය ස්ථාපිත කිරීම සඳහා රු. මිලියන 5.36 ක ප්‍රතිපාදන සළසා තිබූ අතර, එයින් රු. මිලියන 2.68 ක් 2015 දෙසැම්බර් 31 දින පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබුණි. එම මුදලින් රු.මිලියන 1.61 ක් 2016 පෙබරවාරි 26 දින කොන්ත්‍රාත්කරු වෙත ගෙවා ඉතිරි රු. මිලියන 1.07 ක් 2016 මැයි මාසය වන විටත් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

කල් ඉකුත් වූ හා ප්‍රමිතියෙන් තොරව පැවැති ඖෂධ භාවිතයෙන් ඉවත් කිරීම

පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් රෝහල් 6 ක සහ කුරුණෑගල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලීය ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් ඒකකයේ වටිනාකම රු. මිලියන 16.95 ක් වූ ඖෂධ වර්ග 413 කින් ඒකක 10,162,768 ක්ද, වටිනාකම ගණනය කල නොහැකි වූ තවත් ඖෂධ වර්ග 53 ක්ද, කල් ඉකුත්වීම, නියැදි සාම්පල් අසමත්වීම, පැහැය හා සුවඳ වෙනස් වීමෙන් භාවිතයෙන් ඉවත් කර තිබුණි.

ස්ථාපිත කර තිබුණු රුධිර කාන්දු කරන ඒකක වෛද්‍ය සත්කාර කටයුතු සඳහා යොදා නොගැනීම

රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2014 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වකුගඩු රෝග නිවාරණ වැඩසටහන යටතේ රු. මිලියන 42.57 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර ඉන් රු. මිලියන 40.18 ක් වැය කර පොල්පිතිගම රෝහලේ හා නිකවැරටිය රෝහලේ රුධිර කාන්දු කරන ඒකක ස්ථාපිත කර තිබුණි. 2016 පෙබරවාරි 29 දින සිදු කරන ලද විගණන පරීක්ෂාවේදී එදින වන විටත් එම ගොඩනැගිලි හා වෛද්‍ය උපකරණ, රෝහල් බල ප්‍රදේශයේ වකුගඩු රෝගීන්ගේ වෛද්‍ය සත්කාර කටයුතු සඳහා යොදවා නොතිබුණි.

වාට්ටු සංකීර්ණය රෝගීන්ගේ ප්‍රයෝජනයට යොදවා නොගැනීම

නිකවැව රෝහලේ ඇඳන් 20 ක භික්ෂු වාට්ටුවක් ඉදිකිරීම සඳහා රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සළසා දී තිබුණු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 15.68 ක් වැය කර ඇඳන් 20 ක් සහිත වාට්ටු සංකීර්ණය 2015 මැයි 31 දින වන විට ඉදිකර අවසන් කර තිබුණි. එහි භික්ෂු වාට්ටුවක් සඳහා ඇඳන් වෙන්කිරීම පමණක් සිදුකර තිබුණු අතර 2016 පෙබරවාරි 23 දින සිදු කරන ලද විගණනයේදී එම සංකීර්ණය රෝගීන්ගේ ප්‍රයෝජනයට යොදවාගෙන නොතිබුණි.

ඵලදායක නොවන පරිදි බස් මගී ආවරණ ඉදිකිරීම

මාර්ග අමාත්‍යාංශයේ පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ බස් මගී ආවරණය ඉදිකිරීම සඳහා 2014 හා 2015 වර්ෂවලදී රු. මිලියන 5.99 ක් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට ලබාදී තිබුණි. මගී ආවරණ සවිකළ යුතු ස්ථාන නිසි ලෙස හඳුනාගෙන නොතිබීම හේතුවෙන් ජනාකීර්ණ නොවන ප්‍රදේශවල සවිකර තිබූ අවස්ථාද, ඇස්තමේන්තුගත මුදලට වැඩියෙන් වියදම් කළ අවස්ථාද, වයඹ පළාත් සභාවට අයත් නොවන මාර්ගයන්හි ඉදිකර තිබූ අවස්ථාද නිරීක්ෂණය වූ බැවින් දරන ලද වියදම ඵලදායක ලෙස යොදාගෙන නොතිබුණි.

ඌව පළාත් සභාව

ඌව පළාත් සභාව විසින් 2015 වර්ෂය සඳහා එකතුව රු.මිලියන 18,941 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. එම ආදායමෙන් රු.මිලියන 16,366 ක් රජයේ ප්‍රදාන මඟින්ද, රු.මිලියන 2,605 ක් අභ්‍යන්තර මාර්ග මඟින්ද, රැස්කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. එම ඇස්තමේන්තුගත ආදායමෙන් රජයේ ප්‍රදාන මගින් රු.මිලියන 19,120 ක්ද, අභ්‍යන්තර මාර්ගවලින් රු.මිලියන 2,727 ක් අභ්‍යන්තර මාර්ගවලින්ද රැස්කර තිබුණි. 2015 වර්ෂය සඳහා පළාත් සභාව විසින් පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 12,600 ක්ද, මුලධන වියදම් සඳහා රු.මිලියන 3,736 ක්ද, වශයෙන් එකතුව රු.මිලියන 16,336 ක වියදම් ඇස්තමේන්තු කර තිබුණි. 2015 වර්ෂයේදී පුනරාවර්තන වියදම රු.මිලියන 18,590 ක්ද, මුලධන වියදම රු.මිලියන 3,196 ක් වශයෙන් එකතුව රු.මිලියන 21,786 ක් උපයෝජනය කර තිබුණි.

ඌව පළාත් සභාවේ කටයුතු සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

කාරක සභා හතක් ක්‍රියාත්මක වී නොතිබීම

ඌව පළාත් සභාවේ කාර්ය පටිපාටි රීති සංග්‍රහයේ 74 වන රීතිය ප්‍රකාරව කාරක සභා හතක් ස්ථාපිත කර තිබුණි. VI වන පළාත් සභාව ආරම්භ කරන ලද 2014 සැප්තැම්බර් මාසයේ සිට 2016 මාර්තු මාසය දක්වා වූ කාලය තුළදී එම කාරක සභා හත ක්‍රියාකාරී තත්ත්වයෙන් නොපැවැතුණි. ඒ නිසා 2015 වර්ෂය සඳහා ඌව පළාත් සභා ලේකම් කාර්යාලය විසින් පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම අනුව අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

විදේශ පුහුණු පාඨමාලා ගාස්තු වැඩිපුර ගෙවා තිබීම

2015 වර්ෂයේ විදේශ පුහුණු පාඨමාලාවක පාඨමාලා ගාස්තු සඳහා ඇමරිකන් ඩොලර් 88,200 කට සරිලන මුදලක් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය විසින් තායිලන්තයේ පුහුණු ආයතනයක් වෙත ගෙවා තිබුණි. පළාත් සභාව විසින් එම පුහුණුව සඳහා සහභාගී කර තිබුණු නිලධාරින්ට අදාල පුහුණු ගාස්තුව ඇමරිකන් ඩොලර් 22,400 ක් වී තිබුණි. ඒ අනුව ඇමරිකන් ඩොලර් 65,800 කට සරිලන රු. මිලියන 8.69 ක මුදලක් එම ආයතනය වෙත වැඩිපුර ගෙවා තිබුණි.

විධිමත් අනුමැතියකින් හා විධිවිධානවලට පටහැනිව වාහන මිලදී ගැනීම

2011 ජුලි 06 දිනැති අංක FC/PSDG & CBG/Circular/2011/1 දරන වයඹ පළාත් මුදල් කොමිෂන් සභාවේ චක්‍රලේඛය ප්‍රකාරව පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ වාහන මිලදී ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයේ හා මුදල් කොමිෂන් සභාවේ පූර්ව අනුමැතියකින් තොරව ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, සංස්කෘතික, සමාජ සුභසාධන සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍යාංශය විසින් ප්‍රධාන අමාත්‍යවරයා සඳහා රු. මිලියන 9.40 ක් වැයකර BMW වර්ගයේ මෝටර් රථයක් මිලදී ගෙන තිබුණි. එම මෝටර් රථය පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂවරයා විසින් අදාල පිරිවිතරයන් සමඟ සසඳා වෙනස්කම් 7 ක් වාර්තා කර තිබුණි.

බීජ අල ආනයනය කර ගොවීන් වෙත අලෙවි කිරීමේ වැඩසටහන

2002 වර්ෂයේදී ඌව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් මහා කන්නයේ වගා කිරීම සඳහා බීජ අල ආනයනය කර ගොවීන් වෙත අලෙවි කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක කළ වැඩසටහන සඳහා රු. මිලියන 67.00 ක අත්තිකාරම් ප්‍රධාන ලේකම් මඟින් ලබාගෙන තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට එම අත්තිකාරම්වලින් රු. මිලියන 40.87 ක් තවදුරටත් ප්‍රධාන ලේකම් වෙත පියවිය යුතුව තිබුණි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ නිලධාරීන්ගේ නොසැලකිල්ල හා සැලසුම් රහිතව කටයුතු කිරීම හේතුවෙන් පළාත් සභා අරමුදලට රු.මිලියන 29.80 ක මූල්‍යමය අලාභයක් සිදු වී තිබුණි.

චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව වැටුප් හා දීමනා ගෙවීම

2011 මැයි 11 දිනැති අංක පීඑල්/6/11/3ධූ1 දරන පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපිය අනුව පළාත් සභා නායක, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක, විපක්ෂ නායක, පළාත් විපක්ෂයේ ප්‍රධාන සංවිධායක යන අනුමත නොවන ධූරධාරීන්ගේ වැටුප්, දීමනා හා පහසුකම් පිළිබඳ ඉදිරි කටයුතු සිදු නොකරන ලෙස දැනුම් දී තිබුණි. එම උපදෙස්වලට හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 25 වන වගන්තියට පටහැනිව අනුමත නොවන ධූරධාරීන් තිදෙනෙකු සඳහා VI වන පළාත් සභාව පිහිටුවන ලද 2014 සැප්තැම්බර් මාසයේ සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා වැටුප් හා දීමනා වශයෙන් රු. මිලියන 6.99 ක් සභා ලේකම් කාර්යාලය විසින් ගෙවා තිබුණි.

වාණිජ අත්තිකාරම් කටයුත්ත සඳහා වන අවම ලැබීම් සීමාවට ළඟා නොවීම

2015 වාර්ෂික මුදල් ප්‍රකාශය අනුව දිසා යාන්ත්‍රික වැඩපළ සඳහා වූ වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුත්තේ අවම ලැබීම් සීමාව රු. මිලියන 40.00 ක් වුව ද, සමාලෝචිත වර්ෂයේදී රැස් කළ ආදායම රු. මිලියන 27.65 ක් වී තිබීම නිසා රු. මිලියන 12.35 කින් අවම බැර සීමාවට ළඟා වී නොතිබුණි.

කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු නොකිරීම

2015 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුම්වල ශේෂවලින් ඌව පළාත් සභාවේ ආයතන 21 කට අයත් එකතුව රු. මිලියන 66.35 ක් වූ වර්ෂ 02 කට අධික කාලයක සිට පැවැත එමින් තිබුණත්, මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව නියාදනය කර නොතිබුණි.